විශ්වවිද්‍යාල ප්‍රතිපාදන
කොමිෂන් සභාව
ශ්‍රී ලංකාව

අධ්‍යයන වර්ෂය 2019/2020
[අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2019]

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය

**විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීමේදී මෙන්ම තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී ද මෙම අත්පොත හොඳින් කියවා තේරුම් ගෙන එහි සඳහන් නීතිරීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.**

## පටුන


| ශීර්ෂය | | | පිටුව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පණිවිඩය | | | 1 |
| කෙටි යෙදුම් | | | 3 |
| මෙම අත්පොත භාවිත කිරීමට උපදෙස් | | | 5 |
| **1 කොටස** - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශ වීමේදී බලපාන ප්‍රතිපත්ති හා නීතිරීති | | 9 |
| | 1.1 | රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය | 10 |
| | 1.2 | විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් | 12 |
| | 1.3 | අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා ඉසෙඩ් අගය | 13 |
| | 1.4 | විශ්වවිද්‍යාලවල විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රවේශ වීමට අදාළ කඩඉම් ලකුණු | 13 |
| | 1.5 | යම් අපේක්ෂකයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බැලෙන දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය | 13 |
| | 1.6 | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ වීමට අදාළ නිර්ණායක | 14 |
| | 1.7 | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලැබීමට හේතු | 16 |
| | 1.8 | විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී සිදුවන ප්‍රමාදය අවම කිරීමට ගන්නා ලද පියවර | 18 |
| **2 කොටස** - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා සූදානම් විය යුතු ආකාරය පිළිබඳ වැදගත් උපදෙස් | | 21 |
| | 2.1 | එක් එක් විෂය ධාරා යටතේ ඇති අධ්‍යයන පාඨමාලා | 25 |
| | 2.2 | ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශවීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සපුරාලිය යුතු පූර්ව අවශ්‍යතා | 38 |

**3 කොටස** - "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස් 123

3.1 "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස් 124

3.2 අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා සිසුන් අනුයුක්ත කිරීමේ පදනම 125

3.3 අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීම 128

**4 කොටස** - ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ සහ අනෙකුත් වැදගත් උපදෙස් 129

4.1 ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ 130

4.2 පුරප්පාඩු පිරවීම සිදුකරන ආකාරය / ඉහළ මනාපයන් දක්වා ඇති ඇතැම් පාඨමාලා හා විශ්වවිද්‍යාල සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවීමට හෝ කිසිදු ඉහළ මනාපයක් සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම ඉදිරියටත් රැඳී සිටීමට අනුගමනය කළ යුතු පියවර 131

4.3 කිසියම් පාඨමාලාවක් සඳහා එක් විශ්වවිද්‍යාලයක සිට වෙනත් විශ්වවිද්‍යාලයකට මාරුවීම් සිදුකරන ආකාරය 133

4.4 අභියාචනා ඉදිරිපත් කරන ආකාරය 134

4.5 කිසියම් පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට කිසියම් අපේක්ෂකයෙකු තේරී පත්වීම පිළිබඳව පැමිණිල්ලක් / විරුද්ධතාවයක් ඉදිරිපත් කරන ආකාරය 135

4.6 ප්‍රවේශය කල් ගැනීම 135

4.7 විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධ විමසීම් 136

**5 කොටස** - අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමේ ක්‍රමවේදය 137

එක් එක් පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අදාළ "Uni-Codes" 153

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සපුරා තිබිය යුතු අවශ්‍යතාවයන් 158

ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවය 159

**6 කොටස** - විශේෂ විධිවිධාන යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම 171

6.1 අන්ධ හා කායික අශක්නුතාවන් ඇති අපේක්ෂකයන් 172

6.2 විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති සිසුන් 172

6.3 ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතාවන් දක්වා ඇති අයදුම්කරුවන් 174

6.4 සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම 174

6.5 විදේශයන්හි අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයන් හා විදේශීය සිසුන් 174

6.6 ගුරුවරුන් ඇතුළත් කර ගැනීම 175

6.7 අතිරේක ප්‍රවේශය 176

**7 කොටස** - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ එමගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා පිළිබඳ හැඳින්වීමක් 177

**8 කොටස** - සිසුන් විසින් නිතර අසනු ලබන ප්‍රශ්න 241

**9 කොටස** - අධ්‍යයන පාඨමාලාවලට ඇති ඉල්ලුම පිළිබඳ සිසුන්ට අවබෝධයක් ලබා ගැනීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂයේදී නිකුත් කළ කඩඉම් ලකුණු 253

**10 කොටස** - ආදර්ශ අයදුම්පත්‍ර 263

ඇමුණුම 1 අභියාචනා සඳහා ආදර්ශ අයදුම්පත්‍රය
ඇමුණුම 2 විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත
ඇමුණුම 3 අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත

**ඇමුණුම**

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පණිවිඩය

උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීම තරුණ දරුවන් විශාල පිරිසකගේ ඒකායන ප්‍රාර්ථනාවයි. එබැවින් විශ්වවිද්‍යාලවල වගකීම වන්නේ යාවත්කාලීන දැනුමින්, හැකියාවන්ගෙන්, නිවැරදි අදහස්වලින් පමණක් නොව නිසි මානසිකත්වයකින්ද හෙබි උපාධිධාරීන් බිහිවීමට අවැසි පරිසරය සකසා දීම සහ එමගින් ඔවුන් තෝරාගත් මාවත්හි සාර්ථකත්වය කරා පිය නැඟීමට ඉඩ සළසා දීමයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් තෝරා ගැනීමේ හා අනුයුක්ත කිරීමේ වගකීම දරණ ප්‍රමුඛ ආයතනයයි.

මෙම අත්පොත ඔබේ මනාපය පරිදි අධ්‍යයන පාඨමාලාවන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ඔබට සපයා දෙනු ලබයි. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ වන ප්‍රතිපත්ති, නීතිරීති, අවම සුදුසුකම් සහ අනෙකුත් කාරණා පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු මෙහි අඩංගු වේ. මීට අමතරව, සිසුන් විසින් නිතර අසනු ලබන ප්‍රශ්න යනුවෙන් වෙනම පරිච්ඡේදයක්ද මෙම අත්පොතට ඇතුළත් කර ඇත.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය මගින් විවිධ පාඨමාලා 225 ක් **(Uni - Codes)** පවත්වනු ලැබේ. උසස් අධ්‍යාපනය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව මෙම සියළු අධ්‍යයන පාඨමාලා නොමිලේ ලබාදෙනු ලැබේ. මීට අමතරව, මහපොළ ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන ශිෂ්‍යාධාර සහ රාජ්‍ය නොවන ආයතන සහ මානව හිතකාමී සංවිධානවලින් සිසුන් සඳහා පිරිනමනු ලබන අනෙකුත් මූල්‍ය ශිෂ්‍යත්ව මගින්ද සිසුන්ට පහසුකම් සළසා දෙනු ලැබේ. දත්තවලට අනුව මේ වනවිට සිසුන් 70% - 80% ක් අතර සංඛ්‍යාවකට මෙම මූල්‍ය පහසුකම් ලැබේ. මීට අමතරව, නේවාසිකාගාර පහසුකම් අවම ගාස්තු යටතේ සිසුන්හට ලබාදෙන අතර දුෂ්කර දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති ඇතැම් විශ්වවිද්‍යාල විසින් විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය මුළුල්ලේම නේවාසිකාගාර පහසුකම් සිසුන්හට ලබාදෙනු ලැබේ.

කලා විෂය ධාරාවේ අධ්‍යයන පාඨමාලා සඳහා දිප ව්‍යාප්ත කුසලතා පදනම මත පමණක් සිසුන් තෝරා ගැනීමත්, අනෙකුත් සියළු පාඨමාලාවල මුළු ස්ථාන සංඛ්‍යාවෙන් 60% ක් සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනීමත් හේතුවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ඇතුළත්වීම ඉතා තරඟකාරී කටයුත්තක් බවට පත්ව ඇත. උදාහරණයක් වශයෙන් 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් **76,559** ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළද ඉන් උසස් අධ්‍යාපනය සඳහා වරම් හිමි කර ගත්තේ 31,158 ක සිසුන් සංඛ්‍යාවකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව රජයේ විශ්වවිද්‍යාල හා එක්ව සිසුනට උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා තව තවත් වැඩි කර දීමට සෑම විටම උත්සාහ දරයි.

ජීවන නිපුණතා යනු පෞර්ෂ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අතර සේවායෝජකයන් විසින් අපේක්ෂා කරන්නාවූත් ඉහළ වටිනාකමක් ලබා දෙන්නාවූත් අංගයකි. එබැවින් විශ්වවිද්‍යාල විසින් සෑමවිටම සිසුනට ඔවුන්ගේ ජීවන නිපුණතා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය කර ගැනීම සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබා දෙයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්ද සිසුන්ගේ ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණ දැනුම වැනි මෘදු නිපුණතා වර්ධනය කරලීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව, 2019 වසරේදී ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ නව අධ්‍යයනාංශ කිහිපයක්ම විශ්වවිද්‍යාලයන්හි ආරම්භ කරන ලදී. මීට අමතරව, UTEL නම් වූ විවිධ අදියරයන්ගෙන් **(Bands)** සමන්විත විභාගයක්ද විශ්වවිද්‍යාල සිසුන් සඳහා ආරම්භ කර ඇත. මෙම UTEL සහතිකය රැකියා සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණයන්හිදී ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනත්වය සාධනය කිරීම සඳහා මහඟු උපකාරයක් වනු ඇත.

මීට අමතරව, විවිධ වර්ගයේ ක්‍රීඩාවන් විශාල සංඛ්‍යාවක් සඳහා මෙන්ම අන්තර්ජාතික ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වීමටද විශ්වවිද්‍යාල සිසුන්හට අවස්ථාව සැලසී ඇත. එලෙසම, සිසුනගේ විශ්වවිද්‍යාල අත්දැකීම් වඩාත් අර්ථවත් කර ගැනීම සඳහා විෂයානුබද්ධ ශිෂ්‍ය කමිටු (උදා: කායික විද්‍යා / භූගෝල විද්‍යා කමිටු), චිත්‍ර සහ සංස්කෘතික

කවයන් (උදා: චිත්‍ර කවය), ආගම් කමිටු (උදා: බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමය, මුස්ලිම් මජ්ලිස්) සහ සිසු අයිතීන් සුරැකීම සඳහා ක්‍රියා කරන ශිෂ්‍ය සංවිධාන වැනි විවිධ ශිෂ්‍ය සංගම් හා සහසම්බන්ධ වීමටද සිසුනට හැකියාව ලැබේ. එබැවින් එවැනි සියලු ක්‍රියාකාරකම් සඳහා සහභාගිවන ලෙසත්, ඔබගේ මෘදු නිපුණතා වර්ධනය කර ගැනීමෙහිලා මෙම පහසුකම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගන්නා ලෙසත් අපි ඉල්ලා සිටිමු.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වලට සිසුන් ලියාපදිංචි කිරීම සඳහා නීත්‍යානුකූල බලයලත් ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවයි. එහෙයින්, අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීම හා අන්තර්ජාලය හරහා තේරී පත් වූ පාඨමාලාව හා විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචිවීම අනිවාර්ය අවශ්‍යතාවයකි. එසේ ලියාපදිංචිවීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහතික කරන ලද ලියාපදිංචි වූ සිසුන්ගේ ලැයිස්තු විශ්වවිද්‍යාලවලට හා උසස් අධ්‍යාපන ආයතනවලට යවනු ලැබේ. විශ්වවිද්‍යාල විසින් ඇතුළත් කරගනු ලබන්නේ එසේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සහතික කර යවනු ලබන ලැයිස්තුවෙහි ඇතුළත් ශිෂ්‍යයන් පමණකි. අන්තර්ජාල සේවාවේ ආරක්ෂාව පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වගකීම දරණ බවටද දැනුම් දෙමු.


**රජයේ විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමට බලාපොරොත්තු වන සියළුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිය අන්තර්ජාල අයදුම්පත පිරවීමට පෙර මෙම අත්පොත ඉතා හොඳින් කියවා බලන ලෙස අවධාරණය කරනු ලැබේ. විවිධ විෂය සංකලනයන් පිළිබඳ ඇති පැහැදිලි අවබෝධය ඔබ ඇතුළත්වීමට කැමැත්ත දක්වන අධ්‍යයන පාඨමාලාව තෝරා ගැනීමට ඔබට උපකාරී වනු ඇත. එය නිවැරදිව සහ සුපරීක්ෂාකාරීව සිදු කරනු නොලැබූ සිසුන් තමන් ඉතාමත් කැමැත්තක් දක්වන පාඨමාලාව අහිමි කර ගන්නා අයුරුද, නොඑසේනම් විශ්වවිද්‍යාලය සඳහා ඇතුළත්වීමේ අවස්ථාව මුළුමනින්ම මගහැර ගන්නා අයුරුද අපි විසින් අත්දැක ඇත්තෙමු.**

අපි ඔබගේ සියලු අනාගත උත්සාහයන් සාර්ථක වේවායි හෘදයාංගමව ප්‍රාර්ථනා කරමු !

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව**

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| කො.වි. | - | කොළඹ විශ්වවිද්‍යාලය |
| පේ.වි. | - | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ශ්‍රී.ජ.වි. | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| කැ.වි. | - | කැලණිය විශ්වවිද්‍යාලය |
| මො.වි. | - | මොරටුව විශ්වවිද්‍යාලය |
| යා.වි. | - | යාපනය විශ්වවිද්‍යාලය |
| රු.වි. | - | රුහුණ විශ්වවිද්‍යාලය |
| නැ.වි. | - | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| අ.වි. | - | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
| ර.වි. | - | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ස.වි. | - | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| ව.වි. | - | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| ඌ.වි. | - | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |
| සෞ.ක.වි. | - | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| වි.වි. | - | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| දේ.වි. | - | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය |
| ග.වි.වි. | - | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය |
| කො.වි.ප.අ. | - | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය |
| ස්.වි.සෞ.අ.ආ. | - | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය |
| රා.ඇ. | - | රාමනාදන් ඇකඩමිය |
| ශ්‍රී.ම. | - | ශ්‍රීපාලි මණ්ඩපය |
| ත්‍රි.ම. | - | ත්‍රිකුණාමල මණ්ඩපය |
| ව.ම. | - | වවුනියා මණ්ඩපය |


රා.ඇ.
යා.වි.
ව.ම.
ත්‍රි.ම.
ර.වි.
ජ.වි.පෙ.අ.ආ.
නැ.වි.
ව.වි.
පේ.වි.
ග.වි.වි
කැ.වි
ඌ.වි.
අ.වි.
කො.වි.
ශ්‍රී.ජ.වි.
මො.වි.
පෞ.ක.වි.
වි.වි.
දේ.වි.
කො.වි.ප.අ.
ශ්‍රී.ම.
ස.වි.
රු.වි.

## මෙම අත්පොත භාවිත කිරීමට උපදෙස්

**මෙම අත්පොතෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගන්නේ කෙසේද ?**

2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් ලබා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට ප්‍රවේශ වීමට බලාපොරොත්තුවෙන් පසුවන සිසුන්ට වැදගත්වන මාතෘකා 10 ක් පිළිබඳව විස්තර කෙරෙන කොටස් 10 කින් මෙම අත්පොත සමන්විත වේ.

### 1 කොටස

පළමු කොටසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට ප්‍රවේශ වීමේදී බලපාන්නා වූ ප්‍රතිපත්ති හා නීතිරීති පිළිබඳව අවබෝධයක් ඔබට ලබා දේ. මෙම කොටස යටතේ දීප ව්‍යාප්ත කුසලතා පදනම, දිස්ත්‍රික් පංගු ක්‍රමය, නව හා පැරණි නිර්දේශයන් යටතේ සිසුන් තෝරා ගනු ලබන ක්‍රමවේදය, ඉසෙඩ් අගය, කිසියම් වර්ෂයකදී කඩඉම් ලකුණු ගණනය කරන ආකාරය සහ අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය පිළිබඳව විස්තර කෙරේ. එමෙන්ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රවේශය සඳහා ඔබ සුදුසුකම් නොලබන්නේ නම් එසේ වීමට හේතුද එහි ඇතුළත් වේ.

### 2 කොටස

ඔබගේ අනාගතය නිවැරදිව සැලසුම් කිරීමේදී මෙන්ම විශේෂයෙන්ම, ඔබ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාවක් හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම්ද මෙහි අඩංගු කරුණු ඉතා වැදගත් වේ. එයට හේතුව වන්නේ එම උපාධි පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාල විසින් එකිනෙකට වෙනස් විෂය සංකලනයන් සිය උපාධි පාඨමාලා වලට ප්‍රවේශයන්හිදී සළකා බලන බැවින් ඒ පිළිබඳ පූර්ව අවබෝධය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේදී වැදගත් වන බැවිනි. තවද, එක් එක් කාණ්ඩයෙන් විෂය සංකලනයන් තෝරා ගැනීම පිළිබඳවද සැකසුන නීතිරීති මාලාවක් පවතී. එය තරමක් සංකීර්ණ නීතිරීති මාලාවකි. එබැවින්, ඔබ මෙම කොටස ඉතා හොඳින් කියවා අවබෝධ කරගෙන අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමේදීම ඔබට අවශ්‍ය විෂය සංකලනයන් නිසිලෙස තෝරාගන්නේ නම් ඉතා වැදගත් වේ.

### 3 කොටස

මෙම කොටසින් "Uni-Code" භාවිත කර නිවැරදිව පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමට සහ කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදේ. එබැවින්, අන්තර්ජාලය හරහා "Uni-Code" භාවිත කර ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමට පෙර මෙම කොටස හොඳින් කියවා අවබෝධ කර ගන්නා මෙන් උපදෙස් දෙනු ලැබේ.

## 4 කොටස

මෙම කොටසින් ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේ පිළිවෙල, පූරප්පාඩු පිරවීම සිදු කරන ආකාරය, ඉහළ මනාපයන් සඳහා තේරී පත් නොවී දැනට තේරී ඇති පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම රැඳී සිටීමට අනුගමනය කළ යුතු පියවර, විශ්වවිද්‍යාල මාරුවීම් සිදුකරන ආකාරය, අභියාචනා ඉදිරිපත් කරන ආකාරය වැනි වැදගත් මාතෘකා පිළිබඳව විස්තර කෙරේ. මෙයද ඉතා වැදගත් කොටසක් වන බැවින්, අන්තර්ජාලය හරහා ඔබගේ ප්‍රවේශ අයදුම්පත්‍රය පිරවීම ඇරඹීමට පෙර මෙය කියවා බලන මෙන් උපදෙස් දෙනු ලැබේ.

## 5 කොටස

මෙම කොටස ඔබ කැමති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කරන ආකාරය පිළිබඳව පැහැදිලි කරයි. අන්තර්ජාලය හරහා ප්‍රවේශ අයදුම්පත සම්පූර්ණ කිරීම පිළිබඳව පැහැදිලි උපදෙස් මෙහි අඩංගු වන අතර, ඔබ අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට නොහැකි / පහසුකම් නොමැති අයදුම්කරුවෙකු නම් ඒ සඳහා සලසන ලද වෙනත් පහසුකම් පිළිබඳව ද මෙහි විස්තර වේ. අන්තර්ජාලය හරහා අයදුම්කිරීමෙහි ඇති නිරවද්‍යභාවය සහ ආරක්ෂිතබව පිළිබඳවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යය මණ්ඩලය ලෙස අපි පූර්ණ වගකීම දරන්නෙමු.

## 6 කොටස

මේ යටතේ විශේෂ විධිවිධාන අනුව සිසුන් ඇතුළත් කර ගැනීම හා එම ප්‍රවේශයන් සඳහා ඇතුළත් වීමට අදාළ නිර්ණායක පිළිබඳව විස්තර කෙරේ.

## 7 කොටස

හත්වන කොටසින් රජයේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ඇති පහසුකම් පිළිබඳව විස්තර කෙරේ. මීට අමතරව, එක් එක් විශ්වවිද්‍යාලයේ / උසස් අධ්‍යාපන ආයතනයේ පවත්වන පාඨමාලා පිළිබඳව විස්තරාත්මක අවබෝධයක්ද ඔබට ලබා දේ.

## 8 කොටස

අටවන කොටස ඉතා වැදගත් වේ. ඔබ විසින් නිතර අසනු ලබන ප්‍රශ්න (FAQs) සඳහා පිළිතුරු මෙහි අඩංගු වේ. උදාහරණයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂකයකුගේ දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය, එක් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වූ පසු නැවත උසස් පෙළ සඳහා පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිද යන්න වැනි නිතර අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු මෙහි ඇතුළත් වේ. එබැවින්, ඔබ මෙය හොඳින් කියවා බලා මෙහි පිළිතුරු සඳහන් නොවන වෙනත් ප්‍රශ්න වේනොත්, අප වෙත ලිපියක් හෝ ඊමේල් පණිවිඩයක් මගින් දන්වා එවන්න. එවිට ඔබගේ පැණයට පිළිතුරු අප විසින් ලබා දෙනු ඇත. එසේම, එම ප්‍රශ්න හා ඒවාට අදාළ පිළිතුරුද ඉදිරි වසරවල අත්පොත්වලට ඇතුළත් කරනු ලැබේ.

## 9 කොටස

පසුගිය අධ්‍යයන වර්ෂයට අදාළ එක් එක් පාඨමාලාවට ඇතුළත්වීමට අවශ්‍ය වූ කඩඉම් ලකුණු මෙම කොටසෙහි දක්වා ඇත. මෙම කඩඉම් ලකුණු දැක්වීමෙහි අරමුණ, එක් එක් පාඨමාලා සඳහා ඇති ඉල්ලුම පිළිබඳව යම් අවබෝධයක් ඔබට ලබාදීම පමණකි. එබැවින්, මෙම කඩඉම් ලකුණු පමණක්ම භාවිත කරමින් තීරණ ගැනීමෙන් වළකින්න. කඩඉම් ලකුණු වසරින් වසර වෙනස් වන අතර ඒ පිළිබඳව 8 වන කොටසේ නිතර අසනු ලබන ප්‍රශ්න යටතේද විස්තර කර ඇත.

## 10 කොටස

දහවන කොටස යටතේ අභියාචනා යොමු කිරීම, විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතා ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සහ අන්ධ හා කායික අශක්නුතාවක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා වන ආදර්ශ අයදුම්පත් ගෙනහැර දක්වා ඇත.

**මෙම අත්පොතෙහි දක්වා ඇති නීතිරීති සහ ප්‍රකාශ පිළිබඳ අර්ථ නිරූපණය කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වගකීම වන අතර එම අර්ථ නිරූපණ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

# 1 කොටස

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශ වීමේදී බලපාන ප්‍රතිපත්ති හා නීතිරීති

1.1 රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය

1.2 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්

1.3 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා ඉසෙඩ් අගය

1.4 විශ්වවිද්‍යාලවල විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රවේශ වීමට අදාළ කඩඉම් ලකුණු

1.5 යම් අපේක්ෂකයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බැලෙන දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය

1.6 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ වීමට අදාළ නිර්ණායක

1.7 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලැබීමට හේතු

1.8 විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී සිදුවන ප්‍රමාදය අවම කිරීමට ගන්නා ලද පියවර

# 1 කොටස

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශ වීමේදී බලපාන ප්‍රතිපත්ති හා නීතිරීති

### 1.1 රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය

විෂය ධාරාවන් අනුව ප්‍රවේශ ප්‍රතිපත්තිය වෙනස් වේ.

මෙම අත්පොතෙහි 2.1 (1) ඡේදයේ 1 සිට 9 දක්වා සඳහන් කර ඇති කලා අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රවේශ වීමට අපේක්ෂා කරන සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගැනීම ප්‍රධාන වශයෙන් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදු කෙරේ. මෙම කාණ්ඩයට අයත් සිසුන් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම යොදා ගන්නේ නැත. එබැවින්, එම උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට සියලුම සිසුන් එක සමාන තරඟයක නිරත වේ.

කිසියම් අධ්‍යයන පාඨමාලාවකට තෝරා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ජාතික ප්‍රතිපත්තියක් අනුව තීරණය කෙරේ. එයට අනුව, යම් දිස්ත්‍රික්කයකින් කිසියම් පාඨමාලාවකට ඇතුළත් කරගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන්වලදී එම පාඨමාලාවට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට වඩා අඩු නොවන අයුරින් තෝරාගැනේ.

නමුත්, කලා අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමට දීප ව්‍යාප්ත කුසලතා පදනම යොදා නොගන්නා අවස්ථාවක් පවතී.

එනම්, පහත සඳහන් කලා අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදයයි.

1. සංගීතය
2. නර්තනය
3. නාට්‍ය හා රංග කලා
4. දෘශ්‍ය කලා
5. දෘශ්‍ය හා තාක්ෂණික කලා
6. චිත්‍ර හා නිර්මාණ

මෙම අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම දිස්ත්‍රික් කුසලතා පදනම මත සිදු වේ. එම ක්‍රමවේදය පහතින් විස්තර කර ඇත.

එමෙන්ම අනෙකුත් විෂය ධාරාවන්ට එනම් වාණිජ්‍ය, ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛවපද්ධති තාක්ෂණවේදය සහ මෙම අත්පොතෙහි 2.2.8 කොටසෙහි දක්වා ඇති විවිධ විෂය ධාරාවන්වල සිසුන් සුදුසුකම් ලබන පාඨමාලා සඳහාද ප්‍රවේශය පහත ක්‍රමවේදය අනුව සිදු කරනු ලබයි.

1. කිසියම් පාඨමාලාවක් සඳහා ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

2. ඉතිරි 60% න් 55% ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ. ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55% ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

3. මීට අමතරව, දිස්ත්‍රික්ක 16 ක් අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇත. ඒ අනුව ඉතිරි 5%, එම දිස්ත්‍රික්ක 16 හි සිසුන් අතරෙහි බෙදා දෙනු ලැබේ. මෙහිදී එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16 හි

මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ. මෙම 5%, එක් දිස්ත්‍රික්කයක් සඳහා පමණක් නොව දිස්ත්‍රික්ක 16 අතරම බෙදා හැරේ.

අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යයි සලකනු ලබන දිස්ත්‍රික්ක 16 වන්නේ;

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නුවරඑළිය | 7. | වව්නියා | 13. | පොළොන්නරුව |
| 2. | හම්බන්තොට | 8. | ත්‍රිකුණාමලය | 14. | බදුල්ල |
| 3. | යාපනය | 9. | මඩකලපුව | 15. | මොණරාගල |
| 4. | කිලිනොච්චිය | 10. | අම්පාර | 16. | රත්නපුර |
| 5. | මන්නාරම | 11. | පුත්තලම | | |
| 6. | මුලතිව් | 12. | අනුරාධපුරය | | |

**ඉහත සඳහන් ප්‍රවේශ ප්‍රතිපත්තිය යටතේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ සිසුන් තෝරා ගනු ලබන ක්‍රමවේදය :**

2019/2020 අධ්‍යයන වර්ෂයේ එක් එක් පාඨමාලාව සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ සිසුන් තෝරා ගනු ලබන ප්‍රතිශත තීරණය කිරීම පහත දැක්වෙන ක්‍රමවේදය අනුව සිදු කෙරෙනු ඇත.

- 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන් වෙනම කාණ්ඩ දෙකක් (*two distinct populations*) වශයෙන් සැලකීමට SC(FR) 29/2012 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගය අනුව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර තිබේ.
- ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නව නිර්දේශය සහ පැරණි නිර්දේශය වශයෙන් වෙන වෙනම අපේක්ෂයන් වෙත නිකුත් කරනු ලැබූ 2019 වර්ෂයේ පැවැති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය පදනම් කරගෙන පහත සඳහන් නිර්ණායකයන්ට යටත්ව සිදුකෙරේ.

  - 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා <u>නව නිර්දේශය</u> යටතේ පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>පළමු වරට</u> අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙලින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ (*Composite Average*) ප්‍රතිශතය වේ.

  - 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා <u>පැරණි නිර්දේශය</u> යටතේ පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>දෙවන සහ තුන්වන වරට</u> අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙලින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ (*Composite Average*) ප්‍රතිශතය වේ.

කෙසේ වෙතත්, කිසියම් පාඨමාලාවකට සිසුන් තෝරා ගැනීමේදී දිස්ත්‍රික්ක පදනම මත වෙන්කරනු ලබන පංගු ප්‍රමාණය (එනම් 55% සහ 5% ක එකතුව) 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන්වලදී ඒ ඒ පාඨමාලාවලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදුකෙරේ.

විශ්වවිද්‍යාලවලට සිසුන් අනුයුක්ත කිරීමේදී පැන නගින ප්‍රායෝගික ගැටළු සහ අනෙකුත් නොවැලැක්විය හැකි හේතු සාධක හේතුවෙන් ඒ ඒ පාඨමාලාවට තෝරා ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ඒ ඒ අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලින් යෝජිත ප්‍රවේශ සංඛ්‍යාවලින් වෙනස් විය හැකි බව සැලකිය යුතුය. එම සංඛ්‍යා ඒ ඒ විශ්වවිද්‍යාල අතර බෙදී යන ආකාරය ආසන්න වශයෙන් මෙම අත්පොතෙහි ඇමුණුම (ආ) හි දක්වා ඇත.

මෙම අත්පොතෙහි හයවන කොටසේ දක්වා ඇති පරිදි විශේෂ විධිවිධාන යටතේද එම ඡේදවල දක්වා ඇති කොන්දේසිවලට යටත්ව සීමිත සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ.

## 1.2 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන් ;

(අ) තුන්වරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (උසස් පෙළ) අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් ද 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

- සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, ඉසෙඩ් අගය අනුව ඔවුන් යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවකට මෙම අධ්‍යයන වර්ෂයේදී තේරී පත් වුවහොත් එම තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබයි.
- එවැනි අපේක්ෂකයෙකු සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව පෙර අවස්ථාවකදී සපුරා ඇත්නම්, එය ප්‍රවේශය සඳහා සළකා බලනු ලැබේ.
- සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව ඉදිරි වර්ෂයකදී ඒ සඳහා පෙනී සිට එය සමත් වුවහොත්, ඉසෙඩ් අගය අනුව දැනට තේරී සිටින පාඨමාලාව ඉදිරි අධ්‍යයන වර්ෂයකදී හැදෑරීම සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලබයි.

## 1.3 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා ඉසෙඩ් අගය

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විභාග දෙපාර්තමේන්තුව මගින් ඉසෙඩ් අගය ගණනය කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දෙනු ලැබේ. මෙය සංඛ්‍යානමය ගණනය කිරීමකි. එම ගණනය කිරීම සාධක 03ක් මත පදනම් වේ.

i. අදාළ වර්ෂයේදී අදාළ විෂය සඳහා සිසුන් ලබා ගත් "අමු ලකුණු"

ii. අදාළ වර්ෂයේදී අදාළ විෂය සඳහා වූ ලකුණු ව්‍යාප්තියේ මධ්‍යන්‍යය

iii. අදාළ වර්ෂයේදී අදාළ විෂය සඳහා වූ ලකුණු ව්‍යාප්තියේ සම්මත අපගමනය

එබැවින්, එක් එක් වර්ෂයේදී කිසියම් පාඨමාලාවක් සඳහා සිසුන් දක්වන කුසලතාවය සහ අදාළ විෂය සඳහා එම වර්ෂයේදී අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් සංඛ්‍යාව ආදී කාරණා අනුව ඉසෙඩ් අගය වෙනස් විය හැක.

## 1.4 විශ්වවිද්‍යාලවල විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රවේශ වීමට අදාළ කඩඉම් ලකුණු

කඩඉම් ලකුණු ගණනය කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. එක් එක් අධ්‍යයන පාඨමාලාවට අදාළ කඩඉම් ලකුණු අදාළ වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සිසුන් දැක්වූ කුසලතාවය, අදාළ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඇති ඉල්ලුම සහ අදාළ පාඨමාලාව සඳහා යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාව වැනි කරුණු අනුව තීරණය වේ.

මේ අනුව, යම් වර්ෂයකදී යම් කිසි පාඨමාලාවක කඩඉම් ලකුණ, එම පාඨමාලාව සඳහා අයදුම්කරන ලද සිසුන් දැක්වූ කුසලතාව, විශ්වවිද්‍යාල මගින් අදාළ පාඨමාලාව සඳහා යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය යනාදී සාධක අනුව වසරින් වසර වෙනස් වේ.

සමහර අවස්ථාවන්හිදී ඇතැම් සිසුන් පසු වර්ෂයකදී නැවත උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමේ අපේක්ෂාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් නොකරන අතර ඇතැම් සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළද තේරී පත්වූ පාඨමාලාව සඳහා ලියාපදිංචි නොවීමට පසුව තීරණය කරයි.

**එබැවින්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී ඔබගේ ඉසෙඩ් අගය සහ පෙර වසරේ කඩඉම් ලකුණු මත රැඳී නොසිට, ඔබ අවම සුදුසුකම් සපුරා ඇති හැකි තරම් පාඨමාලා සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන ලෙස අවධාරණයෙන් දන්වා සිටිමු.**

## 1.5 යම් අපේක්ෂකයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂකයෙකු කුමන දිස්ත්‍රික්කයකට අයත්වන්නේ දැයි තීරණය කිරීම පිණිස අපේක්ෂකයා අවසන් වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ සාක්ෂි සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඉදිරිපත් කළ යුතුය. මෙහිදී, අපේක්ෂකයා විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරුවල නිරවද්‍යතාවය, පාසල් අයදුම්කරුවෙකුගේ නම් පාසල් වාර්තා ආශ්‍රයෙන් දැනට ඉගෙනුම ලබන පාසලේ ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර පෞද්ගලික අයදුම්කරුවෙකුගේ නම් පාසල් හැරයාමේ සහතිකය ආශ්‍රයෙන් සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කළ යුතුවේ.

ඒ අනුව, අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් සපුරාලූ අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වූ මාසයට පෙර වූ මාසයේ අන්තිම දවසින් අවසන් වන වර්ෂ තුනක (03) කාල පරිච්ඡේදය මෙහිදී සලකා බැලේ. උදාහරණයක් ලෙස අ.පො.ස. (උසස් පෙළ) විභාගය අගෝස්තු මස පැවතුනේ නම්, ජූලි මස 31 වන දින සිට පිටුපසට වසර 03 ගණනය කෙරේ.

මෙම සලකනු ලබන තුන් අවුරුදු කාල පරිච්ඡේදය තුළ අපේක්ෂකයා අධ්‍යාපනය ලැබීම සඳහා අවම වශයෙන් වසරක් හෝ වසරකට වැඩි කාලයක් ඇතුළත්ව සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය එම අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බැලෙන දිස්ත්‍රික්කය වේ.

යම් හෙයකින් එම වසර 03 ක කාල පරිච්ඡේදය තුළ අපේක්ෂකයා එක් පාසැලකට වඩා වැඩි පාසල් ප්‍රමාණයකට ඇතුළත්ව සිටියේ නම්, වැඩිම දින ගණනක් අධ්‍යාපනය ලැබීම සඳහා ඇතුළත්ව සිටි පාසැල පිහිටි දිස්ත්‍රික්කය එම අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බලන දිස්ත්‍රික්කය වශයෙන් සැළකේ. නමුත් අනිවාර්යයෙන්ම එම දින ගණන අවම වශයෙන් වසරක් හෝ වසරකට වඩා වැඩි විය යුතුය. උදාහරණයක් වශයෙන් කිසියම් අපේක්ෂකයෙකු වසරකුත් මාස තුනක කාලයක් යම් දිස්ත්‍රික්කයක පිහිටි පාසලක අධ්‍යාපනය ලබා ඉතිරි වසරකුත් මාස නමයක කාලය වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි පාසැලක අධ්‍යාපනය ලැබුවේ නම්, වසරකුත් මාස නමයක කාලයක් අධ්‍යාපනය ලැබූ පාසැල පිහිටි දිස්ත්‍රික්කය අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බැලෙන දිස්ත්‍රික්කය වේ.

මෙහිදී කිසියම් අපේක්ෂකයෙකු මාස 11ක කාලයක් යම් දිස්ත්‍රික්කයක පිහිටි පාසලක අධ්‍යාපනය ලබා පිළිවෙලින් මාස 09ක් හා මාස 10ක් බැගින් වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි පාසල් දෙකක අධ්‍යාපනය ලබා ඇතැයි සිතමු. එවිට, දෙවන දිස්ත්‍රික්කයෙහි එම සිසුවා අධ්‍යාපනය ලැබූ මුළු කාලය (වසරකුත් මාස හත) පළමු දිස්ත්‍රික්කයෙහි අධ්‍යාපනය ලැබූ කාලයට (මාස එකොළහ) වඩා වැඩි හෙයින් සහ දෙවන දිස්ත්‍රික්කයෙහි අධ්‍යාපනය ලැබූ මුළු කාලය වසරකට වඩා වැඩි හෙයින්, වසරකුත් මාස හතක් අධ්‍යාපනය ලැබූ එම දෙවන දිස්ත්‍රික්කය අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බැලෙන දිස්ත්‍රික්කය වේ.

යම් හෙයකින්, මෙම කාල පරිච්ඡේදය තුළ අපේක්ෂකයකු පාසැලට ඇතුළත්ව සිටි කාල සීමාව කුමන දිස්ත්‍රික්කයකින් හෝ වසරකට වඩා අඩු අවස්ථාවකදී හෝ සළකා බලනු ලබන වර්ෂ තුනක කාල පරිච්ඡේදය තුළදී අපේක්ෂකයා කිසිඳු පාසැලකට ඇතුළත්ව නොමැති අවස්ථාවකදී, අපේක්ෂකයාගේ ස්ථිර පදිංචිය පිහිටි දිස්ත්‍රික්කය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බලනු ලැබේ. එසේ දිස්ත්‍රික්කය තහවුරු කර ගැනීම සඳහා අපේක්ෂකයාගේ අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛන 02 එවිය යුතුය.

ඒවා නම්;

i. පාසැල් හැරයාමේ සහතිකයේ හෝ ශිෂ්‍ය කාර්ය දර්ශනයේ මුල් පිටපත

ii. ග්‍රාම නිලධාරී සහතිකයේ මුල් පිටපත (ප්‍රාදේශීය ලේකම් විසින් නිලමුද්‍රාව තබා අනු අත්සන් කරන ලද)

**සැලකිය යුතුයි :**

පෞද්ගලික අයදුම්කරුවන් සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමඟ පාසැල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත එවීම අනිවාර්ය වේ.

## 1.6 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ වීමට අදාළ නිර්ණායක

1. සියළුම සිසුන්හට රජය උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම සඳහා එක සමාන අවස්ථාවක් ලබා දී ඇත.

2. එබැවින්, සැමට කරන සාධාරණයක් වශයෙන්, නිදහස් අධ්‍යාපනය යටතේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට සියලුම සිසුනට එක් අවස්ථාවක් පමණක් හිමිවේ.

3. එයට හේතුව වන්නේ; යම්කිසි ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරී ඇති පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගැනීම නිසා හෝ එහි ලියාපදිංචිවීමෙන් පසු අධ්‍යයන කටයුතු සඳහා වාර්තා නොකිරීම නිසා එම ශිෂ්‍යයා විසින් වළක්වාලන්නේ එම වසරේම වෙනත් ශිෂ්‍යයෙකුට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා තිබූ අවස්ථාවක් වීමයි. එසේම, ලියාපදිංචිය අවලංගු කොට ගෙන ඊට පසු වර්ෂයක උසස් පෙළ ප්‍රතිඵල අනුව වෙනත් පාඨමාලාවක ලියාපදිංචිවීම සඳහා

ඉල්ලුම් කිරීමෙන් එම ශිෂ්‍යයා එම වසරේද උසස් පෙළට පෙනී සිටි වෙනත් සිසුවෙකුගේ අවස්ථාවද අහිමි කිරීමට උත්සාහ කරයි.

4. අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවස්ථාව හිමිවන්නේ ඒ සඳහා අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට දී ඇති අනුමත අවස්ථා තුනෙන් එක් අවස්ථාවකදී පමණි. එසේම, ලියාපදිංචිය සඳහා අයදුම්කිරීමේදී ද ඔවුන්ට යොදාගත හැක්කේ අයදුම්පත් කැඳවීම සඳහා අදාළ වූ එම අ.පො.ස (උසස් පෙළ)විභාගයේදී ඔවුන් ලබාගත් ප්‍රතිඵලය පමණකි.

5. **යම්කිසි ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් එවන ලද තේරීම් ලිපිය ලද පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැර වන සේ බැංකුවකට හෝ අන්තර්ජාලය හරහා ලියාපදිංචි ගාස්තු ලෙස රු.50/-ක මුදල ගෙවා ලියාපදිංචිවීම සඳහා දී ඇති අවසාන දින හෝ එදිනට පෙර ඔහු/ඇය තේරී පත්වූ පාඨමාලාවට සහ අනුයුක්ත කරන ලද විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය මඟින් ලියාපදිංචි වූ විට ඔහු /ඇය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට (වරින් වර සංශෝධිත) අනුව ස්ථාපිත කරන ලද පනත 1.6 (8) ඡේදය යටතේ සඳහන් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකු ලෙස සැළකේ.**

6. **මුදල් ගෙවීම සිදුකර තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය මඟින් ලියාපදිංචිය සම්පූර්ණ කළ දිනය ලියාපදිංචි වූ දිනය ලෙස සැළකේ.**

**ඒ අනුව, කිසියම් අයදුම්කරුවෙකු තේරී පත්වූ විශ්වවිද්‍යාලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ අදාළ පාඨමාලාවට ලියාපදිංචිවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදුන් අවසාන දින හෝ ඊට පෙර, අදාළ බැංකුවට හෝ අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැරවන සේ අදාළ මුදල් ගෙවීම සිදු කළද, අන්තර්ජාලය හරහා ඉහත 1.6 (5) ඡේදයේ සඳහන් පරිදි ලියාපදිංචිය සම්පූර්ණ නොකළහොත් එය වලංගු ලියාපදිංචිවීමක් ලෙස සළකනු නොලැබේ.**

7. **තවද, බැංකුවට මුදල් ගෙවූයේ නම්, ඒ බව සනාථ කිරීම සඳහා ගෙවීම් වවුචරයේ ස්කෑන් කරන ලද පිටපත (UGC Copy) අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය (Upload).**

8. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිසුන් තෝරා අනුයුක්ත කරනු ලබන විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පහත දැක්වේ.

i. කොළඹ විශ්වවිද්‍යාලය

ii. පේරාදෙණිය විශ්වවිද්‍යාලය

iii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

iv. කැලණිය විශ්වවිද්‍යාලය

v. මොරටුව විශ්වවිද්‍යාලය

vi. යාපනය විශ්වවිද්‍යාලය

vii. රුහුණ විශ්වවිද්‍යාලය

viii. නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ix. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

x. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

xi. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

xii. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

xiii. ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

xiv. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

xv. ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

xvi. ත්‍රිකුණාමල මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

xvii. වව්නියා මණ්ඩපය, යාපනය විශ්වවිද්‍යාලය

xviii. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

xix. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය

xx. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

xxi. ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

xxii. ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය, යාපනය විශ්වවිද්‍යාලය

9. ඉහත සඳහන් විශ්වවිද්‍යාල පනත යටතේම ස්ථාපිත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දූරස්ථ අධ්‍යාපන ක්‍රම උපයෝගී කරගනිමින් අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. එම විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රවේශ සුදුසුකම් ඇතුළු වැඩි විස්තර ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයෙන් ලබා ගත හැකිය.

10. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ, පහත සඳහන් උසස් අධ්‍යාපන ආයතනවල පැවැත්වෙන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කරගනු ලබන්නේ එම විශ්වවිද්‍යාල/ ආයතන විසින්මය. එබැවින් එම පාඨමාලා සඳහා ඇතුළත්වීමට බලාපොරොත්තු වන සිසුන්, අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී අදාළ ආයතනයට අයදුම් කළ යුතුය.

i. මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
ii. තාක්ෂණවිද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

11. ඉහත ජේද අංක 1.6 (8) හි දක්වා ඇති විශ්වවිද්‍යාල 14 හි මණ්ඩප 03 හි සහ විශ්වවිද්‍යාල ආයතන 05 හි පැවැත්වෙන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය මෙම අත්පොතෙහි විස්තර කර ඇත. මෙහි දක්වා ඇති නීතිරීති රජය විසින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හෝ ගනු ලබන තීරණ අනුව වෙනස් විය හැකිය.

## 1.7 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලැබීමට හේතු

පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන් අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශය ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට තුන් වතාවකට වැඩි වාර ගණනක් පෙනී සිටි සිසුන්.

කිසියම් ශිෂ්‍යයෙකුට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමට අනුමත අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටිය හැකි අවස්ථා තුන, සමගාමී අවස්ථා වශයෙන් හෝ එසේ නොමැතිව හෝ පෙනී සිටිය හැකිය. නමුත්, අවසානයේදී සිය අවස්ථා තුනම සම්පූර්ණ කළ පසුව, ඊට පසු වර්ෂයක හෝ ඊට පෙර වර්ෂයක විභාග ප්‍රතිඵලවලින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ නොහැකි වේ.

2. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අභ්‍යන්තර සිසුන් වශයෙන් ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්. [මෙම ඡේදය යටතට අදාළ වන රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන ඉහත 1.6 (8)හි සහ 1.6 (10)හි දක්වා ඇත].

3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ නොවන වෙනත් පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාලයක / ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්. ඒවා නම් ;

   i. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

   ii. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

   iii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (නම්ගත කර ඇති කැඩෙට් නිලධාරීන් ලෙස - As Enlisted Officer Cadets)

   iv. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

   v. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2017 වසරේ සහ ඊට පසු වසරවලදී ලියාපදිංචි වූ සිසුන්)

4. අධ්‍යාපන විද්‍යා පීඨයක (College of Education) අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

5. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (University College) මගින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා නිදහස් අධ්‍යාපන අවස්ථාවක් යටතේ අභ්‍යන්තර සිසුන් ලෙස ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

6. පහත **"වැදගත්"** යටතේ සඳහන් කර ඇති ඡේදයන්හි දක්වා ඇති විධිවිධානවලට යටත්ව පහත සඳහන් ආයතනයන්හි තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක් සහිත පහත දක්වා ඇති පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්.

   (අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාව.

   (ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව.

**වැදගත් :**

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන තුන් (03) අවුරුදු හෝ ඊට වැඩි කාලයක උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සහ / හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව පූර්ණකාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන්, ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත එම ලියාපදිංචිය අවලංගු කර ගතහොත් පමණක්, එසේ ලියාපදිංචිවීමට පදනම් වූ ප්‍රතිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාලයක / උසස් අධ්‍යාපන ආයතනයක යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ප්‍රවේශය ලැබීමට අයදුම් කිරීමට සුදුසුකම් ලැබිය හැකිය.

ලියාපදිංචිවීම සඳහා අදාළ ආයතනය විසින් ලබා දී ඇති අවසාන දින සිට දින 60 ක කාලයක් ඇතුළත ඉහත 1.7 (6) හි සඳහන් කරන ලද පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කර නොගත් කිසියම් අපේක්ෂකයෙකු ඉහත 1.7 (6) කොටසට අයත් වන බැවින් එසේ ලියාපදිංචි වීමට පදනම් වූ ප්‍රතිඵල ලබා ගත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පසුව පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් නොලබයි.

ඉහත දක්වන ලද දින 60 ක් ඇතුළත ලියාපදිංචිය අවලංගු කරගෙන නැවත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකි වීමේ සහනය, ඉහත 1.7 (6) ඡේදයෙහි සඳහන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාවක **පුරප්පාඩුවක් පිරවීමට** තෝරාගත් සිසුවෙකුට හිමි නොවේ.

7. ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගත් සිසුන්.

8. ඉහත 1.7 හි 2, 3, 4, 5, 6 සහ 7 ඡේද යටතේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයකින් දැනටමත් ප්‍රථම උපාධියක් හෝ අදාළ සුදුසුකමක් ලබා ඇති සිසුන්.

9. විශ්වවිද්‍යාල ප්‍රවේශය සහ/ හෝ එහි ලියාපදිංචිය සඳහා මෙම අධ්‍යයන වර්ෂයේ හෝ පෙර අධ්‍යයන වර්ෂයකදී අසත්‍ය තොරතුරු ප්‍රකාශ කර ඇති සහ/ හෝ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර ඇති සිසුන්.

**සැලකිය යුතුයි :**

**i. යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගැනීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම අධ්‍යයන වර්ෂයට අදාළ ඔහුගේ/ඇයගේ විශ්වවිද්‍යාල තේරී පත්වීම් සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත අවලංගු කිරීමට කටයුතු කරන අතර ඉන් ඉදිරියට කිසිදු අධ්‍යයන වර්ෂයකදී යළිත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට එම ශිෂ්‍යයාට අවසර දෙනු නොලැබේ.**

**ii. තවද, යම් ලෙසකින් විශ්වවිද්‍යාලයකට/උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ශිෂ්‍යයා විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම ශිෂ්‍යයා අදාළ විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.**

## 1.8 විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී සිදුවන ප්‍රමාදය අවම කිරීමට ගන්නා ලද පියවර

1. නොවැලැක්විය හැකි හේතූන් වලදී හැරුණු විට (උදා: අධිකරණ කටයුතු), ඉදිරි වසර වලදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉතා ඉක්මනින් අයදුම්පත් කැඳවීම සිදු කරනු ලබයි.

2. **ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්කර ඇත.** එමගින් අතින් පුරවා එවන අයදුම්පත් පරීක්ෂා කිරීම සඳහා ගතවන කාලය ඉතිරි කර දෙන අතර, වඩාත් ඉක්මනින් කඩඉම් ලකුණු නිකුත් කිරීමටද හැකිවේ.

3. අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීමට අදාළ උපදෙස් මෙම අත්පොතෙහි 5 කොටසේ පැහැදිලිව දක්වා ඇත.

4. ඔබට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අන්තර්ජාල පහසුකම් නොමැතිනම් හෝ අන්තර්ජාලය භාවිත කිරීම පිළිබඳ නිසි අවබෝධයක් නොමැති නම්, මෙම ප්‍රවේශ අත්පොතේ 5 කොටසෙහි අග සඳහන් කර ඇති ඔබගේ ප්‍රදේශයේ ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් (NAC Centers), අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් සහ ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් (ICT Centers) හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ඇති නැණසල මධ්‍යස්ථානයක් වෙත යන්න. ඔවුන් ඔබට ඒ සඳහා අවශ්‍ය අන්තර්ජාල පහසුකම් හා උපකාරයන් **නොමිලේ** ලබා දෙනු ඇත.

5. කඩඉම් ලකුණු නිකුත් කළ පසු, තේරී පත්වූ විශ්වවිද්‍යාලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ අදාළ පාඨමාලාව සඳහා ලියාපදිංචිවීමට සියළුම සිසුන් ඒ සඳහා ඇති අන්තර්ජාල සේවාව භාවිත කළ යුතුය. **මෙයද අනිවාර්ය අවශ්‍යතාවයක් බව සළකන්න.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අන්තර්ජාලය හරහා අයදුම් කිරීමේ සහ ලියාපදිංචිවීමේ ක්‍රියාවලියේ ආරක්ෂිතබව හා රහස්‍යභාවය පිළබඳව වගකියනු ලැබේ.

6. ඉහත 1.6 (5) හි දක්වා ඇති පරිදි අන්තර්ජාලය හරහා සිසුන් තේරී පත් වූ පාඨමාලාව හා විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි කර ගැනීම විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියේ ඇති ප්‍රමාදයන් අවම කිරීමට ගන්නා ලද එක් පියවරකි.

7. අන්තර්ජාලය භාවිතා කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා සිසුන් තේරී පත්වූ විශ්වවිද්‍යාලවල / උසස් අධ්‍යාපන ආයතනවල අදාළ පාඨමාලා සඳහා ලියාපදිංචි වීම හේතුවෙන්, එක් එක් විශ්වවිද්‍යාල මගින් වෙන වෙනම ලියාපදිංචි කටයුතු කිරීමේදී ඇතිවන නොවැලැක්විය හැකි ප්‍රමාදයන් ද මගහරවා ගැනීමට හැකිවී ඇත.

# 2 කොටස

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා සූදානම් විය යුතු ආකාරය පිළිබඳ වැදගත් උපදෙස්**


**2.1** **එක් එක් විෂය ධාරා යටතේ ඇති අධ්‍යයන පාඨමාලා**

**2.2** **ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශවීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සපුරාලිය යුතු පූර්ව අවශ්‍යතා**

**2.2.1** **කලා විෂය ධාරාව**

| | | |
|---|---|---|
| 2.2.1.1 | කලා | 38 |
| 1. | කලා (SP) | 42 |
| 2. | කලා (SAB) | 43 |
| 3. | සන්නිවේදන අධ්‍යයන | 44 |
| 4. | සාමය හා ගැටුම් නිරාකරණය | 46 |
| 5. | ඉස්ලාම් අධ්‍යයන | 46 |
| 6. | අරාබි භාෂා | 47 |
| 7. | ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) | 47 |
| 8. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය කලා | 47 |
| 9. | යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය සහ චිත්‍ර හා නිර්මාණ | 48 |
| 10. | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය හා තාක්‍ෂණික කලා | 49 |
| 2.2.1.2 | සමාජ ව්‍යවහාර‍වේදය | 50 |

**2.2.2** **වාණිජ්‍යය විෂය ධාරාව**

| | | |
|---|---|---|
| 2.2.2.1 | කළමනාකරණය | 52 |
| 2.2.2.2 | කළමනාකරණය (රාජ්‍ය) විශේෂ | 52 |
| 2.2.2.3 | දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය | 52 |
| 2.2.2.4 | වාණිජ්‍යය | 52 |
| 2.2.2.5 | කළමනාකරණ අධ්‍යයන (TV) | 55 |
| 2.2.2.6 | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS) | 56 |

**2.2.3** **ජෛවීය විද්‍යා විෂය ධාරාව**

| | | |
|---|---|---|
| 2.2.3.1 | වෛද්‍ය විද්‍යාව / දන්ත ශල්‍ය විද්‍යාව / පශු වෛද්‍ය විද්‍යාව | 58 |
| 2.2.3.2 | කෘෂි තාක්‍ෂණය සහ කළමනාකරණය | 59 |
| 2.2.3.3 | කෘෂිකර්මය | 59 |

| | | |
|---|---|---|
| 2.2.3.4 | ආහාර විද්‍යාව හා පෝෂණය | 60 |
| 2.2.3.5 | ආහාර විද්‍යාව හා තාක්ෂණය | 60 |
| 2.2.3.6 | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 61 |
| 2.2.3.7 | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 61 |
| 2.2.3.8 | සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 62 |
| 2.2.3.9 | ජෛවීය විද්‍යාව | 62 |
| 2.2.3.10 | ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | 63 |
| 2.2.3.11 | සෞඛ්‍ය ප්‍රවර්ධන | 64 |
| 2.2.3.12 | හෙද | 64 |
| 2.2.3.13 | ඖෂධ විද්‍යාව | 65 |
| 2.2.3.14 | වෛද්‍ය රසායනාගාර විද්‍යා | 66 |
| 2.2.3.15 | විකිරණ ශිල්පය | 66 |
| 2.2.3.16 | භෞත චිකිත්ස | 67 |
| 2.2.3.17 | අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 67 |
| 2.2.3.18 | ධීවර සහ සාගර විද්‍යාව | 68 |
| 2.2.3.19 | පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | 68 |
| 2.2.3.20 | සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | 69 |
| 2.2.3.21 | ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | 69 |
| 2.2.3.22 | කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | 70 |
| 2.2.3.23 | කෘෂි ව්‍යාපාර කළමනාකරණය | 70 |
| 2.2.3.24 | හරිත තාක්ෂණය | 71 |
| 2.2.3.25 | සත්ත්ව පාලන විද්‍යාව | 71 |
| 2.2.3.26 | අපනයන කෘෂිකර්මය | 72 |
| 2.2.3.27 | ජලජ සම්පත් තාක්ෂණය | 73 |
| **2.2.4** | **භෞතීය විද්‍යා විෂය ධාරාව** | |
| 2.2.4.1 | ඉංජිනේරු විද්‍යාව | 75 |
| 2.2.4.2 | ඉංජිනේරු විද්‍යාව (EM) | 76 |
| 2.2.4.3 | ඉංජිනේරු විද්‍යාව (TM) | 76 |
| 2.2.4.4 | භෞතීය විද්‍යාව | 77 |
| 2.2.4.5 | පරිගණක විද්‍යාව | 77 |
| 2.2.4.6 | ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | 79 |
| 2.2.4.7 | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 80 |
| 2.2.4.8 | කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය | 80 |
| 2.2.4.9 | සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ | 81 |
| 2.2.4.10 | ආගණනය සහ තොරතුරු පද්ධති | 81 |
| 2.2.4.11 | භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 82 |
| **2.2.5** | **ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව** | |
| 2.2.5.1 | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 85 |
| **2.2.6** | **ජෛවපද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව** | |
| 2.2.6.1 | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 87 |

| | | |
|---|---|---|
| **2.2.7** | **තොරතුරු සන්නිවේදන තාක්ෂණය** | 89 |
| **2.2.8** | **විවිධ විෂය ධාරාවන්වල සිසුන් සුදුසුකම් ලබන පාඨමාලා** | |
| 2.2.8.1 | තොරතුරු තාක්ෂණය (IT) | 91 |
| 2.2.8.2 | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT) | 91 |
| 2.2.8.3 | ප්‍රමාණ සමීක්ෂණය | 92 |
| 2.2.8.4 | මැනුම් විද්‍යාව | 93 |
| 2.2.8.5 | නගර හා ග්‍රාම නිර්මාණය | 93 |
| 2.2.8.6 | වාස්තු විද්‍යාව | 94 |
| 2.2.8.7 | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | 96 |
| 2.2.8.8 | භූමි නිර්මාණවේදය | 97 |
| 2.2.8.9 | නිර්මාණවේදය | 98 |
| 2.2.8.10 | නීතිය | 99 |
| 2.2.8.11 | පහසුකම් කළමනාකරණය | 100 |
| 2.2.8.12 | පරිගණනය සහ කළමනාකරණය | 101 |
| 2.2.8.13 | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) | 102 |
| 2.2.8.14 | විද්‍යාව සහ තාක්ෂණය | 102 |
| 2.2.8.15 | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | 104 |
| 2.2.8.16 | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | 105 |
| 2.2.8.17 | තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 106 |
| 2.2.8.18 | කාර්මික තොරතුරු තාක්ෂණය | 106 |
| 2.2.8.19 | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | 107 |
| 2.2.8.20 | තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 107 |
| 2.2.8.21 | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 108 |
| 2.2.8.22 | ශාරීරික අධ්‍යාපනය | 108 |
| 2.2.8.23 | ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | 109 |
| 2.2.8.24 | කථන හා ශ්‍රවණ විද්‍යා | 110 |
| 2.2.8.25 | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 110 |
| 2.2.8.26 | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | 111 |
| 2.2.8.27 | තොරතුරු පද්ධති | 112 |
| 2.2.8.28 | පරිවර්තන අධ්‍යයන | 113 |
| 2.2.8.29 | සිනමා හා රූපවාහිනී අධ්‍යයන | 114 |
| 2.2.8.30 | ව්‍යාපෘති කළමනාකරණය | 114 |
| 2.2.8.31 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | 115 |
| 2.2.8.32 | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 117 |
| 2.2.8.33 | ආහාර ව්‍යාපාර කළමනාකරණය | 117 |
| 2.2.8.34 | සාගර සහ මිරිදිය විද්‍යාව | 118 |
| 2.2.8.35 | ව්‍යාපාර විද්‍යාව | 119 |
| 2.2.8.36 | මූල්‍ය ඉංජිනේරුකරණය | 119 |
| 2.2.8.37 | භූගෝලීය තොරතුරු විද්‍යාව | 120 |
| 2.2.8.38 | මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය | 121 |
| 2.2.8.39 | මානව සම්පත් සංවර්ධනය | 121 |

# 2 කොටස

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා සූදානම් විය යුතු ආකාරය පිළිබඳ වැදගත් උපදෙස්**

## 2.1 එක් එක් විෂය ධාරා යටතේ ඇති අධ්‍යයන පාඨමාලා

එක් එක් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල විවිධ අධ්‍යයන පාඨමාලා පවතී. ඇතැම් විට සමාන අධ්‍යයන පාඨමාලා හැඳින්වීමට විවිධ විශ්වවිද්‍යාල යොදා ගන්නා නම්වල සුළු වශයෙන් වෙනස්කම් ඇති බව ඔබට දක්නට ලැබෙනු ඇත. එසේම, තමන් සතුව ඇති ප්‍රවීණතා හා පහසුකම් අනුව තමන් ලබාදෙන පාඨමාලා මොනවාද යන්න තීරණය කිරීමටද විශ්වවිද්‍යාලවලට හැකියාව පවතී.

අ.පො.ස. (උසස් පෙළ) විභාග විෂයයන් පහත දැක්වෙන පරිදි ප්‍රධාන විෂය ධාරා හයකට (06) වර්ග කර ඇත

(1) කලා විෂය ධාරාව
(2) වාණිජ්‍යය විෂය ධාරාව
(3) ජෛවීය විද්‍යා විෂය ධාරාව
(4) භෞතීය විද්‍යා විෂය ධාරාව
(5) ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂය ධාරාව
(6) ජෛවපද්ධති තාක්‍ෂණවේදය විෂය ධාරාව

ඉහත විෂය ධාරාවන් යටතේ පවතින අධ්‍යයන පාඨමාලා පිළිබඳව එනම්, ඒවා පවත්වනු ලබන විශ්වවිද්‍යාල, ලබාදෙන උපාධි පාඨමාලා සහ එම පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳව පහත පිටු අංක 25 සිට 121 දක්වා විස්තර කර ඇත.

## (1) කලා විෂය ධාරාව

### 1. කලා - (ARTS)

- කොළඹ විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

### 2. කලා (SP) - [ARTS (SP)]

- ශ්‍රීපාලි මණ්ඩපය

3. කලා (SAB) - [ARTS (SAB)]

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

4. සන්නිවේදන අධ්‍යයන - (COMMUNICATION STUDIES)

- ත්‍රිකුණාමල මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

5. සාමය හා ගැටුම් නිරාකරණය - (PEACE AND CONFLICT RESOLUTION)

- කැලණිය විශ්වවිද්‍යාලය

6. ඉස්ලාම් අධ්‍යයනය - (ISLAMIC STUDIES)

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

7. අරාබි භාෂාව - (ARABIC LANGUAGE)

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

8. ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම - [TEACHING ENGLISH AS A SECOND LANGUAGE (TESL)]

- කැලණිය විශ්වවිද්‍යාලය

9. සමාජ වෘතවේදය - (SOCIAL WORK)

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ඉහත 1 සිට 9 දක්වා පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදුවේ.**

10. සංගීතය - (MUSIC)

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
- ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය
- ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය

11. නර්තනය - (DANCE)

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
- ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය
- ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය

12. නාට්‍ය හා රංග කලා - (DRAMA & THEATRE)

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
- ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

13. දෘශ්‍ය කලා - (VISUAL ARTS)

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

14. දෘශ්‍ය හා තාක්ෂණික කලා - (VISUAL & TECHNOLOGICAL ARTS)

- ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

15. චිත්‍ර හා නිර්මාණ - (ART & DESIGN)

- ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය

## (2) වාණිජ්‍යය විෂය ධාරාව

1. කළමනාකරණය - (MANAGEMENT)

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

2. කළමනාකරණය (රාජ්‍ය) විශේෂ - [MANAGEMENT (PUBLIC) SPECIAL]

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

3. දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය - (ESTATE MANAGEMENT & VALUATION)

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

4. වාණිජ්‍යය - (COMMERCE)

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

5. කළමනාකරණ අධ්‍යයන (TV) - [MANAGEMENT STUDIES (TV)]

- ත්‍රිකුණාමල මණ්ඩපය
- වව්නියා මණ්ඩපය

6. ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) - [BUSINESS INFORMATION SYSTEMS (SPECIAL)] (BIS)

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## (3) ජෛවීය විද්‍යා විෂය ධාරාව

**1. වෛද්‍ය විද්‍යාව - (MEDICINE)**

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- මොරටුව විශ්වවිද්‍යාලය

**2. දන්ත ශල්‍ය විද්‍යාව - (DENTAL SURGERY)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**3. පශු වෛද්‍ය විද්‍යාව - (VETERINARY SCIENCE)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**4. කෘෂි තාක්‍ෂණය සහ කළමනාකරණය - (AGRICULTURAL TECHNOLOGY & MANAGEMENT)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**5. කෘෂිකර්මය - (AGRICULTURE)**

- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**6. ආහාර විද්‍යාව හා පෝෂණය - (FOOD SCIENCE & NUTRITION)**

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**7. ආහාර විද්‍යාව හා තාක්‍ෂණය - (FOOD SCIENCE & TECHNOLOGY)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**8. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (AYURVEDIC MEDICINE AND SURGERY)**

- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

9. **යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (UNANI MEDICINE AND SURGERY)**

- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

10. **සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (SIDDHA MEDICINE AND SURGERY)**

- යාපනය විශ්වවිද්‍යාලය
- ත්‍රිකුණාමල මණ්ඩපය

11. **ජෛවීය විද්‍යාව - (BIOLOGICAL SCIENCE)**

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

12. **ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) - [APPLIED SCIENCES (BIOLOGICAL SCIENCE)]**

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- වව්නියා මණ්ඩපය

13. **සෞඛ්‍ය ප්‍රවර්ධන - (HEALTH PROMOTION)**

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

14. **හෙද - (NURSING)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- කොළඹ විශ්වවිද්‍යාලය

15. **ඖෂධ විද්‍යාව - (PHARMACY)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය

**16. වෛද්‍ය රසායනාගාර විද්‍යා - (MEDICAL LABORATORY SCIENCES)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය

**17. විකිරණ ශිල්පය - (RADIOGRAPHY)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**18. භෞත චිකිත්ස - (PHYSIOTHERAPY)**

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**19. අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව - (MOLECULAR BIOLOGY & BIOCHEMISTRY)**

- කොළඹ විශ්වවිද්‍යාලය

**20. ධීවර සහ සාගර විද්‍යාව - (FISHERIES & MARINE SCIENCES)**

- රුහුණ විශ්වවිද්‍යාලය

**21. පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - (ENVIRONMENTAL CONSERVATION & MANAGEMENT)**

- කැලණිය විශ්වවිද්‍යාලය

**22. සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව - (ANIMAL SCIENCE & FISHERIES)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**23. ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය - (FOOD PRODUCTION & TECHNOLOGY MANAGEMENT)**

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**24. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය - (AGRICULTURAL RESOURCE MANAGEMENT AND TECHNOLOGY)**

- රුහුණ විශ්වවිද්‍යාලය

**25. කෘෂිව්‍යාපාර කළමනාකරණය - (AGRIBUSINESS MANAGEMENT)**

- රුහුණ විශ්වවිද්‍යාලය

**26. හරිත තාක්ෂණය - (GREEN TECHNOLOGY)**

- රුහුණ විශ්වවිද්‍යාලය

27. සත්ත්ව පාලන විද්‍යාව - (ANIMAL SCIENCE)

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

28. අපනයන කෘෂිකර්මය - (EXPORT AGRICULTURE)

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

29. ජලජ සම්පත් තාක්ෂණය - (AQUATIC RESOURCES TECHNOLOGY)

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## (4) භෞතීය විද්‍යා විෂය ධාරාව

1. ඉංජිනේරු විද්‍යාව - (ENGINEERING)

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- මොරටුව විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2. ඉංජිනේරු විද්‍යාව (EM) - භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව
[ENGINEERING (EM) - EARTH RESOURCES ENGINEERING]

- මොරටුව විශ්වවිද්‍යාලය

3. ඉංජිනේරු විද්‍යාව (TM) - පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය
[ENGINEERING (TM) - TEXTILE & CLOTHING TECHNOLOGY]

- මොරටුව විශ්වවිද්‍යාලය

4. භෞතීය විද්‍යාව - (PHYSICAL SCIENCE)

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**5. පරිගණක විද්‍යාව - (COMPUTER SCIENCE)**

- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
- ත්‍රිකුණාමල මණ්ඩපය
- කැලණිය විශ්වවිද්‍යාලය

**6. ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) - [APPLIED SCIENCES (PHYSICAL SCIENCE)]**

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- වව්නියා මණ්ඩපය
- ත්‍රිකුණාමල මණ්ඩපය

**7. ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය - (TRANSPORT & LOGISTICS MANAGEMENT)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**8. කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය - (INDUSTRIAL STATISTICS & MATHEMATICAL FINANCE)**

- කොළඹ විශ්වවිද්‍යාලය

**9. සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ - (STATISTICS & OPERATIONS RESEARCH)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**10. ආගනණය සහ තොරතුරු පද්ධති - (COMPUTING & INFORMATION SYSTEMS)**

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**11. භෞතිය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - (PHYSICAL SCIENCE - ICT)**

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය

## (5) ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

**1. ඉංජිනේරු තාක්ෂණවේදය - [ENGINEERING TECHNOLOGY (ET)]**

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## (6) ජෛවපද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව

**1. ජෛවපද්ධති තාක්ෂණවේදය - [BIOSYSTEMS TECHNOLOGY (BST)]**

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය

## (7) තොරතුරු සන්නිවේදන තාක්ෂණය - (INFORMATION COMMUNICATION TECHNOLOGY)

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- වව්නියා මණ්ඩපය
- කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**(8) විවිධ විෂය ධාරා යටතේ පෙනී සිටි සිසුන් සුදුසුකම් ලබන පාඨමාලා**

**1. තොරතුරු තාක්ෂණය - [INFORMATION TECHNOLOGY (IT)]**

- මොරටුව විශ්වවිද්‍යාලය

**2. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය - [MANAGEMENT AND INFORMATION TECHNOLOGY (MIT)]**

- කැලණිය විශ්වවිද්‍යාලය

**3. ප්‍රමාණ සමීක්ෂණය - (QUANTITY SURVEYING)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**4. මැනුම් විද්‍යාව - (SURVEYING SCIENCE)**

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**5. නගර හා ග්‍රාම නිර්මාණය - (TOWN & COUNTRY PLANNING)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**6. වාස්තු විද්‍යාව - (ARCHITECTURE)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**7. විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය - (FASHION DESIGN & PRODUCT DEVELOPMENT)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**8. භූමි නිර්මාණවේදය - (LANDSCAPE ARCHITECTURE)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**9. නිර්මාණවේදය - (DESIGN)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**10. නීතිය - (LAW)**

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය

**11. පහසුකම් කළමනාකරණය - (FACILITIES MANAGEMENT)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**12. පරිගණනය සහ කළමනාකරණය - (COMPUTATION & MANAGEMENT)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**13. කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) - [MANAGEMENT AND INFORMATION TECHNOLOGY (SEUSL)]**

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**14. විද්‍යාව සහ තාක්ෂණය - (SCIENCE AND TECHNOLOGY)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**15. පරිගණක විද්‍යාව සහ තාක්ෂණය - (COMPUTER SCIENCE & TECHNOLOGY)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**16. ව්‍යවසායකත්වය සහ කළමනාකරණය - (ENTREPRENEURSHIP & MANAGEMENT)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**17. තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම - (TEA TECHNOLOGY & VALUE ADDITION)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**18. කාර්මික තොරතුරු තාක්ෂණය - (INDUSTRIAL INFORMATION TECHNOLOGY)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**19. ඛනිජ සම්පත් සහ තාක්ෂණය - (MINERAL RESOURCES AND TECHNOLOGY)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**20. තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම - (PALM AND LATEX TECHNOLOGY & VALUE ADDITION)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

21. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය - (HOSPITALITY, TOURISM AND EVENTS MANAGEMENT)

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

22. ශාරීරික අධ්‍යාපනය - (PHYSICAL EDUCATION)

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

23. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය - (SPORTS SCIENCE & MANAGEMENT)

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

24. කථන හා ශ්‍රවණ විද්‍යා - (SPEECH AND HEARING SCIENCES)

- කැලණිය විශ්වවිද්‍යාලය

25. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය - (INFORMATION TECHNOLOGY & MANAGEMENT)

- මොරටුව විශ්වවිද්‍යාලය

26. සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය - (TOURISM & HOSPITALITY MANAGEMENT)

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

27. තොරතුරු පද්ධති - (INFORMATION SYSTEMS)

- කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

28. පරිවර්තන අධ්‍යයන - (TRANSLATION STUDIES)

- කැලණිය විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

29. සිනමා හා රූපවාහිනී අධ්‍යයන - (FILM & TELEVISION STUDIES)

- කැලණිය විශ්වවිද්‍යාලය

**30.** **ව්‍යාපෘති කළමනාකරණය - (PROJECT MANAGEMENT)**

- වව්නියා මණ්ඩපය

**31.** **තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - [INFORMATION AND COMMUNICATION TECHNOLOGY (ICT)]**

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- වව්නියා මණ්ඩපය

**32.** **මෘදුකාංග ඉංජනේරු විද්‍යාව - (SOFTWARE ENGINEERING)**

- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**33.** **ආහාර ව්‍යාපාර කළමනාකරණය - (FOOD BUSINESS MANAGEMENT)**

- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**34.** **සාගර සහ මිරිදිය විද්‍යාව - (MARINE AND FRESH WATER SCIENCES)**

- රුහුණ විශ්වවිද්‍යාලය

**35.** **ව්‍යාපාර විද්‍යාව - (BUSINESS SCIENCE)**

- මොරටුව විශ්වවිද්‍යාලය

**36.** **මූල්‍ය ඉංජනේරුකරණය - (FINANCIAL ENGINEERING)**

- කැලණිය විශ්වවිද්‍යාලය

**37.** **භූගෝලීය තොරතුරු විද්‍යාව - (GEOGRAPHICAL INFORMATION SCIENCE)**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**38.** **මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය - (FINANCIAL MATHEMATICS AND INDUSTRIAL STATISTICS)**

- රුහුණ විශ්වවිද්‍යාලය

**39.** **මානව සම්පත් සංවර්ධනය - (HUMAN RESOURCE DEVELOPMENT)**

- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## 2.2 ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශවීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සපුරාලිය යුතු පූර්ව අවශ්‍යතා

### 2.2.1 කලා විෂය ධාරාව

**2.2.1.1 කලා - (ARTS)**
**(පාඨමාලා කේතය - 019)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 6300)**

- කලා අධ්‍යයන පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට නම්, අපේක්ෂකයන් විසින් අදාළ විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S)සාමාර්ථ ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා කලා විෂය ධාරාව යටතේ බොහෝ විෂයයන් සංඛ්‍යාවක් ඇති බැවින්, එම විෂයයන් කාණ්ඩ හතරක් යටතේ වර්ගීකරණය කර ඇත.
- එබැවින්, අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා එම කාණ්ඩ වලින් විෂයයන් තුනක් සඳහා පෙනී සිටිය යුතුය.

**01 වන කාණ්ඩය - සමාජීය විද්‍යා / ව්‍යවහාරික සමාජ අධ්‍යයනඃ**

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ඉතිහාසය
4. ගෘහ ආර්ථික විද්‍යාව
5. කෘෂි විද්‍යාව/ ගණිතය/ සංයුක්ත ගණිතය
6. සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
8. ගිණුම්කරණය/ ව්‍යාපාර සංඛ්‍යානය
9. දේශපාලන විද්‍යාව
10. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
11. තාක්ෂණවේදය විෂයයන්ගෙන් එක් විෂයයක් පමණක් :
    - සිවිල් තාක්ෂණය
    - විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය
    - කෘෂි තාක්ෂණවේදය
    - යාන්ත්‍රික තාක්ෂණය
    - ආහාර තාක්ෂණය
    - ජීව සම්පත් තාක්ෂණය

**01 වන කාණ්ඩයෙන් විෂයයන් තෝරා ගැනීමට උපදෙස් :**

- සිසුන් මෙම කාණ්ඩයෙන් අවම වශයෙන් එක් විෂයයක් හෝ තෝරා ගත යුතුය.
- අවශ්‍යනම් විෂයයන් තුනම පළමු වන කාණ්ඩයෙන් තෝරා ගත හැකිය.

ඉහත නීතිය අදාළ නොවන අවස්ථා තුනක් පවතී. එනම් ;

1. 04 වන කාණ්ඩයෙන් ( භාෂා කාණ්ඩය) ජාතික භාෂා තුන, එනම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි තෝරා ගන්නා ශිෂ්‍යයෙකුට 01 වන කාණ්ඩයෙන් කිසිඳු විෂයයක් තෝරා ගැනීම අවශ්‍ය නොවේ.
2. ජාතික සහ සම්භාව්‍ය භාෂා සංකලනයක් තෝරා ගන්නා ශිෂ්‍යයෙකුට 01 වන කාණ්ඩයෙන් කිසිඳු විෂයයක් තෝරා ගැනීම අවශ්‍ය නොවේ.

**ජාතික භාෂා වන්නේ;**

| | | |
|---|---|---|
| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |

**සම්භාව්‍ය භාෂා වන්නේ;**

| | | |
|---|---|---|
| අරාබි | පාලි | සංස්කෘත |

උදාහරණයක් වශයෙන් කිසියම් ශිෂ්‍යයෙකුට සිය විෂයයන් තුන ලෙස සිංහල, පාලි සහ සංස්කෘත තෝරා ගත හැකිය. එවැනි ශිෂ්‍යයෙකු 01 වන කාණ්ඩයෙන් කිසිඳු විෂයයක් තෝරා ගැනීම අවශ්‍ය නොවේ.

නමුත් කිසිඳු ශිෂ්‍යයෙකුට සිය විෂයයන් තුන ලෙස සම්භාව්‍ය භාෂා තුනක් තෝරා ගත නොහැකිය. තෝරා ගත හැකි උපරිම සම්භාව්‍ය භාෂා සංඛ්‍යාව දෙකකි.

3. 04 වන කාණ්ඩයෙන් භාෂා දෙකක් හා තුන්වන විෂය ලෙස පිළිවෙලින් පහත 02 වන හා 03 වන කාණ්ඩයන්හි දැක්වෙන ආගම් සහ ශිෂ්ටාචාර හෝ සෞන්දර්ය අධ්‍යයන විෂයයක් තෝරා ගත් ශිෂ්‍යයෙකුට 01 වන කාණ්ඩයෙන් කිසිඳු විෂයයක් තෝරා ගැනීම අවශ්‍ය නොවේ.

**02 වන කාණ්ඩය - ආගම් සහ ශිෂ්ටාචාර :**

1. බුද්ධ ධර්මය
2. හින්දු ධර්මය
3. ක්‍රිස්තු ධර්මය
4. ඉස්ලාම්
5. බෞද්ධ ශිෂ්ටාචාරය
6. හින්දු ශිෂ්ටාචාරය
7. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
8. ඉස්ලාම් ශිෂ්ටාචාරය
9. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

**02 වන කාණ්ඩයෙන් විෂයයන් තෝරාගැනීමට උපදෙස්:**

- කිසියම් ශිෂ්‍යයෙකුට 02 වන කාණ්ඩයෙන් තෝරා ගත හැකි උපරිම විෂයයන් සංඛ්‍යාව දෙකකි.
- නමුත්, ආගම් විෂයක් (උදා: බුද්ධ ධර්මය) තෝරාගෙන ඇති අවස්ථාවකදී අනෙත් විෂය ලෙස තෝරාගත් ආගම් විෂයට අදාළ ශිෂ්ඨාචාර විෂය (උදා: බෞද්ධ ශිෂ්ඨාචාරය) තෝරා ගත නොහැක.

**03 වන කාණ්ඩය - සෞන්දර්ය අධ්‍යයන :**

සෞන්දර්ය විෂයයන් විෂය කොටස් හතරකින් සමන්විත වේ. ඒවා නම් ;

1. චිත්‍ර
2. නර්තනය
3. සංගීතය
4. නාට්‍ය සහ රංග කලාව

මේවා පහත පරිදි වැඩිදුරටත් බෙදා වෙන්කළ හැකිය;

1. චිත්‍ර

2. නර්තනය
   (අ) දේශීය
   (ආ) භාරත

3. සංගීතය
   (අ) පෙරදිග
   (ආ) කර්ණාටක
   (ඇ) බටහිර

4. නාට්‍ය සහ රංග කලාව
   (අ) සිංහල
   (ආ) දෙමළ
   (ඇ) ඉංග්‍රීසි

**03 වන කාණ්ඩයෙන් විෂයයන් තෝරාගැනීමට උපදෙස් :**

- කිසියම් ශිෂ්‍යයෙකුට ඉහත විෂය කොටස් හතරෙන් විෂයයන් දෙකක් තෝරා ගත හැකිය. නමුත් කිසිදු ශිෂ්‍යයෙකුට එකම විෂය කොටසකින් සිය විෂයයන් දෙක තෝරා ගත නොහැකිය.

**04 වන කාණ්ඩය – භාෂා:**

මෙම භාෂා කාණ්ඩය විෂය කොටස් තුනකින් සමන්විත වේ. ඒවා නම් ;

1. ජාතික භාෂා
2. සම්භාව්‍ය භාෂා
3. විදේශීය භාෂා

**ජාතික භාෂා වන්නේ :**

- සිංහල
- දෙමළ
- ඉංග්‍රීසි

**සම්භාව්‍ය භාෂා වන්නේ :**

- අරාබි
- පාලි
- සංස්කෘත

**විදේශීය භාෂා වන්නේ :**

- චීන
- ප්‍රංශ
- ජර්මන්
- හින්දි
- ජපන්
- මැලේ
- රුසියන්

**04 වන කාණ්ඩයෙන් විෂයයන් තෝරාගැනීමට උපදෙස්:**

- මෙම කාණ්ඩයෙන් සිසුනට උපරිම වශයෙන් තෝරාගත හැක්කේ විෂයයන් දෙකකි. උදාහරණ වශයෙන්, විෂයන් තුනක් තෝරා ගැනීමේදී, ශිෂ්‍යයෙකුට චීන හා ප්‍රංශ 04 වන කාණ්ඩයෙන්ද, අනෙක් විෂය වෙනත් කාණ්ඩයකින්ද තෝරා ගත හැකිය.

  නමුත්, මෙම නීතිය අදාළ නොවන අවස්ථා පවතී. ඒවා මීට ඉහතදී 01 වන කාණ්ඩයෙන් විෂයයන් තෝරා ගැනීම සඳහා ලබාදුන් උපදෙස් යටතේද විස්තර කර ඇත.

  ඒවා නම්;

  (අ) කිසියම් ශිෂ්‍යයෙකුට ජාතික භාෂා තුන තෝරා ගත හැකිය.

  උදා: සිංහල, දෙමළ හා ඉංග්‍රීසි

  (ආ) කිසියම් ශිෂ්‍යයෙකුට අවම වශයෙන් එක් විෂයයක් ජාතික භාෂා වලින්ද ඉතිරි විෂයයන් දෙක සම්භාව්‍ය භාෂා වලින්ද තෝරා ගත හැකිය.

  නමුත්, කිසිදු ශිෂ්‍යයෙකුට සම්භාව්‍ය භාෂා තුනක් හෝ විදේශීය භාෂා තුනක් තෝරා ගත නොහැකිය.

- ඉහත උපදෙස් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල කලා අධ්‍යයන පාඨමාලාව යටතේ ඇති විවිධ ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අවශ්‍ය විෂය සංකලනයක් තෝරා ගැනීමට ඔබට උපකාරීවනු ඇත.

- නමුත්, ඇතැම් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් කලා විෂය ධාරාව යටතේ පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී ඉහත සඳහන් කළ විෂය සංකලනයන්ට වඩා වෙනස් විෂය සංකලනයන් අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී හදාරා තිබීම අපේක්ෂා කෙරේ. එයට හේතුව වන්නේ, එම උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නංවා එමගින් රැකියා අවස්ථා උදා කර දීමට සහ සමාජයේ ඉල්ලුමට සරිලන පරිදි සිය උපාධි පාඨමාලාවන් සකසා ගැනීමේ අවශ්‍යතාවයි.

විවිධ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගින් ලබාදෙන එවැනි අධ්‍යයන පාඨමාලා දහයක් (10) පහත දැක්වේ.

1. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය මගින් පවත්වනු ලබන ප්‍රසංග කලා සහ ජනමාධ්‍ය අධ්‍යයන පාඨමාලාවන්
2. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන කලා අධ්‍යයන පාඨමාලාව
3. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය මගින් පවත්වනු ලබන සන්නිවේදන අධ්‍යයන පාඨමාලාව
4. කැළණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන සාමය හා ගැටුම් නිරාකරණය අධ්‍යයන පාඨමාලාව
5. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉස්ලාම් අධ්‍යයන පාඨමාලාව
6. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අරාබි භාෂා පාඨමාලාව
7. කැළණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම අධ්‍යයන පාඨමාලාව
8. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය කලා අධ්‍යයන පාඨමාලා
9. යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය සහ චිත්‍ර හා නිර්මාණ අධ්‍යයන පාඨමාලා
10. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා අධ්‍යයන පාඨමාලා

මෙම අධ්‍යයන පාඨමාලා පිළිබඳ විස්තර පහත දැක්වේ.

## 1. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය මගින් පවත්වනු ලබන කලා අධ්‍යයන පාඨමාලාව - [ARTS (SP)]
**(පාඨමාලා කේත : ජනමාධ්‍ය - 020; ප්‍රසංග කලා - 041)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යා : ජනමාධ්‍ය - 100; ප්‍රසංග කලා - 100)**

මෙම අධ්‍යයන පාඨමාලාව යටතේ උපාධි පාඨමාලා දෙකක් පවත්වනු ලබයි. එනම්;

1. ශාස්ත්‍රවේදී (ප්‍රසංග කලා) විශේෂ උපාධි පාඨමාලාව
2. ශාස්ත්‍රවේදී (ජනමාධ්‍ය) විශේෂ උපාධි පාඨමාලාව

මෙම උපාධි පාඨමාලා දෙකෙහිම කාලය වසර 04 කි.

මෙම පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී කලා විෂය ධාරාවේ විෂය කාණ්ඩ වලින් විෂයයන් තුනක් සඳහා පෙනී සිටිය යුතුය. ඉහත පාඨමාලා දෙක සඳහා සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු වෙනත් විශේෂ අවශ්‍යතා පහත සඳහන් වේ.

අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා කලා විෂය ධාරාවේ විෂය කාණ්ඩවලින් විෂයයන් තුනක් පහත කොන්දේසි යටතේ හදාරා තිබිය යුතුය.

1. භාෂා විෂයයන් දෙකකට වඩා පෙනී නොසිටිය යුතුය.

2. ආගම සහ ශිෂ්ඨාචාර කාණ්ඩයෙන් එක් විෂයයකට වඩා පෙනී නොසිටිය යුතුය.

3. තාක්‍ෂණවේදය විෂයයන් එකකට වඩා පෙනී නොසිටිය යුතුය.

4. පහත සඳහන් විෂයයන්ගෙන් එකකට වඩා පෙනී නොසිටිය යුතුය.

   1. ගිණුම්කරණය
   2. ව්‍යාපාර සංඛ්‍යානය
   3. ආර්ථික විද්‍යාව

මීට අමතරව, පහත සඳහන් විශේෂ අවශ්‍යතාවයන්ද සපුරාලිය යුතුය. එනම්;

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

   අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමඟ එවිය යුතුය. එම සහතිකය එවීමට අපොහොසත් වුවහොත් ඉහත පාඨමාලාව සඳහා ඔබේ අයදුම්පත්‍රය සළකා බලනු නොලැබේ.

2. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

   කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය විසින් පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්‍ෂණයට පෙනී සිටීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

   එම යෝග්‍යතා පරීක්‍ෂණය ශ්‍රීපාලි මණ්ඩපය මගින් තීරණය කරන පරිදි වාචික, ප්‍රායෝගික හෝ ලිඛිත නැතහොත් මෙම අංශ තුනෙන්ම සමන්විත විය හැකිය. වැඩි විස්තර සඳහා අපේක්‍ෂකයන් හොරණ පිහිටි කොළඹ විශ්විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විමසිය යුතුය.

## 2. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන කලා අධ්‍යයන පාඨමාලාව - [ARTS (SAB)]

**(පාඨමාලා කේතය - 021)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 281)**

කලා විෂය ධාරාවෙන් පමණක් නොව වාණිජ්‍ය විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුනටද මෙම අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කළ හැකිය. මේ යටතේ ලබාදෙන උපාධි පාඨමාලා දෙක වන්නේ :

1. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය - පාඨමාලා කාලය - වසර හතරකි
2. ශාස්ත්‍රවේදී උපාධිය - පාඨමාලා කාලය - වසර තුනකි

මෙම සිව් අවුරුදු ගෞරව උපාධිය සඳහා සිසුන් තෝරා ගැනීම, පළමු වසරේදී සිසුන්ගේ කුසලතා මත පදනම්ව සිදු කෙරේ.

මෙම උපාධි පාඨමාලා දෙක යටතේ ඇති ප්‍රධාන විෂයයන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 1. | ආර්ථික විද්‍යාව | - | (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්) |
| 2. | සංඛ්‍යානය | - | (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්) |
| 3. | භූගෝල විද්‍යාව | - | (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්) |
| 4. | සමාජ විද්‍යාව | - | (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්) |
| 5. | දේශපාලන විද්‍යාව | - | (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්) |
| 6. | සිංහල | | |
| 7. | දෙමළ | | |
| 8. | ඉංග්‍රීසි | | |
| 9. | ජපන් භාෂාව | | |
| 10. | හින්දි භාෂාව | | |
| 11. | චීන භාෂාව | | |
| 12. | ජර්මන් භාෂාව | | |
| 13. | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | - | (ඉංග්‍රීසි මාධ්‍යය පමණි) |

**සිසුන් තෝරා ගැනීමේ පදනම :**

කලා හා වාණිජ්‍ය යන විෂය ධාරාවන් දෙකෙහිම සිසුනට මේ සඳහා අවස්ථාව හිමිවන බැවින්, පවතින මුළු ප්‍රවේශ සංඛ්‍යාවෙන් (281), 55% ක් පමණ කලා විෂය ධාරාව යටතේ පෙනී සිටි සිසුන් සඳහා ද, ඉතිරිය වාණිජ්‍ය විෂය ධාරාව යටතේ පෙනී සිටි සිසුන් සඳහා ද ලබා දෙනු ලැබේ.

**3. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය මගින් පවත්වනු ලබන සන්නිවේදන අධ්‍යයන පාඨමාලාව - (COMMUNICATION STUDIES)**
**(පාඨමාලා කේතය - 029)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 200)**

මෙම අධ්‍යයන පාඨමාලාව යටතේ ත්‍රිකුණාමල මණ්ඩපය මගින් උපාධි පාඨමාලා දෙකක් ලබාදේ. එනම්,

1. ශාස්ත්‍රවේදී (සන්නිවේදන අධ්‍යයන)
2. ශාස්ත්‍රවේදී (භාෂා)

ඉහත පාඨමාලා ද්විත්වය සඳහා ඇතුළත් කරගන්නා සිසුන්, විශ්වවිද්‍යාලය මගින් නියම කර ඇති සුදුසුකම් සපුරාලන්නේ නම්, ඔවුන්ගේ අභිමතය පරිදි වසර තුනක සාමාන්‍ය උපාධිය වසර හතරක විශේෂ උපාධියක් දක්වා දීර්ඝ කරගත හැකිය. හතරවන වසරේදී පීඨය සහ සනාතන සභාව මගින් තීරණය කරනු ලැබූ විශේෂවේදී උපාධියට අදාළ වූ විෂයයන්ගේ අමතර මොඩියුලයන් ශිෂ්‍යයන්ට පිරිනමනු ලැබේ.

මෙම පාඨමාලාව සඳහා සිසුන් තෝරාගන්නා ක්‍රමවේදය ඉතා නම්‍යශීලීය. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ඕනෑම අපේක්ෂකයෙකු [(විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම සහ සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම)] මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන නමුත්, එම විෂයයන් තුනෙන් අනිවාර්යයෙන්ම එක් විෂයක් ලෙස සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

කෙසේ නමුත්, මෙය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වන පාඨමාලාවක් බැවින්, සිසුන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙම පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

එක් එක් උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කරගන්නා උපරිම සිසුන් සංඛ්‍යාව මණ්ඩපයේ තෝරා ගැනීමේ පටිපාටියට අනුකූලව ත්‍රිකුණාමල මණ්ඩපය මගින් තීරණය කරනු ලබයි.

සටහන :

**2022/2023 අධ්‍යයන වර්ෂයේ සිට සන්නිවේදන අධ්‍යයන පාඨමාලාව පහත සඳහන් පරිදි අධ්‍යයන පාඨමාලා දෙකකට වෙන්කර එම පාඨමාලා දෙක සඳහා වෙන වෙනම සිසුන් තෝරා ගැනෙනු ලැබේ. එම අධ්‍යයන පාඨමාලා දෙක නම් ,**

1. **සන්නිවේදන අධ්‍යයන**
2. **භාෂා**

**1. සන්නිවේදන අධ්‍යයන**

**සන්නිවේදන අධ්‍යයන පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2022/2023 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් පහත සඳහන් කාණ්ඩ තුන අතුරින් එක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති අදාළ අවම සුදුසුකම් සපුරාලිය යුතුය.**

**(අ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C)සාමාර්ථයක් ලබා තිබීම.**

**(ආ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ)විභාගයේදී සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය විෂය සහ වෙනත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

**(ඇ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ)විභාගයේදී ඕනෑම විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.**

**2. භාෂා පාඨමාලාව**

**භාෂා පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2022/2023 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් මීළඟ පිටුවෙහි සඳහන් කාණ්ඩ තුන අතුරින් එක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති අදාළ අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.**

**(අ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ)විභාගයේදී ඕනෑම විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.**

**(ආ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ සහ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් අධි සම්මාන (B) සාමාර්ථයක් ලබා තිබීම.**

**(ඇ) කාණ්ඩය**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සහ වෙනත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

**4. කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන සාමය හා ගැටුම් නිරාකරණය අධ්‍යයන පාඨමාලාව - (PEACE AND CONFLICT RESOLUTION)**
**(පාඨමාලා කේතය - 031)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 35)**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වනු ලබන්නේ ශාස්ත්‍රවේදී ගෞරව සාමය හා ගැටුම් නිරාකරණය උපාධිය ලෙසයි. [BAHons (Peace and Conflict Resolution)].

මෙහි කාල සීමාව වසර හතරකි.

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ඕනෑම අපේක්ෂකයෙකු [(විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම හා සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම)]මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. මෙහිදී, ඕනෑම අ.පො.ස (උසස් පෙළ) විෂයයන් තුනක් සමත් සිසුන් මේ සඳහා සලකා බලනු ලැබේ.

මෙම පාඨමාලාව ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

**5. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉස්ලාම් අධ්‍යයන පාඨමාලාව - (ISLAMIC STUDIES)**
**(පාඨමාලා කේතය - 063)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 275)**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වනු ලබන්නේ ශාස්ත්‍රවේදී ඉස්ලාම් අධ්‍යයන උපාධිය ලෙසයි. මෙහි කාල සීමාව වසර තුනකි.

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා ගත් සිසුනට මේ සඳහා අයදුම් කළ හැකිය. නමුත්, ඉන් අනිවාර්යයෙන්ම එක් විෂයයක් ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ඨාචාරය විය යුතුය.

**6. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අරාබි භාෂා අධ්‍යයන පාඨමාලාව - (ARABIC LANGUAGE)**
**(පාඨමාලා කේතය - 084)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 225)**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වනු ලබන්නේ ශාස්ත්‍රවේදී අරාබි භාෂා උපාධිය ලෙසයි. මෙහි කාල සීමාව වසර තුනකි.

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා ගත් සිසුනට මේ සඳහා අයදුම් කළ හැකිය. නමුත්, ඉන් අනිවාර්යයෙන්ම එක් විෂයයක් අරාබි භාෂාව විය යුතුය.

**7. කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම අධ්‍යයන පාඨමාලාව - [TEACHING ENGLISH AS A SECOND LANGUAGE (TESL)]**
**(පාඨමාලා කේතය - 105)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වනු ලබන්නේ ශාස්ත්‍රවේදී ගෞරව (ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම) උපාධිය ලෙසයි.

මෙම උපාධි පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ඇතුළුව වෙනත් ඕනෑම විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

පාඨමාලා කාලය වසර 04 ක් වන අතර පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබයි.

**8. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය කලා අධ්‍යයන පාඨමාලා - (MUSIC, DANCE, DRAMA & THEATRE AND VISUAL ARTS)**
**(පාඨමාලා කේත : සංගීතය - 068; නර්තනය - 069; නාට්‍ය හා රංග කලා - 071; දෘශ්‍ය කලා - 085)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යා : සංගීතය - 275; නර්තනය - 275; නාට්‍ය හා රංග කලා - 55; දෘශ්‍ය කලා - 110)**

මුළු ප්‍රවේශ සංඛ්‍යාව 715 කි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් උපාධි පාඨමාලා 03 ක් ලබාදේ. ඒවා නම්;

1. දෘශ්‍ය කලාවේදී (විශේෂ)
2. ප්‍රාසංගික කලාවේදී නර්තනය හා නාට්‍ය (විශේෂ)
3. ප්‍රාසංගික කලාවේදී සංගීතය (විශේෂ)

**ඉහත පාඨමාලා 03 සඳහා තේරී පත්වීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සපුරා තිබිය යුතු අවශ්‍යතා:**

කිසියම් අපේක්ෂකයෙකු තමන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂය සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද අනිකුත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථද ලබා තිබිය යුතුය. මෙම අවශ්‍යතාවය අනිවාර්ය

වේ. උදාහරණයක් වශයෙන් සංගීතය හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංගීත විෂය සඳහා සම්මාන (C) සාමාර්ථයක් හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබිය යුතුය. එමෙන්ම, දෘශ්‍ය කලා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී චිත්‍ර විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

මීට අමතරව, විශ්වවිද්‍යාලය මගින් සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය කලා යන පාඨමාලා සඳහා ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලැබේ.

යම්කිසි ශිෂ්‍යයෙකු එම ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් වුවහොත්, එම ශිෂ්‍යයා මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි. නමුත් එම ශිෂ්‍යයා ඔහු / ඇය විසින් අයදුම්පත්‍රයේ කැමැත්ත ප්‍රකාශ කර ඇති අනෙකුත් පාඨමාලා සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇත්නම් සළකා බලනු ලැබේ.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පුවත්පත් නිවේදනයක් මගින් ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වන සියලු අධ්‍යයන පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

## 9. යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය සහ චිත්‍ර හා නිර්මාණ අධ්‍යයන පාඨමාලා - (MUSIC, DANCE AND ART & DESIGN)

**(පාඨමාලා කේත : සංගීතය - 068; නර්තනය - 069; චිත්‍ර හා නිර්මාණ - 070)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යා : සංගීතය - 100; නර්තනය - 75; චිත්‍ර හා නිර්මාණ - 35)**

මුළු ප්‍රවේශ සංඛ්‍යාව 210 කි.

ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමියෙන් උපාධි පාඨමාලා 03 ක් ලබාදේ. ඒවා නම්;

1. ශාස්ත්‍රවේදී ලලිත කලා (සංගීතය)
2. ශාස්ත්‍රවේදී ලලිත කලා (නර්තනය)
3. ශාස්ත්‍රවේදී ලලිත කලා (චිත්‍ර හා නිර්මාණ)

**ඉහත පාඨමාලා 03 සඳහා තේරී පත්වීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තෝරා ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස් :**

කිසියම් අපේක්ෂකයෙකු තමන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂය සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද අනිකුත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථද ලබා තිබිය යුතුය. මෙම අවශ්‍යතාව අනිවාර්ය වේ. උදාහරණයක් වශයෙන් සංගීතය හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංගීත විෂය සඳහා සම්මාන (C) හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබිය යුතුය. එමෙන්ම, චිත්‍ර හා

නිර්මාණ පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී චිත්‍ර විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද ලබා තිබිය යුතුය.

මීට අමතරව, යාපනය විශ්වවිද්‍යාලයේ රාමනාදන් ඇකඩමිය මගින් සංගීතය, නර්තනය සහ චිත්‍ර හා නිර්මාණ යන පාඨමාලා සඳහා ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලැබේ.

යම්කිසි ශිෂ්‍යයෙකු එම ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් වුවහොත්, එම ශිෂ්‍යයා මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි. නමුත් එම ශිෂ්‍යයා ඔහු / ඇය විසින් අයදුම්පත්‍රයේ කැමැත්ත ප්‍රකාශ කර ඇති අනෙකුත් පාඨමාලා සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇත්නම් සළකා බලනු ලැබේ.

යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය විසින් පුවත්පත් නිවේදනයක් මගින් ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමියේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විමසිය යුතුය.

යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය මගින් පවත්වන සියළු අධ්‍යයන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**10. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා අධ්‍යයන පාඨමාලා (MUSIC, DANCE, DRAMA & THEATRE AND VISUAL & TECHNOLOGICAL ARTS) (පාඨමාලා කේත : සංගීතය -068; නර්තනය - 069; නාට්‍ය හා රංග කලා - 071; දෘශ්‍ය හා තාක්ෂණික කලා - 072) (යෝජිත ප්‍රවේශ සංඛ්‍යා : සංගීතය – 80; නර්තනය - 70; නාට්‍ය හා රංග කලා - 70 ;දෘශ්‍ය හා තාක්ෂණික කලා - 70)**

මුළු ප්‍රවේශ සංඛ්‍යාව 290 කි.

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයෙන් උපාධි පාඨමාලා 04 ක් ලබාදේ. ඒවා නම්;

1. ශාස්ත්‍රවේදී ලලිත කලා (සංගීතය)
2. ශාස්ත්‍රවේදී ලලිත කලා (නර්තනය)
3. ශාස්ත්‍රවේදී ලලිත කලා (නාට්‍ය හා රංග කලා)
4. ශාස්ත්‍රවේදී ලලිත කලා (දෘශ්‍ය හා තාක්ෂණික කලා)

**ඉහත පාඨමාලා 04 සඳහා තේරී පත්වීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තෝරා ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස් :**

කිසියම් අපේක්ෂකයෙකු තමන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂය සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද අනිකුත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථද ලබා තිබිය යුතුය. මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. උදාහරණයක් වශයෙන් සංගීතය හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංගීත විෂය සඳහා සම්මාන (C) හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබිය යුතුය. එමෙන්ම, දෘශ්‍ය හා තාක්ෂණික කලා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයෙකු අ.පො.ස.

(උසස් පෙළ) විභාගයේදී චිත්‍ර විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද ලබා තිබිය යුතුය.

මීට අමතරව, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය මගින් සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලා සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා යන පාඨමාලා සඳහා ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලැබේ.

යම්කිසි ශිෂ්‍යයෙකු එම ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් වුවහොත්, එම ශිෂ්‍යයා මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි. නමුත් එම ශිෂ්‍යයා ඔහු / ඇය විසින් අයදුම්පත්‍රයේ කැමැත්ත ප්‍රකාශ කර ඇති අනෙකුත් පාඨමාලා සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇත්නම් සළකා බලනු ලැබේ.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් පුවත්පත් නිවේදනයක් මගින් ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විමසිය යුතුය.

මෙම ආයතනය මගින් පවත්වන සියලු අධ්‍යයන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

### 2.2.1.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන සමාජ වෘතවේදය අධ්‍යයන පාඨමාලාව - (SOCIAL WORK)

**(පාඨමාලා කේතය - 112)**

**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වනු ලබන්නේ සමාජ වෘතවේදී ගෞරව උපාධිය [BSW(Hons)] ලෙසයි.

මෙම අධ්‍යයන පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට, මෙම අත්පොතෙහි 2.2.1.1 කොටසෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලබන කලා විෂය ධාරාවේ ඕනෑම විෂයයන් තුනක් සඳහා අ.පො.ස.(උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

පාඨමාලා කාලය වසර 04 ක් වන අතර පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබයි.

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී කලා විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත් ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- නීතිය
- වාස්තු විද්‍යාව
- නිර්මාණවේදය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- කළමනාකරණ අධ්‍යයන (TV)
- ප්‍රමාණ සමීක්ෂණය

- තොරතුරු තාක්ෂණය (IT)
- නගර හා ග්‍රාම නිර්මාණ
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)
- පරිගණනය සහ කළමනාකරණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ශාරීරික අධ්‍යාපනය
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- කථන හා ශ්‍රවණ විද්‍යා
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය
- සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය
- තොරතුරු පද්ධති
- භූමි නිර්මාණවේදය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- ආහාර ව්‍යාපාර කළමනාකරණය
- මූල්‍ය ඉංජිනේරුකරණය
- භූගෝලීය තොරතුරු විද්‍යාව
- මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය
- මානව සම්පත් සංවර්ධනය

## 2.2.2 වාණිජ්‍යය විෂය ධාරාව

**2.2.2.1. කළමණාකරණය - (MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 016)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 4790)**

**2.2.2.2. කළමණාකරණය (රාජ්‍ය) විශේෂ - [MANAGEMENT (PUBLIC) SPECIAL]**
**(පාඨමාලා කේතය - 028)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 85)**

**2.2.2.3. දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය - (ESTATE MANAGEMENT & VALUATION)**
**(පාඨමාලා කේතය - 017)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**2.2.2.4. වාණිජ්‍යය - (COMMERCE)**
**(පාඨමාලා කේතය - 018)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 740)**

**උසස් පෙළ විෂයයන් තෝරා ගැනීම සඳහා උපදෙස්:**

ඉහත සඳහන් කළ පාඨමාලාවලට ප්‍රවේශ වීමට නම් පහත සඳහන් විෂයයන් තුනකින් යුතු විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ව්‍යාපාර අධ්‍යයනය
- ආර්ථික විද්‍යාව
- ගිණුම්කරණය

හෝ

අවම වශයෙන් ඉහතින් සඳහන් විෂයයන් දෙකක් හා තුන් වන විෂය වශයෙන් පහත සඳහන් කර ඇති එක් විෂයක් සඳහා පෙනී සිටිය යුතුය.

- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ව්‍යාපාර සංඛ්‍යානය
- ජර්මන්
- සංයුක්ත ගණිතය හෝ ගණිතය
- ඉතිහාසය
- දේශපාලන විද්‍යාව
- ඉංග්‍රීසි
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- ප්‍රංශ
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ගණකාධිකරණය, විගණනය හා ව්‍යවහාරික ගිණුම්කරණය සහ මූල්‍ය වැනි ඇතැම් ප්‍රථම උපාධි පාඨමාලා වලට ප්‍රවේශය ලැබීම සඳහා අයදුම්කරුවන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගිණුම්කරණය විෂයට පෙනී සිටීම අවශ්‍ය වේ.

උපාධි පාඨමාලාවල කාලය වසර හතරකි.

**එක් එක් විශ්වවිද්‍යාලය මගින් ලබා දෙන උපාධි පාඨමාලා :**

***කොළඹ විශ්වවිද්‍යාලය***

- ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ)
- ව්‍යාපාර පරිපාලනවේදී මූල්‍ය
- ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර පරිපාලනවේදී අලෙවි
- ව්‍යාපාර පරිපාලනවේදී ගණකාධිකරණය
- ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර පරිපාලනවේදී ජාත්‍යන්තර ව්‍යාපාර
- ව්‍යාපාර පරිපාලනවේදී ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය

***ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය***

- විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ)
- විද්‍යාවේදී කළමනාකරණය (රාජ්‍ය) විශේෂ
- වාණිජවේදී (විශේෂ)
- විද්‍යාවේදී දේපළ කළමනාකරණය හා තක්සේරුවිද්‍යා (විශේෂ)
- විද්‍යාවේදී ගණකාධිකරණය (විශේෂ)
- විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ)
- විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ)
- විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථිකවිද්‍යා) (විශේෂ)
- විද්‍යාවේදී මූල්‍ය (විශේෂ)
- විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)
- විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ)
- විද්‍යාවේදී ව්‍යවසායකත්වය (විශේෂ)

***කැලණිය විශ්වවිද්‍යාලය :***

- ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර කළමනාකරණවේදී (ගණකාධිකරණය) විශේෂ
- ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ අලෙවිකරණය
- ව්‍යාපාර කළමනාකරණවේදී (මූල්‍ය) විශේෂ
- වාණිජවේදී (විශේෂ)
- වාණිජවේදී (ව්‍යාපාර තාක්ෂණ) විශේෂ
- වාණිජවේදී (ව්‍යවසායකත්වය) විශේෂ
- වාණිජවේදී (මූල්‍ය කළමනාකරණය) විශේෂ
- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (රක්ෂණය)
- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (බැංකුකරණය)
- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (විගණනය සහ ව්‍යවහාරික ගිණුම්කරණය)

**යාපනය විශ්වවිද්‍යාලය:**

- ව්‍යාපාර පරිපාලනවේදී (සංචාරක හා සත්කාරක කළමනාකරණය) ගෞරව
- ව්‍යාපාර පරිපාලනවේදී (ගණකාධිකරණය) විශේෂ
- ව්‍යාපාර පරිපාලනවේදී (මූල්‍ය කළමනාකරණය) විශේෂ
- ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ) විශේෂ
- ව්‍යාපාර පරිපාලනවේදී (අලෙවි) විශේෂ
- වාණිජවේදී (විශේෂ)

**රුහුණ විශ්වවිද්‍යාලය:**

- ව්‍යාපාර පරිපාලනවේදී ගිණුම්කරණය (ගෞරව)
- ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්වය (ගෞරව)
- ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය (ගෞරව)
- ව්‍යාපාර පරිපාලනවේදී අලෙවිකරණය (ගෞරව)
- ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර කළමනාකරණය (ගෞරව)

**නැගෙනහිර විශ්වවිද්‍යාලය:**

- ව්‍යාපාර පරිපාලනවේදී අලෙවි කළමනාකරණය (විශේෂ)
- ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ)
- වාණිජවේදී ව්‍යාපාර සංවර්ධන (විශේෂ)
- වාණිජවේදී ගණකාධිකරණය සහ මූල්‍ය (විශේෂ)

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය:**

- ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ)
- වාණිජවේදී (විශේෂ)

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය:**

- විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය) විශේෂ
- විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (අලෙවි කළමනාකරණය) ගෞරව
- විද්‍යාවේදී (මානව සම්පත් කළමනාකරණය) ගෞරව
- විද්‍යාවේදී (තොරතුරු පද්ධති) ගෞරව

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය:**

- විද්‍යාවේදී (ගණකාධිකරණය හා ව්‍යාපාර මූල්‍ය) විශේෂ
- විද්‍යාවේදී (බැංකු සහ ව්‍යාපාර මූල්‍ය) විශේෂ
- විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී ගෞරව රක්ෂණය සහ මූල්‍ය

***ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය:***

- විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (මූල්‍ය කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (අලෙවි කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (සංචාරක කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණය) විශේෂ
- විද්‍යාවේදී (බැංකු සහ රක්ෂණ) විශේෂ

***පේරාදෙණිය විශ්වවිද්‍යාලය:***

- ව්‍යාපාර පරිපාලනවේදී මූල්‍ය කළමනාකරණය (විශේෂ)
- ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ)
- ව්‍යාපාර පරිපාලනවේදී අලෙවි කළමනාකරණය (විශේෂ)
- ව්‍යාපාර පරිපාලනවේදී මෙහෙයුම් කළමනාකරණය (විශේෂ)

### 2.2.2.5 කළමනාකරණ අධ්‍යයන (TV) - [MANAGEMENT STUDIES (TV)]
**(පාඨමාලා කේතය - 022)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 325)**

අ.පො.ස උසස් පෙළ විභාගයේදී ඕනෑම විෂයයන් තුනකට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් ලද අපේක්ෂකයන්ට පහත දැක්වෙන විශ්වවිද්‍යාලවල පැවැත්වෙන කළමනාකරණ අධ්‍යයන (TV) උපාධි පාඨමාලා සඳහා අයදුම් කළ හැකිය.

1. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය
2. යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය

කෙසේ වෙතත් සිසුන් තෝරා ගැනීමේදී යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපයට තෝරා ගනු ලබන සිසුන්ගෙන් 60% ක ප්‍රමාණයක් සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයට තෝරාගනු ලබන සිසුන්ගෙන් 40% ක ප්‍රමාණයක් වාණිජ විෂය ධාරාව යටතේ පෙනී සිටි සිසුන්ගෙන් තෝරාගනු ලැබේ.

වසර තුනක උපාධි පාඨමාලාවක් සඳහා ඇතුළත් කරගන්නා සිසුන්ට තමන්ගේ අභිමතය පරිදි විශ්වවිද්‍යාලයේ අනුමත අවශ්‍යතා සපුරා ඇත්නම් හතරවන වර්ෂයට අධ්‍යයන කටයුතු සඳහා ඇතුළත් විය හැකිය. හතරවන වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පීඨ මණ්ඩලය හා සනාතන සභාව තීරණය කරනු ලබන අමතර විෂය ඒකක (විශේෂ විෂය ක්ෂේත්‍ර වලට අදාළ පරිදි) සිසුන් විසින් හැදෑරිය යුතුය.

**එක් එක් විශ්වවිද්‍යාලය මගින් ලබා දෙන උපාධි පාඨමාලා :**

***නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව : (ත්‍රිකුණාමලය)***

- විද්‍යාවේදී ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය
- විද්‍යාවේදී අලෙවි කළමනාකරණය
- විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය
- විද්‍යාවේදී තොරතුරු කළමනාකරණය

**යාපනය විශ්වවිද්‍යාලය : (වව්නියා මණ්ඩපය)**

- ව්‍යාපාර කළමනාකරණවේදී
- ව්‍යාපාර කළමනාකරණවේදී ගිණුම්කරණය හා මූල්‍යය ගෞරව
- ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවි කළමනාකරණය ගෞරව
- ව්‍යාපාර කළමනාකරණවේදී ව්‍යාපාර ආර්ථික විද්‍යාව ගෞරව
- ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් කළමනාකරණය ගෞරව

**2.2.2.6 ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) - [BUSINESS INFORMATION SYSTEMS (SPECIAL)] (BIS)**
**(පාඨමාලා කේතය - 077)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

පාඨමාලා ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම පිණිස පහත සඳහන් විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ව්‍යාපාර අධ්‍යයනය
- ආර්ථික විද්‍යාව
- ගිණුම්කරණය

නැතහොත්, ඉහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහ තුන්වන විෂය ලෙස පහත එක් විෂයක් සඳහා සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සංයුක්ත ගණිතය
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- ව්‍යාපාර සංඛ්‍යානය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අයදුම්කරුවන් කළමනාකරණය, කළමනාකරණය (රාජ්‍ය) විශේෂ, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය, කළමනාකරණ අධ්‍යයන (TV) හෝ වාණිජ්‍යය උපාධි පාඨමාලාවන් සඳහා තෝරාගනු ලබයි.**

**කළමනාකරණය, වාණිජ්‍යය, කළමනාකරණ අධ්‍යයන (TV) යන පාඨමාලාවල ඒ ඒ විශේෂ විෂය ක්ෂේත්‍රවලට සිසුන් තෝරා ගනු ලබනුයේ අයදුම්කරු අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලයේ අදාළ පීඨය මගින් තීරණය කරනු ලබන තෝරා ගැනීමේ ක්‍රමයක් අනුවය.**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී වාණිජ්‍යය විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහා ද අයදුම් කළ හැකිය. නමුත් ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- නීතිය
- කලා (SAB)
- ප්‍රමාණ සමීක්ෂණය
- තොරතුරු තාක්ෂණය (IT)
- වාස්තු විද්‍යාව
- නිර්මාණවේදය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- නගර හා ග්‍රාම නිර්මාණය
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)
- පහසුකම් කළමනාකරණය
- පරිගණනය හා කළමනාකරණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- කාර්මික තොරතුරු තාක්ෂණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)
- ශාරීරික අධ්‍යාපනය
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය
- සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය
- තොරතුරු පද්ධති
- භූමි නිර්මාණවේදය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- ආහාර ව්‍යාපාර කළමනාකරණය
- ව්‍යාපාර විද්‍යාව
- මූල්‍ය ඉංජිනේරුකරණය
- මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය
- මානව සම්පත් සංවර්ධනය

## 2.2.3 ජෛවීය විද්‍යා විෂය ධාරාව

**2.2.3.1** වෛද්‍ය විද්‍යාව (MEDICINE) / දන්ත ශල්‍ය විද්‍යාව (DENTAL SURGERY) / පශු වෛද්‍ය විද්‍යාව (VETERINARY SCIENCE)
(පාඨමාලා කේත : වෛද්‍ය විද්‍යාව - 001; දන්ත ශල්‍ය විද්‍යාව - 002; පශු වෛද්‍ය විද්‍යාව - 003)
(යෝජිත ප්‍රවේශ සංඛ්‍යා : වෛද්‍ය විද්‍යාව - 1590; දන්ත ශල්‍ය විද්‍යාව - 90; පශු වෛද්‍ය විද්‍යාව - 100)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

වෛද්‍ය විද්‍යාව පාඨමාලාව පැවැත්වන විශ්වවිද්‍යාල

- වෛද්‍ය පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය
  ස්ථානය - කොළඹ
- වෛද්‍ය පීඨය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  ස්ථානය - පේරාදෙණිය
- වෛද්‍ය පීඨය - යාපනය විශ්වවිද්‍යාලය
  ස්ථානය - යාපනය
- වෛද්‍ය පීඨය - රුහුණ විශ්වවිද්‍යාලය
  ස්ථානය - කරාපිටිය, ගාල්ල
- වෛද්‍ය පීඨය - කැලණිය විශ්වවිද්‍යාලය
  ස්ථානය - රාගම
- වෛද්‍ය විද්‍යා පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
  ස්ථානය - ගංගොඩවිල
- වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
  ස්ථානය - සාලියපුර, අනුරාධපුරය
- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය - නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
  ස්ථානය - මඩකලපුව
- වෛද්‍ය පීඨය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
  ස්ථානය - කුලියාපිටිය
- වෛද්‍ය පීඨය - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
  ස්ථානය - රත්නපුර
- වෛද්‍ය පීඨය - මොරටුව විශ්වවිද්‍යාලය
  ස්ථානය - කළුතර

- පාඨමාලා කාලය - වසර පහකි

දන්ත ශල්‍ය විද්‍යාව පාඨමාලාව පැවැත්වන විශ්වවිද්‍යාලය

- දන්ත වෛද්‍ය පීඨය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  ස්ථානය - පේරාදෙණිය
- පාඨමාලා කාලය - වසර පහකි

**පශු වෛද්‍ය විද්‍යාව පාඨමාලාව පැවැත්වන විශ්වවිද්‍යාලය**

- **පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය ස්ථානය - පේරාදෙණිය** - **පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
- **පාඨමාලා කාලය** - **වසර පහකි**

## 2.2.3.2 කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය - (AGRICULTURAL TECHNOLOGY & MANAGEMENT)

**(පාඨමාලා කේතය - 039)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 200)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව හෝ ගණිතය; ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(iii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව; කෘෂි විද්‍යාව හෝ ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය)උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

## 2.2.3.3 කෘෂිකර්මය - (AGRICULTURE)

**(පාඨමාලා කේතය - 004)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 760)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව හෝ ගණිතය; ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(iii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව; කෘෂි විද්‍යාව හෝ ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (කෘෂිකර්මය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
  යාපනය විශ්වවිද්‍යාලය
  ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
  ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
  ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.3.4 ආහාර විද්‍යාව හා පෝෂණය - (FOOD SCIENCE & NUTRITION)**
**(පාඨමාලා කේතය - 005)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව -110)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව හෝ ගණිතය; ජීව විද්‍යාව හෝ කෘෂිවිද්‍යාව
(iii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව; කෘෂි විද්‍යාව හෝ ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) ගෞරව උපාධි පාඨමාලාව [BScHons (Food Sc & Nutr)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- විශේෂ විෂය ක්ෂේත්‍ර - ආහාර විද්‍යාව හා තාක්ෂණය
  - ව්‍යවහාරික පෝෂණය

**2.2.3.5 ආහාර විද්‍යාව හා තාක්ෂණය - (FOOD SCIENCE & TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 035)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 170)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල - විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා තාක්ෂණය) විශේෂ උපාධි පාඨමාලාව
  පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  සබරගමුව විශ්වවිද්‍යාලය
  - විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා තාක්ෂණය) ගෞරව උපාධි පාඨමාලාව [BScHons (FST)]
  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.3.6 ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (AYURVEDIC MEDICINE AND SURGERY)**
**(පාඨමාලා කේතය - 032)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 300)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි පාඨමාලාව (B.A.M.S)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
  ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හයකි (වසර 05 ක් අධ්‍යයන කටයුතු හා අවසන් වසර අරෝග්‍යශාලා ආශ්‍රිත ආධුනික වෛද්‍ය පුහුණුව)
- පාඨමාලා මාධ්‍යය - සිංහල

**2.2.3.7 යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (UNANI MEDICINE AND SURGERY)**
**(පාඨමාලා කේතය - 033)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි පාඨමාලාව (B.U.M.S)
- පාඨමාලාව පැවැත්වන විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හයකි (වසර 05 ක් අධ්‍යයන කටයුතු හා අවසන් වසර අරෝග්‍යශාලා ආශ්‍රිත ආධුනික වෛද්‍ය පුහුණුව)
- පාඨමාලා මාධ්‍යය - ඉංග්‍රීසි

**2.2.3.8 සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය - (SIDDHA MEDICINE AND SURGERY)**
**(පාඨමාලා කේතය - 036)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 150)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි පාඨමාලාව (B.S.M.S)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - යාපනය විශ්වවිද්‍යාලය
  ත්‍රිකුණාමල මණ්ඩපය,
  නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- පාඨමාලා කාලය - වසර හයකි (වසර 05 ක් අධ්‍යයන කටයුතු හා අවසන් වසර අරෝග්‍යශාලා ආශ්‍රිත ආධුනික වෛද්‍ය පුහුණුව)
- පාඨමාලා මාධ්‍යය - යාපනය විශ්වවිද්‍යාලය - දෙමළ
  ත්‍රිකුණාමල මණ්ඩපය - ඉංග්‍රීසි

**2.2.3.9 ජෛවීය විද්‍යාව - (BIOLOGICAL SCIENCE)**
**(පාඨමාලා කේතය - 006)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 1440)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (ජෛවීය විද්‍යා) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - කොළඹ විශ්වවිද්‍යාලය
  පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලය

යාපනය විශ්වවිද්‍යාලය

රුහුණ විශ්වවිද්‍යාලය

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**2.2.3.10 ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) - [APPLIED SCIENCES (BIOLOGICAL SCIENCE)]**
**(පාඨමාලා කේතය - 007)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 320)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

මෙම පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල සහ එම විශ්වවිද්‍යාල මගින් පවත්වන උපාධි පාඨමාලා පහත දක්වා ඇත.

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

- විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යා) පාරිසරික විද්‍යා හා සම්පත් කළමනාකරණය සාමාන්‍ය උපාධිය පාඨමාලා කාලය වසර තුනකි
- විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යා) පාරිසරික විද්‍යා හා සම්පත් කළමනාකරණය විශේෂ උපාධිය පාඨමාලා කාලය වසර හතරකි

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

- විද්‍යාවේදී (සාමාන්‍ය) ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාව
  පාඨමාලා කාලය වසර තුනකි
- විද්‍යාවේදී ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාව
  පාඨමාලා කාලය වසර හතරකි
- විද්‍යාවේදී (ප්‍රධාන විෂයයන් දෙකක සංකලනයකි) ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාව
  පාඨමාලා කාලය වසර හතරකි
- විද්‍යාවේදී (විශේෂ) උපාධිය ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාව
  පාඨමාලා කාලය වසර හතරකි

**යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය)**

- විද්‍යාවේදී පාරිසරික විද්‍යාව උපාධි පාඨමාලාව

  පාඨමාලා කාලය වසර තුනකි
- විද්‍යාවේදී පාරිසරික විද්‍යාව (විශේෂ) උපාධි පාඨමාලාව

  පාඨමාලා කාලය වසර හතරකි

### 2.2.3.11 සෞඛ්‍ය ප්‍රවර්ධන - (HEALTH PROMOTION)

**(පාඨමාලා කේතය - 050)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලා - විද්‍යාවේදී සාමාන්‍ය (සෞඛ්‍ය ප්‍රවර්ධන) උපාධිය

  පාඨමාලා කාලය වසර තුනකි

  විද්‍යාවේදී විශේෂ (සෞඛ්‍ය ප්‍රවර්ධන) උපාධිය

  පාඨමාලා කාලය වසර හතරකි
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

### 2.2.3.12 හෙද - (NURSING)

**(පාඨමාලා කේතය - 037)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 450)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍යය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

පහත සඳහන් විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විද්‍යාවේදී හෙද උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- කොළඹ විශ්වවිද්‍යාලය

**සැළකිය යුතුයි :**

- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම්පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් හෙද පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.
- ඊට අමතරව, අයදුම්කරුවන්ගේ උස 4' 10"ට නොඅඩු විය යුතු අතර සියලු ආකාරයේ විකලාංගතාවන්ගෙන් තොර විය යුතුය. මෙම කායික යෝග්‍යතාවයන් සපුරා නැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් හෙද පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.
- ඉහත අවශ්‍යතාවයන් දෙක අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයන් වශයෙන් හෙද කවුන්සිලයේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇත.
- යම්හෙයකින් අසත්‍ය / වැරදි තොරතුරු සැපයීම මත හෙද පාඨමාලාවට තේරී ඇත්නම් හෙද පාඨමාලාව සඳහා ඔබගේ ප්‍රවේශය අවලංගු වන බව සැලකිය යුතුය.

**2.2.3.13 ඖෂධ විද්‍යාව - (PHARMACY)**
**(පාඨමාලා කේතය - 051)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 190)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ භෞතිය විද්‍යාව සහ ජීව විද්‍යාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

පහත සඳහන් විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විද්‍යාවේදී ඖෂධ විද්‍යාව උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඖෂධ විද්‍යා පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**2.2.3.14 වෛද්‍ය රසායනාගාර විද්‍යා - (MEDICAL LABORATORY SCIENCES)**
**(පාඨමාලා කේතය - 052)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 190)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

පහත සඳහන් විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යාව උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් වෛද්‍ය රසායනාගාර විද්‍යා පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**2.2.3.15 විකිරණ ශිල්පය - (RADIOGRAPHY)**
**(පාඨමාලා කේතය - 053)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 45)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විද්‍යාවේදී විකිරණ ශිල්පය උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් විකිරණ ශිල්පය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**2.2.3.16 භෞත චිකිත්ස - (PHYSIOTHERAPY)**
**(පාඨමාලා කේතය - 054)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 70)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ජීවවිද්‍යාව
- ගණිතය
- උසස් ගණිතය
- සංයුක්ත ගණිතය

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

පහත සඳහන් විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විද්‍යාවේදී භෞත චිකිත්ස උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් භෞත චිකිත්ස පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**2.2.3.17 අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව - (MOLECULAR BIOLOGY & BIOCHEMISTRY)**
**(පාඨමාලා කේතය - 058)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (සාමාන්‍ය උපාධිය)
  පාඨමාලා කාලය - වසර තුනකි

  විද්‍යාවේදී (සාමාන්‍ය උපාධිය)
  පාඨමාලා කාලය - වසර හතරකි

  විද්‍යාවේදී විශේෂ (අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව) (විශේෂ උපාධිය)
  පාඨමාලා කාලය - වසර හතරකි

- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කොළඹ විශ්වවිද්‍යාලය

## 2.2.3.18 ධීවර සහ සාගර විද්‍යාව - (FISHERIES & MARINE SCIENCES)
**(පාඨමාලා කේතය - 062)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ධීවර සහ සාගර විද්‍යාව (ගෞරව) උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණු විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- විශේෂ විෂයය ක්ෂේත්‍ර - ධීවර විද්‍යාව (Fisheries Sciences)
  ජලජීවී වගා විද්‍යාව (Aquaculture)
- මාධ්‍යය - ඉංග්‍රීසි

## 2.2.3.19 පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය - (ENVIRONMENTAL CONSERVATION & MANAGEMENT)
**(පාඨමාලා කේතය - 055)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- භෞතික විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ගණිතය
- කෘෂි විද්‍යාව

- උපාධි පාඨමාලාව - පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී උපාධි පාඨමාලාව
  පාඨමාලා කාලය - වසර තුනකි

  පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව [BScHons (ECM)]
  පාඨමාලා කාලය - වසර හතරකි
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය

**2.2.3.20 සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව - (ANIMAL SCIENCE & FISHERIES)**
**(පාඨමාලා කේතය - 086)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව

(ii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව සහ කෘෂිවිද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව)උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.3.21 ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය - (FOOD PRODUCTION & TECHNOLOGY MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 087)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 85)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව

(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව හෝ ගණිතය; ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව

(iii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව; කෘෂි විද්‍යාව හෝ ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය) උපාධි පාඨමාලාව [BScHons (Food Prod & Tech Mgmt)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- විශේෂ විෂය ක්ෂේත්‍ර - පශු සම්පත් හා පක්ෂි විද්‍යාව
  ධීවර හා ජලජ ජීවී විද්‍යාව

**2.2.3.22 කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්‍ෂණය - (AGRICULTURAL RESOURCE MANAGEMENT AND TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 093)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 150)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව

(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව හෝ ගණිතය; ජීව විද්‍යාව හෝ කෘෂිවිද්‍යාව

(iii) රසායන විද්‍යාව; ජීව විද්‍යාව; කෘෂි විද්‍යාව හෝ ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී(කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්‍ෂණය)උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.3.23 කෘෂි ව්‍යාපාර කළමනාකරණය - (AGRIBUSINESS MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 094)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 55)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- භෞතික විද්‍යාව
- කෘෂි විද්‍යාව
- ආහාර තාක්‍ෂණය / ජීව සම්පත් තාක්‍ෂණය / කෘෂි තාක්‍ෂණවේදය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (කෘෂි ව්‍යාපාර කළමනාකරණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

## 2.2.3.24 හරිත තාක්ෂණය - (GREEN TECHNOLOGY)
**(පාඨමාලා කේතය - 095)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- භෞතික විද්‍යාව
- කෘෂි විද්‍යාව
- ආහාර තාක්ෂණය / ජීව සම්පත් තාක්ෂණය / කෘෂි තාක්ෂණවේදය

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (හරිත තාක්ෂණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් හරිත තාක්ෂණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

## 2.2.3.25 සත්ත්ව පාලන විද්‍යාව - (ANIMAL SCIENCE)
**(පාඨමාලා කේතය - 067)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය) උපාධිය [BScHons (Animal Production and Food Technology)]

- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

### 2.2.3.26 අපනයන කෘෂිකර්මය - (EXPORT AGRICULTURE)
**(පාඨමාලා කේතය - 073)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (අපනයන කෘෂිකර්මය) උපාධිය [BScHons (Export Agri)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

ශිෂ්‍යයන් මෙම පාඨමාලාව සඳහා තේරී පත්වූ විට පහත දැක්වෙන විශේෂකරණයන්ගෙන් එකක් තුන්වන අධ්‍යයන වර්ෂය ආරම්භයේදී හැදෑරිය යුතුය.

- බෝග නිපැයුම් තාක්ෂණය (Crop Product Technology)
- ව්‍යවසායකත්ව කෘෂිකර්මය (Entrepreneurial Agriculture)

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

**2.2.3.27 ජලජ සම්පත් තාක්‍ෂණය - (AQUATIC RESOURCES TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 088)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (ජලජ සම්පත් තාක්‍ෂණ) උපාධිය [BScHons (Aquatic Resources Tech)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජෛවීය විද්‍යා විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්‍ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත් ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- නීතිය
- වාස්තුවිද්‍යාව
- නිර්මාණවේදය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- කළමනාකරණය අධ්‍යයන (TV)
- තොරතුරු තාක්‍ෂණය (IT)
- කළමනාකරණය හා තොරතුරු තාක්‍ෂණය (MIT)
- නගර හා ග්‍රාම නිර්මාණය
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය (ICT)

- විද්‍යාව සහ තාක්ෂණය
- පරිගණක විද්‍යාව සහ තාක්ෂණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ඛනිජ සම්පත් සහ තාක්ෂණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)
- ශාරීරික අධ්‍යාපනය
- කථන හා ශ්‍රවණ විද්‍යා
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තාල සහ ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම
- තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය
- සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය
- තොරතුරු පද්ධති
- භූමි නිර්මාණවේදය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- සාගර සහ මිරිදිය විද්‍යාව
- ආහාර ව්‍යාපාර කළමනාකරණය
- භූගෝලීය තොරතුරු විද්‍යාව
- මානව සම්පත් සංවර්ධනය

## 2.2.4 භෞතීය විද්‍යා විෂය ධාරාව

### 2.2.4.1 ඉංජිනේරු විද්‍යාව - (ENGINEERING)
(පාඨමාලා කේතය - 008)
(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 2083)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

**එක් එක් විශ්වවිද්‍යාලය යටතේ පවතින විශේෂ විෂය ක්ෂේත්‍ර :**

***පේරාදෙණිය විශ්වවිද්‍යාලය :***

- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- රසායන සහ සැකසුම් ඉංජිනේරු විද්‍යාව
- පරිගණක ඉංජිනේරු විද්‍යාව
- විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
- නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු විද්‍යාව

***මොරටුව විශ්වවිද්‍යාලය :***

- ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව
- විදුලි ඉංජිනේරු විද්‍යාව
- රසායන සහ ක්‍රියාවලි විද්‍යා ඉංජිනේරු
- විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව
- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
- පරිගණක විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව
- ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු විද්‍යාව

***රුහුණ විශ්වවිද්‍යාලය :***

- සිවිල් හා පාරිසරික ඉංජිනේරු
- විද්‍යුත් හා තොරතුරු ඉංජිනේරු
- යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු
- නාවික ඉංජිනේරු හා නාවික නිර්මාණ ශිල්පය

***යාපනය විශ්වවිද්‍යාලය :***

- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව

- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
- පරිගණක ඉංජිනේරු විද්‍යාව

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය :**

- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- විදුලි ඉංජිනේරු විද්‍යාව#
- විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව#
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

# දැනට විදුලි ඉංජිනේරු සහ විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාවන් එක් විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස හැඳෑරිය හැකිය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයඃ**

- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- පරිගණක ඉංජිනේරු විද්‍යාව
- විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

ඉහත සඳහන් ඒ ඒ විශේෂ විෂය ක්ෂේත්‍ර සඳහා සිසුන් තෝරා ගනු ලබනුයේ අයදුම්කරු අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලය මගිනි.

### 2.2.4.2 ඉංජිනේරු විද්‍යාව (EM) - භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව
**[ENGINEERING (EM) - EARTH RESOURCES ENGINEERING]**
**(පාඨමාලා කේතය - 009)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

### 2.2.4.3 ඉංජිනේරු විද්‍යාව (TM) - පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය
**[ENGINEERING (TM) - TEXTILE & CLOTHING TECHNOLOGY]**
**(පාඨමාලා කේතය - 010)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 70)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.4.4 භෞතීය විද්‍යාව - (PHYSICAL SCIENCE)**
**(පාඨමාලා කේතය - 013)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 2015)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය. එම විෂයයන් තුන පහත පරිදි තෝරාගත යුතුය.

- සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය

සහ

- රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව

තුන්වන විෂය ලෙස පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක් තෝරාගත යුතුය.

- කෘෂි විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ජීව විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (භෞතීය විද්‍යාව) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - කොළඹ විශ්වවිද්‍යාලය
  පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
  කැලණිය විශ්වවිද්‍යාලය
  යාපනය විශ්වවිද්‍යාලය
  රුහුණ විශ්වවිද්‍යාලය
  නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
  ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**2.2.4.5 පරිගණක විද්‍යාව - (COMPUTER SCIENCE)**
**(පාඨමාලා කේතය - 012)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 525)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකකට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

සහ

පහත සඳහන් විෂයයන් අතුරින් ඉතිරි විෂයන් දෙකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය

- සංයුක්ත ගණිතය
- උසස් ගණිතය
- ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී පරිගණක විද්‍යාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල

  කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
  යාපනයවිශ්වවිද්‍යාලය
  රුහුණ විශ්වවිද්‍යාලය
  ත්‍රිකුණාමල මණ්ඩපය, නැගෙනහිර විශ්වවිද්‍යාලය,
  ශ්‍රී ලංකාව

- පාඨමාලා කාලය - වසර තුනකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

මීට අමතරව පහත සඳහන් විශ්වවිද්‍යාල/අධ්‍යයනායතන මගින් සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා ලබා දෙනු ලැබේ.

- විද්‍යාවේදී පරිගණක විද්‍යා ගෞරව උපාධිය

  පාඨමාලාව පවත්වන අධ්‍යයනායතනය - කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය

- විද්‍යාවේදී මෘදුකාංග ඉංජිනේරු ගෞරව උපාධිය

  පාඨමාලාව පවත්වන අධ්‍යයනායතනය - කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය

- විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා [BScHons (ComputerSc)]

  පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය

- විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා [BScHons (Computer Science)]

  පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - යාපනය විශ්වවිද්‍යාලය

**2.2.4.6 ව්‍යවහාරික විද්‍යා (භෞතිය විද්‍යා) - [APPLIED SCIENCES (PHYSICAL SCIENCE )]**
**(පාඨමාලා කේතය - 015)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 580)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදි පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය. එම විෂයයන් තුන පහත පරිදි තෝරාගත යුතුය.

- සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය

  සහ

- රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව

තුන්වන විෂය ලෙස පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක් තෝරාගත යුතුය.

- කෘෂි විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ජීව විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**මෙම පාඨමාලාව ලබාදෙන විශ්වවිද්‍යාල, උපාධි පාඨමාලා සහ කාල සීමාව පහත දැක්වේ :**

***ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය***

විද්‍යාවේදි (සාමාන්‍ය) උපාධිය ව්‍යවහාරික විද්‍යා - තුන් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදි උපාධිය ව්‍යවහාරික විද්‍යා - සිව් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදි (ප්‍රධාන විෂයයන් දෙකක සංකලනයකි) ව්‍යවහාරික විද්‍යා - සිව් අවුරුදු උපාධි පාඨමාලාව

***ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය***

විද්‍යාවේදි (ව්‍යවහාරික විද්‍යා) රසායනික විද්‍යා තාක්ෂණය විශේෂ උපාධිය

විද්‍යාවේදි (ව්‍යවහාරික විද්‍යා) පරිගණක විද්‍යා හා තාක්ෂණ විශේෂ උපාධිය

විද්‍යාවේදි (ව්‍යවහාරික විද්‍යා) ව්‍යවහාරික භෞතිය විද්‍යා විශේෂ උපාධිය

විද්‍යාවේදි (ව්‍යවහාරික විද්‍යා) ව්‍යවහාරික භෞතිය විද්‍යා සාමාන්‍ය උපාධිය

***යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය)***

විද්‍යාවේදි ව්‍යවහාරික ගණිතය සහ ආගනණය - තුන් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදි පරිගණක විද්‍යාව (විශේෂ) - සිව් අවුරුදු උපාධි පාඨමාලාව

**නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,(ත්‍රිකුණාමල මණ්ඩපය)**

විද්‍යාවේදී ව්‍යවහාරික භෞතිය විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික (සාමාන්‍ය)

විද්‍යාවේදී ව්‍යවහාරික භෞතිය විද්‍යා (විශේෂ)

විද්‍යාවේදී ඉලෙක්ට්‍රොනික (විශේෂ)

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය, තුන් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 † - ඉංග්‍රීසි මාධ්‍යය, සිව් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදී (විශේෂ) ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය, සිව් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදී (විශේෂ) කර්මාන්ත කළමනාකරණ උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය, සිව් අවුරුදු උපාධි පාඨමාලාව

විද්‍යාවේදී (විශේෂ) සංඛ්‍යානය සමඟ ගණිතය උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය, සිව් අවුරුදු උපාධි පාඨමාලාව

† පරිගණක හා තොරතුරු පද්ධති, ඉලෙක්ට්‍රොනික, කර්මාන්ත කළමනාකරණ, ගණිතය හා ගණිතමය ආදර්ශ සහ සංඛ්‍යානය යන විෂයන්ගෙන් දෙකකින් ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 සමන්විත වේ.

### 2.2.4.7 ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය - (TRANSPORT & LOGISTICS MANAGEMENT)

**(පාඨමාලා කේතය - 057)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

### 2.2.4.8 කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය - (INDUSTRIAL STATISTICS & MATHEMATICAL FINANCE)

**(පාඨමාලා කේතය - 059)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 120 )**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය සහ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය.

- උසස් ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව

- උපාධි පාඨමාලා - විද්‍යාවේදී (සාමාන්‍ය උපාධිය)
  පාඨමාලා කාලය - වසර තුනකි

  විද්‍යාවේදී (සාමාන්‍ය උපාධිය)
  පාඨමාලා කාලය - වසර හතරකි

  විද්‍යාවේදී ගෞරව (කර්මාන්ත සංඛ්‍යානය)
  පාඨමාලා කාලය - වසර හතරකි

  විද්‍යාවේදී ගෞරව (ගණිතමය මූල්‍ය)
  පාඨමාලා කාලය - වසර හතරකි

- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කොළඹ විශ්වවිද්‍යාලය

**2.2.4.9 සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ - (STATISTICS & OPERATIONS RESEARCH)**
**(පාඨමාලා කේතය - 060)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය සහ පහත දැක්වෙන විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය

- ජීව විද්‍යාව
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- කෘෂි විද්‍යාව
- ගණිතය
- උසස් ගණිතය
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

**2.2.4.10 ආගනණය සහ තොරතුරු පද්ධති - (COMPUTING & INFORMATION SYSTEMS)**
**(පාඨමාලා කේතය - 080)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ පහත සඳහන් විෂයයන් අතරින් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී විශේෂ (ආගනණය සහ තොරතුරු පද්ධති)උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමග අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ආගනණය සහ තොරතුරු පද්ධති පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.4.11 භෞතිය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - (PHYSICAL SCIENCE - ICT) (පාඨමාලා කේතය - 108) (යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 120)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල - භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විද්‍යාවේදී උපාධි පාඨමාලාව
  කැලණිය විශ්වවිද්‍යාලය

  භෞතික විද්‍යා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව [BSc (PICT)]
  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර තුනකි

**යම් පාඨමාලාවක් තුළ ඇති විශේෂ විෂය ක්ෂේත්‍ර සඳහා සිසුන් තෝරාගනු ලබනුයේ අයදුම්කරු අනුයුක්ත කර ඇති විශ්වවිද්‍යාලයේ අදාළ පීඨය මගිනි.**

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී භෞතිය විද්‍යා විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත්, ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- ප්‍රමාණ සමීක්ෂණය
- වාස්තු විද්‍යාව
- නිර්මාණවේදය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- නීතිය
- කළමනාකරණ අධ්‍යයන (TV)
- මැනුම් විද්‍යාව
- තොරතුරු තාක්ෂණය (IT)
- කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT)
- නගර හා ග්‍රාම නිර්මාණය
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)
- පහසුකම් කළමනාකරණය
- පරිගනණය සහ කළමනාකරණය
- විද්‍යාව සහ තාක්ෂණය
- පරිගණක විද්‍යාව සහ තාක්ෂණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- භෞත චිකිත්ස
- තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ඛනිජ සම්පත් සහ තාක්ෂණය
- ශාරීරික අධ්‍යාපනය
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)
- කථන හා ශ්‍රවණ විද්‍යා
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තාල සහ ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම
- තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය
- සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය
- තොරතුරු පද්ධති
- භූමි නිර්මාණවේදය
- පරිවර්තන අධ්‍යයන
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව

- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- සාගර සහ මිරිදිය විද්‍යාව
- ආහාර ව්‍යාපාර කළමනාකරණය
- ව්‍යාපාර විද්‍යාව
- භූගෝලීය තොරතුරු විද්‍යාව
- මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය
- මානව සම්පත් සංවර්ධනය

## 2.2.5 ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

### 2.2.5.1 ඉංජිනේරු තාක්ෂණවේදය - [ENGINEERING TECHNOLOGY (ET)]
**(පාඨමාලා කේතය - 102)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 1052)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

ඉංජිනේරු තාක්ෂණවේදය (ET), තාක්ෂණවේදය සඳහා විද්‍යාව (SFT) හා තුන්වන විෂය වශයෙන් පහත දැක්වෙන විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ආර්ථික විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ගෘහ ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
- චිත්‍ර
- ව්‍යාපාර අධ්‍යයනය
- කෘෂි විද්‍යාව
- ගිණුම්කරණය
- ගණිතය

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BET(Hons)] පැවත්වෙන විශ්වවිද්‍යාල සහ උපාධි පාඨමාලා පහත දැක්වේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

**කැලණිය විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

**යාපනය විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

**රුහුණ විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

නැනෝවිද්‍යා තාක්‍ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

කෘෂි විද්‍යා ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**කොළඹ විශ්වවිද්‍යාලය**

මෙවලම් හා ස්වයංක්‍රීය ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඉංජිනේරු තාක්‍ෂණවේදය විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්‍ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත්, ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- කළමනාකරණ අධ්‍යයන (TV)
- තොරතුරු තාක්‍ෂණය (IT)
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය (ICT)
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- ශාරීරික අධ්‍යාපනය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- නිර්මාණවේදය
- පරිගණනය සහ කළමනාකරණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- කාර්මික තොරතුරු තාක්‍ෂණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය (SEUSL)
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තොරතුරු තාක්‍ෂණය සහ කළමනාකරණය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)
- මානව සම්පත් සංවර්ධනය

## 2.2.6 ජෛවපද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව

### 2.2.6.1 ජෛවපද්ධති තාක්ෂණවේදය - [BIOSYSTEMS TECHNOLOGY (BST)]
**(පාඨමාලා කේතය - 103)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව – 945)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

ජෛවපද්ධති තාක්ෂණවේදය (BST), තාක්ෂණවේදය සඳහා විද්‍යාව (SFT) හා තුන්වන විෂය වශයෙන් පහත දැක්වෙන විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ආර්ථික විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ගෘහ ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
- චිත්‍ර
- ව්‍යාපාර අධ්‍යයනය
- කෘෂි විද්‍යාව
- ගිණුම්කරණය
- ගණිතය

ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BBST(Hons)] පැවැත්වෙන විශ්වවිද්‍යාල සහ උපාධි පාඨමාලා පහත දැක්වේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

**යාපනය විශ්වවිද්‍යාලය**
වාණිජ හරිත ගොවිතැන පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය
ආහාර නිෂ්පාදනය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

**නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
කෘෂි තාක්ෂණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**
කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**කොළඹ විශ්වවිද්‍යාලය**

පාරිසරික ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

කෘෂිකර්ම ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**රුහුණ විශ්වවිද්‍යාලය**

ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජෛවපද්ධති තාක්‍ෂණවේදය විෂය ධාරාවේ විෂයයන්ට පෙනී සිටි අපේක්‍ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත්, ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- කළමනාකරණ අධ්‍යයන (TV)
- තොරතුරු තාක්‍ෂණය (IT)
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය (ICT)
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- ශාරීරික අධ්‍යාපනය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- නිර්මාණවේදය
- පරිගණනය සහ කළමනාකරණය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- කාර්මික තොරතුරු තාක්‍ෂණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය (SEUSL)
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- තොරතුරු තාක්‍ෂණය සහ කළමනාකරණය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)
- මානව සම්පත් සංවර්ධනය

**2.2.7. තොරතුරු සන්නිවේදන තාක්ෂණය - (INFORMATION COMMUNICATION TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 104)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව – 785)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT), තාක්ෂණවේදය සඳහා විද්‍යාව (SFT), සහ ඉංජිනේරු තාක්ෂණවේදය (ET) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය (BST) යන විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BICT(Hons)] පහත සඳහන් විශ්වවිද්‍යාල වලදී හැදෑරීමට අවකාශ ලැබේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**කැලණිය විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය)**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**රුහුණ විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**කොළඹ විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය

**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණය අධ්‍යයන පාඨමාලාවට සුදුසුකම් ලබන අපේක්ෂකයන්ට පහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහාද අයදුම් කළ හැකිය. නමුත්, ඔවුන් ඒ සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.**

- කළමනාකරණ අධ්‍යයන (TV)
- සාමය හා ගැටුම් නිරාකරණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)
- ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය
- ශාරීරික අධ්‍යාපනය
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය
- නිර්මාණවේදය
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය

- කාර්මික තොරතුරු තාක්ෂණය
- කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL)
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
- පරිවර්තන අධ්‍යයන
- සිනමා හා රූපවාහිනී අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණය
- මානව සම්පත් සංවර්ධනය

තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ විශේෂිත ප්‍රථම උපාධි පාඨමාලා තුනක් හඳුන්වාදෙනු ලැබේ. එනම්, ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BET(Hons)], ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BBST(Hons)]සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලාව [BICT(Hons)]වශයෙනි. මෙම සියලු ප්‍රථම උපාධි පාඨමාලා සැකසී ඇත්තේ මෙරට පවතින වෙළඳපොළ සහ කාර්මික අවශ්‍යතා සපුරාලීමේ පිළියමක් වශයෙනි. මේ අතරින්, ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලා [BET(Hons)], Sydney Accord අනුසාරයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) මගින් සකසන ලද Accreditation Mannual යන ග්‍රන්ථය පදනම් කොටගෙන සැකසී ඇති අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව ප්‍රථම උපාධි පාඨමාලා [BICT(Hons)]ශ්‍රී ලංකා පරිගණක සංසදයේ උපදෙස් අනුසාරයෙන් සැකසී ඇත. 2016 සැප්තැම්බර් මස National Biotechnology Industry Association (NBIA) ආරම්භ වීමත් සමඟම, ජෛවපද්ධති තාක්ෂණවේදී උපාධි පාඨමාලාව ප්‍රදානය කිරීමට අදාළ වන වෘත්තීමය ආයතනය වශයෙන් National Biotechnology Industry Association (NBIA) ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුනා ගන්නා ලදී. ඉහත සියළු උපාධි පාඨමාලා ශාස්ත්‍රීය අගය (Credit) 120 කින් සමන්විත වේ.

## 2.2.8 විවිධ විෂය ධාරාවන්වල සිසුන් සුදුසුකම් ලබන පාඨමාලා

### 2.2.8.1 තොරතුරු තාක්ෂණය - (INFORMATION TECHNOLOGY – IT)
**(පාඨමාලා කේතය - 026)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව -200)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත දැක්වෙන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.

- උසස් ගණිතය
- සංයුක්ත ගණිතය
- ගණිතය
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (තොරතුරු තාක්ෂණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

### 2.2.8.2 කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය - [MANAGEMENT AND INFORMATION TECHNOLOGY (MIT)]
**(පාඨමාලා කේතය - 027)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව -100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව

(i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් ඉදිරිපත්ව විෂයයන් තුනකින් සමත් වීම ;

හෝ

(ii) ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සමත් වීම.

මීට අමතරව, සියළුම අයදුම්කරුවන් විසින් කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

තවද, පාඨමාලාව හදාරණ විද්‍යාර්ථීන්හට තෙවන වසර සිට පහත සඳහන් විෂය පථයන්ගෙන් එකක් තෝරාගෙන එය තවදුරටත් නිපුණ කිරීම සඳහා අවකාශය සැලසේ.

1. තොරතුරු තාක්ෂණය [Information Technology(IT)]
2. ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව [Business Systems Engineering (BSE)]
3. මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය [Operations & Supply Chain Management (OSCM)]
4. තොරතුරු පද්ධති [Information Systems(IS)]

කැලණිය විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර කැලණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් විමසිය යුතුය.

### 2.2.8.3 ප්‍රමාණ සමීක්ෂණය - (QUANTITY SURVEYING)
**(පාඨමාලා කේතය - 011)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 125)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත දැක්වෙන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා පෙනී සිට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- සංයුක්ත ගණිතය
- උසස් ගණිතය

තවද, අනෙකුත් විෂය / විෂයයන් පහත සඳහන් විෂයයන් ගෙන් තෝරා ගෙන අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ගිණුම්කරණය
- ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර සංඛ්‍යානය
- ව්‍යාපාර අධ්‍යයනය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මීට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී පහත සඳහන් අවශ්‍යතාවන් ද සපුරා තිබිය යුතුය.

(අ) ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්

(ආ) විද්‍යා විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

(ඇ) ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (ප්‍රමාණ සමීක්ෂණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ තමන්ගේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රමාණ සමීක්ෂණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.8.4 මැනුම් විද්‍යාව - (SURVEYING SCIENCE)
**(පාඨමාලා කේතය - 014)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 110)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ වෙනත් ඕනෑම අනුමත විෂයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (මැනුම් විද්‍යා) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - සබරගමුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

### 2.2.8.5 නගර හා ග්‍රාම නිර්මාණය - (TOWN & COUNTRY PLANNING)
**(පාඨමාලා කේතය - 030)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 55)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත දැක්වෙන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් සමත් විය යුතුය.

- ඉංජිනේරු තාක්ෂණය
- කෘෂි විද්‍යාව
- ජීව විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයන
- ව්‍යාපාර සංඛ්‍යානය
- රසායන විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ආර්ථික විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- භූගෝල විද්‍යාව
- උසස් ගණිතය
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- ගණිතය
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මීට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් අධි (B) සාමාර්ථයක් හා ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (නගර හා ග්‍රාම නිර්මාණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමඟ එවිය යුතුය. එම සහතික අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වුවහොත් නගර හා ග්‍රාම නිර්මාණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**සටහන :**

**(i) නගර හා ග්‍රාම නිර්මාණය පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් ගෙන් තෝරා ගත් විෂයයන් තුනකට ;**

- **සංයුක්ත ගණිතය**
- **රසායන විද්‍යාව**
- **භෞතික විද්‍යාව**
- **ජීව විද්‍යාව**

**හෝ**

**(ii) ඉහත විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් සමඟ පහත සඳහන් විෂය මාලාවෙන් ඉතිරි විෂය/ විෂයයන්ට පෙනී සිට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

- **ගිණුම්කරණය**
- **කෘෂි විද්‍යාව**
- **ව්‍යාපාර අධ්‍යයන**
- **ව්‍යාපාර සංඛ්‍යානය**
- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**
- **ආර්ථික විද්‍යාව**
- **දේශපාලන විද්‍යාව**
- **භූගෝල විද්‍යාව**
- **උසස් ගණිතය**
- **තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය**
- **ගණිතය**
- **ජෛවපද්ධති තාක්ෂණවේදය**
- **තාක්ෂණවේදය සඳහා විද්‍යාව**
- **ඉංජිනේරු තාක්ෂණවේදය**

**මීට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් අධි (B) සාමාර්ථයක් හා ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.**

**2.2.8.6 වාස්තු විද්‍යාව - (ARCHITECTURE)**
**(පාඨමාලා කේතය - 023)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) පහත දැක්වෙන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයකට:

(i)
- චිත්‍ර
- උසස් ගණිතය
- සංයුක්ත ගණිතය
- භූගෝල විද්‍යාව
- රසායන විද්‍යාව
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් අනෙක් විෂයය /විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ගිණුම්කරණය
- හින්දු ශිෂ්ඨාචාරය
- ව්‍යාපාර සංඛ්‍යානය
- ඉස්ලාම් ශිෂ්ඨාචාරය
- ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය
- දේශපාලන විද්‍යාව
- ඉංග්‍රීසි
- සිංහල
- සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
- ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය
- හින්දි
- බෞද්ධ ශිෂ්ඨාචාරය
- ගෘහ ආර්ථික විද්‍යාව
- චීන
- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
- ගණිතය
- සංස්කෘත
- ජර්මන්
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- අරාබි
- ඉතිහාසය
- ව්‍යාපාර අධ්‍යයන
- ජපන්
- ආර්ථික විද්‍යාව
- පාලි
- ප්‍රංශ
- දෙමළ
- කෘෂි විද්‍යාව

මීට අමතරව, අපේක්ෂකයන් විසින් පහත සඳහන් අවශ්‍යතාවන් ද සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

- උපාධි පාඨමාලාව - වාස්තු විද්‍යාවේදී උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර පහකි

මොරටුව විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර මොරටුව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් විමසිය යුතුය.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමග එවිය යුතුය. එම සහතික අයදුම්පත සමග එවීමට අපොහොසත් වුවහොත් වාස්තු විද්‍යාව පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

## 2.2.8.7 විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය - (FASHION DESIGN & PRODUCT DEVELOPMENT)
**(පාඨමාලා කේතය - 034)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් පහත සඳහන් අවශ්‍යතාවන් ද සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

- උපාධි පාඨමාලාව - මෝස්තර නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව (B Des Hons)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අපේක්ෂකයන් මෙවැනි ගුණයන්ගෙන් ද යුක්ත විය යුතුය.

- විලාසිතා සහ රෙදිපිළි නිර්මාණකරණය පිළිබඳ අභිරුචිය.
- ව්‍යාපෘති පාදක කරගත් ස්වාධීන අධ්‍යයනයන් සඳහා වන කැපවීම.
- නිර්මාණාත්මක කලාව සහ සංස්කෘතිය, සිතුවම්කරණය, සිනමාව සහ සංගීතය කෙරෙහි දක්වන සැබෑ රුචිය සහ මහත් ළැදිකම.

මෙම පාඨමාලාව මතු සඳහන් ක්ෂේත්‍ර ද්විත්වයෙහි විශේෂඥතාවය පිරිනමයි. මෙම ක්ෂේත්‍ර සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම නියමිත නිර්ණායක අනුව සිදුකරන අතර ශිෂ්‍යයන්ගේ මනාපය සහ ප්‍රථම වසර ප්‍රතිඵල ද සලකා බැලේ.

**විලාසිතා නිර්මාණකරණය**

මෙහිදී පර්යේෂණ, සංකල්ප ප්‍රවර්ධනය, නිපැයුම් ප්‍රවර්ධනය (පතොරම් කැපීම සහ ඇඳුම් තාක්ෂණය) සහ අලෙවිකරණය (ක්‍රමෝපායන අලෙවිකරණය, පාරිභෝගිකයාගේ චර්යාව, සන්නම) වැනි හරවත් කුසලතා වර්ධනය කරයි.

**රෙදිපිළි නිර්මාණකරණය**

මෙහිදී පර්යේෂණ, සංකල්ප ප්‍රවර්ධනය, නිපැයුම් ප්‍රවර්ධනය (අත්‍යන්ත්‍ර පේෂකර්ම වියවීම, ගෙතීම, රෙදිපිළි වර්ණ ගැන්වීම, මුද්‍රණය සහ නිමහම් ක්‍රමවේදය) වැනි හරවත් කුසලතා වර්ධනය කරයි.

අවශ්‍ය ද්‍රව්‍ය මූලාශ්‍ර කර ගනිමින් නිර්මාණය කරන ලද නිර්මාණ ගොනුවක් (portfolio) පාඨමාලාව අවසානයේදී ශිෂ්‍යයා වගකීමෙන් ඉදිරිපත් කළ යුතුය.

මෙම උපාධි පාඨමාලාව යථාර්ථවාදී වාණිජ අරමුණු සමග ස්වාධීන නිර්මාණශීලීත්වයෙන් සම්මිශ්‍රණය වූවකි. මෙහිදී පාරිභෝගිකයා, සන්නම සහ වෙළඳපොල ඉලක්ක කරගත් සංකල්ප බිහිකිරීමේ සිට නිෂ්පාදනය දක්වා වූ වෘත්තිමය නිර්මාණකරණ ක්‍රියාවලියට උපාධිධාරියාට තම කුසලතා සහ දැනුම යෙදවිය හැකිය.

මොරටුව විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර මොරටුව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් විමසිය යුතුය.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමග එවිය යුතුය. එම සහතික අයදුම්පත සමග එවීමට අපොහොසත් වුවහොත් විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**2.2.8.8 භූමි නිර්මාණවේදය - (LANDSCAPE ARCHITECTURE)**
**(පාඨමාලා කේතය - 097)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

(i) අ.පො.ස. (උසස් පෙළ) පහත දැක්වෙන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයකට ;

- චිත්‍ර
- භූගෝල විද්‍යාව
- ජීව විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- සංයුක්ත ගණිතය
- කෘෂි විද්‍යාව

සහ

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් අනෙක් විෂය / විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ගිණුම්කරණය
- හින්දි
- අරාබි
- හින්දු ශිෂ්ටාචාරය
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ඉතිහාසය
- ව්‍යාපාර සංඛ්‍යානය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයන
- ඉස්ලාම් ශිෂ්ටාචාරය
- චීන
- ජපන්
- ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
- ආර්ථික විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- ගණිතය
- පාලි
- ඉංග්‍රීසි
- සංස්කෘත
- ප්‍රංශ
- සිංහල
- ජර්මන්
- සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
- දෙමළ
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ඊට අමතරව, අපේක්ෂකයන් පහත සඳහන් අවශ්‍යතාවන් ද සපුරාලිය යුතුය ;

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S)සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - භූමි නිර්මාණවේදී උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

මොරටුව විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර මොරටුව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් විමසිය යුතුය.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමඟ එවිය යුතුය. එම සහතික අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වුවහොත් භූමි නිර්මාණවේදය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.8.9 නිර්මාණවේදය - (DESIGN)
**(පාඨමාලා කේතය - 024)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් පහත සඳහන් අවශ්‍යතාවන් ද සපුරා තිබිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට, අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S)සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඈ) මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව (Bachelor of Design Honours)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

මෙම පාඨමාලාව පහත දැක්වෙන පරිදි විශේෂායන තුනකින් පිරිනැමෙන අතර පාඨමාලාවේ දෙවන වසර ප්‍රථම වර්ෂාර්ධය අවසානයේ එක් එක් විශේෂායනය සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

(i) **විලාසිතා සහ ජීවන විලාස නිර්මාණකරණය**

විලාසිතා නිර්මාණකරණය සහ තාක්‍ෂණය, ඇඳුම් නිර්මාණකරණය, පැළඳුම් නිර්මාණකරණය, ආභරණ නිර්මාණකරණය සහ විලාසිතාම උපාංග නිර්මාණකරණයෙහි නිපුණතා සංවර්ධනය අරමුණු වෙයි.

(ii) **මාධ්‍ය සහ සන්නිවේදන නිර්මාණකරණය**

නිරූඨ නිර්මාණකරණය, ප්‍රචාරණ නිර්මාණකරණය, සල රූ නිර්මාණකරණය සහ මානව පරිගණක අන්තර්ක්‍රියා නිර්මාණකරණයෙහි නිපුණතා සංවර්ධනය අරමුණ වෙයි.

(iii) **භාණ්ඩ සහ උපාංග නිර්මාණකරණය**

ගෘහ භාණ්ඩ සහ උපාංග නිර්මාණකරණය, පිගන් මැටි ආශ්‍රිත නිර්මාණකරණය, විදුලි උපාංග නිර්මාණකරණ සහ කාර්මික නිර්මාණකරණයෙහි නිපුණතා සංවර්ධනය අරමුණ වෙයි.

මොරටුව විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්‍ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර මොරටුව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් විමසිය යුතුය.

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමග එවිය යුතුය. එම සහතිකය අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් නිර්මාණවේදය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.8.10 නීතිය - (LAW)
**(පාඨමාලා කේතය - 025)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව -385)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්**

(i) පහත සඳහන් විෂය මාලාවෙන් තෝරාගත් විෂයයන් තුනකට ;

- ගිණුම්කරණ
- කෘෂි විද්‍යාව
- ජීව විද්‍යාව
- ව්‍යාපාර සංඛ්‍යානය
- ව්‍යාපාර අධ්‍යයන
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
- දේශපාලන විද්‍යාව
- භූගෝල විද්‍යාව
- උසස් ගණිතය
- ඉතිහාසය
- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
- ආර්ථික විද්‍යාව
- ගණිතය/සංයුක්ත ගණිතය
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය

හෝ

(ii) ඉහත විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් සමග පහත දැක්වෙන විෂය මාලාවෙන් ඉතිරි විෂය/ විෂයයන් ට පෙනී සිට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- බුද්ධ ධර්මය/ බෞද්ධ ශිෂ්ටාචාරය
- ක්‍රිස්තු ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
- හින්දු ධර්මය/ හින්දු ශිෂ්ටාචාරය
- ඉස්ලාම්/ඉස්ලාම් ශිෂ්ටාචාරය

- ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය
- ජපන්
- පාලි
- සංස්කෘත
- සිංහල
- දෙමළ
- චීන
- ඉංග්‍රීසි
- ප්‍රංශ
- ජර්මන්
- අරාබි

තවද, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - නීතිවේදී
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - කොළඹ විශ්වවිද්‍යාලය<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>යාපනය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එම සහතිකය අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් නීතිය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.8.11 පහසුකම් කළමනාකරණය - (FACILITIES MANAGEMENT)
**(පාඨමාලා කේතය - 056)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය හෝ ගණකාධිකරණය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) සහ පහත සඳහන් විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය.

- ව්‍යාපාර සංඛ්‍යානය
- උසස් ගණිතය
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය
- ආර්ථික විද්‍යාව

මීට අමතරව, අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය ;

- ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්
- ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්
- විද්‍යා විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (ගෞරව) පහසුකම් කළමනාකරණ උපාධි පාඨමාලාව [BScHons (FM)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පහසුකම් කළමනාකරණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

සටහන :

**පහසුකම් කළමනාකරණය පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස.(උසස් පෙළ)විභාගයේ දී පහත සඳහන් කාණ්ඩ දෙක අතුරින් එක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති අදාළ අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.**

**(අ) කාණ්ඩය**
**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

**(ආ) කාණ්ඩය**
**අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය යන විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම ;**

**හෝ**

**ඉහත (ආ) කාණ්ඩයෙන් ගිණුම්කරණය ඇතුළුව විෂයයන් දෙකක් සමඟ පහත සඳහන් විෂය මාලාවෙන් ඉතිරි විෂයට පෙනී සිට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ජර්මන්
- සංයුක්ත ගණිතය
- ඉතිහාසය
- දේශපාලන විද්‍යාව
- ඉංග්‍රීසි
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- ප්‍රංශ
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ඉහත එක් කාණ්ඩයක් යටතේ අදාළ අවම සුදුසුකම් සපුරා තිබීමට අමතරව 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්, ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ විද්‍යාව විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.**

### 2.2.8.12 පරිගණනය සහ කළමනාකරණය - (COMPUTATION & MANAGEMENT)
**(පාඨමාලා කේතය - 061)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ආර්ථික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය ඇතුළුව ඕනෑම අනුමත විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (පරිගණනය සහ කළමනාකරණය)
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරිගණනය සහ කළමනාකරණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**සටහන : 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් මෙම උපාධි පාඨමාලාව පිරිනැමීම අත්හිටවනු ලැබේ. එබැවින්, 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට ඒ සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කරනු නොලැබේ.**

### 2.2.8.13 කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) - [MANAGEMENT AND INFORMATION TECHNOLOGY (SEUSL)]

**(පාඨමාලා කේතය - 079)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 120)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මෙම උපාධි පාඨමාලාවට කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විෂයය ඒකක ඇතුළත් වේ.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර තුනකි

### 2.2.8.14 විද්‍යාව සහ තාක්ෂණය - (SCIENCE AND TECHNOLOGY)

**(පාඨමාලා කේතය - 064)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 65)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය

- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

1. සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය

සහ

2. රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව

සමග

තුන්වන විෂය ලෙස පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ජීව විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය [BScHons (Science Tec)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

ශිෂ්‍යයන් මෙම පාඨමාලාව සඳහා තේරී පත්වූ විට පහත දැක්වෙන විශේෂකරණයන්ගෙන් එකක් තුන්වන අධ්‍යයන වර්ෂය ආරම්භයේදී හැදෑරිය යුතුය.

- ආහාර ඉංජිනේරු විද්‍යාව සහ ජෛව සැකසුම් තාක්ෂණය - (Food Engineering & Bioprocess Tecnology)

  උපාධි පාඨමාලාව - විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී ආහාර ඉංජිනේරු විද්‍යාව සහ ජෛව සැකසුම් තාක්ෂණය සහිත ගෞරව උපාධිය [BScHons (Science Tec) (FEBT)]

- පදාර්ථ විද්‍යාව හා තාක්ෂණය - (Material Science & Technology)

  උපාධි පාඨමාලාව - විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී පදාර්ථ විද්‍යාව හා තාක්ෂණය සහිත ගෞරව උපාධිය [BScHons (Science Tec) (MST)]

- මෙකාට්‍රොනික්ස් - (Machatronics)

උපාධි පාඨමාලාව - විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී මෙකාට්‍රොනික්ස් සහිත ගෞරව උපාධිය [BScHons (Science Tec) (Mechatronics)]

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

### 2.2.8.15 පරිගණක විද්‍යාව සහ තාක්ෂණය - (COMPUTER SCIENCE & TECHNOLOGY) (පාඨමාලා කේතය - 065) (යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ තුන්වන විෂය ලෙස පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- උසස් ගණිතය
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත විෂයයන් තුනට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

1. සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය

සහ

2. භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව

සමඟ

තුන්වන විෂය ලෙස පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- කෘෂි විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ජීව විද්‍යාව
- උසස් ගණිතය
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - පරිගණක විද්‍යාව හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය [BScHons (CST)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

### 2.2.8.16 ව්‍යවසායකත්වය සහ කළමනාකරණය - (ENTREPRENEURSHIP & MANAGEMENT)
**(පාඨමාලා කේතය - 066)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 80)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ව්‍යවසායකත්වය සහ කළමනාකරණය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

ශිෂ්‍යයන් මෙම පාඨමාලාව සඳහා තේරී පත්වූ විට පහත දැක්වෙන විශේෂකරණයන්ගෙන් එකක් තුන්වන අධ්‍යයන වර්ෂය ආරම්භයේදී හැදෑරිය යුතුය.

- රක්ෂණය සහ ආයුගණක (Insurance and Actuary)
- ව්‍යවසායකත්වය සහ කළමනාකරණ තාක්ෂණය (Entrepreneurship & Management Technology)

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

**2.2.8.17 තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම - (TEA TECHNOLOGY & VALUE ADDITION)**
**(පාඨමාලා කේතය - 074)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 65)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම) උපාධිය [BScHons (Tea Tech & Value Addition)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

**2.2.8.18 කාර්මික තොරතුරු තාක්ෂණය - (INDUSTRIAL INFORMATION TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 075)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - කාර්මික තොරතුරු තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය [BScHons (IIT)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

**2.2.8.19 ඛනිජ සම්පත් සහ තාක්ෂණය - (MINERAL RESOURCES AND TECHNOLOGY)**
**(පාඨමාලා කේතය - 076)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 65)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - ඛනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය [BScHons (MRT)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

මෙම පාඨමාලාව සඳහා තේරී පත්වූ සිසුන් තුන්වන අධ්‍යයන වර්ෂය ආරම්භයේදී පහත දැක්වෙන විශේෂකරණයන්ගෙන් එකක් හැදෑරිය යුතුය.

1. ඛනිජ සැකසුම් තාක්ෂණය -(Mineral Processing Technology)

   උපාධි පාඨමාලාව - ඛනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ඛනිජ සැකසුම් තාක්ෂණය සහිත ගෞරව උපාධිය [BScHons (MRT) (MPT)]

-

2. ජල විද්‍යා හා තාක්ෂණය - (Water Science and Technology)

   උපාධි පාඨමාලාව - ඛනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ජල විද්‍යා හා තාක්ෂණය සහිත ගෞරව උපාධිය [BScHons (MRT) (WST)]

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

**2.2.8.20 තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම - (PALM AND LATEX TECHNOLOGY & VALUE ADDITION)**
**(පාඨමාලා කේතය - 089)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 65)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී මීළඟ පිටුවෙහි සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව (තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම)උපාධිය [BScHons (Palm and Latex Tech & Value Addition)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සිදුකළ යුතුය.

### 2.2.8.21 ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය (HOSPITALITY, TOURISM AND EVENTS MANAGEMENT)
**(පාඨමාලා කේතය - 090)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 80)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය)උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

අවසාන වසරේදී සියලුම ශිෂ්‍යයන් කාර්මික පුහුණුව සහ තමන්ගේ විෂයයන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදුකළ යුතුය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

### 2.2.8.22 ශාරීරික අධ්‍යාපනය - (PHYSICAL EDUCATION)
**(පාඨමාලා කේතය - 081)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

**2.2.8.23 ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය - (SPORTS SCIENCE & MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 082)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 105)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව අපේක්ෂකයන් විසින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් ඒකාබද්ධව පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල - විද්‍යාවේදී (ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය) විශේෂ උපාධිය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
  - විද්‍යාවේදී (ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය) ගෞරව උපාධිය [BScHons (SSM)] ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

මෙම පරීක්ෂණයේදී 30% ක ලකුණු ලබාදීමක් සිදුකරනුයේ පාසල්, පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා සඳහා වේ. එසේම තවත් 30% ක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබාදේ. ඉතිරි 40% ලකුණු ප්‍රමාණය ලිඛිත පරීක්ෂණය සඳහා වේ.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරීවරුන් විමසිය යුතුය.

## 2.2.8.24 කථන හා ශ්‍රවණ විද්‍යා - (SPEECH AND HEARING SCIENCES)
**(පාඨමාලා කේතය - 083)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජෛවීය විද්‍යා විෂය ධාරාව, භෞතීය විද්‍යා විෂය ධාරාව හෝ මෙම අත්පොතෙහි 2.2.1.1 කොටසෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරා ගනු ලබන කලා විෂය ධාරාවේ ඕනෑම අනුමත විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව අපේක්ෂකයන් විසින් කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව කථන හා ශ්‍රවණ විද්‍යා උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් පවත්වනු ලබන මෙම උපාධි පාඨමාලාවේ විශේෂ විෂය ක්ෂේත්‍ර වන්නේ කථන හා භාෂා චිකිත්සාව සහ ශ්‍රවණවේදයයි. ශ්‍රවණවේදය විශේෂ උපාධිය හැදෑරිය හැක්කේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයයට පෙනී සිටි සිසුන්ට පමණි.

කැලණිය විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

## 2.2.8.25 තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය - (INFORMATION TECHNOLOGY & MANAGEMENT)
**(පාඨමාලා කේතය - 091)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.

- උසස් ගණිතය
- ආර්ථික විද්‍යාව
- ගණිතය
- සංයුක්ත ගණිතය
- භූගෝල විද්‍යාව
- භෞතික විද්‍යාව
- ගිණුම්කරණය
- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
- ව්‍යාපාර සංඛ්‍යානය

මීට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

- ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්
- ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්

| | | |
|---|---|---|
| ▪ උපාධි පාඨමාලාව | - | විද්‍යාවේදී තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය ගෞරව උපාධිය |
| ▪ පාඨමාලාව පැවැත්වන විශ්වවිද්‍යාලය | - | මොරටුව විශ්වවිද්‍යාලය |
| ▪ පාඨමාලා කාලය | - | වසර හතරකි |
| ▪ මාධ්‍යය | - | ඉංග්‍රීසි |

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**සටහන :**

**තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහා සම්මාන (C) සාමාර්ථ සහිතව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.**

- **උසස් ගණිතය**
- **සංයුක්ත ගණිතය**
- **ගිණුම්කරණය**
- **ආර්ථික විද්‍යාව**
- **භූගෝල විද්‍යාව**
- **තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය**
- **ගණිතය**
- **භෞතික විද්‍යාව**
- **ව්‍යාපාර සංඛ්‍යානය**
- **තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය**
- **රසායන විද්‍යාව**

**මීට අමතරව, අයදුම්කරුවන් විසින් 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.**

**තවද, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්ද ලබා තිබිය යුතුය.**

### 2.2.8.26 සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය - (TOURISM & HOSPITALITY MANAGEMENT)

**(පාඨමාලා කේතය - 092)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 130)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී මීළඟ පිටුවෙහි සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) වාණිජ්‍යය, ජීව විද්‍යාව සහ භෞතීය විද්‍යා විෂය ධාරා යටතේ අනුමත විෂයයන් තුනක්

(ii) ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය විෂයයන් අතුරින් අවම වශයෙන් එක් (01) විෂයයක් සහ මෙම අත්පොතෙහි 2.2.1.1 කොටසෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලබන කලා විෂය ධාරාවේ අනිකුත් විෂයයන් දෙකක්.

- උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල
  විද්‍යාවේදී සංචාරක කළමනාකරණය (විශේෂ) උපාධිය
  විද්‍යාවේදී ආගන්තුක සත්කාර කළමනාකරණය (විශේෂ) උපාධිය
  සබරගමුව විශ්වවිද්‍යාලය

  සංචාරක කළමනාකරණය (විශේෂ) උපාධිය
  විද්‍යාවේදී සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය (විශේෂ) උපාධිය
  රජරට විශ්වවිද්‍යාලය

- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

## 2.2.8.27 තොරතුරු පද්ධති - (INFORMATION SYSTEMS)
**(පාඨමාලා කේතය - 096)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන (C) සාමාර්ථ සහිතව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.

- උසස් ගණිතය
- ගණිතය / සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- ගිණුම්කරණය
- ව්‍යාපාර සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය
- ජීව විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- භූගෝල විද්‍යාව
- සිවිල් තාක්ෂණය
- යාන්ත්‍රික තාක්ෂණය
- විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මීට අමතරව, අයදුම්කරුවන් විසින් පහත අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
(iii) කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී තොරතුරු පද්ධති උපාධිය (Bachelor of Science in Information Systems)
- පාඨමාලාව පවත්වන අධ්‍යයනායතනය - කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
- පාඨමාලා කාලය - වසර තුනකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

මෙම පාඨමාලාවට තෝරා ගන්නා සිසුන් අතුරින් ඔවුන්ගේ දක්ෂතාවය සහ මනාපය අනුව තෝරා ගනු ලබන සීමිත සිසුන් සංඛ්‍යාවකට විද්‍යාවේදී තොරතුරු පද්ධති ගෞරව (Bachelor of Science Honours in Information Systems) සිව් අවුරුදු උපාධි පාඨමාලාව හැදෑරිය හැක.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් පුවත්පත් නිවේදනයක් මගින් හෝ ආයතනයේ වෙබ් අඩවිය වන (www.ucsc.cmb.ac.lk )මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / විභාග විමසිය යුතුය.

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉහත කී සාමාර්ථයන් ලැබූ බව සනාථ කෙරෙන සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් තොරතුරු පද්ධති පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

### 2.2.8.28 පරිවර්තන අධ්‍යයන - (TRANSLATION STUDIES)
**(පාඨමාලා කේතය - 098)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 115)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව මගින් ඒකාබද්ධව පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය (භාෂා ප්‍රවීණතාව පිළිබඳ)සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව හා පවත්වන විශ්වවිද්‍යාල - ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයන
  කැලණිය විශ්වවිද්‍යාලය
  (ඉංග්‍රීසි / සිංහල)

  ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයන
  ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
  (ඉංග්‍රීසි / සිංහල)

  ශාස්ත්‍රවේදී (විශේෂ) පරිවර්තන අධ්‍යයන
  යාපනය විශ්වවිද්‍යාලය
  (ඉංග්‍රීසි / දෙමළ)

ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයන
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
(ඉංග්‍රීසි / දෙමළ)

- පාඨමාලා කාලය - වසර හතරකි

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව විසින් පුවත්පත් නිවේදනයක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,කැලණිය විශ්වවිද්‍යාලය,යාපනය විශ්වවිද්‍යාලය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරුන් විමසිය යුතුය.

**2.2.8.29 සිනමා හා රූපවාහිනී අධ්‍යයන - (FILM & TELEVISION STUDIES)**
**(පාඨමාලා කේතය - 100)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අයදුම්කරුවන් අදාළ විශ්වවිද්‍යාලය මගින් පවත්වන සිනමා හා රූපවාහිනී අධ්‍යයනය පිළිබඳ විශේෂ කුසලතා පරීක්ෂා කෙරෙන අභියෝග්‍යතා පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

අයදුම්කරුවන් සිනමා හා රූපවාහිනී අධ්‍යයනය පිළිබඳව දක්වන ඇල්ම, උනන්දුව සහ සහජ දක්ෂතාවය මත පිහිටා අයදුම් කිරීම අපේක්ෂා කෙරේ. විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ආකාරයට මෙම යෝග්‍යතා පරීක්ෂණය වාචික, ප්‍රායෝගික හෝ ලිඛිත හෝ මෙම අංශ තුනෙන්ම සමන්විත විය හැකිය.

- උපාධි පාඨමාලාව - ශාස්ත්‍රවේදී (විශේෂ) සිනමා හා රූපවාහිනී අධ්‍යයන පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

කැලණිය විශ්වවිද්‍යාලය යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

**2.2.8.30 ව්‍යාපෘති කළමනාකරණය - (PROJECT MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 101)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 75)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලා හා පාඨමාලා කාලය - ව්‍යාපාර කළමනාකරණවේදී (ව්‍යාපෘති කළමනාකරණය) සාමාන්‍ය උපාධිය
  - වසර තුනකි

- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව (ව්‍යාපෘති කළමනාකරණය) [BBMHons (Project Management)]
- වසර හතරකි

- පාඨමාලාව පවත්වන මණ්ඩපය - යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය
- මාධ්‍යය - ඉංග්‍රීසි

### 2.2.8.31 තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය - [INFORMATION AND COMMUNICATION TECHNOLOGY (ICT)]

**(පාඨමාලා කේතය - 038)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 200)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත දැක්වෙන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා හෝ සම්මාන (C) සාමාර්ථයක් සහිතව විෂයයන් තුන සමත් වී තිබිය යුතුය .

- උසස් ගණිතය
- ගණිතය / සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- ගිණුම්කරණය
- ව්‍යාපාර සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය
- ජීව විද්‍යාව
- භූගෝල විද්‍යාව
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
- සංස්කෘත
- සංගීතය (පෙරදිග/කර්ණාටක/බටහිර)
- සිවිල් තාක්‍ෂණය
- යාන්ත්‍රික තාක්‍ෂණය
- විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්‍ෂණවේදය
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය

මීට අමතරව, අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන අවශ්‍යතා ද සපුරාලිය යුතුය.

(අ) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ආ) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) ඊට අමතරව රජරට විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය එකාබද්ධව පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන්ද අයදුම්කරුවන් සමත් විය යුතුය.

**ලබාදෙන උපාධි පාඨමාලා :**

| | | | |
|---|---|---|---|
| ▪ | උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල | - | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී උපාධි පාඨමාලාව<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br><br>විද්‍යාවේදී තොරතුරු තාක්ෂණය උපාධි පාඨමාලාව<br>වව්නියා මණ්ඩපය, යාපනය විශ්වවිද්‍යාලය |
| ▪ | පාඨමාලා කාලය | - | වසර තුනකි |

එම සිසුන් අතරින් ඔවුන්ගේ දක්ෂතාවය සහ මනාපය අනුව තෝරාගනු ලබන සීමිත සිසුන් සංඛ්‍යා -වකට පහත සඳහන් උපාධි පාඨමාලාව සඳහා අවස්ථාව හිමිවේ.

| | | | |
|---|---|---|---|
| ▪ | උපාධි පාඨමාලා හා පවත්වන විශ්වවිද්‍යාල | - | විද්‍යාවේදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපාධි පාඨමාලාව<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br><br>විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණය උපාධි පාඨමාලාව<br>වව්නියා මණ්ඩපය, යාපනය විශ්වවිද්‍යාලය |
| ▪ | පාඨමාලා කාලය | - | වසර හතරකි |

ඉගැන්වීම හා විභාග පැවැත්වීම ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිදු කෙරේ.

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ තමන්ගේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**යෝග්‍යතා පරීක්ෂණය:**

(i) යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පුවත්පත් නිවේදනයක් මගින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

(ii) වැඩි විස්තර සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපයේ මණ්ඩපාධිපති සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

**2.2.8.32 මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව - (SOFTWARE ENGINEERING)**
**(පාඨමාලා කේතය - 099)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන්ට සහ තුන්වන විෂය වශයෙන් පහත දක්වා ඇති විෂයයන්ගෙන් එකකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය.

- රසායන විද්‍යාව
- උසස් ගණිතය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

- උපාධි පාඨමාලාව - මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාල - කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

**2.2.8.33 ආහාර ව්‍යාපාර කළමනාකරණය - (FOOD BUSINESS MANAGEMENT)**
**(පාඨමාලා කේතය - 107)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 80)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන්ගෙන් කුමන හෝ විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- රසායන විද්‍යාව
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- සංයුක්ත ගණිතය
- කෘෂි විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය
- ආර්ථික විද්‍යාව
- ගණකාධිකරණය

මීට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී (විශේෂ) (ආහාර ව්‍යාපාර කළමනාකරණය) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ තමන්ගේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ආහාර ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

**සටහන :**

**ආහාර ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2021/2022 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් කාණ්ඩ දෙක අතුරින් එක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති අදාළ අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය;**

**(අ) කාණ්ඩය**
**අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිට රසායන විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය හෝ කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් ඕනෑම විෂයයන් 03ක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

**(ආ) කාණ්ඩය**
**අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා වාණිජ්‍යය විෂය ධාරාවෙන් පෙනී සිට ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය යන විෂයයන්ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම.**

**2021/2022 අධ්‍යයන වර්ෂයේ සිට මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 50% ක් (අ) කාණ්ඩයෙන්ද ඉතිරි 50% (ආ) කාණ්ඩයෙන්ද තෝරා ගනු ලැබේ.**

**ඉහත එක් කාණ්ඩයක් යටතේ අදාළ අවම සුදුසුකම් සපුරා තිබීමට අමතරව, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

### 2.2.8.34 සාගර සහ මිරිදිය විද්‍යාව - (MARINE AND FRESH WATER SCIENCES)
**(පාඨමාලා කේතය - 106)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 60)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයකට පෙනී සිට විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(i) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව හෝ
(ii) රසායන විද්‍යාව; භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී සාගර සහ මිරිදිය විද්‍යාව (ගෞරව) උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි

- විශේෂ විෂය ක්ෂේත්‍ර :
    - සාගර විද්‍යාව සහ සාගර භූ විද්‍යාව (Oceanography & Marine Geology)
    - මිරිදිය විද්‍යා සහ තාක්ෂණය (Water Sciences & Technology)
- මාධ්‍යය - ඉංග්‍රීසි

## 2.2.8.35 ව්‍යාපාර විද්‍යාව - (BUSINESS SCIENCE)

**(පාඨමාලා කේතය - 109)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 100)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී භෞතිය විද්‍යා විෂය ධාරාවෙන් හෝ වානිජ්‍යය විෂය ධාරාවෙන් පෙනී සිට ඉන් ඕනෑම විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

මීට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - ව්‍යාපාර විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - මොරටුව විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- විශේෂ විෂය ක්ෂේත්‍ර - ව්‍යාපාර විශ්ලේෂ විද්‍යාව (Business Analytics)
    - ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (Business Process Management)
    - මූල්‍ය විශ්ලේෂ විද්‍යාව - (Financial Analytics)
- මාධ්‍යය - ඉංග්‍රීසි

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම් පත්‍රය සමඟ තමන්ගේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසිලෙස සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ව්‍යාපාර විද්‍යාව පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ.

වැඩි විස්තර සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ business.mrt.ac.lk යන වෙබ් අඩවියට පිවිසෙන්න.

## 2.2.8.36 මූල්‍ය ඉංජිනේරුකරණය - (FINANCIAL ENGINEERING)

**(පාඨමාලා කේතය - 110)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය සහ මිළඟ පිටුවෙහි දැක්වෙන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- ව්‍යාපාර අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ව්‍යාපාර සංඛ්‍යානය
- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ඉතිහාසය
- දේශපාලන විද්‍යාව
- භෞතික විද්‍යාව
- තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය

මීට අමතරව, අපේක්ෂකයන් විසින් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.

- උපාධි පාඨමාලාව - ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණය (ගෞරව) උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - කැලණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

කැලණිය විශ්වවිද්‍යාලය විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පුවත්පත් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විමසිය යුතුය.

### 2.2.8.37 භූගෝලීය තොරතුරු විද්‍යාව - (GEOGRAPHICAL INFORMATION SCIENCE)
**(පාඨමාලා කේතය - 111)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජෛවීය විද්‍යා විෂය ධාරාව, භෞතීය විද්‍යා විෂය ධාරාව හෝ මෙම අත්පොතෙහි 2.2.1.1 කොටසෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරා ගනු ලබන කලා විෂය ධාරාවේ ඕනෑම අනුමත විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

**2.2.8.38 මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය - (FINANCIAL MATHEMATICS AND INDUSTRIAL STATISTICS)**
**(පාඨමාලා කේතය - 113)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 50)**

(New)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය සහ වෙනත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - විද්‍යාවේදී ගෞරව මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය [BScHons (Fin. Math & Ind. Stat.)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - රුහුණ විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

**2.2.8.39 මානව සම්පත් සංවර්ධනය - (HUMAN RESOURCE DEVELOPMENT)**
**(පාඨමාලා කේතය - 114)**
**(යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව - 65)**

(New)

**ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

- උපාධි පාඨමාලාව - මානව සම්පත් සංවර්ධනය ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධි පාඨමාලාව [BBMHons (Human Resource Development)]
- පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- පාඨමාලා කාලය - වසර හතරකි
- මාධ්‍යය - ඉංග්‍රීසි

# 3 කොටස

## "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස්

| | |
|---|---|
| **3.1** | "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස් |
| **3.2** | අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා සිසුන් අනුයුක්ත කිරීමේ පදනම |
| **3.3** | අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීම |

## 3 කොටස

### "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස්

මෙම කොටසින් ප්‍රධාන වශයෙන්ම "Uni-Code" භාවිත කර නිවැරදිව පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමට සහ කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීමට අවශ්‍යය උපදෙස් දක්වා ඇත. එබැවින්, අන්තර්ජාලය හරහා "Uni-Code" භාවිත කර ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමට පෙර මෙම කොටස හොඳින් කියවා අවබෝධ කර ගන්නා මෙන් උපදෙස් දෙනු ලැබේ.

### 3.1 "Uni-Code" ක්‍රමය පිළිබඳ හැඳින්වීම සහ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීම සඳහා "Uni-Code" භාවිත කිරීමට උපදෙස්

1. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල 14 ක්, මණ්ඩප 03 ක් සහ උසස් අධ්‍යාපන ආයතන 05 ක් මගින් විවිධ උපාධි පාඨමාලා 104 ක් පවත්වනු ලබයි.

2. සෑම විශ්වවිද්‍යාලයක්/ මණ්ඩපයක් / උසස් අධ්‍යාපන ආයතනයක් මගින්ම පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලා සඳහා එකිනෙකට අනන්‍ය වූ කේතයන් ලබා දී ඇත.

3. **මෙම කේතය "Uni-Code" ලෙස හැඳින්වේ.**

4. සියලු කේත (Uni-Code) සංඛ්‍යාව 225 කි.

5. කේත (Uni-Code) සියල්ල අඩංගු ලැයිස්තුව පිටු අංක 153 සිට 157 දක්වා ඇත.

6. සෑම අපේක්ෂකයෙකුටම තමන් ඇතුළත් වීමට සුදුසුකම් ලබන "Uni-Codes" (එනම් පාඨමාලා සහ විශ්වවිද්‍යාල) කැමති සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

7. ඒ සඳහා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කළ යුත්තේ පිළිවෙළින් **වැඩි කැමැත්තක් ඇති කේතයේ (Uni-Code)සිට අඩු කැමැත්තක් ඇති කේතය (Uni-Code) දක්වා** වේ.

8. මෙහිදී අපේක්ෂකයාගේ කැමැත්ත අඩු වන ආකාරයට කේතයන් (Uni-Codes) පෙළ ගැස්විය යුතුය.

9. **තමා සුදුසුකම් ලබන උපරිම කේත (Uni-Codes) සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

10. ප්‍රවේශ අත්පොතෙහි ලබා දී ඇති පෙර වසරෙහි කඩඉම් ලකුණු රටා මත තීරණ නොගත යුතු බවට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. ඊට හේතුව වන්නේ එම තොරතුරු ලබාදී ඇත්තේ කිසියම් කේතයක් (Uni-Code) සඳහා ඇති ඉල්ලුම ඔවුනට අවබෝධ කර දීමට පමණක් වන බැවිනි.

11. උපරිම කේත (Uni-Codes) සංඛ්‍යාවක් සඳහන් කිරීම වැදගත් වන්නේ අයදුම්කරු විසින් කිසියම් කේතයක් සඳහා අදාළ කඩඉම් ලකුණ සම්පූර්ණ කර තිබුනද එම කේතය ඉල්ලුම් කර නොමැති නම් ඔහු / ඇය එම කේතය (පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය) සඳහා අනුයුක්ත නොකරන බැවිනි.

    උදාහරණයක් වශයෙන් කිසියම් අයදුම්කරුවෙකු තමන් ලබා ඇති Z - අගය අනුව යම්කිසි වෛද්‍ය පීඨයක් සඳහා ඇතුළත්වීමට සුදුසුකම් ලැබුවද එම වෛද්‍ය පීඨයට අදාළ කේතය (Uni-Code) අයදුම්කර නොමැති නම් සහ ඔහු / ඇය මීළඟ කැමැත්ත වශයෙන් දන්ත ශල්‍ය විද්‍යාව සඳහන් කර ඇති නම්, ඔහු / ඇය ඉහත කී වෛද්‍ය පීඨය සඳහා ඇතුළත්වීමට Z - අගය අනුව සුදුසුකම් සපුරාලුවද ඒ සඳහා තෝරා නොගෙන දන්ත ශල්‍ය විද්‍යාව සඳහා තෝරා ගනු ලැබේ.

12. **ශිෂ්‍යයා විසින් ඉල්ලුම්කර නොමැති කේතයන් (Uni-Codes) සඳහා ඔවුන් අනුයුක්ත නොකරන බව සලකන්න.**

13. **කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමේදී එකම කේතය (Uni-Code) එක් වරකට වඩා ඇතුළත් කිරීමට සිසුනට ඉඩදෙනු නොලැබේ.**

**14.** **සෑම විටම අයදුම්කරුවන්ව තමා විසින් වැඩිම කැමැත්තක් දක්වන ලද කේතය (Uni-Code) සඳහා තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උත්සාහ කරනු ලබයි. නමුත්, යම් හෙයකින් එම කේතයට අදාළ ස්ථාන සංඛ්‍යාව අයදුම්කරුට වඩා ඉහළ Z අගයන් ලබාගත් වෙනත් අයදුම්කරුවන්ගෙන් දැනටමත් පිරී ඇත්නම්, එම අයදුම්කරු, ඔහු / ඇය විසින් සුදුසුකම් ලබන මීළඟ කේතය සඳහා සලකා බලනු ලැබේ.**

15. කිසිදු ශිෂ්‍යයෙකු කේත (Uni-Code) 225 සඳහාම අයදුම් කිරීමට කිසිදු ලෙසකින් සුදුසුකම නොලබයි. තමන් සුදුසුකම් ලබන පාඨමාලා මොනවාද යන්න අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී පෙනී සිටි විෂයයන් අනුව තීරණය වේ.

උදා : අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව සඳහා පෙනී සිටි ශිෂ්‍යයෙකු ඉංජිනේරු පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සුදුසුකම් නොලබයි. එබැවින් එම ශිෂ්‍යයා සඳහා ඇති තේරීම් සංඛ්‍යාව 225 කට වඩා අනිවාර්යෙන්ම අඩුවේ. කෙසේ වෙතත්, ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී සිසුන්ට උපරිම වශයෙන් තේරීම් 125 ක් ලකුණු කිරීම සඳහා අවස්ථාව ලබාදී ඇත.

**සෑම විටම තමන් සුදුසුකම් ලබන උපරිම Uni-Codes සංඛ්‍යාවක් අයදුම්පතෙහි සඳහන් කිරීමට අයදුම්කරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.**

## 3.2 අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා සිසුන් අනුයුක්ත කිරීමේ පදනම

2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ යම් අපේක්ෂකයෙකු විශ්වවිද්‍යාලයක අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා තෝරා ගැනීම පහත සාධක මත පදනම්ව සිදු කෙරේ. (අදාළ පාඨමාලාව සඳහා නියමිත අනෙකුත් පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.)

- අපේක්ෂකයා ලබා ඇති ඉසෙඩ් අගය
- අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අපේක්ෂකයා දක්වා ඇති කැමැත්තේ අනුපිළිවෙළ ("Uni-Code" අනුපිළිවෙළ)

යම් අපේක්ෂකයකු විසින් අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල එකකට වැඩි ගණනක් සඳහා මනාපය සඳහන් කර ඇති අවස්ථාවක එම අපේක්ෂකයා ප්‍රවේශය සඳහා ප්‍රථමයෙන් සලකා බලනුයේ ඔහු/ඇය විසින් පළමු මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහාය. එම පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට ඔහු/ඇය සුදුසුකම් නොලැබුවහොත්, අයදුම්පතෙහි ඔහුගේ/ඇයගේ කැමැත්තේ අනුපිළිවෙළ අනුව දෙවන මනාපය සඳහන් කර ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඊළඟට සලකා බලනු ලැබේ. මීළඟ පිටුවේ ඇති නිදර්ශනයෙන් එය පැහැදිලි වේ.

නිදර්ශනය : යම් අපේක්ෂකයෙකු තම මනාපය අනුව පාඨමාලා සහ විශ්වවිද්‍යාල 10 ක් පහත දැක්වෙන අයුරින් අයදුම්පතෙහි දක්වා ඇතැයි සිතන්න.

"Uni-Codes"

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 0 | 1 | 6 | C | කළමනාකරණය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 2. | 0 | 2 | 8 | C | කළමනාකරණය (රාජ්‍ය) විශේෂ - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 3. | 0 | 1 | 6 | A | කළමනාකරණය - කොළඹ විශ්වවිද්‍යාලය |
| 4. | 0 | 1 | 8 | C | වාණිජ්‍යය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 5. | 0 | 1 | 7 | C | දේපල කළමනා. සහ තක්සේරුකරණය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 6. | 0 | 1 | 6 | D | කළමනාකරණය - කැලණිය විශ්වවිද්‍යාලය |
| 7. | 0 | 7 | 7 | C | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 8. | 0 | 2 | 5 | A | නීතිය - කොළඹ විශ්වවිද්‍යාලය |
| 9. | 0 | 9 | 1 | G | තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය - මොරටුව විශ්වවිද්‍යාලය |
| 10. | 0 | 9 | 6 | T | තොරතුරු පද්ධති - කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය |

සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී, මෙම අයදුම්කරුවා සඳහන් කර ඇති පරිදි පළමුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණයටත්, දෙවනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය (රාජ්‍ය) විශේෂ පාඨමාලාවටත්, තෙවනුව කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පාඨමාලාවටත් යනාදී වශයෙන් ඔහු/ ඇය යම් පාඨමාලාවකට තෝරා ගැනෙන තෙක් හෝ සඳහන් කර ඇති කිසිදු පාඨමාලාවක් සඳහාවත් නොතේරෙන තෙක් ඔහුගේ/ ඇයගේ මනාපයන් සලකා බලනු ලැබේ. නිදසුනක් වශයෙන් මේ අපේක්ෂකයාගේ ඉසෙඩ් ලකුණ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය හෝ කළමනාකරණය (රාජ්‍ය) විශේෂ පාඨමාලා සඳහා ප්‍රමාණවත් නොවන නමුත් කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පාඨමාලාව සඳහා ප්‍රමාණවත් නම් ඔහු / ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. මේ අනුව ඔහු / ඇය මනාප අංක 04 සිට 10 දක්වා වූ කිසිදු පාඨමාලාවකට තව දුරටත් සලකා බලනු නොලැබේ.

යම් කිසි ශිෂ්‍යයෙකු යම් විශ්වවිද්‍යාලයක පවත්වන අධ්‍යයන පාඨමාලාවකට (Uni-Code) ඉසෙඩ් අගය අනුව සුදුසුකම් ලැබුවත් එම පාඨමාලාව පවත්වන යම් විශ්වවිද්‍යාලයක් සඳහා ඔහු / ඇය විසින් මනාපයක් සඳහන් කර නොමැති නම් ඒ සඳහා ඔහු / ඇය අනුයුක්ත නොකරන අතර ඒ වෙනුවට ඔහු / ඇය විසින් ඊළඟට මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඔහු / ඇය සලකා බලනු ලැබේ.

**ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේදී අපේක්ෂකයා කැමැත්ත දක්වා ඇති අධ්‍යයන පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය යන කරුණු දෙකම එකවර සළකා බලනු ලැබේ.**

**අයදුම්කරුවන් සළකා බලනු ලබන්නේ තමන් විසින් මනාපය දක්වා ඇති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා පමණි.**

**අයදුම්කරුවන් විසින් කැමැත්ත ප්‍රකාශ කර නොමැති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔවුන් සලකා බලනු නොලැබේ.**

වැදගත් :

කිසියම් ශිෂ්‍යයෙකු කිසියම් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන යම් පාඨමාලාවක් සඳහා (Uni-Code) තේරී පත්වී ඒ සඳහා ලියාපදිංචි නොවුනහොත්, පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී ඔහු/ ඇය එම පාඨමාලාව පවත්වන වෙනත් විශ්වවිද්‍යාල සඳහා සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි ඉහළ මනාපයන් දක්වා තිබුණද ඒ කිසිදු විශ්වවිද්‍යාලයක් සඳහා එම පාඨමාලාව හැදෑරීම පිණිස ඔහුගේ/ ඇයගේ අයදුම්පත යළි සලකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔහු/ ඇය ඊළඟට ඉහළ මනාපය සඳහන් කර ඇති අනෙක් පාඨමාලාව සඳහා ඔහුගේ/ ඇයගේ අයදුම්පත සලකා බලනු ලැබේ.

ඒ සම්බන්ධව පහත නිදර්ශනයෙන් ඔබට වැඩිදුරටත් පැහැදිලිවනු ඇත.

නිදර්ශනය 1 :

කිසියම් සිසුවෙකු සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි පහත පරිදි පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා සිය මනාපය දක්වා ඇතැයි සිතමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 0 | 8 | 3 | D | කථන හා ශ්‍රවණ විද්‍යා - කැලණිය විශ්වවිද්‍යාලය |
| 2. | 0 | 0 | 4 | L | කෘෂිකර්මය - සබරගමුව විශ්වවිද්‍යාලය |
| 3. | 0 | 0 | 5 | M | ආහාර විද්‍යාව සහ පෝෂණය - වයඹ විශ්වවිද්‍යාලය |
| 4. | 0 | 0 | 4 | M | කෘෂිකර්මය - වයඹ විශ්වවිද්‍යාලය |
| 5. | 0 | 0 | 6 | A | ජෛවීය විද්‍යාව - කොළඹ විශ්වවිද්‍යාලය |
| 6. | 0 | 0 | 6 | C | ජෛවීය විද්‍යාව - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 7. | 0 | 0 | 6 | D | ජෛවීය විද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය |
| 8. | 0 | 0 | 6 | F | ජෛවීය විද්‍යාව - රුහුණ විශ්වවිද්‍යාලය |
| 9. | 0 | 0 | 7 | L | ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යාව) - සබරගමුව වි. වි. |
| 10. | 0 | 0 | 7 | K | ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යාව) - රජරට විශ්වවිද්‍යාලය |

මෙම සිසුවා සාමාන්‍ය ප්‍රවේශය යටතේ සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි 8 වන මනාපය ලෙස දක්වා ඇති ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලයට තේරී පත්වූයේ යැයි සිතමු. යම් ලෙසකින් ඔහු / ඇය තමා තේරී පත්වූ රුහුණ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි නොවුනහොත් පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී සිය අයදුම්පතෙහි පිළිවෙලින් 7 වන, 6 වන සහ 5 වන මනාපයන් ලෙස දක්වා ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීමට ඔහු / ඇය තවදුරටත් සලකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔහු / ඇය සිය අයදුම්පතෙහි 4 වන මනාපයේ සිට 1 වන මනාපය දක්වා ඇති අනෙකුත් පාඨමාලා හැදෑරීම සඳහා සලකා බලනු ලැබේ.

නිදර්ශනය 2 :

ඉහත නිදර්ශනයෙහි සඳහන් සිසුවා සාමාන්‍ය ප්‍රවේශය යටතේ තමා තේරී පත්වූ 8 වන මනාපය ලෙස අයදුම්පතෙහි දක්වා ඇති රුහුණ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූයේ යැයි සිතමු. යම් ලෙසකින් මෙම සිසුවා පූරප්පාඩු පිරවීමේ වටයකදී ඔහුගේ / ඇයගේ අයදුම්පතෙහි 7 වන මනාපය ලෙස දක්වා ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට තේරී පත්ව ඒ සඳහා ලියාපදිංචි නොවුනහොත්, ඔහු/ ඇය ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ දැනට ලියාපදිංචිව සිටියද, පූරප්පාඩු

**පිරවීමේ වටයන්හිදී සිය අයදුම්පතෙහි පිළිවෙලින් 6 වන සහ 5 වන මනාපයන් ලෙස දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම පිණිස තව දුරටත් ඔහු / ඇය සලකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔහු/ ඇය සිය අයදුම්පතෙහි 4 වන මනාපයේ සිට 1 වන මනාපය දක්වා ඇති අනෙකුත් පාඨමාලාවන් හැදෑරීම සඳහා සලකා බලනු ලැබේ.**

**එබැවින්, කිසියම් ශිෂ්‍යයෙකු තමා තේරී පත් වූ කිසියම් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වන යම් පාඨමාලාවක් (Uni-Code) සඳහා ලියාපදිංචි නොවීමට තීරණය කරන්නේ නම්, ඉන් අදහස් වන්නේ ඔහු/ ඇය එම පාඨමාලාව හැදෑරීම පිණිස සිය අයදුම්පතෙහි ඉහළ මනාපයන් සඳහන් කරන ලද වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයක් සඳහා තේරී පත්වීමට අදහස් නොකරන බවයි.**

**කෙසේ වෙතත්, එම ශිෂ්‍යයා දැනට තේරී සිටින පාඨමාලාවට හා විශ්වවිද්‍යාලයට වඩා ඉහළ මනාපයක් දක්වා ඇති වෙනත් විශ්වවිද්‍යාලයකට එම පාඨමාලාවම හැදෑරීම සඳහා ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සිය අයදුම්පත සලකා බැලීමට කැමැත්ත දක්වන්නේ නම්, පළමුව ඔහු/ ඇය තමා දැනට තේරී සිටින පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, පළමු නිදර්ශනයෙහි සඳහන් සිසුවා කොළඹ විශ්වවිද්‍යාලයෙහි ජෛවීය විද්‍යා පාඨමාලාවට ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සිය අයදුම්පත සලකා බැලීමට කැමැත්ත දක්වන්නේ නම් පළමුව තමා තේරී පත්වූ රුහුණ විශ්වවිද්‍යාලයෙහි ජෛවීය විද්‍යා පාඨමාලාවට ලියාපදිංචි විය යුතුය.**

**එසේ නොවුනහොත්, ඔහු/ ඇය විසින් ඉහළ මනාපයන් සඳහන් කර ඇති වෙනත් විශ්වවිද්‍යාල කිසිවක් සඳහා, එනම් අයදුම්පතෙහි පිළිවෙලින් 7 වන, 6 වන සහ 5 වන මනාපයන් සඳහා ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම පිණිස ඔහුගේ/ ඇයගේ අයදුම්පත තව දුරටත් සලකා බලනු නොලැබේ.**

## 3.3 අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීම

**අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට මසක් ඇතුළත** මෙහි පස්වන කොටසේ (ඇ) ජේදය යටතේ ඇති උපදෙස් අනුව **අන්තර්ජාලය හරහා** තමන් අයදුම්කළ කේත (Uni-Code) අනුපිළිවෙළ වෙනස් කිරීමට අයදුම්කරුවන්ට අවසර දෙනු ලැබේ.

එසේ කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීමෙන් පසු ඉන් ලැබෙන මුද්‍රිත පිටපත නිසි පරිදි අත්සන් කර විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් භාරගන්නා අවසන් දින සිට මසක් ඇතුළත අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් කේත (Uni-Code) අනුපිළිවෙළ වෙනස් කිරීමට අවසර දෙනු ලැබේ.

**එසේම, ඔබගේ මුල් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම් පත්‍රයේ සහ මෙම අයදුම් පත්‍රයේ සඳහන් කරන අත්සන එකම විය යුතුය.**

මෙම අවස්ථාවේදී ඔබ විසින් කේත (Uni-Code) අනුපිළිවෙළ වෙනස් කිරීමෙන්, ඔබගේ මුල් අයදුම්පතේ දක්වන ලද කැමැත්තේ අනුපිළිවෙළ මුළුමනින්ම අවලංගු වන අතර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමේදී ඔබ විසින් දක්වන මෙම නව කැමැත්තේ අනුපිළිවෙළ සලකා බලනු ලැබේ.

**ලිපි, ෆැක්ස් හා විද්‍යුත් තැපැල මගින් කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

**අයදුම්පත් බාර ගැනීමේ අවසන් දිනයේ සිට මාසයක් ඉක්ම ගිය පසු අයදුම්පතේ සඳහන් කළ කේත අනුපිළිවෙළ (Uni-Code) වෙනස් කිරීමට කිසිම අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.**

# 4 කොටස

## ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ සහ අනෙකුත් වැදගත් උපදෙස්

4.1 ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ

4.2 පූරප්පාඩු පිරවීම සිදුකරන ආකාරය/ඉහළ මනාපයන් දක්වා ඇති ඇතැම් පාඨමාලා හා විශ්වවිද්‍යාල සඳහා පූරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවීමට හෝ කිසිඳු ඉහළ මනාපයක් සඳහා පූරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම ඉදිරියටත් රැඳී සිටීමට අනුගමනය කළ යුතු පියවර

4.3 කිසියම් පාඨමාලාවක් සඳහා එක් විශ්වවිද්‍යාලයක සිට වෙනත් විශ්වවිද්‍යාලයකට මාරුවීම් සිදුකරන ආකාරය

4.4 අභියාචනා ඉදිරිපත් කරන ආකාරය

4.5 කිසියම් පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට කිසියම් අපේක්ෂකයෙකු තේරී පත්වීම පිළිබඳව පැමිණිල්ලක්/ විරුද්ධතාවයක් ඉදිරිපත් කරන ආකාරය

4.6 ප්‍රවේශය කල් ගැනීම

4.7 විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධ විමසීම්

## 4 කොටස

### ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ සහ අනෙකුත් වැදගත් උපදෙස්

### 4.1 ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ පිළිවෙළ

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පුවත්පත් දැන්වීම් මගින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම අත්පොතේ පස්වන කොටසේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් අයදුම්කරුවන් විසින් අන්තර්ජාලය හරහා තම අයදුම්පත යොමුකළ යුතුය.

**වැදගත් :**

**විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්ය වේ.**

මෙම අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලය ලත් නියෝජිතයකුගෙන් රු. 500/- ක් ගෙවා ලබා ගත හැකිය.

(ii) නිසියාකාරව සම්පූර්ණ කර අන්තර්ජාලය හරහා ලබා ගත් මුද්‍රිත අයදුම්පත අදාළ ලියකියවිලි ද සමඟ නියමිත දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවීම අයදුම්කරුගේ වගකීම වන්නේය. අයදුම්පත් කැඳවීම සඳහා පළකෙරෙන පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය දැනුම් දෙනු ලැබේ. අදාළ ලියකියවිලි සහ සහතිකපත් අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වීම අයදුම්පත ප්‍රතික්ෂේපවීමට හේතුවක් විය හැකිය.

(iii) පාසල් අපේක්ෂකයකු වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් ලැබූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ඉදිරිපත් වූ පාසලේ විදුහල්පති ලවා මුද්‍රිත අන්තර්ජාල අයදුම්පත සහතික කරවා ගත යුතුය. පෞද්ගලික අපේක්ෂකයකු වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සෑම අයදුම්කරුවෙකුම එම මුද්‍රිත අන්තර්ජාල අයදුම්පත දිවුරුම් කොමසාරිස්වරයකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු ලවා සහතික කරවා ගත යුතුය.

(iv) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් වෙත තමා තේරී පත්වූ පාඨමාලාව සහ එම පාඨමාලාව හැදෑරීමට අනුයුක්ත කොට ඇති විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් එම තෝරා ගැනීම භාර ගන්නේ නම් බැංකුවට හෝ අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැර වන සේ ලියාපදිංචි ගාස්තු ලෙස රු.50/- ක මුදල ගෙවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලියාපදිංචිවීම සඳහා ලබා දුන් අවසන් දින හෝ එදිනට පෙර තමන් සුදුසුකම් ලැබූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි විය යුතුය.

(v) අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමෙන් අනතුරුව එසේ ලියාපදිංචිවීමෙන් ලද මුද්‍රිත පිටපත (Online Payment Receipt) නිසි පරිදි අත්සන් කර, බැංකුවට මුදල් ගෙවූයේ නම් මුදල් ගෙවූ බවට ලිඛිත සාක්ෂිද සමඟ [ගෙවීම් වවුචරයේ පිටපත (UGC Copy)] ලියාපදිංචි තැපැලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවිය යුතුය.

ඉතා වැදගත්

**දිවුරුම් ප්‍රකාශය**

**සියලුම ශිෂ්‍යයන් තමා තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචිවීමේදී විශ්වවිද්‍යාල භූමියෙන් ඇතුළත හෝ පිටත නවක වදය ඇතුළු සියලු හිංසාකාරී ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමට එකඟවීමේ දිවුරුම් ප්‍රකාශයක් අත්සන් කළ යුතු වේ. එම දිවුරුම් ප්‍රකාශය ශිෂ්‍යයා සහ ඔහුගේ / ඇයගේ දෙමව්පියෙකු විසින් අත්සන් කිරීම අනිවාර්ය වේ. දෙමව්පියන් නොමැති සිසුවෙකු නම්, එම සිසුවාට අමතරව ඔහුගේ / ඇයගේ නීත්‍යානුකූල භාරකරු විසින්ද එය අත්සන් කළ යුතුවේ.**

**4.2 පුරප්පාඩු පිරවීම සිදුකරන ආකාරය/ඉහළ මනාපයන් දක්වා ඇති ඇතැම් පාඨමාලා හා විශ්ව-විද්‍යාල සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවීමට හෝ කිසිදු ඉහළ මනාපයක් සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාල-යේම ඉදිරියටත් රැඳී සිටීමට අනුගමනය කළ යුතු පියවර**

**4.2.1 පුරප්පාඩු පිරවීමේ නිර්ණායක**

සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගනු ලැබූ සිසුන් ලියාපදිංචි නොවීම හේතුවෙන් යම් විශ්වවිද්‍යාලයක පවත්වනු ලබන පාඨමාලාවක පුරප්පාඩු ඇති විය හැකිය. එවැනි අවස්ථාවකදී එම පුරප්පාඩු මෙම අත්පොතෙහි 3.2 ඡේදයෙහි සඳහන් විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන ආකාරයට පුරවනු ලැබේ.

(i) දිප ව්‍යාප්ත කුසලතා පදනම මත යම් විශ්වවිද්‍යාලයක යම් අධ්‍යයන පාඨමාලාවක් (Uni - Code) සඳහා තෝරා ගනු ලැබූ සිසුන් ලියාපදිංචි නොවීම හේතුවෙන් ඇතිවන පුරප්පාඩු, දිප ව්‍යාප්ත කුසලතා පදනම මත ඊළග ඉසෙඩ් ලකුණු මට්ටමේ සිටින අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

(ii) දිස්ත්‍රික් පංගු ක්‍රමය මත යම් විශ්වවිද්‍යාලයක යම් අධ්‍යයන පාඨමාලාවක් (Uni - Code) සඳහා තෝරා ගනු ලැබූ සිසුන් ලියාපදිංචි නොවීම හේතුවෙන් ඇතිවන පුරප්පාඩු, දිස්ත්‍රික් කුසලතා පදනම මත එසේ පුරප්පාඩු ඇතිවන දිස්ත්‍රික්කයේ ඊළඟ ඉසෙඩ් ලකුණු ලබා ගත් සිසුන්ගෙන් පුරවනු ලැබේ. එනම් දිස්ත්‍රික් පදනම මත යම් දිස්ත්‍රික්කයක ඇතිවන පුරප්පාඩු එම දිස්ත්‍රික්කයේම සිසුන්ගෙන් පුරවනු ලැබේ.

(iii) එකම ලකුණු මට්ටමේ සිප දෙනෙකු සිටීම නිසා හෝ වෙනයම් ප්‍රායෝගික කරුණක් නිසා මුල් අවස්ථාවේ දී සිසුන් තෝරා ගැනීමේ දී, දිප ව්‍යාප්ත කුසලතා මත හෝ දිස්ත්‍රික් පදනම මත, නියමිත පංගු ප්‍රමාණයට වඩා සිසුන් ප්‍රමාණයක් තෝරාගෙන තිබේ නම් එසේ වැඩිපුර තෝරා ගෙන ඇති සංඛ්‍යාව, ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාවෙන් අඩුකර ඉතිරි ප්‍රමාණය පමණක් පුරවනු ලැබේ.

(iv) පුරප්පාඩු පිරවීමේදීද අපේක්ෂකයින් විසින් කැමැත්ත දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය යන කරුණු දෙකම එකවර සළකා විශ්වවිද්‍යාලවලට අනුයුක්ත කරනු ලැබේ.

එනම් යම් කිසි අපේක්ෂකයෙකු විසින් යම් කිසි පාඨමාලාවකට ඉසෙඩ් ලකුණු අනුව සුදුසුකම් ලැබුවත් එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (Uni - Code) සඳහා ඔහු / ඇය විසින් මනාපයක් සඳහන් කර නොමැති අවස්ථාවක පුරප්පාඩු පිරවීම යටතේ ඔහුව/ ඇයව එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය වෙත අනුයුක්ත නොකරන අතර ඒ වෙනුවට ඔහු / ඇය විසින් ඊළඟට මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (Uni - Code) සඳහා සලකා බලනු ලැබේ.

(v) විශ්වවිද්‍යාලයක යම් පාඨමාලාවක අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසු එම පාඨමාලාවේ පුරප්පාඩු පුරවනු ලබනුයේ අදාළ පීඨයේ පීඨාධිපති ඒ සඳහා එකඟ වන්නේ නම් පමණි. පාඨමාලාව ආරම්භ කිරීම යනු ඉංග්‍රීසි පාඨමාලාව ඇතුලු නම්නිකරණ පාඨමාලාව ආරම්භ කිරීම නොවන බව සැළකිය යුතුය.

ඉතා වැදගත්:

**4.2.2 ඉහළ මනාපයන් දක්වා ඇති ඇතැම් පාඨමාලා සහ විශ්වවිද්‍යාල (Uni - Codes) සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවීමට හෝ කිසිදු ඉහළ මනාපයක් සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්ව-විද්‍යාලයේම ඉදිරියටත් රැඳී සිටීමට කැමති අයදුම්කරුවන් සඳහා**

(i) වසර 2019 දී පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත සාමාන්‍ය ප්‍රවේශය යටතේ හෝ පුරප්පාඩු පිරවීම යටතේ විශ්වවිද්‍යාල පාඨමාලා (Uni - Codes) සඳහා තෝරාගෙන ඒ සඳහා ලියාපදිංචි වන අපේක්ෂකයන්, තමා දැනටමත් තේරී ඇති පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට (Uni

- Code) වඩා ඉහළ මනාපයක් ලෙස සිය අයදුම්පතේ දක්වා ඇති **ඇතැම්** පාඨමාලා සහ විශ්වවිද්‍යාලයන්හි (Uni - Codes) ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු සඳහා පුරප්පාඩු පිරවීම යටතේ තමන්ව සලකා බැලීමට අවශ්‍ය නොවන්නේ නම් හෝ දැනට තේරී සිටින පාඨමාලාවට හා විශ්වවිද්‍යාලයට ඉහළින් මනාපය සඳහන් කර ඇති කිසිදු පාඨමාලාවකට හා විශ්වවිද්‍යාලයකට ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයෙහිම (Uni - Code) ඉදිරියටත් රැඳී සිටීමට කැමැත්ත දක්වන්නේ නම්, තමන් දැනට තේරී පත්ව සිටින එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (Uni - Code) සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී, පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

1. අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීම සඳහා ලබා දී ඇති මුල් පිටුවෙහි (Online Screen) ඇති **"Promotion Declaration"** බොත්තම භාවිත කරන්න.

2. දැන් ඔබ විසින් මනාපය සඳහන් කරන ලද "Uni - Codes" අනුපිළිවෙළ දැක්වෙන ලැයිස්තුව දිස්වනු ඇත.

3. එම "Uni - Codes" අතුරින් ඔබ දැනට තේරී පත්ව ඇති පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට අදාළ කේතය (Uni - Codes) හඳුනාගන්න.

4. **එම කේතයට ඉහළින් ඔබ විසින් මනාපය දක්වා ඇති කේතයන් (Uni - Codes) අතුරින් තමාව ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී <u>සළකා බැලීමට අවශ්‍ය නොවන්නාවූ</u> "Uni - Codes" සැළකිල්ලෙන් තෝරා ගන්න (අදාළ කොටුවල "✓" ලකුණ යොදන්න). යම් හෙයකින් ඔබ විසින් ඉහළින් මනාපයන් දක්වා ඇති කිසිදු පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට (Uni - Codes) මින් ඉදිරියට ඔබව සලකා බැලීමට අවශ්‍ය නොවන්නේ නම් සහ දැනට තේරී ඇති පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම ඉදිරියටත් රැඳී සිටීමට කැමැත්ත දක්වන්නේ නම්, දැනට තේරී ඇති කේතයට ඉහළින් මනාපයන් දක්වා ඇති සියළුම කේතයන් ඔබ විසින් තෝරා ගත යුතුය.**

5. ඉන්පසු **"Submit"** බොත්තම භාවිත කිරීම මගින් ඔබ විසින් පුරප්පාඩු පිරවීම යටතේ සලකා බැලීම <u>අනවශ්‍ය</u> යැයි සඳහන් කළ "Uni - Codes" ඔබගේ "Uni - Code" ලැයිස්තුවෙන් ඉවත් කරන්න.

   [ඔබ විසින් සළකා බැලීම අනවශ්‍ය යැයි සඳහන් කරන ලද එම "Uni - Codes" ලැයිස්තුව අන්තර්ජාලය හරහා ලියාපදිංචිය සම්පූර්ණ කිරීමේදී ලැබෙන මුද්‍රිත පිටපතෙහිද (Online Payment Receipt) සඳහන් වනු ඇත].

6. ඔබ විසින් එසේ ඉවත් කිරීම සඳහා තෝරා ගත් "Uni - Code" ලැයිස්තුව නැවතත් වෙනස් කිරීමට අවශ්‍ය නම් ඉහත 1-5 දක්වා ඇති උපදෙස් නැවත අනුගමනය කරන්න.

7. **ඔබ විසින් ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා නොබැලිය යුතු පාඨමාලා සහ විශ්වවිද්‍යාල (Uni - Codes) ඉහත සඳහන් කළ පරිදි ඔබගේ "Uni - Codes" ලැයිස්තුවෙන් <u>ඉවත් නොකළහොත්,</u> තමන් විසින් ඉහළ මනාපයක් ලෙස දක්වා ඇති පාඨමාලාවක සහ විශ්වවිද්‍යාලයක (Uni - Code)පවතින පුරප්පාඩුවක් සඳහා ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයකදී ඔබව තෝරාගතහොත් අනිවාර්යෙන්ම එම තේරීම භාරගෙන ඒ සඳහා ලියාපදිංචි විය යුතුය.**

(ii) ඉහත නිර්ණායක අනුව යම් විශ්වවිද්‍යාලයක අධ්‍යයන පාඨමාලාවක් සඳහා යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වන තෙක් වට කිහිපයක් යටතේ පුරප්පාඩු පිරවීමට සිදුවේ.

(iii) මීළඟ පිටුවෙහි ඇති උදාහරණයේ දැක්වෙන පරිදි යම් අයදුම්කරුවෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් ලකුණු අනුව තමන් විසින් 8 වන මනාපය දක්වා ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා තේරී ඇතැයි සිතමු.

ඔහු/ ඇය පූරප්පාඩු පිරවීමේදී ඊට ඉහළින් 6 වන මනාපය ලෙස දක්වා ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විකිරණ ශිල්පය හෝ 5 වන මනාපය ලෙස දක්වා ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ භෞත චිකිත්ස පාඨමාලාව සඳහා තේරී පත්වීමට ඉඩ ඇත. පූරප්පාඩු පිරවීමේ ඉදිරි අදියර වලදී එම අයදුම්කරු 4 වන මනාපය ලෙස දක්වා ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා පාඨමාලාවට ද තේරී පත්විය හැකිය.

උදා :

"Uni-Codes"

1. 0 0 2 B දන්ත ශල්‍ය වෛද්‍ය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2. 0 3 5 C ආහාර විද්‍යාව හා තාක්ෂණය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3. 0 5 1 C ඖෂධ විද්‍යාව - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4. 0 0 6 B ජෛව විද්‍යාව - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
5. 0 5 4 A භෞත චිකිත්ස - කොළඹ විශ්වවිද්‍යාලය
6. 0 5 3 B විකිරණ ශිල්පය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
7. 0 0 4 E කෘෂිකර්මය - යාපනය විශ්වවිද්‍යාලය
8. 0 0 6 A ජෛව විද්‍යාව - කොළඹ විශ්වවිද්‍යාලය
9. 0 5 8 A අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව - කොළඹ විශ්වවිද්‍යාලය
10. 0 3 2 N ආයුර්වේද - දේශීය වෛද්‍ය විද්‍යායතනය

**යම් හෙයකින් එම අයදුම්කරු තමන් තේරී ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා පාඨමාලාවට ඉහළින් මනාපය දක්වා ඇති පාඨමාලා සඳහා තේරී පත්වීමට අදහස් නොකර කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා පාඨමාලාවේම රැඳී සිටීමට අදහස් කරන්නේ නම් එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා අන්තර්ජාල සේවාව භාවිතා කරමින් ලියාපදිංචිවීමේදී ඉහත 4.2.2 (i) හි දක්වා ඇති පරිදි එය පැහැදිලිව සඳහන් කළ යුතුය. එසේ නොකරන සියලුම අයදුම්කරුවන් යම් හෙයකින් ඉහළ මනාපයක් දක්වා ඇති පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට තේරී පත්වුවහොත් එම ප්‍රවේශය අනිවාර්යයෙන්ම භාර ගත යුතුය.**

**කෙසේ වෙතත්, මෙම අයදුම්කරු අයදුම්පතෙහි 8 වන මනාපය ලෙස දක්වා ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා පාඨමාලාවට තේරී පත්වුවද ඒ සඳහා ලියාපදිංචි නොවුනහොත් 3.2 කොටසේ "වැදගත්" යනුවෙන් සඳහන් ඡේදයෙහි පැහැදිලි කර ඇති පරිදි පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී ඔහු/ඇය අයදුම්පතෙහි 4 වන මනාපය ලෙස දක්වා ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා පාඨමාලාවට තවදුරටත් සලකා බලනු නොලැබේ.**

## 4.3 කිසියම් පාඨමාලාවක් සඳහා එක් විශ්වවිද්‍යාලයක සිට වෙනත් විශ්වවිද්‍යාලයකට මාරුවීම් සිදුකරන ආකාරය

පූරප්පාඩු පිරවීමේදී අයදුම්කරුවන් තමන් විසින් ඉහළ මනාපයක් දක්වා ඇති විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා (Uni - Codes) සඳහා තේරී පත්වීමට ඉඩ ඇත.

එම නිසා අයදුම්කරුවන් තමන් විසින් අයදුම්පතේ ඉහළ මනාපයක් දක්වා ඇති දැනට තේරී ඇති පාඨමාලාව පවත්වනු ලබන වෙනත් විශ්වවිද්‍යාලයකට ස්ථාන මාරුවීම සඳහා වෙනම ස්ථාන මාරුවීමේ අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අවශ්‍යය නොවේ.

තවද සුහද මාරුවීම් සඳහා කිසිසේත් අවස්ථාවක් නොමැති බවද සලකන්න.

එසේ ඉහළ මනාපය දක්වා ඇති පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට තෝරා ගනු ලබන්නේ අදාළ පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සහ ඉසෙඩ් ලකුණු අනුපිළිවෙල පදනම් කරගෙන ඉහත 4.2 වගන්තියේ දක්වා ඇති නිර්ණායක අනුව වේ.

අයදුම්කරුවන් තමන් තේරී ඇති පාඨමාලාවට පහළින් මනාපයක් දක්වා ඇති පාඨමාලාවක් සඳහා මාරුවීමට අදහස් කරන්නේ නම් මෙහි 4.4 ඡේදයේ දක්වා ඇති උපදෙස් අනුව අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

## 4.4 අභියාචනා ඉදිරිපත් කරන ආකාරය

2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගැනීමෙන් පසු සාමාන්‍ය ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා විමර්ශනය කර වාර්තා කිරීම සඳහා අභියාචනා කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. ඒ සඳහා පහත සඳහන් අයදුම්කරුවන්ගෙන් අභියාචනා බාරගනු ලැබේ.

(අ) යම් අධ්‍යයන පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා සියළු ප්‍රවේශ අවශ්‍යතා සපුරා ඇති සහ ප්‍රකාශිත අවම ඉසෙඩ් ලකුණු මට්ටම ඇතුළත සිටින එහෙත් ඒ සඳහා නොතේරුණු අයදුම්කරුවන්, මෙම අත් පොතෙහි 3 වන කොටසෙහි දක්වා ඇති නීතිරීතිවලට යටත්ව.

(ආ) යම් අධ්‍යයන පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා තෝරා ගනු ලැබ ඇති නමුත් මෙම අත් පොතෙහි 3 වන කොටසෙහි දක්වා ඇති නීතිරීතිවලට යටත්ව තමා විසින් මනාපයක් දක්වා ඇති සහ සියළු ප්‍රවේශ අවශ්‍යතා සපුරා ඇති වෙනත් අධ්‍යයන පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා තෝරාගනු ලැබිය යුතු යැයි අදහස් කරන අයදුම්කරුවන්.

(ඇ) තේරී ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය වෙනුවට අදාළ සියලු ප්‍රවේශ අවශ්‍යතා සපුරා ඇති එහෙත්, සිය අයදුම්පතෙහි පහළින් දක්වා ඇති වෙනත් විශ්වවිද්‍යාලයක් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පවත්වන පාඨමාලාවකට මාරුවීමට අදහස් කරන අයදුම්කරුවන්. (මෙහිදී මාරුවීම් අපේක්ෂාකරන පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු තිබිය යුතුවන අතර, අභියාචනා කළ අයදුම්කරුවන් වැඩි පිරිසක් සිටින අවස්ථාවකදී ඔවුන්ගේ ඉසෙඩ් ලකුණු අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ).

(ඈ) අදාළ සියලු ප්‍රවේශ අවශ්‍යතා සපුරා ඇති එහෙත් තමා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් නොකළ පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට අයදුම් කිරීමට අදහස් කරන අයදුම්කරුවන්. (මෙහිදී අදාළ පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු තිබිය යුතු වන අතර, අභියාචනා කළ අයදුම්කරුවන් වැඩි පිරිසක් සිටින අවස්ථාවකදී ඔවුන්ගේ ඉසෙඩ් ලකුණු අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ).

**පහත සඳහන් කරුණු සම්බන්ධව කරනු ලබන අභියාචනා, අභියාචනා කමිටුව විසින් සලකා බලනු නොලබන අතර එවැනි අභියාචනා ලැබුණ බවක් දැන්වීම හෝ ඒ සම්බන්ධයෙන් ගෙවනු ලබන මුදල් නැවත ගෙවීමක් හෝ නොකෙරේ.**

1. විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය
2. අතිරේක ප්‍රවේශයක් යටතේ විශේෂ විෂයයන් සඳහා ප්‍රවේශය
3. පුරප්පාඩු පිරවීම යටතේ ප්‍රවේශය

විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙම අත්පොතෙහි 10 වන කොටසෙහි ඇමුණුම-1 හි දී ඇති අභියාචනා සඳහා අයදුම්පත්‍රය සම්පූර්ණ කර

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ අවම ඉසෙඩ් ලකුණු ප්‍රකාශයට පත් කර සති හතරක් (04) ඇතුළත ලිඛිතව, ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රවේශ අභියාචනා කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව බාරේ, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "අභියාචනා - විශ්වවිද්‍යාල ප්‍රවේශ" යනුවෙන් සඳහන් කළ යුතුය.

සෑම අභියාචනයක් සඳහාම රුපියල් පන්සියයක (රු. 500/-) ගෙවීමක් කළ යුතුය. එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මුදල් ගෙවීම සඳහා කුවිතාන්සියක් මාර්ගයෙන් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවිය හැකි අතර, ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ රැස්කිරීම් ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස්කිරීම් ගිණුම් අංක 167-1-001-4-3169407 ට එම ගෙවීම බැර කළ යුතුය. සෑම අභියාචනයක්ම එසේ මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලය ලත් නිලධාරියකු විසින් අත්සන් කර තිබිය යුතුය. මෙම ගෙවීම නොමැති කිසිදු අභියාචනයක් සලකා බැලීම සිදු නොකරන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු දැනුම් දීමක්ද සිදු කරනු නොලැබේ. තවද, අසම්පූර්ණ හෝ කාරණය පැහැදිලිව සඳහන් කර නොමැති අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ෆැක්ස් සහ විද්‍යුත් තැපැල (e-mail)මගින් එවනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.**

**අභියාචනා සඳහා ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක. www.ugc.ac.lk**

**ඔබ අභියාචනා එකකට වඩා ඉදිරිපත් කරන්නේ නම් අභියාචනා ආකෘති පත්‍රයේ ඡායා පිටපත් භාවිත කළ හැකිය.**

## 4.5 කිසියම් පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට කිසියම් අපේක්ෂකයෙකු තේරී පත්වීම පිළිබඳව පැමිණිල්ලක් /විරුද්ධතාවයක් ඉදිරිපත් කරන ආකාරය

යම් විශ්වවිද්‍යාලයක අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගෙන ඇති කිසියම් අයදුම්කරුවකු ඒ සඳහා සුදුසුකම් නොලබන්නේය යන පදනම මත යම් කෙනෙකුට පැමිණිල්ලක් කිරීමට හෝ විරෝධතාවයක් දැක්වීමට අවශ්‍ය නම් ඒ බව අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයට ලිඛිතව දන්වා එවිය හැකිය.

එවැනි පැමිණිල්ලක් හෝ විරෝධතාවයක් දන්වා එවීමේදී අදාළ අයදුම්කරු පිළිබඳ හැකි තරම් තොරතුරු සමඟ පැමිණිල්ල හෝ විරෝධතාවය කුමක් ද යන්න පැහැදිලිව සඳහන් කර යම් ලිඛිත සාක්ෂි ඇතොත් ඒවාද සමඟ ඉදිරිපත් කළ යුතුය.

## 4.6 ප්‍රවේශය කල් ගැනීම

(i) යම් විශ්වවිද්‍යාල පාඨමාලාවකට තෝරාගනු ලැබ ප්‍රවේශය කල් ගැනීමට අපේක්ෂා කරන අපේක්ෂකයෙකු හට තමා විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු අදාළ විශ්වවිද්‍යාලය පිළිගතහොත් එම කල් ඉල්ලීම සඳහා අවසර ලැබේ.

(ii) එසේ ප්‍රවේශය කල් ලබාගැනීමට අපේක්ෂා කරන්නෙකු, පළමුව තමා තේරී ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතු අතර, අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට ප්‍රථම එම ඉල්ලීම කරනු ලබන්නේ කුමන කරුණු හේතු කොට ගෙනද යන්න සඳහන් කොට අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ඉල්ලීමක් කළ යුතුය.

(iii) එවැනි කල් ගැනීමක් ලබා ගත හැක්කේ උපරිම වශයෙන් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා පමණි.

(iv) එවැනි කල් ලබාගැනීමක දී අපේක්ෂකයෙකු තමා කලින් යොමු කරනු ලැබූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා පමණක් නැවත ඇතුළත් කරනු ලැබේ. එසේ කල් ලබා ගත් අපේක්ෂකයකු තමා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගැනීමට පදනම් වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් පසුව එනම් 2019 ට පසුව පැවැත්වෙන අ.පො.ස. (උසස් පෙළ) විභාගයක ප්‍රතිඵල මත වෙනත් කවර හෝ පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබයි.

## 4.7 විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධ විමසීම්

ප්‍රථම උපාධි පාඨමාලා ප්‍රවේශ කටයුතු සම්බන්ධ සියලුම ලිපි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස,**
**කොළඹ 07.**

| | | |
|---|---|---|
| **දූරකථන අංකය** | : | **011-2695301, 011-2695302, 011-2685758, 011-2678731 011-2692357** |
| **ෆැක්ස් අංකය** | : | **011-2691678** |
| **වෙබ් අඩවිය** | : | **www.ugc.ac.lk** |

විශ්වවිද්‍යාලයක පැවැත්වෙන පාඨමාලා පිළිබඳව තොරතුරු අවශ්‍ය වේ නම් අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙතින් එම තොරතුරු ලබා ගත යුතුය. විශ්වවිද්‍යාලවල ලිපිනයන් සහ දූරකථන අංක ඇමුණුම (ඇ) හි දක්වා ඇත.

# 5 කොටස

## අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමේ ක්‍රමවේදය

**මෙම කොටස ඔබ කැමති අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කරන ආකාරය පිළිබඳව පැහැදිලි කරයි. අන්තර්ජාලය හරහා ප්‍රවේශ අයදුම්පත සම්පූර්ණ කිරීම පිළිබඳව පැහැදිලි උපදෙස් මෙහි අඩංගු වන අතර, ඔබ අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට නොහැකි / පහසුකම් නොමැති අයදුම්කරුවෙකු නම් ඒ සඳහා සලසන ලද පහසුකම් පිළිබඳව ද මෙහි විස්තර වේ.**

**විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම මෙන්ම තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමද අනිවාර්ය අවශ්‍යතාවක් බව සලකන්න. එබැවින්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට මෙන්ම තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචිවීමටද අනිවාර්යයෙන්ම අන්තර්ජාල සේවාව පමණක්ම භාවිත කළ යුතුය.**

**අන්තර්ජාල සේවාවන්හි ඇති නිරවද්‍යතාවය සහ ආරක්ෂිතබව පිළිබඳවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යය මණ්ඩලය ලෙස අපි පූර්ණ වගකීම දරන්නෙමු.**

# ඊ කොටස

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමුකිරීම
අනිවාර්ය අවශ්‍යතාවක් බව සලකන්න.

අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමේදී යම් ගැටලුවක් ඇතිවුවහොත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) අමතන්න

## අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කිරීමේ ක්‍රමවේදය
## www.ugc.ac.lk

වැදගත්

- **විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සඳහා පුවත්පත් නිවේදනය බලන්න.**
- **විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර මෙම අත්පොතෙහි මුල් කොටස් කිහිපයේ සඳහන් විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ නීති රීති කියවන මෙන් අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.**
- මෙම උපදෙස් සුපරීක්ෂාකාරීව කියවන්න.
- අයදුම්පත පිරවීමේදී ඔබ විසින් ලබා දිය යුතු සියලු තොරතුරු මෙහි දක්වා ඇත.
- ඔබ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය මගින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කිරීමේ සේවාව සඳහා ලියාපදිංචි වීමේදී සහ ලියාපදිංචි වීමෙන් පසුව ඔබගේ අයදුම්පත පිරවීමේ සෑම අදියරකදීම ඒ සඳහා අවශ්‍ය සියලුම උපදෙස් ඔබ ඉල්ලුම් කරන භාෂාවෙන් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) ඔබ වෙත ලබා දෙනු ලැබේ.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්ට දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන (NAC Centers), අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල් සහ ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Centers ) සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ඇති නැණසල මධ්‍යස්ථානයන්හිදී ඒවා විවෘත කර තබන වේලාවන්හිදී අන්තර්ජාලය හරහා තම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කිරීමට පහසුකම් **නොමිලේ** සලසා දී ඇත. මෙම මධ්‍යස්ථානවල ලිපිනයන් සහ දුරකථන අංකයන් මෙම අත්පොතෙහි 5 කොටස අවසානයෙහි සඳහන් කර ඇත.

### (අ) පරිශීලකයෙකු (user) ලෙස ලියාපදිංචි වීමට

1. සෑම අයදුම්කරුවකුම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.ugc.ac.lk) හරහා අන්තර්ජාලය මගින් විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් යොමුකිරීමේ සේවාව සඳහා පරිශීලකයෙකු ලෙස ලියාපදිංචි විය (register as a user) යුතුය.
2. ලියාපදිංචි වීමේදී සෑම අයදුම්කරුවෙකුටම **ජාතික හැඳුනුම්පතක්** සහ **වලංගු විද්‍යුත් තැපැල් ගිණුමක්** (valid email account) තිබීම අත්‍යවශ්‍යය.
3. අයදුම්කරුවන් මෙම අන්තර්ජාල සේවාව සඳහා ලියාපදිංචි වීමට පෙර තම ජාතික හැඳුනුම්පතෙහි (දෙපැත්තම) **ස්කෑන් කරන ලද පිටපතක් හෝ ඡායාරූප ගත කළ** ජාතික **හැඳුනුම්පතක්** සූදානම් කර ගත යුතුය.



**අවවාදයයි: ඔබ විසින් යොමු කරන ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ස්කෑන් කරන ලද හෝ ඡායාරූප ගත කළ** පිටපත පැහැදිලි විය යුතුය. **වෙනස් කරන ලද, තාක්ෂණිකව සකසන ලද හෝ ව්‍යාජ ජාතික හැඳුනුම්පතක පිටපතක් යොමු කිරීම ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හෝ අනවශ්‍ය ලෙස ප්‍රමාද වීමට හේතුවේ. එබැවින්** ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි, **ස්කෑන් කරන ලද** හෝ ඡායාරූප ගත **කරන ලද** පිටපතක් **යොමුකිරීම ඔබගේ වගකීම බව සලකන්න.**

4. පරිශීලකයකු ලෙස ලියාපදිංචිවීමට උදාහරණයේ දැක්වෙන පරිදි පහත තොරතුරු සැපයිය යුතුය.

- පළමුව ඔබ කැමති භාෂාව ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි) තෝරා ගන්න.
- එවිට අයදුම්පතෙහි සියලු තොරතුරු ඔබ කැමති භාෂාවෙන් දිස්වනු ඇත. (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)
- කෙසේ වෙතත්, අයදුම්පතෙහි එක් එක් කොටසෙහි ඉල්ලා සිටින තොරතුරු ඇතුළත් කිරීම **ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්** විය යුතුය.
- ඊතිස (cursor) ⓘ සළකුණ මත තැබීමෙන් අයදුම්පතෙහි එක් එක් කොටස පිරවීමට අවශ්‍ය උපදෙස් පරිගණක තිරය මත දිස්වනු ඇත.

**සටහන -**


අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී අයදුම්කරු විසින් අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී භාවිත කරන ලද ජාතික හැඳුනුම්පතෙහි අංකයම භාවිත කළ යුතුය.

පහත සඳහන් පියවරයන් අනුගමනය කරන්න.

1. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය පළමු පෙළ කොටුවෙහි (Text Box) ඇතුළත් කරන්න. (ඔබට දැනට ජාතික හැඳුනුම්පත් අංකයක් නොමැති නම් එම කොටුව හිස්ව තබා පහත 4 වන පියවරට යන්න).
2. මීළග පෙළ කොටුවෙහි (Text Box) එම ජාතික හැඳුනුම්පත් අංකයම නැවතත් ඇතුළත් කරන්න.
3. මීලගට ඔබගේ ජාතික හැඳුනුම්පත නිකුත් කළ දිනය තෝරාගන්න.
4. 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙහි තොරතුරු සඳහන් කරන කොටසෙහි පළමුව ඔබගේ විභාග අංකය ඇතුළත් කරන්න.
5. මීළගට ඇති පතන මෙනුවෙහි (**drop down menu**) අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී භාවිත කරන ලද හැඳුනුම්පත් වර්ගය ලෙස "NIC" තෝරා ගන්න. යම් ලෙසකින් ඔබ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජාතික හැඳුනුම්පතක් වෙනුවට පහත දක්වා ඇති අනන්‍යතාවය තහවුරු කිරීමේ වෙනත් හැඳුනුම්පත් වර්ගයක් භාවිත කරනු ලැබූ අයදුම්කරුවෙකු නම් එම හැඳුනුම්පත් වර්ගය අදාළ මෙනුවෙන් (**drop down menu**) තෝරා ගන්න.
   - i. තැපැල් හැඳුනුම්පතක් (PIC)
   - ii. රියදුරු බලපත්‍රයක් (DL)
   - iii. ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රයක් (SLPP)
   - iv. විදේශ ගමන් බලපත්‍රයක් (FPP)
   - v. සහතික කරන ලද ඡායරූපයක් (CP)
6. ලබාදී ඇති පෙළ කොටුවෙහි (Text Box) අදාළ හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
7. මීලගට එම හැඳුනුම්පත නිකුත් කළ දිනය තෝරාගන්න.

**වැදගත් : යම් ලෙසකින් ඉහත සඳහන් කරන ලද ඔබ විසින් සැපයිය යුතු කුමන හෝ තොරතුරක් ඔබට අදාළ නොවේ නම් එම කොටුව හිස්ව තබන්න.**

උදා -




5. ඉහත තොරතුරු ඇතුළත් කළ පසු "මීළඟ" ලෙස සඳහන් බොත්තම භාවිත කර මීළඟ පිටුවට පිවිසෙන්න.

(අ) ඔබ මෙම කොටස පිරවීමේදී,

(i) **ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ස්කෑන් හෝ ඡායාරූප ගත කළ පිටපතක් සැපයිය යුතුය.**
මෙම කොටස පිරවීමට පෙර ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි (දෙපැත්තම) ස්කෑන් හෝ ඡායාරූප ගත කරන ලද පිටපතක් සූදානම් කර ගත යුතුය.

ජාතික හැඳුනුම්පතක් වෙනුවට ඉහත "සටහන (5)" හි සඳහන් කරන ලද වෙනත් හැඳුනුම්පත් වර්ගයක් අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී භාවිත කළේ නම්, එම හැඳුනුම්පතෙහි ස්කෑන් හෝ ඡායාරූප ගත කරන ලද පිටපතක් (දෙපැත්තම) සැපයිය යුතුය. ඔබ විසින් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සහතික කරන ලද ඡායාරූපයක් භාවිත කළේ නම්, එම සහතික කරන ලද ඡායාරූපයේ ස්කෑන් හෝ ඡායාරූප ගත කළ පිටපතක් වෙනුවට ඔබගේ අනන්‍යතාවය තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශයක ස්කෑන් කරන ලද හෝ ඡායාරූප ගත කරන ලද පිටපතක් සැපයිය යුතුය.

(ii) **වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක් සැපයිය යුතුය.**
ඔබට වලංගු විද්‍යුත් තැපැල් ගිණුමක් *(Email Account)* නොමැති නම් කරුණාකර මෙම කොටස පිරවීමට පෙර විද්‍යුත් තැපැල් ගිණුමක් *(Email Account)* සාදා ගන්න. **මේ සඳහා වෙනත් අයෙකුගේ විද්‍යුත් තැපැල් ගිණුමක් (Email Account) භාවිත නොකළ යුතුය.**

(iii) **ජංගම දූරකථන අංකයක් ඇතුළත් කළ යුතුය.**

ඔබගේ, ඔබගේ පියාගේ, මවගේ හෝ සමීපතමයෙකුගේ ජංගම දූරකථන අංකයක් ඇතුළත් කළ හැකිය. **ඔබ විසින් සපයනලද ජංගම දූරකථන අංකය මෙම අධ්‍යයන වර්ෂය සඳහා අන්තර්ජාල සේවාව හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කරන වෙනත් අයෙකු විසින් භාවිත නොකළ යුතුය.**

**ලියාපදිංචි කිරීමට අදාළ සක්‍රීය කිරීමේ දිගුව (Verification Link) ඔබගේ පරිශීලක අංකය (User ID) සමඟ ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමටද සක්‍රීය කිරීමේ කේතය (Activation Code) ඔබ සපයන ලද ජංගම දුරකථන අංකයටද යොමු කෙරෙනු ඇත. ඔබගේ UGC ගිණුමට පිවිසීමට ඔබ විසින්ම මුරපදයක් (Password) සාදා ගත යුතුය.**

**ශක්තිමත් මුරපදයක් (Password) සාදා ගැනීම සඳහා උපදෙස්**

- අවම වශයෙන් අක්ෂර අටකින් සමන්විත විය යුතුය.
- ඔබ පරිශීලකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා භාවිත කළ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ඔබගේ නම භාවිත නොකළ යුතුය.
- කලින් භාවිත කළ මුරපදයන්ගෙන් වෙනස් විය යුතුය.

පහත සඳහන් යෙදුම්වලින් අවම වශයෙන් තුනකින්වත් සමන්විත වන්නේ නම් වඩාත් සුදුසුය.

- කැපිටල් (Capital) අක්ෂර
- සිම්පල් (Simple) අක්ෂර
- සංඛ්‍යා
- විරාම ලකුණු

| **අක්ෂර වර්ගය** | **උදාහරණ** |
|---|---|
| කැපිටල් අක්ෂර (Uppercase letters) | A,B,C |
| සිම්පල් අක්ෂර (Lowercase letters) | a,b,c |
| සංඛ්‍යා (Numbers) | 0,1,2,3,4,5,6,7,8,9 |
| අක්ෂර හා සංඛ්‍යාවලට අමතරව යතුරු පුවරුවේ දක්වා ඇති සංකේත සහ පරතර | `~!@#$^&*()_-+=\|\{}[]"";:<>,.?/ |

සටහන: ඔබගේ නම සහ ලිපිනය ඇතුළත් කරන සෑම අවස්ථාවකදීම ඉංග්‍රීසි කැපිටල් අකුරු පමණක් භාවිත කළ යුතුය.

උදා -




"ලියාපදිංචිය" ලෙස සඳහන් බොත්තම භාවිත කිරීමට පෙර මෙම අන්තර්ජාල සේවාව භාවිත කිරීමට අදාළ නියමයන් සහ කොන්දේසි හොඳින් කියවා තේරුම් ගන්න.

## *විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙම අන්තර්ජාල සේවාව භාවිත කරන්නන් සඳහා වන නියමයන් සහ කොන්දේසි*

1. මම 2019 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට හැර වෙනත් කිසිදු අරමුණක් සඳහා මෙම අන්තර්ජාල සේවාව භාවිත නොකිරීමට එකඟ වෙමි.

2. මම 2019 වර්ෂයේ පැවති අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අයදුම්කරුවෙක් වෙමි. මා විසින් සපයන ලද විභාග අංකය, ජාතික හැඳුනුම්පත් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය මාගේම වන බවත් වෙනත් අයකුගේ නොවන බවත් සහතික කරමි.

3. මෙම අන්තර්ජාල සේවාව සඳහා ලියාපදිංචි වීමේදී සහ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කිරීමේ ක්‍රියාවලියේ එක් එක් පියවරයන්හිදී මා විසින් සපයන ලද / සපයනු ලබන තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට සහතික වෙමි.

4. මා විසින් ඕනෑම අවස්ථාවකදී අසත්‍ය, නොමඟ යවන සුළු,වැරදි හෝ වංචනික තොරතුරු, විස්තර හෝ ප්‍රකාශ ලබා දීම හෝ මෙම වෙබ් පිටුවේ අන්තර්ගතය වෙනස් කිරීමට, අන් අයගේ ගිණුම් වෙත වංචනිකව පිවිසීමට, මා විසින් හෝ වෙනත් අයෙකු විසින් ඇතුළත් කළ දත්තයන් වෙනස් කිරීමට උත්සහ කිරීම ඕනෑම අවස්ථාවකදී මාගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අවලංගු කරනු ලැබීමට හේතු වන බවද ඒ සම්බන්ධයෙන් මට එරෙහිව නීතිමය පියවර ගනු ලබන බවද මා හොඳින් දන්නා අතර ඊට එකඟ වෙමි.

5. අන්තර්ජාල සේවාව සඳහා අයදුම්පත යොමු කළ පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවසරයකින් තොරව මා විසින් සපයන ලද තොරතුරු වෙනස් කිරීමට නොහැකි බව මම දනිමි.


6. මෙම අන්තර්ජාල සේවාව භාවිත කිරීම මඟින් මා විසින් සපයන ලද විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය හරහා ද, තැපැල් මාර්ගයෙන්ද වෙනත් විද්‍යුත් සහ විද්‍යුත් නොවන මාධ්‍යයන් හරහා ද මා සමඟ සම්බන්ධ වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මම අවසර ලබා දෙමි.

7. මෙම අන්තර්ජාල සේවාව හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්පත යොමු කිරීම මාගේ තොරතුරුවල නිවැරදිතාව තහවුරු කිරීම සඳහා පමණක් වන අතර මා විසින් නිසි පරිදි අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත අවශ්‍ය ලියකියවිලි සමඟ පුවත්පත් නිවේදනයක් මඟින් දැනුම් දෙනු ලබන අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට හෝ ඊට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරන තුරු මාගේ විද්‍යුත් අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා නොබැලෙන බව මම හොඳින් දනිමි.

ලියාපදිංචිය ලෙස සඳහන් බොත්තම භාවිත කිරීමට පෙර ඔබ නියමයන් සහ කොන්දේසිවලට එකඟ වන්නේදැයි සටහන් කරන්න. ඉන්පසු "ලියාපදිංචිය" ලෙස සඳහන් බොත්තම භාවිත කරන්න.

6. "ලියාපදිංචිය" ලෙස සඳහන් බොත්තම භාවිත කළ විට ලියාපදිංචිය සාර්ථක බව දැක්වෙන පණිවිඩය පහත පරිදි දිස්වනු ඇත.


උදා -



7. ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට යොමුකර ඇති සක්‍රීය කිරීමේ දිගුව (Verification link) සහ ඔබ සපයන ලද ජංගම දුරකථනයට යොමුකර ඇති සක්‍රීය කිරීමේ කේතය (Activation Code) භාවිත කර ඔබගේ UGC ගිණුම සක්‍රීය කරගත හැකිය.

ඔබගේ UGC ගිණුම සක්‍රීය කිරීමට ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට එවූ විද්‍යුත් පණිවිඩයේ ඇති දිගුව භාවිත කරන්න.

උදා -


UG/2019/000012 – Initial Registration Inbox x

**UGC Administrator**
to me

Dear Miss.Bandara DPS,

Thank you for registering at University Grants Commission, Sri Lanka.

**Your User ID – XXXXXXXXXXX**

Please Click here to verify your account

**Please feel free to contact us for further information.**

**Yours sincerely,**

**University Admissions Department**
**University Grants Commission**


ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට එවන ලද පණිවිඩයේ ඇති දිගුව හරහා ඔබට පහත සඳහන් පණිවිඩය දිස්වනු ඇත. ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට එවන ලද පරිශීලක අංකය (user ID) සහ ඔබ සපයන ලද ජංගම දුරකථන අංකයට යොමුකර ඇති සක්‍රීය කිරීමේ කේතය *(Activation Code)* භාවිතා කර ඔබගේ UGC ගිණුම සක්‍රීය කර ගන්න.

උදා -



8. ඔබගේ UGC ගිණුම සාර්ථකව සක්‍රීය වී ඇති බව දැක්වෙන පණිවිඩය පහත පරිදි දිස්වනු ඇත.

උදා -




9. ඔබගේ UGC ගිණුම සක්‍රීය කිරීම සාර්ථක බව දක්වමින් ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට සහ ඔබ සැපයූ ජංගම දුරකථන අංකයට පණිවිඩ යොමු කෙරෙනු ඇත.

උදා -



UG/2019/000012 – Successful Registration

Inbox x

**UGC Administrator**

to me

**Dear Miss.Bandara DPS,**

Your account has been successfully activated..

**Please feel free to contact us for further information.**

**Yours sincerely,**

**University Admissions Department**
**University Grants Commission**

10. ලියාපදිංචිය සාර්ථක වූ විට ඔබගේ පරිශීලක අංකය (user ID) සහ ඔබ විසින් සෑදූ මුරපදය (Password) භාවිත කර ඔබගේ UGC ගිණුමට පිවිස ඔබට අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවිය හැක.

## (ආ) අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීම

1. මුලින්ම ඔබගේ UGC ගිණුමට පිවිසෙන්න.
   ඔබගේ UGC ගිණුමට පිවිසීමට "මෙතැනින් පිවිසෙන්න" බොත්තම භාවිත කරන්න.

2. ඔබගේ ගිණුමට පිවිසීමේදී සහ ඔබගේ අයදුම්පත්‍රය පිරවීමේ ඕනෑම අදියරකදී ඔබ කැමති භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) තෝරා ගත හැකිය. එවිට ඔබගේ අයදුම්පතෙහි අන්තර්ගතය ඔබ කැමති භාෂාවකින් කියවිය හැක. කෙසේවෙතත්, අයදුම්පතෙහි ඉල්ලා සිටින තොරතුරු ඇතුළත් කිරීම **ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්** විය යුතුය.




3. ඔබගේ UGC ගිණුමට පිවිසීමේදී පරිශීලක අංකය (user ID) සහ ඔබ සැදූ මුරපදය (Password) භාවිත කළ යුතුය.




**සටහන** - ඔබගේ මුරපදය අමතක නම් "මුරපදය අමතකවීම" යන දිගුව භාවිත කර ඔබගේ මුරපදය යළි පිහිටුවා ගන්න.

## 4. අයදුම්පත්‍රය පිරවීම

- අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රය පිරවීම පියවර හතරකින් යුත් ක්‍රියාදාමයකි.
- එක් පියවරකට අදාළ අනිවාර්යෙන් පිරවිය යුතු කොටස් ඔබ විසින් සම්පූර්ණ කර ඇත්නම් එම පියවර අවසානයේ ඇති "මීළඟ" ලෙස සඳහන් බොත්තම භාවිතයෙන් ඔබ විසින් ඇතුළත් කරන ලද දත්ත සුරැකිය (Save) හැකිය. එක් පියවරක අනිවාර්යෙන් පිරවිය යුතු කොටස් සම්පූර්ණ කිරීමෙන් තොරව මීළඟ පියවරට යා නොහැකිය.
- අනිවාර්යයෙන් පිරවිය යුතු කොටසක් පිරවීමෙන් තොරව මීළග පියවරට යාමට උත්සාහ කිරීමේදී ඒ බව ඔබට පරිගණක තිරය මත දැනුම් දෙනු ඇත.
- පියවර හතරම එකවර සම්පූර්ණ කිරීමට පෙර ඔබට ඕනෑම අදියරකදී ගිණුමෙන් පිටවිය හැකි අතර පසු අවස්ථාවක ගිණුමට පිවිස එතැන් සිට ඉදිරි පියවරයන් සම්පූර්ණ කළ හැකිය.
- ඊතිස (cursor) (i) සළකුණ මත තැබීමෙන් අයදුම්පතෙහි එක් එක් කොටස පිරවීමට අවශ්‍ය උපදෙස් පරිගණක තිරය මත දිස්වනු ඇත.

### පියවර 1 අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු

**සටහන - ස්ථිර පදිංචි ලිපිනය ඇතුළත් කරන විට ලිපිනයේ එක් එක් කොටස් (උදා- අංකය, වීදිය, නගරය) වෙන් කිරීම සඳහා කොමාවක් භාවිතා කරන්න. ලිපිනය ඇතුළත් කිරීමේදී ඉංග්‍රීසි කැපිටල් අකුරු පමණක් භාවිතා කරන්න.**
**කඩඉම් ලකුණු නිකුත් කිරීමට පෙර හෝ පසු ලිපිනයේ යම් වෙනසක් වුවහොත් ඒ බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දීමට වග බලා ගත යුතුය.**

පහත උදාහරණය මගින් පියවර 1 පිරවිය යුතු ආකාරය දක්වා ඇත.

උදා :




පියවර 1 සම්පූර්ණ කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද දත්ත සුරැකීමට (Save) සහ පියවර 2 ට පිවිසීමට "සුරකින්න සහ මීළඟ" ලෙස සඳහන් බොත්තම භාවිත කරන්න.


## පියවර 2 - අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල

- ඔබ පියවර 2 ට පිවිසීමේදී ඇතැම්විට ඔබගේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස (උසස් පෙළ) විභාග ප්‍රතිඵලවලට අදාළ සමහර කොටස් ස්වයංක්‍රීයව පිරවී තිබෙනු ඔබට දිස්වනු ඇත.
- එසේ ස්වයංක්‍රීයව පිරවී ඇති දත්තයන් පිළිගන්නේ නම්, "පිළිගනිමි" ලෙස සඳහන් කරන්න.
- එසේ නොමැතිනම් ඔබට එම දත්තයන් යළි ඇතුළත් කිරීමට ඉඩදෙනු ලැබේ.

**සටහන - ඔබ විසින් ඇතුළත් කරනු ලබන දත්තයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දත්ත සමඟ සසඳා තහවුරු කරනු ලැබේ.**

- ඔබ පියවර 2 හි දක්වා ඇති වාර ගණනට වඩා වැඩි වාර ගණනක් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ / හෝ අ.පො.ස (උසස් පෙළ) විභාගයන්ට පෙනී සිට ඇත්නම් කරුණාකර "එකතු කිරීම" යන බොත්තම භාවිත කර එවැනි එක් එක් වාරයන්හි ප්‍රතිඵල ඇතුළත් කරන්න.

උදා : පහත උදාහරණය මගින් පියවර 2 පිරවිය යුතු ආකාරය දක්වා ඇත.




පියවර 2 සම්පූර්ණ කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද දත්ත සුරැකීමට (Save) සහ පියවර 3 ට පිවිසීමට "සුරකින්න සහ මීළඟ" ලෙස සඳහන් බොත්තම භාවිත කරන්න.

## පියවර 3 - අයදුම්කරුගේ පාසැල් තොරතුරු

**පාසැල් අයදුම්කරුවන් සඳහා**

- ඔබ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටියේ පාසැල් අයදුම්කරුවෙකු ලෙස නම් පළමුව පාසල් අපේක්ෂකයෙකු යන්න තෝරන්න.
- ඔබගේ පාසල / පාසල් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ලැයිස්තුගත කර ඇත. එම නිසා ඔබගේ පාසල / පාසල් ඇතුළත් කිරීම සඳහා පළමුවෙන් පාසල / පාසල් පිහිටි නිවැරදි පරිපාලන දිස්ත්‍රික්කය තෝරන්න.
- ඉන්පසු කරුණාකර ඔබගේ පාසැලේ තොරතුරු පහත පරිදි ඇතුළත් කරන්න.

**සටහන - ඔබගේ පාසල / පාසල් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් යටතේවත් ලැයිස්තු ගත කර නොමැති නම් කරුණාකර රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) අමතන්න.**

පහත උදාහරණය මගින් පාසල් අයදුම්කරුවෙකු විසින් පියවර 3 පිරවිය යුතු ආකාරය වෙනම දක්වා ඇත.


උදා:



**පෞද්ගලික අයදුම්කරුවන් සඳහා**

- ඔබ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටියේ පෞද්ගලික අපේක්ෂකයෙකු ලෙස නම් පළමුව පෞද්ගලික අපේක්ෂකයෙකු යන්න තෝරන්න. ඔබ පෙර ඇතුළත්ව සිටි පාසල / පාසල් පිහිටි පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ලැයිස්තුගත කර ඇත. එම නිසා ඔබ ඇතුළත්ව සිටි පාසල / පාසල් ඇතුළත් කිරීම සඳහා පළමුවෙන් පාසල / පාසල් පිහිටි නිවැරදි පරිපාලන දිස්ත්‍රික්කය තෝරන්න.
- පහත උදාහරණය මගින් පෞද්ගලික අපේක්ෂකයෙකු පියවර 3 පිරවිය යුතු අයුරු දක්වා ඇත.

උදා:




පියවර 3 සම්පූර්ණ කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද දත්ත සුරැකීමට (Save) සහ පියවර 4 ට පිවිසීමට "සුරකින්න සහ මීළඟ" ලෙස සඳහන් බොත්තම භාවිත කරන්න.

| පියවර 4 - | අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව<br>**Courses of Study and Universities according to your order of preference** |
|---|---|

- අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල සටහන් කිරීමට පෙර මෙම අත්පොතෙහි 3.1 ඡේදය යටතේ දක්වා ඇති කරුණු ඉතා සැළකිල්ලෙන් කියවන්න.

- **ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේදී අයදුම්කරුවන් විසින් මනාපය දක්වා ඇති පාඨමාලාව සහ ඊට අදාළ විශ්වවිද්‍යාලය යන දෙකම එකවර සලකා බලනු ලැබේ. අවශ්‍ය අවම ලකුණු ලබා තිබුණද අයදුම්කරුවන් විසින් මනාපය දක්වා නොමැති පාඨමාලා සහ ඊට අදාළ විශ්වවිද්‍යාල, ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේදී සලකා බලනු නොලැබේ.**

- පියවර 4 සම්පූර්ණ කළ යුතු ආකාරය පහත උදාහරණයේ දක්වා ඇත.
  - පළමුවෙන්ම "Courses" යන මෙනුවෙන් පාඨමාලාවක් තෝරා ගන්න.
  - එවිට එම පාඨමාලාව පැවැත්වෙන විශ්වවිද්‍යාල "University" යන මෙනුවෙහි දිස්වනු ඇත.
  - එම මෙනුවෙන් ඔබගේ මනාපය අනුව විශ්වවිද්‍යාලයක් තෝරා "එකතු කරන්න" බොත්තම භාවිතා කරන්න.
  - ඔබගේ මනාපය සඳහන් කරන විට එකම පාඨමාලාව එකම විශ්වවිද්‍යාලය සමග එක් වරකට වඩා භාවිතා කළ නොහැක.
  - ඔබ කැමති සියලු පාඨමාලා හා විශ්වවිද්‍යාල තෝරා ගත් පසුව ඔබ තෝරා ගත් සියලු පාඨමාලා හා විශ්වවිද්‍යාල ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ අනුව දිස්වනු ඇත.
  - එසේ ඔබ විසින් තෝරා ගත් පාඨමාලා මෙම ලැයිස්තුව ඉහළ දක්වා ඇති "<" සහ ">" බොත්තම් භාවිතයෙන් ඔබගේ මනාපය පරිදි අනුපිළිවෙල වෙනස් කර ගත හැකිය.
  - ඔබට කිසියම් පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් තෝරා ගත් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට අවශ්‍ය නම් "x" නැමැති බොත්තම භාවිතා කළ හැකිය.

පහත උදාහරණයෙන් අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල කැමැත්තේ අනුපිළිවෙළ සකස් කරන ආකාරය දක්වා ඇත.

උදා -




| No | Uni-Code | |
|---|---|---|
| 1 | 001A | Medicine/ University of Colombo |
| 2 | 001C | Medicine/ University of Sri Jayewardenepura |
| 3 | 001D | Medicine/ University of Kelaniya |
| 4 | 002B | Dental Surgery/ University of Peradeniya |
| 5 | 001F | Medicine/ University of Ruhuna |
| 6 | 001B | Medicine/ University of Peradeniya |
| 7 | 003B | Veterinary Science/ University of Peradeniya |
| 8 | 001K | Medicine/ Rajarata University of Sri Lanka |
| 9 | 006A | Biological Science/ University of Colombo |
| 10 | 006B | Biological Science/ University of Peradeniya |
| 11 | 006C | Biological Science/ University of Sri Jayewardenepura |
| 12 | 006D | Biological Science/ University of Kelaniya |

වැදගත් -

**ඔබ අයදුම්කරන පාඨමාලාවන් හා විශ්වවිද්‍යාල සඳහා ඔබව සලකා බලනු ලබන්නේ, මෙම ප්‍රවේශ අත්පොතෙහි 2.2 කොටසේ සඳහන් පූර්ව අවශ්‍යතා සපුරා ඇත්නම් පමණි.**

- “Uni-Code” ලැයිස්තුව සඳහා පිටු අංක 153-157 බලන්න.
- අ.පො. ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂය පූර්ව අවශ්‍යතා සපුරාලිය යුතු පාඨමාලා සඳහා පිටු අංක 158 බලන්න.
- ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වෙන පාඨමාලා සඳහා පිටු අංක 159 බලන්න.

ඔබ විසින් ඉහත උපදෙස් පරිදි අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ පියවර 4 යටතේ සටහන් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත මුද්‍රණය කළ පසු ඊට අදාළ “Uni-Code” අනුපිළිවෙළ පහත උදාහරණයේ ආකාරයෙන් මුද්‍රණය වී දිස්වනු ඇත.

උදා :

| | No. | UNI-CODE | No. | UNI-CODE | No. | UNI-CODE | No. | UNI-CODE | No. | UNI-CODE |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| O | 1 | 001B | 26 | 007L | 51 | | 76 | | 101 | |
| r | 2 | 001F | 27 | 007R | 52 | | 77 | | 102 | |
| d | 3 | 001C | 28 | 004H | 53 | | 78 | | 103 | |
| e | 4 | 002B | 29 | 004K | 54 | | 79 | | 104 | |
| r | 5 | 058A | 30 | 004M | 55 | | 80 | | 105 | |
| | 6 | 001D | 31 | 007K | 56 | | 81 | | 106 | |
| of | 7 | 003B | @ 32 | 025E | 57 | | 82 | | 107 | |
| | 8 | 001H | 33 | 026G | 58 | | 83 | | 108 | |
| P | 9 | 001K | # 34 | 027D | 59 | | 84 | | 109 | |
| r | 10 | 004K | 35 | 076U | 60 | | 85 | | 110 | |
| e | 11 | 005M | 36 | 079J | 61 | | 86 | | 111 | |
| f | 12 | 006B | 37 | 087M | 62 | | 87 | | 112 | |
| e | 13 | 032N | 38 | 006E | 63 | | 88 | | 113 | |
| r | @ 14 | 037B | 39 | 004E | 64 | | 89 | | 114 | |
| e | @ 15 | 051B | 40 | | 65 | | 90 | | 115 | |
| n | @ 16 | 052C | 41 | | 66 | | 91 | | 116 | |
| c | @ 17 | 054B | 42 | | 67 | | 92 | | 117 | |
| e | @ 18 | 054A | 43 | | 68 | | 93 | | 118 | |
| | 19 | 064U | 44 | | 69 | | 94 | | 119 | |
| | 20 | 006C | 45 | | 70 | | 95 | | 120 | |
| | # @ 21 | 034G | 46 | | 71 | | 96 | | 121 | |
| | 22 | 035C | 47 | | 72 | | 97 | | 122 | |
| | 23 | 062F | 48 | | 73 | | 98 | | 123 | |
| | 24 | 006J | 49 | | 74 | | 99 | | 124 | |
| | 25 | 006H | 50 | | 75 | | 100 | | 125 | |

\# මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට අදාළ විශ්වවිද්‍යාලය මගින් පවත්වන ලද ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

@ මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරුවන් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී නියමිත විෂයයන් සඳහා අදාළ සාමර්ථ්‍යන් ලබා තිබිය යුතුය.

## "Uni-Codes" Assigned for each Course of Study of University
## එක් එක් පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අදාළ "Uni-Codes"

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | UNI - CODE |
|---|---|---|---|
| ✪ | වෛද්‍ය විද්‍යාව | කොළඹ විශ්වවිද්‍යාලය | 001A |
| ✪ | වෛද්‍ය විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 001B |
| ✪ | වෛද්‍ය විද්‍යාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 001C |
| ✪ | වෛද්‍ය විද්‍යාව | කැලණිය විශ්වවිද්‍යාලය | 001D |
| ✪ | වෛද්‍ය විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 001E |
| ✪ | වෛද්‍ය විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 001F |
| ✪ | වෛද්‍ය විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 001G |
| ✪ | වෛද්‍ය විද්‍යාව | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 001H |
| ✪ | වෛද්‍ය විද්‍යාව | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 001K |
| ✪ | වෛද්‍ය විද්‍යාව | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 001L |
| ✪ | වෛද්‍ය විද්‍යාව | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 001M |
| ✪ | දන්ත ශල්‍ය විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 002B |
| ✪ | පශු වෛද්‍ය විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 003B |
| ✪ | කෘෂිකර්මය | යාපනය විශ්වවිද්‍යාලය | 004E |
| ✪ | කෘෂිකර්මය | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 004H |
| ✪ | කෘෂිකර්මය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 004K |
| ✪ | කෘෂිකර්මය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 004L |
| ✪ | කෘෂිකර්මය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 004M |
| ✪ | ආහාර විද්‍යාව සහ පෝෂණය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 005M |
| ✪ | ජෛව විද්‍යාව | කොළඹ විශ්වවිද්‍යාලය | 006A |
| ✪ | ජෛව විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 006B |
| ✪ | ජෛව විද්‍යාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 006C |
| ✪ | ජෛව විද්‍යාව | කැලණිය විශ්වවිද්‍යාලය | 006D |
| ✪ | ජෛව විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 006E |
| ✪ | ජෛව විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 006F |
| ✪ | ජෛව විද්‍යාව | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 006H |
| ✪ | ජෛව විද්‍යාව | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 006J |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව (ජෛව විද්‍යාව) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 007K |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව (ජෛව විද්‍යාව) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 007L |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව (ජෛව විද්‍යාව) | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 007R |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 008B |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 008C |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 008E |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 008F |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 008G |
| ✪ | ඉංජිනේරු විද්‍යාව | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 008J |
| ✪ | ඉංජිනේරු විද්‍යාව (EM) | මොරටුව විශ්වවිද්‍යාලය | 009G |
| ✪ | ඉංජිනේරු විද්‍යාව (TM) | මොරටුව විශ්වවිද්‍යාලය | 010G |
| ✪ | ප්‍රමාණ සමීක්ෂණය | මොරටුව විශ්වවිද්‍යාලය | 011G |
| ✪ | පරිගණක විද්‍යාව | කැලණිය විශ්වවිද්‍යාලය | 012D |
| ✪ | පරිගණක විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 012E |
| ✪ | පරිගණක විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 012F |
| ✪ | පරිගණක විද්‍යාව | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 012T |

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | UNI - CODE |
|---|---|---|---|
| ✪ | පරිගණක විද්‍යාව | නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 012W |
| ✪ | භෞතිය විද්‍යාව | කොළඹ විශ්වවිද්‍යාලය | 013A |
| ✪ | භෞතිය විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 013B |
| ✪ | භෞතිය විද්‍යාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 013C |
| ✪ | භෞතිය විද්‍යාව | කැලණිය විශ්වවිද්‍යාලය | 013D |
| ✪ | භෞතිය විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 013E |
| ✪ | භෞතිය විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 013F |
| ✪ | භෞතිය විද්‍යාව | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 013H |
| ✪ | භෞතිය විද්‍යාව | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 013J |
| ✪ | මැනුම් විද්‍යාව | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 014L |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව ( භෞතිය විද්‍යාව) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 015K |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව ( භෞතිය විද්‍යාව) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 015L |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව ( භෞතිය විද්‍යාව) | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 015M |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව ( භෞතිය විද්‍යාව) | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 015R |
| ✪ | ව්‍යවහාරික විද්‍යාව ( භෞතිය විද්‍යාව) | නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 015W |
| ✪ | කළමනාකරණය | කොළඹ විශ්වවිද්‍යාලය | 016A |
| ✪ | කළමනාකරණය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 016B |
| ✪ | කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 016C |
| ✪ | කළමනාකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 016D |
| ✪ | කළමනාකරණය | යාපනය විශ්වවිද්‍යාලය | 016E |
| ✪ | කළමනාකරණය | රුහුණ විශ්වවිද්‍යාලය | 016F |
| ✪ | කළමනාකරණය | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 016H |
| ✪ | කළමනාකරණය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 016J |
| ✪ | කළමනාකරණය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 016K |
| ✪ | කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 016L |
| ✪ | කළමනාකරණය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 016M |
| ✪ | දේපල කළමනාකරණය හා තක්සේරුකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 017C |
| ✪ | වාණිජ්‍යය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 018C |
| ✪ | වාණිජ්‍යය | කැලණිය විශ්වවිද්‍යාලය | 018D |
| ✪ | වාණිජ්‍යය | යාපනය විශ්වවිද්‍යාලය | 018E |
| ✪ | වාණිජ්‍යය | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 018H |
| ✪ | වාණිජ්‍යය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 018J |
| ✪ | කලා | කොළඹ විශ්වවිද්‍යාලය | 019A |
| ✪ | කලා | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 019B |
| ✪ | කලා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 019C |
| ✪ | කලා | කැලණිය විශ්වවිද්‍යාලය | 019D |
| ✪ | කලා | යාපනය විශ්වවිද්‍යාලය | 019E |
| ✪ | කලා | රුහුණ විශ්වවිද්‍යාලය | 019F |
| ✪ | කලා | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 019H |
| ✪ | කලා | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 019J |
| ✪ | කලා | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 019K |
| ✪ | කලා (SP) - ජනමාධ්‍ය | කොළඹ විශ්වවිද්‍යාලය ( ශ්‍රීපාලි මණ්ඩපය ) | 020S |
| ✪ | කලා (SP) - ප්‍රසංග කලා | කොළඹ විශ්වවිද්‍යාලය ( ශ්‍රීපාලි මණ්ඩපය ) | 041S |
| ✪ | කලා (SAB) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 021L |
| ✪ | කළමනාකරණ අධ්‍යයන (TV) | නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 022W |
| ✪ | කළමනාකරණ අධ්‍යයන (TV) | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 022R |

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | UNI - CODE |
|---|---|---|---|
| ✪ | වාස්තු විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 023G |
| ✪ | නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 024G |
| ✪ | නීතිය | කොළඹ විශ්වවිද්‍යාලය | 025A |
| ✪ | නීතිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 025B |
| ✪ | නීතිය | යාපනය විශ්වවිද්‍යාලය | 025E |
| ✪ | තොරතුරු තාක්ෂණය (IT) | මොරටුව විශ්වවිද්‍යාලය | 026G |
| ✪ | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT) | කැලණිය විශ්වවිද්‍යාලය | 027D |
| ✪ | කළමනාකරණය (රාජ්‍ය) විශේෂ | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 028C |
| ✪ | සන්නිවේදන අධ්‍යයන | නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 029W |
| ✪ | නගර හා ග්‍රාම නිර්මාණය | මොරටුව විශ්වවිද්‍යාලය | 030G |
| ✪ | සාමය හා ගැටුම් නිරාකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 031D |
| ✪ | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 032N |
| ✪ | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 032P |
| ✪ | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 033N |
| ✪ | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මොරටුව විශ්වවිද්‍යාලය | 034G |
| ✪ | ආහාර විද්‍යාව හා තාක්ෂණය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 035B |
| ✪ | ආහාර විද්‍යාව හා තාක්ෂණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 035C |
| ✪ | ආහාර විද්‍යාව හා තාක්ෂණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 035L |
| ✪ | සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | යාපනය විශ්වවිද්‍යාලය | 036E |
| ✪ | සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 036W |
| ✪ | වෙද | කොළඹ විශ්වවිද්‍යාලය | 037A |
| ✪ | වෙද | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 037B |
| ✪ | වෙද | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 037C |
| ✪ | වෙද | යාපනය විශ්වවිද්‍යාලය | 037E |
| ✪ | වෙද | රුහුණ විශ්වවිද්‍යාලය | 037F |
| ✪ | වෙද | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 037H |
| ✪ | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 038K |
| ✪ | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 038R |
| ✪ | කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 039B |
| ✪ | සෞඛ්‍ය ප්‍රවර්ධන | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 050K |
| ✪ | ඖෂධ විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 051B |
| ✪ | ඖෂධ විද්‍යාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 051C |
| ✪ | ඖෂධ විද්‍යාව | යාපනය විශ්වවිද්‍යාලය | 051E |
| ✪ | ඖෂධ විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 051F |
| ✪ | වෛද්‍ය රසායනාගාර විද්‍යා | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 052B |
| ✪ | වෛද්‍ය රසායනාගාර විද්‍යා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 052C |
| ✪ | වෛද්‍ය රසායනාගාර විද්‍යා | යාපනය විශ්වවිද්‍යාලය | 052E |
| ✪ | වෛද්‍ය රසායනාගාර විද්‍යා | රුහුණ විශ්වවිද්‍යාලය | 052F |
| ✪ | විකිරණ ශිල්පය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 053B |
| ✪ | භෞත චිකිත්ස | කොළඹ විශ්වවිද්‍යාලය | 054A |
| ✪ | භෞත චිකිත්ස | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 054B |
| ✪ | පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 055D |
| ✪ | පහසුකම් කළමනාකරණය | මොරටුව විශ්වවිද්‍යාලය | 056G |
| ✪ | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | මොරටුව විශ්වවිද්‍යාලය | 057G |
| ✪ | අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | කොළඹ විශ්වවිද්‍යාලය | 058A |
| ✪ | කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | කොළඹ විශ්වවිද්‍යාලය | 059A |

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | UNI - CODE |
|---|---|---|---|
| ✪ | සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 060B |
| ✪ | පරිගණනය සහ කළමනාකරණය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 061B |
| ✪ | ධීවර සහ සාගර විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 062F |
| ✪ | ඉස්ලාම් අධ්‍යයන | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 063J |
| ✪ | විද්‍යාව සහ තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 064U |
| ✪ | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 065U |
| ✪ | ව්‍යවසායකත්වය හා කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 066U |
| ✪ | සත්ත්ව පාලන විද්‍යාව | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 067U |
| ✪ | සංගීතය | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 068X |
| ✪ | සංගීතය | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 068Y |
| ✪ | සංගීතය | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 068Z |
| ✪ | නැටුම් | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 069X |
| ✪ | නැටුම් | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 069Y |
| ✪ | නැටුම් | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 069Z |
| ✪ | චිත්‍ර සහ නිර්මාණ | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 070X |
| ✪ | නාට්‍ය හා රංග කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 071Y |
| ✪ | නාට්‍ය හා රංග කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 071Z |
| ✪ | දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 072Y |
| ✪ | අපනයන කෘෂිකර්මය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 073U |
| ✪ | තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 074U |
| ✪ | කාර්මික තොරතුරු තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 075U |
| ✪ | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 076U |
| ✪ | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 077C |
| ✪ | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (SEUSL) | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 079J |
| ✪ | ආගණනය සහ තොරතුරු පද්ධති | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 080L |
| ✪ | ශාරීරික අධ්‍යාපනය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 081L |
| ✪ | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 082C |
| ✪ | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 082L |
| ✪ | කථන හා ශ්‍රවණ විද්‍යා | කැලණිය විශ්වවිද්‍යාලය | 083D |
| ✪ | අරාබි භාෂාව | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 084J |
| ✪ | දෘශ්‍ය කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 085Z |
| ✪ | සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 086B |
| ✪ | ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 087M |
| ✪ | ජලජ සම්පත් තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 088U |
| ✪ | පාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 089U |
| ✪ | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 090U |
| ✪ | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | මොරටුව විශ්වවිද්‍යාලය | 091G |
| ✪ | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 092K |
| ✪ | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 092L |
| ✪ | කෘෂි සම්පත් කළමනාකරණය සහ තාක්ෂණය | රුහුණ විශ්වවිද්‍යාලය | 093F |
| ✪ | කෘෂිව්‍යාපාර කළමනාකරණය | රුහුණ විශ්වවිද්‍යාලය | 094F |
| ✪ | හරිත තාක්ෂණය | රුහුණ විශ්වවිද්‍යාලය | 095F |
| ✪ | තොරතුරු පද්ධති | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 096T |
| ✪ | භූමි නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 097G |
| ✪ | පරිවර්තන අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 098D |
| ✪ | පරිවර්තන අධ්‍යයන | යාපනය විශ්වවිද්‍යාලය | 098E |

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | UNI - CODE |
|---|---|---|---|
| ✪ | පරිවර්තන අධ්‍යයන | කැළණිය විශ්වවිද්‍යාලය | 098H |
| ✪ | පරිවර්තන අධ්‍යයන | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 098L |
| ✪ | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | කැලණිය විශ්වවිද්‍යාලය | 099D |
| ✪ | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 099L |
| ✪ | සිනමා හා රූපවාහිනී අධ්‍යයනය | කැලණිය විශ්වවිද්‍යාලය | 100D |
| ✪ | ව්‍යාපෘති කළමනාකරණය | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 101R |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | කොළඹ විශ්වවිද්‍යාලය | 102A |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 102C |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | කැලණිය විශ්වවිද්‍යාලය | 102D |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | යාපනය විශ්වවිද්‍යාලය | 102E |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | රුහුණ විශ්වවිද්‍යාලය | 102F |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 102K |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 102L |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 102M |
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 102U |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | කොළඹ විශ්වවිද්‍යාලය | 103A |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 103C |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | යාපනය විශ්වවිද්‍යාලය | 103E |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | රුහුණ විශ්වවිද්‍යාලය | 103F |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | කැළණිය විශ්වවිද්‍යාලය | 103H |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 103J |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 103K |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 103L |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 103M |
| ✪ | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 103U |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | කොළඹ විශ්වවිද්‍යාලය | 104A |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 104C |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | කැලණිය විශ්වවිද්‍යාලය | 104D |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | රුහුණ විශ්වවිද්‍යාලය | 104F |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 104J |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 104K |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 104R |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 104U |
| ✪ | ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) | කැලණිය විශ්වවිද්‍යාලය | 105D |
| ✪ | සාගර සහ මිරිදිය විද්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලය | 106F |
| ✪ | ආහාර ව්‍යාපාර කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 107L |
| ✪ | භෞතික විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 108C |
| ✪ | භෞතික විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | කැලණිය විශ්වවිද්‍යාලය | 108D |
| ✪ | ව්‍යාපාර විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 109G |
| ✪ | මූල්‍ය ඉංජිනේරුකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 110D |
| ✪ | භූගෝලීය තොරතුරු විද්‍යාව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 111B |
| ✪ | සමාජ ව්‍යවේදය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 112B |
| ✪ | මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය | රුහුණ විශ්වවිද්‍යාලය | 113F |
| ✪ | මානව සම්පත් සංවර්ධනය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 114U |

## අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සපුරා තිබිය යුතු අවශ්‍යතාවයන්

පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලාවන් සඳහා ඔහුගේ / ඇයගේ විශ්වවිද්‍යාල අයදුම්පත්‍රයේ මනාපය දක්වා ඇති සෑම අපේක්ෂකයකුම තමන්ගේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග සහතිකයේ මුල් පිටපතෙහි නිසි ලෙස **සහතික කරන ලද පිටපතක්** මුද්‍රිත අන්තර්ජාල අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය. එම සහතික පිටපත් මුද්‍රිත අයදුම්පත්‍රය සමඟ එවීමට අපොහොසත් වුවහොත් අදාළ පාඨමාලාව සඳහා සලකා බලනු නොලැබේ. තවද, **අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත්‍රය යොමු කිරීමට ලබා දී ඇති අවසන් දිනය වන විට තමන් ඉල්ලුම් කරන ලද පාඨමාලා සඳහා අවශ්‍ය අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සාමාර්ථ සම්පූර්ණ කර තිබිය යුතුය.**

| Uni-Codes | අධ්‍යයන පාඨමාලාව | G.C.E(O/L) | | |
|---|---|---|---|---|
| | | Eng | Mat | Sci |
| 011G | ප්‍රමාණ සමීක්ෂණය | C | C | S |
| 020S | කලා (SP) - ජනමාධ්‍ය | S | | |
| 041S | කලා (SP) - ප්‍රසංග කලා | S | | |
| 023G | වාස්තු විද්‍යාව | S | C | |
| 024G | නිර්මාණවේදය | S | C | C |
| 025A/025B/025E | නීතිය | C | | |
| 029W | සන්නිවේදන අධ්‍යයන | C | | |
| 030G | නගර හා ග්‍රාම නිර්මාණය | B | C | |
| 034G | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | C | C | C |
| 037A/037B/037C/037E/037F/037H | හෙද (සටහන 1 බලන්න) | S | | |
| 038K / 038R | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | C | C | |
| 051B/051C/051E/051F | ඖෂධ විද්‍යාව | S | | |
| 052B/052C/052E/052F | වෛද්‍ය රසායනාගාර විද්‍යා | S | | |
| 053B | විකිරණ ශිල්පය | S | | |
| 054A/054B | භෞත චිකිත්සා | S | | |
| 056G | පහසුකම් කළමනාකරණය (සටහන 2 බලන්න) | C | C | S |
| 061B | පරිගණනය සහ කළමනාකරණය | | C | |
| 080L | ආගනණය සහ තොරතුරු පද්ධති | C | | |
| 091G | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | C | C | |
| 095F | හරිත තාක්ෂණය | C | | |
| 096T | තොරතුරු පද්ධති | C | C | |
| 097G | භූමි නිර්මාණවේදය | S | C | |
| 107L | ආහාර ව්‍යාපාර කළමනාකරණය | C | C | C |
| 109G | ව්‍යාපාර විද්‍යාව | | C | |

Eng - ඉංග්‍රීසි භාෂාව Mat - ගණිතය Sci - විද්‍යාව

***සටහන 1 :***

*ඔබ හෙද පාඨමාලාව සඳහා අයදුම්කිරීමට බලාපොරොත්තුවන්නේ නම් ඔබගේ **උස 4' 10"** හෝ ඊට වඩා වැඩි විය යුතු අතර **සියලු ආකාරයේ විකලාංගතාවන්ගෙන් තොර විය යුතුය.***

***සටහන 2 :***

***2020/2021** අධ්‍යයන **වර්ෂයේ සිට** පහසුකම් කළමනාකරණය පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් අ.පො.ස (සා.පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට සම්මාන(C) සාමාර්ථයක් සහ ගණිතය විෂයට සම්මාන(C) සාමාර්ථයක් ලබා ගැනීමට අමතරව **විද්‍යාව විෂයටද** අවම **වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්** ලබා තිබිය යුතුය.*

## ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවය

පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලාවන් සඳහා තම විශ්වවිද්‍යාල අයදුම්පත්‍රයේ මනාපය දක්වා ඇති සෑම අපේක්ෂකයකුම අදාළ විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණයෙන්ද සමත්විය යුතුය. අදාළ විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර සිසුන් විසින් තම අයදුම්පත් කෙලින්ම අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කළ යුතුය. ඒ පිළිබඳ වැඩි විස්තර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබාගත හැකිය. [මෙම අත්පොතෙහි ඇමුණුම (ඇ) හි අදාළ විශ්වවිද්‍යාලවල ලිපිනයන් සහ දුරකතන අංක දක්වා ඇත.] **කෙසේ නමුත්, අදාළ පාඨමාලාව සඳහා සළකා බැලීමට නම් ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට අමතරව අදාළ පාඨමාලාවේ කඩඉම් ලකුණ සම්පූර්ණ කර තිබීමද අනිවාර්ය වේ.**

| Course of Study | University / Campus / Institute | Uni-Code |
|---|---|---|
| කලා (SP) - ජනමාධ්‍ය | කොළඹ විශ්වවිද්‍යාලය (ශ්‍රීපාලි මණ්ඩපය) | 020S |
| කලා (SP) - ප්‍රසංග කලා | කොළඹ විශ්වවිද්‍යාලය (ශ්‍රීපාලි මණ්ඩපය) | 041S |
| වාස්තු විද්‍යාව | මොරටුව විශ්වවිද්‍යාලය | 023G |
| නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 024G |
| කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | කැලණිය විශ්වවිද්‍යාලය | 027D |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මොරටුව විශ්වවිද්‍යාලය | 034G |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 038K |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | යාපනය විශ්වවිද්‍යාලය (වව්නියා මණ්ඩපය) | 038R |
| පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 065U |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 066U |
| සංගීතය | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 068X |
| සංගීතය | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 068Y |
| සංගීතය | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 068Z |
| නැටුම් | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 069X |
| නැටුම් | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 069Y |
| නැටුම් | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 069Z |
| චිත්‍ර සහ නිර්මාණ | ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 070X |
| නාට්‍ය සහ රංග කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 071Y |
| නාට්‍ය සහ රංග කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 071Z |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 072Y |
| කාර්මික තොරතුරු තාක්ෂණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 075U |
| ශාරීරික අධ්‍යාපනය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 081L |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 082C |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 082L |
| කථන හා ශ්‍රවණ විද්‍යා | කැලණිය විශ්වවිද්‍යාලය | 083D |
| දෘශ්‍ය කලා | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 085Z |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 090U |
| තොරතුරු පද්ධති | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | 096T |
| භූමි නිර්මාණවේදය | මොරටුව විශ්වවිද්‍යාලය | 097G |
| පරිවර්තන අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 098D |
| පරිවර්තන අධ්‍යයන | යාපනය විශ්වවිද්‍යාලය | 098E |
| පරිවර්තන අධ්‍යයන | නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 098H |
| පරිවර්තන අධ්‍යයන | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 098L |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | කැලණිය විශ්වවිද්‍යාලය | 100D |
| මූල්‍ය ඉංජිනේරුකරණය | කැලණිය විශ්වවිද්‍යාලය | 110D |

## අයදුම්පත්‍රය මුද්‍රණය කිරීමට පෙර.....

- දී ඇති උපදෙස් අනුව පියවර 4 සම්පූර්ණ කළ පසු "පෙන්වන්න" යන බොත්තම භාවිතා කර එක් එක් පියවර යටතේ ඔබ ඇතුළත් කළ දත්තයන් පරීක්ෂා කළ හැකිය.
- කරුණාකර එක් එක් කොටසට අදාළ තොරතුරු ඔබ විසින් නිවැරදිව පුරවා ඇතිදැයි සුපරීක්ෂාකාරීව බලන්න.
- ඔබ ඇතුළත් කළ ඕනෑම තොරතුරක් අයදුම්පත්‍රය මුද්‍රණය කිරීමට පෙර වෙනස් කළ හැක.
- අයදුම්පත්‍රය මුද්‍රණය කිරීමට පෙර ඔබ ඇතුළත් කළ සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට තහවුරු කර ගැනීමට වග බලා ගන්න.


## 5. අයදුම්පත්‍රය මුද්‍රණය කිරීම

- ඔබගේ අයදුම්පත්‍රයේ අදාළ සියලු තොරතුරු ඇතුළත් කර ඇති බවට තහවුරු කරගත් පසු "මුද්‍රණය" යන බොත්තම භාවිත කර ඔබගේ අයදුම්පත්‍රය PDF ආකෘතිය යටතේ ලබා ගත හැකිය. **අනතුරුව එම PDF අයදුම්පත්‍රය මුද්‍රණය කළ යුතුය. (කළු සුදු මුද්‍රණයක් නිර්දේශ කරනු ලැබේ)**

  **ලේසර් මුද්‍රණ යන්ත්‍රයක් (Lazer Printer) උපයෝගී කරගෙන අයදුම්පත්‍රය මුද්‍රණය කිරීම අත්‍යවශ්‍යය.**
- එම අයදුම්පත්‍රයේ PDF පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමටද *(Email Account)* ලැබී ඇත්දැයි බලන්න.
- **ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමට එවන ලද ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ PDF** පිටපත වෙනස් කර හෝ විකෘත කර මුද්‍රණය කර භාරදීම **ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට සහ ඔබට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට හේතු වන බව සළකන්න.**

## 6. අයදුම්පත භාරදීම

1. මුද්‍රිත අයදුම්පතෙහි සෑම පිටුවකම පහළින් යාන්ත්‍රිකව කියවිය හැකි Bar Code තීරුවක් මුද්‍රණය වී ඇත. ඊට අමතරව ඔබගේ අයදුම්පතෙහි මුද්‍රිත පිටපත සමඟ **Bar Code තීරු** වෙනම මුද්‍රණය වී ඇත්දැයි **තහවුරු කරගන්න.**
2. එම මුද්‍රිත Bar Code තීරු වෙන් වෙන්ව කපා ඔබ විසින් ප්‍රවේශ අයදුම්පත සමඟ අමුණන එක් එක් ලියකියවිලිවල දෙපැත්තෙහිම දකුණුපස ඉහළ කෙළවරෙහි මෙහි පහත දක්වා ඇති ආකාරයට ඇලවිය යුතුය. (උදා : පාසල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත / ශිෂ්‍ය කාර්ය දර්ශනයේ මුල් පිටපත / ග්‍රාම නිලධාරී සහතිකය / අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ සහතික කළ පිටපත / නමේ වෙනස තහවුරු කිරීමට වූ දිවුරුම් ප්‍රකාශය ආදියෙහි)



3. එම මුද්‍රිත Bar Code වල ඔබගේ (උසස් පෙළ) විභාග අංකය, ජාතික හැඳුනුම්පත් අංකය සහ ඔබ විසින් අන්තර්ජාලය හරහා යොමුකරන ලද විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත හඳුනාගැනීම සඳහා සුවිශේෂී කේත අන්තර්ගතවේ. එබැවින් **ඔබගේ අයදුම්පත සමඟ මුද්‍රණය වූ Bar Code තීරු වෙනත් අයදුම්කරුවකුගේ අයදුම්පත සමඟ එවන ලේඛනවල හෝ ඔබගේ ලේඛනවල වෙනත් අයෙකුගේ Bar Code තීරු ඇලවීම කිසිසේත්ම නොකළ යුතුය.**

4. ප්‍රවේශ අත්පොතෙහි 2.2 වන කොටසේ දක්වා ඇති පරිදි ප්‍රවේශය සඳහා අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී යම් විෂයක් සඳහා සාමාර්ථයයන් අවශ්‍ය වන උපාධි පාඨමාලා සඳහා අයදුම් කර ඇත්නම් **ඔබගේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල ලේඛනයේ නිසිලෙස සහතික කළ පිටපතක්** විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත සමඟ එවිය යුතුය. එම සහතිකය එවීමට අපොහොසත්වන අයදුම්කරුවන් අදාළ පාඨමාලා සඳහා සලකා බලනු නොලැබේ.

5. **පාසැල් අයදුම්කරුවන් සඳහා**

අයදුම්කරු ඉගෙනුම ලැබූ පාසල් පිළිබඳ තොරතුරු දැක්වෙන **මුද්‍රිත අයදුම්පතෙහි 7 වන කොටස** පාසලේ විදුහල්පති විසින් පරීක්ෂා කර දිනය, අත්සන සහ විදුහල්පතිගේ නිලමුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය. අයදුම්කරු පාසලට ඇතුළත් වූ සැබෑ දිනය හා අයදුම්කරු විසින් අයදුම්පතෙහි සඳහන් කර ඇති දිනයේ වෙනසක් පවතී නම් හා විදුහල්පති විසින් එම දිනය නිවැරදි කර ඇත්තනම් එම නිවැරදි කල දිනය ඉදිරියෙන් විදුහල්පති විසින් තම අත්සන තැබිය යුතුය.

6. **පෞද්ගලික අයදුම්කරුවන් සඳහා**

පෞද්ගලික අපේක්ෂකයකු වශයෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් ප්‍රවේශ අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛන එවිය යුතුය.

1. පාසැල් හැරයාමේ සහතිකයේ හෝ ශිෂ්‍ය කාර්ය දර්ශනයේ **මුල් පිටපත**
2. ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් නිලමුද්‍රාව තබා අනු අත්සන් කරන ලද) **මුල් පිටපත**

ඉහත ලියකියවිලිවල පිටපත් භාරගනු නොලබන අතර අදාළ මුල් සහතික / ලියකියවිලි අයදුම්පත සමඟ එවීමට අපොහොසත් වීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

පෞද්ගලික අපේක්ෂකයන් විසින් **මුද්‍රිත අයදුම්පතෙහි 7 වන කොටස** සාමදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් දිනය, අත්සන, නිලමුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.

7. ඔබ අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී භාවිතා කළ නම සහ අයදුම්පතෙහි සඳහන් කර ඇති නමෙහි වෙනසක් ඇත්නම් එම නම වෙනස්වීම පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් (Affidavit) අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. (දිවුරුම් ප්‍රකාශයෙහි රු. 50/- ක් වටිනා මුද්දරයක් මත අත්සන් තැබිය යුතු බව කරුණාවෙන් සලකන්න).

එමෙන්ම ඔබ පෞද්ගලික අයදුම්කරුවෙකු නම් ඔබගේ පාසල් හැරයාමේ සහතිකයේ සඳහන්ව ඇති නම සහ අයදුම්පතෙහි දී ඇති නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහාද දිවුරුම් ප්‍රකාශයක් (Affidavit) ඉදිරිපත් කළ යුතුය. (දිවුරුම් ප්‍රකාශයෙහි රු. 50/- ක් වටිනා මුද්දරයක් මත අත්සන් තැබිය යුතු බව කරුණාවෙන් සලකන්න).

8. සියලුම අයදුම්කරුවන් මුද්‍රිත අයදුම්පත් **තැපැල් කිරීමට පෙර මුද්‍රිත අයදුම්පතෙහි 6 වන කොටසෙහි දැක්වෙන අයදුම්කරුගේ ප්‍රකාශය හොඳින් කියවා දිනය සහිතව අත්සන් කිරීමට වග බලා ගතයුතුය. එසේ කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වැඩිදුර තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවය සඳහා අයදුම්කරුට ඉහත සඳහන් කරන ලද ලේඛන වලට අමතරව වැඩිදුර ලේඛන සපයන ලෙස ඉල්ලුම් කිරීමට ඉඩ ඇත. එවැනි ඉල්ලීමක් ලද පසු ඉල්ලුම් කරන ලද ලේඛන ඒ අයුරින්ම ඉල්ලුම් කරන ලද අවස්ථාවේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලබා දීම අයදුම්කරුගේ වගකීමකි.

**වැදගත්**

9. ඔබ විසින් අන්තර්ජාලය හරහා යොමුකරන ලද ඉලෙක්ට්‍රොනික අයදුම්පත භාවිත කරනු ලබන්නේ දත්තවල නිවැරදිතාව පරීක්‍ෂා කිරීම සඳහා පමණක් වන අතර 2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලීමට නම් ඔබ විසින් **නිසි පරිදි අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත** අදාළ සියලුම ලියකියවිලි සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත **ලියාපදිංචි තැපෑලෙන් එවීම අනිවාර්යය වේ.**

**ඔබගේ අත්සන සහිත මුද්‍රිත අයදුම්පත පුවත්පත් නිවේදන මගින් දැනුම් දෙන ප්‍රවේශ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමට අපොහොසත් වුවහොත් ඔබ තවදුරටත් විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්‍ෂා නොකරන ලෙස සලකා ඔබගේ ඉලෙක්ට්‍රොනික අයදුම්පත 2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බලනු නොලැබේ.**

10. අයදුම්පත සමඟ එවන සියලුම ලියකියවිලිවල දකුණු පස ඉහළ කෙළවරේ Bar Code තීරුව ඉහත උපදෙස් දී ඇති පරිදි අලවා නිසි පරිදි අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත සමඟ නොගැළවෙන ලෙස අමුණා පුවත්පත් නිවේදන මගින් දැනුම්දෙනු ලබන **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර** පහත දැක්වෙන ලිපිනයට **A4 ප්‍රමාණයේ ලියුම්කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන්** භාරදිය යුතුය. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

ලිපිනය - අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07

අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමේදී යම් ගැටලුවක් ඇති වුවහොත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) අමතන්න.

## (ඇ) අන්තර්ජාලය හරහා "Uni-Codes" අනුපිළිවෙල වෙනස් කිරීම

- මෙම අත්පොතේ 3.3 ඡේදයේ පරිදි අයදුම්පත් භාරගන්නා අවසන් දින සිට **මසක් ඇතුළත** තමන් අයදුම්කළ අධ්‍යයන පාඨමාලා හා විශ්වවිද්‍යාල සඳහා "Uni-Codes" අනුපිළිවෙල අන්තර්ජාලය හරහා ඔබගේ UGC ගිණුමට පිවිස එක් වරක් වෙනස් කිරීමට අයදුම්කරුවන්ට අවසර දෙනු ලැබේ.

- එසේ කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීමෙන් පසු ලැබෙන "Uni-Codes" අනුපිළිවෙළ දැක්වෙන පිටුව මුද්‍රණයකර තම අත්සන සහ දිනය සහිතව අතිරේක ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින සිට **මසක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. **එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ නව "Uni-Codes" අනුපිළිවෙල සලකා නොබලනු ඇත. ඒ වෙනුවට ඔබගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි සඳහන් කර තිබූ "Uni-Codes" අනුපිළිවෙල තෝරා ගැනීම් වලදී සලකා බලනු ඇත.**

- **ඔබගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ මුල් අයදුම්පතේ සහ මෙම නව** "Uni-Codes" **අනුපිළිවෙළ දැක්වෙන මුද්‍රිත අයදුම්පත්‍රයේ අත්සන එකම විය යුතුය. අත්සනෙහි කිසියම් වෙනසක් පැවතුනහොත් ඔබගේ** "Uni-Codes" **අනුපිළිවෙල වෙනස් කිරීමේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන බව සලකන්න.**

**සැළකිය යුතුයි :** මෙම අවස්ථාවේදී ඔබ විසින් "Uni-Code" අනුපිළිවෙල වෙනස් කිරීමෙන්, ඔබගේ මුල් අයදුම්පතේ දක්වන ලද කැමැත්තේ අනුපිළිවෙල මුලුමනින්ම අවලංගු වන අතර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමේදී ඔබ විසින් දක්වන මෙම නව කැමැත්තේ අනුපිළිවෙල සලකා බලනු ලැබේ.

## විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්හට එම සේවාව පහත සඳහන් මධ්‍යස්ථානයන්හිදී නොමිලේ ලබාගත හැක

### ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන (NAC Centers)

**අම්බලන්ගොඩ**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
80/1, පොල්වත්ත පාර, හල්වතුර, අම්බලන්ගොඩ.
☎ : 091-2258585

**අම්පාර**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
ඉංගිනියාගල පාර, සාමපුර, අම්පාර.
☎ : 063-2222052

**අනුරාධපුරය**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
ජයන්ති මාවත, අනුරාධපුරය.
☎ : 025-2222871

**බදුල්ල**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
18/1, බණ්ඩාරනායක මාවත, බදුල්ල.
☎ : 055-2228842, 3012151

**මඩකලපුව**
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
23, අළුත් පාර, මඩකලපුව.
☎ : 065-2222264

**ගාල්ල**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
ලබුදූව, ගාල්ල.
☎ : 091-2223784

**ගම්පහ**
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
ගම්පහ පාර, මිරිස්වත්ත, මුදුන්ගොඩ.
☎ : 033-2234571

**කළුතර**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
66/2, නාගොඩ පාර, කළුතර.
☎ : 034-2223399

**මහනුවර**
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
පොල්ගොල්ල, මහනුවර.
☎ : 081-2494083

**කුරුණෑගල**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
නිශ්ශංක මාවත, මල්කඩුවාව, කුරුණෑගල.
☎ : 037-2223473

**මාතර**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
නූපේ, මාතර.
☎ : 041-2222943

**මොණරාගල**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
තාක්ෂණ විද්‍යාල හන්දිය, සිරිගල,
පොතුවිල් පාර, මොණරාගල.
☎ : 055-2277395

**නාවල**
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,
නව සීආර්සී ගොඩනැගිල්ල, නාවල, නුගේගොඩ
☎ : 011-2853930

**පොළොන්නරුව**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
24 කණුව, බැද්දෑව, ජයන්තිපුර.
☎ : 027-2225776

**යාපනය**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
බ්‍රවුන්ස් පාර, කොකුවිල්, යාපනය.
☎ : 021-2222871

**රත්නපුර**
විවෘත විශ්වවිද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථානය,
නිදෙල්ලන, රත්නපුර.
☎ : 045-2228660

**අම්බලන්තොට**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
රාජසරණගම පාර, ලුනම් දකුණ, අම්බලන්තොට.
☎ : 047-2225533

**කෑගල්ල**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
කුමාරතුංග මුනිදාස මාවත, කෑගල්ල.
☎ : 035-2222501

**පුත්තලම**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
නො. 1/137, කොළඹ පාර, පුත්තලම.
☎ : 032-2266822

**වවුනියාව**
විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථානය,
නො. 366, නුවර පාර, තෝක්කවත්ත, වවුනියාව.
☎ : 024-2222995

### අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් හා කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන (Provincial and Zonal ICT Centres)

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය, නුගවෙල.
☎ : 081-2491230

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය, ගලේවෙල.
☎ : 066 - 2289073, 071-7367369

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ශාන්ත තෝමස් විද්‍යාලය, මාතලේ.
☎ : 066-2222523, 075-2776941

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
දියතිලක මධ්‍ය මහා විද්‍යාලය, හඟුරන්කෙත.
☎ : 081-2369491

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මදීනා ජාතික පාසල, මඩවල හඩවීදිය.
☎ : 081-2470023

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ධීරානන්ද මහා විද්‍යාලය, කිළිමතලාව.
☎ : 081-2579800

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
නාලන්ද මහා විද්‍යාලය, නාලන්ද, මාතලේ.
☎ : 066-2246785

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
හයිලන්ඩ්ස් විද්‍යාලය, හැටන්.
☎ : 051-2224999

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ගිනිගත්හේන මධ්‍ය මහා විද්‍යාලය, ගිනිගත්හේන.
☎ : 051-2242500

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
විල්ගමුව, හෙට්ටිපොල.
☎ : 066-2250182

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය.
☎ : 071-8028877

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ම/කක කිරාන් මහා විද්‍යාලය, කිරාන්.
☎ : 065-2054855, 071-8292179

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ත්‍රි/මු ශාන්ත අන්තෝනි මහා විද්‍යාලය, මා(ර්)කට් පාර, මුතූර්.
☎ : 026-2238150

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
අල්-හාජ් එනුහාර් විද්‍යාලය, පෙරියකුමුනායි, කින්නියා.
☎ : 026-2236574

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
නො. 35, බාර් පාර, අරසාදි, මඩකලපුව.
☎ : 065-2227707

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කොට්ටකිවුඩ මහා විද්‍යාලය, කොට්ටකිවුඩ, කල්වංචිකුඩි.
☎ : 065-2251397

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කාවන්තිස්ස මහා විද්‍යාලය, අම්පාර.
☎ : 063-2222139

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ත්‍රි/විපුලානන්ද විද්‍යාලය, කින්නියා පාර, ත්‍රිකුණාමලය.
☎ : 026-2051487, 071-8448070

නැගෙනහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
නො.09, ඕ(ර්)ස් හිල්, ත්‍රිකුණාමලය.
☎ : 026-2222997

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කමු/කමු/මහමුද් බාලිකා විද්‍යාලය, කල්මුනේ.
☎ : 067-2225095, 077-2258030, 077-4794799

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කලාප අධ්‍යාපන කාර්යාලය, අක්කරෙයිපත්තු.
☎ : 067-2277324

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
මහවැලිගම නවෝද්‍යා විද්‍යාලය, සේරුනුවර.
☎ : 026-3269560

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කුමාර විද්‍යාලය, තිරුක්කෝවිල්.
☎ : 067-2265053

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
මල්කම්පිටිය පාර, සමන්තුරේ.
☎ : 067-2261448

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල, දෙහිඅත්තකණ්ඩිය.
☎ : 027-2250391

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
යා/පුලෝලි දෙමළ මහා විද්‍යාලය, පුලෝලි.
☎ : 021-2263087, 077-3580755

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
අයිලන්ඩ්ස්, යා/සරස්වතී විද්‍යාලය, වන්නලවඩි, වේලානෙයි.
☎ : 021-2211597

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
වවුනියා දකුණ, ව/වවුනියා දෙමළ මධ්‍ය මහා විද්‍යාලය, නුවර පාර, වවුනියාව.
☎ : 024-2228695

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ව/පුතුක්කුලන් මධ්‍ය මහා විද්‍යාලය, සකිරිකුලන්කුලම්, වවුනියා.
☎ : 024-2228696

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කිලිනොච්චි මධ්‍ය විද්‍යාලය, කිලිනොච්චි.
☎ : 021-2283866

උතුරු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
මරුක්කාරම්පලයි, වවුනියා.
☎ : 077-7589797

පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය-උතුරු මැද පළාත, ජයන්ති මාවත, කලාප අධ්‍යාපන කාර්යාලය පිටුපස, අනුරාධපුරය.
☎ : 025-2237505, 2237504

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය, අනුරාධපුරය.
☎ : 071-3532724, 077-6561737

කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානය, කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය, කැකිරාව.
☎ : 071-4923327

කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානය, තඹුත්තේගම මධ්‍ය මහ විද්‍යාලය, තඹුත්තේගම.
☎ : 025-2275573

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
වවුනියා පාර , කැබිතිගොල්ලෑව.
☎ : 077-3961166

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
පො/ආනන්ද බාලිකා ජාතික පාසල, හිඟුරක්ගොඩ.

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
පො/තෝපාවැව මධ්‍ය මහා විද්‍යාලය, පොළොන්නරුව.

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
කහටගස්දිගිලිය.
☎ : 071-8165613

වයඹ පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
නාවින්න පාර, වාරියපොල.
☎ : 037-2267685

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
මලියදේව පිරිමි විද්‍යාලය, කුරුණෑගල.
☎ : 037-2230333

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
ශ්‍රී සරණංකර මධ්‍ය මහා විද්‍යාලය, බිංගිරිය.
☎ : 032-2246680

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය,
විජයබා ජාතික පාසල, මහව.
☎ : 037-2275889

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
වික්‍රමශීලා මධ්‍ය මහා විද්‍යාලය, ගිරිඋල්ල.
☎ : 072-5312653

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, ආනමඩුව.
☎ : 032-2263202

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මැදගම අභය මහා විද්‍යාලය, මැදගම, පණිරෙන්ඩාව.
☎ : 032-2240180

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මයුරපාද ජාතික පාසල, මාවනැල්ල.
☎ : 035-2246110

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, තෝලංගමුව.
☎ : 035-2268472

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බලංගොඩ ආනන්ද මෛත්‍රී මධ්‍ය මහා විද්‍යාලය, බලංගොඩ.
☎ : 045-2288343

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
රාහුල ජාතික පාසල, ගොඩකවෙල.
☎ : 045-2240107, 071-6537411

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට.
☎ : 045-2263438

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ශංකන්ද මධ්‍ය මහා විද්‍යාලය, පැල්මඩුල්ල.
☎ : 071-6538173

සබරගමුව පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
අටුල්ගම, දෙනිඹිට.
☎ : 036-2268143

වලක්මුල්ල කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
වීරකැටිය ජාතික පාසල, වීරකැටිය.
☎ : 071-0771551, 071-8035542

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
හ/ හම්බන්තොට ප්‍රාථමික පාසල, හම්බන්තොට
☎ : 071-5385966, 071-8614096

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ආනන්ද මහා විද්‍යාලය, කිතුලම්පිටිය, ගාල්ල.
☎ : 071-6394576

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
තංගල්ල බාලිකා විද්‍යාලය, තංගල්ල.
☎ : 047-2240912, 071-4408368, 071-4408368
071-4226263, 071-6609421

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ග/ කරන්දෙනිය මධ්‍ය මහා විද්‍යාලය, කරන්දෙනිය.
☎ : 071-8235123, 071-01717764, 071-8235123
077-3243193, 071-8072476

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
දෙනියාය ජාතික පාසල, දෙනියාය.
☎ : 041-2273786, 071-3779310, 077-5222733
077-3779310

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බ/බතලයාය මධ්‍ය මහා විද්‍යාලය, බතලයාය, අලුත්නරම, මහියංගනය.
☎ : 055-2258110, 071-8236506, 071-8045675
071-2698729

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මො/මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලය, වැල්ලවාය.
☎ : 055-3561111, 071-9816662

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බ/පැල්ගහතැන්න මහා විද්‍යාලය, පැල්ගහතැන්න.
☎ : 071-9354717, 071-9573880

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය, මොණරාගල.
☎ : 055-2277097, 071-6093208, 071-8127300
071-3332577, 071-8141400

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බ/හාලිඇල මධ්‍ය මහා විද්‍යාලය, හාලිඇල.
☎ : 077-5748664, 077-6908334, 077-7156256

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
කගගොල්ල ජාතික පාසල, කගගොල්ල, දියතලාව.
☎ : 057-2232460, 077-986189, 077-7955558

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය, බදුල්ල.
☎ : 055-2223852, 071-0364362, 077-9671794
077-3971878, 077-7062211

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
දොඩම්ගොල්ල විද්‍යාලය, දොඩම්ගොල්ල, බිබිල.
☎ : 055-5676386, 071-1700918

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බ/ඩී.එස්.සේනානායක ජාතික පාසල, කන්දකැටිය.
☎ : 055-2245624, 077-2203216

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බ/ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, වල්හපුතැන්න, හල්දුම්මුල්ල.
☎ : 057-72051652, 071-4463306

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ගලගිරියාව ජාතික පාසල, ගණේමුල්ල.
☎ : 033-2263677

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
වේල්ස් කුමර විද්‍යාලය, මොරටුව.
☎ : 011-2646496

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
සපුගස්කන්ද මහා විද්‍යාලය, මාකොල.
☎ : 011-2962165

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
සෙනරත් පරණවිතාන ජාතික පාසල, උඩුගම්පොල.
☎ : 033-2231261

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
දළුපොත මහා විද්‍යාලය, දළුපොත, මීගමුව.
☎ : 031-2223411

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය, උසාවිය පාර, හෝමාගම.
☎ : 011-2748096

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
බණ්ඩාරගම ජාතික පාසල, බණ්ඩාරගම.
☎ : 038-2290369

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය, හොරණ.
☎ : 034-2262905

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ශ්‍රී විජයාරාම මහා විද්‍යාලය, උඩහමුල්ල, නුගේගොඩ.
☎ : 011- 2802975

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
මෙරිල් කාරියවසම් මධ්‍ය මහා විද්‍යාලය, මීගහතැන්න.
☎ : 034-2284541

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ශ්‍රී සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය, නිට්ටඹුව.
☎ : 033-2292346

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
තිස්ස මධ්‍ය මහා විද්‍යාලය, කළුතර උතුර.
☎ : 034-2237178

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ලුම්බිණි විද්‍යාලය, කොළඹ 05.
☎ : 011-2552094

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ජනාධිපති විද්‍යාලය, මහරගම.
☎ : 011-2897225

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
උඩුගම්පොල මධ්‍ය මහා විද්‍යාලය, උඩුගම්පොල.
☎ : 033-2282712

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ජාතික පාසල, හුනුම්ල්ල.
☎ : 031-2247280

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
ශ්‍රී රාහුල බාලිකා මහා විද්‍යාලය, මාලබේ.
☎ : 011-2744527

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
කලාප අධ්‍යාපන කාර්යාලය, දැල, නිවිතිගල.
☎ : 070-2300670, 071-1242776

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය,
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, රුවන්වැල්ල.
☎ : 070-2027900, 071-8017826, 071-8048945

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය,
කලාප අධ්‍යාපන කාර්යාලය, පල්ලිමුල්ල, මාතර.
☎ : 041-2222949, 071-8560733, 071-4208683

දකුණු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය,
අමරසූරිය ගුරු විද්‍යාලය පරිශ්‍රය, උණවටුන, ගාල්ල.
☎ : 091-2250740, 071-6146331, 071-4904706
071-9164964

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය,
උසාවිය ඉදිරිපිට, ගම් උදාව, නිකුරක්ගොඩ.
☎ : 027-2246633

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය,
මනම්පිටිය.
☎ : 027-2050060

කරුන්කන්ඩල් කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන
මධ්‍යස්ථානය, ආන්ඩන්කුලම්,ආඩම්පාන්
☎ : 076-7740957

කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානය,
තුනුක්කායි.
☎ : 021-2060053

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ඇති දිස්ත්‍රික්ක නැණසල මධ්‍යස්ථාන

## අම්පාර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා යෞවන සභාව, 86, වෙරළ පාර, අඩ්ඩලවෙන්නායි 11. ☎
: 077-3170448, 067-2279295

KDMC නැණසල ප්‍රධාන මධ්‍යස්ථානය - කල්මුණේ, 9, මහ වීදිය,
කල්මුණෙයිකුඩි - 14.
☎ : 067-2224290, 077-5392412

මැක්මුලිය යෞවන සමාජය නැණසල, 355/1, මැක්මුලිය පාර,
මරුතමුනේනෙයි - 06.
☎ : 077-6767015

මහඔය නැණසල, අධ්‍යාපන හා සමාජ සංවර්ධන සමාජය,
විජේතුංග ගොඩනැගිල්ල, මහවීදිය, මහඔය.
☎ : 070-2016995, 063-5771772

පදියතලාව නැණසල, අධ්‍යාපන හා සමාජ සංවර්ධන පදනම,
විජේසූරිය ගොඩනැගිල්ල, මහ වීදිය, පදියතලාව.
☎ : 070-3269296, 063-5771772

## අනුරාධපුර දිස්ත්‍රික්කය

රජරට නැණසල, කෙත් ඇල පාර, කන්නිමඩුව පාර,
ගලෙන්බිඳුණුවැව.
☎ : 071-8196019

හොරොව්පතාන නැණසල, වව්නියා පාර,
හොරොව්පතාන
☎ : 077-5646446, 025-2278567

ඉපලෝගම ප්‍රාදේශීය සභා නැණසල,
ඉපලෝගම.
☎ : 025-2264276, 071-0189708

රණ මයුර ග්‍රාම සංවර්ධන සමිතිය, පදවිය පාර,
කැබිතිගොල්ලෑව.
☎ : 077-3961166

මේඝවන විහාර නැණසල කාර්යාලය, 561/87/F,
3 වෙනි හරස් වීදිය, නව නගරය, අනුරාධපුරය.
☎ : 025-2234064, 077-6737877, 077-7180886

නැණසල මධ්‍යස්ථානය - පරාක්‍රමපුර,
පදවි පරාක්‍රමපුර.
☎ : 025-2254051, 077-7180886

විෂන් ටෙක් පරිගණක ජාලය නැණසල,
නව නගරය, පදවිය.
☎ : 077-0116597, 071-8665527

උදාර සමාජ සංවර්ධන පදනම, නො. 64, මීගස්ගම, ඇඳගල
එප්පාවල.
☎ : 025-2249483

## බදුල්ල දිස්ත්‍රික්කය

සමාජ ආධාර පදනම නැණසල(සෙලාන් බැංකුව අසල),
14/1, කොහෝවත්ත පාර, බදුල්ල.
☎ : 077-5858528, 077-7270525, 055-2223121
055 - 2223335

සෙනරත් නැණසල, සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය,
බදුල්ල.
☎ : 055-2222279

ඇටම්පිටිය නැණසල, සමෘද්ධි බැංකු සංගමය,
බදුල්ල පාර, ඇටම්පිටිය.
☎ : 076-6053281, 055-2295085

ග්ලෙන්හෝර් නැණසල, ග්ලෙන්හෝර් වත්ත,
හපුතලේ.
☎ : 057-7429150, 072-7533680

නැණසල මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල, 4,
තන්තිරිය, බදුල්ල පාර, බණ්ඩාරවෙල.
☎ : 077-6772055, 071-6414353

නැණසල පරිගණක පුහුණු මධ්‍යස්ථානය,
බ/කැප්පෙටිපොල මහා විද්‍යාලය ඉදිරිපිට, කැප්පෙටිපොල.
☎ : 057-5799771, 071-8283780, 075-6121065
071 - 7467678

## කොළඹ දිස්ත්‍රික්කය

සුහ සාධක සමිති නැණසල, සීතාවකපුර නගර සභාව,
32/1, යටියන්තොට පාර, අවිස්සාවේල්ල.
☎ : 036-2222275, 036-2222146, 077-3488734

## ගාල්ල දිස්ත්‍රික්කය

බෙන්තොට සංස්කෘතික මධ්‍යස්ථානය, සංවර්ධන සංවිධාන
නැණසල, අතුරුවෙල, ඉදුරුව.
☎ : 034-2275087

අම්බලන්ගොඩ නැණසල, 71/7, ගාලු පාර, අම්බලන්ගොඩ.
☎ : 071-2244441, 072-9623623, 091-5716732

## ගම්පහ දිස්ත්‍රික්කය

නැණසල - මහජන පුස්තකාලය, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
මීගමුව පාර, නිට්ටඹුව.
☎ : 033-2287277, 033-2246816, 077-6070592,
072-4087214

මරදගහමුල්ල නැණසල මධ්‍යස්ථානය, සණස ගොඩනැගිල්ල,
හේන්පිටගෙදර පාර, මරදගහමුල්ල
☎ : 031-2247147, 011-3818283, 078-8545388

නැණසල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය,
ශ්‍රී සුනන්දාරාමය, මැදගම, ගම්පහ.
☎ : 033-2248882, 071-4598163, 077-6093124

මිරිස්වත්ත නැණසල මධ්‍යස්ථානය, 152/සී, මිරිස්වත්ත, මුදුන්ගොඩ,
ගම්පහ.
☎ : 033-2248263, 077-8848440

ගම්පහ ඉඹිගොල්ල නැණසල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
මධ්‍යස්ථානය, විද්‍යාවංශ මහා පිරිවෙන, බණ්ඩාරවත්ත, ගම්පහ.
☎ : 033-2239497, 077-4460566, 071-6287264

විජය මංගල පිරිවෙන නැණසල, යටියන, මිනුවන්ගොඩ.
☎ : 071-8334991, 011-2295027

## හම්බන්තොට දිස්ත්‍රික්කය

ඉලෙක්ට්‍රෝ නැණසල, 42, මහ වීදිය, අම්බලන්තොට.
☎ : 047-2225560, 071-8220115

ආසිරි තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය නැණසල, තිස්සමහාරා- මය,
117/ඒ, පල්ලියවත්ත හන්දිය,තිස්සමහාරාමය.
☎ : 047-2239989, 077-3795335

## යාපනය දිස්ත්‍රික්කය

කාන්තා සංවර්ධන හා ප්‍රජා මධ්‍යස්ථානය - මූර් වීදිය, 143, ඔස්මනියා
විද්‍යාල පාර, (මුස්ලිම් පාසල පාර), යාපනය
☎ : 077-4739889, 077-4087514

ඉලවලෙයි තරුණ හෙන්රියන් ක්‍රීඩා සමාජය සහ නැණසල, පාසැල්
පාර, ඉලවලෙයි.
☎ : 077-4087514, 077-2487673

ඉනුවිල් මහජන පුස්තකාලය නැණසල මධ්‍යස්ථානය,ශ්‍රී
පරරාජසේකර පිල්ලෙයාර් කෝවිල, ඉනුවිල් මානිපේ පාර,
ඉනුවිල් දකුණ, ඉණුවිල්.
☎ : 021-2054435, 077-9775650, 077-4431851

## කළුතර දිස්ත්‍රික්කය

රයිගම කොතලාවල කාර්යසාධක සමිති නැණසල, රයිගම
කොතලාවල රජමහා විහාරය, රයිගම, බණ්ඩාරගම.
☎ : 038-2290935, 077-4410089

## මහනුවර දිස්ත්‍රික්කය

ගැටඹේ නැණසල, රජෝපවනාරාමය, ගැටඹේ, පේරාදෙණිය.
☎ : 081-5683005, 081-2388113

ශ්‍රී නාථ දේවාල විහාර නැණසල, ශ්‍රී නාථ දේවාල විහාරය, මහනුවර.
☎ : 081-2205221, 071-8471479

නැණසල අධ්‍යාපන මධ්‍යස්ථානය, 46, නව නගරය, තෙල්දෙණිය.
☎ : 077-2099999, 081-2374532

DG-ARTS නැණසල, විද්‍යා දර්ශන පිරිවෙන, පන්විල පාර,
වත්තේගම නගරය.
☎ : 081-2470146, 071-2949292,072-7949292
077-7857557

උඩුදුම්බර නැණසල, 01, නව නගරය, උඩුම්බර
☎ : 081-2054527, 071-4490101

ශ්‍රී සුමංගල දහම් පාසැල, බෝලපේ පන්සල, බෝලපේ, කඩුලියද්ද.
☎ : 081-2404283, 071-8339764

## කෑගල්ල දිස්ත්‍රික්කය

සුනන්ද නැණසල, ශ්‍රී විජයසුන්දරාරාමය, වැලිමාන්න, අරණායක.
☎ : 035-5632482, 071-8001454, 071-3707509
035-2258017

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව, බුලත්කොහුපිටිය.
☎ : 076-7883232, 071-8784260

ශ්‍රී විසුද්ධාරාම මහා විහාරය, වැන්දල, කරවනැල්ල, රුවන්වැල්ල.
☎ : 036-2267087, 071-8442020, 077-2535472

## කුරුණෑගල දිස්ත්‍රික්කය

රෝයල් නැණසල, නලාවත පාර, බෝවත්ත.
☎ : 071-6151431, 032-2245726

වයඹ නැණසල තොරතුරු තාක්ෂණ ඇකඩමිය, 29/4, මීගමුව පාර,
කුරුණෑගල.
☎ : 037-4937095, 037-7927579

විද්‍යාලංකාර නැණසල, විද්‍යාලංකාර පිරිවෙන, දම්පැලැස්ස,
නාරම්මල.
☎ : 076-6564505

නැණසල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාසල, 57/1, මීගමුව
පාර, නාරම්මල.
☎ : 071-6318410

ගිරිඋල්ල නැණසල තොරතුරු තාක්ෂණ ඇකඩමිය, 22/23, වට
රවුම පාර, ගිරිඋල්ල.
☎ : 037-4937093, 037-5879394

මාකඳුර නැණසල, මහජන පුස්තකාල ගොඩනැගිල්ල, මාකඳුර, ගෝනවිල.
☎ : 037-4937098, 031-2299688

නැණසල අධ්‍යාපන ආයතනය, පොල්පිතිගම.
☎ : 071-6030132, 071-1578799, 037-2273444

උඩුබද්දාව නිසල නැණසල, උඩුබද්දාව.
☎ : 071-6414854, 037-4992344

## මාතලේ දිස්ත්‍රික්කය

ඉසිපතනාරාමය බෞද්ධ මධ්‍යස්ථානය නැණසල, ඉසිපතනාරාමය, ඉනාමළුව, දඹුල්ල.
☎ : 071-3427046, 066-4935150, 066-4935151

## මාතර දිස්ත්‍රික්කය

සුබෝධාරාමය නැණසල, ශ්‍රී සුබෝධාරාමය, කොස්මෝදර.
☎ : 071-9886463

මාතර නැණසල, කිතුලේවෙල පිරිවෙන, හක්මන පාර, මාතර.
☎ : 041-5001100, 071-7627626

පස්ගොඩ නැණසල, පස්ගොඩ.
☎ : 077-3243054, 077-2485252, 041-2291023

වැලිගම නැණසල, දෙවන මහල, නව සුපිරි වෙළඳසැල සංකීර්ණය, වැලිගම.
☎ : 077-3543836, 041-7901142

ජයසුමනාරාමය නැණසල, කොටුවේගොඩ, මාතර.
☎ : 071-7627626

## මොණරාගල දිස්ත්‍රික්කය

හිඟුරුකඩුව නැණසල, ගම සවිබල ගැන්වීමේ මධ්‍යස්ථානය, හිඟුරුකඩුව, පස්සර.
☎ : 055-2271190, 071-8217869

සමාධි නිකේතන බෞද්ධ මධ්‍යස්ථානය - නැණසල, සමාධි නිකේතන බෞද්ධ මධ්‍යස්ථානය, දියකොබල, බිබිල.
☎ : 055-2265005

වෙල්ලස්ස සංවර්ධන සංසදය නැණසල, 15, බස් නැවතුම්පළ ඉදිරිපිට පොදු වෙළඳ සංකීර්ණය, පළමු මහල, බුත්තල.
☎ : 055-2273399, 071-3160130

මහගම නැණසල, මහගම ජනපදය සෙවනගල.
☎ : 047-2288288, 071-9273856

නැණසල සෙවණගල, 14, සෙවනගල නගරය.
☎ : 071-8572019, 077-3403053, 047-2280060

තණමල්විල සමාජය, බස් ඩිපෝව ඉදිරිපිට, තණමල්විල.
☎ : 072-2508608, 071-2508608, 047-2285285
047-2285295

කරවිලෙ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - කතරගම, 36, සෙල්ල පාර, මයිලගම, කතරගම.
☎ : 077-3801576, 075-5862613, 047-2236301
075-3020888

## නුවරඑළිය දිස්ත්‍රික්කය

නෝර්ටන් නැණසල, 34/1, මහා වීදිය, නෝර්ටන් පාලම.
☎ : 051-3122062, 075-4000267

හැටන් නැණසල, ශ්‍රී මාණික්ක පිල්ලෙයාර් දේවස්ථානය, නව ගොඩනැගිල්ල, දිඹුල්ල පාර, හැටන්.
☎ : 051-2224559, 075-4000267, 071-1455544

මාදන්වල නැණසල, මාදන්වල රජමහා විහාරය, හඟුරන්කෙත.
☎ : 081-2369401, 071-0404231

මහජන පුස්තකාලය, මස්කෙළිය.
☎ : 071-8166888, 052-2277275

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

නැණසල - කළුකැලේ, 70, ජයශක්ති කර්මාන්තපුර කළුකැලේ, පොළොන්නරුව.
☎ : 027-5671848 / 077-6789181

## පුත්තලම දිස්ත්‍රික්කය

නැණසල - නුරෙච්චෝලෙයි (ග්‍රාම සංවර්ධන සමිතිය), ඉලන්තඩිය පාර, නුරෙච්චෝලෙයි.
☎ : 077-5668646, 032-2268523

## රත්නපුර දිස්ත්‍රික්කය

බලංගොඩ නැණසල, 232, කල්තොට පාර, මිරිස්වත්ත, බලංගොඩ.
☎ : 045-2289889, 045-7201206, 077-7775358

සර්වෝදය සමාජ නැණසල, තණමල්විල පාර, උඩවලව.
☎ : 047-2233483, 076-7724370,

ඇඹිලිපිටිය නැණසල දෙවන මහල, අම්ල ගොඩනැගිල්ල, පල්ලේගම, ඇඹිලිපිටිය.
☎ : 047-2261510, 077-4430256

නැණසල පදලන්ගල, වෙලන්ගහවෙල හන්දිය, පදලන්ගල.
☎ : 072-8350350, 071-2856144, 075-2680984

යෝධගම නැණසල, රෝහල පාර, නව නගරය, ඇඹිලිපිටිය.
☎ : 047-2261890, 077-8172407

නැණසල-පඹහින්න බෙලිහුල්ඔය, රෝහල හන්දිය, පඹහින්න, බෙලිහුල්ඔය.
☎ : 045-2280379, 075-8068340

නැණසල කළවාන පරිගණක සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වැද්දාගල පාර, කළවාන.
☎ : 045-2255786, 045-2256786

නැණසල නිව් ලංකා ටෙක්, 26, වටපොත පාර, නිවිතිගල.
☎ : 045-2279978, 071-2320642, 070-3682099

පහළ කරවිට සණස සමාජය, කරවිට, උඩ කරවිට.
☎ : 045-2279526

නැණසල පරිගණක පුහුණු මධ්‍යස්ථානය, (ශ්‍රී ඥාණසීහ තපෝවන විහාරය), 155, ගුඩ් ෂෙඩ් පාර, රත්නපුර.
☎ : 071-4431426, 077-7828887

නැණසල තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය, පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බණ්ඩාරනායක මාවත, රත්නපුර.
☎ : 045-2231399, 071-7993973

නැණසල තොරතුරු තාක්‍ෂණ හා සන්නිවේදන මධ්‍යස්ථානය, නාමල්දෙණිය, පරකඩුව.
☎ : 036-2257307, 077-2081997

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

කින්නියා කුට්ටිකරච්චි නැණසල, 255/B, මහ වීදිය, කුට්ටිකරච්චි, කින්නියා - 04.
☎ : 026-2236953, 077-9692883, 077-0209555

නැණසල - තොක්ස් පාර, මූතූර්.
☎ : 077-2004744, 075-2948481

මූතූර් නැගෙනහිර නැණසල, අරාබි විද්‍යාල පාර, ජයා නගර්, මූතූර් - 05.
☎ : 077-9440923, 075-6061223

# 6 කොටස

## විශේෂ විධිවිධාන යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම


| | | |
|---|---|---|
| 6.1 | අන්ධ හා කායික අශක්නුතාවන් ඇති අපේක්ෂකයන් | 172 |
| 6.2 | විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති සිසුන් | 172 |
| 6.3 | ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතාවන් දක්වා ඇති අයදුම්කරුවන් | 174 |
| 6.4 | සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම | 174 |
| 6.5 | විදේශයන්හි අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයන් හා විදේශීය සිසුන් | 174 |
| 6.6 | ගුරුවරුන් ඇතුළත් කර ගැනීම | 175 |
| 6.7 | අතිරේක ප්‍රවේශය | 176 |

# 6 කොටස

## විශේෂ විධිවිධාන යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ දී අන්ධ, කායික අශක්නුතාවන් ඇති සිසුන්, සන්නද්ධ සේවා නිලධාරීන්, විදේශීය සිසුන් සහ විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති සිසුන් ආදී විශේෂ ගණයේ සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා විශේෂ විධිවිධාන බොහෝ රටවල ක්‍රියාත්මක වේ.

මුළු ප්‍රවේශ සංඛ්‍යාවෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ඉහත සඳහන් විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල වලට ඇතුළත් කෙරේ.

විශේෂ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 6.1 අන්ධ හා කායික අශක්නුතාවන් ඇති අපේක්ෂකයන්

අදාළ විශ්වවිද්‍යාලවල ඉල්ලීම මත 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගයට බ්‍රේල් ක්‍රමයෙන් පෙනී සිටි සීමිත අන්ධ සිසුන් ප්‍රමාණයක් කලා පාඨමාලාව හැදෑරීම සඳහා ද කායික අශක්නුතාවයක් ඇති බවට වෛද්‍ය සහතික ලබා ඇති සීමිත සංඛ්‍යාවක් කලා, වාණිජ්‍යය, ජෛවීය විද්‍යා හා භෞතිය විද්‍යා යන පාඨමාලාවන් හැදෑරීම සඳහා ද ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණය කළ හැකිය.

මේ විධිවිධාන යටතේ ප්‍රවේශය ලැබීමට, අයදුම්කරුවන් මෙම අත්පොතෙහි 1.2 හා 2.2 යන ඡේදයන් හි දක්වා ඇති අවම සුදුසුකම් සහ එක් එක් පාඨමාලාව සඳහා ඇති විෂය පූර්ව අවශ්‍යතා සහ අනුමත විෂයයන් සම්පූර්ණ කර තිබිය යුතුය.

කායික අශක්නුතාවය ඔප්පුකිරීම සඳහා එවැනි අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතුය. මේ විධිවිධාන යටතේ කායික අශක්නුතාවයක් වශයෙන් සැලකෙනුයේ සාමාන්‍ය ජීවිතයට බලපාන ආකාරයේ නිත්‍ය ශාරීරික බෙලහීනතාවයකි.

**ඉහතින් දැක්වූ අන්ධ හා කායික අශක්නුතාවන් ඇති අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට මෙම පොතෙහි ඇමුණුම-3 හි දක්වා ඇති අයදුම් පත උපයෝගී කර ගත යුතුය.**

**නිසි පරිදි පුරවන ලද අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා එවනු ලබන මුද්‍රිත අයදුම්පත සමඟ ලියාපදිංචි තැපෑලෙන් අතිරේක ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට පුවත් පත් දැන්වීමේ දක්වා ඇති අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙනසේ එවිය යුතුය.**

**අසම්පූර්ණ හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.**

**විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීමට වෙනම පුවත්පත් දැන්වීම් පළකරනු නොලැබේ.**

### 6.2 විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති සිසුන්

සෑම අධ්‍යයන පාඨමාලාවකම ඇති ස්ථාන වලින් 0.5% ක ප්‍රමාණයක් දක්වා එකතුවී ඇති මුළු ස්ථාන සංඛ්‍යාවට යටත්ව සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම් කිසි පාඨමාලාවකට නොතේරුණු, එහෙත් ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු (උදා: සංගීතය, නැටුම්, චිත්‍ර, කලා සහ සාහිත්‍ය), බාල දක්ෂ සහ ශිෂ්‍යභට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාර කම් වලින් 2016.08.01 දින සිට 2019.07.31 දින දක්වා කාලය තුළ ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති ශිෂ්‍යයන්ට පිරිනැමේ.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පාඨමාලා සඳහා එකඟවී ඇති ස්ථාන වලින් 4% දක්වා මෙම ප්‍රවේශය සඳහා වෙන් කරනු ලැබේ.

මෙම විශේෂ විධිවිධාන යටතේ ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරුවන් මෙම අත්පොතෙහි ඡේද අංක 1.2 හි සඳහන් අවම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර ඡේද අංක 2.2 හි දක්වා ඇති පරිදි එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා අවශ්‍ය වන විෂය පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය. ඊට අමතරව අයදුම්කරු ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කයේ නියමිත පාඨමාලාවට අදාල අවම Z ලකුණු මට්ටමේ සිට 0.2000 ක ලකුණු මට්ටමක් ඇතුළත සිටිය යුතුය.

මේ යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන අවස්ථාවේදී තමා ජාතික/ජාත්‍යන්තර මට්ටමේ කුසලතා ලබා ඇති බව සනාථ කිරීමට සහතිකපත් ඉදිරිපත් කළ යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබා දීමේ ක්‍රමවේදයකට අනුව එවැනි අයදුම්කරුවන්ට තමන් ලබා ඇති දක්ෂතාවයන්ට ලකුණු ප්‍රදානය කෙරේ. එක් එක් පාඨමාලාව සඳහා වෙන් කර ඇති ස්ථාන සංඛ්‍යාව, ඉහත කී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව අයදුම්කරුවන් තම කුසලතා සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.

මෙහිදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී තමා ලබා ගත් ඉසෙඩ් ලකුණුවලට එකතු කිරීමක් නොකෙරේ.

**ඉහතින් දැක්වූ විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට මෙම පොතෙහි ඇමුණුම - 2 හි දක්වා ඇති අයදුම්පත උපයෝගී කර ගත යුතුය. ඇතුළත්වීමට බලාපොරොත්තුවන පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව සඳහන් කළ යුතු අතර, පාඨමාලා කේතයන් සඳහා ඇමුණුම (අ) බලන්න. ඇමුණුම (අ) හි දක්වා ඇති පාඨමාලා කේතයන් සඳහන් නොකරන ලද අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ඇමුණුම - 2 හි දක්වා ඇති අයදුම්පත නිසි පරිදි පුරවා අත්සන් කර ඔබ පාසලේ විදුහල්පතිගේ ද අත්සන හා නිලමුද්‍රාව සහිතව, 2016.08.01 දින සිට 2019.07.31 දින දක්වා වූ කාලය තුළ ඔබ විසින් ලබාගෙන ඇති ජයග්‍රහණවලට අදාළ සහතිකපත්වල සහතික කරන ලද පිටපත් ද අමුණා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා එවනු ලබන මුද්‍රිත අයදුම්පත සමඟ ලියාපදිංචි තැපෑලෙන් අතිරේක ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට පුවත් පත් දැන්වීමේ දක්වා ඇති අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙනසේ එවිය යුතුය.**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන යම්කිසි හේතුවක් මත යම් අපේක්ෂකයෙකුහට විශේෂ ප්‍රවේශ සම්මුඛ පරීක්ෂණයට අදාළ දිනයේදී සහභාගිවීමට නොහැකිවේ නම් අදාළ අපේක්ෂකයා වෙනුවට අපේක්ෂකයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකුට හෝ භාරකරුහට අපේක්ෂකයාගෙන් ලබා ගත් ලිපියක් සමඟ සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීමට අවස්ථාවක් ලබා දිය හැකිය. කෙසේ වෙතත්, ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.**

**අසම්පූර්ණ හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.**

**විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීමට වෙනම පුවත්පත් දැන්වීම් පළකරනු නොලැබේ.**

### 6.3 ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතාවන් දක්වා ඇති අයදුම්කරුවන්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය සහ සබරගමුව විශ්වවිද්‍යාලය මගින් පැවැත්වෙන ශාරීරික අධ්‍යාපනය යන පාඨමාලා හැදෑරීම සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාවට අමතරව සීමිත ස්ථාන සංඛ්‍යාවක් ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා වෙන්කර ඇත.

මෙම විශේෂ ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් පහත සඳහන් අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- ඔලිම්පික් තරඟයකදී පදක්කම් ලබා තිබීම හෝ සහභාගිත්වය.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලකදී, ආසියානු ක්‍රීඩා උළෙලකදී හෝ සාක් ක්‍රීඩා උළෙලකදී අවම වශයෙන් රන්, රිදී හෝ ලෝකඩ පදක්කමක් ලබා තිබීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා, ආසියානු ක්‍රීඩා, සාක් ක්‍රීඩා හෝ පිළිගත් ලෝක කුසලාන තරඟයකදී ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රිකට්, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වීම.

මෙම විශේෂ ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන අයදුම්කරුවන්, අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පදනම් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරිය යුතුය.

**මෙම විශේෂ ප්‍රවේශය සඳහා වෙනමම පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 6.4 සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

**ඉංජිනේරු විද්‍යා, වෛද්‍ය හා දන්ත ශල්‍ය විද්‍යාව** යන පාඨමාලාවල ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 0.5% ක ප්‍රමාණයක් දක්වා (එකතුවූ මුළු සංඛ්‍යාවට යටත්ව) ස්ථිර සේවයේ නියුක්ත සන්නද්ධ සේවා නිලධාරීන් සහ මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් සඳහා වෙන්කර ඇත.

ඉහත ඡේද අංක 1.2 හි සඳහන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම සුදුසුකම් සහ ඡේද අංක 2.2 හි දක්වා ඇති පරිදි ඒ ඒ පාඨමාලාවලට නියමිත විෂය පූර්ව අවශ්‍යතා සපුරා ඇති අපේක්ෂකයන් තමන්ගේ සේවාවේ අණදෙන නිලධාරී මගින් (අදාල පරිදි) ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත තම අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාල අපේක්ෂකයා නිත්‍ය සේවයේ සිටිය යුතුවේ. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලබනුයේ අයදුම්කරුවන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ලබාගත් ඉසෙඩ් ලකුණු වල සාමාන්‍යය උපයෝගී කරගෙනය. මෙම ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් නොකළ යුතු අතර අයදුම්පත් බාරගන්නේ ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් පමණි.

### 6.5 විදේශයන්හි අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයන් හා විදේශීය සිසුන්

(i) සෑම පාඨමාලාවකම පවත්නා ස්ථාන වලින් 0.5 % ක ප්‍රමාණයක් දක්වා (එකතුවූ මුළු සංඛ්‍යාවට යටත්ව) විදේශීය සිසුන් හා විදේශීය සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසුන් සඳහා වෙන් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රටකදී ශ්‍රී ලංකාවේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන විදේශීය විභාගයකින් සුදුසුකම් ලත් සිසුන්ට මේ සඳහා අයදුම් කළ හැකි වේ.

පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සිසුන් තෝරා ගනු ලැබේ.

(අ) අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට ආසන්නතම වසර හයක කාලය තුළ අවම වශයෙන් අධ්‍යයන වසර තුනක් විදේශ අධ්‍යාපනය ලබා ඇති විදේශීය රටවල දැනට සේවය කරන හෝ සේවය කර ඇති ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන්

(ආ) ශ්‍රී ලංකාවේ සිටින විදේශීය තානාපති සේවා නිලධාරීන්ගේ දරුවන්

(ඇ) සාක් සංවිධානයේ සාමාජික රටවල සිසුන්

(ඈ) ඉහත (අ) යටතේ ආවරණය නොවන, අවම සුදුසුකම් ලැබූ විභාගයට ආසන්නතම අධ්‍යයන වර්ෂ තුනක කාලය විදේශීය රටක අධ්‍යාපනය ලබා ඇති ශ්‍රී ලාංකික සිසුන්

(ඉ) ඉහත (ආ) සහ (ඇ) යටතේ ආවරණය නොවන අනෙකුත් විදේශීය සිසුන්

මෙහිදී ඉහත (අ) සහ (ඈ) යටතට අයත් වන ශ්‍රී ලාංකික සිසුන්ගේ දෙමාපියන්ද මෙම ප්‍රවේශය සඳහා සලකනු ලබන අධ්‍යයන වර්ෂ 03ක කාලය මුළුල්ලේම එම රටෙහිම සේවයෙහි නියුතුව සිටිය යුතුය.

**ඉහත (අ) යටතේ තෝරා ගනු ලබන සිසුන් හැරුණු කොට අනෙකුත් සියලුම සිසුන් පාඨමාලා ගාස්තු ගෙවන පදනම මත බඳවා ගනු ලැබේ.**

(ii) මෙයට අමතරව සම්පූර්ණ පාඨමාලා ගාස්තු ගෙවන පදනම මත සියළුම පාඨමාලාවන් සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාවෙන් 4.5% ක ප්‍රමාණයක් යෝජිත ස්ථාන සංඛ්‍යාවට අතිරේකව විදේශීය සිසුන් සහ විදේශීය අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකීය සිසුන් සඳහා වෙන්කර ඇත.

මෙම 4.5%ක ප්‍රමාණය යටතට අයත් වන ශ්‍රී ලාංකික සිසුන්ගේ දෙමාපියන්ද මෙම ප්‍රවේශය සඳහා සලකනු ලබන අධ්‍යයන වර්ෂ 03ක කාලය මුළුල්ලේම එම රටෙහිම සේවයෙහි නියුතුව සිටිය යුතුය.

මෙම ප්‍රවේශය යටතේ අයදුම් කිරීමට බලාපොරොත්තු වන සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා ගත හැකි විශේෂ අයදුම්පතක් මගින් ඒ සඳහා අයදුම් කළ යුතු වේ. අදාළ අයදුම්පත්‍රය www.ugc.ac.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.

## 6.6 ගුරුවරුන් ඇතුළත් කර ගැනීම

පහත සඳහන් කාණ්ඩවලට අයත් ඉතා සීමිත ගුරුවරුන් සංඛ්‍යාවක් කලා, ජෛවීය විද්‍යා, භෞතිය විද්‍යා සහ ව්‍යාවහාරික විද්‍යා යන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණය කළ හැකිය.

(අ) 2015 වර්ෂයේ දී හෝ ඊට පසු වර්ෂයකදී ඉංග්‍රීසි විෂය සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය සමත් ගුරුවරුන්, කලා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) 2015 වර්ෂයේදී හෝ ඊට පසු වර්ෂයකදී විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් ජෛවීය විද්‍යා, භෞතිය විද්‍යා හෝ ව්‍යාවහාරික විද්‍යා යන පාඨමාලා සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

ඉහත සඳහන් කාණ්ඩවලින් කවර හෝ කාණ්ඩයකට අයත් ගුරුවරයෙකුට ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම පිණිස පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(1) ගුරුවරයෙකු වශයෙන් මුල් පත්වීම ලද දිනයේ සිට පස් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(2) තෝරා ගනු ලබන අවස්ථාවේදී යම් ගුරු අභ්‍යාස විද්‍යාලයක/අධ්‍යාපන විද්‍යා පීඨයක ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වී නොසිටිය යුතුය.

(3) යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා, භෞතිය විද්‍යා හෝ ව්‍යාවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී හෝ අදාළ විශ්වවිද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වනු ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය.

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත් කැඳවනු ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබා ඇති ප්‍රතිඵල (මුළු ලකුණු සහ / හෝ අදාළ විෂයයනට ලබාගත් ලකුණු) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගැනේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම විධිවිධාන යටතේ කිසිම අපේක්ෂකයකුගෙන් කිසිම අවස්ථාවකදී කෙලින්ම අයදුම්පත් බාරගනු නොලැබේ.

**විශේෂ ප්‍රවේශය සඳහා තෝරාගනු ලැබූ ගුරුවරුන් ඔවුනට පිරිනමනු ලබන කවර හෝ අධ්‍යයන පාඨමාලාවක් අධ්‍යයනය කිරීම සඳහා බැඳී සිටිය යුතුය. තෝරාගනු ලබන සියලුම සිසුන් ප්‍රථම වසරේ සිට අධ්‍යයන කටයුතු ආරම්භ කළ යුතුය.**

## 6.7 අතිරේක ප්‍රවේශය

ඉහත අංක 1.1 හි සඳහන් කළ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුව සිසුන් තෝරා ගැනීමේ දී කලා අධ්‍යයන පාඨමාලාවේ සමහර විෂයයන්ට අවශ්‍ය තරම් සිසුන් ප්‍රමාණයක් නොතේරීමට පුළුවන. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගනු ලබන සිසුන් ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් සමහර පීඨයන්ට හා අධ්‍යයනාංශවලට ඇතුළත් කර ගැනීමට හැකියාව තිබිය හැකිය. එවැනි අවස්ථාවලදී අදාළ විශ්වවිද්‍යාල වල ඉල්ලීම මත යම් තෝරාගත් විෂයයන්ට සීමිත අතිරේක සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණය කල හැකිය.

මෙය විශ්වවිද්‍යාලවල පවත්නා භෞතික හා මානව සම්පත් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමේත් සමාජයට අවශ්‍ය ශ්‍රම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේත් අරමුණෙන් ඇති කරන ලද 'අතිරේක ප්‍රවේශය' කි.

මේ යටතේ සිසුන් තෝරාගනු ලබනුයේ ද සාමාන්‍ය ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගැනීම සඳහා කැඳවනු ලැබූ අයදුම්පත් අතරින්ම බැවින් ශිෂ්‍යයින් මේ සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු නොවේ.

මෙම විධිවිධාන යටතේ විශේෂ විෂයයන් සඳහා සිසුන් තෝරා ගැනීම දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදුවේ. කෙසේ වෙතත්, භාෂා විෂයයන්, ආගම් සහ ශිෂ්ඨාචාර විෂයයන් හා සෞන්දර්ය අධ්‍යයන විෂයයන් සඳහා සලකා බැලීමට නම් සිසුන් අදාළ විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබිය යුතුවේ. [ඉංග්‍රීසි විෂය සඳහා මෙම අවශ්‍යතාවය අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) වේ].

මෙම විධිවිධාන යටතේ ඇතුළත් කරගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ඔහු/ ඇය තෝරා ගැනීමට ඉවහල්වූ විෂය විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය මුළුල්ලේම අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුවේ. මෙම විධිවිධාන යටතේ ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයෙකු අදාළ විශ්වවිද්‍යාලයේදී විශේෂ උපාධියක් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා ඔහු/ ඇය තෝරා ගැනීමට ඉවහල්වූ විෂය අනිවාර්යයෙන්ම තෝරා ගත යුතුය.

# 7 කොටස

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ එමගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා පිළිබඳ හැඳින්වීමක්

**මෙම කොටසින් රජයේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ඇති පහසුකම් පිළිබඳව විස්තර කෙරේ. මීට අමතරව, එක් එක් විශ්වවිද්‍යාලයේ / උසස් අධ්‍යාපන ආයතනයේ පවත්වන පාඨමාලා පිළිබඳව විස්තරාත්මක අවබෝධයක්ද ඔබට ලබා දේ.**


| | |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 178 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 182 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 189 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 197 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 206 |
| යාපනය විශ්වවිද්‍යාලය | 208 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 209 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය (මඩකලපුව) | 215 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ඔලුවිල්) | 217 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (මිහින්තලේ) | 218 |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (බෙලිහුල්ඔය) | 221 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (කුලියාපිටිය) | 227 |
| ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 232 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 234 |
| ශ්‍රීපාලි මණ්ඩපය | 238 |
| වව්නියා මණ්ඩපය | 239 |
| ත්‍රිකුණාමල මණ්ඩපය | 239 |
| කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය | 239 |
| කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 239 |
| කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 240 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 240 |
| ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | 240 |

# 7 කොටස

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ එමගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා පිළිබඳ හැඳින්වීමක්

**කෙටි නම්:**

| | | | |
|---|---|---|---|
| ව්‍යා. ගණිතය - ව්‍යවහාරික ගණිතය | | රසායන වි. - රසායන විද්‍යාව | |
| ශු. ගණිතය - ශුද්ධ ගණිතය | | භෞතික වි. - භෞතික විද්‍යාව | |
| සං.හා පරි. විද්‍යාව - සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව | | උද්භිද වි. - උද්භිද විද්‍යාව | |
| පරි. විද්‍යාව - පරිගණක විද්‍යාව | | | |
| සං.පර්. සහ තො.තා. - සංකාර්යය පර්යේෂණ සහ තොරතුරු තාක්ෂණය | | | |

**ඉ/මා - ඉගැන්වීමේ මාධ්‍යය**

S - සිංහල  T - දෙමළ  E - ඉංග්‍රීසි  A - අරාබි

## කොළඹ විශ්වවිද්‍යාලය

| **අධ්‍යයන පාඨමාලාව** | **විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)** | **ඉ/මා** |
|---|---|---|
| කලා | - | S/T/E |
| කළමනාකරණය + | - | E |
| නීතිය | - | S/T/E |
| වෛද්‍ය විද්‍යාව | - | E |
| භෞත චිකිත්ස | - | E |
| කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය * | - | E |
| අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව * | රසායන විද්‍යාව, ශාක විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| ජෛවීය විද්‍යාව * | රසායන විද්‍යාව, ශාක විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, සංඛ්‍යානය, රසායන විද්‍යාව සමග පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, සංඛ්‍යානය, භෞතික විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව සමඟ පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව* | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව | E |
| හෙද | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය(ET) | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය(BST) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |

\+ **කළමනාකරණ හා මූල්‍ය පීඨය**

හැඳින්වීම

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇතිවන ප්‍රවණතාවන්ට සරිලන පරිදි 2009 වසරේදී කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨය මඟින් ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව සඳහා නව විෂය මාලාවක් හඳුන්වා දෙන ලදී. මෙම නව විෂය මාලාවෙහි මූලික අරමුණ වන්නේ ශාස්ත්‍රීය උසස් අධ්‍යාපනය හා කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අවශ්‍යතා අතර පවතින පරතරය අවම වන අයුරින්, ශාස්ත්‍රීය හා ප්‍රායෝගික යන දෙඅංශයේම දැනුමෙන් යුත් උපාධිධාරීන් පිරිසක් බිහි කිරීමයි. නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙන් පහත සඳහන් අරමුණු සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

- විවිධ ක්ෂේත්‍රයේ විශේෂඥභාවයකින් යුත් පීඨ ව්‍යාප්ත උපාධි පාඨමාලාවක් හඳුන්වා දීම.
- දැනට පවතින දෙපාර්තමේන්තු ශාස්ත්‍රීය වශයෙන් විශේෂිත වූ සේවා දෙපාර්තමේන්තු බවට පත්කිරීම
- පාඨමාලා ඒකක ක්‍රමය (Course Unit System) හඳුන්වා දීම.
- ඉගෙනුම් ක්‍රියාවලියේ නම්‍යශීලී බවත්, පාථුල බවත් වැඩි දියුණු වන අයුරින් වෛකල්පිත පාඨමාලා (Elective courses) ප්‍රමාණය වැඩි කිරීම.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ අදාළ ප්‍රායෝගික පුහුණුව සඳහා විද්‍යාර්ථීන්ට අවකාශය සලසා දීම.

**ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව (BBA)**

මෙය සිව් අවුරුදු, පූර්ණ කාලීන - විශේෂ පාඨමාලාවකි. ගිණුම්කරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මූල්‍යකරණය, ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය සහ ජාත්‍යන්තර ව්‍යාපාර යන විෂය ධාරාවන් සඳහා ද කළමනාකරණ පීඨය මගින් උපාධි පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලාවෙහි විෂය මාලාව අදියර I (BBA Level I) සහ අදියර II (BBA Level II) වශයෙන් කොටස් දෙකකින් යුක්ත වන අතර, එම සෑම අදියරක්ම පිළිවෙලින් සෙමෙස්තර හතරකට (04) අයත් වේ. ඒ අනුව සම්පූර්ණ උපාධි පාඨමාලාව සෙමෙස්තර අටකින් (08) සමන්විත වේ. BBA අදියර II හි දී, ( එනම් V, VI, VII, VIII සෙමෙස්තර වලදී) විද්‍යාර්ථීන් තෝරා ගන්නා විශේෂ විෂය ධාරාව කුමක් වුවද BBA අදියර I ( එනම් I, II, III හා IV සෙමෙස්තර) සෑම විද්‍යාර්ථියෙකුම පොදුවේ හැදෑරිය යුතුවේ.

ඒ අනුව ( විද්‍යාර්ථීන්ට) පහත සඳහන් උපාධි පාඨමාලා හැදෑරිය හැකිය.

- ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය
- ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය
- ව්‍යාපාර ආර්ථිකවිද්‍යාව පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය
- මූල්‍යකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය
- ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳ පරිපාලනවේදී උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිපාලනවේදී උපාධිය
- ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ පරිපාලනවේදී උපාධිය
- අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය

මෙම උපාධි පාඨමාලා පිළිබඳ කෙටි හැඳින්වීමක් පහත දැක්වේ.

- ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA)

  කළමනාකරණය සහ සංවිධාන හා සම්බන්ධ විවිධ පර්යාවලෝකනයන් පිළිබඳ අත්‍යවශ්‍ය දැනුම, කුසලතාව සහ පුහුණුව ලබාදීමේ අරමුණින් මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර තිබේ. කළමනාකරණය හා සංවිධානය පිළිබඳ ප්‍රමාණවත් න්‍යායාත්මක අවබෝධයක් සපයන අතරම, කළමනාකරණය සහ ආයතනික ක්‍රියාකාරකම් ආශ්‍රිත තත්කාලීන ගැටළු විශ්ලේෂනය කිරීමේ හැකියාව විද්‍යාර්ථීන්ට ලබාදීම මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වේ.

- ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA in Accounting)

  මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන විද්‍යාර්ථීන් සඳහා ගිණුම්කරණය පිළිබඳ මූලික අවබෝධයකින් යුතුව ආයතනික ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම, අදාල තොරතුරු වාර්තා කිරීම, ආයතනික පරිපාලන ක්‍රමවේද සැලසුම් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම යනාදිය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

- ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA in Business Economics)

  මෙම පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් හට ව්‍යාපාර පිළිබඳව ආර්ථික විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයකින් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදෙනු ලැබේ. ආර්ථික විද්‍යාව පිළිබඳ සාම්ප්‍රදායික උපාධි පාඨමාලාවලදී මෙන් නොව මෙහිදී කළමනාකරණය හා සම්බන්ධ සියලු හර විෂයයන් ඉගෙනීමට විද්‍යාර්ථීන්ට අවකාශය සැලසේ. විවිධ නිබන්ධන හා ඉගෙනුම් ආධාරක මගින් ව්‍යාපාර කළමනාකරණය ආශ්‍රිත තත්වයන් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා විද්‍යාර්ථීන් තුල වර්ධනය කරවීමට අපේක්ෂිතය.

- මූල්‍යකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA in Finace)

  මූල්‍යකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි හදාරන විද්‍යාර්ථයින්ට මූල්‍යකරණය පිළිබඳව ප්‍රවේශයකින් යුතුව ව්‍යාපාර හා ආයතනික ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදෙනු ලැබේ. එමෙන්ම මෙම පාඨමාලාව ඔස්සේ පරිපාලන ක්‍රියාවලිය ආශ්‍රිතව කාලීන වශයෙන් පැනනගින පුළුල් අවස්ථාවන් හඳුනාගැනීමට හැකිවනු ඇත.

- ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය
  (BBA in Hospitality and Leisure Management)

  නවීන ලෝකයේ අපේක්ෂා සහගත විෂය ක්ෂේත්‍රයක් වශයෙන් ආගන්තුක සත්කාර විවේක කළමනාකරණය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයද මෙම ක්ෂේත්‍රයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කරන අතර හෝටල්, සංචාරක කර්මාන්තය

හා විවේක කළමනාකරණය ආදියෙහි ප්‍රවර්ධනය සඳහා නව ව්‍යාපෘතීන් ආරම්භ කර තිබේ. එබැවින් මෙම ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා රාශියක් විවර වී තිබේ. ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා දායක කර ගත හැකි ශාස්ත්‍රීය හැකියාවන්ගෙන් යුත් වෘත්තීමය කළමනාකරුවන් බිහි කිරීම මෙම උපාධි පාඨමාලාවේ අරමුණයි.

- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA in Human Resource Management)

  යම් සංවිධානයක හෝ ආයතනයක අත්‍යවශ්‍යම අංගයක් ලෙස මානව සම්පත් කළමනාකරණය හඳුනාගැනීම මෙම පාඨමාලාවෙන් සිදුකෙරේ. මානව සම්පත් කළමනාකරණය මෙන්ම ඒ හා සම්බන්ධ සෙසු අංශ සමඟ ද සම්බන්ධ වීමට විද්‍යාර්ථීන්ට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම මෙම පාඨමාලාවෙන් අපේක්ෂා කෙරේ.

- ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (BBA in International Business)

  අලෙවිකරණය, ගිණුම්කරණය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථිකවිද්‍යාව හා නීතිය යන අංශයන්හි ගෝලීය ප්‍රවණතා හඳුනාගනිමින් ජාත්‍යන්තර ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂ දැනුමක් ලබා ගැනීමට මෙම පාඨමාලාවෙන් අවකාශය සැපයෙනු ඇත. තවද මේ සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබාගැනීමට ද විද්‍යාර්ථීන්ට මෙමගින් අවස්ථාව උදාවනු ඇත. විශේෂයෙන්ම, කළමනාකරණ උපාධිධාරීන් වශයෙන් නම අනන්‍යතාව පවත්වා ගනිමින් ජාත්‍යන්තර ව්‍යාපාර ක්‍රියාවලිය තුල විශේෂඥ දැනුමක් මෙමගින් ලබාගත හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

- අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය (BBA in Marketting)

  අලෙවිකරණය හා සම්බන්ධ පුහුණුව මගින් අලෙවිකරණය සඳහා වන අවස්ථා හඳුනාගැනීමට අවශ්‍ය මගපෙන්වීම මෙම පාඨමාලාවෙන් ලබාදෙනු ලැබේ. එමෙන්ම මෙමගින් පාරිභෝගිකයන්ගේ, ආයතනයේ සහ සමාජයේ අභිවෘද්ධිය සඳහා එම දැනුම උපයෝගී කරගැනීමට ද ආයතනය තුල හා පිට සිටින අදාල පාර්ශවයන් ඒකාබද්ධ කිරීමටද අවශ්‍ය පුහුණුව විද්‍යාර්ථීන්ට ලබා දීමට අපේක්ෂිතය.

## විද්‍යා පීඨය

විද්‍යා පීඨයේ "මොඩියුල" පාඨමාලා ඒකක ක්‍රමයක් පවතී. සිසුන් ඔවුන්ගේ වෘත්තීය ඉලක්ක අනුව සුදුසු අනිවාර්ය (compulsory), වෛකල්පිත (elective) හා වැඩිදියුණු කිරීමේ (enhancement) පාඨමාලා සංයෝජනයක් හදාරනු ඇත. **සෑම විෂය ධාරා හතරටම අයත් විද්‍යාවේදී (BSc) උපාධි, පීඨය මඟින් ලබා දෙයි. උදා -- ජීව විද්‍යා, භෞතික විද්‍යා, කාර්මාන්ත සංඛ්‍යානය හා ගණිත මූල්‍යය, අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව.**

- විද්‍යාවේදී (BSc) උපාධිය මුල් කර ගත් තුන් අවුරුදු සාමාන්‍ය උපාධිය
- විද්‍යාවේදී (BSc) උපාධිය මුල් කරගත් සිවුඅවුරුදු විශේෂ/ ගෞරව උපාධිය ( අධ්‍යයන ක්ෂේත්‍රය) ( පළමු දෙවසරේ ප්‍රතිඵල මත තෝරා ගැනේ)

විද්‍යා පීඨයට ඇතුළත් වන සියලුම සිසුන්ට ඔවුන්ගේ විද්‍යා දැනුම වැඩිදියුණු කරගැනීම සඳහා සැලසුම් කළ පරිගණක විද්‍යා පාඨමාලා හැදෑරීමේ අවස්ථාව ලැබෙනු ඇත. මෙම පාඨමාලා ලබා දෙනු ලබන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලය (UCSC). මෙම කොටසෙහි කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ඇති වගුවෙහි දක්වා ඇති භෞතික විද්‍යා විෂය ධාරාවෙහි විෂය සංකලන සඳහා තෝරාගනුලබන්නේ දැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යොදාගනුලබන ඇතුළත් කිරීමේ නිර්ණායක පදනම් කරගෙනය. ජීව විද්‍යාව මෙන්ම අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව හදාරන සිසුන් සඳහා ඇත්තේ එක් සංකලනයක් (One combination) පමණි. තව දුරටත් ජෛවරසායනය පළමු දෙවසර තුළදී වෙනම විෂයක් ලෙස ලබා නොදෙයි.

පීඨයට ඇතුළත් වන සියලුම සිසුන් ඔවුන් තෝරාගත් විෂය සංකලනයන්ට අදාළ අනිවාර්ය පාඨමාලා (compulsory courses) හැදෑරිය යුතුය. ඊට අමතරව, මෙම විෂය ගණනාවක් අතුරෙන් වෛකල්පිත පාඨමාලා (elective courses) තෝරාගත හැකිය. සාමාන්‍ය උපාධි සඳහා ඇතුළත් වන සිසුන්ට තෙවන වසරේ දී සුදුසු පාඨමාලා ගණනාවක් ලබා දෙන අතර කර්මාන්ත සීමාවාසික පුහුණුවක් (industrial internship) ද ඇතුළත් වේ.

පළමු දෙවසර තුළදී විශිෂ්ටත්වයක් දක්වන සිසුන්ට පීඨය මගින් ලබා දෙන මූලික, අන්තර්විෂයික, ව්‍යවහාරික හා කර්මාන්ත නැඹුරුවකින් යුත් විශේෂ/ ගෞරව උපාධිවලින් එකක් සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. මෙම වැඩසටහන් සඳහා ඇති ඉඩකඩ සීමිත බැවින් ඉහළ තරඟකාරීත්වයක් පවතී. සියලුම විශේෂ/ ගෞරව උපාධි සඳහා පර්යේෂණ සංරචකයක් අඩංගු වේ. කර්මාන්ත නැඹුරුවකින් යුත් උපාධියක් සඳහා එය කර්මාන්ත සීමාවාසික පුහුණුවක් විය හැක.

එක් එක් ධාරාව යටතේ ඇති විශේෂ/ ගෞරව උපාධි පහත දැක්වේ.

**භෞතික විද්‍යාව** - රසායන විද්‍යාව , පරිගණක රසායන විද්‍යාව , භෞතික විද්‍යාව , පරිගණක භෞතික විද්‍යාව , ඉංජිනේරු භෞතික විද්‍යාව , ගණිතය , මූල්‍ය ව්‍යාපාර හා පරිගණක ගණිතය , සංඛ්‍යානය , ගණිතය හා සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව , සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව , න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව , තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය , ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණය , ව්‍යවහාර සංඛ්‍යානය , මූල්‍ය හා රක්ෂණය , විද්‍යාව හා කළමනාකරණය , න්‍යෂ්ටික තාක්ෂණය .

**ජීව විද්‍යාව** - රසායන විද්‍යාව, පරිගණක රසායන විද්‍යාව, අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව, ඖෂධ විද්‍යාව , පාරිසරික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ප්‍රතිශක්තිවේදය සහ සමෝධානික අණුක ජීව විද්‍යාව, ශාක විද්‍යාව, ජෛව තොරතුරු තාක්ෂණය, ශාක ජෛව තාක්ෂණය, න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, ව්‍යාපාරය හා පරිසරය, විද්‍යාව හා කළමනාකරණය , උද්‍යාන විද්‍යාව හා තිරසාර භූමි නිර්මාණය , න්‍යෂ්ටික තාක්ෂණය .

( පරිගණක රසායන විද්‍යාව, පරිගණක භෞතික විද්‍යාව, ජෛව තොරතුරු තාක්ෂණය , ගණිතය හා සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව, සංඛ්‍යානය සමග පරිගණක විද්‍යාව යන උපාධි කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල (UCSC) සමග එක්ව ලබාදෙන අතර, ඖෂධවිද්‍යා උපාධිය වෛද්‍ය පීඨයේ ඖෂධවේද අංශය සමග එක්ව ලබා දෙන බව සලකන්න).

**කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍යය** - කර්මාන්ත සංඛ්‍යානය, ගණිතමය මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය, ව්‍යවහාර සංඛ්‍යානය, මූල්‍ය හා රක්ෂණය.

**අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව** - අණුක ජීවවිද්‍යාව සහ ජීව රසායන විද්‍යාව , රසායන විද්‍යාව ( සීමිත අවස්ථාවන් ), තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය සහ අණුක ජීවවිද්‍යාව සහ ජෛව තාක්ෂණය. මීට අමතරව ඉඩකඩ අනුව මේ සිසුන්ට ජීව විද්‍යා ධාරාවේ සිසුන් සඳහා ලබා දෙන විශේෂ/ ගෞරව උපාධිය සඳහා ඇතුළත් වීමේ අවසරය ලැබේ.

## හෙද පීඨය

හෙද පීඨය මගින් සාත්තු සේවාව ( හෙද) පිළිබඳව විද්‍යාවේදී උපාධියක් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ සියලු වයස්වල රෝගීන් රැකබලා ගැනීම සඳහා පුළුල් පරාසයක විහිදුණු දැනුම කුසලතා හා ආකල්පවලින් සමන්විත හා රෝග වළක්වා ගැනීම, සෞඛ්‍ය ප්‍රවර්ධනය හා නැවත ප්‍රතිශ්ඨාපනය හා පුනරුත්ථාපනය සඳහා සහාය විය හැකි උපාධිලාභී හෙදියන් නිර්මාණය කිරීමය. මෙම උපාධිය වසර හතරකින් සමන්විත වන අතර පාඨමාලා ඒකක ක්‍රමයක් මත පදනම් වූ ශාස්ත්‍රීය පැය 127 කින් සමන්විත පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක වනු ඇත. සමස්ථ පාඨමාලාවම ඉංග්‍රීසි බසින් පැවැත්වේ. එමෙන්ම මෙම හෙද පාඨමාලාව ජාත්‍යන්තර මට්ටමෙන් ලබා ගත හැකි වෙනත් හෙද වැඩසටහන් හා සම වන ආකාරයට සකස් කර තිබේ. මෙම පාඨමාලාවෙහි විෂය නිර්දේශය සිසුන් හෙද වෘත්තියෙහි නිරතවීමට අවශ්‍ය මූලික විද්‍යා හා සමාජ විද්‍යා මූලධර්ම පිළිබඳ ස්ථිර පදනමක් ලබා දෙන එමෙන්ම හෙද සේවාව පිළිබඳ වෘත්තීය හා හර පාඨමාලාවලින් සමන්විත නවතම තාක්‍ෂණයන් පිළිබිඹු වන ආකාරයට සකස් කර ඇත. මෙම පාඨමාලාව හෙද රැකවරණයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ඉහළ කුසලතා සපිරි හෙද වෘත්තිකයන් මෙන්ම කැපකරු හෙද අධ්‍යාපනය සහ සෞඛ්‍ය හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට හැකි හෙදියන් බිහිකිරීමේ අරමුණින් සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව ප්‍රායෝගික දැනුම ප්‍රවර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් ලබා දෙන අතර ඒ තුළින් සිසුන්හට සැබෑ ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන තත්වයන් විසඳා ගැනීමට අවශ්‍ය නිපුණතා අත්පත් කර ගැනීමට ඉඩ ප්‍රස්තාවක් සැලසේ.මෙම වැඩසටහන හෙද පර්යේෂණ හා සාක්ෂි මත පදනම් වූ පුහුණුවීමේ සංකල්ප මෙන්ම විවේචනාත්මක චින්තනය සහ ගැටලු විසඳාගැනීමේ හැකියාවන් සංවර්ධනය කිරීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. ප්‍රායෝගික පාදක ඉගෙනුම් කොළඹ හා ඒ අවට රෝහල් ගණනාවක මෙන්ම ප්‍රජා කොටස් ආශ්‍රිතව සිදු කෙරේ.

## තාක්‍ෂණ පීඨය

සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා තුනක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත සුදුසුකම් සපුරනු ලබන සිසුන් තාක්‍ෂණ පීඨය සඳහා තෝරා ගනු ලැබේ. පහත සඳහන් උපාධි පාඨමාලා ශාස්ත්‍රීය පැය 120 කින් සමන්විතය.

1. මෙවලම් හා ස්වයංක්‍රීය ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

2. පාරිසරික ජෛව පද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

3. කෘෂිකර්ම ජෛව පද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය

මෙම බහුවිධ උපාධි වැඩසටහන්හි විෂය නිර්දේශ සකස්ව ඇත්තේ සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම අනුසාරයෙන් අදාළ ක්ෂේත්‍රයන්හි නවීන තාක්‍ෂණය භාවිතා කිරීම සහ නව නිර්මාණකරණයට මංපෙත් විවර කරමින්ය. මෙම වැඩසටහන් හරහා වෘත්තීය නිපුණතාවයකින් යුත් තිරසාර ආර්ථික සංවර්ධනයකට හා පොදුජන සුභසිද්ධිය උදෙසා සෘජු දායකත්වයක් සපයන හා පරිසර හිතකාමී තාක්‍ෂණ උපාධිධාරීන් නිර්මාණය කිරීම අරමුණයි.

උපාධි පාඨමාලා මතු සඳහන් පුළුල් විෂය පථ වලින් සමන්විතය.

- මූලික විද්‍යා හා ගණිත විෂයයන්, මූලික තාක්‍ෂණ විෂයයන්, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා කළමනාකරණය හා ගණකාධිකරණය සහ සෞඛ්‍යය
- තාක්‍ෂණ විෂයයන් පිළිබඳ අදාළ දැනුම හා කුසලතා ලබා දීම සඳහා වූ තාක්‍ෂණික විෂයයන්,

මීට අමතරව, සෑම ශිෂ්‍යයෙකුම,

- නිශ්චිත කාල වකවානුවක් සඳහා වූ කර්මාන්ත පුහුණුව හා වාර්තාව

හෝ

- උපාධි වැඩසටහන සඳහා අදාළ පර්යේෂණ ව්‍යාපෘතිය හා නිබන්ධනය ඉදිරිපත් කළ යුතුය.

මීට අමතරව පීඨයට ඇතුලු වන සියළුම සිසුනට ඔවුන්ගේ තාක්‍ෂණික කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පරිගණක, ඉලෙක්ට්‍රොනික හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණුව විද්‍යාගාර හා යාන්ත්‍රික වැඩපල හරහා ලබා දෙනු ඇත.

### ශාස්ත්‍ර පීඨය

### ප්‍රථම උපාධි පාඨමාලා

ශාස්ත්‍ර පීඨය පුළුල් පදනමක් සහිතව ප්‍රථම උපාධි පාඨමාලාව සිසුන්ට පිරිනමනු ලබයි.

1. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව ( විෂය ධාරා - තුන් අවුරුදු පාඨමාලා)

ව්‍යවහාරික ප්‍රජා විද්‍යාව; බැංකු සහ මුදල්; ව්‍යාපාරික සහ කළමනාකරණ ආර්ථික විද්‍යාව; ඉංග්‍රීසි අධ්‍යයනය; න්‍යාය සහ භාවිතය; භූගෝල විද්‍යාව සහ පරිසර කළමනාකරණය; සංස්කෘතිය සහ උරුමය; ගැටුම් නිරාකරණය සහ සාමය; ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය; සිංහල අධ්‍යයනය; ව්‍යවහාරික සමාජ විද්‍යා අධ්‍යයනය; නාගරික සහ ප්‍රජා අධ්‍යයනය; බෞද්ධ අධ්‍යයනය; ඉංග්‍රීසි දෙවන බස ලෙස හැදෑරීම; සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලාව; ව්‍යවහාරික ඉස්ලාමීය අධ්‍යයනය; තොරතුරු තාක්‍ෂණය සහ සංවර්ධනය; ක්‍රීඩා අධ්‍යයනය.

2. ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලා ( සිව් අවුරුදු පාඨමාලා)

බෞද්ධ අධ්‍යයනය; ප්‍රජා විද්‍යාව; ආර්ථික විද්‍යාව; ඉංග්‍රීසි; භූගෝල විද්‍යාව; ඉතිහාසය; ජාත්‍යන්තර සම්බන්ධතා; දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්තිය; සිංහල; සමාජ විද්‍යාව.

සියලුම උපාධි පාඨමාලාවන්හි ඉගැන්වීම් සහ අඛණ්ඩ ඇගැයීම් සමාසික ක්‍රමය තුළ පැවැත්වේ. සෑම පාඨමාලා ඒකකයක් සඳහාම අදාල සමාසිකය තුළ ඉගැන්වීම් සහ අඛණ්ඩ ඇගැයීම් සිදු කෙරේ. සමාසිකයක් සති 15 ක් වන අතර පාඨමාලා ඒකකයක් ඉගැන්වීම් සහ අධ්‍යයන ක්‍රියාවලිය පැය 150 ක් වේ. සාමාන්‍ය උපාධි පාඨමාලාව ( විෂය ධාරා) වර්ෂ තුනක් තුළ සිදුවන අතර ( සමාසික හයක) විශේෂ උපාධි පාඨමාලා සිව් වසරක ( සමාසික අටක) අධ්‍යයන කාලයකට යටත් වේ.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භා/මා |
|---|---|---|
| කලා | - | S/T/E |
| නීතිය | - | E |
| කළමනාකරණය | - | S/T/E |
| වෛද්‍ය විද්‍යාව | - | E |
| දන්ත ශල්‍ය විද්‍යාව | - | E |
| පශු වෛද්‍ය විද්‍යාව | - | E |
| කෘෂි තාක්‍ෂණය සහ කළමනාකරණය+ | - | E |
| ආහාර විද්‍යාව හා තාක්‍ෂණය¶ | - | E |
| ජෛවීය විද්‍යාව * | - | E |
| සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | - | E |
| ඉංජිනේරු විද්‍යාව# | - | E |
| භෞතීය විද්‍යාව * | - | E |
| සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | - | E |
| පරිගණනය සහ කළමනාකරණය | - | E |
| හෙද | - | E |
| ඖෂධ විද්‍යාව | - | E |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | E |
| විකිරණ ශිල්පය | - | E |
| භෞත චිකිත්ස | - | E |
| භූගෝලීය තොරතුරු විද්‍යාව | - | E |
| සමාජ වෘතාවේදය | - | E |

## කෘෂි විද්‍යා පීඨය

වර්ෂ 1948 දී ස්ථාපිත කරනු ලැබූ කෘෂි විද්‍යා පීඨය අවුරුදු 70 ක ශාස්ත්‍රීය උරුමයක් සහ ඉතා ඉහළ අධ්‍යාපනික අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයකින් සමන්විත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කෘෂි විද්‍යා පීඨය වේ. මෙම පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 137 ක් සිටින අතර ඉන් 75% ක් පමණ ලොව වටා පිහිටි ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාලවලින් ආචාර්ය උපාධි ලබාගෙන ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් මහාචාර්යවරුන් වීමද මෙම පීඨයේ විශේෂත්වයකි. පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු අටක් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම සඳහා ඉඩකඩ ඇති , පහසුකම් සහිත පංති කාමර සහ විද්‍යාගාරවලින් සමන්විතය. පීඨය තුළ ගැටලු පදනම් කරගත් ඉගෙනුම් ප්‍රවේශයක් සිසුනට ලබා දීම සඳහා පර්යේෂණ හා ප්‍රායෝගික පුහුණුව අරමුණු කොට ගෙන මහඉලුප්පල්ලම උප ඒකකය (MI), පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය සහ බෝග පර්යේෂණ මධ්‍යස්ථානය යන යටිතල පහසුකම් ඉදිකර ඇත. අධ්‍යයන වැඩසටහන් සහ බාහිර සමාජ ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානයක් (AbC), කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයක් (AgBC) සහ කෘෂිකර්ම අධ්‍යයන ඒකකයක්ද (AEU) පීඨය තුළ ස්ථාපිත කර ඇත.

කෘෂිකර්ම උසස් අධ්‍යාපනයේ පුරෝගාමියා ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය අද්විතීය වන්නේ:

- කෘෂිකර්මය හා ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණුව මෙන්ම, සමාජ හා ආර්ථික අවබෝධය, ජීවන නිපුණතාවය අරමුණු කරගත් වෘත්තීය මාර්ගෝපදේශනය හා නායකත්ව පුහුණුව සැපයීම සඳහා ඒකාබද්ධ අධ්‍යාපනයක් ලබාදීම.
- ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර පවතින ඉතා සමීප සම්බන්ධතාවය, ශිෂ්‍යයන් මගින් ගුරුවරුන් ඇගයීමේ ක්‍රමය හඳුන්වාදීම, ප්‍රතිඵල පදනම් කරගත් ප්‍රවේශයක් සහිත ශිෂ්‍ය කේන්ද්‍රීය ස්වයං ඉගෙනුම් ක්‍රියාවලියකින් සමන්විත වීම.
- සිසුන් අතර සහයෝගීතාවය ඔපනැන්වෙන වැඩසටහන් තුළින්, නිපුණතාවය, ධනාත්මක හා තීක්ෂණ චින්තනය, කණ්ඩායම් ක්‍රියාකාරකම්, කාර්යක්ෂම අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන් හා සමාජීය දක්ෂතාවයන් යුතු උපාධිධරයන් බිහි කිරීම.
- ලොව පිළිගත් ප්‍රමුඛ විශ්වවිද්‍යාල සමග එක්ව අන්තර්ජාතික ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ලොව ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල සඳහා අප පිරිනමනු ලබන අන්තර්ජාතිකව පිළිගත් විදෙස් අධ්‍යාපන වැඩසටහන් සහ අන්තර්ජාතික සිසුන් සමග සම්බන්ධවීමට අවස්ථාව ලබා දීම.
- සෑම වසරකම කුසලතා මෙන්ම අවශ්‍යතා පදනමින් 100 කට අධික මුල්‍යමය සහන සහ ශිෂ්‍යාධාර පිරිනැමීම.
- 100% ක් සේවයේ නියුක්ත උපාධිධාරීන් බිහි කිරීම. එමෙන්ම දැනට බිහිවී ඇති කෘෂිකර්ම උපාධිධාරීන් රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනයන්වල උසස් අධ්‍යාපන, කෘෂිකර්ම පර්යේෂණ, පරිපාලන හා කළමනාකරණ යන වෘත්තීය ක්ෂේත්‍රයන්හි රැකියාවන්ගේ නියුතු ප්‍රවීණයන් වීම.
- තිරසාර සමාජ පරිවර්තන හැකියාවන්ගෙන් යුතු නායකයින් බිහි කිරීම.
- උපාධි ලබා ගැනීමෙන් පසු, අපගේ සිසුන්ට ඇමෙරිකාව, එංගලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය, නවසීලන්තය සහ යුරෝපීය රටවල පිළිගත් විශ්වවිද්‍යාල මගින් පශ්චාත් උපාධි/ ආචාර්ය උපාධි ලබාගැනීම සඳහා පුළුල් ශිෂ්‍යත්ව රැසක් ලබා ගැනීමට ඇති හැකියාව.

වැඩි විස්තර සඳහා කරුණාකර අප වෙබ් පිටුවට (http://agri.pdn.ac.lk) පිවිසෙන්න.

පීඨය ඉතිහාසය පුරාම කෘෂිකාර්මික උසස් අධ්‍යාපනයේ නව නිම් වලලු පුළුල් කිරීම සඳහා නිරන්තරයෙන්ම තම උපාධි පාඨමාලාවන් යාවත්කාලීන කිරීම සිදු කර තිබේ. ඉංග්‍රීසි භාෂාව මගින් පීඨයේ සියලු අධ්‍යයන කටයුතු සිදු කරන අතර ඉංග්‍රීසි භාෂාව පුහුණු කිරීමේ ඒකකය මගින් ශිෂ්‍යයන් හට ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

දැනට කෘෂි විද්‍යා පීඨය මගින් සිව් අවුරුදු උපාධි පාඨමාලා **3** ක් පිරිනමනු ලබයි.

අ) කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
ආ) ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය
ඇ) සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

### අ) කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය කෘෂි විද්‍යා පීඨය මගින් ලබා දෙන ප්‍රධානම උපාධි පාඨමාලාවයි. එය සමාසික අටකින් යුක්ත සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනැමෙන මෙම උපාධිය සමාසිකයන් 8 කින් හා ඒකක 126 කින් සමන්විතය. අනාගත ලෝකයේ අභියෝග ජය ගැනීම උදෙසා අවශ්‍ය ශාස්ත්‍රීය කුසලතා ඉහළම මට්ටමේ පවත්වාගෙන

යාම සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතාවයන් අනුව නිර්මාණය කර ඇති මෙම උපාධි පාඨමාලාව (i) බෝග සහ සත්ත්ව නිෂ්පාදන, (ii) කෘෂි නිෂ්පාදන සැකසුම් තාක්ෂණය, (iii) ස්වාභාවික සම්පත් තිරසාර කළමනාකරණය, (iv) සමාජ ආර්ථික සංවර්ධනය හා ව්‍යාපාර කළමනාකරණය සහ (v) වෘත්තීය, ආකල්ප හා ආත්ම විශ්වාස වර්ධනය යන පුළුල් තේමා පහක් ඔස්සේ විහිදී ඇත. ත්‍රෛභාෂා ශක්‍යතාවය මගින් නව රැකියා අවස්ථාවන් ලොව විවර කරන හෙයින් සිංහල සිසුන් සඳහා ද්‍රවිඩ භාෂාවද, ද්‍රවිඩ සිසුන් සඳහා සිංහල භාෂාවද පුහුණු කිරීමේ අවස්ථාවද මෙම පාඨමාලාව තුළ ලබා දේ.

මෙම උපාධි පාඨමාලාව විද්‍යා හා තාක්ෂණ ලෝකය මෙන්ම කළමනාකරණ ලෝකය ජය ගැනීම සඳහා සිසුනට අවශ්‍ය ප්‍රායෝගික (විද්‍යාගාර හා ක්ෂේත්‍ර) මෙන්ම සිද්ධාන්තමය දැනුම් සංරචකයන් මනා සංකලනයකින් යුක්ත පාඨමාලාවකි. උපාධි පාඨමාලාවේ විෂය මාලාව (අ) මූලික පාඨමාලාව සහ (ආ) විශේෂඥතා පාඨමාලාව යන සංරචක දෙකකින් සමන්විතය. මූලික පාඨමාලාවේදී සිසුන් හට පීඨයේ දෙපාර්තමේන්තු අට විසින්ම ඉදිරිපත් කර ඇති විෂයන් හැදෑරීමට අවස්ථාව හිමි වේ. මෙම මූලික පාඨමාලාව මගින් බහුනිපුණ සහ බහුකුසලතාවලින් පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීමට ස්ථිර අඩිතාලමක් දැමීම සිදු කෙරේ. විශේෂඥතා පාඨමාලාව තුළදී උපාධි අපේක්ෂකයන් හට දෙපාර්තමේන්තු අටකින් පිරිනමන විශේෂ මොඩියුලයන් දොළහක් ඔහුගේ හෝ ඇයගේ ස්ව කැමැත්ත මත තෝරා ගත හැකි වේ. මෙය අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව හැදෑරූ සිසු සිසුවියන්ට ඔවුන්ගේ උසස් පෙළ තුළින් අහිමි වූ විෂයයන් හැදෑරීමට හිමිවන ඉතා දුර්ලභ අවස්ථාවක් වන අතර එහිදී විවිධ වූ විෂය පථයන් ඔස්සේ ඔහුට හෝ ඇයට අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවස්ථාව හිමි වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මනා අධීක්ෂණය යටතේ අවසන් සමාසිකය තුළදී සෑම උපාධිධරයෙක්ම පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කර නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය. මෙවැනි විවිධත්වයෙන් යුතු උපාධි පාඨමාලාවක් උසස් අධ්‍යාපන අවස්ථා තුළ පැවතීම හේතුවෙන් උපාධි සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් කාර්ය ශූරත්වයෙන් හා වෘත්තීය සුදුසුකම්වලින් අග තැන්පත් වන අතර දේශීය හා විදේශීය වශයෙන් ඔවුන් කීර්තියක් අත් කරගෙන ඇත. කෘෂි තාක්ෂණ හා කළමනාකරණ උපාධියට හිමිකම් කියන උපාධිධාරීන්ගේ අනාගතය දීප්තිමත් හා අපේක්ෂා සහිත එකක් වන්නේය. ඉහත සඳහන් පරිදි පාඨමාලාවේ පුළුල් බව හා බහු ක්ෂේත්‍රමය ස්වභාවය කවර ආකාරයක හෝ වෘත්තීය ක්ෂේත්‍රයක විශිෂ්ටත්වයකින් යුතුව කටයුතු කළ හැකි සුදුසුකම් සහිත උපාධිධාරීන් බිහි කරනු ලබන අතර ඔවුන්ට විවිධ විෂය ධාරා ඔස්සේ විශිෂ්ට දැනුමක් ලබා ගැනීමේ දුර්ලභ අවස්ථාවක් සඳහා ඉඩ සළසා දී ඇත.

### ආ) ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය

ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය සමාසික අටකින් යුක්ත සිව් අවුරුදු උපාධි පාඨමාලාවකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනැමෙන මෙම උපාධිය මගින් විද්‍යාත්මක කෘෂි සැකසුම් සංකල්ප, ආහාරයේ භෞතික, රසායනික සහ සංවේදක ඇගයීම, ආහාරයේ ගුණාත්මකභාවය හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, ආහාරවල ජෛව රසායනික සහ කෘත්‍යාමය ස්වභාවය පිළිබඳ විමසීම, ආහාරවල පෝෂණ කාර්යය, මානව පෝෂණය හා මානව යහපැවැත්ම සඳහා දායකත්වය, වෘත්තීය ආකල්ප සහ විශ්වාසනීයත්වය වර්ධනය කිරීම, පුද්ගල කළමනාකරණ හැකියාව හා නායකත්ව පුහුණුව ඇති උපාධිධාරීන් බිහි කිරීම සිදු කෙරේ. ඉහත සඳහන් දැනුම, හැකියාව සහ ආකල්ප, ඒකක 126 කින් යුක්ත වූ අද්විතීය සිද්ධාන්ත දැනුම හා ප්‍රායෝගික පුහුණුව සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩලයක් මගින් සපයනු ලැබේ. සිද්ධාන්ත දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීමේදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන ක්‍රමවේදය භාවිතය නිසා ආත්ම විශ්වාසය ගොඩනැගීමත්, නවීන තාක්ෂණික විද්‍යාගාර භාවිතයට හුරු කිරීමෙන් තාක්ෂණික නිපුණතා දියුණු කිරීමත්, ආහාර ආශ්‍රිත කර්මාන්තවලට නිරාවරණය වීම මගින් එම පරිසරයන්ට සහ පරිපාලන තත්ත්වයනට ගැළ ගැසුනුඅය බිහි වීමත් සිදුවේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මනා අධීක්ෂණය යටතේ අවසන් සමාසිකය තුළදී සෑම උපාධිධරයෙක්ම පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කර නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමත් සමඟ උපාධිධරයන් දේශීය සහ විදේශීය ආහාර සහ ආහාර ආශ්‍රිත කර්මාන්ත සහ ව්‍යවසායක අංශයන් කෙරෙහි අර්ථාන්විත දායකත්වයක් දක්වනවාට කිසිදු සැකයක් නැත.

### ඇ) සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සමාසික අටක් පුරා විහිදෙන අතර එය සත්ව නිෂ්පාදනය සහ කළමනාකරණයට අමතරව මූලික කෘෂිතාක්ෂණික දැනුම, නිෂ්පාදන පිරිසැකසුම, ආර්ථික විද්‍යාව සහ කෘෂිව්‍යාප්තිය යන විෂයයන්ගෙන් සමන්විත වේ. පළමු සමාසික දෙක තුළ සියලුම සිසුන් සඳහා අනිවාර්යය පාඨමාලාවන් ඇතුළත් වේ. ඉතිරි සමාසික හය අනිවාර්ය පාඨමාලා සමඟ වෛකල්පිත පාඨමාලා ඇතුළත් වේ. මේ සමඟ සිසුනට ස්වයං අධ්‍යයන අවස්ථා බොහොමයක් ලබා දෙයි. අවසාන සමාසිකය සත්ත්ව පාලනය, මත්ස්‍ය විද්‍යාව හා අනෙකුත් අදාළ අංශවලට අදාළව පරිපූර්ණ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා වෙන් කරනු ලැබේ. මේ අතරතුර සිසුන්ට සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව ආශ්‍රිත කර්මාන්ත හා සම්බන්ධ වී අත්දැකීම් සහ යාබද වැඩ පරිසරවලට හුරු වීමට අවස්ථා ලබා දේ. උපාධි පාඨමාලාව අවසන් කළ පසු, සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව සහ නොයෙකුත් අංශ පිළිබඳව සිද්ධාන්තමය දැනුම, ප්‍රායෝගික කුසලතාවය සහ වැඩදායක ආකල්පවලින් සමන්විත උපාධිධරයෙකු බිහිවන නිසා ඔවුන්ට අධ්‍යයන, පර්යේෂණ, පරිපාලන, සැලසුම්කරණය, සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවසායකත්වයන් යන ක්ෂේත්‍රවල රැකියා ලබා ගැනීමේ අවස්ථාවන් උදාවේ.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය (Faculty of Allied Health Sciences) -**
වර්තමානය වනවිට ප්‍රථම උපාධි පාඨමාලා පහක් (05) මෙම පීඨයෙන් පිරිනැමේ.

(අ) **වෛද්‍ය රසායනාගාර විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී උපාධිය**- මෙය පෙර ලියාපදිංචි වීමේ පාඨමාලාවක් වන අතර එය සැලසුම් කර ඇත්තේ වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් බිහිකිරීම සඳහාය. ශාස්ත්‍රීය අගය 120 (120 Credits) කින් සමන්විත වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ විෂය නිර්දේශය වෛද්‍ය රසායනාගාර තාක්ෂණයන් සඳහා හොඳ විද්‍යාත්මක පදනමක් සපයන අතර ඒ තුළින් නවීන රසායනාගාර සේවාවක් මහජනතාවට සැපයීම සඳහා අවශ්‍ය හැකියාවන් දියුණුකර ගැනීමට සිසුවා යොමු කරවයි. තවද, මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ අදාල ජීව වෛද්‍ය ක්ෂේත්‍රයන්හි පවතින දැනුම ලබා ගැනීමට සිසුන් දිරි ගැන්වීම සඳහා වන අතර ඒ තුළින් සිසුන්ට රසායන පර්යේෂණවල ප්‍රතිඵල විවරණය කර ගැනීමට, වැරදි සිදුවන මූලාශ්‍ර අවබෝධ කර ගැනීමට හා ගැටළු විසඳා ගැනීමට හැකියාව ලැබේ.

(ආ) **සාත්තු සේවාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (හෙද),** ශාස්ත්‍රීය අගය 120 (120 Credits) - සාත්තු සේවාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය පෙර ලියාපදිංචි කිරීමේ උපාධි පාඨමාලාවකි. එය සැලසුම් කරන ලද්දේ පවුල් සෞඛ්‍ය සාත්තු සේවය, ළමා සාත්තු සේවය හා ප්‍රජා සෞඛ්‍ය සාත්තුව වැනි විවිධ අංශවල උසස් තත්ත්වයකින් යුතු ආරක්ෂිත හා ඵලදායී සාත්තු සේවයක් ලබාදියහැකි සාත්තු සේවා වෘත්තියේ නියැලෙන්නන් පිරිසක් බිහිකිරීම සඳහාය. මෙහි විෂය නිර්දේශය සාත්තු සේවාවේ නියැලීම සඳහා වැදගත් විද්‍යාත්මක හා මානවවාදී පදනමක් ලබාදෙයි. මෙතුළින් නිවාරණය, නඩත්තුව, රෝග සුව කිරීම, සෞඛ්‍ය පුනරුත්ථාපනය හා ප්‍රවර්ධනය හා සම්බන්ධවූ සාත්තු සත්කාරයක් ලබාදීම සඳහා අවශ්‍ය හැකියාවන් දියුණු කර ගැනීමට සිසුන් යොමු කරවයි. එමෙන්ම මෙහි සේවය දරුවන් බිහිකිරීමට සිටින කාන්තාවගේ සත්කාරය මෙන්ම ජීවිත කාලයම නියුණු හා දරුණු සෞඛ්‍ය ගැටළු වලින් පෙළෙන රෝගීන්ටද ලබාදෙයි. තවද, ඔවුන් ස්වාධීන වෘත්තිකයන් වශයෙන් සාත්තු සේවයේ නියැලීමටත් එහි දියුණුව සඳහාත්, සෞඛ්‍ය සත්කාරයේ අනෙකුත් ක්ෂේත්‍රවලට එයින් ලැබෙන ක්‍රමික දායකත්වයේ කොටස්කරුවන් වීමටත් අවශ්‍ය විශ්වාසය ලබාගනී. මෙම වැඩසටහනේ මුල් අවධියේම සාත්තු සේවා පර්යේෂණ හා සාක්ෂි මත පදනම්වූ පුහුණුවීමේ සංකල්පක්ද හඳුන්වාදෙනු ඇත. මෙහිදී වැඩි අවධානයක් යොමුකරනු ලබන්නේ උපාධි අපේක්ෂකයන් තුළ විවේචනාත්මක හා කල්පනාකාරී චින්තනය, ගැටළු විසඳීම හා සමාජ නිපුණතාවන් දියුණු කිරීමට මෙන්ම වෘත්තීය සාරධර්ම හා ආචාරශීලී නිපුණතාවන් දියුණු කිරීම සඳහාත්ය. විවිධ ආරෝග්‍යශාලාවල හා ප්‍රජා කොටස් අතර සිට ලබන පුහුණුව මත පදනම් වූ ඉගෙනුම් ක්‍රමයක් අනුගමනය කෙරේ. න්‍යායාත්මක හා පුහුණුව පදනම් කරගත් මොඩියුලර් මගින් සානුකම්පිත, සැලකිලිමත්, හැකියාවෙන් යුත්, දැඩි සුපරීක්ෂාවකින් හෙබි සාත්තුසේවා වෘත්තිකයන් බවට සිසුන් පත්කරලීම පාඨමාලාවේ අරමුණයි.

(ඇ) **කායික චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (භෞත චිකිත්ස)** - මෙම වැඩසටහනද ශාස්ත්‍රීය අගය 120 (120 Credits) කින් සමන්විත පෙර ලියාපදිංචි කිරීමේ උපාධි පාඨමාලාවකි. ශ්‍රී ලංකාවේ හෝ විදෙස් රටවල විවිධ ක්ෂේත්‍රයන්හි උසස් තත්ත්වයේ කායික චිකිත්සාවක් හා පුනරුත්ථාපනයක් සැපයීමට හැකි කායික චිකිත්සකයන් පිරිසක් බිහිකරලීම සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. සම සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රයට අයත් ශාඛාවන්වල සීඝ්‍රයෙන් වර්ධනය වන නූතන සංකල්පවලින් හා පුහුණුවකින් මෙම පාඨමාලාව සමන්විත වේ. කායික චිකිත්සාව හා පුනරුත්ථාපනය තක්සේරු කිරීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට මෙන්ම එහි ප්‍රතිඵල ඇගයීමට මෙම උපාධිධරයන්ට හැකිවනු ඇත. මෙම පාඨමාලාවෙන් මෙම උපාධිධරයන් තුළ ආරක්ෂිත චිකිත්සක පුහුණුවක් සහතික කෙරෙන අතර ඉදිරියේදී කායික චිකිත්සක ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පුහුණුවක් ලබාගැනීමටද මෙම උපාධිධරයන්ට හැකියාව ලැබේ.

(ඈ) **ඖෂධවේදය පිළිබඳ උපාධිය** - මෙයද ශාස්ත්‍රීය අගය 120 (120 Credits) කින් සමන්විත පෙර ලියාපදිංචි කිරීමේ පාඨමාලාවකි. ඖෂධවේදය සෞඛ්‍ය විද්‍යාවේ ශාඛාවකි. එහි සීමාව අමුද්‍රව්‍යවල සිට ඖෂධ නිෂ්පාදනය දක්වාත් එම ඖෂධ පරිහරණය තුළින් රෝගීන් තුළ ඇතිවන ප්‍රතික්‍රියා නිරීක්ෂණය දක්වාත් විහිදේ. ඖෂධ හා සම්බන්ධ පහත සඳහන් අංශවලට මෙය ඇතුලත් වේ. නිෂ්පාදනය, තත්ත්ව සහතිකය, එළඹුම හා සංවර්ධනය, නියාමන කටයුතු ආරෝග්‍යශාලා හා චිකිත්සන ඔසුවේදය, නීති පැනවීම හා නීති ක්‍රියාමාර්ග ගැනීම, උගතුන්, බෙදාහැරීම, වෙළඳපොළ, ප්‍රවර්ධනය, ලබාගැනීම්, ගබඩා කිරීම, ප්‍රජා සේවාව, තොරතුරු සැපයීම හා නිරීක්ෂණය යන්නයි. මෙම ශාස්ත්‍රීය අගය(Credits) 120 ක විෂය නිර්දේශය ඖෂධවේදයේ නියැලීම සඳහ විද්‍යාත්මක හා සේවය මුල්කරගත් පදනමක් සපයයි. එතුළින් උපාධිධරයන්ට වෘත්තිමය වශයෙන් සුදුසුකම්ලත් ඖෂධවේදීන් ලෙස ඖෂධවේදයේ ස්වාධීනව නියැලීමට අවශ්‍ය හැකියාවන් දියුණු කර ගැනීමට මඟපෑදෙනු ඇත. තවද, ඔවුන් ස්වාධීන වෘත්තිකයන් වශයෙන් සාත්තු සේවයේ නියැලීමටත් එහි දියුණුව සඳහාත්, සෞඛ්‍ය සත්කාරයේ අනෙකුත් ක්ෂේත්‍රවලට එයින් ලැබෙන ක්‍රමික දායකත්වයේ කොටස්කරුවන් වීමටත් අවශ්‍ය විශ්වාසය ලබාගනී. මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ස්වයං අධ්‍යයනය තුළින් දැනුම හා ප්‍රතිවේදය ලබාගැනීමට හා නව එළඹුම් කරා උපාධිධරයන් තවදුරටත් පෙලඹවීම සඳහාය. විශ්ලේෂණාත්මක නිපුණතාවන් උසස් ලෙස දියුණු කළ හා උසස් චිකිත්සක හැකියාවක් සමඟ නායකත්ව විභවතාවක් ඇති උපාධිධරයන් බිහිකිරීමද මෙම වැඩ සටහනේ ඉලක්කයකි. උපාධි අපේක්ෂකයන් තුළ විවේචනාත්මක හා කල්පනාකාරී චින්තනය, ගැටළු විසඳීම හා සමාජ නිපුණතාවන් දියුණු කිරීමට මෙන්ම වෘත්තීය, සාරධර්ම හා ආචාරශීලී නිපුණතාවන් දියුණු කිරීම සඳහාත් මෙහිදී වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත.

(ඉ) **විකිරණවේදය හා විකිරණ චිකිත්සාව පිළිබඳ විද්‍යා උපාධිය** - මෙම උපාධි පාඨමාලාවද ශාස්ත්‍රීය අගය 120 (120 Credits) කින් සමන්විත පෙර ලියාපදිංචි කිරීමේ පාඨමාලාවකි. විකිරණවේදීන් කටයුතු කරනු ලබන්නේ විකිරණ පරිහරණය වන සායනික පරිසරයකය. මෙම ඉල්ලුමක් සහිත තාක්ෂණික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයට යහපත් පුද්ගල ගුණධර්ම අවශ්‍ය වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ සංතුෂ්ටියක් සහිත නම්‍යශීලී වෘත්තියක් හිමිවේ. විකිරණවේදය සායනික පරිසරයක විද්‍යාව හා තාක්ෂණය යෙදීමට කැමැත්තක් දක්වන පුද්ගලයන්ට යෝග්‍ය වෘත්තියකි.

**ශාස්ත්‍ර පීඨය**

ප්‍රථම උපාධි වැඩසටහන: පීඨය එහි සිසුන්ට පුළුල් පදනමක් මත ප්‍රථම උපාධි අධ්‍යාපනය පිරිනමනු ලබයි. පීඨය මගින් පිරිනැමෙන ප්‍රථම උපාධි වැඩසටහන් පහත දැක්වේ.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය   2. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය   3. නීතිවේදී උපාධිය

උපාධි වැඩසටහන් පවත්වනු ලබන්නේ සමාසික ක්‍රමය මත පදනම්වූ ඉගැන්වීම් හා අඛණ්ඩ ශිෂ්‍ය ඇගයීම මතය. එක් පාඨමාලාවක් සමාසිකයක් තුළ උගන්වා පරීක්ෂණයට ලක් කෙරේ. සමාසිකයක් අධ්‍යයන වැඩ සති (15) පහළවකින් යුක්තවන අතර එක් පාඨමාලාවකට පැය (45) හතලිස් පහක් අයත් වේ.

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (සමාසික හයක් ඇතුලත්) වර්ෂ තුනක කාල පරිච්ඡේදයකින් සමන්විත වන අතර ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සහ සමාජ වෘතවේදී ගෞරව උපාධියට (සමාසික 08 ක් ඇතුළත්) වර්ෂ හතරක කාල පරිච්ඡේදයක් හිමි වේ.

**නීතිවේදී උපාධිය**

**තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය -** මෙම අත්පොතෙහි 2.2.8.10 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් පිළිගෙන ඇති පාඨමාලා ඒකක ක්‍රමයට අනුව දියුණු කරන ලද නීතිය පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි වැඩසටහනකි. අධ්‍යයන වැඩ සටහනේ ප්‍රථම වසරේදී සිසුන් නීතිවේදයේ හා තෝරාගත් සමාජ විද්‍යා පාඨමාලාවල මූලිකාංග පිළිබඳ හදාරනු ඇත. දෙවන, තෙවන හා සිව්වන වසර වලදී ජාත්‍යන්තර නීතිය, පවුල් නීතිය, නීති ක්‍රමය, අපරාධ නීතිය, ගිවිසුම් නීතිය, දේපල නීතිය ඇතුළත් නීතිවේදයේ ස්වාධීන ප්‍රදේශයන් ආවරණය කෙරෙනු ඇත. තෙවන වසරේ සිට සිසුන්ට සංස්ථාපිත නීතිය, මානව හිමිකම් හා පරිසර නීතිය, ජාත්‍යන්තර නීතිය, අපරාධ නීතිය හෝ අර්බුද නිරාකරණය පිළිබඳ විශේෂ උපාධියට සුදානම් විය හැක.

**භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය**

**තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය -** මෙම අත්පොතෙහි 2.2.8.37 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

**උපාධි වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන මෙම සිව් අවුරුදු ගෞරව උපාධි වැඩසටහන පවත්වනු ලබන්නේ සමාසික ක්‍රමයට අනුවය. මෙම වැඩසටහනෙහි ඉලක්කය වනුයේ ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන කටයුතුවලට අවශ්‍ය අවකාශීය විශ්ලේෂණ කටයුතුවලට ආධාර කළ හැකි ආකාරයේ උපාධිධාරීන් කොටසක් බිහිකිරීමය. දැනට පවතින භූගෝල විද්‍යා විශේෂ උපාධිය සඳහා ඇති පාඨමාලා කිහිපයක්, ශාස්ත්‍ර පීඨය මගින් ඉදිරිපත් කරන මූලික පාඨමාලා සහ භූගෝලීය තොරතුරු විද්‍යාව සඳහාම සකස් කළ නව පාඨමාලා කිහිපයකින් මෙම වැඩසටහන සමන්විත වේ. මෙහි ඇති බොහොමයක්ම පාඨමාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිපුණතා වැඩි දියුණු වන ආකාරයට පන්ති සහ විද්‍යාගාර හා ක්ෂේත්‍ර පදනම් කරගත් ඇගයීම්වලින් සමන්විත වේ. නිපුණතා සහ වෘත්තීය හැකියාවන් වර්ධනය සඳහා අවසාන වසරේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් උපාධි නිබන්ධනයක් කිරීම හා සීමාවාසික පුහුණුවක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

**සමාජ වෘත්තවේදී ගෞරව උපාධිය**

**තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය -** මෙම අත්පොතෙහි 2.2.1.2 කොටසෙහි සඳහන් කර ඇති පරිදි.

**උපාධි වැඩසටහන පිළිබඳ කෙටි විස්තරයක්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පිරිනමන සමාජ වෘත්තවේදී උපාධිය වසර හතරකදී සම්පූර්ණ කළ යුතු ගෞරව උපාධියක් වේ. පුද්ගල හා සමාජ ප්‍රශ්ණ නිරාකරණය කිරීම සඳහා පුද්ගලයා, පවුල, කුඩා කණ්ඩායම් සහ ප්‍රජාව වැනි සමාජ ඒකකයන් සමඟ විවිධ ආයතනික සංදර්භයන් තුළ වෘත්තීමය ලෙස ක්‍රියා කරමින් දායකවිය හැකි නිපුණතාවයකින් හා ශාක්‍යතාවයකින් යුක්ත වෘත්තිකයින් පුහුණු කිරීම මෙම පාඨමාලාවේ කේන්ද්‍රගත අරමුණ වේ. එය සමාජ විද්‍යාව, මනෝවිද්‍යාව, ආර්ථික විද්‍යාව, ප්‍රජා සෞඛ්‍ය, ප්‍රජා වෛද්‍ය වැනි පාඨමාලාවන්ගෙන් දායකව විෂයන් ද සහිතව බහු පාඨමාලා ආකෘතියකින් ඉදිරිපත් කෙරේ. ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණුව මෙම විෂයේ අනිවාර්ය අංගයක් වන අතර , සිසුන් තෙවන හා සිව්වන වසර වල දෙවන සමාසිකය පුරා කෙරෙන පූර්ණ කාලීන ක්ෂේත්‍ර පුහුණුවක් කෘතහස්ත වෘත්තිකයෙකුගේ අධීක්ෂණය යටතේ රාජ්‍ය, පුද්ගලික හෝ රාජ්‍ය නොවන ආයතනයකදී ලබා ගනු ඇත. මේ අනුව සමස්ත පාඨමාලාව මගින් සමාජ වෘත්තවේදී විෂය ආවරණය කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල වන ආකාරයේ වෘත්තීමය සේවාවක් ජාතික මෙන්ම ජාත්‍යන්තර සමාජ තලයන්හිදී සැපයීම සඳහා සිසුන් පුහුණුකර සූදානම් කිරීමක් කරනු ලබයි.

**කළමනාකරණ පීඨය**

කළමනාකරණ පීඨය විසින් එහි අධ්‍යයනාංශ පහ ඔස්සේ ගෞරව උපාධි කෙරෙහි උපස්ථම්භක වන පරිදි පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලා පිරිනමනු ලබයි. මෙම සියලු උපාධි පාඨමාලා සමාසික සහ පාඨමාලා ඒකක ක්‍රමය පදනම් කොට ගෙන පිරිනමනු ලබන අතර එක් සමාසිකයක් සති පහළොවකින් සමන්විත වේ. ඒ ඒ උපාධි පාඨමාලාව අර්ස (credits) 120 ක අගයකින් යුක්ත වන අතර පාඨමාලා කාල සීමාව සමාසික අටක් හෙවත් සිව් වසරකින් සමන්විත වේ.

1. **ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව**

   ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිරිනමනු ලබන මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව සඳහා වාණිජ විෂය ධාරාවෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති සිසුන් ඇතුළත් කරගනු ලැබේ. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස ඇතුළත් කරගනු ලබන සිසුන් හට දෑවුරුදු පොදු පාඨමාලාවක් හැදෑරිය යුතු වන අතර ඉන් පසුව තවත් අවුරුදු දෙකක් පහත සඳහන් විශේෂිකරණ ක්ෂේත්‍ර අතුරින් එකක් සිය අභිමතය පරිදි තෝරාගෙන හැදෑරිය යුතු වේ.

   - ගණකාධිකරණය සහ මූල්‍ය
   - මානව සම්පත් කළමනාකරණය
   - අලෙවි කළමනාකරණය
   - මෙහෙයුම් කළමනාකරණය
   - සංවිධාන කළමනාකරණය

2. **වාණිජවේදී (විශේෂ) උපාධි පාඨමාලාව**

මෙම ඒකාබද්ධ උපාධි පාඨමාලාව ශාස්ත්‍ර පීඨයේ අනුග්‍රාහකත්වයෙන් පිරිනමනු ලැබේ. ශාස්ත්‍ර පීඨයට ඇතුළත් කරගනු ලබන සිසුන් හට වාණිජවේදී (විශේෂ) උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස අයදුම් කළ හැකි වන අතර පළමු වසර තුළ ඔවුන් විසින් හදාරනු ලබන කළමනාකරණ විෂයයන් සඳහා ලබාගන්නා සාමාර්ථ පදනම් කොට ගෙන සුදුසුකම් ලබන සිසුන් මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ. සිසුන්ගේ අභිමතය පරිදි මෙම උපාධි පාඨමාලාව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන එක් මාධ්‍යයකින් හැදෑරිය හැකි වේ. (වාණිජවේදී විශේෂ උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන සිසුන් පළමුව ශාස්ත්‍ර පීඨයට ඇතුළත්විය යුතුය).

3. **පරිගණක සහ කළමණාකරණවේදී (විශේෂ) උපාධි පාඨමාලාව**

මෙම ඒකාබද්ධ උපාධි පාඨමාලාව විද්‍යා පීඨයේ අනුග්‍රාහකත්වයෙන් පිරිනමනු ලැබේ. පරිගණක සහ කළමනාකරණවේදී (විශේෂ) උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස විද්‍යා පීඨයට ඇතුළත් කරගනු ලබන සිසුන් හට කළමනාකරණය පිළිබඳ සංරචකයට ඇතුළත් වන විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කළමනාකරණ පීඨය විසින් පිරිනමනු ලැබේ. (පරිගණක සහ කළමනාකරණවේදී විශේෂ උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන සිසුන් පළමුව විද්‍යා පීඨයට ඇතුළත් විය යුතුය.)

**දන්ත වෛද්‍ය පීඨය -**

දන්ත වෛද්‍ය පීඨය දන්ත වෛද්‍ය උපාධියට වැදගත්වන ප්‍රථම උපාධි පාඨමාලාවක් පිරිනමනු ලබයි. මෙම පාඨමාලාවේ කාල පරිච්ඡේදය අධ්‍යයන වර්ෂ පහකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු සිදු කෙරේ. වර්තමානයේදී පීඨයට මෙම පාඨමාලාව සඳහා වසරකට සිසුන් 90 දෙනෙකු ඇතුළත් කර ගනී.

**ඉංජිනේරු පීඨය**

ඉංජිනේරු පීඨය මගින් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනැමෙන සිව් වසරක පූර්ණකාලීන ඉංජිනේරු විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් පැවැත්වේ. ප්‍රථම වර්ෂය සියලු සිසුන්ට පොදු වන අතර අවසන් වසර තුන ඉංජිනේරු විද්‍යාවේ එක් විශේෂීකරණ අංශයක් යටතේ ඉගෙනීමට වෙන් කර ඇත. එක් සමාසිකයකට සති 15 ක කාල පරිච්ඡේදයක් අයත් වන සමාසික ක්‍රමය මත පදනම් වූ පාඨමාලා ඒකක ක්‍රමය පීඨය අනුගමනය කරයි. පාඨමාලා වැඩද (රසායනාගාර, සැලසුම් හා ක්ෂේත්‍ර වැඩ) හා කාර්මික අංශයේ පුහුණුවද ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාවේ අත්‍යාවශ්‍ය කොටස් වේ. ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාව ඒකක මට්ටම් පහකින් සමන්විතය. ප්‍රථම මට්ටම් හතර පිළිවෙලින් මුල් අවුරුදු හතර නියෝජනය කරන අතර පස්වැන්නෙන් වෛකල්පිත විෂයන් සමූහයක් නියෝජනය වේ. මෙම උපාධිය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සිවිල් ඉංජිනේරු ආයතනය UK (ICE) ව්‍යුහාත්මක ඉංජිනේරු ආයතනය UK (IstructE) සහ මහාමාර්ග හා ප්‍රවාහන ආයතනය UK ඇතුළු දේශීය හා අන්තර් ජාතික වෘත්තීය සංවිධාන විසින් පිළිගනු ලැබේ.

ඉංජිනේරු විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා ඇතුළු වන සියළුම සිසුන් ප්‍රථම වසර තුළදී සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාව (GPE) හැදෑරිය යුතු වන අතර එය සතුටුදායක අයුරින් සම්පූර්ණ කරනු ලබන සිසුන්ට විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලා (SPE) සඳහා ප්‍රවේශය ලබාගත හැකිවේ. ශිෂ්‍යයා සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාවේ දැක්වූ කුසලතාවය සහ ඔහු/ ඇයගේ කැමැත්ත මත විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලාවේදී විශේෂීකරණ විෂයධාරා හයෙන් එකක් හැදෑරීමට සිසුන්ට නියම වේ. විශේෂීකරණය යටතේ පහත සඳහන් පාඨමාලාවක් හැදෑරිය හැකිය.

1. රසායනාගාර හා සැකසුම් ඉංජිනේරු ශිල්පය
2. සිවිල් ඉංජිනේරු ශිල්පය
3. පරිගණක ඉංජිනේරු ශිල්පය
4. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය
5. යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය
6. නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු ශිල්පය

සාමාන්‍ය ඉංජිනේරු පාඨමාලාවට සියළු සිසුන් හැදෑරිය යුතු පාඨමාලා ඒකක 12 ක් අඩංගු වේ. විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලාවේ විෂයන් හරවත් විෂයයන්, තාක්ෂණික වෛකල්පිත විෂයන් හා සාමාන්‍ය වෛකල්පිත විෂයන් ලෙස කාණ්ඩ තුනකට වර්ග කෙරේ.

හරවත් විෂයයන් අදාල විශේෂීකරණ විෂය ධාරාවේ සියලු සිසුන්ට අනිවාර්ය වේ. තාක්ෂණික වෛකල්පිත විෂයන් තාක්ෂණික ස්වභාවයක් ගන්නා අතර ඒවායින් හරවත් විෂයන් හෝ අභිරේකව තෝරාගත් අංශයන් වලට සම්බන්ධ විෂයන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දේ. සාමාන්‍ය වෛකල්පිත විෂයන් තාක්ෂණික ස්වභාවයක් නොගන්නා අතර ඒවායින් සිසුන්ට වෘත්තිකයෙක් මෙන්ම රටවැසියෙක් වශයෙන් ද තමන්ගේ කාර්යයන් පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගැනීමට මඟ සැලසේ.

**වෛද්‍ය පීඨය**

**උපාධි අපේක්ෂක වැඩ සටහන**

වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය විද්‍යාවේදී උපාධිය (MBBS), මෙම පීඨයෙන් පිරිනැමේ.

මෙම පාඨමාලාවේ කාලපරිච්ඡේදය වසර (05) පහක් පුරා පැතිරුණ වාර 14 කි. 2005 වසරේ සිට "වසර 2004 න් එහා" නමින් හැඳින්වෙන, සමාසිකයක් මොඩියුල පහක් මත පදනම් වූ විෂය නිර්දේශ සංශෝධනයක් පීඨය ආරම්භ කළේය. "වසර 2004 න් එහා" නම් වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විෂය නිර්දේශයට නූතන ලෝකයේ අවශ්‍යතා හා ඉල්ලුම් තහවුරු කරමින් "2003 වෛද්‍ය අධ්‍යාපනයේ ලෝක සමුළුවේදී" යෝජනා කරන ලද වෙනස්කම් ඇතුළත් කරන ලදී. මෙම නව විෂය නිර්දේශය ප්‍රථම වතාවට 2005 වර්ෂයේදී වෛද්‍ය පාසලට ඇතුළත්වූ 2004/2005 ශිෂ්‍ය කණ්ඩායමට හඳුන්වා දෙන ලදී. සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට පටහැනිවූ මෙම නව විෂය නිර්දේශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ මුල්කාලීන සායනික අදාලත්වයක්, ස්වයං අධ්‍යයනය, වෘත්තීය සංවර්ධනය හා ප්‍රජා මූලික අධ්‍යයනයක් පිළිබඳවය.

මෙම වැඩසටහන පහත සඳහන් විෂය ධාරාවන් පහකින් යුක්ත වේ.
(පළමු සමාසික 8 ක කාලය තුළ)

- SBM – වෛද්‍ය විද්‍යාවේ විද්‍යාත්මක පදනම – සායනික, රසායනාගාර කළමනාකරණ කටයුතු ඉටු කිරීමට පාදකවන දැනුම ලබාදේ.
- CLM – සායනික රසායනාගාර කළමනාකරණය – සායනික, රසායනාගාර හා රෝගී කළකමනාකරණ කුසලතා ලබාදේ.
- CLR – සන්නිවේදනය, ඉගෙනීම හා පර්යේෂණ – සන්නිවේදන කුසලතා වර්ධනය, ඉංග්‍රීසි භාෂා හැකියාව, වෙබ් පදනම් කරගත් ඉගෙනුම හා පර්යේෂණ කුසලතා දියුණු කිරීම.
- DIS – සමාජයීය වෛද්‍යවරයා – ජනගහන ගැටළු හා විවේචනාත්මක සෞඛ්‍ය ගැටළු හා සම්බන්ධ සමාජ කර්තව්‍ය පිළිබඳව වෛද්‍යවරුන් සවිබල ගැන්වීම.
- HCT – ආරෝග්‍යශාලා ප්‍රජාව පදනම් කරගත් පුහුණුව.

### විද්‍යා පීඨය

මෙම පීඨය අධ්‍යයනාංශ අටකින් සමන්විත වේ. ඒවා, උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව, භූ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්‍ෂණය, ‌ෙෂෙනික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන නම් වලින් හැඳින්වෙන අතර විද්‍යා අධ්‍යාපන ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකක නමින් ඒකක දෙකක් ද වේ. පහත වගුවේ විස්තර වනුයේ පීඨයෙන් පිරිනැමෙන උපාධි වැඩසටහන්ය.

| උපාධි වැඩසටහන | කාලය | විස්තරය |
|---|---|---|
| විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය | අවුරුදු 03 | ජීව විද්‍යා හා භෞතික විද්‍යා යන විෂයධාරා දෙකේම වැඩසටහන් පිරිනැමේ. |
| ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | අවුරුදු 04 | සිසුන්ගේ 100 හා 200 මට්ටමේ කාර්යය සාධනය සැලකිල්ලට ගෙන තරඟකාරී පදනම මත තෙවන වසර ආරම්භයේදී සීමිත සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කෙරේ. සිසුන් විශේෂ විෂයේ පාඨමාලා ඒකක හා අදාල අධ්‍යයනාංශ වලින් නිර්දේශිත පාඨමාලා ඒකක හදාරන අතර අවසන් වසරේදී පර්යේෂණ ව්‍යාපෘතියක් ද කරනු ලබයි. |
| ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | අවුරුදු 04 | සිව්වන වසරටද තමන්ගේ අධ්‍යයන පාඨමාලාව පවත්වාගෙන යෑමේ විකල්පය සිසුන්ට ලබාදී ඇත. මෙම අවස්ථාව ලැබෙනුයේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියේ අවශ්‍යතා සාර්ථකව සපුරා ඇති සිසුන්ටය. සිව්වන වසරේදී ඔවුන් ව්‍යවහාරික හා කාර්මික අංශය හා සම්බන්ධ වූ පාඨමාලා හා සති 16 ක කාර්මික අංශය හා සම්බන්ධව කටයුතු කිරීමක් සහිත කුසලතා සංවර්ධන වැඩසටහනක් අධ්‍යයනය කළ යුතු වේ. |
| සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | අවුරුදු 04 | -- |
| පරිගණනය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | අවුරුදු 04 | මෙම වැඩසටහන ශාස්ත්‍ර පීඨය හා විද්‍යා පීඨය එකතුව පිරිනමනු ලබයි. |

පීඨය උපාධි අපේක්‍ෂකයින්ට සියළු අංගෝපාංගවලින් සමන්විත විද්‍යාගාරයක්, පරිගණක හා පුස්තකාල පහසුකම් සහිත අතිවිශිෂ්ඨ අධ්‍යයන පරිසරයක් ලබාදෙයි. පීඨයේ සියළු අධ්‍යයන වැඩසටහන් අධ්‍යයන වර්ෂයේ සමාසිකයන් දෙකක් තුළ පාඨමාලා ඒකක ක්‍රමය මත 100, 200, 300 හා 400 යන මට්ටම් හතරේදී පවත්වනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වේ. නම්‍යශීලී වූ උසස් උපාධියක් ලබාදීමේ අටියෙන් සැලසුම් කළ විවිධ විෂයන් සමූහයක් පීඨයෙන් පිරිනැමේ. එනමුදු වෙනත් විෂයන් වලට වඩා විශේෂිත විෂයන් වලට ප්‍රවේශය ලබා ගැනීම සඳහා විශාල තරඟයක් පවතී.

**පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය**

පශු වෛද්‍ය විද්‍යාවේදී ගෞරව උපාධියට වැදගත්වන [BVSc(Hons)] පූර්ණ කාලීන උපාධි අපේක්ෂක පුහුණුවක් පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයෙන් පිරිනැමේ. මෙම උපාධි වැඩසටහන අධ්‍යයන වර්ෂ පහක් පුරා දිවෙන අතර එක් අධ්‍යයන වර්ෂයකට සමාසිකයන් දෙකක් ඇතුළත් වේ. සමස්ථ පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අධ්‍යනාංශ පහකින් මෙම පාඨමාලා ලබාදෙනු ඇත. (මූලික පශු විද්‍යා අංශය, පශු ව්‍යාධි ජීව විද්‍යාව අංශය, පශු සායනික විද්‍යා අංශය, පශු මහජන සෞඛ්‍ය ඖෂධ විද්‍යාව, ගොවිපළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශය) උපාධි අපේක්ෂක පුහුණුව ලබාදෙනු ලබන්නේද පශු ශික්ෂණ රෝහල හා පශු ශික්ෂණ ගොවිපළ මඟිනි. දේශන, නිබන්ධන, රසායනාගාර පුහුණුව, සායන, ක්ෂේත්‍ර නැරඹුම හා කර්මාන්ත අංශයේ පුහුණුව මඟින් උපාධි අපේක්ෂකයන් තුළ ද දැනුම ප්‍රගුණ කරවයි. බොහෝමයක් විෂයයන් සමාසිකයන් දෙකක් (වර්ෂාවසාන විෂයන්) පුරා පැතිරෙන අතර අනෙක් විෂයයන් එක් සමාසිකයකට (සමාසික අවසාන විෂයයන්) සීමා වේ. බහුවිධ සමාසික විෂයයන් වර්ෂ අවසාන පරීක්ෂණයේදී ද ඇගයීමට ලක්වන අතර තනි සමාසික විෂයයන් සමාසිකය අවසානයේදී ඇගයීමට ලක්වේ.

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භා/මා |
|---|---|---|
| කලා | - | S |
| කළමනාකරණය ¶ | - | S/E |
| කළමනාකරණ (රාජ්‍ය) විශේෂ | - | S/E |
| දේපල කළමනාකරණය හා තක්සේරුකරණය | - | S/E |
| වාණිජ්‍යය | - | S/E |
| ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS) | - | S/E |
| වෛද්‍ය විද්‍යාව | - | E |
| හෙද | - | E |
| ඖෂධ විද්‍යාව | - | E |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | E |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | - | E |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | - | E |
| ජෛවීය විද්‍යාව | - (කරුණාකර පහත බලන්න) | E* |
| භෞතීය විද්‍යාව | - (කරුණාකර පහත බලන්න) | E* |
| ඉංජිනේරු විද්‍යාව | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය(ET) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය(BST) | - | E |
| භෞතීය විද්‍යාතීය - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | - | E |

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි පාඨමාලාවල මාධ්‍යය ඉංග්‍රීසි මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

මූලික විද්‍යා විෂයයන් වන රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය යන විෂයයන් පළමු වර්ෂයේ දී පමණක්, සිංහල පැහැදිලි කිරීම් සහිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එම විෂයයන් දෙවන වර්ෂයේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක්ද, අනෙකුත් විෂයයන් පළමු වර්ෂයේ සිටම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද හැදෑරිය යුතුය.

සියළුම සිසුන් අනිවාර්ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාර්ථයක් ලබා ගැනීම, උපාධිය ලබා ගැනීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් වන්නේය.

ආහාර විද්‍යාව හා තාක්ෂණය සහ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය යන උපාධි සඳහා සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙනමම ලියාපදිංචි කරනු ලැබේ.

එම ආහාර විද්‍යාව හා තාක්ෂණය සහ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය විෂය ධාරාවට ලියාපදිංචිවන සිසුන් හැර අනෙකුත් සියළුම සිසුන් පහත සඳහන් විෂය සංකලන සහිත පාඨමාලාවක් තෝරාගත යුතුය.

සිසුන්ට ජෛවීය විද්‍යාව, භෞතීය විද්‍යාව යන පාඨමාලාවන්ට අයත් වන මතු දැක්වෙන විෂයයන් ගෙන් සමන්විත විෂය සංකලන හැදෑරීම සඳහා අවස්ථාව සලසා ඇත.

**විෂය සංකලන**

**ජෛවීය විද්‍යා විෂය ධාරාව**

| කේත අංකය | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| B01 | රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව | E |
| B02 | රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය/ ශාක ජීව විද්‍යාව/ ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E |
| B03 | රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව | E |
| B04 | රසායන විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව , ශාක ජෛව තාක්ෂණය / ශාක ජීව විද්‍යාව / ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E |
| B05 | රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය | E |
| B07 | රසායන විද්‍යාව , කළමනාකරණ විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය / ශාක ජීව විද්‍යාව / ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E |
| B08 | රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| B09 | රසායන විද්‍යාව, ආහාර විද්‍යාව, ජීව විද්‍යාව | E |
| B12 | රසායන විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, කළමනාකරණ විද්‍යාව | E |
| B13 | රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව, ජීව විද්‍යාව | E |
| B14 | රසායන විද්‍යාව, ප්‍රවේණි හා අණුක ජීව විද්‍යාව, ජීව විද්‍යාව | E |

**භෞතීය විද්‍යා විෂය ධාරාව**

| කේත අංකය | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| P01 | ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව | E |
| P02 | ගණිතය, රසායන විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව | E |
| P03 | ගණිතය, භෞතික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව | E |
| P04 | ගණිතය, රසායන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව | E |
| P05 | ගණිතය, භෞතික විද්‍යාව, කළමනාකරණ විද්‍යාව | E |
| P06 | ගණිතය, පරිගණක විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව | E |
| P07 | ගණිතය, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව | E |
| P08 | ගණිතය, සංඛ්‍යාන විද්‍යාව, ආර්ථික විද්‍යාව | E |
| P12 | ගණිතය, ව්‍යවහාරික ගණිතය, පරිගණක විද්‍යාව | E |
| P13 | ගණිතය, භෞතික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික විද්‍යාව | E |
| P14 | ගණිතය, ව්‍යවහාරික ගණිතය, කළමනාකරණ විද්‍යාව | E |
| P15 | ගණිතය, භෞතික විද්‍යාව, ආර්ථික විද්‍යාව | E |

**පොදු විෂය සංකලන**
**(ජෛවීය විද්‍යා හා භෞතීය විද්‍යා විෂය ධාරාවන් සඳහා)**

| කේත අංකය | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| C01 | රසායන විද්‍යාව, පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව, කළමනාකරණ විද්‍යාව | E |
| C02 | රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය | E |

**විද්‍යාවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව (90 Credits - SLQF Level 5)**
**BSc General Degree Program**

මෙම තුන් අවුරුදු උපාධි පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ, විවිධ ක්ෂේත්‍රවල තීරණ ගැනීමේ සහ නායකත්වය සඳහා උපාධිධාරීන් පුහුණු කිරීම අරමුණු කරගෙනය. මෙම උපාධි පාඨමාලාවලදී සියලුම සිසුන් පළමු වසර දෙක තුළදී ඔවුන් තෝරාගත් විෂයයන්වලට අදාළ මූලික ඒකක (Course Units) හැදෑරීම අත්‍යාවශ්‍ය වේ. ජාතික විද්‍යා හා තාක්ෂණ අවශ්‍යතා සහ රැකියා අවශ්‍යතා සඳහා උචිත විවිධ විෂයන් තෙවන වසරේදී හඳුන්වා දී ඇත.

**ගෞරව උපාධි පාඨමාලා (120 Credits - SLQF Level 6)**
**BSc Honours in Specializing Field, උදා: BSc Honours in Chemistry**

තෝරාගත් විෂයකට අදාළව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, පර්යේෂකයන් සහ වෘත්තීයවේදීන් වීමට අපේක්ෂා කරන සිසුන් සඳහා, සිව් වසරක ගෞරව උපාධි පාඨමාලා ඉදිරිපත් කර ඇත. මෙහිදී පළමු වසර දෙක තුළදී ඉහළ කුසලතා දක්වන සිසුන් පහත සඳහන් විෂයයන්ට අදාළ ගෞරව උපාධි පාඨමාලා සඳහා තෝරාගනු ලැබේ.

එම විෂයයන් නම් රසායන විද්‍යාව, බහු අවයවික රසායන විද්‍යාව, කර්මාන්ත රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ජලජ සම්පත් කළමනාකරණය, පරිගණක විද්‍යාව, පාරිසරික කළමනාකරණය සහ වන විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය, ශාක ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය, සංඛ්‍යාන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව වේ.

ඊට අමතරව ආහාර විද්‍යාව හා තාක්ෂණය සහ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පාඨමාලාද මේ යටතට ගැනේ.

**විස්තාරිත උපාධි පාඨමාලාව (120 Credits - SLQF Level 6)**
**BSc Honours in Applied Sciences**

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ සිසුන්ට අදාළ කර්මාන්ත සඳහා ඇතුළත් වීම ඉලක්ක කර ගෙනයි.

සාමාන්‍ය උපාධිය තුළදී ඉහළ කුසලතා දක්වන සිසුන්ට හතරවන වසරේදී මෙම ගෞරව උපාධි පාඨමාලාවට ඇතුළත් විය හැක. හතරවන වසරේ දෙවන වර්ෂාර්ධය අවසාන වන විට පහත විෂයන්ට අදාළව සහ අනිවාර්යය Inplant Training / Internship හෝ පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතුය.

එම විෂයයන්, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය (ICT), බහු අවයවික විද්‍යාව හා තාක්‍ෂණය (PST), කළමනාකරණ විද්‍යාව, ආර්ථික විද්‍යාව, ජීව විද්‍යාව, ශාක ජීව විද්‍යාව (PBT), ගණිතය, සංඛ්‍යාන විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, පාරිසරික කළමනාකරණය සහ වන විද්‍යාව (EMF), ජලජ සම්පත් කළමනාකරණය සහ සත්ත්ව විද්‍යාව වේ.

වැඩි විස්තර පහත දැක්වෙන වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.
http://science.sjp.ac.lk

**විද්‍යාවේදී භෞතික විද්‍යා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (PICT) උපාධි පාඨමාලාව**
**(90 Credits - SLQF Level 5)**

භෞතික විද්‍යා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වර්ගීකරණය යටතේ අ. පො. ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය(ICT), හැදෑරූ සිසුන්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ තුන් අවුරුදු විද්‍යාවේදී භෞතික විද්‍යා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපාධියට ඇතුළත් කෙරේ. මෙම සිසුන්ට පහත සඳහන් විෂය සංකලන එකක් හැදෑරීමට අවස්ථාව හිමිවේ.

මෙම සිසුන් පොදු විෂය ධාරාව යටතේ ගණිතය සහ භෞතික විද්‍යාව හදාරන හෙයින් කුසලතා මත ගණිතය සහ භෞතික විද්‍යාව විශේෂ උපාධිය හැදෑරීමට අවස්ථාව හිමි වන්නේය.

| **කේත අංකය** | **විෂයයන්** | **මාධ්‍යය** |
|---|---|---|
| I01 | ගණිතය, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය | E |
| I02 | ගණිතය, භෞතික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික විද්‍යාව | E |

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය**

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරණ විෂය ධාරාව හඳුන්වාදීමේ පුරෝගාමිකයා ලෙසට 1959 වර්ෂයේ දී උපාධි පාඨමාලා දෙකක් ඉදිරිපත් කරමින් බිහිවූ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය 1972 වර්ෂයේ සිට දේශීය හා ගෝලීය කළමනාකරණ විද්‍යාර්ථයන් බිහිකිරීමේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනයක් වේ. වර්තමානය වන විට කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධිත සිව් අවුරුදු පාඨමාලා 12ක් ඉදිරිපත් කරනු ලබන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ව්‍යාපාරික ලෝකයේ ශ්‍රම ඉල්ලුමට ගැලපෙන පරිදි නවීන තාක්‍ෂණික හැකියාවෙන් හෙබි උපාධිධාරීන් දැනුමෙන්, හැකියාවෙන්, කුසලතාවන්ගෙන් හා විනයෙන් යුතුව දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොල වෙත ඉදිරිපත් කරනු ලබයි.
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

**විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධි පාඨමාලාව**

වර්ෂ 1991 දී හඳුන්වාදුන් විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධි පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ, ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය රටවල රාජ්‍ය හා පෞද්ගලික සංවිධානවල ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි කළමනාකාරීත්ව තනතුරු දැරීමේ හැකියාව ඇති විචක්ෂණශීලී උපාධිධාරීන් (Resourceful Graduates) බිහි කිරීමයි. මෙම පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට අන්තර්ජාතික ගිණුම්කරණ පරිචයන් හා ගිණුම්කරණය සඳහා පරිගණක භාවිතය හා ගිණුම්කරණ පර්යේෂණ කුසලතාවයන් ඇතුළුව ගිණුම්කරණය හා සම්බන්ධ ප්‍රධාන සහ උපකාරක ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීම සිදුකරයි. තවද මෙම පාඨමාලාව තුළින් නායකත්ව හා පෞරුෂත්ව කුසලතා (Personal Capacity Skills), සන්නිවේදන කුසලතා ඇතුළු මූලික (සාමාන්‍ය) කුසලතා (Generic Skills) වැඩි දියුණු කිරීමට විශේෂ අවධානයක් යොමු කරයි. උපාධි පාඨමාලාවේ අනිවාර්ය අංගයක් වන ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ වසර දෙකක ප්‍රායෝගික පුහුණු වැඩසටහන තුළින් පුළුල් ප්‍රායෝගික පලපුරුද්දක් ලබා ගැනීමට උපාධි අපේක්‍ෂකයන්ට හැකිවන අතර එමගින් ඔවුන්ට දේශීය හා ගෝලීයව රැකියා අවස්ථා බහුලව උදාවේ. තවද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ජාතික සහ ජාත්‍යන්තර වෘත්තීය ගණකාධිකරණ ආයතන මගින් පවත්වනු ලබන විභාග වලදී විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධිය සඳහා නිදහස් කිරීම (Exemption) ලබාදෙනු ලැබේ.

**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධි පාඨමාලාව**

1959 වර්ෂයේ සිට පුරා පනස් වසරකට අධික ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රය තුළ පුරෝගාමී හා ප්‍රමුඛතම කළමනාකරණ අධ්‍යයන පාඨමාලාවක් ලෙසට ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධි පාඨමාලාව ශ්‍රී ලාංකික සිසු සිසුවියන් අතරේ පිළිගැනීමක් ඇති පාඨමාලාවකි. ව්‍යාපාර කළමනාකරණ න්‍යාය හා පරිචය සම්බන්ධයෙන් විශිෂ්ඨ නිපුණතාවයක් උපාධි

අපේක්ෂකයින්ට ලබාදෙමින් ව්‍යාපාරික ලෝකයේ නායකත්ව භූමිකාවන් සාර්ථකව ඉටු කිරීමටත්, ආචාරධර්ම සහ සමාජය ගැටලු සම්බන්ධයෙන් සංවේදීතාවක් ඇති කිරීමටත්, ගතික ව්‍යාපාරික පරිසරයට සාර්ථකව අනුගත වීමටත් ව්‍යාපාර පරිපාලන(විශේෂ) උපාධි පාඨමාලාවෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ. ව්‍යාපාර කළමනාකරණයේ මූලික හා වරණීය විෂයයන්ගෙන් මෙන්ම කළමනාකරණ සීමාවාසික පුහුණුවකින් හා පර්යේෂණ ව්‍යාපෘතියකින් උපාධි පාඨමාලාවේ විෂයමාලාව සමන්විත වේ. මෙම උපාධි පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට ව්‍යාපාර කළමනාකරණ න්‍යාය සම්බන්ධයෙන් ස්ථාවර පදනමක් මෙන්ම තත්කාලීන ව්‍යාපාර පරිචයන් සම්බන්ධයෙන් අත්දැකීම් ලබාගැනීමට අවස්ථාවන් පවතින නිසා ව්‍යාපාරික ලෝකය තුළ කළමනාකරණය සම්බන්ධ විවිධ රැකියා සඳහා යොමු වීමේ අවස්ථාව හිමිය.

## විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා)(විශේෂ) උපාධි පාඨමාලාව

ජාතික හා ගෝලීය ප්‍රවණතාවයන් තුළ කළමනාකරණ පසුබිමක් ඇති ආර්ථික විද්‍යාඥයන් සඳහා වූ ඉල්ලුම පදනම්ව වර්ෂ 2002 දී විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන(ව්‍යාපාර ආර්ථික විද්‍යා)(විශේෂ) උපාධි පාඨමාලාව ලංකාවේ කළමනාකරණ සම්බන්ධ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට පළමුවරට හඳුන්වා දෙනු ලැබීය. පර්යේෂණ, විශ්ලේෂණ, සන්නිවේදනය, කණ්ඩායම් ගතව ක්‍රියාකිරීමේ හැකියාව, ගැටලු නිරාකරණය හා තීරණ ගැනීම යන කුසලතා වර්ධනය කිරීම තුළින් ව්‍යාපාර කළමනාකරණයේ ආර්ථික විද්‍යා න්‍යායන්ගෙන් හා භාවිතයන්ගෙන් ශක්තිමත් වූ හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනයන්හි වෘත්තීමය අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන පරිදි උපාධි අපේක්ෂකයින් ජනිත කිරීම මෙම පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වේ. මෙම පාඨමාලාව ව්‍යාපාර කළමනාකරණයේ මෙන්ම ආර්ථික විද්‍යා විෂයයන්ගේ ප්‍රධාන ක්ෂේත්‍රවල සංකලනයකින් යුක්තවන අතර ව්‍යාපාර කළමනාකරණ විෂයයන්ට අමතරව ආර්ථික විද්‍යා විෂයයන් වනManagerial Economics, Financial Economics, Money & Banking, Development Economics, Econometrics, International Economics සහ Project Management යන විෂයයන්ගේ ආවරණය වේ. මෙයට අමතරව සේවා නියුක්ති හැකියාවන් වර්ධනය කිරීම සඳහා මෘදු කුසලතා(Soft Skills) සහ සන්නිවේදන හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය හා බැංකුකරණ ක්ෂේත්‍රයේත්, ඊට අමතරව ව්‍යාපාර හා ආර්ථික ප්‍රතිපත්ති සැලසුම්කරණය, විශ්ලේෂණය හා පර්යේෂණ ආදී ක්ෂේත්‍රයේත් සුවිශේෂී රැකියා අවස්ථා මෙම පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට පවතී.

## වාණිජවේදී (විශේෂ) උපාධි පාඨමාලාව

1973 වර්ෂයේ සිට පුරා දශක හතරකට වැඩි ඉතිහාසයක් සහිත සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ලෙසට හඳුන්වාදුන් වාණිජවේදී (විශේෂ) උපාධි පාඨමාලාව, වර්තමානයේ පවතින හා අනාගතයේ ඇතිවිය හැකි ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගෙන න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම උපාධි අපේක්ෂකයන්ට මනා ලෙස අවබෝධ කරගත හැකිවන පරිදි නිර්මාණය කර ඇත. කළමනාකරණ ක්ෂේත්‍රයේ පවතින තරඟකාරී රැකියා අවස්ථා සඳහා උපාධි අපේක්ෂකයින්ගේ දැනුම, හැකියාව සහ ආකල්ප වැඩි දියුණු කිරීමට වාණිජවේදී (විශේෂ) උපාධි පාඨමාලාව විවිධ විෂය ක්ෂේත්‍රයන්ගේ සංකලනයෙන් යුතුව සංවර්ධනය කර ඇති අතර විශේෂයෙන්ම ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, බැංකුකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර ගණිතය, ව්‍යාපාර සංඛ්‍යානය, අන්තර්ජාතික වෙළඳාම හා මූල්‍ය, බදුකරණය හා විගණනය යන විෂයන්ගේ දායකත්වය මෙන්ම අවසන් අධ්‍යයන වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට නියමිත පර්යේෂණ (Research) සහ ප්‍රායෝගික පුහුණුව (Internship) තුළින් මෙම පාඨමාලාව සුවිශේෂී පාඨමාලාවක් බවට පත්ව ඇත. දේශීය හා විදේශීය වෘත්තීය විභාගයන්හිදී ලැබෙන නිදහස් කිරීම් මෙම පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට හිමි වන අතර අනෙකුත් කළමනාකරණ පාඨමාලා තුළින් ආවරණය කරනු ලබන සියළුම ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ද මෙම පාඨමාලාව තුළින් ආවරණය වනු ලබන නිසා පුළුල් පරාසයක් තුළ විහිදුණු රැකියා අවස්ථා රාශියක් දේශීය හා විදේශීය වශයෙන් මෙම උපාධිධාරීන්ට විවෘතව පවතී.

## විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරුකරණ (විශේෂ) උපාධි පාඨමාලාව

1986 වර්ෂයේ දී හඳුන්වාදෙනු ලැබූ විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරුකරණ (විශේෂ) උපාධි පාඨමාලාව වර්තමානය දක්වාම දේපල කළමනාකරණ හා තක්සේරුකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන තුළ ඇති එකම උපාධි පාඨමාලාව වේ. උපාධි අපේක්ෂකයන්ට දේපල කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික නිපුණතාව ලබාදෙනු ලබන මෙම උපාධි පාඨමාලාව තුළ තක්සේරුකරණය, දේපල සංවර්ධනය හා කළමනාකරණය, නාගරික හා ප්‍රාදේශීය සැලසුම්කරණය, ඉඩම් හා අදාළ නාගරික ආර්ථික විද්‍යාව, දේපල අලෙවිකරණය, දේපල මූල්‍යනය, ස්වාධීන පර්යේෂණ වාර්තා පිළියෙළ කිරීම මෙන්ම අදාළ ආයතනයන්හි විෂයානුබද්ධ පුහුණුව ලබාදීම සිදුකරනු ලබයි. වඩාත් දියුණු පහසුකම් හා ක්‍රමවේදයන් භාවිත කරමින් තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණතාව අත්කර දෙමින් ඉහත අරමුණ ඉටුකරගැනීමට හැකිවන පරිදි උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. අදාළ පුහුණුව සපුරනු ලබන උපාධිධාරීන්ට ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා නගර සැලසුම්කරුවන්ගේ ආයතනයේ සමාජිකත්වය ලබාගත හැකිවන අතර විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරුකරණ (විශේෂ) උපාධි පාඨමාලාව එංගලන්තයේ රාජකීය තක්සේරුකරුවන්ගේ ආයතනය විසින් පිළිගත් උපාධි පාඨමාලාවක් වේ (Accredited by the Royal Institution of Chartered Surveyors- “RICS UK”). නියමිත පුහුණුව සපිරූ උපාධිධරයන්ට එම “RICS UK” ආයතනයේ සාමාජිකත්වය ලබාගත හැක. සාර්ථක උපාධිධාරීන් හට තක්සේරුකරුවන්, දේපල කළමනාකරුවන් ඇතුළු මෙම ක්ෂේත්‍රවල වෙනත් විවිධ රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශ රටවල ද ඉහළ ඉල්ලුමක් පවතී.

## විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධි පාඨමාලාව

2001 වර්ෂයේදී හඳුන්වාදුන් විද්‍යාවේදී මූල්‍ය(විශේෂ) උපාධි පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ නිරන්තරයෙන් යාවත්කාලීන වන දේශීය සහ විදේශීය මූල්‍ය වෙළඳපොළේ අභියෝගවලට මුහුණදීමට හැකියාවක් ඇති, නිපුණතාවයෙන් යුතු, රැකියාභිමුඛ මූල්‍ය උපාධිධාරීන් බිහි කිරීම වේ. මෙම උපාධි පාඨමාලාව සාංගමික මූල්‍ය (Corporate Finance), ආයෝජන හා ආයෝජන කළඹ කළමනාකරණය(Investment and Portfolio Management), ව්‍යාපාර තක්සේරුකරණ න්‍යාය හා ප්‍රායෝගික භාවිතය(Business

Valuation Theory and Application), බැංකු කළමනාකරණය (Bank Management), ජාත්‍යන්තර මූල්‍ය කළමනාකරණය (International Financial Management), අවධානම් කළමනාකරණය සහ රක්ෂණය (Risk Management and Insurance), මූර්ත දේපල මූල්‍ය (Real Estate Finance) විෂය වැනි මූල්‍ය විෂය ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශ වලට අදාළ විෂයයන්ගෙන් සංකලිත වූවකි. එමෙන්ම සිසුන්ට අවසන් වසරේදී මූල්‍ය අංශයේ ආයතනික පුහුණුව තුළින් වැඩ පරිසරයට නිරාවරණය වීමට, ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට හා විෂයානුබද්ධ දැනුම ලබාගැනීමට හැකිවන අතර මූල්‍ය ක්ෂේත්‍රයේ ස්වාධීන පර්යේෂණ අධ්‍යයන (Independent Research Study in Finance) සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතිවල (Independent Research Project in Finance) නියැලීමෙන් උපාධි අපේක්ෂකයන්ට මූල්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ හැකියාව වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසේ. මූල්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණ හා විධායක රැකියා සඳහා දේශීයවත් ගෝලීයවත් පවතින ඉල්ලුම නිසා විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිධාරීන්ට රැකියා අවස්ථා බහුල වශයෙන් පවතී.

## විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව

1994 වර්ෂයේ දී හඳුන්වාදුන් විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ මානව සම්පත් කළමනාකරණය විශේෂීකරණය කරමින් ව්‍යාපාර පරිපාලනයට අදාළ න්‍යාය හා පරිචයන්ගෙන් උපාධි අපේක්ෂකයන් සංවර්ධනය කර වැඩ ලෝකයේ විශිෂ්ටයන් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය නිවැරදි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම වේ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණතාවය, තොරතුරු තාක්ෂණයේ නිපුණතාව, සදාචාරය වර්ධනය හා මනා චරිතයක් සංවර්ධනය කිරීම මෙන්ම ආයතනයන්හි මානව සම්පත් සංවර්ධනය, ආයතනික සංවර්ධනය හා ස්වයං සංවර්ධනයට දායකත්වයක් දිය හැකි උපාධිධාරීන් මෙම උපාධි පාඨමාලාව තුළින් බිහිකිරීමට අපේක්ෂා කරනු ලබයි. අවසන් වර්ෂයේ අර්ධ වර්ෂ දෙක තුළදී උපාධි පාඨමාලාවේ අවශ්‍යතාවයක් ලෙසට පුහුණුව (Internship) ලබාදීමටත් මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ස්වාධීන පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයත් නිසා මෙම උපාධි පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂකයින්ට සංවිධාන කළමනාකරණය හා මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ මනා නිපුණතාවයක් අත්පත්කර ගැනීමට හැකිවේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විධායක හා කළමනාකරණ රැකියා අවස්ථා පදනම් කර ගනිමින් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇති අතර ව්‍යාපාරික උපදේශනය සහ ස්වයං ව්‍යවසායකත්වය යටතේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ආයතන බිහි කිරීමට ද උපාධිධාරීන්ට අවස්ථාව හිමිවේ.

## විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව

1994 වර්ෂයේ දී හඳුන්වාදුන් විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව විශිෂ්ට අලෙවි කළමනාකරණ අධ්‍යාපනයක් තුළින් දේශීය හා විදේශීය ව්‍යාපාරික අවශ්‍යතා ඉෂ්ඨ කිරීමට අවශ්‍ය අලෙවි කළමනාකරණ දැනුම, කුසලතා හා ආකල්ප උපාධි අපේක්ෂකයන් තුළ වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් ඉදිරිපත් කරන උපාධි පාඨමාලාවකි. අලෙවි කළමනාකරණයට අදාළ මනා ඉගෙනුම් පරිසරයක් තුළ ව්‍යාපාරික ආයතනවලට මෙන්ම සමස්ත සමාජයටම බලපාන ආකාරයෙන් අලෙවිකරණ කාර්යක්ෂමතාවයට හා ඵලදායකත්වයට අගයක් එකතු කළ හැකි නිර්මාණශීලී, අභියෝගශීලී හා වෙනස් කිරීමේ නියෝජිතයන් බවට පත්වීමේ හැකියාව ඇති (Change Agents) අලෙවි කළමනාකරණ උපාධිධාරීන් මෙම පාඨමාලාව තුළින් බිහිකරනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව තුළින් අලෙවි කළමනාකරණයට අදාළ න්‍යායාත්මක දැනුම මෙන්ම වෘත්තීය පරිචයේ අත්දැකීම් ලබා ගැනීමට හැකි වන පරිදි සම්පූර්ණ අලෙවි කළමනාකරණ දැනුමක් ලබා ගැනීම සඳහා මාස හයක පුහුණුවක් (Internship) සහ පර්යේෂණ වාර්තාව (Reserch Dissertation) ලබාදීම මඟින් ගතික වූ දේශීය මෙන්ම ගෝලීය ව්‍යාපාරික අවස්ථාවක් තුළින් ජනිත වන විධායක හා කළමනාකරණ රැකියා අවස්ථාවක් අත්පත්කර ගැනීමට හැකියාවක් උපාධිධාරීන්ට පවතී.

## විද්‍යාවේදී කළමනාකරණය (රාජ්‍ය) විශේෂ උපාධි පාඨමාලාව

1959 වර්ෂයේ සිට පුරා දශක පහකට අධික කාලයක් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයෙහිම කළමනාකරණ දැනුම හා දක්ෂතාවය ඇති නිපුණ උපාධිධාරීන් බිහිකිරීමට විද්‍යාවේදී කළමනාකරණය (රාජ්‍ය) විශේෂ උපාධි පාඨමාලාව හඳුන්වාදෙනු ලැබූ අතර රාජ්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ලංකාවේ ඇති එකම උපාධි පාඨමාලාව මෙම උපාධි පාඨමාලාව වේ. මෙම පාඨමාලාවේ විෂය මාලාව සඳහා අන්තර් විෂය ක්ෂේත්‍ර හා බහු විෂය ක්ෂේත්‍ර ස්වභාවයේ වූ විෂයය සංයෝජනය අඩංගු වන අතර අංග සම්පූර්ණ ප්‍රායෝගික පුහුණු උපාංගය තුළින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි වැඩ පරිසරයට උපාධි අපේක්ෂකයන් හුරු කිරීම සිදු කරනු ලැබේ. පළමු හා දෙවන වසර වලදී මෙම පාඨමාලාවේ විෂයයන් ද්විභාෂා (සිංහල හා ඉංග්‍රීසි) මාධ්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන අතර තෙවන හා සිව්වන වසර වලදී ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඉදිරිපත් කරනු ලබයි. දේශීය හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළෙහි රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානයන්හි විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීමට හැකි දැනුම, කුසලතා හා ආකල්ප පවතින නිසා ශ්‍රම වෙළඳපොළ තුළ රැකියා අවස්ථා පහසුවෙන් අත්පත් කර ගැනීමට හැකියාවක් කළමනාකරණය (රාජ්‍ය) විශේෂ උපාධිධාරීන්ට පවතී.

## විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධි පාඨමාලාව

2001 වර්ෂයේ දී හඳුන්වාදුන් විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධි පාඨමාලාව තුළින් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ සංකල්ප මෙන්ම ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ යෙදවුම් පිළිබඳ පුළුල් දැනුමක් හා හැකියාවක් ලබාදීම සිදු කරයි. එමඟින් තොරතුරු පද්ධති විශේෂීකරණයක් සහිත කළමනාකරණ ක්ෂේත්‍රයේ රැකියා සඳහා කැමැත්ත ඇති සහ විභවතාවය ඇති උපාධි අපේක්ෂකයන් සංවර්ධනය කර, ව්‍යාපාරික ලෝකයේ පවතින වර්තමාන හා අනාගත රැකියා අවස්ථා සඳහා උපාධිධාරීන් බිහි කිරීම ප්‍රධාන පරමාර්ථය වේ.

මෙම උපාධි පාඨමාලාව සුවිශේෂිත වනුයේ වාණිජ විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වන ශිෂ්‍යයන් සඳහා කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍ර දෙකෙහිම සංකලනයක් සහිත දැනුමක් ලබා දෙනු ලබන ප්‍රථම සහ

ප්‍රධානම පාඨමාලාව මෙම පාඨමාලාව වන නිසාය. කළමනාකරණය, තොරතුරු පද්ධති හා තොරතුරු තාක්‍ෂණය යන විෂය ක්ෂේත්‍රයන්හි න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම උපාධිධාරීන්ට ලබා දීමට හැකිවන අයුරින් නිර්මාණය කර ඇති මෙම උපාධි පාඨමාලාවට උපාධි අපේක්‍ෂකයන් ප්‍රායෝගික වැඩ පරිසරයට හුරුකිරීම සඳහා යෙදවුම් සංවර්ධන ව්‍යාපෘතියක් සහ සය මාසික (06) ප්‍රායෝගික පුහුණුව (Internship) අන්තර්ගත වේ. මෙම පාඨමාලාව සාර්ථකව හැදෑරීම මගින් දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශවල නිර්මාණයවන තොරතුරු පද්ධති ආශ්‍රිත සහ අනෙකුත් කළමනාකරණ රැකියා අවස්ථා පහසුවෙන් අත්පත්කර ගැනීමට අදාළ උපාධිධාරීන්ට හැකි වන අතර, මෘදුකාංග සංවර්ධන ක්ෂේත්‍රයේ ව්‍යවසායකයන් ලෙසට නව ව්‍යාපාර ආරම්භ කිරීමට ද ඔවුන්ට හැකියාව ලැබේ.

## විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්‍ෂණ කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව

2008 වර්ෂයේ දී හඳුන්වාදෙනු ලැබූ විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්‍ෂණ කළමනාකරණය (විශේෂ) උපාධි පාඨමාලාව ප්‍රධාන පරමාර්ථය වනුයේ මෙහෙයුම් සහ තාක්‍ෂණ කළමනාකරණයට අදාළ චින්තනයන්, ගැටළු න්‍යායන් සහ කළමනාකරණ මූලධර්මයන්හි යෙදවුම් ආවරණය කරමින් නිෂ්පාදන, සේවා හා රාජ්‍ය ආයතනයන්හි මෙහෙයුම් හා තාක්‍ෂණ කළමනාකරණ දැනුම් හා හැකියාව ඇති උපාධිධාරීන් බිහි කිරීමය. සාර්ථක කළමනාකරුවෙකු වීමට අවැසි න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණු වැඩසටහන තුළින් උපාධි අපේක්‍ෂකයන්ට ව්‍යාපාරික ලෝකය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට හැකියාවක් ඇති අතර ගැටළු විසඳීමේ නිපුනතාවය, විශ්ලේෂනාත්මකව සිතීමේ හැකියාව, සන්නිවේදන නිපුනතාවය සහ අති නවීන තාක්‍ෂණ සහ කළමනාකරණ මූලධර්ම භාවිතය වර්ධනය කරනු ලබයි. දේශීය මෙන්ම ගෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ නිෂ්පාදන, සේවා හා රාජ්‍ය යන අංශවල පවතින විධායක හා කළමනාකරණ රැකියා අවස්ථා පහසුවෙන් අත්පත් කර ගැනීමට මෙම උපාධි පාඨමාලාව හදාරනු ලැබූ උපාධිධාරීන්ට හැකියාව පවතී.

## විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධි පාඨමාලාව

2010 වර්ෂයේදී හඳුන්වාදුන් විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධි පාඨමාලාව තුළින් ආත්ම විශ්වාසය, නිර්මාණශීලීත්වය, අවධානම් භාරගැනීම, උත්ථාන වීර්යය, ඔරොත්තුදීම, ධනාත්මක බව, උත්සහවන්ත බව, දැක්මක් සහිත බව, අවස්ථා හඹායාම, පරිසර සංවේදී බව, පූර්ව ක්‍රියාකාරී බව වැනි මූලික කුසලතාවයන් ජනිත කිරීම තුළින් උපාධි අපේක්‍ෂකයන්ගේ ව්‍යවසායකත්ව චින්තනය වර්ධනය කිරීම හා කැපවීම වර්ධනය කිරීමෙන් පුරවැසියන්ගේ ව්‍යවසායකත්ව චින්තනය හරහා "කළ හැකිය" යන ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමත්, නව ව්‍යාපාර ආරම්භ කිරීමටත්, ඒ තුළින් සේවා නියුක්ති හැකියාව සමස්තයක් ලෙසට ඉහළ දැමීමත්, අවසානයේ ජාතික ආර්ථික, සමාජ හා සුභසාධනය වර්ධනය කිරීමත් ප්‍රධාන පරමාර්ථය වේ. වෙනත් කළමනාකරණ උපාධිධාරීන්ට සාපේක්‍ෂව "රැකියා සොයන්නන්" වෙනුවට "රැකියා තනන්නන්" බවට උපාධිධාරීන් පත් කිරීම මෙම උපාධි පාඨමාලාවේ මුඛ්‍ය පරමාර්ථයක් වන අතර ක්ෂේත්‍රය තුළ ස්ථාපිත සබඳතා සහ පවත්නා සම්පත් තුළින් නව්‍ය ව්‍යාපාර ආරම්භ කිරීමට උපාධිධාරීන්ට සහය වීම මෙම උපාධි පාඨමාලාවේ වැදගත් අංගයකි. සමාජ හා ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට දායකවන්නාවූ ව්‍යවසායකයන් හා ව්‍යවසායකත්ව කළමනාකරුවන් බිහිකිරීම තුළින් වෙළඳපොල තුළ රැකියා අවස්ථා සොයනවා වෙනුවට වෙළඳපොල ජයගැනීමත්, ශ්‍රම වෙළඳපොල තුළ රැකියා අවස්ථා ජනිත කිරීමත් මෙම පාඨමාලාව හැදෑරූ උපාධිධරයන්ගෙන් අපේක්‍ෂා කරනු ලැබේ.

## ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍ර පීඨය එහි උපාධි අපේක්‍ෂකයන්ට පළල් මට්ටමක පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. පීඨය මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය
2. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

සාමාන්‍ය උපාධි පාඨමාලාව වසර 03 ක් වන අතර විශේෂ උපාධි පාඨමාලාව වසර 04 කි.

පහත සඳහන් විෂයයන් විශේෂ උපාධි පාඨමාලාවලට ඇතුළත් වේ.

අපරාධ විද්‍යාව සහ මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, ඉතිහාසය, ජනසන්නිවේදනය, දර්ශනය හා මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, නර්තනය, පාලි, පුරා විද්‍යාව, බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ඨාචාරය, භූගෝල විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය, සංගීතය, සංස්කෘත, සමාජ විද්‍යාව, සමාජ සංඛ්‍යානය, සිංහල, හින්දි.

පහත සඳහන් විෂයයන් සාමාන්‍ය උපාධි පාඨමාලාවලට ඇතුළත්වේ.

අපරාධ විද්‍යාව සහ මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, ඉතිහාසය, ජනසන්නිවේදනය, කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය, දර්ශනය හා මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, නර්තනය, පාලි, පුරා විද්‍යාව, ප්‍රංශ භාෂාව, බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ඨාචාරය, භූගෝල විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය, සංගීතය, සංස්කෘත, සමාජ විද්‍යාව, සමාජ සංඛ්‍යානය, සිංහල, හින්දි. උපාධි පාඨමාලා අර්ධ වාර්ෂික පදනම මත ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. විභාග අඛණ්ඩව ඇගයීම් සහ අර්ධ වාර්ෂිකය අවසානයේ පවත්වනු ලබන විභාග යන ක්‍රම දෙකක් යටතේ සිදු කෙරේ. සති 15 කින් සමන්විත අර්ධ වාර්ෂිකයක් තුළ සෑම පාඨමාලාවක්ම උගන්වනු ලබන අතර එකිනෙක පාඨමාලාවන් සඳහා පැය 45 ක කාලයක් වෙන්වේ.

සෑම උපාධි අපේක්‍ෂකයෙකුම ඉංග්‍රීසි, ශ්‍රී ලංකා සමාජය සහ බෞද්ධ සංස්කෘතිය, සම්මත සිංහල ව්‍යවහාරය යන අනිවාර්ය පාඨමාලා හැදෑරිය යුතුය. ඊට අමතරව, ඉංග්‍රීසි, තොරතුරු තාක්‍ෂණය, කළමනාකරණය පිළිබඳ මූලිකාංග සහ ජපන් භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම්ද සලසා තිබේ. සමහර පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලැබේ.

**තාක්ෂණ පීඨය**

ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථමයෙන් හඳුන්වාදෙනු ලැබූ අංග සම්පූර්ණ තාක්ෂණ පීඨය 2016 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ ස්ථාපනය කරන ලදී.

තාක්ෂණ පීඨය මගින් පූර්ණ කාලීන ගෞරව උපාධි අධ්‍යයන පාඨමාලා තුනක් අ. පො. ස (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරූ සිසුන් සඳහා පමණක්ම පවත්වනු ලබන අතර ඒවායේ භාෂා මාධ්‍යය ඉංග්‍රීසි වේ. එම පාඨමාලා නම්,

I. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය [BET(Hons)]
II. ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය [BBST(Hons)]
III. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය [BICT(Hons)]

මෙම පීඨය මගින් පවත්වනු ලබන ගෞරව උපාධි පාඨමාලාවන් වසර හතරක් තුළ පවත්වාගෙන යනු ලබන අතර, ප්‍රථම වසර එනම් පළමුවන සහ දෙවන වර්ෂාර්ධයන් පදනම් වසර ලෙස හැඳින්වේ. ඉතිරි වර්ෂාර්ධ 6 න් එක් වර්ෂාර්ධයක් කාර්මික පුහුණුව සඳහා වෙන් කර ඇත.

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව [BET(Hons)] උපාධි පාඨමාලාව ප්‍රධාන ක්ෂේත්‍ර 7 කින් යුක්ත වේ.

(අ) බලශක්ති හා පාරිසරික තාක්ෂණවේදය
(ආ) මෙකාට්‍රොනික් තාක්ෂණවේදය
(ඇ) ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය
(ඈ) ප්‍රරා තාක්ෂණවේදය
(ඉ) මෝටර් රථ තාක්ෂණවේදය
(ඊ) බහුඅවයවික තාක්ෂණවේදය
(උ) භූ පද්ධති සහ සැකසුම් තාක්ෂණවේදය

ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව [BBST(Hons)] උපාධි පාඨමාලාව ප්‍රධාන ක්ෂේත්‍ර 3 කින් යුක්ත වේ.

(අ) ආහාර සැකසුම් තාක්ෂණවේදය
(ආ) කෘෂිකර්ම හා පාරිසරික තාක්ෂණවේදය
(ඇ) කාර්මික ජෛව තාක්ෂණවේදය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව [BICT(Hons)] උපාධි පාඨමාලාව ප්‍රධාන ක්ෂේත්‍ර 3 කින් යුක්ත වේ.

(අ) බහු මාධ්‍ය තාක්ෂණවේදය
(ආ) ජාල තාක්ෂණවේදය
(ඇ) මෘදුකාංග තාක්ෂණවේදය

**ඉංජිනේරු පීඨය**

**ඉංජිනේරු විද්‍යාවේදී උපාධි පාඨමාලාව**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු පීඨය මගින් ප්‍රදානය කරනු ලබන ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය වසර හතරක පාඨමාලා කාලයකින් යුක්තය. මෙම උපාධි පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගනු ලබන්නේ, ඉංජිනේරු විද්‍යා කාණ්ඩය යටතේය. මෙම උපාධි වැඩසටහන අධ්‍යයන වර්ෂාර්ධ අටකින් (8) සමන්විත වන අතර, ප්‍රථම වර්ෂාර්ධ දෙක (2) සෑම සිසුවෙකු හටම පොදු වර්ෂාර්ධ ලෙස ක්‍රියාත්මක වේ. එක් වර්ෂාර්ධයක් සති විස්සක (20) කාල පරාසයක් තුල ක්‍රියාත්මක වන අතර, මෙම කාලයට සිසුන්ගේ පරීක්ෂණ/ඇගයීම් කාලයන්ද ඇතුලත්ය. දෙවන වර්ෂාර්ධය අවසානයේදී එක් එක් සිසුවාගේ කැමැත්ත සහ පළමු වසර අධ්‍යයන කුසලතා මත ශිෂ්‍යයින් විෂය ක්ෂේත්‍ර මාලා හතර (4) සඳහා වෙන් වෙන්ව තෝරාගනු ලැබේ. විශේෂිත විෂය මාලා සඳහා නිර්දේශිත ප්‍රධාන විෂය 'ක්ෂේත්‍රයන් වන්නේ;

(i) සිවිල් ඉංජිනේරු
(ii) පරිගණක ඉංජිනේරු
(iii) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු
(iv) යාන්ත්‍රික ඉංජිනේරු

පස්වන (5) වර්ෂාර්ධයේ සිට ශිෂ්‍යයින් ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අනුබද්ධිත සහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවයනට අදාල 'අනු විෂය ක්ෂේත්‍ර' විෂයයන් හැදෑරීමටද අවස්ථාව ලබාදෙනු ඇත. 'අනු විෂය ක්ෂේත්‍ර' විෂයයන් හැදෑරීමට ඇති සීමිත අවස්ථා සඳහා තෝරා ගැනීම, සිසුන්ගේ පළමු සහ දෙවන වසර තුල දක්වන්නා වූ අධ්‍යයන කුසලතාවය සහ එක් එක් සිසුවාගේ කැමැත්ත පරිදි වේ. දැනට සිසුන්ට තෝරාගත හැකි 'අනු විෂය ක්ෂේත්‍ර' විෂයයන් වන්නේ

(i) ජෛව වෛද්‍ය ඉංජිනේරු (Biomedical Engineering)
(ii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු (Bulding Service Engineering)
(iii) පාරිසරික ඉංජිනේරු (Environmental Engineering)
(iv) දත්ත කළමනාකරණය (Data Management)
(v) අධි කාර්යය ඵල පරිගණක භාවිතය (High Performance Computing)
(vi) මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු (Mechatronics Engineering)
(vii) නිෂ්පාදන ඉංජිනේරු (Manufacturing Engineering)
(viii) සන්නිවේදන ඉංජිනේරු (Telecommunication Engineering)
(ix) මෘදුකාංග ඉංජිනේරු (Software Engineering)
(x) ව්‍යුහාත්මක ඉංජිනේරු (Structural Engineering)
(xi) ප්‍රවාහන ඉංජිනේරු (Transportation Engineering)

සැම ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් සඳහා වූ විෂය මාලා මනා අධ්‍යානයකින් පසු දේශීය හා අන්තර් ජාතික ඉංජිනේරු අධ්‍යයන ප්‍රමිතින්ට අනුකූලව සහ සිසුන්ට, තමන්ට හැදෑරිය හැකි අන්දමේ අධ්‍යයන කටයුතු වලින් සමන්විත වන පරිදි සකසා ඇත.

**වෛද්‍ය විද්‍යා පීඨය**

**වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය**

වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය වසර 5 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. මෙම පාඨමාලාව අදියර තුනකට බෙදා ඇත. සායනික පුහුණුව තුන්වන වසර අධ්‍යයන වර්ෂයේ ආරම්භ වන අතර අවසන් වසර තුළ ඉගෙනීම සම්පූර්ණයෙන්ම රෝහල් මූලික කරගෙන පැවැත්වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

**විද්‍යාවේදී මානව ජීව විද්‍යා උපාධිය**

විද්‍යාවේදී මානව ජීව විද්‍යා උපාධිය වසර තුන හමාරක පාඨමාලාවකි. විද්‍යා පීඨයේ ජීව විද්‍යා විෂය ධාරාවේ පළමු වසර සම්පූර්ණ කළ සිසුන්ට පමණක් මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

**විද්‍යාවේදී හෙද උපාධිය**

විද්‍යාවේදී හෙද උපාධිය ශාස්ත්‍රීය අගය 120 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. රෝහල් පදනම් කරගත් සායනික හෙද පුහුණුව පළමු වසරේ සිට ආරම්භ වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

**විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය**

විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය ශාස්ත්‍රීය අගය 120 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. රෝහල් පදනම් කරගත් රසායනාගාර පුහුණුව දෙවන වසර යටතේ ආරම්භ වන අතර උපාධි පාඨමාලාවට පර්යේෂණ ව්‍යාපෘතියක් ද ඇතුළත් වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

**ඖෂධවේදී උපාධිය**

ඖෂධවේදී උපාධි පාඨමාලාවේ උපාධිය ශාස්ත්‍රීය අගය 120 ක පාඨමාලාවක් වන අතර එක් අධ්‍යයන වර්ෂයක් සති 10 කින් යුත් වාර තුනකින් සමන්විත වේ. උපාධි පාඨමාලාවට ඉගැන්වීම්, ප්‍රායෝගික පන්ති සහ පර්යේෂණ ව්‍යාපෘති මෙන්ම රාජ්‍ය අංශයේ ආයතන මගින් සපයනු ලබන ප්‍රායෝගික පුහුණුවක් ද ඇතුළත් වේ. මුළු අධ්‍යයන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

## කැලණිය විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භා/මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කථන හා ශ්‍රවණ විද්‍යා | - | E |
| කලා | - | S |
| සාමය හා ගැටුම් නිරාකරණය | - | E |
| කළමනාකරණය | - | S/E |
| වාණිජ්‍යය | - | S/E |
| කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MIT) | - | E |
| ජෛවීය විද්‍යාව | - | E* |
| භෞතීය විද්‍යාව | - | E* |
| පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | - | E |
| පරිවර්තන අධ්‍යයනය | - | E/S |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | - | E |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | - | S |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |
| භෞතිය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | - | E |
| ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) | - | E |
| පරිගණක විද්‍යාව | - | E |
| මූලා ඉංජිනේරුකරණය | - | E |

* පළමු වසරේ පළමු සමාසිකයේ දී පාඨමාලා සිංහල / ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර දෙවන සමාසිකයේ සිට පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

පාඨමාලා පරීක්ෂණවලින් අවසන්වන සමාසික දෙකක් ඇතුළත් අධ්‍යයන වර්ෂයක් තුළ පාඨමාලා ඒකක ක්‍රමය මත එනම් අධ්‍යයන ඒකක ක්‍රමය මත කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක වේ. විෂයයන් තෝරා ගැනීම සඳහා උපරිම නම්‍යශීලීතාවය සැලසීමේ අරමුණු ඇතිව විවිධ පාඨමාලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබයි.

පාඨමාලා ඒකකයක් යනු අධ්‍යයන ඒකක වටිනාකමක් ඇති විෂය මොඩියුලයකි. අධ්‍යයන ඒකකයක් යනු සාමාන්‍ය ලකුණු ප්‍රමාණය ගණන් බැලීමේ දී භාවිත කරනු ලබන කාලය මත පදනම් වූ ප්‍රමාණාත්මක මිම්මකි. ස්තර හතරකින් එනම් 1වැනි 2වැනි 3වැනි සහ 4 වැනි ස්තර වශයෙන් පාඨමාලා මොඩියුල සංවිධානය කරනු ලැබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරන සිසුන් විසින් පාඨමාලා මොඩියුල 1, 2 සහ 3 යන ස්තර හැදෑරිය යුතුය. වෛකල්පිත සහ / හෝ අතිරේක පාඨමාලා ඒකක සමග විෂය සංයෝජන තුනක් හෝ වෛකල්පිත සහ / හෝ අතිරේක පාඨමාලා ඒකක සමග විෂයය සංයෝජන දෙකක් හෝ ඇත. මේ හැරුණුවිට, සියලුම ශිෂ්‍යයන් විසින් යම් විෂය ධාරාවක සියලුම අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරිය යුතුය. අනෙකුත් පීඨවලින් අධ්‍යයන වාරයකට අධ්‍යයන ඒකක දෙකකට නොවැඩිව උපරිම අධ්‍යයන ඒකක 6ක් දක්වා ශිෂ්‍යයෙකුට පාඨමාලා ඒකකයක් හැදෑරිය හැකිය. එක් එක් වර්ෂයකට ශිෂ්‍යයෙකු අවම වශයෙන් අධ්‍යයන ඒකක 30 ක පාඨමාලා ඒකක හැදෑරිය යුතුය.

තුන් වසරක සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ සමුච්චිතව ඇති සියලුම අධ්‍යයන ඒකක උපාධිය පිරිනැමීම සඳහා සලකා බලනු ලැබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධි පාඨමාලා මානවශාස්ත්‍ර හා සමාජය විද්‍යා පීඨ දෙක මගින් පවත්වාගෙන යනු ලැබේ. කලා උපාධි පාඨමාලා සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පසු අ.පො.ස. (උසස් පෙළ) සඳහා හදාරනු ලැබූ විෂයයන් සහ Z-Score අගය පදනම් කරගෙන පීඨ දෙකට සිසුන් වෙන් කරනු ලැබේ. ශිෂ්‍යයා අයත් වන පීඨයෙන් උපාධිය සඳහා අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගැනීම අනිවාර්ය වේ.

### මානවශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි හා විශේෂ/ ගෞරව උපාධි සඳහා පහත සඳහන් විෂයන් ඉදිරිපත් කෙරේ.

| | | |
|---|---|---|
| ඉංග්‍රීසි අධ්‍යයනාංශය | - | ඉංග්‍රීසි |
| නූතන භාෂා අධ්‍යයනාංශය | - | චීන, ප්‍රංශ, ජර්මන්, ජපන්, රුසියන්, කොරියන් |
| පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | - | පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ මනෝවිද්‍යාව |
| බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයනාංශය | - | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය (ග්‍රීක සහ රෝම සංස්කෘතිය), ක්‍රිස්තියානි සංස්කෘතිය |
| ලලිත කලා අධ්‍යයනාංශය | - | දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය (චිත්‍ර සහ ග්‍රැෆික්) |
| | - | ප්‍රාසංගික කලා (සංගීතය සහ නර්තනය) |
| | - | **ප්‍රතිබිම්බ කලා (ඡායාරූපකරණය), සිනමා සහ රූපවාහිනී අධ්‍යයනය** |
| | - | නාට්‍ය හා රංග කලාව |

| | | |
|---|---|---|
| වාග් විද්‍යා අධ්‍යයනාංශය | - | වාග් විද්‍යාව, භාෂා පරිවර්තන ක්‍රම * |
| | - | දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව * |
| සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය | - | සංස්කෘත, වාස්තු විද්‍යාව, හින්දු දර්ශනය |
| සිංහල අධ්‍යයනාංශය | - | සිංහල, සාහිත්‍ය විචාරය |
| හින්දි අධ්‍යයනාංශය | - | හින්දි |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය | - | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම |

*** පරිවර්තන ක්‍රම සහ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව යන විෂයන් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා පමණක් ඉදිරිපත් කෙරේ.**

**මානවශාස්ත්‍ර පීඨයේ විෂයන් තෝරා ගැනීමේදී පූර්ව අවශ්‍යතා වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණ කර තිබිය යුතුය.**

- ❖ ප්‍රාසංගික කලා (සංගීතය/නර්තනය) විෂයන් හැදෑරීම සඳහා අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් එම විෂයය සමත් වීම.
- ❖ ඉංග්‍රීසි විෂයය හැදෑරීම සඳහා අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් එම විෂය සඳහා අවම වශයෙන් S සාමර්ථ්‍යක් ලබා තිබීම
- ❖ ප්‍රංශ සහ ජපන් භාෂාව හැදෑරීම සඳහා අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් එම විෂයන් සමත් වී තිබීම හෝ අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.
- ❖ භාෂා පරිවර්තන ක්‍රම සහ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව යන විෂයයන් හැදෑරීම සඳහා අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.
- ❖ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) හැදෑරීම සඳහා අ.පො.ස. (උ.පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් S සාමර්ථ්‍යක් ලබා තිබීම.

  අනෙකුත් විෂයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත.

**සමාජීය විද්‍යා පීඨය**

1. **ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව** - මෙම පීඨය මගින් ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ජාත්‍යන්තර අධ්‍යයනය, සමාජ සංඛ්‍යානය, පුරාවිද්‍යාව, ඉතිහාසය, මනෝ විද්‍යාව, භූගෝල විද්‍යාව, දර්ශනය, සංවර්ධන අධ්‍යයනය, ජනසන්නිවේදනය, පුස්තකාල හා විඥාපන විද්‍යාව, සංචාරනය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය, මානව විද්‍යාව, ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය, සමාජ විද්‍යාව සහ මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය යන විෂයයන්.
2. **සාමය හා ගැටුම් නිරාකරණ ගෞරව උපාධි පාඨමාලාව** - සිව් අවුරුදු කලා උපාධියන් සඳහා පවත්වාගෙන යනු ලබන මෙම පාඨමාලාවට අ.පො.ස (උ.පෙ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම සුදුසුකම් සපුරාලූ අපේක්ෂකයන්ට අයදුම් කළ හැකිය. මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.
3. **ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව** - ඉහත (1) හි පුස්තකාල හා විඥාපන විද්‍යාව හා මානව විද්‍යාව යන විෂයයන් හැර ඉතිරි සියලු විෂයයන්.
4. **ජාත්‍යන්තර අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව** ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

සමාජීය විද්‍යා පීඨයේ විෂයයන් තෝරා ගැනීමේදී පූර්ව අවශ්‍යතා වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණ කර තිබිය යුතුය.

1. සමාජ සංඛ්‍යානය විෂය සඳහා අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් ගණිතය විෂයට සම්මාන සාමාර්ථ ලබා තිබීම.
2. භූගෝල විද්‍යා විෂය සඳහා අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් එම විෂය සමත් වී තිබීම.

අනෙකුත් විෂයයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත.

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා යන පීඨ දෙක මගින් ඉදිරිපත් කරන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ 3 කින් ද ශාස්ත්‍රවේදී විශේෂ/ ගෞරව උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ 4 කින්ද සමන්විත වේ.

එක් අධ්‍යයන වර්ෂයක් අධ්‍යයන වාර 2 කින් හෙවත් අර්ධ වාර්ෂික දෙකකින් සමන්විත වන අතර එම අධ්‍යයන වාරයක් සති 15 කින් සමන්විත වේ. ශාස්ත්‍රවේදී හා විශේෂ / ගෞරව උපාධි පාඨමාලා විෂය ඒකක ක්‍රමය මත පදනම් වේ. විෂය ඒකකයක් යනු නිසියම් අධ්‍යයන සම්භාර(Credit) වටිනාකමක් ඇති විෂයය කොටසකි.

උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට නියමිත අධ්‍යයන සම්භාර (Credit) ප්‍රමාණයක් ඇත. එම ප්‍රමාණය ඇතුළත් වන පරිදි පාඨමාලා ඒකක තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට අවකාශය ලැබේ.

ප්‍රධාන විෂයයන් 2 ක ධාරාව යටතේ හෝ ප්‍රධාන විෂයයන් 3 ක ධාරාව යටතේ ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරීමට හැකියාව ඇත. තම විෂය සංකලනයේ අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීමට අතිරේකව, මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන සහ විද්‍යා යන සෙසු පීඨයන් මගින් ඉදිරිපත් කරනු ලබන ඇතැම් පාඨමාලා ඒකක ද තම රුචිය පරිදි තෝරා ගෙන හැදෑරීමට මෙම ක්‍රමය මගින් අවකාශ සලසා තිබේ.

ශාස්ත්‍රවේදී විශේෂ/ ගෞරව උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රථම වසර අවසාන පරීක්ෂණයෙන් ඉහළ සාමර්ථ්‍යක් ලබා ගත යුතුය.

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටි සිසුන් සඳහා සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ. පිරිනමනු ලබන උපාධි පාඨමාලාවන් වනුයේ වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය, ව්‍යාපාර කළමනාකරණ මානව සම්පත් කළමනාකරණ විශේෂ උපාධිය, ව්‍යාපාර කළමනාකරණ ගණකාධිකරණ විශේෂ උපාධිය, ව්‍යාපාර කළමනාකරණ අලෙවිකරණ විශේෂ උපාධිය සහ ව්‍යාපාර කළමනාකරණ මූල්‍ය විශේෂ උපාධිය යි. වාණිජ විද්‍යා උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සිසුන් වාණිජ හා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවට සෘජුවම අනුයුක්ත කෙරෙන අතර කළමනාකරණ සිසුන් අනෙකුත් දෙපාර්තමේන්තු මගින් පවත්වන පාඨමාලා සඳහා තෝරා ගනු ලබන පදනම ඔවුන්ගේ Z - අගය, කැමැත්ත සහ ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුලත්වන ප්‍රදේශය මතය.

## වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව

නූතන ලෝකයේ ව්‍යාපාර සංවිධාන බහුල වශයෙන් තොරතුරු තාක්ෂණයේ බලපෑමට ලක්ව ඇති අතර එමගින් මෙතෙක් පැවති සාම්ප්‍රදායික ව්‍යාපාර ක්‍රියාවලි වෙනුවට විද්‍යුත් ව්‍යාපාරකරණය, විද්‍යුත් වාණිජය, විද්‍යුත් මූල්‍යකරණය, විද්‍යුත් අලෙවිකරණය සහ ව්‍යාපාරික සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධති භාවිතය දක්වා ප්‍රබල වශයෙන් නැඹුරු වී ඇත. මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ මෙවන් නූතන ව්‍යාපාර සංවිධානවල අභියෝග වලට මුහුණදීමට සහ නූතන ව්‍යාපාරික ලෝකයේ පවතින අවස්ථා හඳුනාගෙන තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප වලින් සන්නද්ධ වෘත්තීමය නිපුණත්වයෙන් ගෙබී උපාධිධරයෙකු බිහි කිරීමයි. නූතන ව්‍යාපාර ලෝකයේ පවතින විකල්ප අංශ කෙරෙහි ශිෂ්‍යයින්ගේ ඇති කැමැත්ත තෘප්තිමත් කිරීම සඳහා, වාණිජ හා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයන පාඨමාලා හතරක් (4) හඳුන්වා දී ඇත.

- වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලව
- වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යවසායකත්ව උපාධි පාඨමාලාව
- වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යාපාර තාක්ෂණය උපාධි පාඨමාලාව
- වාණිජ විද්‍යාවේදී විශේෂ මූල්‍ය කළමනාකරණ උපාධි පාඨමාලාව

උපාධි පාඨමාලාවන් හතර (4) සඳහාම පළමු වසර දෙක (2) පොදු වන අතර සිසුනට ඔවුන්ගේ තෝරා ගත් අංශ මගින් විශේෂීකරණය වීමට තෙවන වසර සිට අවස්ථාව ලැබේ. තෙවන වසර ආරම්භයත් සමඟ අධ්‍යයනාංශ විසින් සිසුන් අදාළ උපාධි පාඨමාලාවන්ට බෙදා වෙන් කරනු ලබන අතර එය සිදුකරනු ලබන්නේ පෙර තීරණය කරගත් විධිමත් තීරණ උපමානයන් අනුව වේ. සෑම වසර හතරකට (4) වරක් සියලුම විෂය නිර්දේශයන් යාවත්කාලීන කරනු ලබන අතර සෑම උපාධි පාඨමාලාවක්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. සිව්වන වසරේදී සිසුන් ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රය අනුව ප්‍රායෝගික පුහුණුවකට යොමු කරන අතර, එම කාලය තුළ දිවා කාලයේ දේශනවලින් නිදහස් කරනු ලබයි.

## වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව

වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව පුළුල් වාණිජ විෂය ක්ෂේත්‍රයන් රැසක් ආවරණය වන පරිදි ගොඩනගා ඇත. වාණිජ හා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික හා න්‍යායික පරිචයන්ගේ දැනුම ලබා ගත හැකි පරිදි විෂය ක්ෂේත්‍රය සකසා ඇති අතර, එමගින් දේශීය හා විදේශීය තරඟකාරීත්ව ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය වන වෘත්තිකයන් බිහි කිරීම අපේක්ෂා කෙරේ.

## වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යවසායකත්ව උපාධි පාඨමාලාව

වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යවසායකත්ව උපාධි පාඨමාලාව ගොඩනගා ඇත්තේ ශ්‍රී ලංකාවේ නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමටත් ක්‍රියාවෙහි යෙදවීමටත් ඒ තුළින් තනි පුද්ගල හා සංස්ථාපනික ව්‍යවසායකත්ව සංස්කෘතියක් ප්‍රචලිත කිරීමටත් ය. මෙම අවකාශය තවත් පුළුල් කරමින්, මෙම අධ්‍යයන පාඨමාලාව නව ව්‍යාපාර ආරම්භ කිරීමේ ක්‍රියාවලිය හා සංස්ථාපිත සංස්ථාපනික නායකයන් ලෙසින් විශාල ව්‍යවසායකත්ව සමාගම් කළමනාකරණය කිරීමත් පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම් හැකියාවන් සිසුනට ලබාදේ.

## වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යාපාර තාක්ෂණය උපාධි පාඨමාලාව

වර්තමාන ව්‍යාපාරික ලෝකය තාක්ෂණය හා නිතැතින්ම බැඳී පවතී. මෙම සබැඳි පවතින විද්‍යුත් වාණිජ්‍ය, විද්‍යුත් ව්‍යාපාරකරණය, විද්‍යුත් අලෙවිකරණය, ව්‍යාපාර විශ්ලේෂණය, නවෝත්පාදන හා නව නිෂ්පාදන බිහිකිරීම, සැපයුම්දාම කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා දේශීයව හා ජාත්‍යන්තරව ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. ඒ හා අනුගත වෙමින් ශ්‍රී ලංකාවේ නූතන ව්‍යාපාර උපාධියකට අවශ්‍ය සියලුම නිපුනතා කරුණු ගෙනහැර දක්වන උපාධි පාඨමාලාවක් ලෙස වාණිජ විද්‍යාවේදී විශේෂ ව්‍යාපාර තාක්ෂණ ය උපාධි පාඨමාලාව හැඳින්විය හැකිය. එම නිසා මෙම උපාධිය නවීන ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා වූ උපාධියක් ලෙස හඳුන්වනු ලබන අතර සිසුනට නූතන වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ අංශයේ දැනුමට අමතරව, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ නිපුනතාවයන් ලබාදීම මෙයින් අපේක්ෂා කරයි.

## වාණිජ විද්‍යාවේදී විශේෂ මූල්‍ය කළමනාකරණ උපාධි පාඨමාලාව

ගිණුම්කරණ හා මූල්‍ය වෘත්තිකයන්ගේ දේශීය හා විදේශීය වශයෙන් වර්ධනය වන ඉල්ලුම් සපුරාලීම සඳහා වෘත්තිකයන් පුහුණු කිරීමට වාණිජ විද්‍යාවේදී විශේෂ මූල්‍ය කළමනාකරණ උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. මෙම ක්ෂේත්‍රයේ අති දක්ෂ ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය වන සියලුම විෂයන් මෙම පාඨමාලාවට ඇතුලත් කර ඇත. තව ද මෙම සමස්ත පාඨමාලාව නිමවා ඇත්තේ සිසුනට අවශ්‍ය ක්ෂේත්‍රය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදෙන ආකාරයටයි.

**ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මානව සම්පත් කළමනාකරණ උපාධිය**

මෙරට පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි උපක්‍රමික අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස, විභව මානව සම්පත් හඳුනා ගැනීම හා සංවර්ධනය කිරීමේ මූඛ්‍ය පරමාර්ථය පෙරදැරිව, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය වර්ෂ 1999 සිට මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය දැයේ දූ දරුවන් හට පිරිනමනු ලබයි. එහි ආචාර්ය මඩුල්ල හා සිසු දරුවන් අධ්‍යයනාංශයේ දැක්ම වන **ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම මිනිස් බල විසඳුම් සලසන්නා බවට පත්වීම** හා මෙහෙවර වන **මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත පර්යේෂණ, උපදේශන සේවා හා රැකියා වෙළඳපොළේ මානව සම්පත් ක්ෂේත්‍රයේ රැකියා හා වෘත්තීමය සේවා සම්බන්ධයෙන් විශ්වසනීයම විකල්පය වීම** වටා එක්රොක් වී පොදු අරමුණකින් ඉගැනීම්, පර්යේෂණ හා විෂය බාහිර ක්‍රියාකාරකම් වල නියැලේ.

ව්‍යාපාර කළමනාකරණ රාමුවේ ප්‍රධාන ශ්‍රිතයන් වන මූල්‍ය කළමනාකරණය, අලෙවි කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය, සමස්ත තත්ත්ව කළමනාකරණය, ව්‍යාපාර හා කම්කරු නීතිය මෙන්ම ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ දැනුම සිසු දරුවන්ට ලබා දෙමින් එහි හර විෂය වන මානව සම්පත් කළමනාකරණය වෙත තියුණු අවධානයක් යොමු කරමින් මානව සම්පත් අභිමුඛ වූ සමස්ත ව්‍යාපාර කළමනාකරණ දැනුමින් සිසු දරුවන් සන්නද්ධ කරනු ලබයි. හුදෙක් දැනුමට පමණක් සීමා නොවී ගතික ව්‍යාපාර පරිසරයට ගැළපෙන නව කුසලතා හා වටිනාකම් වලින් පිරිපුන් විද්‍යාර්ථීන් බිහි කිරීමට අධ්‍යයනාංශය නිරන්තරයෙන් බැඳී සිටියි. අනාගත ලෝකයට අවැසි විවිධ මෘදු කුසලතා සංවර්ධනය කර ගැනීමට වේදිකාවක් සකසමින්, මානව සම්පත් තොරතුරු පද්ධති (Human Resource Information Systems) සම්බන්ධ නව දැනුම විද්‍යාර්ථීන් හට ලබා දෙනු පිණිස hSenid Business Solutions ආයතනය හා එක්ව ඩිප්ලෝමාවක් ලබාදෙන අතර MAS Holdings ආයතනය හා සබැඳිව " Skills For Work" ඩිප්ලෝමාව සිසු දරුවන්ට නොමිලේම ලබා දෙනු ලබයි.

මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයෙන් තම උසස් අධ්‍යාපනය තෝරා ගැනීමෙන් මෙහි පැමිණෙන යම් විද්‍යාර්ථියෙක් එම අංශයටම සීමා වීමක් අදහස් නොකෙරේ. මන්ද මෙම අධ්‍යයනාංශයේ යම් විද්‍යාර්ථියෙක් හට මානව සම්පත් කළමනාකරණයෙන් ඉගෙනීමේ කටයුතු කරන අතරවාරයේදීම, මූල්‍ය හා විගණනය, අලෙවි කළමනාකරණය, කළමනාකරණ තොරතුරු පද්ධති හෝ නීති යන අංශ වලින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට පහසුකම් සලසයි. තවද සිව්වන වසරේදී මානව සම්පත් කළමනාකරණය හා මානව සම්පත් සංවර්ධනය ලෙස මෙම උපාධිය විෂය ඒකක දෙකකට බෙදේ.

මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධියට පමණක් සීමා නොවී, මෙම අධ්‍යයනාංශය මානව සම්පත් කළමනාකරණ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව හා පශ්චාද් උපාධිය ද මානව සම්පත් කළමනාකරණ උසස් ඩිප්ලෝමාව ද ප්‍රදානය කරයි. වර්ෂ 2005 සිට අධ්‍යයනාංශයේ බාහිර උපාධිය වන ව්‍යාපාර කළමනාකරණ (සාමාන්‍ය) උපාධිය දැයේ සිසු සිසුවියන් හට ප්‍රදානය කරනු ලබයි.

**ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ විශේෂ උපාධිය**

ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රය තුළ රැකියා බලාපොරොත්තු වන සිසුන් සඳහා විශේෂයෙන් නිර්මාණය වී ඇති මෙම පාඨමාලාව ගිණුම්කරණය හා සම්බන්ධ ප්‍රධාන විෂයයන් මෙන්ම උපකාරක ක්ෂේත්‍රයන් පිළිබඳව ද පුළුල් දැනුමක් ලබාදේ. එක් වසරක ප්‍රායෝගික පුහුණු වැඩසටහන අනිවාර්ය විෂයය ඒකකයක් වන අතර එමගින් පුළුල් පළපුරුද්දක් හා රැකියා අවස්ථා ලබා ගැනීමට මඟ පාදේ.

මෙම උපාධි පාඨමාලාවෙහි විෂයය නිර්දේශයෙහි අරමුණු යාවත්කාලීන විෂයය දැනුම ශිෂ්‍යයාට ලබාදීම සහ ක්ෂේත්‍රය පිළිබඳව මනා අවබෝධයක් ලබා දීමයි. අධ්‍යයන ක්‍රියාවලිය තුළදී උසස් තාක්ෂණික ක්‍රමවේද භාවිතා කිරීමට ශිෂ්‍යයන්ට අවකාශය සැලසෙන අතර වර්තමානයේ ආයතන විසින් අපේක්ෂා කරනු ලබන ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත.

**ව්‍යාපාර කළමනාකරණවේදී විගණනය සහ ව්‍යෝහාරික ගිණුම්කරණ ගෞරව උපාධිය**

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින මූල්‍ය වංචා මගින් ව්‍යෝහාරික ගිණුම්කරණය කෙරෙහි පවතින ඉල්ලුම වැඩි වී ඇති අතර එහි වැදගත්කම ද වර්ධනය වෙමින් පවතී. මෙය ගෝලීය ඉල්ලුමක් පවතින රැකියා ක්ෂේත්‍රයක් බවට පත්වෙමින් පවතින බැවින් ගණකාධිකරණ අධ්‍යයන අංශය විසින් ව්‍යාපාර කළමනාකරණවේදී විගණනය සහ ව්‍යෝහාරික ගිණුම්කරණය ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වා දී තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයක් මගින් මෙම උපාධිය පිරිනැමෙන ප්‍රථම අවස්ථාව මෙය වන අතර ගිණුම්කරණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සංකීර්ණභාවය සහ රැකියා වෙළඳපොළෙහි ඇති තරඟකාරීත්වය හමුවේ ජය ලැබීමට උපාධිධරයෙකු හට ලැබෙන සුවිශේෂී සුදුසුකමක් ලෙස මෙම උපාධිය සැලකිය හැකිය.

**ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මූල්‍ය උපාධි පාඨමාලාව**

ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මූල්‍ය උපාධි පාඨමාලාව විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලාංකීය හා ගෝලීය වශයෙන් ඉතා වේගයෙන් වර්ධනය වන මූල්‍ය සේවා අංශයෙහි ඉල්ලුම සපුරාලීම පිණිසය. ඒ අනුව මෙම පාඨමාලාව සඳහා විෂය සංයෝජන ප්‍රධාන වශයෙන් මූල්‍ය හා ආර්ථික විද්‍යා විෂයන්ට සම්බන්ධ සාංගමික මූල්‍ය, ආයෝජන කළමනාකරණය හා ධනය සැලසුම්කරණය, ව්‍යාපාරික ආර්ථික විද්‍යාව, ආර්ථික මිතිය, මූල්‍ය ආර්ථික විද්‍යාව වැනි විෂය ඒකකවලින් සමන්විතය. ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මූල්‍ය උපාධි පාඨමාලාව ඇමරිකා එක්සත් ජනපදයේ, වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනය විසින් පිළිගත් උපාධි පාඨමාලාවකි. තවද, මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනය විසින් පිළිගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම උපාධිය වීමෙන්, මූල්‍ය අධ්‍යයන අංශයට සිසුන් දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලට යොමු කරමින්, මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ඵලදායී සම්බන්ධතා පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත.

මෙම උපාධි පාඨමාලාවේ සියළු විෂය ඒකක අතරින්, මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව අවසන් වසර සිසුන්ට අනිවාර්ය විෂය ඒකකයක් වන අතර එය උපාධි අපේක්ෂකයන්ට ප්‍රායෝගික වැඩ පිරිසරය පිළිබඳව හා මූල්‍ය ක්ෂේත්‍රයේ වේගයෙන් වර්ධනය වන අංශ තුළ ඇති රැකියා අවස්ථා පිළිබඳව දැනුවත්වීමට ඉවහල් වේ. තවද අවසාන වසර උපාධි අපේක්ෂකයන්ට පර්යේෂණ නිබන්ධනයක්

පිළියෙල කිරීම අනිවාර්ය වන අතර එය සංකල්පීයකරණය, මෙහෙයුම්කරණය හා විධිමත් කුසලතා යනාදියෙන් උපාධි අපේක්ෂකයන්ට සමන්විත කිරීමට ඉවහල් වේ.

මූල්‍ය අධ්‍යයන අංශය විසින් නව උපාධි පාඨමාලා හඳුන්වාදීමත් සමග, සිසුන් හට තෙවන වසරේ සිට තම අධ්‍යයන කාර්යසාධනය මත පදනම්ව පහත විශේෂ/ ගෞරව උපාධි පාඨමාලා තෝරා ගැනීමේ හැකියාව ඇති අතර මෙම විශේෂ/ ගෞරව උපාධි පාඨමාලා තුන සඳහා පළමු වසර දෙක පොදුවේ.

- ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ මූල්‍ය උපාධිය
- ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය
- ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණය පිළිබඳ ගෞරව උපාධිය

**ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණය ගෞරව උපාධිය**

මෙම උපාධි පාඨමාලාව හඳුන්වාදෙනු ලැබ ඇත්තේ සීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාර ලෝකයේ අවශ්‍යතාවන්ට අනුකූලව, රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂිත දැනුමෙන් යුතු උපාධිධරයින් බිහිකරලීම උදෙසාය. රක්ෂණයට සම්බන්ධ මූලික ක්ෂේත්‍රයන්ට අදාළ විෂයන් වන ප්‍රතිරක්ෂණ කළමනාකරණය, රක්ෂණ හිමිකම් කළමනාකරණය, අවධානම් කළමනාකරණය, ආයුගණක තක්සේරුකරණය යනාදියෙන් සමන්විත වී ඇති මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කරනුලැබ ඇත්තේ එකී ක්ෂේත්‍රයන් හි විශේෂිත දැනුමෙන්, නිපුනතා, ආකල්ප හා පරිචයෙන් යුතු අනාගත රක්ෂණ වෘත්තිකයන් බිහිකරලීම අරමුණු කර ගෙනය.

**ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණය ගෞරව උපාධිය**

බැංකු ක්ෂේත්‍රයේ අභිප්‍රායන් මත පදනම්ව මෙම උපාධි පාඨමාලාව නිර්මාණය වී ඇති අතර මෙහි අරමුණ වී ඇත්තේ උපාධි අපේක්ෂකයන් බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳව සිව් වසරක් පුරාවට ලබාගත් දැනුමෙන්, කුසලතාවයෙන්, ආකල්ප වලින්, පරිචයෙන් හා අවබෝධයෙන් එම ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතාවයක් ගෙන කටයුතු කරන අනාගත වෘත්තිකයන් බවට පත්කිරීමය. බැංකුකරණයට අදාළ ප්‍රධාන විෂය ඒකකයන් වන ණය කළමනාකරණය, භාණ්ඩාගාර කළමනාකරණය, බැංකු නොවන මූල්‍ය ව්‍යාපාර, ආයෝජන හා සංවර්ධන බැංකුකරණය යනාදී ඒකක වලින් මෙම පාඨමාලාව සමන්විත වේ.

**ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණය ගෞරව උපාධිය**

මෙම සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාව සඳහා සිසුන් තෝරාගනුලබන්නේ විශේෂ වූ ක්‍රමවේදයකට අනුවය. සීඝ්‍රයෙන් වෙනස් වන මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ විශේෂිත දැනුමෙන් හෙබි උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කරගෙන මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. එහි විෂය පථය සැකසී ඇත්තේ අවධානම් කළමනාකරණය, මූල්‍ය ආකෘති නිර්මාණය හා මූල්‍ය උපකරණ සංවර්ධනය යන ක්ෂේත්‍රයන් හි නිපුණතාවයෙන් හා දැනුමෙන් සමන්විත අනාගත වෘත්තිකයන් බිහි කිරීම උදෙසාය. මූල්‍ය ඉංජිනේරුකරණයට අදාළ ප්‍රධාන විෂය ඒකකයන් වන මූල්‍ය සඳහා ගණිතමය ආකෘති නිර්මාණය, මූල්‍ය පිළිබඳ අනුරූපන ශිල්ප ක්‍රම, කාර්යක්ෂම ගණිතය හා ප්‍රශස්තකරණය යනාදී ඒකකයන්ගෙන් මෙම පාඨමාලාව සමන්විත වේ. තවද, මෙම උපාධි පාඨමාලාව ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනය විසින් පිළිගත් උපාධි පාඨමාලාවකි.

**ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ විශේෂ උපාධිය**

ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණය පිළිබඳ විශේෂ උපාධිය ලබාදෙනු ලබන අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලයේ පවත්නා කළමනාකරණ අධ්‍යයන අංශයන් තුළින් ISO 9001:2015 තත්ව සහතිකයෙන් පිදුම්ලත් සහ පවත්වාගෙන යනු ලබන එකම අධ්‍යයන අංශය වේ. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධාන මුහුණ පානු ලබන ව්‍යාපාරික අභියෝගයන් සාර්ථකව ජය ගැනීම සඳහා අවශ්‍ය වන දක්ෂ, හැකියාවෙන් සහ ආත්ම විශ්වාසයෙන් පරිපූර්ණ උපායශීලී කළමනාකරුවන් බිහිකිරීමට හැකිවන අන්දමින් ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණය පිළිබඳ විශේෂ උපාධිය නිර්මාණය කොට ඇත. මෙම උපාධි පාඨමාලාව විෂය ස්ථම්භ (ක්ෂේත්‍රයන්) අටකින් සමන්විත වන අතර ඒවා ව්‍යවහාරික අලෙවිකරණය, පාරිභෝගික හැසිරීම සහ පර්යේෂණ, සන්නම්කරණය සහ සන්නිවේදනය, ගිණුම්කරණය සහ මූල්‍ය, ප්‍රමාණාත්මක ප්‍රවේශයන්, ඩිජිටල් අලෙවිකරණය සහ තොරතුරු තාක්ෂණය, දේශීය හා ගෝලීය ව්‍යාපාර පරිසරය සහ නවීන කළමනාකරණ භාවිතයන් ලෙස වර්ග කර ඇත. එහිදී, මූලික ඉගෙනුම් ක්‍රම, ක්‍රියාකාරී ඉගෙනුම් හා ඇගයීම් ක්‍රමවේදයන් සහ වසරක් පුරාවට ලබාදෙනු ලබන ප්‍රායෝගික/ ආධුනිකත්ව පුහුණුව හරහා වැඩි දියුණු කරනු ලබන දැනුම හා කුසලතා තුළින් විද්‍යාර්ථීන් ක්‍රමානුකූලව දියුණු කරනු ලැබේ. එසේම මෙම විද්‍යාර්ථීන්හට උපාධි පාඨමාලාව සමඟම, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in Enterprise Resource Planning) සහ පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in People Skills) යනුවෙන් පාඨමාලා දෙකක් ද හැදෑරීම තුළින් බහුවිධ කුසලතාවලින් පරිපූර්ණ උපාධිධාරියෙකු වීමේ අවස්ථාව ලබාදී තිබේ.

**විද්‍යා පීඨය**

| **අධ්‍යයන පාඨමාලාව** | **විෂය සංකලන (නියමිත අවස්ථාවලදී)** | **ඉ/මා** |
|---|---|---|
| ජෛවීය විද්‍යාව | උද්භිද විද්‍යාව - රසායන විද්‍යාව - සත්ත්ව විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | උද්භිද විද්‍යාව - රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය | E* |
| ජෛවීය විද්‍යාව | සත්ත්ව විද්‍යාව - රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය | E* |
| ජෛවීය විද්‍යාව | උද්භිද විද්‍යාව - රසායන විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | සත්ත්ව විද්‍යාව - රසායන විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | අණුක ජීව විද්‍යාව හා ශාක ජෛව තාක්ෂණය - රසායන විද්‍යාව - උද්භිද විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - උද්භිද විද්‍යාව | E* |
| ජෛවීය විද්‍යාව | ජෛව රසායන විද්‍යාව - රසායන විද්‍යාව - සත්ත්ව විද්‍යාව | E* |

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| භෞතිය විද්‍යාව | ව්‍යවහාරික ගණිතය - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | පරිගණක විද්‍යාව - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | ඉලෙක්ට්‍රොනික විද්‍යාව - භෞතික විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | ව්‍යවහාරික ගණිතය - පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය - සංඛ්‍යානය | E* |
| භෞතිය විද්‍යාව | රසායන විද්‍යාව - පරිගණක විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | ව්‍යවහාරික ගණිතය - රසායන විද්‍යාව - ශුද්ධ ගණිතය | E* |
| භෞතිය විද්‍යාව | පරිගණක අධ්‍යයනය - ඉලෙක්ට්‍රොනික විද්‍යාව - භෞතික විද්‍යාව | E* |
| භෞතිය විද්‍යාව | ව්‍යවහාරික ගණිතය - ශුද්ධ ගණිතය - සංඛ්‍යානය | E* |
| භෞතිය විද්‍යාව | රසායන විද්‍යාව - පරිගණක අධ්‍යයනය - ශුද්ධ ගණිතය | E* |

* පළමු වසර පළමු සමාසිකයේ පාඨමාලා සිංහල / ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර දෙවන සමාසිකයේ සිට පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | කළමනාකරණය, තොරතුරු තාක්ෂණය | E |
| පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | E |

පාඨමාලා සඳහා ඇති ඉල්ලුම නියමිත ප්‍රමාණය ඉක්මවන විට, ජෛවීය විද්‍යා විෂය ධාරාවෙහි සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනු ලබන පාඨමාලා සඳහා පළමු අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකය තුළ පවත්වන පරීක්ෂණවලදී දක්වන කුසලතාවය පදනම් කරගෙන පළමු අධ්‍යයන වර්ෂයේ දෙවැනි සමාසිකය ආරම්භයේදී ශිෂ්‍යයන් තෝරා ගනු ලැබේ. ජෛවීය විද්‍යා විෂය ධාරාවෙහි ජෛව රසායන විද්‍යාව, පරිගණක අධ්‍යයනය, ක්ෂුද්‍රජීව විද්‍යාව, අණුක ජීව විද්‍යාව හා ශාක ජෛව තාක්ෂණය යන විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගනු ලැබේ.

භෞතිය විද්‍යා විෂයය ධාරාවෙහි සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනුලබන පාඨමාලා සඳහා පළමු වසර පළමු සමාසිකය ආරම්භයේදී ශිෂ්‍යයන් තෝරාගනු ලැබේ. භෞතිය විද්‍යා විෂයය ධාරාවෙහි රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, පරිගණක අධ්‍යයනය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංඛ්‍යානය යන විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

විද්‍යාර්ථයකු විසින් වසර තුන ඇතුළත පෙනී සිටි සියලුම පාඨමාලා ඒකක වලට අදාළ අධ්‍යයන සම්භාර විද්‍යාවේදී උපාධිය හා පරිසර සංරක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය ප්‍රධානය කිරීම සඳහා සලකා බලනු ලැබේ.

දෙවන වසර අවසානයේදී විද්‍යා පීඨයේ ශිෂ්‍යයෙකුට පහත සඳහන් ඕනෑම විෂයයක් ගෞරව උපාධි වැඩසටහන සඳහා හැදෑරීමට අයදුම් කළ හැකිය. සිව් වසරක සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ සමුච්චිතව ඇති සියලුම අධ්‍යයන ඒකක විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනැමීම සඳහා සළකා බලනු ලැබේ. පහත සඳහන් ගෞරව උපාධි පාඨමාලා විද්‍යා පීඨය මඟින් පිරිනමනු ලැබේ.

(i) උද්භිද විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(ii) රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(iii) පරිගණක විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(iv) ගණිතය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(v) ගණිතමය භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(vi) ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(vii) අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(viii) භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(ix) සංඛ්‍යානය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(x) සත්ත්ව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

**භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලාව**

මෙය භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන ප්‍රධාන විෂයයන් දෙකකින් සහ තුන්වැනි විෂයක ප්‍රමාණයට සමානව ආවරණය කෙරෙන ගණිතය සහ කළමනාකරණය හෝ ගණිතය සහ පරිගණක අධ්‍යයනය යන කොටස් වලින් සමන්විත වසර තුනක පාඨමාලාවකි. මෙහි අරමුණ අ.පො.ස. (උසස් පෙළ) සඳහා භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් හදාරා ඇති සහ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට අවශ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවශ්‍යතා සපුරා ඇති විශේෂ ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස බඳවා ගැනීමයි.

උපාධිය සාර්ථකව නිම කිරීමේ දී උපාධිධාරීන්ට භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධි මට්ටමේ මනා දැනුමක්, නිපුණතාවයක් සහ අවබෝධයක් ද ඊට අමතරව ගණිතය සහ කළමනාකරණය හෝ ගණිතය සහ පරිගණක අධ්‍යයනය පිළිබඳව ද මනා දැනුමක් සහිත උපාධිධාරීන් ලෙස වැඩ කටයුතු කිරීමට හැකිවේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ , සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යයන අංශයේ සහ ගණිත අධ්‍යයන අංශයේ සහය ඇතිව භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශ විසින් මෙම උපාධි පාඨමාලාව මෙහෙයවනු ලබයි.

**කළමනාකරණය හා තොරතුරු තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව (B.Sc. Honours in Management and Information Technology)**

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව මඟින් කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය යන ක්‍ෂේත්‍ර දෙකෙහි සංකලනයක් ලෙස විශාල පරාසයක දැනුම සහ කුසලතා ලබාදීම සිදු කෙරේ. තරඟකාරී විෂය දැනුමට අමතරව, සිසුන්ගේ මෘදු කුසලතා (Soft skills) සංවර්ධනයට ප්‍රමුඛස්ථානයක් ලබාදී තිබීම, සය මසක සීමාවාසික පුහුණුවකට(Internship) අවස්ථාව ලැබීම සහ පීඨයේ අනුමැතිය මත තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක් සහිතව රැකියා වෙළඳපොළට පිවිසීමට විකල්ප අවස්ථාවක් සලසාදී තිබීම මෙම පාඨමාලාවේ විශේෂ ලක්‍ෂණ වේ. එමෙන්ම, මෙම උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනෙන සිසුන්හට සිය තෙවන අධ්‍යයන වර්ෂයේ සිට තොරතුරු තාක්‍ෂණය, ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව, මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය සහ තොරතුරු පද්ධති යන ක්‍ෂේත්‍රවලින් එකක නිපුණතාවය ලබා ගැනීම ඉලක්ක කොට ගෙන සිය අධ්‍යයන කටයුතු කරගෙන යෑමට වැඩිදුරටත් අවස්ථාව හිමිවේ.

**( අ )** **තොරතුරු තාක්‍ෂණය (Information Technology)**
ACM, IEEE වැනි ලොව පිළිගත් වෘත්තීය සංගම්වල නිර්නායක වලට අනුකූලවන මෙම පාඨමාලාවේ විෂය නිර්දේශය මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව(Software Engineering), දත්ත විද්‍යාව(Data Science), පද්ධති ඉංජිනේරු විද්‍යාව(Systems Engineering) , දත්ත සමුදා පරිපාලනය(Database Administration), පරිගණක ජාල ඉංජිනේරු විද්‍යාව(Network Engineering), ව්‍යාපාර විශ්ලේෂණය(Business Analysis) සහ මෘදුකාංග තත්ත්ව ඉංජිනේරු විද්‍යාව(Software Quality Engineering) ඇතුලු තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රයේ පිළිගත් වෘත්තීන්හි නියැලීමට සිසුන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීම අරමුණුකොටගෙන සකසා ඇත. මීට අමතරව පාඨමාලා කාලය තුළ ලබා ගන්නා කළමනාකරණ ක්‍ෂේත්‍රයේ දැනුම, සිසුන්ට ක්‍රමානුකූලව තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රයේ දක්‍ෂ කළමණාකරුවන් මෙන්ම සාර්ථක ව්‍යවසායකයින් බවට පත්වීමට විශාල පිටිවහලක් වේ.

**( ආ )** **ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව (Business Systems Engineering)**
ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව උපාධි පාඨමාලාව හරහා සාර්ථක ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා වන ව්‍යාපාර උපක්‍රම, කාර්යයන් සහ ගණුදෙනු හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සවිස්තර ප්‍රවේශයක් ලබා දීම සිදුකෙරේ. ගෝලීය වෙළඳපොළ තුළ තරඟකාරී ලෙස හැසිරීමට අපගේ ව්‍යාපාර සංවිධාන සහ ඒවායෙහි ක්‍රියාවලින් ලොව පිළිගත් විශිෂ්ඨ කළමනාකරණ භාවිතයන්ට ගැළපෙන ලෙස ප්‍රතිනිර්මාණය කිරීම වැදගත් වන අතර ඒ සඳහා තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීම තුළින් නව ව්‍යාපාරික අවස්ථාවන් උත්පාදනයට ඉඩ සැලසේ.

**( ඇ )** **මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය (Operations & Supply Chain Management)**
මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය පාඨමාලාවේ පදනම තොරතුරු තාක්ෂණ මූලධර්ම යොදා ගනිමින් ලොව පිළිගත් විශිෂ්ඨ ක්‍රමෝපායන් භාවිතය හරහා මෙහෙයුම් හා සැපයුම් දාම කළමනාකරණය කිරීම වේ. මෙම පාඨමාලාවේ අන්තර්ගතය, ඒ සඳහා අවශ්‍ය වන වෘත්තීමය දැනුම සහ කුසලතාවයන් වැඩිදියුණු කිරීම අරමුණු කොට ගෙන නිර්මාණය කර ඇත.

**( ඈ )** **තොරතුරු පද්ධති (Information Systems)**
වර්තමාන ව්‍යාපාරික ලෝකයේ ව්‍යාපාරික තීරණ ගැනීමේදීලා අවශ්‍ය වන තොරතුරු නිසි පරිදි සැපයීම සඳහා තොරතුරු පද්ධතීන් ක්‍රමෝපායික වැදගත්කමක් උසුලයි. පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවා සැපයීමටත් පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ උපරිම කිරීමටත් හේතුවන මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීමට තොරතුරු පද්ධතීන් හේතු වේ. එම නිසා, තොරතුරු තාක්‍ෂණ සම්පත් කළමනාකරණය තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ ව්‍යාපාරයක සාර්ථකත්වය කෙරෙහි සෘජුව බලපාන සාධකයක් වේ.

එම නිසා ව්‍යාපාර ආයතනවල ක්‍රමෝපායන් සහ ක්‍රියාවලීන් සමඟ තදින් බැඳී ඇති තොරතුරු පද්ධති නිසිලෙස පවත්වාගෙන යාමට, වැඩි දියුණු කිරීමට මෙන්ම එයට අවශ්‍ය මානව හා භෞතික සම්පත් නිසිලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සපිරි වෘත්තිකයින් බිහි කිරීම මෙම පාඨමාලාවේ ප්‍රමුඛ අරමුණ වේ.

**පරිසර සංරක්‍ෂණය හා කළමනාකරණය විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා**

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය මඟින් දැනට පිළිවෙලින් වසර 3 සහ 4 ගතවන පරිසර සංරක්‍ෂණය හා කළමනාකරණය විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව යන උපාධි පාඨමාලා දෙකම පවත්වාගෙන යයි.

මෙම උපාධි පාඨමාලාව ජාතික හා ගෝලීය පරිසර සංරක්‍ෂණ හා කළමනාකරණ ගැටළු හා අවශ්‍යතා වෙත යොමු කර ඇත. එහි විෂය නිර්දේශය පරිසර කළමනාකරණය, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව සහ ක්‍ෂුද්‍ර ජීව විද්‍යාව යන විෂය සංකලනයන් හා අදාළව සකසා ඇත. මෙම විෂය නිර්දේශය මඟින් ශාක හා සතුන්ගේ විවිධත්වය(Diversity of Plant and Animal), පරිසර විද්‍යාව (Ecology), වන විද්‍යාව (Forestry), ජල විද්‍යාව (Hydrology), ජල සම්පත් කළමනාකරණය (Water Resources Management ), වන ජීවී කළමණාකරණය (Wildlife Management), සංරක්‍ෂණ ජීව විද්‍යාව (Conservation Biology), පරිසර ආර්ථික විද්‍යාව

(Environmental Economics), පාංශු සංරක්ෂණය (Soil Conservation), වායු තත්ව කළමනාකරණය (Air Quality Management), ඝන අපද්‍රව්‍ය, අපජල සහ අන්තරායකාරී අපද්‍රව්‍යය කළමනාකරණය (Solid Waste, Waste Water and Hazardous Waste Management), පරිසර තත්ත්ව ප්‍රමාණනය (Environmental Monitoring), පාරිසරික සෞඛ්‍යය (Environmental Health), පාරිසරික ඇගැයීම් ක්‍රමවේදයන් (Environmental impact assessment practices), GIS සහ දුරස්ථ සංවේදක උපයෝගීතාවන් (GIS and remote sensing applications), පාරිසරික ප්‍රතිපත්ති හා නීති සම්පාදනය (Environmental Policies and Legislation), දේශගුණික විපර්යාස (Climatic Changes), ස්වභාවික ආපදා (Natural Disasters), හරිත තාක්ෂණික ක්‍රමවේදයන් (Green Technologies) වැනි විශේෂිත වූ ක්ෂේත්‍රයන්හි නිපුණතාවක් ලැබීමට ඉඩ සැලසේ. මෙම උපාධි පාඨමාලාවේදී සියලුම සිසුන්ට පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හා අදාළ කර්මාන්තයක් ආශ්‍රිතව මනා කාර්මික හා වෘත්තීය නිපුණතාවයක් ලබා දෙයි. එමෙන්ම පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හා අදාළ ක්ෂේත්‍රයක් ආශ්‍රිතව පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සඳහා අදාළ පුහුණුවක්ද ලබා දෙයි. විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන් විසින් කෙටි කාලීන කණ්ඩායම් පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරන අතර, ගෞරව උපාධි අපේක්ෂකයන් විසින් වර්ෂයක් තුළ සම්පූර්ණ කරන ඒකල විශේෂ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරයි. මෙයට අමතරව පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳව ගැඹුරු මාතෘකා වෙතටද එම ගෞරව උපාධි අපේක්ෂකයන් යොමු කරවයි.

### මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

අන්තර්ජාතික වශයෙන් පිළිගත් ACM උපදෙස් මාලාවට අනුකූලව සකසා ඇති මෙම සිව් අවුරුදු වෘත්තීමය උපාධි පාඨමාලාව මගින් උපාධි අපේක්ෂකයන්ට අනාගතයේදී මෘදුකාංග ඉංජිනේරුවන් ලෙස සාර්ථක ආර්ථිකයකට දායකවීමට අවශ්‍ය දැනුම, හැකියාව සහ ආකල්ප දියුණු කරගැනීම සඳහා අඩිතාලම දැමීමට අපේක්ෂිත ය. වෙබ් කේන්ද්‍රීය (Net Centric), ජංගම දුරකතන සඳහා පරිගණකකරණය (Mobile Computing), පරිගණක ක්‍රීඩා සහ සජීවනය (Digital Gaming & Animation), සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය (Health Informatics), බුද්ධිමත් ව්‍යාපාර පද්ධති (Business Intelligent Systems) සහ දත්ත විද්‍යාව (Data Science) වැනි විශේෂිත ක්ෂේත්‍රවල නිපුණතාවය ලැබීමට හැකි අයුරින් පාඨමාලාව සකසා ඇති බැවින් සිසුන්ට තමන් කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමේ අවකාශය සපයා ඇත. මාස 6 ක කාලයක් අදාළ ක්ෂේත්‍රයේ ආයතනයක පුහුණුව ලැබීමේ අවස්ථාවද සිසුනට හිමිවේ. මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ මෘදුකාංග නිෂ්පාදන ආයතනවල පූර්ණ දායකත්වය යටතේ ඉදිරිපත් කෙරේ.

## වෛද්‍ය පීඨය

### වෛද්‍ය විද්‍යා (එම්.බී.බී.එස්.) පාඨමාලාව

එම්.බී.බී.එස්. පාඨමාලාව වසර පහකි. එහි විෂය මාලාව මිනිස් සිරුරේ අවයව පද්ධති පාදක කරගනිමින් සකස්කොට ඇත. මෙම පාඨමාලාව අදියර තුනක් යටතේ සංවිධානය වී ඇති අතර එක් එක් අදියරක් අවසානයේ වෘත්තීයමය උපාධිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රධාන විභාගයක් බැගින් පැවැත්වේ. පළමු සහ දෙවන වසර ඇතුලත් වන ප්‍රථම අදියරේදී සිසුන් විසින් මිනිස් සිරුරේ සාමාන්‍ය ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වයද තෙවන සහ සිව්වන වසර ඇතුලත්වන දෙවන අදියරේදී රෝග ඇතිවීමට හේතු සාධක, ප්‍රතිකාර ක්‍රම සහ රෝග වලක්වා ගැනීම ක්‍රමවේදයන්ද හදාරනු ලැබේ. ඊට අමතරව තෙවන සහ සිව්වන වසරේදී විවිධ වෛද්‍ය ක්ෂේත්‍රවලට අදාළ සායනික පුහුණුවද ලබා දේ. සිව්වන වසරේදී අධීක්ෂිත පර්යේෂණ ව්‍යාපෘතියක්ද සම්පූර්ණ කළ යුතුය. අවසන් අදියරේදී සිසුන් පූර්ණකාලීන සායනික පුහුණුව සඳහා උතුරු කොළඹ ශික්ෂණ රෝහලට යොමු කෙරෙන අතර එම පුහුණුව අවසානයේ වෛද්‍යවේදය, ප්‍රසව හා නාරිවේදය, ළමා රෝගවේදය, මානසික වෛද්‍යවේදය සහ ශෛල්‍ය වෛද්‍යවේදය යටතේ පැවැත්වෙන අවසාන පරීක්ෂණයට මුහුණදිය යුතුය. මෙම පරීක්ෂණයෙන් සමත්වන සිසුන්ට වෛද්‍ය විද්‍යා උපාධිය පිරිනැමෙන අතර මාස 12 ක සීමාවාසික පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු වෛද්‍යවරයකු / වෛද්‍යවරියක ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය හිමිවේ. මෙම පාඨමාලාවේ සියලු ඉගැන්වීම් කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් සිදු වේ.

### කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

මෙම විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ දැනට ශ්‍රී ලංකාවේ පවතින එකම පාඨමාලාවයි. පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම කථන හා භාෂා චිකිත්සකවරයෙකු හෝ ශ්‍රවණවේදියෙකු ලෙස සේවය කිරීමට යෝග්‍යතාවය සපුරයි. මෙහි විෂය ධාරාවේ න්‍යායාත්මක දේශනවලට අමතරව සෞඛ්‍ය, අධ්‍යාපන සහ පුනරුත්ථාපන යන ක්ෂේත්‍රයන්ට අදාළව කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව අන්තර්ගත කොට ඇත.

පාඨමාලාවේ මූලික අරමුණ වන්නේ:

1. කථන / භාෂා / සන්නිවේදන සහ ශ්‍රවණ ඌනතාවයන්ගෙන් පෙලෙන්නන් හට සේවා ලබාදීමට අවශ්‍ය දැනුම ආකල්ප සහ කුසලතා වලින් පිරිපුන් කථන හා භාෂා චිකිත්සකවරුන් සහ ශ්‍රවණවේදීන් පුහුණු කිරීම.
2. කථන / භාෂා / සන්නිවේදන සහ ශ්‍රවණ ඌනතාවයන් පිළිබඳ සමාජයේ දැනුවත් බව පුළුල් කිරීම.
3. පර්යේෂණ සහ ප්‍රායෝගික අත්දැකීම් හරහා විෂය පථයේ උන්නතියට දායකත්වය ලබාදීම.

පාඨමාලාවේ කාල සීමාව වසර 04 ක් වන අතර අවම "ක්‍රෙඩිට්" අගයන් 120 කින් සමන්විතය. අවසන් වසරේදී සිසුන් පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම අනිවාර්ය වේ. සම්පූර්ණ පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු සිදුකරනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

## පරිගණක හා තාක්ෂණ පීඨය

### ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථකව නිම කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය මගින් ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ.

මෙම ඉංජිනේරු තාක්ෂණ උපාධි පාඨමාලාව උපාධිධාරීන්ව පුළුල් විවිධ කර්මාන්ත යෙදුම් සඳහා සූදානම් කිරීම අරමුණු කොටගත් විද්‍යාව හා තාක්ෂණයේ ප්‍රායෝගික යෙදුම් මත ප්‍රබලව ඉලක්ක වී ඇත. විෂය නිර්දේශයේ පළමු වසර දෙකෙහි ඉලක්කය වන්නේ ඉංජිනේරු තාක්ෂණවේදියෙකුට තිබිය යුතු පොදු නිපුණතාවන් දියුණු කිරීම වන අතර, අවසන් වසර දෙකෙහි දී තෝරා ගත් විෂය ක්ෂේත්‍රයක විශේෂ නිපුණතා දියුණු කිරීම සඳහා වෙන්ව ඇත.

මූලිකව ලබා දී ඇති විශේෂඥ ක්ෂේත්‍රයන් වන්නේ:

- ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි තාක්ෂණය (Material and Process Tehnology)
- කර්මාන්ත ස්වයංයන්ත්‍රකරණය හා රොබෝ විද්‍යාව (Industrial Automation and Robotics)
- තිරසර තාක්ෂණය (Sustainable Tehnologies)

කර්මාන්ත ස්වයංයන්ත්‍රණය හදාරන විද්‍යාර්ථීන්ට, පරිගණක හෝ රොබෝ යන්ත්‍ර වැනි කාලීන පද්ධති භාවිතා කිරීමට සහ කර්මාන්තවල විවිධ ක්‍රියාවලීන් සහ යන්ත්‍ර සූත්‍ර හැසිරවීමට අවශ්‍ය ICT නිපුණතාවය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි ඉංජිනේරු තාක්ෂණ විශේෂඥ ක්ෂේත්‍රවලදී ඉලක්ක වන්නේ, අමුද්‍රව්‍ය සහ ප්‍රයෝජනවත් දෑ වටිනා භාණ්ඩ බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම සැලසුම් කිරීම වේ. තිරසර තාක්ෂණය විශේෂඥ ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ කාලීන ලෝක සහ ශ්‍රී ලාංකීය ආර්ථික- සාමාජය ගැටලුවලට තිරසාර විසඳුම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

කර්මාන්ත පුහුණුව උපාධි පාඨමාලාවේ අනිවාර්ය අංගයක් වේ. හතරවන වර්ෂයේ අවසාන අර්ධ වාර්ෂිකයේ දී විද්‍යාර්ථීන් ප්‍රසිද්ධ කර්මාන්ත ආයතනවල ආධුනිකයන් වශයෙන් යොමු කරනු ඇත.

උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක්ම වේ.

තුන්වන අධ්‍යයන වසරට ප්‍රවේශ වීම සඳහා සිසුන් විසින් දෙවන අධ්‍යයන වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අවම අධ්‍යයන පරිසාධන මට්ටම සපුරාලිය යුතුව ඇත.

### තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථකව නිම කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය මගින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ.

මෙම පාඨමාලාව මගින් මෘදුකාංග සංවර්ධකවරුන්, ජාලකරණ පරිපාලකවරුන් හා තොරතුරු හා සන්නිවේදන වෘත්තිකයන් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කිරීමට විද්‍යාර්ථීන්ට උපකාර කරයි. ඉලෙක්ට්‍රෝනික විද්‍යාව සහ දත්ත සන්නිවේදන පිළිබඳව ශක්තිමත් පදනමක් ලබාදීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රමිතීන්ට අනුව, මෘදුකාංග හා පරිගණක ජාල සැලසුම් කිරීමට, නිර්මාණයට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා හා දැනුම වර්ධනය කිරීම මෙම පාඨමාලාව තුළින් සිදුවේ. අතථ්‍යකරණය හා වලා පරිගණනය, ජාල කළමනාකරණය, රැහැන් රහිත හා ජංගම සන්නිවේදන විද්‍යාව, පරිගණක ආරක්ෂණය, වෙබ් ක්‍රමලේඛණය, පරිගණක ක්‍රීඩා හා සජීවීකරණය, අතථ්‍ය යථාර්තය සහ ජංගම යෙදුම් සංවර්ධන විද්‍යාව වැනි විශේෂ විෂය ඒකක, විෂය ධාරාවට ඇතුලත් කිරීම මගින් විද්‍යාර්ථීන්ට තම අභිමත වෘත්තීය ධාරා ඔස්සේ විපුල දැනුමක් ලබාගැනීමේ අවකාශ සපයාදී ඇත.

මූලිකව ලබා දී ඇති විශේෂඥ ක්ෂේත්‍රයන් වන්නේ:

- පරිගණක ජාල (Computer Networks)
- පරිගණක ක්‍රීඩා සහ සජීවීකරණය (Games and Animation)
- මෘදුකාංග පද්ධති තාක්ෂණය (Software Systems Tehnologies)

හතරවන වසරට අදාල වන සය මාසික සීමාවාසික පුහුණු කාලය තුළදී විද්‍යාර්ථීන්ට සැබෑ කර්මාන්ත පරිසරය තුළ කටයුතු කිරීමට ඉඩහසර ලබාදේ. උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක්ම වේ.

තුන්වන අධ්‍යයන වසරට ප්‍රවේශ වීම සඳහා සිසුන් විසින් දෙවන අධ්‍යයන වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද අවම අධ්‍යයන පරිසාධන මට්ටම සපුරාලිය යුතුව ඇත.

### පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සිව් අවුරුදු පාඨමාලාවකි. මෙම පාඨමාලාවෙහි ව්‍යුහය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුවෙහි නිර්දේශය මත සහ Institute of Electrical and Electronics Engineers (IEEE) සහ Association for Computing Machinery (ACM) ආයතනයන්හි නිර්ණායකවලට අනුකූලව සකසා ඇත.

මෙම පාඨමාලාව මගින් විද්‍යාර්ථීන්ට මෘදුකාංග නිපැයුම් කර්මාන්තය සඳහාත්, පර්යේෂණ හැසිරවීම හා පරිගණක විද්‍යාව පිළිබඳ දැනුම බෙදාහැරීම සඳහාත් අදාළ වන කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කර ගැනීමට සහාය ලබා දේ. පරිගණක තාක්ෂණය පිළිබඳ ගැඹුරු මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල මෘදුකාංග විශ්ලේෂණය කිරීමට, සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කර පවත්වාගෙන යාමට අදාළ කුසලතා හා දැනුම වර්ධනය කිරීම මෙම පාඨමාලාව තුළින් සිදුවේ. දත්ත සමුදාය (Databases), යාන්ත්‍රික ඉගෙනුම් ක්‍රියාවලිය (Machine Learning), දත්ත ආරක්ෂණය (Data Security), සම්පාදක පිළිබඳ න්‍යාය (Theory of Compilers), සමාන්තර පරිගණනය (Parallel Computing), අධිකාර්ය සාධන පරිගණනය (High Performance Computing), සංඛ්‍යාංක අධිකරණ වෛද්‍ය විද්‍යාව (Digital Forensics), විචාරයික ජාල (Semantic Web), විද්‍යුත් ව්‍යාපාර තාක්ෂණය (e-Business Technology), පරිගණක ක්‍රීඩා හා සජීවිකරණය (Computer Games & Animation) සහ අතථ්‍ය යථාර්තය (Virtual Reality) ආදී විෂය ඒකක, විෂය ධාරාවට එක්ව තිබීම මගින් විද්‍යාර්ථීන්ට සිය අභිමත වෘත්තීය ධාරාව ඔස්සේ විපුල දැනුමක් ලබා ගැනීමේ අවකාශය සළසා ඇත.

- දත්ත විද්‍යාව (Data Science)
- කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence)
- සයිබර් ආරක්ෂණය (Cyber Security)
- විද්‍යාත්මක පරිගණනය (Scientific Computing)

සිව්වන වසර සඳහා අදාලවන සය මසක සීමාවාසික පුහුණු කාලය තුළදී විද්‍යාර්ථීන්ට සැබෑ කර්මාන්ත පරිසරය තුළ කටයුතු කිරීමට ඉඩහසර ලබා දේ. සියලුම ඉගැන්වීම් හා විභාග ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අවසන් වසරේදී විද්‍යාර්ථීන් විසින් තම අභිමත විෂයන් ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකළ යුතුය.

## මොරටුව විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | | E |
| ඉංජිනේරු විද්‍යාව | - | E |
| ඉංජිනේරු විද්‍යාව (EM) | - | E |
| ඉංජිනේරු විද්‍යාව (TM) | - | E |
| තොරතුරු තාක්ෂණය (IT) | - | E |
| වාස්තු විද්‍යාව | - | E |
| නිර්මාණවේදය | - | E |
| ප්‍රමාණ සමීක්ෂණය | - | E |
| නගර හා ග්‍රාම නිර්මාණය | - | E |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | - | E |
| පහසුකම් කළමනාකරණය | - | E |
| ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය | - | E |
| තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | - | E |
| භූමි නිර්මාණවේදය | - | E |
| ව්‍යාපාර විද්‍යාව | - | E |

### වාස්තු විද්‍යා පීඨය

මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය වාස්තු විද්‍යාව, භූමි නිර්මාණවේදය, ප්‍රමාණ සමීක්ෂණය, පහසුකම් කළමනාකරණය, නගර හා ග්‍රාම නිර්මාණ සැලසුම්කරණය සහ නිර්මාණවේදය යන විෂය පථයන් සඳහා ශ්‍රී ලංකාවේ උපාධි හා පශ්චාත් උපාධි පිරිනමනු ලබන එකම ශාස්ත්‍රීය ආයතනය වන මෙම පීඨය , වාස්තු විද්‍යා අධ්‍යයනාංශය, ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යයනාංශය හා සමෝධානිත නිර්මාණ අධ්‍යයනාංශය නමින් නම් කරන ලද දෙපාර්තමේන්තු හතරකින් සමන්විත වේ.

මෙම පීඨය මගින් වාස්තු විද්‍යාව, නගර හා ග්‍රාම නිර්මාණ සැලසුම්කරණ විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව, පහසුකම් කළමනාකරණ විද්‍යාව, නිර්මාණවේදය සහ භූමිනිර්මාණවේදය සඳහා ගෞරව උපාධි පිරිනමනු ලබන අතර බහුතර පාඨමාලාවන් සඳහා ජාතික හා අන්තර්ජාතික මට්ටමේ වෘත්තීයවේදීන්ගේ ආයතනය මගින් පිළිගැනීමක් ලබා දී ඇත.

වාස්තු විද්‍යා අධ්‍යයනාංශය මගින් වාස්තු විද්‍යාව සඳහා වූ පස් අවුරුදු වාස්තු විද්‍යා ගෞරව උපාධියත්, භූමිනිර්මාණ විද්‍යාව සඳහා සිව් අවුරුදු භූමිනිර්මාණවේදී ගෞරව උපාධියත් පිරිනමනු ලබයි. වාස්තු විද්‍යාවේදී ගෞරව උපාධිය ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාවේදීන්ගේ සංගමයත්, බ්‍රිතාන්‍ය රාජකීය වාස්තුවිද්‍යාවේදීන්ගේ සංගමයත්, පොදු රාජ්‍ය මණ්ඩලීය වාස්තු විද්‍යා වේදීන්ගේ සංගමයත් මෙම ගෞරව උපාධිය අන්තර්ජාතික මට්ටමේ උපාධියක් බව පිළිගෙන තිබේ.

ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් ප්‍රමාණ සමීක්ෂණය සහ පහසුකම් කළමනාකරණය සඳහා සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණවේදීන්ගේ ආයතනයත්, රාජකීය බලපත්‍රලාභී ප්‍රමාණ සමීක්ෂණවේදීන්ගේ ආයතනයත්, සිවිල් ඉංජිනේරු ආයතනය සහ පැසිෆික් කලාපීය ප්‍රමාණ සමීක්ෂකයින්ගේ සංගමය මගින් 1986, 1987, 2010 සහ 2011 යන වසර වලදී මෙම ගෞරව උපාධිය සඳහා අන්තර්ජාතික මට්ටමේ පිළිගැනීමක් ලබාදී තිබේ.

පහසුකම් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා ද රාජකීය බලපත්‍රලාභී ප්‍රමාණ සමීක්ෂණවේදීන්ගේ ආයතනයේ පිළිගැනීම ද හිමිවී තිබේ.

නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යයනාංශය, භෞතික සැලසුම්කරණ හා නගර නිර්මාණ පිළිබඳ අධ්‍යයන වැඩසටහන් සහ ඒ සඳහා පර්යේෂණයන්හි නියැලෙන අධ්‍යයනාංශයකි. මෙම අංශය සිව් අවුරුදු නගර සහ ග්‍රාම නිර්මාණවේදී ගෞරව උපාධියක් පිරිනමනු ලබයි. මෙම අධ්‍යයන පාඨමාලාව ශ්‍රී ලංකා නගර සහ ග්‍රාම නිර්මාණකරුවන්ගේ ආයතනය පිළිගෙන තිබේ.

සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය, සිව් අවුරුදු ගෞරව උපාධියක් නිර්මාණවේදය සඳහා පිරිනමනු ලබයි. ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් වටා මෙහි විෂය පථය විහිදී පවතී. එනම්, විලාසිතා සහ ජීවන ක්‍රම නිර්මාණ, මාධ්‍ය සහ සන්නිවේදනය සහ නිෂ්පාදන නිර්මාණ වේ.

**ඉංජිනේරු විද්‍යා පීඨය**

මොරටුව විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු විද්‍යා පීඨය මගින් උපාධි අපේක්ෂකයන් සඳහා පූර්ණකාලීන ප්‍රථම උපාධි පාඨමාලා 03 ක් පවත්වනු ලැබේ. මින් පළමු පාඨමාලාව විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව පාඨමාලාවයි. ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සඳහා අංශ තුනකින් සිසුන් ඇතුලත් කරගනු ලැබේ. එනම් ඉංජිනේරු , ඉංජිනේරු ( භූ සම්පත් EM) සහ ඉංජිනේරු ( පේෂකර්ම හා රෙදිපිළි TM) අංශයයි. විද්‍යාවේදී ඉංජිනේරු පාඨමාලාව වසර හතරක අධ්‍යයන කාල සීමාවකින් යුතු වන අතර එය සෙමෙස්තර අටකින් සමන්විතවේ. සෑම සෙමෙස්තරයක්ම සති විස්සකින් සමන්විත වන අතර එයට විභාග කාලයද ඇතුලත් වේ. පළමු සෙමෙස්තරය අවසානයේ ඉංජිනේරු පාඨමාලාව සඳහා බඳවා ගත් සියළුම සිසුන්, ඔවුන්ගේ කැමැත්ත සහ පළමු සෙමෙස්තරයේ ලබා ගත් කාර්ය සාධනය අනුව ක්ෂේත්‍ර අටකට බෙදා වෙන් කරනු ලැබේ. මෙම ක්ෂේත්‍ර අට නම් -

1. ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව
2. රසායන විද්‍යා හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව
3. සිවිල් ඉංජිනේරු විද්‍යාව
4. පරිගණක විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව
5. විදුලි ඉංජිනේරු විද්‍යාව
6. ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශන විද්‍යාව
7. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
8. ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව

ඉංජිනේරු ( භූ සම්පත් EM) පාඨමාලාවට ඇතුලත් කරගන්නා සිසුන් භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව හදාරණ අතර ඉංජිනේරු ( පේෂකර්ම හා රෙදිපිළි TM) පාඨමාලාවට ඇතුලත් කරගන්නා සිසුන් පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය හදාරනු ලැබේ.

ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සඳහා විශේෂීකරණය වූ ක්ෂේත්‍ර දහයකට අදාලව විද්‍යාගාර පුහුණුව, නිර්මාණ පුහුණුව, ක්ෂේත්‍ර පුහුණුව සහ වෘත්තීය පුහුණුව අන්තර්ගත වේ. ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව දේශීය හා විදේශීය වෘත්තීමය සංවිධාන මගින් පිළිගෙන ඇත.

ඉංජිනේරු පීඨය මගින් පිරිනමනු ලබන දෙවන උපාධි පාඨමාලාව වනුයේ මෝස්තර නිර්මාණ හා විලාසිතා නිර්මාණ පාඨමාලාවයි. මෙය වර්ෂ හතරක පූර්ණ කාලීණ පාඨමාලාවක් වන අතර තුන්වන වසරේදී වෘත්තීය පුහුණුව අන්තර්ගතවේ.

ඉංජිනේරු පීඨය මගින් පවත්වන ලබන තෙවන ගෞරව උපාධි පාඨමාලාව වනුයේ ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ පාඨමාලාවයි. මෙය වසර හතරක පූර්ණ කාලීන පාඨමාලාවක් වන අතර ඒ සඳහා සෙමෙස්තර අටක අධ්‍යන කාලයක්, වෘත්තීය පුහුණුව ද සමඟින් ඇතුලත් වේ.

**තොරතුරු තාක්ෂණ පීඨය**

තොරතුරු තාක්ෂණ පීඨය මගින් දැනට තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය සහ තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ ගෞරව උපාධිය නමින් උපාධි පාඨමාලා දෙකක් පවත්වාගෙනයනු ලබයි. මෙම පාඨමාලා දෙක සඳහා සිසුන් ඇතුලත් කරගනු ලබන්නේ මෙම අත්පොතෙහි සඳහන් කර ඇති විෂය සංකලනයන්ට අනුකූලවය. එක් එක් උපාධි පාඨමාලාව සඳහා ගතවන කාලය අධ්‍යයන වර්ෂ හතර බැගින් වේ. සිසුන්ගේ විවිධ වූ අධ්‍යාපනික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අධ්‍යයන අංශ තුනක් මෙම පීඨය තුල ක්‍රියාත්මක වේ. එම අධ්‍යයන අංශ වනුයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය, අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අංශය සහ පරිගණකමය ගණිත අධ්‍යයන අංශයයි. මෙම උපාධි පාඨමාලා දෙකෙහි, තොරතුරු තාක්ෂණයට අදාල ප්‍රධාන විෂයයන් තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය මගින් පිරිනමනු ලබයි. පරිගණකමය ගණිත අංශය මගින් එම පාඨමාලා දෙක සඳහා වැදගත් වන ගණිතය සහ ඊට අනුබද්ධ ක්ෂේත්‍ර ඔස්සේ පාඨමාලා පිරිනමනු ලබයි. මෙයට අමතරව අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අංශය මගින් කළමනාකරණය හා ඊට අනුබද්ධ විෂය මාලාවන් පිරිනමනු ලබයි.

**තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව**

දිනෙන් දින වර්ධනය වන්නාවූ තොරතුරු තාක්ෂණික වෘත්තිකයන්ගේ ඉල්ලුමට සරිලන පරිදි දැනුමෙන්, හැකියාවන්ගෙන් සහ ආකල්පමය වශයෙන් පරිපූර්ණ වූ උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින් මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. "තොරතුරු තාක්ෂණ" යන පුළුල් ක්ෂේත්‍රය යටතේ මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කොට ඇත්තේ ඉන් බිහිවන උපාධිධාරීන් නවීන තොරතුරු තාක්ෂණ ආයතන වල

රැකියාවන්හි නිරතවීමේදී එල්ලවන අභියෝග වලට සාර්ථකව මුහුණදීමේ හැකියාව වර්ධනය වන අයුරිනි. පරිගණක තාක්‍ෂණය, අත්‍යවශ්‍ය කළමනාකරණ පරිශීලනය, කාර්මික ක්ෂේත්‍රයට නැඹුරුතාව යන සියල්ලෙහිම සංකලනයක් ලෙස විද්‍යාවේදී තොරතුරු තාක්‍ෂණ ගෞරව උපාධි පාඨමාලාවේ වත්මන් විෂය මාලාව සහ එය ඉගැන්වීමේ පටිපාටිය සැකසී ඇත. මෙම උපාධි පාඨමාලාවට සිසුන් ඇතුලත් කෙරෙනුයේ අ.පො.ස.(උසස් පෙළ) භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව (භෞතික විද්‍යාව විෂයක් ලෙස) හැදෑරූ සිසුන්ය. සිසුන්ගේ තොරතුරු තාක්‍ෂණ හැකියාවන් විවිධ පැතිකඩ ඔස්සේ වර්ධනය කිරීමේ අරමුණින් අනිවාර්ය සහ ප්‍රධාන අධ්‍යයන ඒකක කිහිපයක් මුල් අධ්‍යයන වර්ෂ දෙකෙහිදී ක්‍රියාත්මක වේ. තෙවන වර්ෂය ආරම්භයේ සිට විකල්ප අධ්‍යයන ඒකක හරහා තොරතුරු තාක්‍ෂණයේ සුවිශේෂී අංශයන්ට සිසුන් නිරාවරණය කරනු ලැබේ. තෙවන අධ්‍යයන වර්ෂයෙහි දෙවන වාරය තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍ර පුහුණුවකින් සමන්විත වන අතර සිසුන්ගේ තරගකාරී හැකියාවන් වැඩිදියුණු කිරීම සහ පුළුල් පරාසයක් තුල වෘත්තීය අත්දැකීම් ලබාදීම එහි අරමුණු වේ. ඊට අමතරව, සිසුන්හට තම න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා තොරතුරු තාක්‍ෂණ අධ්‍යයන ක්ෂේත්‍ර ය හා බැඳුණු ව්‍යාපෘති වලින් ද මෙම පාඨමාලාව සමන්විත වේ. තම උසස් අධ්‍යාපනය සඳහා යොමුවීමට උනන්දුවක් දක්වන සිසුන්ට පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා ගැනීමට කේවල ව්‍යාපෘතියක් තෝරා ගත හැකිය. අවසන් වසරෙහිදී ක්‍රියාත්මක කෙරෙන අනිවාර්ය කණ්ඩායම් ව්‍යාපෘතිය තුළින් සිසුන් එතෙක් ලබා ගත් දැනුම හා හැකියාව අභියෝගාත්මක තොරතුරු තාක්‍ෂණ ගැටළු විසඳීම සඳහා යොදා ගැනේ.

## තොරතුරු තාක්‍ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

දිනෙන් දින ඉහළ යන සර්ව නිපුණ තොරතුරු තාක්‍ෂණ වෘත්තිකයින්ගේ, කළමනාකරණ සිද්ධාන්ත භාවිතයේ අවශ්‍යතාව සැපිරීම සඳහා 2010 වසරේදී මෙම ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වාදෙන ලදී. සියලු සිසුන් සඳහා තාක්‍ෂණ අධ්‍යාපනයේ තිම්වලලු පුළුල් කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව අ.පො.ස.(උසස් පෙළ) සෑම විෂය ධාරාවක් සඳහාම විවෘතව ඇත. තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ අංශයේ රැකියා අවස්ථා කඩිනමින් ලඟා කර ගැනීමට හැකි වන පරිදි අත්‍යවශ්‍ය තොරතුරු තාක්‍ෂණ දැනුමින් සහ වැඩිදියුණු කළ කළමනාකරණ නිපුණතාවන්ගෙන් මෙම පාඨමාලාව සමන්විත වේ. කළමනාකරණ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකරණය කිරීමේ අරමුණින් සැඳුම්ලත් ව්‍යාපෘතීන් මෙම උපාධි පාඨමාලාව තුල ඇතුලත් වේ. තෙවන අධ්‍යයන වර්ෂයෙහි දෙවන වාරය තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍ර පුහුණුවකින් සමන්විත වන අතර සිසුන්ගේ තරගකාරී හැකියාවන් වැඩි දියුණු කිරීම සහ පුළුල් පාරාසයක් තුල වෘත්තීය අත්දැකීම් ලබා දීම එහි අරමුණු වේ. අවසන් වසරෙහිදී ක්‍රියාත්මක කෙරෙන අනිවාර්ය කණ්ඩායම් ව්‍යාපෘතිය තුළින් සිසුන් එතෙක් ලබා ගත් දැනුම හා හැකියාව අභියෝගාත්මක තොරතුරු තාක්‍ෂණ ගැටලු විසඳීම සඳහා යොදා ගැනේ.

මෙම උපාධි පාඨමාලා ද්විත්වයම පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

## යාපනය විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| කලා | - | T |
| කළමනාකරණය | - | T/E |
| වාණිජ්‍යය | - | T/E |
| නීතිය | - | E |
| වෛද්‍ය විද්‍යාව | - | E |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | T |
| කෘෂිකර්මය | - | E |
| ජෛවීය විද්‍යාව | උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව | T/E |
| ඉංජිනේරු විද්‍යාව | - | E |
| භෞතිය විද්‍යාව | - | T/E |
| පරිගණක විද්‍යාව | - | T/E |
| හෙද | - | E |
| ඖෂධ විද්‍යාව | - | E |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | E |
| පරිවර්තන අධ්‍යයනය | - | E/T |
| ඉංජිනේරු තාක්‍ෂණවේදය (ET) | - | E |
| ජෛවපද්ධති තාක්‍ෂණවේදය (BST) | - | E |

## ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව පහත සඳහන් විශේෂීකරණයන්ගෙන් සමන්විතවේ.

- මෝටර්රථ
- ගොඩනැගිලි ඉදිකිරීම්
- ඉලෙක්ට්‍රොනික

## රුහුණ විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භා/මා |
|---|---|---|
| කලා | - | S |
| කළමනාකරණය | - | E |
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | - | E |
| ඉංජිනේරු විද්‍යාව | - | E |
| ජෛවීය විද්‍යාව | උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| ජෛවීය විද්‍යාව | රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව | E |
| ජෛවීය විද්‍යාව | රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| ජෛවීය විද්‍යාව | භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව | E |
| භෞතිය විද්‍යාව | රසායන විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව | E |
| භෞතිය විද්‍යාව | භෞතික විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව | E |
| භෞතිය විද්‍යාව | රසායන විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය | E |
| භෞතිය විද්‍යාව | භෞතික විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය | E |
| භෞතිය විද්‍යාව | රසායන විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව | E |
| භෞතිය විද්‍යාව | පරිගණක විද්‍යාව, ගණිතය, ව්‍යවහාරික ගණිතය | E |
| භෞතිය විද්‍යාව | ගණිතය, කාර්මික ගණිතය, රසායන විද්‍යාව | E |
| භෞතිය විද්‍යාව | ගණිතය, කාර්මික ගණිතය, භෞතික විද්‍යාව | E |
| ධීවර සහ සාගර විද්‍යාව | - | E |
| හෙද | - | E |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | E |
| ඖෂධ විද්‍යාව | - | E |
| පරිගණක විද්‍යාව | - | E |
| කෘෂි ව්‍යාපාර කළමනාකරණය | - | E |
| හරිත තාක්ෂණය | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |
| සාගර සහ මිරිදිය විද්‍යාව | - | E |
| ජෛව පද්ධති තාක්ෂණවේදය (BST) | - | E |
| මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය | - | E |

**මානව ශාස්ත්‍ර හා සමාජය විද්‍යා පීඨය**

මානව ශාස්ත්‍ර හා සමාජය විද්‍යා පීඨය විසින් හඳුන්වා දී ඇති උපාධි පාඨමාලා ආකෘතිය, අර්ස පදනම් කරගත් පාඨමාලා ඒකක වලින් සමන්විත සමාසික ක්‍රමය (Credits based course units semesters system) වශයෙන් නම් කෙරේ.

පීඨයේ උපාධි පාඨමාලාවන් හි ප්‍රධානතම පරමාර්ථය වනුයේ උසස් බුද්ධි මට්ටමකින් හා වෘත්තීය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ නිර්මාණශීලී වූ උපාධිධාරීන් බිහි කිරීමයි. එසේම ඔවුන් විසින් සමාජ හා ආර්ථික පරිසරයේ උන්නතිය උපරිම වන ආකාරයෙන් බුද්ධිමය දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර ඔවුන් මනා සශජවනයකින් හා උසස් බුද්ධිමය වටිනාකම්වලින් පරිපූර්ණ වූ ආදර්ශමත් ලෙස සමාජයේ කටයුතු සඳහා යොමුකිරීමක්ද අපේක්ෂා කෙරේ.

මානව ශාස්ත්‍ර හා සමාජය විද්‍යා පීඨය එහි උපාධි අපේක්ෂකයන්ට පළල් මට්ටමක උපාධි පාඨමාලා දෙකක් පවත්වාගෙන යනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය — වසර තුනකි
2. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය — වසර හතරකි

ඉංග්‍රීසි, පුරා විද්‍යාව, ඉතිහාසය, බෞද්ධ ශිෂ්ඨාචාරය, පාලි, බෞද්ධ දර්ශනය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සිංහල, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, සමාජ සංඛ්‍යානය, තොරතුරු තාක්ෂණය යන විෂයයන් උපාධි සඳහා හැදෑරිය හැකිය.

සාමාන්‍යයෙන් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි සඳහා විෂයයන් තුනකින් යුත් ඕනෑම විෂයය සංකලනයක් තෝරා ගත හැකි අතර මෙය සිසුන්ගේ ඉල්ලීම මත පීඨය මගින් වසරින් වසර තීරණය කරනු ලැබේ. ඉහත ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය විෂය හැර අනෙක් ඕනෑම විෂයයක් විශේෂවේදී උපාධි පාඨමාලාව සඳහා තෝරා ගත හැකිය. විෂයක් ලෙස ඉංග්‍රීසි හැදෑරීමට නම් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි සාහිත්‍යයට හෝ අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් (C ශ්‍රේණිය) ලබා තිබිය යුතුය. සමාජ සංඛ්‍යානය විෂය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C ශ්‍රේණිය) සාමාර්ථයක් ලබා තිබිය යුතුය. පාලි විෂය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අ.පො.ස. උසස් පෙළ සඳහා ඒ විෂය හදාරා තිබිය යුතුය. තොරතුරු තාක්ෂණය හැදෑරීම සඳහා පීඨය මගින් විභාගයක් පවත්වා සිසුන් තෝරා ගනු ලැබේ. ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පළමුස්ථල පරීක්ෂණයන්ගෙන් සමත් වී අදාළ විෂයයට ඉහල සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

උපාධි අපේක්ෂකයන්ගේ දැනුම ප්‍රථුල කිරීම සඳහා පදනම් පාඨමාලා හා පරිපූරක පාඨමාලා සිසුන්ගේ අභිමතය පරිදි තෝරා ගත හැකි අතර ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය (IT), මූලික ගණිතය, මානව ශාස්ත්‍ර හා සමාජය විද්‍යා පර්යේෂණ ක්‍රම මේ අතර වේ. මේ අතරින්

ඉංග්‍රීසි හා IT අනිවාර්ය වේ. පදනම් විෂයයන් තෝරා ගැනීමේදී ඒ සඳහා වන පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. අනෙකුත් විෂයයන් සඳහා පූර්ව අවශ්‍යතා නොමැත. තවද, දෙමළ, ප්‍රංශ, කොරියන් හා හින්දි වැනි භාෂා පිළිබඳ හැදෑරීමට අමතර පහසුකම් සලසා තිබේ. සිසුන්ගේ ඉල්ලීම මත විශේෂවේදී පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද හැදෑරීමට අවස්ථාව ඇත.

උපාධි පාඨමාලා සමාසික පදනම මත ඉගැන්වීම් කටයුතු සිදු කරන අතර විභාග අඛණ්ඩව ඇගයීම් සහ සමාසික අවසානයේ පවත්වනු ලබන විභාග යන ඇගයීම් ක්‍රම දෙකක් යටතේ සිදු කෙරේ.

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

2003 වර්ෂයේ දී පිහිටුවන ලද කළමනාකරණ හා මූල්‍ය පීඨය ශිෂ්‍ය සංඛ්‍යාව අනුව රුහුණ විශ්වවිද්‍යාලයේ දෙවන විශාලතම පීඨය වේ. (එනම් 2018 වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 1511 කි.) ගණකාධිකරණය සහ මූල්‍ය, ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය යන අධ්‍යයන දෙපාර්තමේන්තු හතරකින් කළමනාකරණ හා මූල්‍ය පීඨය සමන්විත වේ. කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් පිරිනමනු ලබන බීබීඒ (ගෞරව) උපාධි පාඨමාලාවන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF)-6 වන මට්ටමට සමාන වන අතර, ඒ සෑම උපාධි පාඨමාලාවක්ම වසර හතරක් තුළ පිරිනමන අර්ස (credit) 120 කින් සමන්විත වේ. පීඨය විසින් 2001 වර්ෂයේදී විෂය ඒකක පදනම් කරගත් උපාධි පාඨමාලා හඳුන්වා දුන් අතර, සෑම උපාධි පාඨමාලාවක්ම අනිවාර්ය සීමාවාසික ප්‍රායෝගික පුහුණුවකින් සහ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතියකින් සමන්විත වේ. සෑම උපාධි පාඨමාලාවක ම විෂය නිර්දේශය අදාළ ක්ෂේත්‍ර වල තත්කාලීන වර්ධනයන්ට ගැලපෙන, නව්‍යතම විෂය ඒකක වලින් පොහොසත් වේ.

**කළමනාකරණ මූල්‍ය පීඨය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා**

**ව්‍යාපාර පරිපාලනවේදී ගිණුම්කරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)**

ව්‍යාපාර පරිපාලනවේදී ගිණුම්කරණය පිළිබඳ උපාධි පාඨමාලාව, දේශීය මෙන්ම විදේශීය වශයෙන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සාර්ථක ගිණුම්කරණ වෘත්තියක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා, නිපුණතා සහ වෘත්තිය දැනුම සහිත ගුණාත්මක උපාධිධාරීන් බිහිකිරීම සඳහා නිර්මාණය කර ඇත. මේ අනුව වෙනස් වන ව්‍යාපාර ලෝකය තුළ ආයතන මෙහෙයවීමේ හැකියාවන් වර්ධනය කිරීමට සිසුන්ට අවශ්‍ය වන ප්‍රායෝගික අංග ඇතුළත් නව්‍යතම විෂය ඒකක සමූහයකින් මෙම උපාධි පාඨමාලාව සමන්විත වේ. ඒ අතර සීමාවාසික ප්‍රායෝගික පුහුණුව, පර්යේෂණ ව්‍යාපෘති, අඛණ්ඩ ඇගයීම් වලට අනුයුක්තව ක්ෂේත්‍ර කටයුතු ප්‍රධාන තැනක් ගනී. තවද දෙපාර්තමේන්තුව විසින් ශිෂ්‍ය කව සහ සංගම් පිහිටුවීම මගින් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන අතර එමගින් නිර්මාණශීලිත්වය, දැනුම හුවමාරු කර ගැනීම, නවෝත්පාදනය කෙරෙහි සිසුන් දිරිමත් කරයි. අවසාන වශයෙන් මෙම උපාධි පාඨමාලාවේ උපාධිධාරීන් හට ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන් විශිෂ්ඨ වෘත්තීය අවස්ථාවන් ඇති අතර රැකියා ආයතන තුළ හා සමාජය තුළ සුවිශේෂී වටිනාකමක් නිර්මාණය කිරීමේ හැකියාව ද ඇත.

**ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)**

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව මගින් ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රය තුළ වර්තමාන හා නැගී එන ව්‍යාපාර අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය දැනුම, කුසලතා හා නිපුනතා සහිත උපාධිධාරීන් බිහිකිරීමට අපේක්ෂා කරයි. මෙය අර්ස (credit) 120 ක් සහිත සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාවක් වන අතර ව්‍යාපාර කළමනාකරුවන් ලෙස සිය වෘත්තීය ජීවිතය දියුණු කර ගැනීමට අපේක්ෂා කරන උපාධි අපේක්ෂකයින් බිහිකිරීම මෙම පාඨමාලාවේ අරමුණ වේ. ඒ සඳහා අනිවාර්ය පර්යේෂණ අංගයකින් සහ ව්‍යාපාර කළමනාකරණයේ සීමාවාසික ප්‍රායෝගික පුහුණුවකින් මෙම පාඨමාලාව සමන්විත වේ. තවද මෙම උපාධි පාඨමාලාව ව්‍යාපාරික පරිසරය තුළ විකල්ප අවස්ථා ඇගයීම සඳහා අවශ්‍ය සංඛ්‍යාත්මක කුසලතා සහ ගැටළු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. එමගින් සිසුන්ට ව්‍යාපාර කළමනාකරණය සඳහා ව්‍යාපාරික අවස්ථා අවබෝධ කර ගැනීමට සහ ඇගයීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ වෘත්තීය නිපුනත්වය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. අවසාන වශයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරියා හට ඉහළ විශිෂ්ඨත්වයක්, හා වෘත්තීයමය බවක් සහිත පුළුල් පරාසයක් තුළ විහිදුනු රැකියා අවස්ථා රාශියක් විදේශීය හා දේශීය වශයෙන් හිමිය.

**ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්වය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)**

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධියේ අරමුණ වනුයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙන් හා පවත්වාගෙන යාමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සුවිශාල දායකත්වයක් ලබා දිය හැකි මනා ව්‍යවසායකත්ව ගුණාංග සහිත සිසුන් පිරිසක් බිහිකිරීමයි. ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි මූලික සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා පළමු අධ්‍යයන වාර තුනේදී පොදු විෂය මාලාවකින්ද අවසාන අධ්‍යයන වාර පහේදී විශේෂ ක්ෂේත්‍රයන් ඔස්සේ පුළුල් ප්‍රායෝගික හැදෑරීමකින්ද මෙම පාඨමාලාව සමන්විත වේ. පළමු අධ්‍යයන වාර තුන අවසානයේදී , පීඨය විසින් කලින් නියම කරන ලද අවශ්‍ය නිර්ණායක සපුරාලන සිසුන් ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධිය හැදෑරීමට සුදුසුකම් ලබයි.

ව්‍යාපාර පරිපාලනවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධිය හැදෑරීම තුළින් සිසුන්ට අධ්‍යනාංශය විසින් කර්මාන්තායතන සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනුලබන වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා සහ බාහිර පුහුණුවන් වැනි විවිධ ක්‍රියාකාරකම් තුළින් ව්‍යවසායකත්ව විනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් ලබා ගත හැකිය. එම ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට ඔවුන්ගේ අන්තර් පුද්ගල, සන්නිවේදනය සහ කණ්ඩායම් ගොඩනැගීමේ හැකියාව වර්ධනය කර ගත හැකිය.

**ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය (SLQF 06)**

ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය සැලසුම් කර ඇත්තේ නූතන ව්‍යාපාරික ආයතනයන්හි අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් දැනුමක් සහිත කුසලතා සහ නිපුණතාවලින් හෙබි ඉහළ රැකියා නියුක්තියකින් යුතු මානව සම්පත් කළමනාකරණ උපාධිධාරීන් බිහි කිරීම සඳහාය. ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි මූලික සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක්

ලබා දීම සඳහා පළමු අධ්‍යයන වාර තුනේදී පොදු විෂය මාලාවකින්ද අවසාන අධ්‍යයන වාර පහේදී විශේෂ ක්ෂේත්‍රයන් ඔස්සේ පුළුල් ප්‍රායෝගික හැදෑරීමකින්ද මෙම පාඨමාලාව සමන්විත වේ. පළමු අධ්‍යයන වාර තුන අවසානයේදී , පීඨය විසින් කලින් නියම කරන ලද අවශ්‍ය නිර්ණායක සපුරාලන සිසුන් ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය හැදෑරීමට සුදුසුකම් ලබයි.

ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය හැදෑරීම තුළින් සිසුන්ට අධ්‍යනාංශය විසින් කර්මාන්තායතන සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කරනු ලබන වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා සහ බාහිර පුහුණුවන් වැනි විවිධ ක්‍රියාකාරකම් තුළින් මානව සම්පත් කළමනාකරණයේ හොඳම භාවිතයන් සහ නවීන ප්‍රවණතා ගවේෂණය කළ හැකිය. එම ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට ඔවුන්ගේ අන්තර් පුද්ගල, සන්නිවේදනය සහ කණ්ඩායම් ගොඩනැගීමේ හැකියාවන් වර්ධනය කර ගත හැකිය.

**ව්‍යාපාර පරිපාලනවේදී අලෙවිකරණය පිළිබඳ ගෞරව උපාධිය. (SLQF 06)**

පරිපූර්ණ අලෙවි වෘත්තිකයන් බිහි කිරීමේ අභිමතාර්ථයෙන්, 2008 වර්ෂයේදී, අලෙවිකරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ව්‍යාපාර පරිසරයේ සිදුවන නිරන්තර වෙනස්වීම් මත, මනා දැනුමින් හා හැකියාවන්ගෙන් යුත් අලෙවිකරණ වෘත්තිකයෙකුට වන ඉල්ලුම අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. එම අවශ්‍යතාවයන්ට සුදුසු උපාධිධාරියෙකු බිහි කිරීමට මනා හැකියාවන්ගෙන් හා ඉහළ ගුණාත්මක දැනුමින් යුත් ආචාර්ය මණ්ඩලයකින් දෙපාර්තමේන්තුව සමන්විත වන අතර, තම දැනුම දේශන, පර්යේෂණ, උපදේශන සේවා හා වෘත්තීමය හා ක්‍රමසම්පාදන සේවා යන විවිධ තලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා සමාජය තුළ බෙදා හරිමින් සිටී. තවදුරටත් දෙපාර්තමේන්තුව බිහි කළ හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ විද්‍යාර්ථයන් දේශීය හා විදේශයන්හි එක ලෙස තම දායකත්වය ලබා දෙමින් සිටී. දෙපාර්තමේන්තුවේ සිසුන් අධ්‍යයන කටය හරහා විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියක නිරත වන අතර, ඒ තුළින් ඔවුන් තම අධ්‍යයන හැකියාවන් ඔප්නංවා ගැනීම පමණක් නොව, ඔවුන්ගේ සමාජ වගකීම පිළිබඳ හැඟීම වර්ධනය තුළින් පරිපූර්ණ උපාධිධාරියෙකු බවට පත්වේ.

**විද්‍යා පීඨය**

**විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය සහ විශේෂ)**

එක් අධ්‍යයන වර්ෂයක් සති පහලොව (15) බැගින් යුතු සමාසික දෙකකින් යුක්ත වේ. දැනට භාවිත වන විෂය පාඨමාලා ඒකකයන්, අර්ස මූලික ඇගයුම් ක්‍රමයක් පදනම් කර ගනී. උපාධි පාඨමාලාව ආරම්භයේදීම ශිෂ්‍යයන් තම අභිමතය පරිදි විෂය සංයෝජනයන් තෝරා ගත යුතුය. පළමු සහ දෙවන වසර වලට නියමිත පදනම් පාඨමාලා ඒකක හැදෑරීම ඔවුන්ට අනිවාර්ය වේ. පීඨයෙන් සහ දෙපාර්තමේන්තු මගින් දෙවන සහ තෙවන වසර වලදී පිරිනැමෙන වෛකල්පිත පාඨමාලා ඒකක තම වෘත්තීය අපේක්ෂණයන්ට ගැලපෙන පරිදි තෝරා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ඇත. බොහෝ වෛකල්පිත විෂයයන් භෞතික විද්‍යා සහ ජීව විද්‍යා විෂය ක්ෂේත්‍ර දෙකටම පොදුය. පීඨයෙන් පිරිනැමෙන ඇතැම් වෛකල්පිත විෂය ඒකකයන් පහත සඳහන් වෙයි.

ඉලෙක්ට්‍රොනික විද්‍යාව (Electronics), ක්ෂුද්‍රපාලක සහ ඒවායේ භාවිතය (Microcontrollers and applications), පරිගණකමය භෞතික විද්‍යාව (Computational Physics), තාරකා විද්‍යාව සහ විශ්ව න්‍යාය විද්‍යාව (Astronomy and Cosmology), කළමනාකරණය (Management), ගිණුම්කරණය (Accounting), අලෙවිකරන කළමනාකරණය (Marketing Management), පර්යේෂන ව්‍යාපෘති ( (Research Project), පර්යේෂණ ක්‍රම විද්‍යාව (Research Methodology), කථනය සහ සන්නිවේදනය (Speech and Communication), ශාරීරික යෝග්‍යතාව සහ සෞඛ්‍ය කළමනාකරණය (Physical Fitness and Health Management), විද්‍යාත්මක ලේඛණය සහ සන්නිවේදනය (Scientific writing and Communication), ප්‍රවේනික ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණය(Genetic Engineering and Biotechnology), උසස් පරිසර විද්‍යාව (Advanced Environment Technology), උද්‍යාන විද්‍යාව - මල් වගාව සහ භූ දර්ශනය (Horticulture Floriculture and Landscape), වන විද්‍යාව (Forestry), ආහාර තාක්ෂණය (Food Technology), ව්‍යවහාරික කීට විද්‍යාව (Applied Entomology), ප්‍රතිශක්තිකරණ විද්‍යාව (Immunology), ජලජීවී විද්‍යාව (Aquaculture), පරපෝෂී විද්‍යාව (Parasitology), පක්ෂි විද්‍යාව (Ornithology), ජෛව ආචාර ධර්ම (Bioethics), ආර්ථික විද්‍යාවේ ගණිතමය ක්‍රම හඳුන්වා දීම (Introductory Mathematical Methods in Economics), නියුරෝන ජාලයන් පිළිබඳ න්‍යාය සහ භාවිතය (Theory and applications of Neural Networks), දෘශ්‍ය ක්‍රමලේඛනය (Visual Programming), පරිගණක දෘඩාංග සහ ජාලකරණය (PC Hardware and Networking), පද්ධති සහ ජාල පරිපාලනය (System and Network Administration), කාර්මික රසායන විද්‍යාව (Industrial Chemistry), පාරිසරික රසායන විද්‍යාව (Environment Chemistry).

මීට අමතරව, පරිගණක විද්‍යාව විෂයයක් ලෙස හදාරණු නොලබන භෞතික විද්‍යා ශිෂ්‍යයන් සහ සියලුම ජීව විද්‍යා ශිෂ්‍යයන් පරිගණක සාක්ෂරතාව පිළිබඳ පාඨමාලාව (Computer Literacy Course - CLC) ඔවුන්ගේ ප්‍රථම වසරේදී හැදෑරිය යුතු වේ. එම CLC පාඨමාලාවෙන් විශිෂ්ට කුසලතා පෙන්වන ශිෂ්‍යයෝ ඔවුන්ගේ දෙවන වසරේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in Information Technology - CCIT) හැදෑරීමට සුදුසුකම් ලබා ගනිති.

උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන අංශ විසින් පවත්වන විශේෂවේදී උපාධි පාඨමාලාවන් පිරිනැමෙන්නේ පළමු සහ දෙවන වසර විභාග වලදී විශිෂ්ට දක්ෂතා දැක්වූ ශිෂ්‍යයන්ට පමණි. (විශේෂවේදී උපාධි පිරිනැමෙන්නේ තෙවන සහ සිව්වන වසර වලදීය). අධ්‍යයන සහ / හෝ පර්යේෂණ අංශ වලට සම්බන්ධ වෘත්තීය අවස්ථා ලබා ගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් මෙම වැඩසටහන් ඉලක්ක කර ගනිමින් කටයුතු කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

සියලුම ශිෂ්‍යයන් ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගැනීම සඳහා වන නිර්දේශිත පාඨමාලා හැදෑරිය යුතු වේ. පාඨමාලා ඒකක සහ අනෙකුත් සම්පත් / පහසුකම් පිළිබඳ වැඩිදුර විස්තර http:/www.ruh.ac.lk විශ්වවිද්‍යාලයීය අන්තර්ජාල අඩවියෙහි සඳහන් වේ.

**BCS පරිගණක විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය සහ විශේෂ)**

මේ සඳහා විශේෂ එළඹුමකින්ද ශිෂ්‍යයන් බඳවා ගනු ලැබේ. වසර තුනක කාලයක් තිස්සේ (BCS) පරිගණක විද්‍යාවේදී උපාධි අපේක්ෂකයෝ පරිගණක විද්‍යාවේ විවිධ පැතිකඩ හදාරති. ප්‍රථම වසර තුන තුළ සුවිශේෂ දක්ෂතා දක්වන ශිෂ්‍යයෝ පරිගණක විද්‍යාවේදී (විශේෂ) උපාධියට නියමිත උසස් පාඨමාලාවන් (Advanced Courses) හැදෑරීම සඳහා අතිරේක අධ්‍යයන වසරක් වෙනුවෙන් තෝරාගනු ලැබෙති.

## වෛද්‍ය පීඨය

රුහුණ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටුවා ඇති එකම වෛද්‍ය විද්‍යාලයයි. වර්ෂ 1980 දී ආරම්භ කෙරුණු මෙම වෛද්‍ය පීඨය ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම වෛද්‍ය විද්‍යාලයක් බවට පත්වීම සඳහා දිගු ගමනක නියැලිණි. ශ්‍රී ලංකාවේ අනෙකුත් වෛද්‍ය විද්‍යාලවලින් බිහිවන උපාධිධාරීන්ට නොදෙවෙනි ගුණාත්මක භාවයෙන් යුතු උසස් වෛද්‍ය උපාධිධාරීන් රටට දායාද කර ඇත.

මෙම පීඨය; කාය ව්‍යවච්ඡේද විද්‍යා, ජෛව රසායන විද්‍යා, ප්‍රජා වෛද්‍ය විද්‍යා, අධිකරණ වෛද්‍ය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා, ධාත්‍රික ගුත හා නාරීවේද විද්‍යා, ළමා රෝග විද්‍යා, පරපෝෂවේද විද්‍යා, ව්‍යාධි විද්‍යා, ඖෂධවේද විද්‍යා, කායික විද්‍යා, මනෝ විද්‍යා, ශල්‍ය විද්‍යා සහ නිර්වින්දන විද්‍යා යන අධ්‍යයනාංශ පහළොවකින් සමන්විත වේ.

මීට අමතරව, දේශන ශාලා, නිබන්ධන කාමර, විද්‍යාගාර, සායනික පුහුණු විද්‍යාගාරය, සායන, තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, පුස්තකාල පහසුකම්, ආපනශාලාව, ක්‍රීඩාගාරය, ක්‍රීඩා භූමිය සහ විශාල ශ්‍රවනාගාරයකින් සමන්විත යටිතල පහසුකම් පීඨයට ඇතුළත්වේ.

පීඨය මගින් ශිෂ්‍ය ආධාරක සේවා දවස පුරාම ක්‍රියාත්මක කෙරේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් 560 දෙනෙකු සඳහා ප්‍රමාණවත් ලෙස නේවාසික පහසුකම් පීඨ සංකීර්ණය තුළම ලබා දී ඇත.

## සම සෞඛ්‍ය විද්‍යා පීඨය

රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් 2008 වර්ෂයේ දී හෙද විද්‍යා, වෛද්‍ය රසායනාගාර විද්‍යා සහ ඖෂධවේද යන විෂය ක්ෂේත්‍රයන් උදෙසා උපාධිධාරීන් පුහුණු කිරීම පිණිස සම සෞඛ්‍ය උපාධි පාඨමාලා වැඩසටහන මුලාරම්භ කරන ලදී. දශක ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තියුණු අවශ්‍යතාවයක්ව පැවති සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි වෙනස්වන ප්‍රවනතාවයන් සමඟ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි දර්ශකයන් ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණු වලින් සමන්විත සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් බිහිකිරීමේ අරමුණු පෙරදැරිව ඉහත උපාධි පාඨමාලාවන් ආරම්භ කරන ලදී. ජාතික මෙන්ම අන්තර්ජාතික රැකියා වෙළඳපොළට ප්‍රවේශවීමේ හැකියාවන් මුදුන්පත් කර ගැනීමට හැකිවන පරිදි ඉහත උපාධි පාඨමාලාවන් සැලසුම් කර ඇත.

වර්ෂ 2017 සැප්තැම්බර් මාසයේ දී ඉහත උපාධි පාඨමාලාවන් රුහුණු විශ්වවිද්‍යාලයේ අභිනව සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙය දක්ෂිණ ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති එකම සම සෞඛ්‍ය විද්‍යා පීඨයයි. රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය දැනට අධ්‍යයන අංශ තුනකින් සමන්විත වන අතර, එමගින් ඒවායේ විෂය පථයට අනුකූලව විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර (ගෞරව) උපාධිය, ඖෂධවේද (ගෞරව) උපාධිය පිරිනමනු ලැබේ. මෙම සියළු උපාධි පාඨමාලාවන් ඉගැන්වීම් හා විභාග කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, ඒ සියල්ල සම්මාන 120 කින් සමන්විත වේ. මේ සියළු උපාධි පාඨමාලාවන් සිව් අවුරුදු පාඨමාලාවන් වන අතර, ඒවාහි විෂය මාලා, ශ්‍රී ලංකා යෝග්‍යතා නිරණ මාර්ගෝපදේශයට ගැලපෙන ලෙස හා අත්‍යාවශ්‍ය වන්නා වූ ක්ෂේත්‍ර පර්යේෂණ ව්‍යාපෘතිය සහ අනුරූපී පුහුණු වැඩසටහන්ගෙන් (රෝහල්, සායනික, ප්‍රජා හා කර්මාන්ත ආශ්‍රිත) සමන්විත වේ.

මෙම පීඨයට අනුබද්ධව නුදුරු අනාගතයේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ නව උපාධි පාඨමාලාවන් හා පශ්චාත් උපාධි පාඨමාලාවන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

## ඉංජිනේරු පීඨය

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මගින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සිව් වාර්ෂික පූර්ණ කාලීන පාඨමාලාවක් වන්නේය. එක් අධ්‍යයන වර්ෂයකට සමාසික දෙක බැගින් සමාසික අටක් සඳහා අධ්‍යයන කටයුතු සංවිධානය කර ඇත. ඉංජිනේරු උපාධි පාඨමාලාව ආරම්භයේදී ඒ සඳහා මූලාරම්භයක් වශයෙන් පරිගණක භාවිතය, ඉංග්‍රීසි භාෂාව සහ සමාජ අවබෝධය සඳහා වන කෙටි පාඨමාලා ඇතුළත් ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වනු ලැබේ. ඉංජිනේරු උපාධි පාඨමාලාවෙහි ප්‍රථම සමාසික දෙක සියළුම උපාධි අපේක්ෂකයන් සඳහා අනිවාර්ය පොදු පාඨමාලාවක් වන අතර තෙවන සමාසිකයෙහි සිට උපාධි අපේක්ෂකයන්ගේ අභිමතය හා ඔවුන් විසින් පළමු සමාසික දෙක අවසානයෙහි ලබාගන්නා වූ ප්‍රවණතාවය පදනම් කර ගනිමින් පහත සඳහන් විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලාවක් හැදෑරීම සඳහා උපාධි අපේක්ෂකයන්ට අවස්ථාව හිමිවේ.

1. සිවිල් හා පාරිසරික ඉංජිනේරු
2. විදුලි හා තොරතුරු ඉංජිනේරු
3. යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු
4. නාවික ඉංජිනේරු හා නාවික නිර්මාණ ශිල්පය

ඉහත විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලාවන් දැනට පීඨයේ ස්ථාපිත කර ඇති සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය, විදුලි හා තොරතුරු ඉංජිනේරු අධ්‍යයනාංශය හා යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ මගින් පවත්වාගෙන යනු ලැබේ.

ගණිතය, ඉංජිනේරු විද්‍යාව හා ඉංජිනේරු නිර්මාණ ශිල්පය යන විෂය ක්ෂේත්‍රයන් කේන්ද්‍රීය කරගත් දැනුම හා කුසලතාව වර්ධනය කිරීමේ විශේෂිත වූ අධ්‍යාපන ක්‍රමවේදයක් අනුගමනය කරමින් ඉංජිනේරු විද්‍යාවේදී උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව අනිවාර්යය විෂයයන්ගෙන්, තාක්ෂණික වෛකල්පිත විෂයයන්ගෙන් හා සාමාන්‍ය වෛකල්පිත විෂයයන්ගෙන් සමන්විත වන අතර අධ්‍යයන කාලය තුළ කාර්මික පුහුණුවක්ද සම්පූර්ණ කළ යුතු වේ.

ඉහත සඳහන් කළ සියළුම අධ්‍යයනාංශ මගින් දැනට පවත්වාගෙන යනු ලබන විශේෂීකරණ ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා වෘත්තීමය ඉංජිනේරු විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා වන අන්තර් ජාතික පිළිගැනීමේ සම්මුතිය වන වොෂින්ටන් සම්මුතියට (Washington Accord) අනුකූලව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි (IESL) කොන්දේසි විරහිත සම්පූර්ණ අනුමැතිය ලැබී ඇත. එබැවින් සම්මුතියේ සාමාජිකත්වය දරන ඕස්ට්‍රේලියාව, කැනඩාව, තායිවානය, හොංකොං, අයර්ලන්තය, ජපානය, කොරියාව, මැලේසියාව, නවසීලන්තය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය හා ඇමරිකාව වැනි අනිකුත් රටවල් මගින් පීඨයේ උපාධිලාභීන් ඉංජිනේරු වෘත්තියේ යෙදීම සඳහා වන අධ්‍යාපනික සුදුසුකම් සපුරා ඇති බව පිළිගනු ලබයි.

ඉහත සඳහන් සියළුම අධ්‍යයනාංශ තම ඉංජිනේරු පාඨමාලාවට අදාළ වන කර්මාන්ත වෘත්තීමය සංවිධාන හා රාජ්‍ය දෙපාර්තමේන්තු සමඟ කාර්මික උපදේශන කමිටුව හරහා ඉතා ශක්තිමත් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගනු ලැබේ. මෙම උපාධි පාඨමාලා ආරම්භයේදී මෙන්ම පවත්වාගෙන යෑමේදී කාර්මික උපදේශන කමිටුවේ සාමාජිකයන් ලෙස ඉංජිනේරු සේවායෝජකයන්ගේ සහ වෘත්තීයවේදීන්ගේ දායකත්වය ලැබේ. ඔවුන්ගේ සහභාගීත්වය හේතුවෙන් ඉංජිනේරු උපාධිධාරී සේවායෝජකයන්ගේ අවශ්‍යතාවලට මෙන්ම ඉංජිනේරු උපාධිධාරීයකු සතුවිය යුතු අනෙකුත් කුසලතා වර්ධනය වන අයුරින් අධ්‍යයන පාඨමාලාවන් පවත්වාගෙන යාමට හැකි වී ඇත.

ඉහත සඳහන් විශේෂීකරණ ඉංජිනේරු පාඨමාලා සඳහා තෝරාගනු ලබන සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය අභිමතාර්ථ සපුරා ගැනීම සහ පහත සඳහන් ඉංජිනේරු වෘත්තිකයකු වීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍ර ප්‍රගුණ කිරීමේ අවස්ථාව ලැබේ.

| සිවිල් හා පාරිසරික ඉංජිනේරු | විදුලි හා තොරතුරු ඉංජිනේරු | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු | නාවික ඉංජිනේරු හා නාවික නිර්මාණ ශිල්පය |
|---|---|---|---|
| • සිවිල් ඉංජිනේරු<br>• වෙරළ හා ජලාශ්‍රිත ඉංජිනේරු<br>• පාරිසරික ඉංජිනේරු<br>• භූ විද්‍යාත්මක ඉංජිනේරු<br>• ප්‍රවාහන හා මහාමාර්ග ඉංජිනේරු<br>• ව්‍යුහාත්මක ඉංජිනේරු | • විදුලි ඉංජිනේරු<br>• ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු<br>• දත්ත ජාලකරණ ඉංජිනේරු<br>• විදුලි සංදේශක ඉංජිනේරු<br>• මෘදුකාංග ඉංජිනේරු | • යාන්ත්‍රික ඉංජිනේරු<br>• ගොඩනැගිලි සේවා ඉංජිනේරු<br>• ද්‍රව්‍යය ඉංජිනේරු<br>• යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු<br>• නිෂ්පාදන හා නිපැයුම් ඉංජිනේරු | • නාවික ඉංජිනේරු<br>• නාවික නිර්මාණ ඉංජිනේරු |

ඉහත සඳහන් කළ අධ්‍යයනාංශ තුන මගින් උගන්වනු ලබන තාක්ෂණික විෂයන්ට අමතරව විෂයාන්තර අධ්‍යයනාංශය මගින් ඉංජිනේරු ගණිතය, කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සෞන්දර්යය හා ඉංජිනේරු ආචාරධර්ම යනාදී පුළුල් පරාසයකින් යුතු විෂයන් වොෂින්ටන් සම්මුතියේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) නිර්දේශයන්ට අනුකූලව උගන්වනු ලබයි.

පීඨයේ උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීයකු හට අප පීඨයේ හෝ වෙනත් ඕනෑම පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක, විද්‍යාපති, විද්‍යාශූරී හෝ ආචාර්ය උපාධි (M. Sc., M.Phil or Phd) හැදෑරීම සඳහා ඇතුළත් වීමට අවස්ථාව සළසා ගත හැක.

## තාක්ෂණ විද්‍යා පීඨය

තාක්ෂණ විද්‍යා පීඨය ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය, ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය සහ බහුවිෂයයික අධ්‍යයනාංශය ලෙස අධ්‍යයනාංශ හතරකින් සමන්විත වේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ තාක්ෂණ විෂයය ධාරාව හදාරණ ලද සිසුන්හට පහත දැක්වෙන සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා තාක්ෂණ පීඨය විසින් ඉදිරිපත් කරනු ලබයි.

1. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
3. ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව

මෙම සෑම උපාධි පාඨමාලාවක්ම සති 15 කින් සමන්විත සමාසික අටකින් යුක්ත වේ. සෑම උපාධි පාඨමාලාවක්ම අවම වශයෙන් සම්භාර 120 කින් සමන්විත වන අතර සෑම උපාධි පාඨමාලාවක්ම මාස හයක කර්මාන්තගත පුහුණු කාලයකින්ද සමන්විත වේ. බහු විෂයයික අධ්‍යයනාංශය විසින් උපාධි පාඨමාලා ද්විත්වයටම අවශ්‍යවන සම්බන්ධිත විෂය ඒකක පිරිනමනු ලබයි. සෑම උපාධි පාඨමාලාවක්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු කෙරෙන අතර විෂය ඒකක පිළිබඳ විස්තර රුහුණ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

## කෘෂිකර්ම පීඨය

රුහුණ විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය 1978 වසරේදී පිහිටුවන ලදුව, වර්තමානය වන විට දකුණුදිග ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අධ්‍යාපනයේ සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය බවට පත්වී ඇත. අධ්‍යනාංශ හතකින් සමන්විත මෙම පීඨය, විද්‍යාත්මක, තාක්ෂණික, කළමනාකරණ, ආර්ථික, පාරිසරික සහ සමාජයීය මූලධර්ම උපයෝගී කරගනිමින් ආහාර, සත්වාහාර, කෙඳි සහ ඉන්ධන (ජෛව) ආශ්‍රිත වැඩිවන විශ්ව අවශ්‍යතා සපුරාලීමට දායක විය හැකි විවිධත්වයකින් යුතු හා අභියෝගාත්මක වෘත්තිකයන් බිහිකරනු ලබන්නේ, කෘෂි විද්‍යා ක්ෂේත්‍රය තුළ සාම්ප්‍රදායික බෝග වගාව සහ සත්ව පාලනය යන ප්‍රධාන විෂය ධාරාවෙන් ඔබ්බට විහිදී ගිය ප්‍රායෝගික දැනුමෙන් විද්‍යාර්ථීන් පෝෂණය කරමිනි. මෙම අවශ්‍යතා මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් රුහුණු විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය පහත නම් සඳහන් උපාධි පාඨමාලා තුන පිරිනමනු ලබයි.

1. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Agricultural Resource Management & Technology)
2. කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Agribusiness Management)
3. හරිත තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in Green Technology)

කෘෂි විද්‍යා, පරිසර හා සම්පත් කළමනාකරණ ක්ෂේත්‍ර හා සබැඳෙන අනාගත නායකයින් වෙත උචිතතා අධ්‍යාපනික අවබෝධය මෙන්ම නිසි පුහුණුව, සමාජ ආචාරධර්මවලින් ඔවුන් සවිබල ගන්වමින් සහ ප්‍රජාව තුළ මනා බුද්ධිමය දැක්මකින් යුතු වෘත්තිකයන් බිහි කිරීම මෙම උපාධි පාඨමාලාවන්ගේ ප්‍රධානතම අභිලාෂය වේ. උපාධි පාඨමාලාවන් තුනෙහිම අන්තර්ගත විෂය මාලා මගින් උපාධිධාරීන්ට වෙළඳපල වටිනාකමක් සහිත අත්දැකීම් සහ අනාගත කෘෂිකාර්මික ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය හැඩගැන්වීම ලබා දෙනු ලබයි. ක්ෂේත්‍රයට අදාළ නිසි දැනුම සහ පුහුණුව සහිත විශේෂඥ වෘත්තිකයන් විසින් සිදුකරනු ලබන දේශන සහ විද්‍යාගාර සැසි ඇතුළුව වෘත්තීමය පුහුණු, ක්ෂේත්‍ර චාරිකා, උපදේශන සහ ආගන්තුක දේශකයින් මෙහෙයවන පාඨමාලා තුළින් මෙම ගුරුව නිරන්තරයෙන් බෙදා දෙනුලබයි.

## 1. කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

මෙම උපාධි පාඨමාලාව වසර හතරක (සමාසික 8) විශේෂවේදී ගෞරව (SLQF 06 වන මට්ටම) උපාධියක් වන අතර මනා සුදුසුකම් සහිත විද්වත් ආචාර්ය මණ්ඩලයක් මගින් පෘථුල පරාසයක විෂය මාලාවක් ආවරණය කරණුලබයි. සාම්ප්‍රදායික සහ ගතානුගතික කෘෂිකාර්මික ක්‍රමෝපායන් වෙනුවට, නවීන තාක්ෂණය සහ කළමනාකරණයට අදාළ දැනුම, ප්‍රායෝගික වැඩ ලෝකයට ගැලපෙන අත්දැකීම් සහ ක්ෂේත්‍ර පර්යේෂණ තුළින් අප උපාධිධාරීන්ට හිමිවේ. මානව සංහතියේ යහ පැවැත්ම සඳහා, දේශීය, ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ආහාර, කෙඳි හා පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනයේදී පරිසර සම්පත් පිළිබඳ අවධානය සලකමින් කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ඉතා සැලකිල්ලෙන් නිර්මාණය කර ඇත. වර්තමාන ලෝකයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් මෙම සම්පූර්ණ පාඨමාලාවම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදුකරනු ලබයි. ශෂ්‍ය විද්‍යාව, කෘෂි - පරිසර විද්‍යාව, තිරසාර කෘෂිකර්මාන්තය, වන කළමනාකරණය, අපනයන බෝග, වගා බෝග, ක්ෂේත්‍ර බෝග සහ එළවළු නිෂ්පාදන තාක්ෂණය, බෝග හුවමාරු සහ බෝග පර්යේෂණ, අලංකරණ බෝග, ක්ෂුද්‍ර හා සාර්ව ආර්ථිකය, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, කෘෂි අලෙවිකරණය, ආහාර ජෛව රසායනය සහ පෝෂණය, ආහාර පරිරක්ෂණ තාක්ෂණය, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව, ශාක කායික විද්‍යාව, ජාන තාක්ෂණය හා ශාක අභිජනනය, ශාක ආරක්ෂණය, තිරසාර කසල කළමනාකරණය, කෘෂි යාන්ත්‍රිකරණය, කාලගුණ විද්‍යාව හා කාලගුණික වෙනස්වීම් පෙරැයීම, පසු අස්වනු තාක්ෂණය, බෝග ජලසම්පාදනය හා ජල කළමනාකරණය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා ඇතුළත් විෂය මාලාවක් නිසි ඇගයීම් පටිපාටියක් සමඟ ඉගැන්වෙනු ලබයි. සෑම විද්‍යාර්ථියෙකුටම ඔවුන්ගේ අවසන් වසරේදී කීර්තිමත් වෘත්තීය ආයතනයක් හෝ කර්මාන්තයක් ආශ්‍රිත දෙමාසික වෘත්තීමය පුහුණුවක් සහ සය මාසික පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීම අනිවාර්ය වේ. මෙලෙස වැඩ ලෝකයට හැඩගැසෙන උපාධිධාරීන් ජාත්‍යන්තර වශයෙන් මෙන්ම ජාතික තලයේදී දීප්තිමත් සහ සාර්ථක වෘත්තීය අවස්ථාවන්ට හිමිකම් කියන බව විශ්වාසයෙන් සඳහන් කරමු.

## 2. කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව සිව් අවුරුදු (සමාසික 8 ක) විශේෂ ගෞරව උපාධි (SLQF 06 වන අදියර හා සමාන) පාඨමාලාවක් වන අතර මනා සුදුසුකම් ලත් විද්වත් ආචාර්ය මණ්ඩලයක් යටතේ පුළුල් පරාසයක පැතිරෙන විෂය ක්ෂේත්‍ර ගණනාවක් හා ඊට අදාළ න්‍යායාත්මක දැනුම ආවරණය කරනුලබන්නකි. ඊට අමතරව මෙම උපාධි පාඨමාලාව තුළින් ප්‍රායෝගික කුසලතා හා සබැඳුණු ක්ෂේත්‍ර පර්යේෂණ හරහා උපාධිධාරීන්හට ව්‍යවසායකත්ව හා ව්‍යාපාර කළමනාකරණ අංශයන්හි දොරටු විවර කර දෙයි. මේ හරහා උපාධි අපේක්ෂක සිසුන්ට මූලික කෘෂිකාර්මික සිද්ධාන්ත, කෘෂිකාර්මික නිෂ්පාදන දැනුම, වානිජ ශක්‍යතා සහ ව්‍යාපාර කළමනාකරණ ඥානය ලබා දෙනු ලැබේ. සම්පූර්ණ උපාධි පාඨමාලාවම ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතු වන අතර මෙම පාඨමාලාවේ අන්තර්ගත විෂයන් ලෙස ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව, සාර්ව ආර්ථික විද්‍යාව, කෘෂි යාන්ත්‍රිකරණය, කෘෂිකර්මයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය(ICT), සත්වාහාර භෝග නිෂ්පාදනය, ව්‍යවහාරික සංඛ්‍යානය, කෘෂි සංවර්ධනය හා ප්‍රතිපත්ති අධ්‍යයනය, පාරිභෝගික චර්යාව, කෘෂි මූල්‍ය අධ්‍යයනය, පසු අස්වනු තාක්ෂණය, ශාක අභිජනනය හා ජාන තාක්ෂණය, පාංශු විද්‍යාව, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, පොත් තැබීම සහ ගිණුම්කරණය, පලතුරු භෝග කළමනාකරණය, ආහාර සහ පෝෂණවේදය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය, සත්ව පෝෂණය සහ ආහාර සැපයීම, සන්නිවේදනය හා දැනුම ප්‍රචාරණය, ජාත්‍යන්තර වෙළඳාම, ව්‍යවසායකත්වය, කෘෂි අපනයන භෝග කළමනාකරණය, ආහාර පරිරක්ෂණය හා සැකසුම් තාක්ෂණය, භූසම්පත් කළමනාකරණය, කෘෂි ව්‍යාප්තිය, ආයතනික කළමනාකරණය, පාරිසරික බලපෑම් අධ්‍යයනය, වෘත්තීය මාර්ගෝපදේශනය, මානව සම්පත් කළමනාකරණය, කෘෂි අලෙවිකරණය, පටක රෝපණ විද්‍යාව, උද්‍යාන අලංකරණය, ස්වභාවික සම්පත් කළමනාකරණය, විද්‍යාත්මක ලේඛනය, ධාන්‍ය රසායනය දැක්විය හැක. එමෙන්ම අවසන් වසරේදී සෑම ශිෂ්‍යයෙක්ම මාස 2 ක වෘත්තීය පුහුණුවක් හා මාස 6 ක පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පිළිගත් ආයතනවලට අනුයුක්ත කෙරේ. විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරීන් දේශීය විදේශීය ඕනෑම ආයතනයක උසස් තනතුරු පවා හෙබවීමේ ශක්‍යතාවයෙන් පරිපූර්ණ වන අතර ඔවුන්ගේ අනාගත වෘත්තීමය මාවත ඉතා පැහැදිලි සහ සාර්ථක එකක් වනු නොඅනුමානය. නවතම සමීක්ෂණ වාර්තාවලට අනුව මෙතෙක් බිහි වූ විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරීන් මේ වන විටත් පිළිගත් දේශීය හා විදේශීය ආයතනවල රැකියා අවස්ථා උදාකර ගැනීමට සමත්ව ඇත.

## 3. විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධි පාඨමාලාව

විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධි පාඨමාලාව සිව් අවුරුදු (සමාසික 8ක) විශේෂ ගෞරව උපාධි (SLQF 06 වන අදියර හා සමාන) පාඨමාලාවක් වන අතර මනා සුදුසුකම්ලත් විද්වත් ආචාර්ය මණ්ඩලයක් යටතේ පුළුල් පරාසයක පැතිරෙන විෂය ක්ෂේත්‍ර ගණනාවක් හා ඊට අදාළ න්‍යායාත්මක දැනුම ආවරණය කරනුලබන්නකි. ඊට අමතරව මෙම උපාධි පාඨමාලාව තුළින් ප්‍රායෝගික කුසලතා හා සබැඳුණු ක්ෂේත්‍ර පර්යේෂණ හරහා උපාධිධාරීන්හට නවීන හරිත තාක්ෂණික ක්‍රමවේද හා ඒවායේ වැඩි දියුණුවීම් සම්බන්ධව මනා දැනුමක් ලබා දෙයි. හරිත තාක්ෂණ උපාධිධාරියෙකු යනු දැනට සිදුවෙමින් පවතින හා අනාගතයේ සිදුවීමට නියමිත සංවර්ධන ක්‍රියාදාමයනට අතහිත දීම අරමුණු කරගනිමින් දේශීය හා විදේශීය විද්‍යා හා තාක්ෂණික වෘත්තීන්ගේ අභිවෘද්ධිය උදෙසා

අවම පාරිසරික හානියකට අනුබල දෙමින් නූතන නව්‍යකරණ තාක්ෂණික ක්‍රමවේදයන් හැසිරවීමෙහි ප්‍රාගුණ්‍යයෙන් හෙබි අයෙකි. මෙම උපාධි පාඨමාලාවම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් හැදෑරිය යුතු වන අතර මෙම පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් ලෙස පරිසර කළමනාකරණය, බලශක්ති විශ්ලේෂණය හා කළමනාකරණය, පුනර්ජනනීය බලශක්තිය, තිරසාර භූමි භාවිතය හා භෝග නිෂ්පාදනය, තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය හා ප්‍රතිචක්‍රීකරණය, නිෂ්පාදන තත්ත්ව කළමනාකරණය, ජෛව නිෂ්පාදන තාක්ෂණය, පරිසර අභිවෘද්ධිය, දේශගුණ විපර්යාසය, පාරිසරික ආර්ථික විද්‍යාව, නිෂ්පාදන චක්‍ර අධ්‍යයනය, පාරිසරික ජෛව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, ජල සම්පත් කළමනාකරණය, නිරවද්‍ය කෘෂි තාක්ෂණය(Precision Agriculture), පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, හරිත ගොඩනැගිලි නිර්මාණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා උපාංග, හරිත රසායනය, පාරිසරික පියසටහන්, දත්තගොනු කළමනාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය(ICT), භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදනය (GIS and Remote Sensing), ආපදා සහ හරිත විසඳුම්, නව්‍යකරණය හා තාක්ෂණ සම්ප්‍රේෂණය සහ සාධනීය ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය යනාදිය දැක්විය හැක. තවද අවසන් වසරේදී සෑම ශිෂ්‍යයෙක්ම මාස 3 ක වෘත්තීය පුහුණුවක් හා මාස 6 ක පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පිළිගත් ආයතනවලට අනුයුක්ත කෙරේ. විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධිධාරීන් දේශීය විදේශීය ඕනෑම ආයතනයක උසස් තනතුරු පවා හෙබවීමේ ශක්‍යතාවයෙන් පිරිපුන් වන අතර ඔවුන්ගේ අනාගත වෘත්තීමය මාවත ඉතා පැහැදිලි සහ සාර්ථක එකක් වනු නොඅනුමානය. නවතම සමීක්ෂණ වාර්තාවලට අනුව මෙතෙක් බිහි වූ විද්‍යාවේදී හරිත තාක්ෂණ උපාධිධාරීන් මේ වන විටත් පිළිගත් දේශීය හා විදේශීය ආයතනවල උසස් රැකියා අවස්ථා උදා කර ගැනීමට සමත්ව ඇත.

**ධීවර සහ සාගර විද්‍යා තාක්ෂණ පීඨය**

ධීවර සහ සාගර විද්‍යා සහ සාරස විද්‍යාව හා ජල තාක්ෂණය යන විෂය සංකලනයන් ඔස්සේ උපාධි පාඨමාලා හඳුන්වාදෙන රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති එකම පීඨය රුහුණ විශ්වවිද්‍යාලයේ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයයි. මෙම පීඨය ධීවර සහ ජල ජීවී වගා, සාගර විද්‍යා හා සාගර භූ විද්‍යා සහ සාරස විද්‍යා හා ජල තාක්ෂණ යන අධ්‍යයනාංශ තුනකින් සමන්විතය. සති 15 කින් යුත් සමාසික ක්‍රමය යටතේ මෙම පීඨය අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන අතර පාඨමාලා ඇගයීම් කරනුලබන්නේ ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය ක්‍රමය (Credit Based Grade Point Average) මගිනි. මේ වන විට මෙම පීඨය පහත දැක්වෙන සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා (විශේෂවේදී උපාධි) දෙකක් පවත්වාගෙන යයි.

1. ධීවර සහ සාගර විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - ධීවර විද්‍යාව සහ ජල ජීවී වගා මෙහි විශේෂිත විෂය ක්ෂේත්‍රවේ
2. සාගර සහ මිරිදිය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - සාගර විද්‍යාව සහ සාගර භූ විද්‍යාව සහ ජල විද්‍යාව හා තාක්ෂණය මෙහි විශේෂිත විෂය ක්ෂේත්‍රවේ

උපාධි පාඨමාලාවන්හි තෙවැනි ස්ඵලය ආරම්භයේදී උපාධි අපේක්ෂකයින්හට විශේෂවේදී පාඨමාලා සඳහා තෝරා ගැනීම කළ හැකි අතර ඔවුන් අදාළ විෂය පාඨමාලා සඳහා ලබා ඇති ප්‍රවීනතාවන් මෙහිදී සැළකිල්ලට ගැනේ. උපාධි පාඨමාලාවන්හි අවසාන වර්ෂයේදී ක්ෂේත්‍ර පුහුණුව සහ පර්යේෂණ නිබන්ධන භාරදීම සම්පූර්ණ කළ යුතු වේ.

## නැගෙනහිර විශ්වවිද්‍යාලය (මඩකලපුව)

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භූ/මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කෘෂිකර්මය | - | E |
| ජෛවීය විද්‍යාව * | උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, පරිගණක විද්‍යාව | E |
| භෞතීය විද්‍යාව * | ව්‍යා. ගණිතය, භෞතික විද්‍යාව, ශු. ගණිතය, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව | E |
| කළමනාකරණය | - | E |
| වාණිජ්‍යය | - | E |
| කලා | අරාබි, ඉස්ලාම් අධ්‍යයනය, දේශපාලන විද්‍යාව, දර්ශනය, ලලිත කලා, සමාජ විද්‍යාව, මානව විද්‍යාව, ඉංග්‍රීසි, දෙමළ, භූගෝල විද්‍යාව, සංසංදනාත්මක ආගම්, අධ්‍යාපනය, හින්දු ශිෂ්ඨාචාරය, ඉතිහාසය, නාට්‍ය හා රංග කලාව, ක්‍රිස්තියානි | T |
| හෙද # | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය(BST) | - | E |
| පරිවර්තන අධ්‍යයනය | - | E/T |

විද්‍යා, කෘෂිකර්ම, කළමනාකරණ අධ්‍යයන, කලා සහ සංස්කෘතික පීඨ යටතේ පවත්නා විෂයයන්ගෙන් සංයුක්ත පාඨමාලා හැදෑරීම සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලය අවසර දෙනුලැබේ.

* පවතින ඉඩපහසුකම් සීමාවන්ට යටත්ව ජෛවීය හා භෞතීය විද්‍යා විෂය ධාරා යටතේ ඇති විෂය ඒකක හැදෑරීමට සිසුන්ට හැකිය.

\# පුහුණුකම් ලත් හෙද සේවා කාර්යය මණ්ඩලයක් ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ හෙද අධ්‍යාපනය ඉහළ නැංවීම.

## අධ්‍යයන වැඩසටහන

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය, උද්භිද විද්‍යා, රසායන විද්‍යා, ගණිත හා පරිගණක විද්‍යා, භෞතික විද්‍යා, සත්ව විද්‍යා යන අධ්‍යයන අංශ පහකින් සහ පරිගණක විද්‍යා ඒකකයකින් සමන්විතයි. විද්‍යා පීඨය වර්ෂාර්ධ (සයමාසික) ක්‍රමයට පාඨමාලාවන් කරනු ලබන අතර ශ්‍රේණි ලකුණු මධ්‍යනාය ක්‍රමයට ඇගයීම් කරනු ලබයි. එක් අධ්‍යයන වර්ෂයක් සයමාසික දෙකකින් යුක්තය. පීඨය මගින් තුන් අවුරුදු සාමාන්‍ය සහ සිව් අවුරුදු විශේෂ උපාධීන් පිරිනමනු ලැබේ. විද්‍යා පීඨය අදාළ අධ්‍යයන අංශ යටතේ පහත සඳහන් විෂයන් පිරිනමනු ලබයි.

1. උද්භිද විද්‍යාව
2. රසායන විද්‍යාව
3. භෞතික විද්‍යාව
4. සත්ව විද්‍යාව
5. ව්‍යවහාරික ගණිතය
6. ශුද්ධ ගණිතය
7. පරිගණක විද්‍යාව

තවද, පීඨය අනෙක් පීඨයන් හා එක්ව, පාඨමාලාවන් කිහිපයක්ද මෙහෙයවනු ලබයි. සිසුන්, පළමු අධ්‍යයන වර්ෂය ආරම්භයේදී විෂයයන් 3 කින් සමන්විත විෂය සංකලනයක් සඳහා ලියාපදිංචි විය යුතුය.

ජීව විද්‍යා සිසුන්ට පහත සඳහන් විෂය සංකලනය පමණක් හැදෑරිය හැකිය.

උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව

භෞතීය විද්‍යා සිසුන්හට පහත සඳහන් විෂය සංකලනයන් අතුරෙන් එක් සංකලනයක් තෝරා ගත හැක.

භෞතීය 1 - රසායන විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව

භෞතීය 2 - ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, රසායන විද්‍යාව

භෞතීය 3 - ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, පරිගණක විද්‍යාව

භෞතීය 4 - ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව

භෞතීය 5 - ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව

භෞතීය 6 - ශුද්ධ ගණිතය, පරිගණක විද්‍යාව, රසායන විද්‍යාව

කෙසේ වෙතත්, ඉහත සඳහන් කරන ලද විෂය සංකලනයන් එක් එක් අංශයේ අධ්‍යයන කාර්යය මණ්ඩලවල අඩුපාඩු කම් මත සීමා කිරීම් වලට ලක්විය හැක.

පරිගණක විද්‍යාව විෂය සඳහා සිසුන් තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ.

1. පළමු සති 2 ක ඇතුළතදී පවත්වනු ලබන ඇගයීම් පරීක්ෂණයේ ලකුණු
2. පවතින පහසුකම්: පරිගණක විද්‍යා විෂය සඳහා වන සිසුන් ගණන සීමා කර ඇත.

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ඔලුවිල්)

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භා / මා |
|---|---|---|
| කලා | ආර්ථික විද්‍යාව, දර්ශනය සහ මනෝ උපදේශනය, සමාජ විද්‍යාව, ඉතිහාසය, සංඛ්‍යානය, දෙමළ, ඉංග්‍රීසි, සිංහල, හින්දු ශිෂ්ටාචාරය, භූගෝල විද්‍යාව, භූගෝලීය තොරතුරු පද්ධතිය, දේශපාලන හා සාමය අධ්‍යයනය, නිලබල ක්‍රමය හා රාජ්‍ය ප්‍රතිපත්ති, ත්‍රිභාෂා අධ්‍යයනය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම. | T |
| කළමනාකරණය ☛ | - | T/E |
| වාණිජ්‍යය | - | T/E |
| කළමනාකරණය සහ තොරතුරුතාක්‍ෂණය(SEUSL) ▲ | - | E |
| ජෛවීය විද්‍යාව # | ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යවහාරික සංඛ්‍යානය, භෞතීය විද්‍යාව පාංශු විද්‍යාව, පරිගණක විද්‍යාව සහ අනිවාර්ය විෂයයන්, සහ වෛකල්පිත විෂයයන්* | E |
| ඉංජිනේරු විද්‍යාව | - | E |
| භෞතීය විද්‍යාව # | පරිගණක විද්‍යාව, ගණිතය 1, ගණිතය 11, ව්‍යවහාරික සංඛ්‍යානය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පාංශු විද්‍යාව, අනිවාර්ය සහ වෛකල්පිත විෂයයන්* | E |
| ඉස්ලාම් අධ්‍යයනය | - | T/E |
| අරාබි භාෂාව | - | A / T / E |
| ජෛවපද්ධති තාක්‍ෂණවේදය (BST) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය | - | E |

☛ කළමනාකරණ සහ වාණිජ පීඨය මගින් උපාධි පාඨමාලා BBA, B.COM සහ B.Sc, MIT වශයෙන් පිරිනමයි. BBA සහ B.COM යන උපාධි පාඨමාලා විශේෂ උපාධි ලෙස වසර 4 ක කාලයක් තුළ ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වයි. BBA උපාධි පාඨමාලාව විශේෂවේදී ගණකාධිකාරී, මූල්‍ය, තොරතුරු පද්ධති, අලෙවිකරණ සහ මානව සම්පත් කළමනාකරණ ලෙස පවතියි. B.Sc, MIT වසර 3 ක උපාධි පාඨමාලාවක් වන අතර එය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වයි.

* වෛකල්පිත විෂයයන්: සංඛ්‍යානය, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය ගණකාධිකරණය, පාරිසරික සමතුලිතතාව ආරක්‍ෂා කෙරෙන කෘෂිකර්මය (Sustainable Agriculture), පාරිසරික විද්‍යාව හා විද්‍යුත්.

# ව්‍යවහාරික පීඨයේ උපාධි වැඩසටහන් සමාසික පාඨමාලා සම්මාන ක්‍රමයක් මත පවත්වනු ලබන අතර, පැය 15 ක දේශන හෝ පැය 45 - 60 අතර රසායනාගාර කටයුතු සම්මාන ඒකකයක් වේ. ජීව විද්‍යා සහ භෞතීය විද්‍යා යනුවෙන් අධ්‍යයන ධාරා 2 ක් පමණක් ඇත. සාමාන්‍ය උපාධියක් ලබා ගැනීම සඳහා අයදුම් කරන අයට ඔහුගේ/ ඇයගේ අධ්‍යයන ධාරාවෙන් හර / වෛකල්පික පාඨමාලා සම්මාන 72 ක් සහ ගණිතයෙන් හෝ ජීව විද්‍යාව සහ ඉංග්‍රීසි වලින් අනිවාර්ය මූලික සම්මාන 03 ක් (එකතුව 75) සම්පූර්ණ කිරීමට සිදුවේ. එසේම, ව්‍යවහාරික විද්‍යා පීඨයෙන් සිව් අවුරුදු විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව) විශේෂ උපාධි සහ විද්‍යාවේදී (රසායන විද්‍යාව) විශේෂ උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

### ▲ කළමනාකරණය සහ තොරතුරුතාක්‍ෂණය (SEUSL)

1. අලෙවිකරණය, මූල්‍ය, කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ පසුබිමක් සහිතව ව්‍යාපාර උපාය මාර්ග, ව්‍යාපාර සංවර්ධනය, ජනතාව හා සංවිධාන කළමනාකරණය, ව්‍යාපෘති හා මෙහෙයුම් සම්බන්ධ කළමනාකරණ සංකල්ප ඵලදායීව යොදා ගැනීමට හැකියාව ලැබෙන්නාවූ තොරතුරු තාක්‍ෂණය, ව්‍යාපාර පද්ධති සහ ආකෘති හා විශ්ලේෂණ පිළිබඳ මූලික කුසලතා සංවර්ධනය කිරීමට
2. කළමනාකරණ දැනුම වැඩි කිරීමට උපකාරීවන තොරතුරු තාක්‍ෂණ කුසලතා භාවිතා කිරීමෙන් දේශීය සංවිධාන, ගෝලීය වෙළඳපළ තුළ සාර්ථක ලෙස තරඟකාරීව ක්‍රියාත්මක වීමට
3. ප්‍රායෝගික සිද්ධි අධ්‍යයනයන් හා පැවරුම් ආදියෙන් තමන් ලද අධ්‍යයනයන් පරිපූර්ණය කරමින් පංති කාමරය ඉගෙනුම සඳහා වන ප්‍රායෝගික විද්‍යාගාරයක් බවට පත්කිරීම සඳහා තෝරා ගත් කාර්ය බද්ධ ක්ෂේත්‍රවල ස්ථිර සෛද්ධාන්තික පසුබිමක් සහිත පුද්ගලයන් ඇති අය බවට කළමනාකරුවන් පත්කිරීම
4. ඉගැන්වීම, පර්යේෂණ කිරීම හා කර්මාන්තයට ව්‍යාප්ති සේවාවන් ලබාදීම ආදියෙහිදී සක්‍රියව නිරතවීමට ශිෂ්‍යයන් හා ආචාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට
5. රටේ තොරතුරු තාක්‍ෂණය සඳහා මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට

**තාක්ෂණ පීඨය**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය මගින් තාක්ෂණ විෂය ධාරාව සඳහා පහත සඳහන් ගෞරව උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

1. කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය [BBST(Hons)]
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය[BICT(Hons)]

අදාළ උපාධි පාඨමාලා දේශන, රසායනාගාර හා ක්ෂේත්‍ර අධ්‍යයනයන්, සම්මන්ත්‍රණ, කාර්මික පුහුණු සැසි, පර්යේෂණ, නවෝත්පාදන, ව්‍යාපාර, නිපැයුම් සංවර්ධන හා පද්ධති සංවර්ධනය ආදී ව්‍යාපෘතීන්ගෙන් සමන්විත වේ. අන්තර්ජාල පහසුකම් මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේද සවිමත් කරනු ලැබේ. එසේම, රසායනාගාර හා ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තා, ස්වයං අධ්‍යයන ( පුස්තකාල, ක්ෂේත්‍ර අධ්‍යයන, තනි හා කණ්ඩායම් පැවරුම්), විශාල හා කුඩා කණ්ඩායම් සාකච්ඡා, නිබන්ධන සාකච්ඡා ආදිය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය නැංවීම සඳහා භාවිතා කෙරේ.

කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන්, කෘෂි තාක්ෂණය හා සම්බන්ධ වූ අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ පුළුල් දැනුමක් හා කුසලතාවයන්ගෙන් සම්පූර්ණ වේ. තවද, මෙම උපාධිධාරීන්ට විද්‍යා හා තාක්ෂණ සහ කළමනාකරණ කුසලතා ඒකාබද්ධ කිරීම මගින් නූතන කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා බැඳුණු නිෂ්පාදන හා සේවා අංශ වෙත සම්බන්ධ විය හැක.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන් තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ භාවිතය සඳහා අදාළ වන තාක්ෂණික හා කළමනාකරණ නිපුනත්වයෙන් සම්පූර්ණ වේ. එසේම මෙම උපාධි පාඨමාලාව සීඝ්‍රයෙන් දියුණුවන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා අනුගත විය හැකි උපාධිධාරීන් බිහිකිරීම සඳහා ඉවහල් වේ.

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (මිහින්තලේ)

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කලා * | - | S |
| කළමනාකරණය § | - | S/E |
| කෘෂිකර්මය # | - | E |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) + | - | E |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) + | - | E |
| සෞඛ්‍ය ප්‍රවර්ධන | - | E |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය(ICT) | - | E |
| සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය(ET) | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය(BST) | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |

*** සමාජයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය**

සමාජය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය විසින් පහත සඳහන් උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

| උපාධි පාඨමාලාව | කාලය | මාධ්‍යය |
|---|---|---|
| 01. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | (වසර 03 / සමාසික 06) | සිංහල |
| 02. ශාස්ත්‍රවේදී (විශේෂ) ඉතිහාසය | (වසර 04 / සමාසික 08) | සිංහල |
| 03. ශාස්ත්‍රවේදී (විශේෂ) සිංහල | (වසර 04 / සමාසික 08) | සිංහල |
| 04. ශාස්ත්‍රවේදී (විශේෂ) පරිසර කළමනාකරණය | (වසර 04 / සමාසික 08) | සිංහල / ඉංග්‍රීසි |
| 05. ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යාව | (වසර 04 / සමාසික 08) | සිංහල / ඉංග්‍රීසි |
| 06. ශාස්ත්‍රවේදී (විශේෂ) පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය | (වසර 04 / සමාසික 08) | සිංහල |

පළමු වසර පළමු සමාසිකයේ දී සියලුම සිසුන් පොදු විෂයන් හැදෑරිය යුතු අතර දෙවන සමාසිකයේ දී විෂය සංයුති ඒකක (module) 05 කින් එක් විෂය සංයුති ඒකකයක් (module) තෝරා ගෙන ඒ ඔස්සේ අධ්‍යාපනය හැදෑරිය යුතුය.

විෂය ඒකකයන්හි (modules) නම සහ කේත(code)

| විෂය ඒකකයන්හි (modules) කේත | විෂය ඒකකයන්හි (modules) නම |
|---|---|
| EWS | Environment and Society |
| EMS | Economic and Scientific Management |
| HAH | History, Archeology and Heritage |
| SSM | Sinhala and Social / Communication |
| TEF | Language and Tourism |

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව හදාරන සිසුන්, පළමු වසර පළමු සමාසිකයේදී පොදු විෂයන් හැදෑරිය යුතු අතර දෙවන සමාසිකයේදී තෝරාගත් විෂය සංයුති ඒකකය (module) ඔස්සේ උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. එම සිසුන් තම තෙවන වසර දෙවන සමාසිකයේදී (අවසාන සමාසිකයේදී) ආයතන පුහුණුව හා පර්යේෂණ ව්‍යාපෘතිය නිම කළ යුතුය.

**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලාව**

සිසුන් පළමු වසරේදී ලබා ගන්නා ප්‍රතිඵල මත ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සඳහා තෝරා ගනු ලැබේ. එම සිසුන් විශේෂ උපාධියට අදාලව විෂයන් සමාසික 6 කදී සම්පූර්ණ කළ යුතුය. එසේම සිවුවන වසර දෙවන සමාසිකයේදී පර්යේෂණ නිබන්ධයක් සම්පූර්ණ කළ යුතුය.

**කළමනාකරණ අධ්‍යයන පීඨය**

කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පහත උපාධි පාඨමාලා 06 ප්‍රදානය කරනු ලබයි.

1. විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය) විශේෂ උපාධි පාඨමාලාව
2. විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) විශේෂ උපාධි පාඨමාලාව
3. විද්‍යාවේදී (සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ) විශේෂ උපාධි පාඨමාලාව
4. විද්‍යාවේදී (ගෞරව) අලෙවි කළමනාකරණය
5. විද්‍යාවේදී (ගෞරව) මානව සම්පත් කළමනාකරණය
6. විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති

විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය) විශේෂ උපාධි පාඨමාලාව, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) විශේෂ උපාධි පාඨමාලාව, විද්‍යාවේදී (ගෞරව) අලෙවි කළමනාකරණය, විද්‍යාවේදී (ගෞරව) මානව සම්පත් කළමනාකරණය සහ විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති යන උපාධි පාඨමාලා පහ සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ ලියාපදිංචිවන අවස්ථාවේදීය. එහිදී සිසුන්ගේ Z අගය, දිස්ත්‍රික් කුසලතාව සහ පාඨමාලාව සඳහා ඇති වරණය යන කරුණු සලකා බලනු ලැබේ.

විද්‍යාවේදී (සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ) විශේෂ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ම විධිමත්ව සිදු කෙරේ.

විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය), විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ), විද්‍යාවේදී (ගෞරව) අලෙවි කළමනාකරණය සහ විද්‍යාවේදී (ගෞරව) මානව සම්පත් කළමනාකරණය යන උපාධි පාඨමාලාවන්හි ප්‍රථම වර්ෂයේ දේශන පැවැත්වීම සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකරනු ලබන අතර දෙවන වර්ෂයේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් දේශන පවත්වනු ලැබේ.

විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති හා විද්‍යාවේදී (සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය) විශේෂ යන උපාධි පාඨමාලාවන්හි දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

**කෘෂි විද්‍යා පීඨය**

**කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව**

# මෙම උපාධි පාඨමාලාව සකස් කර ඇත්තේ ක්ෂේත්‍රයේ නූතන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කෘෂිකර්මය පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක සහ න්‍යායාත්මක දැනුමක් සහිත ප්‍රායෝගික නිපුනතාවයන්ගෙන් හෙබි ආකල්පමය අතින් පරිපූර්ණ උපාධිධාරීයකු බිහිකිරීම උදෙසා වේ.

මෙය වසර හතරක ගෞරව උපාධි පාඨමාලාවක් වන අතර එහි පළමු සමාසික පහ තුළ බෝග නිෂ්පාදනය හා කළමනාකරණය, කෘෂිකාර්මික සත්ව පාලනය, පාංශු විද්‍යාව, ජල කළමනාකරණය, කෘෂි ඉංජිනේරු විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව, ජෛව තාක්ෂණය, කීට විද්‍යාව සහ ව්‍යාධිවේදය සහ උද්‍යාන අලංකරණය යන ක්ෂේත්‍ර පිළිබඳව සෛද්ධාන්තික සහ ප්‍රායෝගික දැනුමක් ලබා දෙනු ඇත. අනතුරුව එළැඹෙන සමාසික දෙක තුල කෘෂි ඉංජිනේරු විද්‍යාව, පාරිසරික පාංශු කළමනාකරණය, කෘෂි ආර්ථික විද්‍යාව සහ ව්‍යාප්තිය, කෘෂි පද්ධති කළමනාකරණය, සත්ව නිෂ්පාදන තාක්ෂණය, ආහාර සහ පසුඅස්වනු තාක්ෂණය, බෝග විද්‍යාව සහ කෘෂි කාර්මික ජීව විද්‍යාව යන ක්ෂේත්‍ර අතුරින් එක් ක්ෂේත්‍රයක් උපාධි පාඨමාලාවේ විශේෂ ක්ෂේත්‍රය ලෙස තෝරා ගත හැක.

මෙම උපාධි පාඨමාලාවේ අවසන් සමාසිකය තුල සිසුන් විසින් ස්වාධීනව පර්යේෂණ ව්‍යාපෘතියක් කර එහි වාර්තාව ඉදිරිපත් කල යුතුය. එසේම සිසුන් සඳහා රජයේ සහ පිළිගත් පෞද්ගලික ආයතන තුළ විශේෂ වෘත්තීය පුහුණුවක්ද ලබා දෙනු ඇත.

වසර හතරක උපාධි පාඨමාලාව තුළ සිසුන්ගේ ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා විශේෂිත පාඨමාලාවන් හඳුන්වාදී ඇත.

කෘෂිකර්මයට සම්බන්ධ සියළු ක්ෂේත්‍රයන්හි පැහිරුණු දැනුමක් සහිත සඵල උපාධිධාරියෙකු බිහිකිරීම මෙම පාඨමාලාවේ අවසන් අරමුණ වෙයි.

**ව්‍යාවහාරික විද්‍යා පීඨය**

+ ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි පාඨමාලා ඒකක ක්‍රමයක් (course unit system) ක්‍රියාත්මක වේ. එක් ශිෂ්‍යයකු අවම වශයෙන් එක් අවුරුද්දකට සම්මාන වටිනාකම් (Course Credits) 30 වනසේ පාඨමාලා ඒකක තෝරා ගත යුතුයි. පහත සඳහන් විෂයයන් අතුරින් ප්‍රථම වර්ෂයේ දී සහ දෙවන වර්ෂයේදී තෝරා ගත හැකි විෂය සංයෝජන කීපයක්ම ඇත; ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය. තුන්වන සහ හතරවන වර්ෂයන්හිදී පහත සඳහන් ව්‍යවහාරික විද්‍යා ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත විෂය සංයෝජන තෝරා ගත හැකිය; ව්‍යවහාරික ජීව විද්‍යාව,ව්‍යවහාරික උද්භිද විද්‍යාව, ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව, ව්‍යවහාරික භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, කාර්මික රසායන විද්‍යාව, කාර්මික ගණිතය, මූල්‍යමය ගණිතය.

**සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධි පාඨමාලාව**

අග්නිදිග ආසියාවේ එකම සෞඛ්‍ය ප්‍රවර්ධන (සාමාන්‍ය හා විශේෂවේදී) උපාධි පාඨමාලාව පිරිනමනු ලබන්නේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයෙන් පමණි. සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු, තනි පුද්ගලයන්ගේ සහ ප්‍රජාවේ සෞඛ්‍ය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීමට ඉතා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමයක් ලෙස මේ වන විට ලොව බොහෝ රටවල් විසින් පිළිගෙන ඇති ප්‍රජා මූලික ක්‍රියාවලියකි. එමෙන්ම සංවර්ධන අභියෝගයන් ජයගැනීමටත්, ප්‍රජාවේ සාමාජිකයින්ගේ ආකල්ප හා ක්‍රියාපිළිවෙත් වෙනස් කිරීමටත් හැකි ක්‍රමවේදයකි.

අධ්‍යයන පාඨමාලාවේ අරමුණ වන්නේ, යහපැවැත්ම හා සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාවලිය නිවැරදිව ක්‍රියාත්මක කළ හැකි නිපුණතාවන් සහිත ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෘත්තිකයන් බිහි කිරීමයි. එමෙන් ම ජනතාවගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීමට ඵලදායී කාර්ය භාරයක් ඉටුකිරීම සඳහා දැනුම සහ කුසලතාවයන් සහිත සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය සුදුසුකම් ලැබෙනු ඇත.

විෂය මාලාව, න්‍යායාත්මක හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර, න්‍යායාත්මක දැනුම, ප්‍රජාව සමග ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් කිරීමට පුළුල් අවබෝධයක් හා අත්‍යවශ්‍ය දැනුම සැපයීම සඳහා නිර්මාණය කර ඇත. මෙම අධ්‍යයන වැඩසටහන පිළිගත්, සුවිශේෂී වූ ක්‍රමවේදයක් අනුගමනය කරන අතර ප්‍රජා මූලික සෞඛ්‍ය ප්‍රවර්ධන මූලධර්ම හරහා ප්‍රජාව සමග සිදු කරන ක්ෂේත්‍ර හා සාමූහික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. එමෙන්ම, ප්‍රජාවේ සෞඛ්‍ය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාවලි සැලසුම් කිරීමටත්, මැදිහත් වීමටත් සහ විවිධ පාර්ශවකරුවන් හා එක්ව වැඩකටයුතු කිරීමටත්, උපාධි අපේක්ෂකයින් උනන්දු කරනු ලැබේ. උපාධි පාඨමාලාව අවසානයේ දී උපාධිධාරීන්හට ප්‍රජාව හා තනි පුද්ගලයන්ට බලපාන විවිධ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන උපාය මාර්ග, වැඩසටහන් හා ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ඇගයීමේ හැකියාව ලැබෙනුඇත. මීට අමතරව, උපාධි අපේක්ෂකයින්ට ළමා යහපැවැත්ම වැඩි දියුණු කිරීම, මන්දපෝෂණය අවම කිරීම, මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, ඇතුළු බෝ නොවන රෝග වැළැක්වීම, සිය දිවි නසාගැනීම අවම කිරීම සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වැනි ජාතික හා ගෝලීය වශයෙන් වැදගත් ප්‍රධාන ක්ෂේත්‍රයන් ඇමතීමට නිපුණතාවන් වැඩි දියුණු වනුඇත.

**තාක්ෂණවේදී උපාධි පාඨමාලාව**

මේ යටතේ රජරට විශ්වවිද්‍යාලය විසින් උපාධි පාඨමාලා 03 ක් පවත්වනුලබයි.

i. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව [BICT(Hons)]
ii. ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව [BBST(Hons)]
iii. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව [BET(Hons)]

මෙම උපාධි පාඨමාලා ඉගැන්වීම හා විභාග පැවැත්වීම ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පමණක් සිදුකෙරේ. පාඨමාලාවේ අවසන් වර්ෂයේදී සිසුන් කර්මාන්ත පුහුණුව හා තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ යුතුය.

### i. තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණවේදී ගෞරව උපාධිය [BICT(Hons)]

මෙම උපාධි පාඨමාලාව ACM / IEEE අන්තර්ජාතික ආයතනය පිළිගත් ඉගෙනීමේ පරිපාටිය හා මාර්ගෝපදේශනවලට අනුකූලව පවත්වනු ලැබේ.

### ii. ජෛවපද්ධති තාක්‍ෂණවේදී ගෞරව උපාධිය [BBST(Hons)]

මෙම පාඨමාලාව ජෛව සැකසුම් (Bio Process) හා ආහාර විද්‍යා යන විෂය සංකලනයන්වල එකතුවක් වන අතර එමගින් ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට අදාල කර්මාන්තයන් වෙත කෙළින්ම සම්බන්ධ කරවීමට හැකිවනු ඇත.

දෙවන අධ්‍යයන වර්ෂය ආරම්යේදී සිසුන් පහත විශේෂ විෂය ක්ෂේත්‍රවල පාඨමාලාවන් සඳහා තෝරා ගනුලබනු ඇත.

- ජෛව සැකසුම් තාක්‍ෂණය
- ආහාර විද්‍යාව හා තාක්‍ෂණය

### iii. ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධිය [BET(Hons)]

දෙවන අධ්‍යයන වර්ෂය ආරම්භයේදී සිසුන් පහත විශේෂ විෂය ක්ෂේත්‍රවල පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලබනු ඇත.

- විදුලි හා විද්‍යුත් තාක්‍ෂණය
- ද්‍රව්‍ය තාක්‍ෂණය (Material Technology)

ආරම්භයේදී ද්‍රව්‍ය තාක්‍ෂණය යටතේ සෙරමික් තාක්‍ෂණය (Ceramic Technology) පාඨමාලාව පවත්වනු ලබන අතර එය ඉදිරියේදී තවත් කාර්මික ද්‍රව්‍ය / ක්ෂේත්‍ර පරාසයක් ආවරණය වන පරිදි ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

- පරිසර තාක්‍ෂණය

රටක සංවර්ධන වැඩසටහන් නිර්මාණය සඳහා අවශ්‍ය වන ඉහළ පාරිසරික විද්‍යා දැනුම ලබා ගත හැකිවන පරිදි විද්‍යාවේ මූලික පාඨමාලාවන් පරිසර තාක්‍ෂණය විෂය නිර්දේශයට ඇතුළත් වේ.

## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (බෙලිහුල්ඔය)

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/ මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කලා (SAB) | - | S/E |
| කළමනාකරණය | - | E |
| කෘෂිකර්මය | - | E |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | - | E |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | - | E |
| මැනුම් විද්‍යාව | - | E |
| ආහාර විද්‍යාව සහ තාක්‍ෂණය | - | E |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | - | E |
| ශාරීරික අධ්‍යාපනය | - | E |
| ආගණනය හා තොරතුරු පද්ධති | - | E |
| සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | - | E |
| පරිවර්තන අධ්‍යයනය | - | E/S |
| ආහාර ව්‍යාපාර කළමනාකරණය | - | E |
| ඉංජිනේරු තාක්‍ෂණවේදය (ET) | - | E |
| ජෛවපද්ධති තාක්‍ෂණවේදය (BST) | - | E |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | - | E |

### වෛද්‍ය පීඨය

### වෛද්‍ය විද්‍යා (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව

පීඨය මගින් පිරිනමනුලබන එම්.බී.බී.එස් උපාධි පාඨමාලාවේ කාල සීමාව අවුරුදු 05 කි. එහි විෂය නිර්දේශය අනුකූලිත හා පර්යන්ත වන අතර අදියර I , අදියර II හා අදියර III ලෙස පෙර සායනික (Pre – Clinical), සම සායනික (Para – Clinical) හා සායනික (Clinical) ලෙස අදියර තුනකට පිළිවෙළින් බෙදා වෙන්කර ඇත. පෙර සායනික විෂයයන් තුළින් මිනිස් ශරීරයේ සාමාන්‍ය සැකැස්ම හා ක්‍රියාකාරීත්වය පළමු සාමාසික තුන්වයෙහි උගන්වනු ලබයි. පුද්ගලික හා වෘත්තීය සංවර්ධනය I වන අදියරේ දී ආරම්භ කරනු ලබයි. සම සායනික විෂයයන් 4 වන සාමාසිකයේ සිට 7 වන සාමාසිකය දක්වා උගන්වන අතර මෙහිදී විද්‍යාර්ථීන් මිනිස් ශරීරයට

බලපාන විවිධ ලෙඩ රෝග පිළිබඳවත් ඒ තුළින් ඇතිවන අසාමාන්‍ය කායික සංකූලතා පිළිබඳවත්, සමස්තයක් ලෙස පොදු ජනතාවට බලපාන සෞඛ්‍ය ගැටලු සඳහා වූ ඖෂධ ප්‍රතිකාර හා පුද්ගල හා වෘත්තීය සංවර්ධනය ද උගන්වනු ලබයි. අදියර III දී අවසාන වසරෙහි ඉගෙනුම ලබන විද්‍යාර්ථීන්ට වෛද්‍ය විද්‍යාව, ශල්‍යකර්ම, ප්‍රසවවේදය, නාරිවේදය, ළමා රෝග වැනි පවුල් සෞඛ්‍ය වෛද්‍ය විද්‍යාවට අදාළවෘත්තීය පුහුණුව ලබා දේ. මෙම සායනික පුහුණුව සඳහා අවශ්‍ය සියලුම පහසුකම් රත්නපුර ශික්ෂණ රෝහල විසින් සපයනු ලැබේ.

විද්‍යාර්ථීන් විසින් ලබාගත් දැනුම අඛණ්ඩ ඇගයීම් හා වසර අවසානයේ දී පැවැත්වෙන ප්‍රධාන පරීක්ෂණ තුළින් පරීක්ෂා කරනු ලැබේ. මෙහි දී ප්‍රධාන විභාග දෙවන එම්.බී.බී.එස්., තෙවන එම්.බී.බී.එස්. හා අවසාන එම්.බී.බී.එස්. ලෙස නම් කරයි.

තම අධ්‍යයන විෂයයන්ට අදාළව සියලු විද්‍යාර්ථීන් හට රෝහල් වල ප්‍රතිකාර ගැනීමට පැමිණ සිටින රෝගීන් හමුවීමට, රෝහල් වල විද්‍යාගාර භාවිත කිරීමට හා කාරක අධ්‍යයනයන් අධ්‍යයනය කිරීමට ප්‍රථම සාමාසිකයේ සිටම අවස්ථාව ලැබේ. අප උපාධි පාඨමාලාවේ ප්‍රමුඛතම ලක්ෂණයක් වන්නේ විෂයයන් සිරස් හා තිරස් අතට එකිනෙක ඒකාබද්ධ කරමින් ඉගැන්වීම් කටයුතු කිරීමයි. මින් අපේක්ෂිත අරමුණ වන්නේ විද්‍යාර්ථීන්ට තමා ග්‍රහණය කරගත් දැනුම රෝග විනිශ්චයේ දී යොදා ගැනීම සඳහා විෂයන් ඉගැන්වීම හා ඉගෙනීම අතර සහ සම්බන්ධතාව සෑම මට්ටමකදී ම ඉහළ ස්ථානයක පවත්වාගෙන යාම තහවුරු කිරීමයි. පාඨමාලාවෙහි ඉගැන්වීම් මාධ්‍යය හා ඇගයුම් මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව වේ.

අපගේ එම්.බී.බී.එස්. උපාධි පාඨමාලාවේ මෙහෙවර ලෙස ඉතා උසස් වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව වෛද්‍ය ශිෂ්‍යයන්ට ඉගැන්වීම් කටයුතු කිරීම, අදාළ උසස් වෘත්තීය ප්‍රමිතීන්ට අනුව රෝගියා මූලික කර ගත් ප්‍රතිකාර සිදු කිරීමට සායනික වෛද්‍යවරුන් සූදානම් කිරීම හා සෞඛ්‍ය සේවා සැපයීමේ දී අදාළ රෝගය වළක්වාලීමට හා ප්‍රතිකාර සිදුකිරීම සඳහා වූ යාන්ත්‍රණයේ ඇති මූලික ගැටලු හඳුනාගැනීම හා පිළිතුරු සැපයීම බලාපොරොත්තු වේ.

මේ අනුව යමින් සමාජය, ආර්ථික, ජාති භේද, ස්ත්‍රී පුරුෂ බව, අනන්‍යතාව, විබලතාවන් හා වයස් පරතරයන් පසෙකලා සානුකම්පිතව දැඩි කැපවීමෙන් හා කුසලතාවයෙන් යුතුව දේශීය හා විදේශීය ජනයාගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීමේ ශක්‍යතාවයෙන් යුතු වෛද්‍ය පරපුරක් හෙට දිනයේ බිහිකරලීමට අප පීඨය මහත් කැපවීමෙන් කටයුතු කරයි. තවදුරටත්, නවීන තාක්ෂණය යොදා ගනිමින් දැනුම, කුසලතා ඔප්නංවාලමින් පර්යේෂණ පුහුණුවීම් ලබා දෙමින් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු හා රෝග වළක්වාලීමේ වැඩසටහන් පීඨය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම අවසාන පරීක්ෂණයෙන් සමත්වන වෛද්‍ය විද්‍යාර්ථීන් ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලයේ ලියාපදිංචි කර පුහුණුවීම් සඳහා යොමු කරනු ලැබේ. වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශ වලට යොමු වෙමින් සෞඛ්‍ය සේවා සපයන කණ්ඩායම් වල වැදගත් භූමිකාවක් නිරූපනය කිරීමට හැකි දක්ෂ හා සාර්ථක විද්‍යාර්ථීන් පිරිසක් අප පීඨයෙන් බිහිවනු ඇත.

**කෘෂිවිද්‍යා පීඨය**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලීය කෘෂි විද්‍යා පීඨය මඟින් සිව් අවුරුදු කෘෂි විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලබයි. කෘෂි විද්‍යා පීඨය කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය, කෘෂි අපනයන අධ්‍යනාංශය සහ සත්ව නිෂ්පාදන අධ්‍යනාංශය ලෙස අධ්‍යනාංශ තුනකින් සමන්විත වේ. මේ අතුරින් කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල පද්ධතිය තුල කෘෂි ව්‍යාපාර පිළිබඳව ඉගැන්වීම් සහ පර්යේෂණ සිදුකරනු ලබන පුරෝගාමී අධ්‍යනාංශයක් ලෙස හඳුන්වාදිය හැකිය. මෙම අධ්‍යනාංශය මඟින් පිරිනමන ආහාර ආශ්‍රිත ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී උපාධිය පිළිබඳව හැඳින්වීමක් වෙනම ස්ථානයක දක්වා ඇත. කෘෂි අපනයන අධ්‍යනාංශය කෘෂි පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩිදියුණුකරනය සහ වගා ආරක්ෂණය හා බෝග නිෂ්පාදන තාක්ෂණවේදය ලෙස අධ්‍යයන මොඩියුල ත්‍රිත්වයක් පිරිනමනු ලබන අතර සත්ව නිෂ්පාදන අධ්‍යනාංශය මඟින් ජලජ ජෛව- සම්පත් කළමනාකරණය සහ සත්ව ජෛව- සම්පත් කළමනාකරණය ලෙස අධ්‍යයන මොඩියුල ද්විත්වයක් පිරිනැමීම සිදුවේ.

කෘෂි විද්‍යා විෂයෙහි විද්‍යාර්ථයෙකු සතු විය යුතු දැනුම, කුසලතාවයන් සහ ආකල්ප උපාර්ජනය කරගනු වස් සියලුම සිසුන් විසින් පූර්ණ කාලීන සිව්වස් පාඨමාලා කාලයක් සපුරාලීම උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමේ අවම සුදුසුකම ලෙසින් සැලකේ. සිව්වස් පාඨමාලාව වසරකට සමාසික දෙක බැගින් වන සමාසික අටකින් සමන්විත වන අතර එක් සමාසිකයක් සති පහළොවක කාලසීමාවකට යටත්වේ. පළමු වසර දෙකක කාලසීමාව තුලදී සියලු සිසුන් මූලික අධ්‍යයන පාඨමාලාවකට සහභාගි වියයුතු අතර අවසන් වසර දෙක තුලදී විශේෂීකරණ පාඨමාලාවකට සහභාගිවීමේ අවකාශය සිසුන්ට හිමිවේ. විද්‍යාවේදී උපාධිය සම්පූර්ණ කිරීමේ අවම සුදුසුකම ලෙසින් සියලුම සිසුන් තම සිව්වසක අධ්‍යයන කාලය තුලදී අවම සම්භාර එකසිය තිහක් (130) ලබා ගැනීම අනිවාර්ය වේ.

**විශේෂීකරණ මොඩියුලය** - පළමු වසර දෙක තුලදී මූලික අධ්‍යයන පාඨමාලාව සාර්ථක ලෙස නිමකරනු ලබන සිසුන්ට තමන් වඩාත් ප්‍රියකරන විෂය ක්ෂේත්‍රයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබීමේ නම්‍යශීලී අවස්ථාවක් විශේෂීකරණ මොඩියුලය යටතේ හිමිවේ. එහිදී සිසුන් විසින් ප්‍රධාන අධ්‍යනාංශ ත්‍රිත්වය මඟින් පිරිනමනු ලබන කෘෂි-පාරිසරික සම්පත් කළමනාකරණය, බෝග වැඩිදියුණුකරනය සහ වගා ආරක්ෂණය, බෝග නිෂ්පාදන තාක්ෂණවේදය, ජලජ ජෛව-සම්පත් කළමනාකරණය, සත්ව ජෛව-සම්පත් කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන මොඩියුල අතරින් එක් මොඩියුලයක් විශේෂීකරණ මොඩියුලය ලෙස තෝරා ගත යුතුවේ. මෙම විශේෂීකරණ මොඩියුල සඳහා රැකියා වෙළදපල තුල ඉතා ඉහළ ඉල්ලුමක් පවතින බව හඳුනාගෙන ඇත.

උපාධි පාඨමාලාවේ ඉතා වැදගත් අංගයක් ලෙස සැලකෙන කර්මාන්ත පිළිබඳ පුහුණුව ලබාදීම සඳහා අවසන් සමාසිකය තුලදී සිසුන් කර්මාන්ත ආශ්‍රිත පුහුණුවකට යොමු කෙරේ. මූලික පාඨමාලාව අනිවාර්යය විෂය මාලාවකින් සමන්විත වන අතර විශේෂීකරණ පාඨමාලාව අනිවාර්යය සහ තෝරාගත හැකි විෂයය මාලාවකින් සමන්විත වේ.

**කර්මාන්ත ආශ්‍රිත පුහුණුව සහ ශාස්ත්‍රීය නිබන්ධනය** - විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ අතිශය වැදගත් සංරචයක් ලෙස කර්මාන්ත ආශ්‍රිත පුහුණුව සහ ශාස්ත්‍රීය නිබන්ධනය පිළියෙල කිරීම හැඳින්විය හැකිය. ඒ තුලින් විද්‍යාර්ථයින් හට වැඩ ලෝකය පිළිබඳව යථා අවබෝධයක් ලබා දීම සිදුකෙරෙන අතර එහිදී සිසුන් තම විශේෂීකරණ මොඩියුලයට ගැලපෙන කර්මාන්තයක් ආශ්‍රිතව පවත්නා ගැටළුවක් හඳුනාගෙන එයට විසඳුම් සෙවීමේ ක්‍රියාවලියකට යොමුකරනු ලැබේ.

තවද කෘෂි විද්‍යාවේදී උපාධි පාඨමාලාව සාර්ථකව හැදෑරීමට සහ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට අදාල කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණ විෂයයන් අනිවාර්ය විෂයයන් ලෙසින් පළමු වසර තුන පුරාවටම සිසුන්ට ඉගැන්වීම සිදුකෙරේ. තවද මේ තුලින් පීඨය තුල ගතකරන කාලසීමාව පුරාවටම සිසුයෙන් නවමුවන තොරතුරු තාක්ෂණ ලෝකය පිළිබඳව අතැඹුලක් සේ ප්‍රත්‍යක්ෂ කරගැනීමේ අවකාශය සිසුන්ට හිමි වේ.

### ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ, කෘෂි විද්‍යා පීඨයේ, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය මගින් ඉදිරිපත් කරනු ලබන ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය සිව් අවුරුදු පාඨමාලාවකි. එය 2016 වසරේ සිට ඉදිරිපත් කරනු ලබන නව උපාධි පාඨමාලාවකි.

මෙම පාඨමාලාව විශේෂයෙන්ම ලෝකයේ විශාලතම ව්‍යාපාරවලින් එකක් වන ආහාර සහ ඒ ආශ්‍රිත ව්‍යාපාර ජාලයට අවශ්‍ය කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව ආහාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණයේ සිද්ධාන්ත දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ද ඉතා පුළුල්ව ලබා දීම සඳහා සකස් කර ඇත. ආහාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය, ආහාර අලෙවිකරණය, ආහාර දාම කළමනාකරණය ඇතුළු ඉතා පුළුල් පරාසයක දැනුමක් මෙම පාඨමාලාව යටතේ ලබා දෙනු ඇත.

මෙම පාඨමාලාවේ ප්‍රධානතම ලක්ෂණයන් වන්නේ -

- ආහාර ව්‍යාපාර කළමණාකරණය සහ ආහාර අලෙවිකරණ ක්ෂේත්‍රවල ඉතා පුළුල් වූ සහ ප්‍රායෝගික දැනුමක් ලබා දීම.
- ආහාර දාම කළමනාකරණය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ විශේෂඥ දැනුමක් ලබා දීම. මෙම දේශන පවත්වනු ලබන්නේ අදාළ ක්ෂේත්‍රයේ නිපුණතා ඇති විශ්වවිද්‍යාලයීය සහ නිෂ්පාදන ක්ෂේත්‍රයේ දේශකවරුන් විසිනි.
- ආහාර ව්‍යාපාර ක්ෂේත්‍රය සහ එහි ප්‍රවීනයන් සමග ඉතාමත් සමීප සබඳතාවයක් පවත්වා ගැනීම.
- ශිෂ්‍යයන්ගේ ඉගෙනීම සඳහා අධ්‍යනාංශය සතුව ඉතාමත් හොඳ පහසුකම් තිබීම.

මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා උපාධියෙන් පසුව ආහාර ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය, වෙළඳ පොළ පර්යේෂණ, නව නිෂ්පාදන සංවර්ධනය, ආහාර අගය දාම කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය වැනි පුළුල් පරාසයක රැකියාවන් විවෘත වේ.

### ව්‍යවහාරික විද්‍යා පීඨය

ව්‍යවහාරික විද්‍යා පීඨය අධ්‍යයනාංශ පහකින් සමන්විත වේ.

1. භෞතිය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
2. ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය
3. ආහාර විද්‍යා හා තාක්ෂණය අධ්‍යයනාංශය
4. ආගනනය හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
5. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපනය අධ්‍යයනාංශය

මෙම පීඨය යටතේ ඇති දෙපාර්තමේන්තු පහ මගින් උපාධි පාඨමාලා හතක් පිරිනැමේ.

ස්වභාවික සම්පත් සහ භෞතිය විද්‍යා හා තාක්ෂණය යන අධ්‍යයනාංශ වල ලියාපදිංචි වන උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ කැමැත්ත අනුව තුන් අවුරුදු හෝ සිව් අවුරුදු පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවේ. ව්‍යවහාරික විද්‍යා පීඨය මගින් පිරිනමන සියලුම උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එමෙන්ම අර්ධ වාර්ෂික පදනම් කරගත් පාඨමාලා සම්භාර ක්‍රමය පීඨයේ සියලු උපාධි පාඨමාලා සඳහා ක්‍රියාත්මක වේ.

### උපාධි පාඨමාලා

1. ආහාර විද්‍යා හා තාක්ෂණය විශේෂ උපාධිය
2. පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය විශේෂ උපාධිය
3. පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය සාමාන්‍ය උපාධිය
4. රසායනික විද්‍යා තාක්ෂණ විශේෂ උපාධිය
5. පරිගනක විද්‍යා හා තාක්ෂණ විශේෂ උපාධිය
6. ව්‍යවහාරික භෞතික විද්‍යා විශේෂ උපාධිය
7. භෞතිය විද්‍යා සාමාන්‍ය විශේෂ උපාධිය
8. ආගණනය සහ තොරතුරු පද්ධති විශේෂ උපාධිය
9. ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විශේෂ උපාධිය
10. ශාරීරික අධ්‍යාපනය විශේෂ උපාධිය

### භෞතීය විද්‍යා

* ව්‍යාවහාරික විද්‍යාව යටතේ භෞතික විද්‍යා විෂය ධාරාව සඳහා පීඨය මගින් භෞතීය විද්‍යා හා තාක්ෂණය පිළිබඳ තුන් අවුරුදු උපාධි පාඨමාලාවක් පවත්වනු ලබන අතර පරිගණක විද්‍යාව හා තාක්ෂණය, රසායනික විද්‍යා තාක්ෂණය සහ ව්‍යාවහාරික භෞතික විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ.

මෙම උපාධි පාඨමාලා රටෙහි පවතින නූතන රැකියා අවශ්‍යතාවයට සරිලන අයුරින් සකසා ඇත. මේ අනුව ව්‍යාවහාරික භෞතික විද්‍යා, රසායන විද්‍යා හා පරිගණක විද්‍යා විෂය ධාරාවන්ට බරව විෂය නිර්දේශය සකසා ඇත.

### රසායනික විද්‍යා තාක්ෂණය

විද්‍යුත් රසායනික විද්‍යා තාක්ෂණය, බහුද්‍රව්‍යවික තාක්ෂණය, කාර්මික රසායනික විද්‍යාව, ඖෂධවේදී රසායනය, ස්වභාවික නිෂ්පාදන රසායනික විද්‍යාව, විශ්ලේෂණ තාක්ෂණය, පාරිසරික රසායනික විද්‍යාව, ජෛව අකාබනික අනු පිළිබඳ රසායනික හා ආහාර රසායනික විද්‍යාව.

### පරිගණක විද්‍යාව හා තාක්ෂණය

වැඩසටහන්කරණ ක්‍රමෝපායන්, අන්තර්ජාල වැඩසටහන්කරණය, දත්ත ගබඩා කළමනාකරණ පද්ධති, මෘදුකාංග ඉංජිනේරු තාක්ෂණය, පරිගණක රූපසටහන්, රූ සටහන් සැකසුම.

### ව්‍යාවහාරික භෞතීය විද්‍යාව

ඊට අමතරව සියලුම සිසුන් පළමු අධ්‍යයන වර්ෂය තුළදී ගණිතය හා සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූල ධර්ම යන විෂයන් අනිවාර්ය විෂයන් වශයෙන් හදාරනවා. මෙම පාඨමාලාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී සියලුම සිසුන් පර්යේෂණ / කාර්මික පුහුණුවකට සහභාගි විය යුතු බවයි.

### පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය

පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණය ව්‍යාවහාරික විද්‍යා උපාධි පාඨමාලාව ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය මගින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. මෙම පාරිසරික විද්‍යා හා ස්වභාවික සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලාව සමත් වීමට නම් අවම වශයෙන් සියලුම පාඨමාලා සඳහා අදාල අධ්‍යයන අර්ධ වාර්ෂික වලදී සී ශ්‍රේණි ලබා ගත යුතු අතර, උපාධි පාඨමාලාව අවසානයේදී FGPA ලකුණු ප්‍රමාණය 02 ඉක්මවා ලබා ගත යුතු වේ. උපාධි සහතිකයට ඇතුලත් කළ යුතුය. ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය මගින් මෙම පාඨමාලාව සඳහා Credit ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ. ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජෛව විද්‍යාව, සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූලධර්ම, තොරතුරු හා සන්නිවේදනය යන අනු විෂයන් පළමු අවුරුද්දේදී අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

ප්‍රධාන පාඨමාලාවෙහි විෂය නිර්දේශයට පාරිසරික විද්‍යාව, ස්වභාවික සම්පත් කළමනාකරණය, වන විද්‍යාව, මිහිතල විද්‍යාව, ජෛව විවිධත්වය, ස්වභාවික සම්පත් ආර්ථික විද්‍යාව, පාංශු විද්‍යාව, පාංශු ඛාදනය හා සංරක්ෂණය ආදී වශයෙන් විෂයයන් රාශියක් ඇතුලත් වන අතර, ඒවා පාරිසරික විද්‍යාව, ජෛව විවිධත්ව සංරක්ෂණය හා මිහිතල විද්‍යාව යන මූලික තේමාවන් 03 ක් යටතේ වර්ග කර ඇත. අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී ඉහත පාඨමාලාවලට අමතරව සති 15 ක පර්යේෂණ / ක්ෂේත්‍ර පුහුණුවකට සහභාගි වී ඒ හා සම්බන්ධ නිබන්ධනයක් පිළියෙල කර පිළිගැන්විය යුතුය.

### ආහාර විද්‍යාව හා තාක්ෂණය

ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය මගින් මෙම ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව පිරිනමයි. මෙය සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර මෙය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙහි ඒකායන අරමුණ වනුයේ ආහාර නිෂ්පාදන කර්මාන්තය තුළ තාක්ෂණික, අධීක්ෂණ වෙළඳ හා කළමනාකරණය කිරීමෙහිලා මනා දැනුමක් ඇති උපාධිධරයන් බිහි කිරීමයි. තව ද මෙම පාඨමාලාව ආහාර සංරක්ෂණය සහ ආහාර සකස් කිරීම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම මගින් නව නිෂ්පාදන බිහිකිරීම අරමුණු කර ඇත. මෙම උපාධිය හදාරන සිසු සිසුවියන් හට ආහාර සැකසුම් මූලධර්මයන් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම, ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම ලබාදීම. ව්‍යවසායකත්ව ධනාත්මක ආකල්ප සංවර්ධනය සංස්ථානය කිරීම, තාක්ෂණික කුසලතා හා පර්යේෂණ දක්ෂතා දියුණු කිරීම හා පෞරුෂත්ව, කළමනාකරණ හා නායකත්වය දියුණු කිරීම යන කරුණු ලබා දීම අපේක්ෂා කරයි.

පළමු අර්ධ වාර්ෂිකය තුළදී මූලික අනුවිෂයන් වන ගණිතය හා සංඛ්‍යානය, මූලික කළමනාකරණ මූලධර්ම සහ තොරතුරු හා සන්නිවේදනය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව විෂයන් හැදෑරිය යුතුය. ඉදිරි වර්ෂ වලදී ආහාර රසායනකල ආහාර විශ්ලේෂණය, ආහාර ජීව සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාවල ආහාර සැකසුම් ඉංජිනේරු විද්‍යාවල ආහාර සැකසුම් තාක්ෂණය සහ රසායනය, තත්ව කළමනාකරණය හා මානව පෝෂණය යන ප්‍රධාන විෂය ධාරාවන්ට අයත් විෂයන් හැදෑරිය හැකිවේග අවසාන වසරේ අවසාන අර්ධ වාර්ෂිකය තුළදී සති 15 ක පර්යේෂණ ව්‍යාපෘතියකට / ක්ෂේත්‍ර පුහුණුවකට සහභාගී වී ඒ හා සම්බන්ධ නිබන්ධන වාර්තාවක් පිළියෙල කර පිළිගැන්විය යුතුය. මෙම පාඨමාලාව සඳහාද පීඨය මගින් Credit ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

### ආගණනය හා තොරතුරු පද්ධති

රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පරිගණක භාවිතය සහ තොරතුරු පද්ධතිය පිළිබඳ දැනුම ඇති උපාධිධරයන් බිහි කිරීම.

මෙම විෂය ධාරාව යටතේ පිරිනමන විශේෂ උපාධි පාඨමාලාවේ අරමුණු වන්නේ තොරතුරු පද්ධති නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුම ලබා දීමයි. සියලුම පාඨමාලා න්‍යායාත්මක සහ ප්‍රායෝගික යන සංරචක වලින් සමන්විත වන අතර නූතන රැකියා අවශ්‍යතාවලට සරිලන අයුරින් සකසා ඇත. මෙම පාඨමාලාව හදාරණ උපාධි අපේක්ෂකයින් කර්මාන්ත දැනුම හා පළපුරුද්ද ලබා ගැනීම සඳහා අවසන් වසර අවසන් අර්ධ වාර්ෂිකය තුළදී සති 15 ක පර්යේෂණ / ක්ෂේත්‍ර පුහුණුවකට සහභාගී කරවනු ලැබේ.

### ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය

දැනට මෙම උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ පවතී. රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් බිහිකිරීම මෙහි අරමුණ වේ.

### ශාරීරික අධ්‍යාපනය

දැනට මෙම උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ පවතී. රටේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ශාරීරික අධ්‍යාපනය හා කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් බිහිකිරීම මෙහි අරමුණ වේ.

### භූවිද්‍යාපන පීඨය

භූවිද්‍යාපන පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ දෙකකින් සමන්විත වේ.

අ) මැනුම් හා භූමිතික අධ්‍යයනාංශය
ආ) දුරස්ථ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය

### උපාධි පාඨමාලාව

සිව් අවුරුදු මැනුම් විද්‍යා උපාධි පාඨමාලාව මැනුම් විද්‍යා මූලධර්ම, භූමිතිය, අනුකූලන න්‍යායන්, සිතියම් විද්‍යාව, ඡායාරේඛනමිතිය, දුරස්ථ ගෝචර ග්‍රහණය, භූමි තොරතුරු පද්ධති, කැඩැස්තර මැනුම්, ජලමාන මැනුම් මෙන්ම ගණිතය, භෞතික විද්‍යාව, පරිගණක නියැළුම්, කළමනාකරණය, පරිසර විද්‍යාව ආදිය ද ආවරණය කරයි.

උපාධි පාඨමාලාව සමාසික( වර්ෂාර්ධ) අට (08) කින් යුක්ත වේ. ඉන් මුල් සමාසික පහ( 05) සියළුම සිසුන්ට පොදු වන අතර මෙහිදී බිම් මැනීමට අදාළ සෑම අංශයක්ම උගන්වනු ලබයි. ඊළඟ සාමාසික තුනේදී (03) සිසුන් විශේෂ උපාධිය සඳහා යොමු කරන අතර එහිදී (I) බිම් මැනීම සහ භූමිතික මැනීම (II) ඉඩම් කළමනාකරණය (III) ජලමාන මැනුම් (IV) දුරස්ථ ගෝචරය (V) භූගෝලීය තොරතුරු පද්ධති යන විශේෂීකරණයන්ගෙන් එකක් හදාරනු ඇත. අවසාන සමාසිකය ආයතනික අභ්‍යාසයන් සඳහා වෙන් කර ඇත.

මෙම උපාධි පාඨමාලාව වර්ෂ 2015 දී රාජකීය වරලත් මිනින්දෝරු ආයතනය (Royal Institution of Chartered Surveyors – RICS) මගින් පිළිගෙන ඇති අතර ඊට අමතරව ජලමාන මැනුම් විශේෂ උපාධිය ජලමාන මිනින්දෝරුවන් සඳහා වන නිපුණතා ප්‍රාමාණික ජාත්‍යන්තර මණ්ඩලය විසින් සහ නාවික සිතියම් විද්‍යාඥ ප්‍රභේද B මට්ටම(FIG/IHO/ICA- Cat B) යටතේ පිළිගනු ලැබ ඇත. එසේම, මෙම පීඨය ජාත්‍යන්තර මිනින්දෝරු ෆෙඩරලයේ (FIG) අධ්‍යයන සාමාජිකයෙකි.

### කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයන පීඨය , 1996 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලා, පීඨය විසින් හඳුන්වා දී ඇති අතර එම උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කරනු ලබන පළමු වසරේ සිටම වෙන් කරනු ලබයි. මෙම සියලු පාඨමාලා පවත්වාගෙන යනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. සාර්ථකව අධ්‍යයන කටයුතු නිම කරනු ලබන උපාධි අපේක්ෂකයන්ට ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය , ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සහ සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ මඟින් පහත සඳහන් උපාධි පිරිනමනු ලැබේ.

| | | |
|---|---|---|
| ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය | - | විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ විශේෂ උපාධිය |
| | - | විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ විශේෂ උපාධිය |
| ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය | - | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධිය |
| අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | - | විද්‍යාවේදී අලෙවි කළමනාකරණ විශේෂ උපාධිය |
| සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය | - | විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය |
| | | විද්‍යාවේදී පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධිය |
| | | විද්‍යාවේදී සත්කාරසේවා කළමනාකරණ විශේෂ උපාධිය |

පීඨයේ සෑම උපාධි පාඨමාලාවක්ම, වසරකට අර්ධ වාර්ෂික දෙකක් බැගින් වූ පූර්ණ කාලීන අර්ධ වාර්ෂික අටකින් සමන්විත වේ. එක් අර්ධ වාර්ෂිකයකට ලිත් සති 15 කි. මෙම අර්ධ වාර්ෂික අට තුළදී උපාධි අපේක්ෂකයන් විසින් තම උපාධිය සඳහා අවම වශයෙන් පාඨමාලා ඒකක රැසක් සම්පූර්ණ කළ යුතු අතර, අවසාන අර්ධ වාර්ෂිකයේ දී සම්පූර්ණ කළ යුතු සිව් මස් ප්‍රායෝගික පුහුණුව හෝ ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම ද මෙයට ඇතුලත් වේ. සෑම අර්ධ වාර්ෂිකයක් අවසානයේ දීම ලිඛිත පරීක්ෂණයක් පැවැත්වෙන අතර උපාධි අපේක්ෂකයන්ගේ කුසලතා ඇගයීම සඳහා GPA ඇගයීම් ක්‍රමය භාවිතා කරයි. සෑම උපාධි අපේක්ෂකයෙක්ම තම උපාධිය සඳහා පීඨය පිළිගත් ආයතනයකින් සිව් මස් ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීම හෝ තම විශේෂීකරණ ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම හෝ සිදු කළ යුතුව ඇත.

### විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ විශේෂ උපාධිය
මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන් වල නියැලීමට බලාපොරොත්තු වන සිසුන් වෙනුවෙන් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. ප්‍රධාන වෘත්තීමය ගණකාධිකාරී ආයතන මගින් මෙහෙයවන පාඨමාලා වලට ගැලපෙන ලෙස මෙම උපාධි පාඨමාලාවේ විෂය ඒකක සකසා ඇති බැවින් උපාධිය සම්පූර්ණ කළ පසු වෙනත් වෘත්තීය පාඨමාලා වල ඇතැම් විෂය ඒකක නිදහස් කර ගැනීමට උපාධිධාරීන්ට හැකියාව ඇත.

### විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ විශේෂ උපාධිය
විද්‍යාවේදී බැංකු සහ රක්ෂණ විශේෂ උපාධි පාඨමාලාව වෙසෙසින්ම සකස් කර ඇත්තේ එම ක්ෂේත්‍රයට අදාළ දැනුමින්, ආකල්පවලින් හා කුසලතාවලින් පිරිපුන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතයන්ට උචිත බැංකු හා රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ හැකියාවන්ගෙන් පරිපූර්ණ විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති උපාධිධාරීන් බිහි කිරීමේ අරමුණෙනි. අදාළ න්‍යායික හා ප්‍රායෝගික පුළුල් දැනුමක් ලබාදීම අරමුණු කරගෙන සුවිශේෂී විෂය ඒකක කිපයක් මෙම පාඨමාලාවට හඳුන්වාදී ඇති අතර එමගින් ඔවුන්ගේ සාමූහික හා විශේෂ විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් උපාධි අපේක්ෂකයින්ගේ, පොදු ජනතාවගේ සහ බැංකු හා රක්ෂණ ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන් හා ඉල්ලුම් සපුරාලීමට අපේක්ෂා කරයි.

### විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධිය
කළමනාකරණ, වෙළඳ සහ වාණිජ යන ක්ෂේත්‍රයන්ට අදාළ රැකියා වල නිරතවීමට අපේක්ෂා කරන සිසුන් වෙනුවෙන් විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. නූතන ව්‍යාපාර ලෝකයේ අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා යන ආකල්ප වලින් සිසුන් සන්නද්ධ කිරීම මෙම උපාධි පාඨමාලාව මගින් සිදු කෙරේ.

### විද්‍යාවේදී අලෙවි කළමනාකරණ විශේෂ උපාධිය
අලෙවිකරණ ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි, දක්ෂතා පිරී සහ රැකියා නියුක්ත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම සඳහා මෙම උපාධි පාඨමාලාව සැලසුම්කරණ ලදී. නිෂ්පාදනය, ප්‍රවාහනය, සන්නිවේදනය, වෙළඳාම, රක්ෂණ, බැංකු සහ රාජ්‍ය ව්‍යාපාර වැනි ක්ෂේත්‍ර වලට අදාළ රැකියා වල නියැලීමට මෙම උපාධිධාරීන්ට හැකියාව ලැබේ.

### විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය
සංචාරක ක්ෂේත්‍රයට අදාළව විවිධ රැකියා වල නිරතවීමට හැකි වන පරිදි සිසුන්ගේ මූලික දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව යටතේ සිසුන්ට වෙනත් විදේශීය භාෂාවක් අධ්‍යයනය කිරීමට ද හැකියාව ලැබේ. මෙම උපාධිය සාර්ථකව නිම කරනු ලබන උපාධි අපේක්ෂකයින් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සංචාරක ක්ෂේත්‍රයේ විවිධ ව්‍යාපාරවල කළමනාකාරීත්ව තනතුරු දැරීම සඳහා සුදුස්සන් වී ඇත.

### විද්‍යාවේදී පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණ විශේෂ උපාධිය
ව්‍යාපාරික සහ වෙනත් ආයතන මුහුණපාන විවිධ පාරිසරික ගැටළු වලට තාක්ෂණික හා තිරසාර විසඳුම් ලබා දීම කෙරෙහි නැඹුරු වූ කළමනාකරණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත . මෙම පාඨමාලාව තුළින් සිසුන්ගේ මූලික කළමනාකරණ කුසලතා , ගැටළු විසඳීමේ හැකියාවන් හා පෞද්ගලික කුසලතාවයන් සංවර්ධනය කරමින් තිරසාර සංවර්ධනය හා සම්බන්ධ ගැටළු වලට සංවේදී කළමනාකරුවන් පිරිසක් බිහිකරනු ලබයි .

### විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය
සත්කාරක සේවා කළමනාකරණ ව්‍යාපාර ක්ෂේත්‍රයට අවැසි න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබා දෙනු වස් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන් හට වෙනත් විදේශීය භාෂාවක් ද අධ්‍යයන කාලය තුල හැදෑරීමට අවස්ථාව උදාවනුඇත. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව නිමකල උපාධිධාරීන්ට දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සත්කාරක සේවා ව්‍යාපාර ක්ෂේත්‍රයේ කළමනාකරණ තනතුරු දැරීමට හැකියාව ලැබෙනුඇත.

## සමාජීය විද්‍යා හා භාෂා පීඨය

### කලා අධ්‍යයන පාඨමාලාව

කලා විෂය ධාරාවෙන් හෝ වාණිජ්‍යය විෂය ධාරාවෙන් අවම සුදුසුකම් සපුරා ඇති සිසුන්ට මෙම අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කළ හැකිය .

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨය පහත සඳහන් පාඨමාලා පවත්වයි .
එනම් ,

1. ශාස්ත්‍රවේදී ( ගෞරව ) උපාධිය ( වසර හතරකි)
2. ශාස්ත්‍රවේදී උපාධිය ( වසර තුනකි)

ශාස්ත්‍රවේදී උපාධිය පීඨයේ අධ්‍යයනාංශ පහ එක්ව පිරිනමනු ලබන අතර , අදාළ විෂයයන්ට අනුව ශාස්ත්‍රවේදී ( ගෞරව) උපාධි පහත පරිදි පිරිනමනු ලබයි .

### ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය
ශාස්ත්‍රවේදී ( ගෞරව) ආර්ථික විද්‍යාව
ශාස්ත්‍රවේදී ( ගෞරව) සංඛ්‍යානය
ශාස්ත්‍රවේදී ( ගෞරව) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ( ඉංග්‍රීසි මාධ්‍යය පමණි )

**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය**

මෙම අධ්‍යයනාංශය ප්‍රධාන හෝ අනු විෂයයක් ලෙස ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) හා විශ්වවිද්‍යාල අධ්‍යයන කාලයෙහි සිසුන්ට ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම සිදු කරයි.

**භූගෝල විද්‍යාව හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය**

ශාස්ත්‍රවේදී (ගෞරව) භූගෝල විද්‍යාව

**භාෂා අධ්‍යයනාංශය**

ශාස්ත්‍රවේදී (ගෞරව) සිංහල
ශාස්ත්‍රවේදී (ගෞරව) දෙමළ
ශාස්ත්‍රවේදී (ගෞරව) ඉංග්‍රීසි
ශාස්ත්‍රවේදී (ගෞරව) ජර්මන්
ශාස්ත්‍රවේදී (ගෞරව) චීන
ශාස්ත්‍රවේදී (ගෞරව) හින්දි

**සමාජ විද්‍යා අධ්‍යනාංශය**

ශාස්ත්‍රවේදී (ගෞරව) දේශපාලන විද්‍යාව
ශාස්ත්‍රවේදී (ගෞරව) සමාජ විද්‍යාව

සිව් අවුරුදු ගෞරව උපාධිය සඳහා සිසුන් තෝරා ගැනීම පළමු වසරේදී සිසුන් දක්වන කුසලතා මත පදනම්ව සිදු කෙරේ.

**තාක්ෂණ පීඨය**

ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ හත්වන පීඨය වන තාක්ෂණ පීඨය, ජෛව පද්ධති තාක්ෂණවේදය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන අධ්‍යයනාංශ දෙකකින් සමන්විත වන අතර එම අධ්‍යයනාංශ මඟින් පහත සඳහන් පූර්ණ කාලීන උපාධි පාඨමාලා දෙක පිරිනමනු ලබයි.

1. ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය(Bachelor of Biosystems Tecnology Honours Degree Programme)
2. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය(Bachelor of Engineering Technology Honours Degree Programme)

ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය සිව් වසරක උපාධි පාඨමාලාවක් වන අතර, එහි පළමු වර්ෂ දෙක, පොදු හර විෂයන්ගෙන් සමන්විත වේ. තෙවන වර්ෂයේ සිට සමාසික කාර්මික පුහුණුවක් ද ඇතුලත්ව, ජෛව බලශක්තිය (Bio-Energy ), ජෛව තාක්ෂණය (Biotechnology), ඖෂධ අනාවරණය (Drug Discovery) යන ප්‍රධාන විෂයමාලා තුනක් යටතේ සිසුන්ට අධ්‍යයන කටයුතු කිරීමට ඉඩ සලසා දී ඇත.

ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යනාංශ පිරිනමනු ලබන සිව් අවුරුදු ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය හදාරන සිසුන්, යාන්ත්‍රික ඉංජිනේරු හා විදුලි ඉංජිනේරු සේවා ක්ෂේත්‍රය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්හි, වෘත්තිකයෙකු වීම උදෙසා සූදානම් කරනු ලබයි. ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යයනාංශයේ උපාධිධාරීන් මූලික විද්‍යාත්මක හා යාන්ත්‍රික ඉංජිනේරු දැනුමෙන් යුක්ත වන අතර, එකී දැනුම යාන්ත්‍රික හා ඊට අදාළ ක්‍රියාකාරකම් වලදී භාවිතා කිරීමටත්, සමාජීය, විද්‍යාත්මක, තාක්ෂණික දියුණුව හා තිරසාර සංවර්ධනය සඳහා සක්‍රියව දායක වීමටත්, හැකියාවක් සහිතව සීග්‍රයෙන් වෙනස් වන වෘත්තීය ක්ෂේත්‍රයන්හි, විභවයක් සහිත වෘත්තීය නිපුණයන් වනු ඇත.

තාක්ෂණ පීඨයේ ප්‍රධාන අරමුණ වනුයේ, විද්‍යාව හා තාක්ෂණ විෂයන් ඉගැන්වීමෙහි සහ පර්යේෂණ සිදුකිරීමෙහිලා ජාත්‍යන්තරව පිළිගත් සන්නාමයක් බවට පත්වීමයි.

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (කුලියාපිටිය)

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| වෛද්‍ය විද්‍යාව | - | E |
| කළමනාකරණය | - | E |
| කෘෂිකර්මය | - | E |
| ආහාර විද්‍යාව සහ පෝෂණය | - | E |
| ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | - | E |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | - | E |

## වෛද්‍ය පීඨය

### වෛද්‍ය විද්‍යා (එම්.බී.බී.එස්.) පාඨමාලාව

විෂය පදනම් වූ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ එම්.බී.බී.එස් පාඨමාලාව වසර පහකි. පූර්ව සායනික (විෂය 03 ක්), සම සායනික (විෂය 06 ක්) සහ සායනික (විෂය 05 ක්) ලෙස වෙන්වූ ප්‍රධාන විෂයයන් 14 කින් සමන්විතය. පූර්ව සායනික සහ සම සායනික විෂයයන් මොඩියුල ක්‍රමය යටතේ උගන්වනු ලබයි. එහි දී, පූර්ව සායනික විෂයයන් මුල් සමාසික 03 තුළදී ද, සම සායනික විෂයයන් 04 වන සමාසිකයේ සිට 07 වන සමාසිකය දක්වා ලෙසද උගන්වනු ලැබේ.

සායනික විෂයයන් 04 වන සමාසිකයේ සිට 10 වන සමාසිකය දක්වා විහිදෙන අතර මොඩියුල පාදක ඒවා වේ.

මොඩියුල, පාඨමාලාව අතරතුර දී හා පාඨමාලාව අවසානයේ වන විභාග වශයෙන් ඇගයෙන අතර ප්‍රධාන සංයුක්ත විභාග 03 කින් සමන්විත ය. ඒවා නම්, දෙවන එම්.බී.බී.එස්, තුන්වන එම්.බී.බී.එස් සහ අවසන් එම්.බී.බී.එස් ලෙස වේ.

අපේ මෙහෙවර වන්නේ උසස් කුසලතාවෙන් සමන්විත, සමාජයට වගකියනු ලබන සෞඛ්‍ය රැකවරණයේ යෙදෙන උසස් වෘත්තීමය තත්වයෙන් යුතු විචිධත්වය, තාර්කික චින්තනය, අන්තර්ග්‍රහණය සහ නිර්මාණශීලීත්වයට දායකත්වයන් දක්වන සංස්කෘතියක ශික්ෂණය දියුණු කිරීම කෙරෙහි කැපවීමෙන් කටයුතු කරන වෘත්තිකයන් බිහි කිරීමය.

අධ්‍යයන පාඨමාලාව මෙහෙයවන ප්‍රධාන මූලධර්ම සහ එම්.බී.බී.එස් උපාධිධාරියකුගෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල වන්නේ (1). උපරිම සෞඛ්‍ය ආරක්ෂාවක්, අභිවර්ධනය සහ විශිෂ්ඨතාව ළගා කර ගැනීමට ඇති කැපවීම, (2). සාමාජීය හා මහජන සෞඛ්‍ය කෙරෙහි ඇති කැපවීම, (3). සඵලදායී සහයෝගිතාව හා සන්නිවේදනය, (4). සදාචාර සම්පන්න හැසිරීම හා වෘත්තීයවේදීත්වය, (5). නායකත්වය සහ කණ්ඩායම් වැඩ (6). විවිධත්වය ගරු කිරීම වේ.

එම්.බී.බී.එස්. පාඨමාලාවේ ඇති ප්‍රධාන ලක්ෂණය වන්නේ පළමු සමාසිකයේ සිටම උගන්වනු ලබන විෂයයන්වල ඇති සායනික අදාළත්වය සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට හදුන්වාදීමයි. මෙය අත්කරගනු ලබන්නේ මුල් අවධියේ රෝගීන්, ඡායාරූප, වීඩියෝ සහ ලිඛිත මාධ්‍යමය සිද්ධීන් යොදා ගනිමිනි.

4 වන සමාසිකයේ සිට රෝහල් කේන්ද්‍ර කොටගත් සායනික පුහුණුව කෙරෙහි වැඩි නැඹුරුවක් ඇත. බොහෝ දුරට අවසාන වසර එක හමාරක කාලයකදී පුහුණු කිරීම හා ඉගැන්වීම සිදුවන්නේ රෝහල්වලය. පාඨමාලාවේ අමතර ලක්ෂණ වන්නේ පාඨමාලාවේ ආරම්භයේ සිට ගැටළු විසඳීමේ හැකියාවක් ඇති කරවීම, වෛද්‍ය විද්‍යාවේ භාවිතයන් සඳහා මූලික විද්‍යාවන් යොදා ගැනීම, ශිෂ්‍ය කේන්ද්‍රීය සහ ස්වයං නියාමන අධ්‍යයනය, කුඩා කණ්ඩායම් අධ්‍යයනය සහ තිරස් සහ සිරස් විෂයය ඒකාබද්ධතාවයි. සිසුන් විසින් ඔවුන්ගේ පුහුණුවේ කොටසක් වශයෙන් පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

අධ්‍යයන පාඨමාලාවේ උපදෙස් ලබා දෙන මාධ්‍යය සහ ඇගයීම් මාධ්‍ය වන්නේ ඉංග්‍රීසි භාෂාවය. විභාගයේදී සාර්ථක වන මනා චරිතයකින් හෙබි ශිෂ්‍යයන් සීමාවාසික පුහුණුව හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා නිර්දේශ කරනු ඇත.

### ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය

පීඨයෙහි දැනට පාඨමාලා සම්මාන ක්‍රමයක් ක්‍රියාත්මක වේ. වසර 04 ක කාල සීමාව සඳහා මුලු සම්මාන සංඛ්‍යාව 120 කි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබන පාඨමාලාවල ශිෂ්‍යයන්ට ලබා ගත හැකි විශේෂීකරණ ක්ෂේත්‍ර වන්නේ- ව්‍යාපාර කළමනාකරණය, ගණකාධිකරණය හා ව්‍යාපාර මූල්‍ය, බැංකු හා ව්‍යාපාර මූල්‍ය සහ රක්ෂණය හා මූල්‍යයයි. ශිෂ්‍යයන් කැමැත්ත පළ කළ පාඨමාලාවන්ගෙන් පළමු වසර දෙක (සමාසික I, II) තුළදී ඔවුන් දැක්වූ සාධනය මත විශේෂීකරණය සඳහා තෝරා ගැනීම පදනම් වේ.

### කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

මෙම පීඨය මගින් කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව [BScHons (Agriculture)] සහ ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව [BBST (Hons)] යන උපාධීන් දෙක ප්‍රධානය කරනු ලබයි. මෙම උපාධි පාඨමාලා දෙකම ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවනු ලබන අතර අධ්‍යයන කාලය වසර හතර බැගින් වේ.

1. **කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව [BScHons (Agriculture)] උපාධිය**

   මෙහි පළමු වසර දෙක තුළ උගන්වනු ලබන පාඨමාලා සියළුම සිසුන්ට අනිවාර්ය වේ. මෙම විෂයන් පීඨය සතු දෙපාර්තමේන්තු, පරිගණක ඒකකය සහ ඉංග්‍රීසි ඒකකය මගින් මෙහෙයවනු ලබයි. තුන්වන වසර පළමු සමාසිකයේ සිට සිසුන්ට විශේෂිත පාඨමාලා හැදෑරීමේ අවකාශය ලැබේ. මෙම විශේෂිත පාඨමාලා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් යටතේ අධ්‍යයනය කළ හැකිය.

   1. වැවිලි කළමනාකරණය :
      - i. වැවිලි සම්පත් කළමනාකරණය
      - ii. වැවිලි නිෂ්පාදන සංවර්ධනය හා තාක්ෂණය
   2. උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණය :
      - i. උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණය
      - ii. උද්‍යාන භෝග පසු අස්වනු තාක්ෂණය

3. කෘෂි ව්‍යාපාර කළමනාකරණය:
   i. කෘෂි ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර
   ii. කෘෂි ව්‍යාපාර හා අලෙවිකරණය

4. ජෛව තාක්ෂණය:
   i. ජෛව තාක්ෂණය

මෙම විශේෂිත පාඨමාලාවන් හැදෑරීම සඳහා සිසුන් තෝරා ගැනීම, සිසුන් විසින් ප්‍රථම හා දෙවන වසර තුළදී දක්වා ඇති කුසලතාව සහ සිසුන්ගේ කැමැත්ත මත තීරණය වේ.

තුන්වන වසර දෙවන සමාසිකය සහ හතරවන වසර පළමු සමාසිකය අවසන් වන තුරු ශිෂ්‍යයන්ට පර්යේෂණ ව්‍යාපෘතියක නියැලීමට අවකාශය සලසා ඇත. මෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ එම පර්යේෂණ ප්‍රතිඵල වාර්තා ලෙස ප්‍රකාශයට පත් කිරීම හා වාර්ෂිකව පවත්වනු ලබන කෘෂි පර්යේෂණ සම්මේලනයේදී (AGRES) ඒවා ඉදිරිපත් කිරීමට ඔවුනට අවකාශය ලබාදීමයි. මෙම උපාධි පාඨමාලාවේ අවසාන සමාසිකය තුළදී විෂය ධාරාවට අදාළ පිළිගත් බාහිර ආයතනයක සේවාස්ථ පුහුණුවකට(Inplant Training) අනුයුක්ත කරනු ලැබේ.

## 2. ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය [BBST(Hons)]

මෙම උපාධි පාඨමාලාව අලුතින් ආරම්භ කර ඇති අතර මෙහි අරමුණ වන්නේ නූතන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ජෛව භෞතික හා ඉංජිනේරු සිද්ධාන්ත මත පදනම්ව ජෛව පද්ධති මෙහෙයවීම පිළිබඳ වූ පූර්ණ දැනුමක් හා විධිමත් පුහුණුවක් ලබාදීම තුළින් කෘෂි ඉංජිනේරු, පසු අස්වනු තාක්ෂණය, ආහාර තාක්ෂණය, අපද්‍රව්‍ය පාලනය වැනි ක්ෂේත්‍රවල වැඩිවෙමින් පවතින ඉල්ලුමට සරිලන උපාධිධරයන් බිහි කිරීමය. පාඨමාලා කාලසීමාව අවුරුදු 04 ක් වන අතර එය අධ්‍යයන ඒකක (Credits) 124 කින් සමන්විත වේ. මෙම උපාධි පාඨමාලාව පර්යේෂණ ව්‍යාපෘතියක් හා පිළිගත් බාහිර ආයතනයක දෙනුලබන සේවාස්ථ පුහුණුවකින්(Inplant Training) සමන්විත වේ.

මෙම පීඨය මීගමුව කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ මීගමුවේ සිට කි.මී. 20 ක් දුරින් සහ කුරුණෑගල සිට කි.මී. 50 ක් දුරින් මාකඳුර ගෝනවිල ප්‍රදේශයේ පිහිටා ඇත.

## පශු සම්පත්, ධීවර සහ පෝෂණ පීඨය

මෙම පීඨය මගින් විද්‍යාවේදී උපාධි පාඨමාලා දෙකක් පිරිනමනුලබයි. ඒවා නම්,

(අ) ආහාර විද්‍යාව හා පෝෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය

(ආ) ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම සිව් අවුරුදු පාඨමාලාවේදී ප්‍රථම වසර දෙක තුළදී උපාධි අපේක්ෂකයින් විසින් පොදු පාඨමාලාවක් හදාරනුලබන අතර, අවසන් දෙවසර තුළදී ව්‍යවහාරික පෝෂණය හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය යන අංශ යටතේ ගෞරව උපාධිය හැදෑරීම සඳහා අවකාශ ලැබේ.

### (අ) ආහාර විද්‍යාව හා පෝෂණය

ආහාර විද්‍යාව හා පෝෂණ පාඨමාලාව මගින් ආහාර තාක්ෂණය හා මානව පෝෂණය සම්බන්ධ මූලධර්ම පිළිබඳව සිසුන් හට පුළුල් අවබෝධයක් ලබා දෙයි. සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන සිසුන් - (1) ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳව පුළුල් විද්‍යාත්මක දැනුමක්, (2) සමාජ විද්‍යාව, අලෙවිකරණය හා කළමනාකරණ යෙදීම් ආශ්‍රිත දැනුමක් සහ අවබෝධයක, (3) ගැටලු විසඳීමේ හා ආශ්‍රිත පර්යේෂණවල යෙදීමේ හැකියාවක්, (4) විෂයානුබද්ධ වෘත්තීමය හා ප්‍රායෝගික නිපුණතාවයන් සහ ව්‍යාපාර හා පුද්ගල නිපුණතාවන් ලබා ගනී.

පළමු මට්ටම (Level I) තුළදී පිරිනමනු ලබන විෂයයන් තුළින්, ජීව රසායන විද්‍යාව, මානව කායික විද්‍යාව, ආහාර හා පෝෂණය, ක්ෂුද්‍ර ජීවි විද්‍යාව, රසායන විද්‍යාව, ආහාර අලෙවිකරණය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව, ආහාර සැකසුම හා පරිරක්ෂණය, ආහාර විශ්ලේෂණය හා තත්ව සහතිකකරණය පිළිබඳ ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

මීට අමතරව සිසුන් විසින් ඉංග්‍රීසි, ගණිතය, සංඛ්‍යානය හා තොරතුරු තාක්ෂණ විෂයයන් හැදෑරිය යුතුය. මට්ටම් II හා III තුළදී සිසුන් තමන්ගේ විශේෂ අධ්‍යයන ධාරාවට අනුබද්ධව: ව්‍යවහාරික පෝෂණ ක්ෂේත්‍රය ( ආහාරවේදය, මහජන සෞඛ්‍ය හා ප්‍රජා පෝෂණය, ආහාර හා රෝගාබාධ, ක්‍රීඩා හා ව්‍යායාම පෝෂණය), ආහාර විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රය ( ආහාර රසායන විද්‍යාව, ආහාර ක්ෂුද්‍ර ජීවී විද්‍යාව, ජෛව තාක්ෂණය, ආහාර ආරක්ෂිතතාව, කිරි, මත්ස්‍ය, මාංශ, ධාන්‍ය, එලවළු හා පළතුරු ආශ්‍රිත ආහාර තාක්ෂණය) විෂයයන් හදාරයි. සියලුම විෂයයන් සඳහා විද්‍යාගාර හෝ ක්ෂේත්‍ර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

හත්වන සමාසිකය තුළදී සියලුම සිසුන් විසින් පර්යේෂණ ව්‍යාපෘතියක නියැලිය යුතුය. අවසාන සමාසිකය තුළදී සිසුන් සඳහා විෂය ධාරාවට සම්බන්ධ පිළිගත් බාහිර ආයතන තුළ සති දහයක සේවාස්ථ පුහුණුවක (In plant Training) නියැලීමට අවස්ථාව සලසා ඇත.

මෙම උපාධි පාඨමාලාව මගින් සිසුන් හට ආහාර තාක්ෂණවේදී, පෝෂණවේදී, ආහාරවේදී, ආහාර රසායනඥ, තත්ව සහතික විද්‍යාඥ, කළමනාකාර, පුද්ගලික ව්‍යාපාර, අධ්‍යාපනඥ, පුහුණුකිරීම් හා පර්යේෂණ ක්ෂේත්‍රවල රැකියාවල නියැලීමට අවශ්‍ය සිද්ධාන්තමය හා වෘත්තීමය නිපුණතාවය ලබා දෙයි. තවද මෙම පාඨමාලාව මගින් පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා නිපුණත්වය ලබා දෙයි.

### (ආ) ආහාර නිෂ්පාදනය සහ තාක්‍ෂණ කළමනාකරණය

මෙම පාඨමාලාවේදී ප්‍රථම වසර දෙක උපාධි අපේක්‍ෂකයන් පොදු පාඨමාලාවක් හදාරනු ලබන අතර අවසන් දෙවසර තුළ පශු සම්පත් හා පක්‍ෂි විද්‍යාව හෝ ධීවර හා ජලජ ජීවී විද්‍යාව යන විෂයය ක්‍ෂේත්‍රයන් සිසුනට තෝරා ගත හැකිය.

ආහාර නිෂ්පාදනය හා තාක්‍ෂණ කළමනාකරණය පිළිබඳ ගෞරව සිව් අවුරුදු පාඨමාලාව එම ක්‍ෂේත්‍රයේ දේශීය සහ විදේශීය අවශ්‍යතාවයන් සපුරාලන අතර නිෂ්පාදන කළමනාකරණ ක්‍ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතාවයන්ට සහ අනාගත අභියෝගයන්ට අනුකූලව සැකසී ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ඔස්සේ ඉදිරියට දිවෙන මෙම පාඨමාලාවෙහි අන්තර්ගතය තුළ ක්‍ෂේත්‍ර අධ්‍යයනයන් ආයතනගත අධ්‍යයනයන් සහ ආහාර නිෂ්පාදනය හා බැඳුනු පර්යේෂණයන්ගෙන් ද සමන්විත වනු ඇත.

සෛද්ධාන්තික දැනුම මෙන්ම ප්‍රමාණවත් ප්‍රායෝගික දැනුමක් ලබාදීම පිණිස අනිවාර්යය විෂය ධාරාවන්ට අමතරව තෝරාගත හැකි විෂයයන් රාශියක් ඇතුළත් කර තිබීම මෙහි විශේෂයක් වන අතර ආයතන ගත පුහුණුවට අමතරව සයමසක පර්යේෂණ පාඨමාලාවකට සිසුන් යොමුකරවීම මෙහි ඇති අනෙක් විශේෂත්වයයි. බහුවිධ විෂය මාලාවන් ඔස්සේ මූලික විෂයය සංකල්පයන්ගේ සිට පුළුල් විෂයය දැනුමක් සහ අවබෝධයක් ලබාදීම මගින් විශේෂ කුසලතාවයන් සහ ආකල්පයන්ගෙන් සපිරි රැකියා සඳහා මනා ප්‍රවීණතාවයක් ඇති උපාධිධාරීන් පිරිසක් මෙමගින් බිහිකෙරේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ මුල් දෙවසර තුළ පැවැත්වෙන පළමු පෙළ විෂයයන් ඔස්සේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හා අනුගත මූලික සංකල්පයන් හා කුසලතාවයන් වෙත සිසුන් යොමු කෙරෙන අතර පරිගණක දැනුම, ගණිතය, සංඛ්‍යානය වැනි විෂයය දැනුම ද ලබා දේ.

පළමු පෙළ විෂයය මාලාව සාර්ථකව සම්පූර්ණ කරන සෑම ශිෂ්‍යයකුටම තමුන් තෝරා ගන්නා, අධ්‍යයන අංශයක් තුළ තුන්වන සහ හතරවන වසරවලදී ගෞරව පාඨමාලා හැදෑරීමේ අවස්ථා හිමි වේ.

මේ යටතේ පශු සම්පත් සහ පක්‍ෂි විද්‍යා අධ්‍යානාංශයේ හෝ ධීවර සහ ජලජ ජීවී අධ්‍යයන අංශයේ විෂයය සංකලනයන් ඔවුනට තෝරා ගත හැකිය. සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ආහාර විද්‍යාව සහ තාක්‍ෂණ අධ්‍යයනාංශ සහ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය මගින් පිළිගන්වනු ලබන සමහර විෂයයන් හැදෑරීමේ අවස්ථාව ද, ආහාර නිෂ්පාදනය හා තාක්‍ෂණ කළමනාකරණය සිසුන්ට හිමිවනු ඇත.

මෙම උපාධි පාඨමාලාවේ විශේෂත්වය වන්නේ සම්ප්‍රදායික දැනුමෙන් ඔබ්බට යොමුවෙමින් ආහාර නිෂ්පාදන තාක්‍ෂණය හා බැඳුනු නූතන දැනුම ගවේෂණය කරමින් නිෂ්පාදන සහ ව්‍යාපාර කළමනාකරණය, පාරිභෝගික අධ්‍යයනයන සහ ජීවන කුසලතා සංවර්ධනය යන අංශයන් ඔස්සේ දැනුම, හැකියාවන්, නායකත්වය සහ ගැටළු විසඳීමේ නිපුණතාවයන්ගෙන් හෙබි රැකියානුබද්ධ උපාධිධාරියකු බිහිකිරීමයි. මීට අමතරව ආහාර නිෂ්පාදන අධීක්‍ෂණය, අලෙවිකරණය, පරීක්‍ෂණ සහ නව නිපැයුම් කෙරෙහි යොමුවන දැනුම සහ හැකියාවන්ගෙන් ඔවුන් යුක්ත වනු ඇත.

ආහාර නිෂ්පාදන ක්‍ෂේත්‍රයේ ව්‍යාපාර හා බැඳුණ දැනුම සහ කුසලතාව හඳුනා ගැනීමට ආයතන ගත පුහුණුව ඔස්සේ සිසුන්ට ඉඩ සැලසෙන අතර රැකියා සඳහා වඩා උචිත කුසලතා වර්ධනයට මෙම වෘත්තීයය පුහුණුව මගින් ඔවුන්ට අවස්ථාව උදා වේ.

වෘත්තීය මට්ටමේදී මෙන්ම පශ්චාත් උපාධි මට්ටමේදී වැදගත් වන විශ්ලේෂණ සහ විචක්‍ෂණ කුසලතාවයන් දියුණු කිරීමේ අරමුණින් සය මසක පර්යේෂණ ව්‍යාපෘතියක් මෙම පාඨමාලාවට අන්තර්ගත කර ඇත.

### ව්‍යවහාරික විද්‍යා පීඨය

අ. පො. ස (උසස් පෙළ) භෞතීය විද්‍යා විෂය ධාරාව හදාළ සියලු සිසුන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයට ඇතුළත්වීමට සුදුසුකම් ලබන අතර අදාල සිසුන් මෙම අත්පොතෙහි 2.2.4.6 කොටසෙහි සඳහන් පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය. මේ අනුව,

(අ) විෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියක් සහිත වසර හතරක විශේෂ උපාධිය
(ආ) කර්මාන්තමය පුහුණුව සහිත වසර හතරක බද්ධ ප්‍රධාන විෂය උපාධිය සහ
(ඇ) වසර තුනක සාමාන්‍ය උපාධිය යනුවෙන් පහත විස්තර කෙරෙන අන්දමින් උපාධි පාඨමාලා තුනකි.

පීඨයේ ප්‍රථම වසර දෙක තුළ දක්වන ලද අධ්‍යයන ක්‍රියාකාරීත්වය මත පදනම් වූ අභ්‍යන්තර තේරීම් ක්‍රමයක් මගින් වසර හතරක උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය ලබාදීම සිදු කෙරේ. මූලිකව අ. පො. ස (උ. පෙ) විභාගයේදී ලබාගන්නා ලද ඉසෙඩ් ලකුණු සහ ඒ ඒ දිස්ත්‍රික්කය මගින් පීඨයේ ලියාපදිංචිය ලැබූ ප්‍රතිශතය මත පදනම්ව සෑම සිසුවෙකුම පහත සඳහන් විෂය සංයෝග අතුරින් එකක් සඳහා තෝරා ගනු ලැබේ.

සංයෝග 1 : පරිගණක හා තොරතුරු පද්ධති, ඉලෙක්ට්‍රොනික, ගණිතය සහ සංඛ්‍යානය
සංයෝග 2 : ඉලෙක්ට්‍රොනික, කර්මාන්ත කළමනාකරණය, ගණිතය සහ සංඛ්‍යානය
සංයෝග 3 : පරිගණක හා තොරතුරු පද්ධති, කර්මාන්ත කළමනාකරණය, ගණිතය සහ සංඛ්‍යානය

ඉහත සඳහන් දෙවන විෂය සංයෝගය සඳහා තේරී පත්වන සිසුන් සඳහා ද උපාධි පාඨමාලාවට අමතරව තම පරිගණක හා තොරතුරු තාක්‍ෂණ දැනුම වර්ධනය කර ගැනීම සඳහා තොරතුරු තාක්‍ෂණය ඩිප්ලෝමාවක් හැදෑරීම සඳහා අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

ඕනෑම විෂය සංයෝගයක් සඳහා සුදුසුකම් ලැබූ සියලු සිසුන් පළමු අධ්‍යයන වර්ෂ දෙක තුළ එම විෂයයන්ට අදාල අධ්‍යයන කටයුතු කළ යුතු වේ. දෙවන වසර අවසානයේදී, පීඨය මගින් විශේෂ කොට (අ) සහ (ආ) යටතේ සඳහන් වසර හතරක උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අයදුම් කළ හැකිය.

(අ) වසර හතරක විද්‍යාවේදී (විශේෂ) ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)
වසර හතරක විද්‍යාවේදී (විශේෂ) කර්මාන්ත කළමනාකරණ උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)
වසර හතරක විද්‍යාවේදී (විශේෂ) සංඛ්‍යානය සමඟ ගණිතය උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය)

ඉහත සඳහන් උපාධි පාඨමාලා සිසුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා වන උනන්දුව සහ පර්යේෂකයන් වීමට හෝ යම් විෂය ක්ෂේත්‍රයක් හදාළ පසු එම විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයින් වීමට ඇති උනන්දුව අනුව සකසන ලද පාඨමාලා වේ. විශේෂ උපාධි පාඨමාලාවක් සඳහා ප්‍රවේශය ලැබීම අතිශය තරඟකාරී වන්නේ ඉහත අදාළ විෂය ක්ෂේත්‍රයේ උසස් ප්‍රවීණතාවක් පෙන්වා උසස් තත්වයක් අත්පත් කර ගන්නා ලද සීමිත සිසුන් කිහිප දෙනෙකුට පමණක් වන බැවිනි. සියලු විශේෂ උපාධි පාඨමාලාවන් සඳහා විශේෂීකරණය වන විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිව්වන වසර තුළ අන්තර්ගතය.

(ආ) වසර හතරක විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) උපාධිය - ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 † (ඉංග්‍රීසි මාධ්‍යය)
† ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 විෂයයන් පහත සඳහන් පරිදි සංයෝග වේ.

| **ප්‍රධාන විෂය 1** | **ප්‍රධාන විෂය 2** |
|---|---|
| පරිගණක හා තොරතුරු පද්ධති | ඉලෙක්ට්‍රොනික / කර්මාන්ත කළමනාකරණය / ගණිතය, ගණිතමය ආදර්ශ සහ සංඛ්‍යානය |
| ඉලෙක්ට්‍රොනික | පරිගණක හා තොරතුරු පද්ධති / කර්මාන්ත කළමනාකරණය / ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය |
| කර්මාන්ත කළමනාකරණය | පරිගණක හා තොරතුරු පද්ධති / ඉලෙක්ට්‍රොනික / ගණිතය, ගණිතමය ආදර්ශ සහ සංඛ්‍යානය |
| ගණිතය, ගණිතමය ආදර්ශ හා සංඛ්‍යානය | පරිගණක හා තොරතුරු පද්ධති / ඉලෙක්ට්‍රොනික / කර්මාන්ත කළමනාකරණය |

ප්‍රධාන විෂය 1 විෂය ධාරාව මඟින් ඒ ඒ සංයෝගය සඳහා ප්‍රධාන විෂය 2 ට වඩා සිසුන්ට විෂය පිළිබඳව පුළුල් ආවරණයක් සැපයෙන අතර ඇතැම් ප්‍රධාන විෂය 1 විෂයයන් සඳහා සීමිත පිරිසක් ලියාපදිංචි කෙරෙන අතර ඒ සඳහා වන ඉඩකඩ අභිබවා ඉල්ලුමක් පවතී.

මෙම සියලු බද්ධ ප්‍රධාන විෂය උපාධීන් ප්‍රධාන විෂය 1 සහ ප්‍රධාන විෂය 2 ලෙසින් තෙවන වසර සිට ඉදිරියට ක්‍රියාත්මක වන පාඨමාලාවන් වන අතර සිව්වන වසර සමන්විත වන්නේ මුල් සමාසිකය පීඨය තුළ ඉගෙනුම් පාඨමාලාවලින් සමන්විත වන පරිදි සහ දෙවන සමාසිකය රාජ්‍ය හෝ පෞද්ගලික බාහිර ආයතනයක පූර්ණ අත්දැකීම් සහ අවබෝධය සහිත ආයතනික සයමාසික පුහුණුවකින් සමන්විත වන අන්දමිනි.

මෙම බද්ධ ප්‍රධාන විෂය උපාධීන් මඟින් අපේක්ෂා කරන්නේ සිසුන් විසින් අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍ර දෙකකට අදාළව දැනුම සහ අත්දැකීම් පුළුල් කර ගැනීමත් උපාධිය ලබා ගැනීමට ප්‍රථම පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ ආයතනවල පරිසරය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමත්ය.

(අ) හි සඳහන් විෂයානුබද්ධ විශේෂ උපාධි පාඨමාලා සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය තරම් මෙම උපාධි පාඨමාලා සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය තරඟකාරී නොවේ. එහෙයින් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු විශේෂයෙන් පෞද්ගලික අංශයේ රැකියා අපේක්ෂා කරන සිසුන් සඳහා මෙහි වැඩි අවස්ථාවක් පවතී.

**(ඇ) වසර තුනක - විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය**

ආරම්භයේ සිටම වසර තුනක අධ්‍යයන කාලය නිම කිරීමෙන් විශ්වවිද්‍යාලයෙන් පිටවීමට අපේක්ෂා කරන සිසුන් සඳහා සහ වසර හතරක උපාධි පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වසර තුනක විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව හැදෑරිය හැකිය. මෙම පාඨමාලාවද ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුකෙරේ. මෙම උපාධිය මුල් විෂය සම්බන්ධතාවට අදාළව ලැයිස්තු ගත කරන ලද ප්‍රධාන විෂයන් තුනකින් සමන්විතය.

මෙහි (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් කරන ලද සියලු උපාධි පාඨමාලා සඳහා භාෂා මාධ්‍යය ඉංග්‍රීසි වන හෙයින් ඉංග්‍රීසි ඉගැන්වීම විෂය සමගාමී අධ්‍යයන වැඩසටහන හා සමගාමීව මුල් වසර දෙක තුළ සිදු කෙරේ. තවද ව්‍යාපාර ඉංග්‍රීසි (Business English) පාඨමාලාවක් සහ උසස් ඉංග්‍රීසි කුසලතා පාඨමාලාව (Advanced English Proficiency Course) තුන්වන වර්ෂය තුළ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් උසස් කුසලතා අත්පත් කර ගැනීමට අදහස් කරන සිසුන් සඳහා පිරිනැමේ.

**තාක්ෂණ පීඨය**

වයඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය පහත සඳහන් අධ්‍යයන අංශයන්ගෙන් යුක්ත වේ.

- යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශය
- විද්‍යුත් තාක්ෂණ අධ්‍යයන අංශය
- ඉදිරිකිරීම් තාක්ෂණ අධ්‍යයන අංශය
- නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයන අංශය

### ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලා

උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදී විෂය ධාරාවේ සිසුන් පහත සඳහන් සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලා සඳහා තාක්ෂණ පීඨයට ඇතුළත් කරගනු ලැබේ.

1. ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය
2. නැනෝවිද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

පාඨමාලාවේ පළමු වසර ආරම්භයේදී මෙම උපාධි පාඨමාලා දෙක සඳහා සිසුන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම සිසුන්ගේ තේරීම හා Z - අගය මත රඳා පවතී. උපාධි පාඨමාලා ක්‍රෙඩිට් (Credit) අගය මත පදනම් වූ පාඨමාලා ඒකක ක්‍රමයක් යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

### ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය [BET(Hons)]

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව විද්‍යුත් තාක්ෂණ, ඉදිකිරීම් තාක්ෂණ සහ යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශ මගින් පවත්වනු ලැබේ. උපාධි පාඨමාලවේ පළමු වසරේදී ඉංජිනේරු තාක්ෂණවේදයට අදාළ පාඨමාලා ඒකකවලට අමතරව ඉංජිනේරු ගණිතය, ඉංජිනේරු භෞතික විද්‍යාව, කර්මාන්ත පරිපාලනය සහ තොරතුරු තාක්ෂණයට අදාළ පාඨමාලා ඒකකද පිරිනමනු ලැබේ. දෙවන වසරේදී පහත දැක්වෙන විශේෂ විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව ලැබේ. මෙම තෝරා ගැනීම සිසුන්ගේ කැමැත්ත සහ ඔවුන්ගේ පළමු වසරේ ප්‍රතිඵල මත රඳා පවතී.

- ඉදිකිරීම් තාක්ෂණය
- විද්‍යුත් තාක්ෂණය
- යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණය

උපාධි පාඨමාලාව මුළුල්ලේම සිසුන්ට ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසේ. තවද ප්‍රායෝගික තාක්ෂණික ගැටළු විශ්ලේෂණය සහ විසඳීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් පාඨමාලාවේ අවසන් වසරේදී අඩංගු කර ඇත. රැකියා පරිසරය පිළිබඳ අත්දැකීමක් ලබාදෙනු පිණිස සිව් වන වසරේ දෙවන අර්ධයේදී සිසුන්ව පූර්ණ කාලීන කර්මාන්ත පුහුණුවක් සඳහා බාහිර ආයතනයකට යොමු කරනු ලැබේ.

### නැනෝවිද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව නැනෝවිද්‍යා තාක්ෂණ අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබයි.

නැනෝවිද්‍යා තාක්ෂණ විෂයය උපාධි මට්ටම දක්වා වර්ධනය කරනු ලබන අතර මීට රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ද්‍රව්‍ය විද්‍යාව, ජීව තාක්ෂණය, නැනෝ ඖෂධ, බලශක්ති යන ක්ෂේත්‍රයන්ට අදාළ අත්‍යවශ්‍ය සෛද්ධාන්තික සහ ප්‍රායෝගික කරුණු අඩංගු වේ. නැනෝ තාක්ෂණයේ පරිගණක යෙදුම් සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ සැළකිය යුතු ප්‍රමාණයක් පාඨමාලාවට අඩංගු කර ඇත. පාඨමාලාවේ පළමු වසරේදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාවේ මූලික කරුණු පිළිබඳව අවබෝධයක් ලබා දෙනු ඇත. දෙවන වසරේ සිට නැනෝවිද්‍යා තාක්ෂණ විෂයේ ප්‍රධාන ක්ෂේත්‍රයන්ට අදාළ මූලික සිද්ධාන්ත සහ ඒවායේ ප්‍රායෝගික යෙදීම් පිළිබඳවත් පර්යේෂණ කිරීමේ හැකියාව සහ කුසලතා වැඩි දියුණු කිරීම පිණිස අවසන් වසරේදී මාස හයක කර්මාන්ත පුහුණුවක් සහ පර්යේෂණ ව්‍යාපෘතියක් පාඨමාලාවට අඩංගු කර ඇත.

## ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/ මා |
|---|---|---|
| විද්‍යාව සහ තාක්ෂණය | - | E |
| පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | - | E |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | - | E |
| සත්ත්ව පාලන විද්‍යාව | - | E |
| අපනයන කෘෂිකර්මය | - | E |
| තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | - | E |
| කාර්මික තොරතුරු තාක්ෂණය | - | E |
| ඛනිජ සම්පත් සහ තාක්ෂණය | - | E |
| ජලජ සම්පත් තාක්ෂණය | - | E |
| තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | - | E |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | - | E |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | - | E |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | - | E |
| මානව සම්පත් සංවර්ධනය | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |

**විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය**
දැනුම හැකියාවන් සහ සංකල්පමය වර්ධනය විවිධ වූ විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි වැඩි දියුණු කිරීමත්, ස්වභාවික හා දේශීය සම්පත්වලට වඩා වැඩි අගයක් ගිම්කර දෙමින් විද්‍යා සහ තාක්ෂණික පර්යේෂණ ක්ෂේත්‍රයන්හි නව පිබිදීමක් ඇතිකරලීමත් මෙහි අරමුණ වෙයි.

**පරිගණක විද්‍යාව හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය**
ස්වයං අධ්‍යයනය හා පර්යේෂණ මගින් ලබාගත් පරිගණක තාක්ෂණික දැනුම භාවිතා කරමින් දේශීය කර්මාන්තයන්ට අගයක් එකතුකර එමගින් ජාතික ආර්ථිකයේ දියුණුවට දායකවිය හැකි උපාධිධාරීන් බිහි කිරීම.

**ව්‍යවසායකත්වය සහ කළමනාකරණය ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය**
දේශීය සම්පත් වලට වැඩි වටිනාකමක් ගිම්කර දෙමින් තිරසාර සංවර්ධන ක්‍රියා වලියට ක්‍රියාශීලීව දායක විය හැකි, කළමනාකරණ දැනුමෙන් හා ව්‍යවසායකත්වය හැකියාවන්ගෙන් පිරිපුන් උපාධිධරයෙකු බිහිකිරීම.

**සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධිය**
සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ ඉල්ලුම සපුරාලීමටත්, සත්ත්ව නිෂ්පාදන ඵලදායීතාව දියුණු කිරීමට සහ කර්මාන්ත සහ ගෘහස්ත මට්ටමේ සත්ත්ව නිෂ්පාදන වලට අගය වැඩිකිරීම සඳහාත් විශේෂිත දැනුම ඇති, නිපුණතා සහිත, උගත් සහ බුද්ධිමත් සත්ත්ව විද්‍යා උපාධිධරයෙකු බිහි කිරීම.

**අපනයන කෘෂිකර්මය විද්‍යාවේදී ගෞරව උපාධිය**
අපනයන සඳහා කෘෂි නිෂ්පාදන සහ ප්‍රාථමික කෘෂි නිෂ්පාදනයන්ගේ මෙන්ම ස්වභාවික කෘෂි සම්පත් වලට අගය වැඩි කිරීමට අවශ්‍ය විද්‍යාත්මක ඥාණයෙන් සහ නිපුණතාවයෙන් යුත් උපාධිධාරීන් බිහි කිරීම.

**තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම විද්‍යාවේදී ගෞරව උපාධිය**
ශ්‍රී ලංකාවේ තේ තාක්ෂණය අංශය පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක දැනුමක් ලබා දීම, න්‍යායාත්මක දැනුම සහ නූතන ප්‍රායෝගික පුහුණුව තුළින් තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම පිළිබඳ විශේෂඥ දැනුමක් සිසුන්ට ලබා දීම, අගය එකතු කිරීමේ නව තාක්ෂණික ක්‍රමවේදයන් මගින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම, තරඟකාරී තේ ලෝක වෙළඳපොළෙහි ඇති පාරිභෝගික අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නංවාලීම යනාදිය පාඨමාලාවේ අරමුණ වෙයි.

**කාර්මික තොරතුරු තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය**
දේශීය කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කිරීම සඳහා වූ පරිගණක විද්‍යා හා තාක්ෂණික දැනුම ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වෙයි.

**ඛනිජ සම්පත් හා තාක්ෂණවේද විද්‍යාවේදී ගෞරව උපාධිය**
දේශීය ඛනිජ සම්පත් පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක දැනුමක් ලබා දීම, න්‍යායාත්මක දැනුම සහ නූතන ප්‍රායෝගික පුහුණුව උපයෝගී කර ගැනීම තුළින් ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබාදීම, ඛනිජ සම්පත් වල අගය වැඩි කිරීම සහ උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අවශ්‍ය විද්‍යා හා තාක්ෂණික දැනුම සැපයීම මෙම පාඨමාලාවේ අරමුණ වෙයි.

**ජලජ සම්පත් තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධිය**
විද්‍යාව හා දියුණු තාක්ෂණය යොදාගනිමින් ශ්‍රී ලංකාවේ ජල ජීවී සම්පත් සංවර්ධනය කිරීමට හැකියාව ඇති දක්ෂයින් බිහි කිරීම, ලෝකයේ ඇති දියුණු හා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් වෙත සිසුන් ප්‍රවිශ්ඨ කරවීම, ජලජීවී අංශය තුළ පවතින ලෝක හා ප්‍රාදේශීය අවශ්‍යතාවලට සරිලන ආකාරයේ නවතම අගය වැඩි කළ නිෂ්පාදන සඳහා ඔවුන් යොමු කිරීම මෙහි අරමුණ වෙයි.

**තාල සහ ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම විද්‍යාවේදී ගෞරව උපාධිය**
ශ්‍රී ලාංකීය තාල සහ ක්ෂීර තාක්ෂණය අංශයේ උචිත ඇගයුමක් උදෙසා ගැඹුරු විද්‍යාත්මක දැනුමක් ලබා දීම, න්‍යායාත්මක දැනුම සහ නූතන ප්‍රායෝගික පුහුණුව තුළින් තාල සහ ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම පිළිබඳ විශේෂඥ දැනුමක් සිසුන්ට ලබා දීම, අගය එකතු කිරීමේ නව තාක්ෂණික ක්‍රම වේදයන් මගින් ශ්‍රී ලංකාවේ තාල සහ ක්ෂීර කර්මාන්තය නංවාලීම, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළෙහි තාල සහ ක්ෂීර නිෂ්පාදනයන් සඳහා වන පාරිභෝගික අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි ශ්‍රී ලාංකීය තාල සහ ක්ෂීර කර්මාන්තය නංවාලීම මෙහි අරමුණ වෙයි.

**ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය**
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි කළමනාකරණය පිළිබඳ ගැඹුරු විද්‍යාත්මක දැනුමක් ලබාදීම, විවිධ ශික්ෂණයන් සමග සිය දැනුම සහ කුසලතාවයන් උපයෝගී කරගෙන අදාළ ක්ෂේත්‍රයේ වටිනාකම් දියුණු කිරීම, සේවා සහ නවීකරණ සංවර්ධනය.

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| සංගීතය | - | S |
| නර්තනය | - | S |
| නාට්‍ය හා රංග කලා | - | S |
| දෘශ්‍ය කලා | - | S |

**දෘශ්‍ය කලා පීඨය**

**චිත්‍ර කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - චිත්‍ර කලා**

චිත්‍ර කලා භාෂාව, එහි ශාස්ත්‍රාලීය, නූතන සහ සමකාලීන ව්‍යාකරණයන් පිළිබඳව ඉතා ගැඹුරු ශාලිකාගත අධ්‍යයනයන්ගෙන් සහ විචාරශීලී න්‍යායන්, සංකල්පයන් අධ්‍යයනය කරමින් දේශීය, කලාපීය සහ ගෝලීය සංස්කෘතික මෙන්ම කලා ක්ෂේත්‍රයට වෘත්තිමය චිත්‍ර ශිල්පීන් බිහි කිරීම.

**මූර්ති කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - මූර්ති කලා**

මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ නිර්මාණාත්මක සංකල්පනා විවිධ මාධ්‍යයන්ගෙන් ත්‍රිමානව ඉදිරිපත් කිරීම, විෂය පථයට අදාළ ද්‍රව්‍ය හඳුන්වාදීම, ඇඹීම, තෙලීම, වාත්තු හා ඉදිකිරීම් ප්‍රතිමා ප්‍රමාන මූලධර්ම වැනි විෂයයන් පිළිබඳව අවබෝධයක් විද්‍යාර්ථීන් හට ලබා දීම සඳහාය.

මූර්ති කලාවේ ජාත්‍යන්තර ප්‍රවණතා සංස්කෘතික හා ඓතිහාසික සංවර්ධනය පිළිබඳව ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව පාඨමාලාවේදී සාකච්ඡා කරනු ලැබේ.

**මුද්‍රණ කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - මුද්‍රණ කලා**

මුද්‍රණ කලාව කඩදාසියක් මත මුද්‍රණය කෙරෙන කලාකෘතියක් ලෙස බෝහෝ විට වරනැගෙන මුත් රෙදිපිළි, ප්ලාස්ටික් හෝ වෙනත් ඕනෑම මතුපිටක් මත බහුවිධ තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ කලාකරුවාගේ දෑතින් හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ මුද්‍රණය කළ හැකිය. (Encyclopedia Britannica). මුද්‍රණ කලා අධ්‍යානාංශයේ විෂය මාලාවෙහි ලලිත කලා, දෘශ්‍ය කලා සහ ව්‍යවහාරික කලා ධාරාවන්ට අයත් විෂය ඒකකයන් අන්තර්ගතව ඇත. එම විෂය ධාරාවන් හැදෑරීම උපාධි අපේක්ෂකයන් හට සිය දෘශ්‍ය කලා උපාධිය ලබාගැනීම මෙන්ම වෘත්තිමය ජීවිතය වැඩිදියුණු කරගැනීමට ද මහඟු පිටුවහලක් වනු ඇත.

**දෘශ්‍ය සන්නිවේදන සැලසුම් අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - දෘශ්‍ය සන්නිවේදන සැලසුම් කලා**

නූතන සන්නිවේදන තාක්ෂණයේ ග්‍රැෆික් සැලසුම්කරණය සන්නිවේදන කාර්යයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සැලකේ. ඒ අනුව නූතන සැලසුම් ප්‍රවණතාවයනට අදාළ ප්‍රචාරණය, නිදර්ශන, මුද්‍රණ, රූපවාහිනය සහ සිනමාව සඳහා වන ග්‍රැෆික් සැලසුම්කරණය පිළිබඳ හැදෑරීමට විද්‍යාර්ථීන් යොමු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

**බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් කලා**

මානව අවශ්‍යතා පරිදි නිර්මාණ සැලසුම්කරණයට ප්‍රවේශවීමේ ක්‍රමවේදයන් මෙම පාඨමාලාවෙන් අවධාරණය කෙරේ.

සංකීර්ණ සමාජය අවශ්‍යතාවයන්ට පිළිතුරු ලෙස නිර්මාණාත්මක සැලසුම් සංකල්පයන් වෙළෙඳපොළ අවශ්‍යතා දක්වා අමුද්‍රව්‍ය, ශිල්ප ක්‍රම හා නූතන තාක්ෂණයේත් අපූර්ව නිමැවුමක් ලෙස බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් පාඨමාලාවෙන් අර්ථ ගැන්වේ.

**සෙරමික් කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - සෙරමික් කලා, සෙරමික් සැලසුම් පාඨමාලාව සහ සෙරමික් මූර්ති පාඨමාලාව**

ව්‍යවහාරික කලා විෂයන් අතර ඉතා ජනප්‍රිය හා උපයෝගීතාවාදී කලා මාධ්‍යයක් වන සෙරමික් අධ්‍යයනය පිළිබඳව නිර්මාණාත්මකව හා වෘත්තීයමය දැනුමක් සෙරමික් කලා පාඨමාලාව හදාරනු ලබන උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත ලබා දීම මෙම අධ්‍යයනාංශය මඟින් සිදුවේ.

**බහු මාධ්‍ය කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - බහු මාධ්‍ය කලා**

බහු මාධ්‍ය කලා විෂය සැලසුම් වී තිබෙන්නේ විවිධ කලාත්මක ආකෘති කිහිපයක් සම්මිශ්‍රණය වීමෙනි. අක්ෂර, හඬ, නිශ්චල රූප, සජීවීකරණය, චලන රූප (video) සහ අන්තර් ප්‍රතික්‍රියා (interative) දක්වන ක්‍රීඩා වැනි නිර්මාණ යන අංග එක්වීමෙනි. දෘශ්‍ය කලා උපාධිය සඳහා බහු මාධ්‍ය කලා විෂය හදාරන විද්‍යාර්ථීන් හැදෑරිය යුතු විෂයයන් කිහිපයක් වේ. වර්ණ, ඩිජිටල් නිරූපණ චිත්‍ර ඇතුලු රූ රටා සැලසුම්, වෙබ් අඩවි නිර්මාණය, සෞන්දර්ය / කලා/ බහු මාධ්‍ය කලා මූලධර්ම, බහු මාධ්‍ය කලා ඉතිහාසය, සිනමාව සහ දැන්වීම්කරණයේ විකාශනය, අක්ෂර නිර්මාණය, ඩිජිටල් සිතුවම් ඇඳීම, පරිගණක ග්‍රැෆික්, ද්විමාන, ත්‍රිමාණ සජීවීකරණය, ඇඳීමේ මූලධර්ම සහ ආකෘතිකමය අධ්‍යයනය, ජීව චිත්‍ර ඇඳීම ආදිය හැදෑරිය යුතුවේ.

වර්තමාන ලෝකයේ බහු මාධ්‍ය කලා භාවිතාව පිළිබඳව පුළුල් දැක්මක් මෙම විෂය අධ්‍යයනය තුළින් ඔබට ලැබෙන අතර බහු මාධ්‍ය කලා නිර්මාණ සහ ක්‍රමවේදය පිළිබඳ දැනුම සංවර්ධනය වීමද සිදුවේ.

**රෙදිපිළි හා ඇඟළුම් කලා අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - රෙදිපිළි හා ඇඟළුම් කලා**

ව්‍යවහාරික කලා විෂයන් අතර වර්තමාණයේදී ඉතා ජනප්‍රිය හා මානව උපයෝගීතාව පරිදි නිර්මාණාත්මයෙන් හෙබි කලා මාධ්‍යයක් ලෙස රෙදිපිළි හා ඇඟළුම් අධ්‍යයනය නම් කළ හැක. විවිධ අවශ්‍යතා සඳහා රෙදිපිළි හා ඇඟළුම් භාවිතය නූතන තාක්ෂණයේදී පරිහරණය පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුම තුළින් වෘත්තීමය හා කලා කුසලතාවයෙන් හෙබි විද්‍යාර්ථියෙකු බිහි කිරීම හා නව මාවතකට යොමු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

**ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය - දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය - ඉතිහාසය හා කලා සිද්ධාන්ත**

මෙම පාඨමාලාව මඟින් දෘශ්‍ය කලා විෂය ක්ෂේත්‍රයට අදාළව විවිධ ශිල්පීන්ගේ කලාත්මක සම්ප්‍රදායන් පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තුලනාත්මකව සංසන්දනය කරමින් පුළුල් ලෙස හැදෑරීම අපේක්ෂිතය. නව අධ්‍යයනාංශයක් වන මේ මඟින් කලා ඉතිහාසය පිළිබඳ හැදෑරීමට විද්‍යාර්ථීන් යොමු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

**නර්තන සහ නාට්‍ය කලා පීඨය**

සිව් අවුරුදු ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලා මෙම පීඨය විසින් හඳුන්වා දී ඇති අතර එම උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කරනු ලබන පළමු වසරේ සිටම වෙන් කරනු ලබයි. මෙම සියලු පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන අතර සාර්ථකව අධ්‍යයන කටයුතු නිම කරනු ලබන උපාධි අපේක්ෂකයන්ට ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය පිරිනමනු ලබයි.

සිව් වසරක විශේෂ උපාධි පාඨමාලාවන් ලෙස සම්පාදනය කොට ඇති මෙම උපාධි පාඨමාලා මඟින් නර්තන කලාවේ සාම්ප්‍රදායික ලක්ෂණ විචාර මූලධර්ම විමර්ශනය, නර්තන අධ්‍යාපනයේ සමාජවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක පදනම පිළිබඳ සිද්ධාන්තයන් ද, සාම්ප්‍රදායික නර්තනයන් හි නිපුණත්වයන්, නිර්මාණාත්මක ගායන වාදන නර්තන පිළිබඳ කුසලතාව පමණක් නොව ප්‍රාසංගික වේදිකා ප්‍රසංග ඉදිරිපත් කිරීමේ ප්‍රායෝගික හැකියාව පිළිබඳ ගැඹුරු දැනුමක් ලබා දේ. මෙම උපාධි පාඨමාලාවන්ට සමගාමීව විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම හා පරිගණක දැනුම වර්ධනය වන ආකාරයේ විෂයන් ද ඇතුලත් වන පරිදි මෙම පාඨමාලා සැලසුම් කොට ඇත. පීඨයේ සෑම උපාධි පාඨමාලාවක්ම වසරකට අර්ධවාර්ෂික දෙකක් බැගින් වූ පූර්ණකාලීන අර්ධවාර්ෂික අටකින් සමන්විත වේ. එක් අර්ධවාර්ෂිකයක් ලින් සති 15 කි. මෙම අර්ධවාර්ෂික අට තුළදී උපාධි අපේක්ෂකයන් විසින් තම උපාධිය සඳහා සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂය ඒකක ඌ.සක් සම්පූර්ණ කළ යුතු අතර අවසාන අර්ධවාර්ෂිකයේ දී ස්වතන්ත්‍ර පර්යේෂණ නිබන්ධිකාවක්ද ඉදිරිපත් කළ යුතුව ඇත. සෑම අර්ධවාර්ෂිකයක් අවසානයේ දීම ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වෙන අතර උපාධි අපේක්ෂකයාගේ කුසලතා ඇගයීම සඳහාGPA ඇගයීම් ක්‍රමයක් භාවිතා කරයි. මෙම පාඨමාලාවන් සාර්ථකව හදාරා සම්පූර්ණ කරන විද්‍යාර්ථීන්ට රාජ්‍ය හා පෞද්ගලික පාසල්වලත්, රාජ්‍ය නොවන සංවිධාන වල මෙන්ම මාධ්‍ය හා සංස්කෘතික ආයතනවලත් රැකියා අවස්ථා ලබා ගත හැකිය.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -උඩරට නර්තනය**

උඩරට නර්තන අධ්‍යයනාංශය හඳුන්වා දෙන මෙම පාඨමාලාව මඟින් මූලික සරඹ අභ්‍යාස , පැනීම් කැරකීම් ආදී වූ ශිල්ප ක්‍රම, වන්නම් , උඩරට ශාන්තිකර්ම පෙළපාලි අංග, ජන නැටුම් හා ජන නාටක, උඩැක්කි, පන්තේරු නර්තන හා ගායන වාදන පිළිබඳ ශාස්ත්‍රීය ශිල්ප ධර්මයන් හා ඊට අදාළ නිර්මාණාත්මක කුසලතාවයන් පිළිබඳ පුළුල් ප්‍රායෝගික දැනුමක් සහ අවබෝධයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. නර්තන නිර්මාණකරණය , රංගාලෝකකරණය, අනුෂංගික කලා සහ වේදිකා තාක්ෂණය සම්බන්ධයෙන් වන නව භාවිතයන් ප්‍රායෝගික හා සෛද්ධාන්තික වශයෙන් අධ්‍යයනය කිරීමට හැකිවේ. භාෂා භාවිතය හා පර්යේෂණ ක්‍රමවේදය, විචාර සිද්ධාන්ත හා ප්‍රාසාංගික කලා, නර්තනයේ සමාජ මනෝවිද්‍යාත්මක, අධ්‍යාපනික මනෝවිද්‍යාත්මක පසුබිම යනාදී වූ සෛද්ධාන්තික දැනුම හා අවබෝධය ලබාදීම ද අරමුණුවේ. සිව් වසරක අවසානයේදී සාම්ප්‍රදායික රඟමඩලේ සහ ප්‍රාසාංගික වේදිකාවේ කුසලතා දැක්විය හැකි මෙන්ම රංගවින්‍යාසකරණයෙහි කුසලතා සපිරි , සෛද්ධාන්තික දැනුමෙන් ද පොහොසත් පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීම අපේක්ෂා කෙරේ.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - පහතරට නර්තනය**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -ආනුෂංගික කලා**

පහතරට නර්තනය විෂයක් වශයෙන් හැදෑරීමට උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා එම විෂය ක්ෂේත්‍රය සඳහා පුළුල් දැනුමක් ලබා ගැනීමට හැකි වන අයුරින් මෙම පාඨමාලාව සකස් කොට ඇත. පහතරට ශාන්තිකර්මයන්හි අන්තර්ගත නර්තන අංග, නාට්‍යමය පෙළපාලි, පහතරට බෙර වාදනය, කෝලම් නාට්‍ය, කෝලම් නර්තන, දේශීය හා ඉන්දියානු ජන නැටුම්, පහතරට උඩැක්කි, නිර්මාණාත්මක ගායන හා වාදන, වේදිකා ප්‍රසංග, ආනුෂංගික කලා ( රංග වස්ත්‍රාභරණ නිර්මාණ) සැරසිලි, මෝස්තර, කැටයම්, වෙස් මුහුණු නිර්මාණය යන විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීම මඟින් මෙම පාඨමාලාව සම්පූර්ණ කළ හැකිය. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් බෙන්තර, මාතර හා රයිගම යන රංග ශෛලීන් පිළිබඳව සෛද්ධාන්තික මෙන්ම ප්‍රායෝගික වශයෙන් පෘථුල දැනුමක් ලබා ගත හැකිය. උපාධිය අවසානයේදී සාම්ප්‍රදායික රඟ මඩලක හා ප්‍රාසාංගික වේදිකාවේ කුසලතා දැක්විය හැකි පරිපූර්ණ උපාධිධාරියෙකු බිහි කිරීම අපේක්ෂා කෙරේ.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -සබරගමු නර්තනය**

සබරගමු නර්තන පාඨමාලාවට ප්‍රවේශ වන විද්‍යාර්ථීන්හට තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුම ලබා ගතහැකි අයුරින් මෙම පාඨමාලාව සකස්කර තිබේ. සබරගමු නර්තනයට ආවේනික මූලික සරඹ සාම්ප්‍රදායික සබරගමු ශාස්ත්‍රීය නර්තනය, සාහිත්‍ය අධ්‍යයනය, මානව වංශ විද්‍යාව, අන්තර් සංස්කෘතික ජනනැටුම් අධ්‍යයනය, නර්තනයේ ශරීර නම්‍යතා අභ්‍යාස, සබරගමු සොකරි නාටකය, සබරගමු ශාස්ත්‍රීය වාදන විධි, සබරගමු දවුල් වාදනය, සබරගමු උඩැක්කි නර්තනය, සබරගමු වන්නම්, සාම්ප්‍රදායික ගායන විධි අධ්‍යයනය, නර්තන නිර්මාණකරණය, නිර්මාණාත්මක ගායන විධි අධ්‍යයනය, නිර්මාණාත්මක වාදන විධි අධ්‍යයනය, ශාන්තිකර්ම පෙළපාළි දැක්ම, ශාන්තිකර්ම නාට්‍යමය පෙළපාළි, ආනුෂංගික කලා (සිංහල සැරසිලි), අංග රචනය, රංගවස්ත්‍රාභරණ නිර්මාණකරණය, විෂයානුබද්ධ පරිගණක තාක්ෂණය, රංගාලෝකකරණය, වේදිකා තාක්ෂණය හා වේදිකා ප්‍රසංග නිර්මාණකරණය, ස්වයං අධ්‍යයනය පැවරුම් සහ තෝරාගත් විෂය ක්ෂේත්‍රයක් උපදේශකවරයෙකු යටතේ උපාධි නිබන්ධනයක් ලෙස රචනා කිරීම යන මේ අයුරින් ශක්‍යතා වර්ධනය වන අයුරින් සිව් වසරක විශේෂ උපාධි පාඨමාලාවක් ලෙස මෙම පාඨමාලාව හඳුන්වා දී ඇත.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -ශ්‍රී ලාංකේය බෙර වාදනය**

ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන්ට ආවේණික බෙර වාදන පිළිබඳ පුළුල් ලෙස හැදෑරීමට උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන්ට, එම විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුමක් ලබා ගත හැකි වන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත.

තවද ඉන්දියානු, බටහිර තූර්ය වාදනය මෙන්ම ලතින් ඇමරිකානු, බ්‍රසීල හා අප්‍රිකානු ආදී පෙර අපර දෙදිග වාදන සම්ප්‍රදායන් පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගත හැකි වන අතර සම්ප්‍රදායික නර්තනය, ගායනය, නිර්මාණාත්මක වාදනය, ධ්වනි තාක්ෂණය හා සංගීතය ආදී විෂයයන් ද අධ්‍යයන කිරීමට හැකි වන අයුරින් සිව් වසරක උපාධි පාඨමාලාවක් ලෙස මෙම පාඨමාලාව සකස් වී ඇත.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - රූපණය**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - මුද්‍රා නාට්‍ය හා නව නර්තනය**

නාට්‍ය හා රංග කලාව හදාරණ විද්‍යාර්ථීන් සඳහා රූපණය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව සහ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවද නෘත්‍ය නාට්‍ය සඳහා නැඹුරුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා මුද්‍රා නාට්‍ය හා නව නර්තනය (විශේෂ) උපාධි පාඨමාලාව ලෙස ප්‍රධාන පාඨමාලා තුනක් ක්‍රියාත්මක වේ. සෛද්ධාන්තිකව මෙන්ම වඩාත් ප්‍රායෝගික අධ්‍යාපනික පසුබිමක් සලසා දෙමින් මෙම විද්‍යාර්ථීන්ගේ නිර්මාණශීලීත්වය, විචාරශීලීත්වය සහ ශිල්පීය ඥාණය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීන ආචාර්යවරුන්ගේ ඇසුර හා මඟ පෙන්වීම ලබාගත හැකි වන පරිදි මෙම පාඨමාලා නිර්මාණය කොට ඇත.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -භරත නාට්‍යම්**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව -කථක් නර්තනය**

ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය මේ වන විට කථක් හා භරත නාට්‍යම් විෂයයන් සඳහා විශේෂ උපාධි පාඨමාලා හඳුන්වා දී තිබේ. දේශීය හා විදේශීය නර්තනය පිළිබඳව තුලනාත්මක අධ්‍යයනය, බෙර වාදනය, දේශීය විදේශීය ජන නැටුම්, රූපවාහිනී හා සිනමා නර්තන රචනය, රංගකලාව හා තාක්ෂණය, අවස්ථා කළමණාකරනය, වෘත්තීය මාර්ගෝපදේශනය, නර්තන කලා සිද්ධාන්ත, විදේශීය නර්තන කලා සිද්ධාන්ත, ගායන හා වාදන සංගීතය, වේදිකා ප්‍රසංගය වැනි අවශේෂ විෂයයන් රාශියක් පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික පුළුල් දැනුමක් ලබා ගැනීමට ද ඔවුනට අවශ්‍ය පහසුකම් ලබා දී ඇත. මේ හැර කථක් නර්තනය පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා වසර පුරා හින්දි භාෂාවත්, භරත නාට්‍යම් පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා වසර පුරා දෙමළ භාෂාවත් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලා හදාරණ විද්‍යාර්ථීන්ට අවස්ථාව සලසා ඇත.

**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - වීඩියෝ නර්තන රචනය**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - සන්නිවේදන හා ජනශ්‍රැති අධ්‍යයනය**
**ප්‍රාසංගික කලාවේදී (විශේෂ )උපාධි පාඨමාලාව - ඩිජිටල් සිනමා**

වීඩියෝ නර්තන රචනය පාඨමාලාව මගින් අප පීඨයේ විද්‍යාථීන් සඳහා රූප මාධ්‍යයෙහි නව තාක්ෂණික දැනුම මෙන්ම රූප මාධ්‍යය සඳහා නිර්මාණාත්මක නර්තන රචනය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ දැනුම ලබා දීම සිදු කරයි. දේශීය නර්තන කැමරාව සඳහා ප්‍රතිනිර්මාණය කිරීම හා නර්තනයේ භාවිත ස්වරූපය ඉතා ඉහළ ස්ථරයකට ගෙන ඒම මගින් විද්‍යාර්ථීන්ගේ බුද්ධිමය හා ශාස්ත්‍රීය කුසලතා වර්ධනය කිරීම මෙම පාඨමාලාවේ මුඛ්‍ය අරමුණ වේ. සන්නිවේදනය හා ජනශ්‍රැති අධ්‍යයනය උපාධි පාඨමාලාව මගින් ප්‍රායෝගික විෂයයන්ට වඩා ප්‍රමුඛ ස්ථානයක් දෙනු ලබන්නේ න්‍යායාත්මක විෂයයන් කෙරෙහිය. අනාගත අභියෝග ජය ගැනීමට අවශ්‍ය පෞරුෂයකින් හෙබි නිර්මාණශීලී චින්තනයකින් පිරිපුන් විද්‍යාර්ථියෙකු බිහි කිරීම මෙම පාඨමාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ. ඩිජිටල් සිනමා මගින් සිනමා කලාව හා බැඳී පවතින ප්‍රායෝගික විෂයයන් මෙන්ම න්‍යායාත්මක විෂයයන් කෙරෙහිද ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ. මෙම පාඨමාලාව මගින් අංකිත සිනමාකරණයේ (Digital Film Making) නව තාක්ෂණික දැනුම විද්‍යාර්ථීන්ට ලබා දීමත්, එමගින් නව නිර්මාණයන් බිහි කිරීමට අවශ්‍ය පසුබිම ඇති කිරීමත් නව රැකියා වෙළඳපොළට යෝග්‍ය උපාධිධාරීන් බිහිකිරීමත් අපේක්ෂිතය.

## සංගීත පීඨය

### ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - උත්තර භාරතීය සංගීතය

උත්තර භාරතීය ගායනය සහ වාදනය කෙරෙහි උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන්හට එම විෂයට අදාළ ප්‍රාසංගික කරුණු කාරණා පිළිබඳ විශේෂ දැනුමක් ලබාගත හැකිවන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. උත්තර භාරතීය සංගීතය හා සම්බන්ධ වෙනත් සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂයයන් ඇතුළත්කොට ඇති අතර ඒ පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබා ගැනීමට මෙමගින් අවකාශ සැලසේ. උත්තර භාරතීය සංගීතය ශ්‍රී ලාංකේය නූර්ති ගීතය, සරළ ගීතය, චිත්‍රපට සංගීතය හා වෙනත් නිර්මාණ කාර්යයන් කෙරෙහි ඉතා ගැඹුරින් භාවිත වන ජාත්‍යන්තරව පිළිගත් සංගීත ක්‍රමයකි. එය ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මැනවින් ස්ථාපනය වී ඇත.

මෙම උපාධිය සම්පූර්ණ කරනුලබන උපාධිධාරීන් හට රජයේ සහ පෞද්ගලික පාසල් වල ගුරු වෘත්තිය, මාධ්‍ය ආයතනවල හෝ මෙම විෂය සම්බන්ධ වෙනත් ආයතනවල රැකියා අවස්ථා ලබා ගත හැකිය. ප්‍රාසංගික විෂය ක්ෂේත්‍රයෙහි අත්දැකීම් ලබාදෙනුවස් විවිධ ප්‍රසංග සහ වැඩසටහන් විශ්වවිද්‍යාලය තුළ සහ බාහිර ආයතනවල ඉදිරිපත් කිරීම කෙරෙහි විද්‍යාර්ථීන් උනන්දු කරවනුලැබේ.

### ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - දක්ෂිණ භාරතීය සංගීතය

දක්ෂිණ භාරතීය ගායනය සහ වාදනය කෙරෙහි උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන්හට එම විෂයට අදාළ ප්‍රාසංගික කරුණු කාරණා පිළිබඳ විශේෂ දැනුමක් ලබාගත හැකි වන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කොට ඇත. ජාතික ඒකාබද්ධතාවය කෙරෙහි අවබෝධයක් ඇතිවන පරිදි මෙම පාඨමාලාවට විෂය ඒකක ඇතුළත් කොට ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ බහුසංස්කෘතික පදනම පිළිබඳව මෙන්ම දෙමළ ජනවාර්ගික සංස්කෘතිය අධ්‍යයනය කිරීමට මෙමගින් අවකාශ සැලසේ. දක්ෂිණ භාරතීය සංගීතය ලොව පිළිගත් සංගීත සම්ප්‍රදායයක් වන අතර ශ්‍රී ලාංකේය ද්‍රවිඩ ජනතාව අතර ප්‍රචලිත වී ඇත. මෙම පාඨමාලාව තුළින් සිංහල ජනයා අතරද මෙම සංගීත ක්‍රමය ප්‍රචලිත කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී අධ්‍යාපනික සහ සමාජයීය කරුණු කාරණා කෙරෙහිද අවධානය යොමු කොට ඇත. දක්ෂිණ භාරතීය සංගීත උපාධිධාරීන් හට රාජ්‍ය සහ පෞද්ගලික පාසල්වල, රාජ්‍ය නොවන සංවිධානවල සහ මාධ්‍ය ආයතන වල රැකියා අවස්ථා ලබාගත හැකිය. දක්ෂිණ භාරතීය උපාධිධාරීන්ගේ විශේෂත්වය වනුයේ ඔවුනට සිංහල මෙන්ම ද්‍රවිඩ සංස්කෘතියද එකසේ අගය කිරීමට හා සංස්කෘතීන් අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට ඇති හැකියාවයි. තවද විශ්වවිද්‍යාලය තුළ මෙන්ම බාහිර ආයතනවල ඒකාබද්ධ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීමට විද්‍යාර්ථීන් උනන්දු කරවනුලැබේ.

### ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව - බටහිර සංගීතය

මෙම විශේෂවේදී උපාධි පාඨමාලාව මගින් බටහිර සම්භාව්‍ය සංගීතයයෙහි ගායනය, වාදනය, සංගීත රචනය හා මෙහෙයවීම පිළිබඳවත් සංගීත සිද්ධාන්ත, ඉතිහාසය, විදේශීය භාෂා හා නව තාක්ෂණ අවබෝධය ඇතුළුව විෂය ක්ෂේත්‍රයෙහි උන්නතිය සඳහා අවශ්‍යය වෙනත් විෂයයන් මෙන්ම Symphony හා Opera ප්‍රමුඛව බටහිර සම්භාව්‍ය මෙන්ම සරළ හා නිර්මාණ සංගීත ක්ෂේත්‍රයේ ප්‍රචලිත විවිධ සංගීත ආකෘතීන් හා ශෛලීන් පිළිබඳව ද ප්‍රායෝගික හා සෛද්ධාන්තික වශයෙන් දැනුම, අවබෝධය හා වෘත්තීය වශයෙන් පුහුණුව ද ලබා දීම මූලික අරමුණ වේ.

බටහිර සංගීත ශිල්පියකු සතු විය යුතු බටහිර සංගීතය පිළිබඳ දැනුම, අවබෝධය හා හැකියාව පමණක් නොව පෙරදිග සංගීතය ඇතුලු අන්‍ය සංගීත සම්ප්‍රදායයන්ට අදාළ ප්‍රායෝගික හා සෛද්ධාන්තික කරුණු පිළිබඳ අවබෝධය ද ලබා දෙමින් ප්‍රාසංගික කලා ක්ෂේත්‍රයෙහි දේශීය මෙන්ම ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට ගැලපෙන විද්‍යාර්ථීන් බිහිකිරීම ද මෙම පාඨමාලාවෙන් අපේක්ෂා කෙරේ. බටහිර ගායනය ඇතුලුව බටහිර සම්භාව්‍ය මෙන්ම සරළ හා ජනප්‍රිය සංගීත සම්ප්‍රදායයන්ට අයත් විවිධ වාද්‍ය භාණ්ඩ වාදනයෙහි නිපුනතාවයක් ඇති වෘත්තීය වාදකයෙකු, ගායකයෙකු, ආචාර්යවරයෙකු හා නිර්මාණ ශිල්පියෙකු මෙන්ම බටහිර සංගීත ක්ෂේත්‍රයෙහි විවිධ අවශ්‍යතා සපුරාලිය හැකි සම්පත් දායකයෙකු බිහිකිරීම මෙම පාඨමාලාව මගින් සිදු කෙරේ.

### ප්‍රාසංගික කලාවේදී විශේෂ උපාධි පාඨමාලාව - ව්‍යවහාරික සංගීතය සහ ජනසන්නිවේදනය

මානව හැඟීම් ප්‍රකාශනයෙහි පුළුල් මාධ්‍යයක් වන "ව්‍යවහාරික සංගීතය" ලෝක සංගීත ක්ෂේත්‍රයෙහි ප්‍රධාන ශික්ෂාවක් ලෙස හැඳින්විය හැකිය. මෙය ජනසන්නිවේදනයෙහි සියුම් ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ඇති විෂය පථයකි. චිත්‍රපටය, ගුවන්විදුලිය, රූපවාහිනිය යනාදී ක්ෂේත්‍ර කෙරෙහි තාක්ෂණය හා සන්නිවේදනය සෘජු ලෙස සම්බන්ධ වී ඇත. තාක්ෂණය භාවිත කොට නවතම නිර්මාණ කරමින් ව්‍යවහාරික සංගීත සන්නිවේදන කුසලතා දියුණුකර ගැනීමට මෙම පාඨමාලාව මගින් අවකාශ සලසා ඇත. විද්‍යාර්ථියා විසින් උසස් පෙළ සඳහා හදාරණ ලද විෂය පථය ව්‍යවහාරික ක්‍රමවේද මගින් දියුණුකර ගැනීමට නිදහස ලබාදී ඇත. ව්‍යවහාරික සංගීත උපාධිධාරීන්හට සංගීත අධ්‍යක්ෂණය වෘත්තීය තත්වයේ ගායකයකු හෝ වාදකයෙකු වීම සහ චිත්‍රපට ක්ෂේත්‍රයෙහි ද රැකියා අවස්ථා උදාකර ගත හැකිය. ව්‍යවහාරික සංගීත විෂය ක්ෂේත්‍රය හා බැඳි නිර්මාණකරණය නිවැරදි මාර්ගයෙහි මෙහෙයවීමට අවශ්‍ය කරන මග පෙන්වීම අධ්‍යයනාංශය මගින් සිදු කරනු ඇත.

### ප්‍රාසංගික කලාවේදී විශේෂ උපාධි පාඨමාලාව - මානවවංශ සංගීතවිද්‍යාව

ස්පර්ශ කළ හැකි සහ නොහැකි ශ්‍රී ලාංකේය උරුමය විමසීමේදී මානවවංශ සංගීතය අප සංස්කෘතිය සමග පුළුල් ලෙස බද්ධ වී ඇති බව පෙනී යයි. සංස්කෘතීන්හි අනන්‍යතාව සිංහල සංස්කෘතිය සමග සම්බන්ධ කරමින් සකස් කරන ලද විෂය ඒකක මෙම පාඨමාලාවට ඇතුළත් කොට ඇත. විවිධ පර්යේෂණ සහ ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා ද අවකාශ සලසා ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය පාරම්පරික සංගීතය, ආසියානු ජනසංගීතය සහ වෙනත් රටවල ජනසංගීතය පිළිබඳ පුළුල් අවබෝධයක් විද්‍යාර්ථීන් හට ලබා ගත හැකිය.

මානවවංශ සංගීතය පිළිබඳ විශේෂ දැනුමක් ලබාගනිමින් ශ්‍රී ලාංකේය වාර්ගික විවිධත්වය සහ අනන්‍යතාවය හඳුනා ගැනීමේ අවකාශය සලසා ඇත. මානවවංශ සංගීත උපාධිධාරීන් හට විවිධ මාධ්‍ය ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ආදියෙහි රැකියා අවස්ථා ලබා ගත හැකිය. ජනසංගීත විෂය පිළිබඳව සංගීත ක්ෂේත්‍රයෙහි ඇති ඉල්ලුමට අනුව නිදහස් වෘත්තිකයන් වශයෙන් ක්ෂේත්‍රයෙහි කටයුතු කිරීමට ද අවකාශ සැලසේ.

**ප්‍රාසංගික කලාවේදී විශේෂ උපාධි පාඨමාලාව - සංගීත විද්‍යාව**

සංගීත විද්‍යා විෂය ක්ෂේත්‍රගත විවිධ විෂය ඒකකයන් තුලනාත්මකව සහ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ අවකාශය මෙම පාඨමාලාව මගින් ලබාදී ඇත. සංගීත විද්‍යා විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂය කරුණු ලෝක සංගීත ශික්ෂාවන්ට අනුගත වන පරිදි විෂය මාලාවෙහි දක්වා ඇත. විවිධ පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ ඇතුළත් කොට ඇති මෙම පාඨමාලාව තුළින් විද්‍යාර්ථියාගේ සංගීත විෂයට අදාළ විද්‍යාත්මක ඥානය සහ තුලනාත්මක දැනුම වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී සමාජවිද්‍යාව හා මානවවිද්‍යාව යන විෂය ක්ෂේත්‍ර කෙරෙහිද අවධානය යොමු කිරීම මෙම පාඨමාලාවෙහි විශේෂත්වයකි. සංගීත විද්‍යා උපාධිධාරීන්හට රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික ආයතන, තාක්ෂණික ක්ෂේත්‍රය සහ මාධ්‍ය ආයතන වල රැකියා අවස්ථා උදා කර ගත හැකිය. ස්වකීය ගායන වාදන කුසලතා දියුණුකරගනිමින් විද්‍යාත්මක පසුබිමක කටයුතු කිරීමට විද්‍යාර්ථීන් හට අවකාශ සැලසේ.

## ශ්‍රීපාලි මණ්ඩපය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | භූ/මා |
|---|---|---|
| ප්‍රසංග කලා | - | S |
| ජනමාධ්‍ය | - | S |

¶ **කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය මගින් පවත්වාගෙන යනු ලබන ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රසංග කලා උපාධිය-**

ශාස්ත්‍රවේදී විශේෂ ප්‍රසංග කලා උපාධිය සඳහා වර්ෂ 04 ක ශාස්ත්‍රාල කාලය තුළදී දෙන ලද පාඨමාලා නිර්දේශය යටතේ පාඨමාලා ඒකක 43 ක් සම්පූර්ණ කිරීමට සිදුවේ. එහිදී ප්‍රධාන පාඨමාලා ඒකක 26 ක්ද පදනම් පාඨමාලා 06 ක්ද වෛකල්පිත පාඨමාලා ඒකක 11 ක්ද වශයෙන් පාඨමාලා ඒකක 43 සම්පූර්ණ කළ යුතුය. එකී පාඨමාලා නිර්දේශයට අදාළ මූලික ව්‍යුහාත්මක ලක්ෂණ පහත සඳහන් වේ. සෑම පාඨමාලා ඒකකයක්ම පැ 45 කින් යුක්ත වේ.

**ප්‍රධාන පාඨමාලා ඒකක**

මෙම පාඨමාලාව ප්‍රධාන පාඨමාලා ඒකක 26 කින් සමන්විත වේ. එම පාඨමාලා ඒකක **අනිවාර්ය** වන අතර නර්තනය, සංගීතය, නාට්‍ය හා රංග කලාව යන ප්‍රායෝගික විෂයන් සිව් වසර තුලදී පාඨමාලා ඒකක 07 ක් ලෙස පාඨමාලා නිර්දේශයට ඇතුලත්ව ඇත. එක් පාඨමාලා ඒකකයක් යටතේ එම ප්‍රායෝගික විෂයන් ගොනුවී ඇති අතර එක් ප්‍රායෝගික පාඨමාලාවක් පැය 45 කින් සමන්විත වේ. තමා විසින් මුලින්ම තෝරා ගත් ප්‍රායෝගික විෂය ධාරාව සිව් වසර පුරාවටම හැදෑරිය යුතුය.

**පදනම් පාඨමාලාව සහ වෛකල්පිත පාඨමාලා ඒකක**

පදනම් පාඨමාලාව කොටස් 06 කින් සමන්විත වේ. මෙම කොටස් ප්‍රසංග කලා උපාධි පාඨමාලාවේ සෑම කොටසක්ම ආවරණය වන ආකාරයට නිර්මාණය කර ඇති අතර මේවා සෑම සිසුවෙකුටම අනිවාර්ය ඒකක වේ.

**වෛකල්පිත පාඨමාලා ඒකක**

මෙම පාඨමාලාව වෛකල්පිත පාඨමාලා ඒකක 30 කින් සමන්විත වේ. ඒවා නර්තනය, සංගීතය, නාට්‍ය හා රංග කලාව, සිනමාව, චිත්‍ර සහ නිර්මාණ යන ක්ෂේත්‍රයන් හා සම්බන්ධය. මේ අතුරින් විෂය ඒකක 11 ක් පමණක් තම අභිමතය හා අවශ්‍යතා අනුව ශිෂ්‍යයා විසින් තෝරා ගත යුතුය.

**සැලකිය යුතුයි:** එක් පාඨමාලා ඒකකයක් ක්‍රියාත්මක වනුලබන්නේ අවම වශයෙන් සිසුන් 05 දෙනෙක් එකී පාඨමාලා ඒකකය සඳහා ලියාපදිංචි වන්නේනම් පමණි. මෙම අවශ්‍යතාවය ප්‍රධාන පාඨමාලා ඒකක වල (ප්‍රායෝගික විෂයයන්) මෙන්ම වෛකල්පිත පාඨමාලා ඒකකයන්ටද බලපායි.

**ශාස්ත්‍රවේදී (විශේෂ) ජනමාධ්‍ය උපාධිය**

කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රී පාලි මණ්ඩපය සිව් අවුරුදු ශාස්ත්‍රවේදී (විශේෂ) ජනමාධ්‍ය උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යනු ලබන අතර **පුවත්පත් මාධ්‍ය, ගුවන් විදුලි මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය හා ජනසන්නිවේදන න්‍යාය සහ ඉතිහාසය** යන විෂය ධාරා සඳහා විශේෂ උපාධි ප්‍රදානය කරනුලැබේ.

ජනමාධ්‍යවේදයේ සංකල්ප, සිද්ධාන්තික හා ප්‍රායෝගික දැනුම ලබාදීම මෙම විශේෂවේදී පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ. ජනමාධ්‍ය අධ්‍යයන අංශය විෂය ඒකක ක්‍රමවේදය අනුව සිව් අවුරුදු පාඨමාලාව ඉදිරිපත් කරනුලබයි.

මෙම පාඨමාලාවේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි සිව්වැදෑරුම් පාඨමාලාවකින් යුක්තය. (1) ප්‍රධාන විෂය පාඨමාලා, (2) පදනම් පාඨමාලා, (3) වෛකල්පිත පාඨමාලා හා (4) සේවා පාඨමාලා වශයෙනි.

ජනමාධ්‍ය අධ්‍යයන අංශය මගින් වසර හතර පුරා පාඨමාලා ඒකක 80 ක් ඉදිරිපත් කරනු ලබන අතර එයින් පාඨමාලා ඒකක 43 ක් අවම වශයෙන් විශේෂ උපාධි ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සම්පූර්ණ කළ යුතුය. මෙම පාඨමාලා ඒකක පහත සඳහන් ප්‍රධාන විෂයධාරා තුළ අන්තර්ගත කර ඇත. පුවත්පත් මාධ්‍ය විෂය ධාරාව, ගුවන් විදුලි මාධ්‍ය විෂය ධාරාව, රූපවාහිනී මාධ්‍ය විෂය ධාරාව, මාධ්‍ය සමාජ විද්‍යාව, මාධ්‍ය මනෝ විද්‍යාව, මාධ්‍ය මානව විද්‍යාව, දර්ශනය, සංස්කෘතිකවේදය, සාහිත්‍ය අධ්‍යනය, දේශපාලන ආර්ථික විද්‍යාව, සංස්කරණය සහ තොරතුරු තාක්ෂණය යනාදී වශයෙන්ය.

අවශ්‍ය ප්‍රායෝගික දැනුම විශ්වවිද්‍යාලයීය නවීන මාධ්‍ය කලාගාරයන්හි මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන කලාගාරයන්හි දෙනු ලැබේ.

## වව්නියා මණ්ඩපය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| කළමනාකරණ අධ්‍යයන(TV) | - | E |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යාව) | පාරිසරික විද්‍යාව | E |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව) | ව්‍යවහාරික ගණිතය සහ ආගණනය | E |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය(ICT) | - | E |
| ව්‍යාපෘති කළමනාකරණය | - | E |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | E |

## ත්‍රිකුණාමල මණ්ඩපය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| කළමනාකරණ අධ්‍යයන(TV) | කළමනාකරණය, ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු කළමනාකරණය, අලෙවි කළමනාකරණය | E |
| සන්නිවේදන අධ්‍යයන | සන්නිවේදනය, වාග් විද්‍යාව, ඉංග්‍රීසි | E |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය## | - | E |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව) | - | E |
| පරිගණක විද්‍යාව | - | E |

## විද්‍යාත්මක පර්යේෂණ ප්‍රවේශය අනුව පුහුණුකර මනා අධ්‍යාපනයක් ලත් දේශීය වෛද්‍යවරුන් ඇති කිරීමෙන් මෙම පද්ධතිය විද්‍යාත්මකව ඉහළ නැංවීම.

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| පරිගණක විද්‍යාව | - | E |
| තොරතුරු පද්ධති | - | E |

## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය | - | S |
| යුනානි වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය | - | E |

## කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය | - | S |

## තැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| සංගීතය | - | T |
| නර්තනය | - | T |
| නාට්‍ය හා රංග කලා | - | T |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | - | T |

## ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය

| අධ්‍යයන පාඨමාලාව | විෂය සංකලන (නියමිත අවස්ථාවලදී) | ඉ/මා |
|---|---|---|
| සංගීතය | - | T |
| නර්තනය | - | T |
| චිත්‍ර සහ නිර්මාණ | - | T |

# 8 කොටස

## සිසුන් විසින් නිතර අසනු ලබන ප්‍රශ්න

ඔබ විසින් නිතර අසනු ලබන ප්‍රශ්න (FAQs) සඳහා පිළිතුරු මෙහි අඩංගු වේ. උදාහරණයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂකයකුගේ දිස්ත්‍රික්කය නිර්ණය කරන ආකාරය, එක් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වූ පසු නැවත උසස් පෙළ සඳහා පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිද යන්න වැනි නිතර අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු මෙහි ඇතුළත් වේ.

එබැවින්, ඔබ මෙය හොඳින් කියවා බලා මෙහි පිළිතුරු සඳහන් නොවන වෙනත් ප්‍රශ්න වෙතොත්, අප වෙත ලිපියක් හෝ ඊමේල් පණිවිඩයක් මඟින් දන්වා එවන්න. එවිට ඔබගේ පැණයට පිළිතුරු අප විසින් ලබා දෙනු ඇත. එසේම, එම ප්‍රශ්න හා ඒවාට අදාළ පිළිතුරුද ඉදිරි වසරවල අත්පොත්වලට ඇතුළත් කරනු ලැබේ.

## 8 කොටස

### සිසුන් විසින් නිතර අසනු ලබන ප්‍රශ්න

1. **විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරන්නේ කෙසේද ?**

අයදුම්කරුවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා (www.ugc.ac.lk) අන්තර්ජාල සේවාව භාවිත කොට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කර ඉන් ලැබෙන මුද්‍රිත පිටපත නිසි පරිදි අත්සන් කොට සඳහන් කර ඇති අනිකුත් ලිපි ලේඛණ ද සමගින් අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් නිවේදනය කර ඇති අවසන් දින හෝ ඊට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

**වැදගත් :**
**විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.**

2. **"Uni - Code" එකක් යනු කුමක්ද ?**

"Uni - Code" එකක් යනු සෑම විශ්වවිද්‍යාලයක් / මණ්ඩපයක් / ආයතනයක් මගින්ම පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලා වෙන් කර හඳුනා ගැනීමට භාවිතා කරන්නා වූ එකිනෙකට අනන්‍යවූ කේතයකි.

මෙම "Uni - Code" සියල්ල අඩංගු ලැයිස්තුව පිටු අංක 153 සිට 157 දක්වා ඇත.

අයදුම්කරුවන් විසින් අන්තර්ජාලය හරහා සිය විශ්වවිද්‍යාල අයදුම්පත පිරවීමේදී කැමැත්තේ අනුපිළිවෙල සඳහන් කිරීම සඳහා මෙම "Uni - Code" භාවිත කළ යුතුය.

"Uni - Code" භාවිත කර කැමැත්තේ අනුපිළිවෙල නිවැරදිව සඳහන් කිරීමට අවශ්‍ය උපදෙස් මෙම අත්පොතෙහි 3 වන කොටසෙහි පැහැදිලිව සඳහන් කර ඇත. එබැවින්, අන්තර්ජාලය හරහා "Uni-Code" භාවිත කර ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ සඳහන් කිරීමට / වෙනස් කිරීමට පෙර එම කොටස හොඳින් කියවා අවබෝධ කර ගන්නා මෙන් උපදෙස් දෙනු ලැබේ.

3. **අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රය පිරවීමට පෙර ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ පරිදි "Uni - Codes" ලැයිස්තුවක් සකසා ගැනීම වැදගත් වන්නේ ඇයි ?**

අයදුම්කරුවන් සළකා බලනු ලබන්නේ තමන් විසින් මනාපය දක්වා ඇති පාඨමාලා සහ විශ්වවිද්‍යාල (Uni - Codes) සඳහා පමණි. අයදුම්කරුවන් විසින් කැමැත්ත ප්‍රකාශ කර නොමැති පාඨමාලා සහ විශ්වවිද්‍යාල (Uni - Codes) සඳහා ඔවුන් සළකා බලන්නේ නැත.

එබැවින්, යම්කිසි අයදුම්කරුවෙකු යම් පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් (Uni - Code) සඳහා තමා ලැබූ Z අගය අනුව සුදුසුකම් ලැබුවත් එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (Uni - Code) සඳහා ඔහු / ඇය විසින් මනාපයක් සඳහන් කර නොමැති නම් ඒ සඳහා ඔහු / ඇය අනුයුක්ත නොකරන අතර ඒ වෙනුවට ඔහු / ඇය විසින් ඊළගට මනාපය දක්වා ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය (Uni - Code) සඳහා සළකා බලනු ලැබේ. එබැවින් ඔබ විසින් ඔබගේ අයදුම්පත්‍රය පිරවීමට පෙර එවැනි "Uni - Codes" ලැයිස්තුවක් සැලකිල්ලෙන් සිතා බලා සකසා ගන්න.

එසේම, ඉහත සඳහන් කළ පරිදි ඔබ සුදුසුකම් ලබන කිසියම් පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් (Uni - Code) සඳහා කැමැත්ත ප්‍රකාශ නොකිරීම හේතුවෙන් ඒ සඳහා තේරී පත් නොවීමේ අවදානම මග හැරීම පිණිස හැකිතාක් "Uni - Code" ප්‍රමාණයක් සඳහා ඔබගේ කැමැත්ත සඳහන් කරන මෙන්ද උපදෙස් දෙනු ලැබේ.

**4. ප්‍රවේශ අයදුම් පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කිරීමෙන් පසුව වුවද පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කල හැකිද ?**

ඔව්. ප්‍රවේශ අත්පොතෙහි සඳහන් කර ඇති පරිදි විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට ලබා දී ඇති අවසන් දින සිට මසක් ඇතුළත පමණක් පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කිරීමට ඉඩ දෙනු ලැබේ.

ඒ සඳහා අයදුම්කරුවන් ප්‍රවේශ අත්පොතේ ලබා දී ඇති උපදෙස් වලට අනුව අන්තර්ජාලය හරහා සිය කැමැත්තේ අනුපිළිවෙල වෙනස් කර, එමගින් ලැබෙන මුද්‍රිත පිටපත නිසි පරිදි අත්සන් කර ලියාපදිංචි තැපෑලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතුය.

ඔබගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ මුල් අයදුම්පතේ සහ මෙම නව "Uni-Codes" අනුපිළිවෙළ දැක්වෙන මුද්‍රිත අයදුම්පත්‍රයේ අත්සන එකම විය යුතුය.

මෙම අවස්ථාවේදී ඔබ විසින් "Uni-Codes" අනුපිළිවෙළ වෙනස් කිරීමෙන්, ඔබගේ මුල් අයදුම්පතේ දක්වන ලද කැමැත්තේ අනුපිළිවෙළ මුලුමනින්ම අවලංගු වන අතර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමේදී ඔබ විසින් දක්වන මෙම නව කැමැත්තේ අනුපිළිවෙළ සළකා බලනු ලැබේ.

**5. පාඨමාලා සඳහා කැමැත්තේ අනුපිළිවෙල අන්තර්ජාල සේවාව හරහා වෙනස් කරන අයුරු පැහැදිලි කරන්න.**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස ඔබගේ පරිශීලක අංකය හා මුරපදය භාවිත කොට ගිණුමට ඇතුළු වන්න (www.ugc.ac.lk).
- පසුව පාඨමාලා සඳහා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කරන්න.
- ඔබගේ අත්සන සහිත මුද්‍රිත පිටපත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

**6. මාගේ අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබුණු බව දැන ගන්නේ කෙසේද?**

- ඔබගේ අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබුණු බව ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ලැබේ.

**7. කඩඉම් ලකුණු නිකුත් කිරීමට පෙර තමා තේරී පත් වන පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය පූර්ව නිගමනය කළ හැකිද ?**

නොහැකිය. කිසියම් පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා කඩඉම් ලකුණු Z අගය, අයදුම්කරුවන්ගේ කැමැත්තේ අනුපිළිවෙල, විශ්වවිද්‍යාලවල පවතින ස්ථාන සංඛ්‍යාව වැනි කරුණු අනුව තීරණය වේ.

**8. පෞද්ගලික අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත්‍රය සමග පාසල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත එවීම අනිවාර්යද ?**

ඔව්. එසේ එවීමට අපොහොසත්වන පෞද්ගලික අයදුම්කරුවන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**9. අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා එක් එක් දිස්ත්‍රික්කයේ අවම කඩඉම් ලකුණ දැන ගන්නේ කෙසේද ?**

- පුවත්පත් මගින්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මගින් (www.ugc.ac.lk)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මහජන සම්බන්ධතා කාර්යාලය මගින්
- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ (1919) කෙටි පණිවුඩ (SMS) සේවාව මගින්

**10. මා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ බව දැන ගන්නේ කෙසේද ?**

ඔබ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබුවහොත් ඒ බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලිපියක් මගින් ඔබට දැනුම් දෙනු ඇත.

**11. සුහද මාරුවීම් සිදු කළ හැකිද ?**

නොහැකිය

**12. ප්‍රවේශ අත්පොතේ දක්වා ඇති පෙර වසරේ කඩඉම් ලකුණු අනුව කිසියම් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන පාඨමාලාවක දිස්ත්‍රික් කඩඉම් ලකුණට වඩා, මාගේ ඉසෙඩ් අගය අඩු වුවහොත්, එවැනි පාඨමාලාවකට මට ඉල්ලුම් කළ හැකිද?**

ඔව්. පෙර වසරේ නිකුත් කළ කඩඉම් ලකුණු මත තීරණ නොගෙන, ඔබ අවම සුදුසුකම් සපුරා ඇති හැකි පමණ අධ්‍යයන පාඨමාලා සඳහා අයදුම් කරන්න. සිසුන් දක්වන කුසලතාවය (ඉසෙඩ් අගය) සහ විශ්වවිද්‍යාලවල පවතින ස්ථාන සංඛ්‍යාව අනුව යම්කිසි දිස්ත්‍රික්කයකින් යම් විශ්වවිද්‍යාලයක පවත්වන යම් පාඨමාලාවකට ප්‍රවේශ වීමට අවශ්‍ය කඩඉම් ලකුණු වසරින් වසර වෙනස් විය හැක.

ඇතැම් සිසුන් ප්‍රමාණවත් ඉසෙඩ් අගයක් ලබා තිබුණද, ඊළඟ වසරේ අ.පො.ස (උසස් පෙළ) කිරීමේ අපේක්ෂාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළද තේරී පත්වූ පාඨමාලාවේ ලියාපදිංචි නොවීමට පසුව තීරණය කරයි. එවැනි අවස්ථා උදාවන බැවින්, ඔබ සුදුසුකම් ලබන හැකිතරම් පාඨමාලා සංඛ්‍යාවක් සඳහා අයදුම් කිරීම සුදුසු වේ.

**13. තේරී පත්වූ පාඨමාලාව සඳහා අදාළ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවූ පසු නැවතත් උසස් පෙළ විභාගය සඳහා පෙනීසිට යළිත් වරක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිද?**

නොහැකිය. සියලුම සිසුන්හට රජයේ උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම සඳහා එක සමාන අවස්ථාවක් ලබා දී ඇති බැවින්, සැමට කරන සාධාරණයක් වශයෙන්, නිදහස් අධ්‍යාපනය යටතේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට සියලුම සිසුනට එක් අවස්ථාවක් පමණක් හිමිවේ.

එයට හේතුව වන්නේ; යම්කිසි ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තේරී ඇති පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගැනීම නිසා එම ශිෂ්‍යයා විසින් වළක්වාලන්නේ එම වසරේම වෙනත් ශිෂ්‍යයෙකුට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා තිබූ අවස්ථාවක් වීමයි. එසේම, ලියාපදිංචිය අවලංගු කොට ගෙන ඊට පසු වර්ෂයක උසස් පෙළ ප්‍රතිඵල අනුව වෙනත් පාඨමාලාවක ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමෙන් එම ශිෂ්‍යයා එම වසරේද උසස් පෙළට පෙනී සිටි වෙනත් සිසුවෙකුගේ අවස්ථාවද අහිමි කිරීමට උත්සාහ කරයි.

**14. කිසියම් ශිෂ්‍යයකු විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකු ලෙස සැලකෙන්නේ කුමන අවස්ථාවේදීද?**

යම්කිසි ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් එවන ලද තේරීම් ලිපිය ලද පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බැර වන සේ බැංකුවකට හෝ අන්තර්ජාලය හරහා ලියාපදිංචි ගාස්තු ලෙස රු.50/=ක මුදල ගෙවා ලියාපදිංචිවීම සඳහා දී ඇති අවසාන දින හෝ එදිනට පෙර ඔහු/ ඇය තේරී පත්වූ පාඨමාලාවට සහ අනුයුක්ත කරන ලද විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය මගින් ලියාපදිංචි වූ විට ඔහු / ඇය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට (වරින් වර සංශෝධිත) අනුව ස්ථාපිත කරන ලද මෙම ප්‍රවේශ අත්පොතේ 1.6 (8) ඡේදය යටතේ සඳහන් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකු ලෙස සැළකේ.

**15. කිසියම් අපේක්ෂකයෙකුගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය තීරණය කරන්නේ කෙසේද ?**

අපේක්ෂකයා අ.පො.ස (උසස් පෙළ) හැදෑරූ වසර 03 ක කාලය තුළ වසරක් හෝ වසරකට වැඩි කාලයක් ඇතුළත්ව සිට අධ්‍යාපනය ලැබූ පාසල පිහිටි දිස්ත්‍රික්කය ඔහුගේ / ඇයගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලේ.

**16. එම වසර 03 ක කාල පරිච්ඡේදය ගණනය කරන්නේ කෙසේද ?**

වසර 03 ගණනය කිරීමේදී අපේක්ෂකයා විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් සපුරාලූ අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වූ මාසයට පෙර වූ මාසයේ අන්තිම දවසින් අවසන් වන වර්ෂ තුනක (03) කාල පරිච්ඡේදය මෙහිදී සලකා බැලේ. උදාහරණයක් ලෙස අ.පො.ස. (උසස් පෙළ) විභාගය අගෝස්තු මස පැවතුනේ නම්, ජූලි මස 31 වන දින සිට පිටුපසට වසර 03 ගණනය කෙරේ.

**17. යම්කිසි ලෙසකින් මා එම කාලය තුළ එක් පාසලකට වඩා වැඩි පාසල් ප්‍රමාණයකට ඇතුළත්ව සිටියේ නම් ?**

එවිට එම කාලය තුළ වැඩිම දින ගණනක් (කෙසේ වුවත් එම කාලය වසරක් හෝ වසරකට වඩා වැඩි විය යුතුය) අධ්‍යාපනය ලැබීම සඳහා ඇතුළත්ව සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය ඔබගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය වශයෙන් සැලකේ.

**18. මා එම කාලය තුළ කිසිදු පාසලකට ඇතුළත්ව නොසිටියේ නම් හෝ මගේ පාසල් කාලය එම කාල පරිච්ඡේදය තුළ වසරකට වඩා අඩු නම් කුමක් සිදුවේද ?**

එවිට සලකා බලනු ලබන වසර තුනක කාල පරිච්ඡේදය තුළදී ඔබගේ ස්ථිර පදිංචිය පිහිටි දිස්ත්‍රික්කය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බලනු ලැබේ. ඔබගේ ස්ථිර පදිංචිය තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි වශයෙන් මෙම අත්පොතේ 1.5 ඡේදය හි සඳහන් ලිපි ලේඛන 02 ඔබ විසින් විශ්වවිද්‍යාල අයදුම්පත සමඟ එවිය යුතු වේ.

**19. ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පිළිබඳ විස්තර සහ ඒවා පැවැත්වෙන දිනයන් මෙම අත්පොතේ සඳහන් නොවන්නේ ඇයි ?**

අදාළ විශ්වවිද්‍යාල විසින් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වන අතර ඒවා පවත්වන දිනයන් විවිධ හේතු අනුව වෙනස් විය හැකිය.

මෙම අත්පොතෙහි පස්වන කොටසෙහි ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන පාඨමාලාවන් සහ අදාළ විශ්වවිද්‍යාල පිළිබඳව පැහැදිලිව දක්වා ඇති අතර එම විශ්වවිද්‍යාලවල ඇමතුම් අංක ඇමුණුම (ඈ) හි දක්වා ඇත. එබැවින් සිසුනට අදාළ විශ්වවිද්‍යාල අමතා යෝග්‍යතා පරීක්ෂණ පිළිබඳ වැඩි විස්තර ලබා ගත හැකිය.

**20. යම් හෙයකින් මා ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණය සමත් වූවත් අදාළ පාඨමාලාවේ කඩඉම් ලකුණ සම්පූර්ණ කර නොමැති නම් මා එම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් නොලබයිද ?**

අදාළ පාඨමාලාව සඳහා ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය නම් එම සමත් වීමට අමතරව එම පාඨමාලාව සඳහා අවශ්‍ය වන අවම කඩඉම් ලකුණ සපුරාලීම ද අත්‍යාවශ්‍ය වේ. ඔබ ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණය සමත් වුවද අදාළ අවම Z අගය ලබා නොමැති නම් එම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් නොලබයි.

**21. තේරී පත්වූ පාඨමාලාව සඳහා අදාළ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පසු, ප්‍රවේශය කල් දැමීමට හැකියාවක් පවතීද ?**

ප්‍රවේශය කල් දැමිය හැක්කේ තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි වූ පසු පමණි. නමුත් ඒ සඳහා පිළිගත හැකි හේතුවක් තිබිය යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු අධ්‍යයන වසර කල් ගෙන,

පසු වර්ෂයක පැවැත්වෙන අ.පො.ස. (උසස් පෙළ) විභාගයකින් ලද ප්‍රතිඵලයක් අනුව වෙනත් උපාධි පාඨමාලාවක් සඳහා ප්‍රවේශ විය නොහැකිය. රාජ්‍ය විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන සඳහා ලියාපදිංචි විය හැක්කේ එක් වරක් පමණි.

එවැනි කල් ගැනීමක් ලබා ගත හැක්කේ උපරිම වශයෙන් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා පමණි.

**22. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුනට ලියාපදිංචිය යළි අවලංගු කරගෙන පසු වර්ෂයක ප්‍රතිඵලවලින් වෙනත් පාඨමාලාවකට ලියාපදිංචි වීමට ඉඩ නොදෙන්නේ ඇයි ?**

මෙයට හේතුව වන්නේ නිදහස් අධ්‍යාපන ප්‍රවේශ ප්‍රතිපත්තියේ සංකීර්ණ බව සහ එමගින් සියලුම සිසුනට සමාන ලෙස සැලකීමයි.

ප්‍රවේශ ප්‍රතිපත්තිය යටතේ කිසියම් පාඨමාලාවක ස්ථාන සංඛ්‍යාවෙන් 40 % ක් දීප ව්‍යාප්ත කුසලතා පදනම මතද, 55% ක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතික වන ලෙස දිස්ත්‍රික් කුසලතා පදනම මතද, ඉතිරි 5 % අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යයි හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක අතරද බෙදී යයි. එබැවින්, සියලුම සිසුනට නිදහස් අධ්‍යාපනය සඳහා සමාන අවස්ථාවක් හිමිවී ඇත.

ඒ අනුව, 77,000 ක් පමණ වන අයදුම්කරුවන් අතරින් හොඳම අයදුම්කරුවන් 34,000 ක්, අධ්‍යයන පාඨමාලා 104 ක් සඳහා තෝරා ගන්නා 40% , 55% සහ 5 % යන සංකීර්ණ ක්‍රමවේදය යටතේ එක් සිසුවෙකුට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා එක් අවස්ථාවකට වඩා ලබා දිය නොහැක.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සියලුම සිසුනට සාධාරණය ඉටු කිරීමේ වගකීම දරයි. යම් ලෙසකින් තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචි විය යුතුද නැද්ද යන්න පිළිබඳව ඔබ සැක සහිතව පසුවේ නම් ඉන් අදහස් වන්නේ ඊළඟ වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් මෙයට වඩා හොඳ ප්‍රතිඵලයක් ලැබිය හැකි බව ඔබ දන්නා බවයි.

එබැවින් අපගේ උපදෙස වන්නේ එවැනි අවස්ථාවකදී ඔබ දැනට තේරී ඇති පාඨමාලාව සඳහා ලියාපදිංචි නොවන ලෙසයි.

**23. කිසියම් අපේක්ෂකයකු සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක අවම ලකුණ ලබාගැනීමට අපොහොසත් වුවහොත් කුමක් කළ යුතුද?**

සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, ඉසෙඩ් අගය අනුව ඔවුන් යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවකට මෙම අධ්‍යයන වර්ෂයේදී තේරී පත් වුවහොත් එම තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබයි.

එවැනි අපේක්ෂකයෙකු සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව පෙර අවස්ථාවකදී සපුරා ඇත්නම්, එය ප්‍රවේශය සඳහා සළකා බලනු ලැබේ.

සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා වූ අනුමත අවස්ථා තුනට යටත්ව ඉදිරි වර්ෂයකදී ඒ සඳහා පෙනී සිට එය සමත් වුවහොත්, ඉසෙඩ් අගය අනුව දැනට තේරී සිටින පාඨමාලාව ඉදිරි අධ්‍යයන වර්ෂයකදී හැදෑරීම සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

**24. පාඨමාලාවක් වෙනස් කර ගැනීම සඳහා අභියාචනයක් ඉදිරිපත් කරන්නේ කෙසේද ?**

තමා තේරීපත් වූ පාඨමාලාවට පහළින් මනාපය දක්වා ඇති පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට අයදුම් කිරීමට සහ / හෝ අයදුම් නොකළ පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට අයදුම් කිරීම සඳහා අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (නීතිරීතිවලට යටත්ව) එම සියලුම අයදුම්පත් සඳහා විශේෂ අවධානයක් යොමු කරන අතර හැකි උපරිම ලෙසින් තවත් සිසුවෙකුට අසාධාරණයක් නොවන ලෙසට ඔවුන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ.

අභියාචනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් මෙම අත්පොත අවසානයේ දී ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර, අදාළ මුදල ගෙවා, කඩඉම් ලකුණු නිකුත් කර සති 04 ක් ඇතුළත අත්පොතෙහි 4.4 කොටසෙහි ලබා දී ඇති උපදෙස් අනුව එම අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවීමට කටයුතු කරන්න.

**25. අභියාචනයක් යොමු කිරීම සඳහා කිසියම් පාඨමාලාවක සහ විශ්වවිද්‍යාලයක ලියාපදිංචි වී සිටීම අනිවාර්ය ද ?**

නැත. තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඔබ ලියාපදිංචි නොවුනද, එසේත් නැතිනම්, මෙම අධ්‍යයන වර්ෂයේදී කිසිඳු පාඨමාලාවකට ඔබ තේරී පත් නොවුනද, අභියාචනාවක් යොමු කිරීම සඳහා එහි කිසිදු බලපෑමක් නොමැත.

**26. "Promotion Declaration" යනු කුමක්ද?**

මෙම වචන දක්නට ලැබෙන්නේ ඔබ දැනට තේරී පත්ව ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදීය.

එබැවින්, මෙය වැදගත් වන්නේ ඔබ විසින් අන්තර්ජාලය හරහා ලියාපදිංචිය සම්පූර්ණ කිරීමේදීය.

මෙයින් සරලව අදහස් වන්නේ, අප විසින් පුරප්පාඩු පිරවීමේදී සළකා නොබැලිය යුතු යැයි ඔබ අදහස් කරන කේතයන් (Uni - Codes), දැනට ඔබ තේරී පත්ව ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී ඔබගේ "Uni - Codes" ලැයිස්තුවෙන් තෝරාගෙන ඉන්පසු ඉවත් කිරීමයි. එයට හේතුව වන්නේ අප සැමවිටම ඔබ විසින් ඉහළ මනාපයන් දක්වා ඇති "Uni - Codes" සඳහා ඔබව උසස් කිරීමට උත්සාහ දරන බැවිනි.

**27. ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා බැලීමට අවශ්‍ය නොවන්නා වූ "Uni - Codes" අන්තර්ජාලය හරහා ඉවත් කිරීම ("Promotion Declaration") සිදුකරන්නේ කෙසේද?**

ඒ සඳහා ඔබ විසින් දැනට තේරී ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා **අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී** පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න.

1. අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීම සඳහා ලබා දී ඇති මුල් පිටුවෙහි (Online Screen) ඇති **"Promotion Declaration"** බොත්තම භාවිත කරන්න.

2. දැන් ඔබ විසින් මනාපය සඳහන් කරන ලද "Uni - Codes" අනුපිළිවෙළ දැක්වෙන ලැයිස්තුව දිස්වනු ඇත.

3. එම "Uni - Codes" අතුරින් ඔබ දැනට තේරී පත්ව ඇති පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට අදාළ කේතය (Uni - Codes) හඳුනාගන්න.

4. **එම කේතයට ඉහළින් ඔබ විසින් මනාපය දක්වා ඇති කේතයන් (Uni - Codes) අතුරින් ඔබව ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා බැලීමට අවශ්‍ය නොවන්නාවූ "Uni - Codes" සැළකිල්ලෙන් තෝරා ගන්න (අදාළ කොටුවල "✓" ලකුණ යොදන්න). යම් හෙයකින් ඔබ විසින් ඉහළින් මනාපයන් දක්වා ඇති කිසිදු පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට (Uni - Codes) මින් ඉදිරියට ඔබව සළකා බැලීමට අවශ්‍ය නොවන්නේනම් සහ දැනට තේරී ඇති පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම ඉදිරියටත් රැඳී සිටීමට කැමැත්ත දක්වන්නේ නම්, දැනට තේරී ඇති කේතයට ඉහළින් මනාපයන් දක්වා ඇති සියළුම කේතයන් ඔබ විසින් තෝරා ගත යුතුය. එලෙසින් ඔබ සළකුණු කරන කේතයන් (Uni - Codes) කිසිවක් සඳහා අප විසින් ඔබව පුරප්පාඩු පිරවීමේදී සළකා බලන්නේ නැත.**

5. ඉන්පසු **"Submit"** බොත්තම භාවිත කිරීම මගින් ඔබ විසින් පූරප්පාඩු පිරවීම යටතේ සලකා බැලීම <u>අනවශ්‍ය</u> යැයි සඳහන් කළ "Uni - Codes" ඔබගේ "Uni - Code" ලැයිස්තුවෙන් ඉවත් කරන්න.

    [ඔබ විසින් සලකා බැලීම අනවශ්‍ය යැයි සඳහන් කරන ලද එම "Uni - Codes" ලැයිස්තුව අන්තර්ජාලය හරහා ලියාපදිංචිය සම්පූර්ණ කිරීමේදී ලැබෙන මුද්‍රිත පිටපතෙහිද (Online Payment Receipt) සඳහන් වනු ඇත. මෙය ඔබ විසින් අනවශ්‍ය යැයි සලකුණු කරන ලද කේතයන් මොනවාද යන්න මතක තබා ගැනීමට ඔබට උපකාර වනු ඇත.]

6. ඔබ විසින් එසේ ඉවත් කිරීම සඳහා තෝරා ගත් "Uni - Code" ලැයිස්තුව නැවතත් වෙනස් කිරීමට අවශ්‍ය නම් ඉහත 1-5 දක්වා ඇති උපදෙස් නැවත අනුගමනය කරන්න.

28. **දැනට තේරී ඇති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීමේදී, ඉදිරි පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා බැලීමට අවශ්‍ය නොවන්නා වූ "Uni - Codes" ඉහත සඳහන් කළ පරිදි මාගේ "Uni - Codes" ලැයිස්තුවෙන් <u>ඉවත් නොකලහොත්</u> කුමක් සිදුවේද?**

ඔබ විසින් ඉදිරි පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා නොබැලිය යුතු පාඨමාලා සහ විශ්වවිද්‍යාල (Uni - Codes) එසේ ඉවත් නොකළ හොත්, ඔබගේ ඉහළ මනාපයන් සඳහා ඔබව සලකා බැලීමට අපට සිදුවනු ඇත.

එබැවින් ඔබ විසින් විශේෂයෙන්ම අවබෝධ කරගත යුතු වන්නේ, ඔබ විසින් ඉහළ මනාපයන් සඳහා තේරී පත් නොවී දැනට තේරී සිටින පාඨමාලාවේ සහ විශ්වවිද්‍යාලයේම (Uni - Code) රැඳී සිටීමට ඉල්ලුම් නොකළහොත්, ඔබව ඉහළ මනාපයන් සඳහා සලකා බැලීමට අපට සිදුවන බවයි. එවිට, පූරප්පාඩු පිරවීම යටතේ ඔබ තේරී පත්වූ එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය ඔබ විසින් **භාරගත යුතු අතර අනිවාර්යයෙන්ම ඒ සඳහා ලියාපදිංචි විය යුතුය.**

එබැවින්, ඔබ කැමති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචි වීමේදී ඒ බව සඳහන් කිරීම අතිශයින් වැදගත් වේ.

29. **දැනට තේරී සිටින පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට ඉහළින් මනාපය සඳහන් කර ඇති "Uni - Codes" සියල්ලම ඉවත් නොකර ඉදිරි පූරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා නොබැලිය යුතු "Uni - Codes" කීපයක් පමණක් තෝරාගෙන ඉවත් කළ හැකිද?**

එසේ කළ හැකිය. පළමුව, ඉවත් කිරීම සඳහා තෝරාගත් "Uni - Codes" ඉදිරියෙහි ඇති අදාළ කොටුවල "✔" ලකුණ යොදන්න. දැන් **"Submit"** බොත්තම භාවිත කිරීම මගින් ඔබ විසින් පූරප්පාඩු පිරවීම යටතේ සලකා බැලීම අවශ්‍ය නොවේ යැයි සඳහන් කළ "Uni - Codes" ඔබගේ "Uni - Code" ලැයිස්තුවෙන් ඉවත් කරන්න.

30. **මා විසින් Z අගය අනුව සුදුසුකම් සපුරා ඇති එහෙත් අයදුම්පතෙහි ඉල්ලුම් නොකරන ලද කේතයක් (Uni-Code) සඳහා පසුව අභියාචනයක් ඉදිරිපත් කළහොත් එම ඉල්ලීම සලකා බලනු ලැබේද ?**

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම Z ලකුණ නිකුත් කර සති 04 ක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලියාපදිංචි තැපැලෙන් එවන ලද අභියාචනා පමණක් සලකා බලනු ලැබේ. එහෙත් එය සිදු කළ හැක්කේ අදාළ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා පූරප්පාඩු පවතින්නේ නම් පමණක් බැවින්, පසුව අභියාචනා කරන ලද එම කේතයන් සඳහා තේරී පත්වීමට ඇති ඉඩකඩ **ඉතා අල්ප වේ**. එයට හේතුව වන්නේ, අදාළ කේතය ඉල්ලුම් කරන ලද සිසුන් සඳහා දැනටමත් එම අවස්ථාව ලබා දී ඇති බැවිනි.

**එබැවින්, හැකි පමණ කේතයන් (Uni - Codes) සංඛ්‍යාවක් ඔබගේ අයදුම්පත්‍රයේ සඳහන් කිරීම**

**අතිශයින් වැදගත් වේ.**

31. **මා සාමාන්‍ය ප්‍රවේශය යටතේ මගේ පස්වන මනාපය ලෙස අයදුම්පතෙහි සඳහන් කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට තේරී පත්වූයෙමි. එහෙත් අයදුම්පතෙහි පිළිවෙලින් හතරවන හා තුන්වන මනාපයන් ලෙස දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට මා වැඩි කැමැත්තක් දක්වන බැවින්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට ලියාපදිංචි නොවීමට තීරණය කළෙමි. එබැවින් පුරප්පාඩු පිරවීමේ වටයකදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට මා තේරී පත්වීමට හැකියාවක් පවතීද ?**

හැකියාවක් නැත.

ඔබ තේරී පත්වන කිසියම් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වන කිසියම් පාඨමාලාවක් සඳහා ඔබ ලියාපදිංචි නොවුනහොත් අයදුම්පතෙහි ඔබ තේරී පත්වූ එම විශ්වවිද්‍යාලය මගින් පවත්වන අදාළ පාඨමාලාවට ඉහළින් මනාපය සඳහන් කර ඇති එම පාඨමාලාව පවත්වන අන් කිසිදු විශ්වවිද්‍යාලයකට එම පාඨමාලාව හැදෑරීම සඳහා යළිත් ඔබේ අයදුම්පත සළකා බලනු නොලැබේ. ඒ වෙනුවට, ඔබ විසින් ඊළගට ඉහළ මනාපය සඳහන් කර ඇති **අනෙක් පාඨමාලාවට** ඔබගේ අයදුම්පත සලකා බලනු ලැබේ.

එබැවින්, ඔබ දැනට තේරී සිටින විශ්වවිද්‍යාලයට වඩා ඉහළ මනාපයක් දක්වා ඇති වෙනත් විශ්වවිද්‍යාලයකට එම පාඨමාලාවම හැදෑරීම සඳහා පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී ඔබගේ අයදුම්පත සළකා බැලීමට කැමැත්ත දක්වන්නේ නම්, පළමුව ඔබ දැනට තේරී සිටින එම පාඨමාලාව හා විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතුය.

එසේ නොවුනහොත්, ඔබ ඉහළ මනාපයන් සඳහන් කර ඇති වෙනත් විශ්වවිද්‍යාල කිසිවක් සඳහා එම පාඨමාලාව හැදෑරීමට ඔබගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

32. **මා සාමාන්‍ය ප්‍රවේශය යටතේ මගේ පස්වන මනාපය ලෙස අයදුම්පතෙහි සඳහන් කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට තේරී පත්ව ඉහත උපදෙස් අනුව ඒ සඳහා ලියාපදිංචි වූයෙමි. ඉන් පසු පුරප්පාඩු පිරවීමේ වටයකදී මා විසින් 4 වන මනාපය ලෙස දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා තේරී පත් වූයෙමි. නමුත්, මාගේ අයදුම්පතෙහි මීට ඉහළින් මනාපය දක්වා තිබූ (3 වන මනාපය) කොළඹ විශ්වවිද්‍යාලය මගින් පවත්වන ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා මා වැඩි කැමැත්තක් දක්වන බැවින්, පුරප්පාඩු පිරවීම යටතේ මා තේරී පත්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට ලියාපදිංචි නොවීමට තීරණය කළෙමි. එබැවින් ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයකදී කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාවට මා තේරී පත්වීමට හැකියාවක් පවතීද ?**

හැකියාවක් නැත.

පුරප්පාඩු පිරවීම යටතේ ඔබ තේරී පත්වූ ඔබගේ 4 වන මනාපය ලෙස දක්වා ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීමට ලියාපදිංචි නොවුනහොත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා මේ වනවිට ඔබ ලියාපදිංචි වී සිටියද ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයකදී තේරී පත්වීමට බලාපොරොත්තු වන්නාවූ අයදුම්පතෙහි ඔබගේ 3 වන මනාපය ලෙස දක්වා ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා තව දුරටත් ඔබගේ අයදුම්පත සළකා බලනු නොලැබේ.

එබැවින්, ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයකදී කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා ඔබගේ අයදුම්පත සළකා බැලීමට අවශ්‍ය නම් ඔබ විසින් කළ යුතුව ඇත්තේ පුරප්පාඩු පිරවීම යටතේ ඔබ තේරී පත් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමයි. නැතහොත්, ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා ඔබගේ අයදුම්පත තවදුරටත් සළකා බලනු නොලැබේ.

**33. විශේෂ උපාධි පාඨමාලා සහ ගෞරව උපාධි පාඨමාලා අතර කිසියම් වෙනසක් පවතීද ?**

කිසිඳු වෙනසක් නැත.

උපාධි පාඨමාලා නාමකරණය පිළිබඳ වූ Sri Lanka Qualifications Framework (SLQF) හි උපදේශයන් අනුව අළුතින් හඳුන්වාදෙන සියළු උපාධි පාඨමාලා විශේෂ උපාධි පාඨමාලා වෙනුවට ගෞරව උපාධි පාඨමාලා වශයෙන් නම් කර ඇත. එබැවින්, උපාධි පාඨමාලාවන්හි අන්තර්ගතය හෝ ප්‍රමිතිය පිළිබඳව කිසිඳු බලපෑමක් ඉන් සිදු නොවේ.

**34. යම් ලෙසකින් තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා මා ලියාපදිංචි නොවුනහොත් ඉන් ඉදිරියට පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී මගේ අයදුම්පත සළකා බලනු නොලැබේද ?**

මෙම අත්පොතෙහි 3.2 ඡේදයෙහි " වැදගත් " යන කොටසෙහි සඳහන් පරිදි ඔබ දැනට තේරී පත්ව සිටින පාඨමාලාව සහ විශ්වවිද්‍යාලයට ලියාපදිංචි නොවුනහොත් එම පාඨමාලාවට ඉහළින් මනාපය සඳහන් කර ඇති වෙනත් විශ්වවිද්‍යාල සඳහා එම පාඨමාලාවම හැදෑරීම පිණිස ඔබගේ අයදුම්පත ඉදිරි පුරප්පාඩු පිරවීමේ වටයන්හිදී සලකා බලනු නොලැබේ. නමුත් ඔබ ලියාපදිංචි නොවන පාඨමාලාවට ඉහළින් මනාපය සඳහන් කර ඇති වෙනත් පාඨමාලා සඳහා තවදුරටත් ඉදිරි පුරප්පාඩු වටයන්හිදී ඔබගේ අයදුම්පත සලකා බලනු ලැබේ.

**35. 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා සිසුන් කාණ්ඩ දෙකක් පෙනී සිටින ලද්දේ ද ? කවුරුන්ද?**

ඔව්

2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන් සහ 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන් එම කාණ්ඩ දෙකයි.

**36. කිසියම් පාඨමාලාවක් සඳහා පැරණි නිර්දේශය හා නව නිර්දේශය යටතේ තෝරා ගන්නා සිසුන් සංඛ්‍යාව තීරණය කරන්නේ කෙසේද ?**

SC(FR) 29/2012 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගය අනුව යමින්, 2019 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන්ද වෙනම කාණ්ඩ දෙකක් *(two distinct populations)* වශයෙන් සැලකීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලදී.

- 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා <u>නව නිර්දේශය</u> යටතේ පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>පළමු වරට</u> අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙලින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුක්ත මධ්‍යකයේ (Composite Average) ප්‍රතිශතය වේ.

- 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී දෙවන සහ තුන්වන වරට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙලින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කය -කින්ම සහ දිප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්ව-විද්‍යාවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුක්ත මධ්‍යකයේ (Composite Average) ප්‍රතිශතය වේ.

# 9 කොටස

## අධ්‍යයන පාඨමාලාවලට ඇති ඉල්ලුම පිළිබඳ සිසුන්ට අවබෝධයක් ලබා ගැනීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂයේදී නිකුත් කළ කඩඉම් ලකුණු

පසුගිය අධ්‍යයන වර්ෂයට (එනම් 2018/2019 අධ්‍යයන වර්ෂයට) අදාළ එක් එක් පාඨමාලාවට ඇතුළත්වීමට අවශ්‍ය වූ කඩඉම් ලකුණු මෙම කොටසෙහි දක්වා ඇත. මෙම කඩඉම් ලකුණු දැක්වීමෙහි අරමුණ, එක් එක් පාඨමාලා සඳහා ඇති ඉල්ලුම පිළිබඳව යම් අවබෝධයක් ඔබට ලබාදීම පමණකි.

එබැවින්, මෙම කඩඉම් ලකුණු පමණක්ම භාවිත කරමින් අවශ්‍ය තීරණ ගැනීමෙන් වලකින්න. කඩඉම් ලකුණු වසරින් වසර වෙනස් වේ.

# 10 කොටස

## ආදර්ශ අයදුම්පත්‍ර

| | | |
|---|---|---|
| ඇමුණුම - 1 | : | අභියාචනා සඳහා ආදර්ශ අයදුම් පත්‍රය |
| ඇමුණුම - 2 | : | විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත |
| ඇමුණුම - 3 | : | අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත |

| | | For Office Use only | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

# අභියාචනා සඳහා ආදර්ශ අයදුම් පත්‍රය
# மேன்முறையீட்டு விண்ணப்பத்தின் மாதிரி
# Specimen Application Form for Appeals

අධ්‍යයන වර්ෂය / கல்வியாண்டு / Academic Year **2019/2020**

**කරුණාකර මෙම ආකෘති පත්‍රය කේත සඳහා (uni-code) කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීමට භාවිතා නොකරන්න.**
**தயவு செய்து இந்த விண்ணப்பத்தை விருப்பொழுங்கு யுனிகோட் மாற்றத்திற்கு பாவிக்க வேண்டாம்.**
**Please do not use this specimen form to change the order of preferences of uni-codes.**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම: හිමි/මයා/ මිය/ මෙය :
விண்ணப்பதாரியின் முழுப்பெயர் (ஆங்கிலத்தில்): வண./திரு./திருமதி/செல்வி :
Full Name of the applicant: Rev./ Mr. / Mrs./Miss:

.......................................................................................................

.......................................................................................................

02. (a) ලිපි ලැබිය යුතු ලිපිනය / தொடர்புக்கான முகவரி (ஆங்கிலத்தில்) / Contact Address:

.......................................................................................................

.......................................................................................................

(b) දුරකථන අංකය/தொலைபேசி இல./Telephone No.

ස්ථාවර / நிலையான / Fixed | | | | | | | | | | |

ජංගම/ கையடக்க / Mobile | | | | | | | | | | |

03. **2019 අ.පො.ස. (උ.පෙළ) විභාගය / 2019 க.பொ.த. (உ.த.) பரீட்சை / G.C.E. (A/L) Examination 2019**

| පෙනී සිටි විෂයයන්/ **தோற்றிய பாடங்கள்** / **Subjects offered** |
|---|
| |
| |
| |

විභාග අංකය /சுட்டெண்/ **Index Number:** | | | | | | | |

ලැබූ Z අගය/ சராசரி Z புள்ளி / Z Score Obtained: | | . | | | | |

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බලන ලද දිස්ත්‍රික්කය/ பல்கலைக்கழக அனுமதிக்காக விண்ணப்பதாரியை கருதிய மாவட்டம் / District from which the applicant was considered for University Admission:

04. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගෙන ඇත්නම්/அனுமதிக்கு தெரிவு செய்யப்பட்டிருப்பின்/ If seleceted for University Admission:

පාඨමාලාව/ கற்கை நெறி / Course of Study :

විශ්වවිද්‍යාලය/ பல்கலைக்கழகம் / University :

05. අභියාචනයට හේතු / மேன்முறையீட்டிற்கான தன்மையும் காரணமும்/ Reason for Appeal:

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(අවශ්‍ය ලියකියවිලි අමුණන්න / சம்பந்தப்பட்ட பத்திரத்தை இணைக்கவும் / Attach relevant documents)

දැනට තේරී ඇති පාඨමාලාවට සහ විශ්වවිද්‍යාලයට පහළින් අයදුම්පතේ සඳහන් කර ඇති වෙනත් පාඨමාලාවකට සහ විශ්වවිද්‍යාලයකට මාරු කර ගැනීමට **හෝ** මුල් අයදුම්පතේ සඳහන් කර නොමැති පාඨමාලා සහ විශ්වවිද්‍යාලවලට අයදුම් කිරීම සඳහා වන අභියාචනයක් නම් ඔබව සළකා බැලිය යුතු පාඨමාලා සහ විශ්වවිද්‍යාල අනුපිළිවෙල පැහැදිලිව සඳහන් කරන්න. / தெரிவு செய்யப்பட்ட கற்கைநெறி மற்றும் பல்கலைக்கழக அனுமதிக்கான குறிக்கப்பட்ட நிபந்தனைகளைப் பூர்த்தி செய்த பரீட்சார்த்தி குறிப்பிட்ட வேறு கற்கைநெறி மற்றும் பல்கலைக்கழக மாற்றத்திற்கான **அல்லது** அக்கற்கைநெறி மற்றும் பல்கலைக்கழகத்திற்கு கீழே குறிப்பிட்டப்பட்ட கற்கைநெறி மற்றும் பல்கலைக்கழக மாற்றத்திற்கான மேன்முறையீடாயின், தயவு செய்து புதிய கற்கைநெறி மற்றும் பல்கலைக்கழக விருப்பொழுங்கை தெளிவாகக் குறிப்பிடுக. / If the appeal is to change the selected course of study of the university to another course of study of a university to which the candidate has given a lower preference **or** to apply for courses of study of universities for which the candidate has not indicated preferences in the original application, clearly indicate the order of preference of courses of study of universities for which the candidate wishes to be considered.

**Order of Preferences**

| | UNI-CODE | | UNI-CODE | | UNI-CODE | | UNI-CODE |
|---|---|---|---|---|---|---|---|
| 1 | | 11 | | 21 | | 31 | |
| 2 | | 12 | | 22 | | 32 | |
| 3 | | 13 | | 23 | | 33 | |
| 4 | | 14 | | 24 | | 34 | |
| 5 | | 15 | | 25 | | 35 | |
| 6 | | 16 | | 26 | | 36 | |
| 7 | | 17 | | 27 | | 37 | |
| 8 | | 18 | | 28 | | 38 | |
| 9 | | 19 | | 29 | | 39 | |
| 10 | | 20 | | 30 | | 40 | |

.................................

දිනය/ திகதி/ Date

.................................

අයදුම්කරුගේ අත්සන / **விண்ணப்பதாரியின் கையொப்பம்** /
**Signature of Applicant**

**මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය මෙම කොටුවේ අලවන්න**
**கொடுப்பனவு பட்டோலையை ஒட்டுக**
**Paste the pay-in-voucher here**

මෙම අයදුම්පත පිරවීමට අදාළ පාඨමාලා කේතයන් සඳහා ඇමුණුම (අ) බලන්න.
இவ் விண்ணப்பப்படிவத்தினை பூரணப்படுத்த இணைப்பு (A) யில் தரப்பட்டுள்ள அட்டவணையினை பயன்படுத்துக
**Please refer Annex (a) for the mapping table to fill in the Course Codes of this application.**

විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත
**இணைப் பாடவிதான செயற்பாடுகளில் திறமைகாட்டிய பரீட்சாத்திகளுக்கான அனுமதிக்கான விண்ணப்பப்படிவம்**
**APPLICATION FOR ADMISSION OF CANDIDATES WHO HAVE EXCELLED IN EXTRA CURRICULAR ACTIVITIES**

**For Office Use only**

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**අධ්‍යයන වර්ෂය / கல்வியாண்டு / Academic Year** **2019/2020**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම: හිමි/මයා/ මිය/ මෙය :
விண்ணப்பதாரியின் முழுப்பெயர் (ஆங்கிலத்தில்): வண./திரு./திருமதி/செல்வி :
Full Name of the applicant: Rev./ Mr. / Mrs./Miss:

.....................................................................................................................

.....................................................................................................................

02. (a) ලිපි ලැබිය යුතු ලිපිනය / தொடர்புக்கான முகவரி (ஆங்கிலத்தில்) / Contact Address:

.....................................................................................................................

.....................................................................................................................

(b) දුරකථන අංකය/தொலைபேசி இல./Telephone No.

ස්ථාවර / நிலையான / Fixed | | | | | | | | | | |

ජංගම/ கையடக்க / Mobile | | | | | | | | | | |

03. ජා.හැ.අංකය/ தே.அ.அ. இல / NIC No : | | | | | | | | | | | | |

04. **2019 අ.පො.ස. (උ.පෙළ) විභාගය / 2019 க.பொ.த. (உ.த.) பரீட்சை / G.C.E. (A/L) Examination 2019**

| පෙනී සිටි විෂයයන් / தோற்றிய பாடங்கள் / Subjects offered | ශ්‍රේණි / தரம் / Grades |
|---|---|
| | |
| | |
| | |

විභාග අංකය/சுட்டெண்/Index Number | | | | | | | |

Z-අගය / Z-புள்ளி / Z-Score | | . | | | | |

සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලබාගත් ලකුණු
பொ.சா.ப. புள்ளிகள்/
Common General Test Marks: | | |

ප්‍රවේශය සඳහා සළකා බලන ලද දිස්ත්‍රික්කය:
பல்கலைக்கழக அனுமதியின் நோக்கத்திற்கு உமது மாவட்டம்/
Your District considered for University Admission : |  |

05. ඇතුළත් වීමට බලාපොරොත්තුවන පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව දැක්විය යුතු අතර, එම අනුපිළිවෙල පසුව වෙනස් කළ නොහැකි බව සළකන්න. **කරුණාකර පාඨමාලා කේතයන් (අංක) සඳහා ඇමුණුම (අ)බලන්න.**
அனுமதிக்கு பரிசீலிக்கப்பட வேண்டிய கற்கை நெறி / கற்கைநெறிகள் என்பவற்றை நீர் விரும்பும் விருப்பு ஒழுங்கில் குறிப்பிடவும். விண்ணப்பித்த பின் மாணவர் எவரும் விருப்பு ஒழுங்கை மாற்ற அனுமதிக்கப்படமாட்டார்கள். **கற்கை நெறிகளுக்கும் அவற்றின் குறியீடுகளுக்கும் தயவு செய்து இணைப்பு A ஐ பார்க்கவும்.** / Indicate according to your order of preference the course/s of study to which you wish to be considered for admission. No student will be permitted to change the order of preference after submit the application. **Please refer Annex (a) for Course Codes.**

| | පාඨමාලා කේතය [කරුණාකර ඇමුණුම (අ) බලන්න] | | |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

| | පාඨමාලා කේතය [කරුණාකර ඇමුණුම (අ) බලන්න] | | |
|---|---|---|---|
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

| | පාඨමාලා කේතය [කරුණාකර ඇමුණුම (අ) බලන්න] | | |
|---|---|---|---|
| 9. | | | |
| 10. | | | |
| 11. | | | |
| 12. | | | |

| | පාඨමාලා කේතය [කරුණාකර ඇමුණුම (අ) බලන්න] | | |
|---|---|---|---|
| 13. | | | |
| 14. | | | |
| 15. | | | |
| 16. | | | |

*සැ.යු.: විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අපේක්ෂකයන් පසු පිටෙහි ලබාදී ඇති ජයග්‍රහණ පිළිබඳ වාර්තාව සම්පූර්ණ කර ඔබ පාසලේ විදුහල්පති ලවා එය සහතික කරවාගෙන සහතිකපත්වල සහතික කරන ලද පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.*

**கவனிக்கவும் : இணைப் பாடவிதான செயற்பாடுகளில் திறமைகாட்டிய அபேட்சகர்கள் அடுத்த பக்கத்தில் தரப்பட்டுள்ள சாதனை அறிக்கையை தமது பாடசாலை அதிபரினால் உறுதிப்படுத்தி சம்மந்தப்பட்ட சான்றிதல் நகல்களுடன் சமர்ப்பித்தல் வேண்டும்.**

**N.B. : Candidates who have excelled in extra curricular activities should complete the Report of Achievements given in the next page, get it certified by the Principal of your school and submit along with the certified copies of certificates.**

06. ඔබ ශ්‍රී ලංකාවේ යම් විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් කවර අවස්ථාවක හෝ ලියාපදිංචි වී ඇත්ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න / நீர் எப்போதாவது உள்வாரி மாணவராக ஏதேனும் பல்கலைக்கழகத்தில் பதிவு செய்து கொண்டீரா? செய்திருப்பின் அதன் விபரங்களைக் கீழே தருக./ Did you register at any time as an internal student of any University in Sri Lanka? If so, give below the particulars:

.....................................................................................................................

මෙම අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි./ மேற்குறிப்பிட்ட தகவல்கள் உண்மையானவையென்றும், சரியானவையென்றும் உறுதிப்படுத்துகிறேன்/I certify that the information given above is true and accurate.

.................................. ..................................................

දිනය/ திகதி/ Date    අයදුම්කරුගේ අත්සන / **விண்ணப்பதாரியின் கையொப்பம்** / **Signature of Applicant**

විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත / இணைப் பாடவிதான செயற்பாடுகளில் திறமைகாட்டிய பரீட்சாத்திகளுக்கான விண்ணப்பம்

**SPECIMEN APPLICATION FORM FOR CANDIDATES WHO HAVE EXCELLED IN EXTRA CURRICULAR ACTIVITIES**

**ජයග්‍රහණ පිළිබඳ වාර්තාව/சாதனைகள் அறிக்கை/REPORT OF ACHIEVEMENTS 2019/2020**
**(විෂය පරිබාහිර කටයුතු සඳහා විශිෂ්ටතාවයක් ඇති අයදුම්කරුවන් සඳහා පමණි.)**
**(இணைப்பாடவிதான செயற்பாடுகளில் திறமைகாட்டிய விண்ணப்பதாரிகளுக்கு மட்டும்)**
**(ONLY FOR CANDIDATES WHO HAVE EXCELLED IN EXTRA CURRICULAR ACTIVITIES)**

නම / பெயர் / Name : ........................................................................................................................................

විභාග අංකය/ சுட்டெண்/ Index Number : ......................................................

**<u>විදුහල්පතිවරයාට උපදෙස් /பாடசாலை அதிபருக்கான அறிவுறுத்தல்/Instructions for the Principal:</u>**

ජාත්‍යන්තර/ ජාතික/ පාසල් මට්ටමින් අදාළ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව 2016.08.01 සිට 2019.07.31 දක්වා වූ කාලසීමාව තුළ ලබා ඇති ජයග්‍රහණ පිළිබඳව ලුහුඬින් මෙහි සඳහන් කරන්න. මෙහි සඳහන් කරනු ලබන සියලුම ක්‍රියාකාරකම්වලට අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් මේ සමග අමුණා එවිය යුතු බව ශිෂ්‍යයා/ ශිෂ්‍යාව දැනුවත් කරන්න. එසේ සහතිකපත් ඉදිරිපත් කර නොමැති ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනු නොලැබේ. ලබාගත් ජයග්‍රහණ සඳහන් කිරීමට මෙම ලේඛණයේ සපයා ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් මෙම ආකෘතියට අනුව සකසා ගත් වෙනත් කොළයක් භාවිත කළ හැකිය. **එසේ භාවිත කරන සෑම අමතර කොළයකම ඔබගේ අත්සන හා නිල මුද්‍රාව යෙදිය යුතු වේ.**

2016.08.01 இலிருந்து 2019.07.31 இடைப்பட்ட காலப்பகுதியில் சர்வதேச/நாடளாவிய மட்டத்தில் மாணவர்கள் பெற்றுக்கொண்ட சாதனைகளை சுருக்கமாக இப்படிவத்தில் குறிப்பிடுக. இங்கு குறிப்பிடப்பட்டுள்ள சாதனைகளுக்குரிய உறுதிப்படுத்தப்பட்ட சான்றிதழ்களின் பிரதிகளை இப் படிவத்துடன் இணைக்குமாறு மாணவர்களை அறிவுறுத்துக. தொடர்புடைய சான்றிதழ் பிரதிகள் இணைக்கப்படாத சாதனைகள் கருத்தில் கொள்ளப்பட மாட்டாது. **இங்கு தரப்பட்டுள்ள இடம் மாணவரது சாதனைகளை குறிப்பிட போதுமாக இல்லாதிருப்பின் இதே அமைப்பில் மேலதிக தாள்களிலும் அதிபரது கையொப்பம் மற்றும் உத்தியோகபூர்வ முத்திரையுடன் இணைக்குக.**

State here in brief, the achievements of the student during the period from 01.08.2016 to 31.07.2019 at International / National and School Level. Please also instruct the student to attach into this form the certified copies of the certificates with regard to the achievements indicated herein. The achievements without the relevant copies of the certificates will not be considered. If the space provided in this report is not sufficient to indicate all the achievements, you may use another sheet of paper, prepared according to the same structure. **You should place your signature and official frank in each such paper, as well.**

**මෙම පෝරමය නිසි පරිදි පුරවා අත්සන් කර ඔබගේ නිල මුද්‍රාව යොදා අදාළ ශිෂ්‍යයාට/ ශිෂ්‍යාවට බාර දෙන්න.**
**உமது உத்தியோகபூர்வ முத்திரையுடன், சரியாக நிரப்பி ஒப்பமிடப்பட்ட படிவம் மாணவரிடத்தில் வழங்கப்பட வேண்டும்.**
**The duly filled & signed form with your official frank should be handed over to the student.**

**1. ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ/சர்வதேச மட்ட சாதனைகள்/International Level Achievements**

| තරඟය/ ක්‍රියාකාරකම<br>நிகழ்வு/ செயற்பாடுகள்<br>Event / Activity | වර්ෂය හා මාසය<br>ஆண்டு மற்றும் மாதம்<br>Year and Month | ආයතනය<br>நிறுவனம்<br>Institution | ලබා ඇති ස්ථානය<br>சாதனை மட்டம்<br>Level of achievement |
|---|---|---|---|
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |

**2. ජාතික මට්ටමේ ජයග්‍රහණ/நாடளாவிய மட்ட சாதனைகள்/National Level Achievements**

| තරඟය/ ක්‍රියාකාරකම<br>நிகழ்வு/ செயற்பாடுகள்<br>Event / Activity | වර්ෂය හා මාසය<br>ஆண்டு மற்றும் மாதம்<br>Year and Month | ආයතනය<br>நிறுவனம்<br>Institution | ලබා ඇති ස්ථානය<br>சாதனை மட்டம்<br>Level of achievement |
|---|---|---|---|
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |

**3. පාසල් මට්ටමේ ජයග්‍රහණ, දරණ ලද තනතුරු/பாடசாலை மட்ட சாதனைகள், வகித்த இடம்/School Level Achievements, Positions Held.**

| තරඟය/ ක්‍රියාකාරකම/ තනතුර<br>நிகழ்வு/ செயற்பாடுகள்/இடம்<br>Event / Activity/Position | වර්ෂය හා මාසය<br>ஆண்டு மற்றும் மாதம்<br>Year and Month | ආයතනය<br>நிறுவனம்<br>Institution | ලබා ඇති ස්ථානය<br>சாதனை மட்டம்<br>Level of achievement |
|---|---|---|---|
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |
| ........................................ | .................... | ......................... | ............................. |

.............................
දිනය/**திகதி**/Date

.....................................................................................
විදුහල්පතිගේ අත්සන සහ නිල මුද්‍රාව
அதிபரது கையொப்பம் மற்றும் உத்தியோகபூர்வ முத்திரை
Principal's Signature & Official Frank

**අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුලත් කිරීම සඳහා අයදුම්පත**
**பார்வையற்ற/அங்கவீன பரீட்சார்த்திகளுக்கான அனுமதிக்கான விண்ணப்பப்படிவம்**
**APPLICATION FOR ADMISSION OF BLIND / DIFFERENTLY ABLED CANDIDATES**

**For Office Use only**

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**අධ්‍යයන වර්ෂය / கல்வியாண்டு / Academic Year 2019/2020**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම: හිමි/මයා/ මිය/ මෙය:
விண்ணப்பதாரியின் முழுப் பெயர் (ஆங்கிலத்தில்): வண./திரு./திருமதி/செல்வி :
Full Name of the applicant: Rev./ Mr. / Mrs. /Miss. ...............................................................................

..............................................................................................................................................

02. (a) ලිපි ලැබිය යුතු ලිපිනය / தொடர்புக்கான முகவரி (ஆங்கிலத்தில்) / Contact Address

..............................................................................................................................................

..............................................................................................................................................

(b) දුරකථන අංකය / தொலைபேசி இலக்கம் / Telephone Number

ස්ථාවර நிலையான/ Fixed: | | | | | | | | | | |

ජංගම දුරකථන கையடக்க/ Mobile: | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය / தேசிய அடையாள அட்டை இல./ National Identity Card Number: | | | | | | | | | | | | |

04. **2019 අ.පො.ස. (උ.පෙළ) විභාගය / 2019 க.பொ.த. (உ.த.) பரீட்சை / G.C.E. (A/L) Examination 2019**

| පෙනී සිටි විෂයයන් / **தோற்றிய பாடங்கள்** / **Subjects offered** |
|---|
| |
| |
| |

විභාග අංකය / **சுட்டெண்/ Index Number:** | | | | | | | |

ලැබූ Z අගය / பெற்ற Z புள்ளி / Z Score Obtained: | | . | | | | |

සාමාන්‍ය පොදු පරීක්ෂණයේ ලකුණු
பொது சாதாரண பரீட்சை புள்ளிகள்/
Common General Test Marks: | | |

05. විශේෂ ප්‍රවේශය යටතේ සලකා බැලීමට ඇති විශේෂ හේතු (අදාළ කොටුව තුළ (X) ලකුණ සඳහන් කරන්න)
உமது விண்ணப்பத்திற்கான விசேட காரணம்/ங்கள் (சம்பந்தப்பட்ட கூட்டில்/ அடைப்பில் 'X' எனக் குறிப்பிடுக.)/
Any special reason/s in respect of your application (Indicate mark 'X' in the relevant box/cage)

☐ කායික අශක්නුතාවක් ඇති අයදුම්කරුවන් / அங்கவீன பரீட்சார்த்தி / Differently Abled Candidates

☐ අන්ධ අයදුම්කරුවන් [අ.පො.ස. (උසස් පෙළ) විභාගයට බ්‍රේල් ක්‍රමයෙන් පෙනී සිටි]
கண் பார்வையற்ற பரீட்சார்த்தி [பிறெய்லி முறையைப் பாவித்து க.பொ.த. (உ.த.) பரீட்சைக்கு தோற்றியோர்] /Blind Candidates [who sat the G.C.E. (A/L) Examination using Braille System]

> **සැ.යු.: කායික අශක්නුතාවක් ඇති අපේක්ෂකයන් වෛද්‍ය සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි**
> **கவனிக்கவும் : அங்கவீனப் பரீட்சார்த்திகள் வைத்திய அத்தாட்சிப் பத்திரங்களின் பிரதிகளை இணைக்க வேண்டும்.**
> **N.B. : Differently abled candidates should attach copies of Medical Certificates.**

06. ඇතුලත්වීමට බලාපොරොත්තුවන පාඨමාලාව
நீர் பரிசீலிக்கப்படுவதற்கு விரும்பும் கற்கைநெறியைக் குறிப்பிடவும்
Course of study to which you wish to be considered.

| ජෛවීය විද්‍යාව<br>உயிரியல் விஞ்ஞானம்<br>Biological Science | ☐ | භෞතික විද්‍යාව<br>பௌதிக விஞ்ஞானம்<br>Physical Science | ☐ | වාණිජ්‍යය<br>வர்த்தகம்<br>Commerce | ☐ | කලා<br>கலை<br>Arts | ☐ |
|---|---|---|---|---|---|---|---|

**සටහන : කායික අශක්නුතාවක් ඇති අයදුම්කරුවන්හට අයදුම්කළ හැක්කේ කලා, වාණිජ්‍යය, භෞතික විද්‍යාව සහ ජෛවීය විද්‍යාව, යන පාඨමාලා සඳහා පමණි.**

**குறிப்பு: இந்த சிறப்பு ஒதுக்கீட்டின் கீழ் அங்கவீனப் பரீட்சார்த்திகள் கலை, வர்த்தகம், பௌதிக விஞ்ஞானம், உயிரியல் விஞ்ஞானம் ஆகிய பாடநெறிகளுக்கு மட்டும் விண்ணப்பிக்க தகுதியுடையவர்கள்.**

**Note: Differently abled candidates are eligible to apply only for courses of study in Arts , Commerce, Physical Science and Biological Science.**

07. ඔබ ශ්‍රී ලංකාවේ යම් විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් කවර අවස්ථාවක හෝ ලියාපදිංචි වී ඇත්ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න / நீர் எப்போதாவது உள்வாரி மாணவராக ஏதேனும் பல்கலைக்கழகத்தில் பதிவு செய்து கொண்டீரா? செய்திருப்பின் அதன் விபரங்களைக் கீழே தருக / Did you register at any time as an internal student of any University in Sri Lanka? If so, give below the particulars :

..............................................................................................................................................

මෙම අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි/மேற்குறிப்பிட்ட தகவல்கள் உண்மையானவையென்றும், சரியானவையென்றும் உறுதிப்படுத்துகிறேன்./I certify that the information given above is true and accurate.

.......................................... ..........................................................................

දිනය/ திகதி/ Date — අයදුම්කරුගේ අත්සන / **விண்ணப்பதாரியின் கையொப்பம்** / **Signature of Applicant**

අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් ඇතුලත් කිරීම සඳහා අයදුම්පත / பார்வையற்ற/அங்கவீன பரீட்சார்த்திகளுக்கான அனுமதிக்கான விண்ணப்பப்படிவம்
**APPLICATION FORM FOR ADMISSION OF BLIND / DIFFERENTLY ABLED CANDIDATES**

## විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇති ස්ථාන සංඛ්‍යාව

2019/2020 අධ්‍යයන වර්ෂයේදී එක් එක් පාඨමාලාවට ආසන්න වශයෙන් පහත සඳහන් සංඛ්‍යා ඇතුළත් කර ගැනීමට යෝජනා කර ඇත.

| පාඨමාලා කේතය | අධ්‍යයන පාඨමාලාව | | යෝජිත ස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| 001 | වෛද්‍ය විද්‍යාව | - | 1590 |
| 002 | දන්ත ශල්‍ය විද්‍යාව | - | 90 |
| 003 | පශු වෛද්‍ය විද්‍යාව | - | 100 |
| 004 | කෘෂිකර්මය | - | 760 |
| 005 | ආහාර විද්‍යාව හා පෝෂණය | - | 110 |
| 006 | ජෛවීය විද්‍යාව | - | 1440 |
| 007 | ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | - | 320 |
| 008 | ඉංජිනේරු විද්‍යාව | - | 2083 |
| 009 | ඉංජිනේරු විද්‍යාව (EM) | - | 50 |
| 010 | ඉංජිනේරු විද්‍යාව (TM) | - | 70 |
| 011 | ප්‍රමාණ සමීක්ෂණය | - | 125 |
| 012 | පරිගණක විද්‍යාව | - | 525 |
| 013 | භෞතික විද්‍යාව | - | 2015 |
| 014 | මැනුම් විද්‍යාව | - | 110 |
| 015 | ව්‍යවහාරික විද්‍යා (භෞතික විද්‍යා) | - | 580 |
| 016 | කළමනාකරණය | - | 4790 |
| 017 | දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය | - | 60 |
| 018 | වාණිජ්‍යය | - | 740 |
| 019 | කලා (අතිරේක ප්‍රවේශයද ඇතුලුව) | - | 6300 |
| 020 | කලා (SP) - ජන මාධ්‍ය | - | 100 |
| 021 | කලා (SAB) | - | 281 |
| 022 | කළමනාකරණ අධ්‍යයන (TV) | - | 325 |
| 023 | වාස්තු විද්‍යාව | - | 75 |
| 024 | නිර්මාණවේදය | - | 60 |
| 025 | නීතිය | - | 385 |
| 026 | තොරතුරු තාක්ෂණය (IT) | - | 200 |
| 027 | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (MIT) | - | 100 |
| 028 | කළමනාකරණය (රාජ්‍ය) විශේෂ | - | 85 |
| 029 | සන්නිවේදන අධ්‍යයන | - | 200 |
| 030 | නගර හා ග්‍රාම නිර්මාණය | - | 55 |
| 031 | සාමය හා ගැටුම් නිරාකරණය | - | 35 |

| | | | |
|---|---|---|---|
| 032 | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | 300 |
| 033 | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | 60 |
| 034 | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | - | 50 |
| 035 | ආහාර විද්‍යාව හා තාක්ෂණය | - | 170 |
| 036 | සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | - | 150 |
| 037 | වෙද | - | 450 |
| 038 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | - | 200 |
| 039 | කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය | - | 200 |
| 041 | කලා (SP) - ප්‍රසංග කලා | - | 100 |
| 050 | සෞඛ්‍ය ප්‍රවර්ධනය | - | 75 |
| 051 | ඖෂධ විද්‍යාව | - | 190 |
| 052 | වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | 190 |
| 053 | විකිරණ ශිල්පය | - | 45 |
| 054 | භෞත චිකිත්ස | - | 70 |
| 055 | පරිසර සංරක්ෂණය හා කළමනාකරණය | - | 60 |
| 056 | පහසුකම් කළමනාකරණය | - | 50 |
| 057 | ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය | - | 60 |
| 058 | අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව | - | 60 |
| 059 | කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය | - | 120 |
| 060 | සංඛ්‍යානය හා සංකාර්යය පර්යේෂණ | - | 50 |
| 061 | පරිගණනය හා කළමනාකරණය | - | 50 |
| 062 | ධීවර සහ සාගර විද්‍යාව | - | 100 |
| 063 | ඉස්ලාම් අධ්‍යයනය | - | 275 |
| 064 | විද්‍යාව සහ තාක්ෂණය | - | 65 |
| 065 | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | - | 100 |
| 066 | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | - | 80 |
| 067 | සත්ත්ව පාලන විද්‍යාව | - | 75 |
| 068 | සංගීතය | - | 455 |
| 069 | නර්තනය | - | 420 |
| 070 | චිත්‍ර සහ නිර්මාණ | - | 35 |
| 071 | නාට්‍ය සහ රංග කලා | - | 125 |
| 072 | දෘශ්‍ය හා තාක්ෂණික කලා | - | 70 |
| 073 | අපනයන කෘෂිකර්මය | - | 75 |
| 074 | තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | - | 65 |
| 075 | කාර්මික තොරතුරු තාක්ෂණය | - | 100 |
| 076 | ඛනිජ සම්පත් සහ තාක්ෂණය | - | 65 |
| 077 | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS) | - | 50 |

| | | | |
|---|---|---|---|
| 079 | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) | - | 120 |
| 080 | ආගණනය සහ තොරතුරු පද්ධති | - | 100 |
| 081 | ශාරීරික අධ්‍යාපනය | - | 50 |
| 082 | ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | - | 105 |
| 083 | කථන හා ශ්‍රවණ විද්‍යා | - | 50 |
| 084 | අරාබි භාෂාව | - | 225 |
| 085 | දෘශ්‍ය කලා | - | 110 |
| 086 | සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | - | 50 |
| 087 | ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | - | 85 |
| 088 | ජලජ සම්පත් තාක්ෂණය | - | 75 |
| 089 | තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | - | 65 |
| 090 | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි කළමනාකරණය | - | 80 |
| 091 | තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය | - | 100 |
| 092 | සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | - | 130 |
| 093 | කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | - | 150 |
| 094 | කෘෂි ව්‍යාපාර කළමනාකරණය | - | 55 |
| 095 | හරිත තාක්ෂණය | - | 50 |
| 096 | තොරතුරු පද්ධති | - | 100 |
| 097 | භූමි නිර්මාණවේදය | - | 50 |
| 098 | පරිවර්තන අධ්‍යයනය | - | 115 |
| 099 | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | - | 100 |
| 100 | සිනමා හා රූපවාහිනී අධ්‍යයන | - | 50 |
| 101 | ව්‍යාපෘති කළමනාකරණය | - | 75 |
| 102 | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | - | 1052 |
| 103 | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | - | 945 |
| 104 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | 785 |
| 105 | ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) | - | 50 |
| 106 | සාගර සහ මිරිදිය විද්‍යාව | - | 60 |
| 107 | ආහාර ව්‍යාපාර කළමනාකරණය | - | 80 |
| 108 | භෞතික විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | - | 120 |
| 109 | ව්‍යාපාර විද්‍යාව | - | 100 |
| 110 | මූල්‍ය ඉංජිනේරුකරණය | - | 50 |
| 111 | භූගෝලීය තොරතුරු විද්‍යාව | - | 50 |
| 112 | සමාජ වෘතවේදය | - | 50 |
| 113 | මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය *(New)* | - | 50 |
| 114 | මානව සම්පත් සංවර්ධනය *(New)* | - | 65 |
| **එකතුව [2019 (උසස් පෙළ) විභාගය සඳහා යෝජිත]** | | - | **34,161** |

# 2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාවේ ව්‍යාප්තිය

## කොළඹ විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 190 |
| ජෛවීය විද්‍යාව | 125 |
| භෞතීය විද්‍යාව | 240 |
| කළමනාකරණය | 630 |
| නීතිය | 265 |
| කලා | 600 |
| අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව | 60 |
| කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය | 120 |
| භෞත චිකිත්ස | 30 |
| හෙද | 100 |
| ඉංජිනේරු තාක්‍ෂණවේදය (ET) | 75 |
| ජෛවපද්ධති තාක්‍ෂණවේදය (BST) | 110 |
| තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය | 60 |
| එකතුව | **2605** |

## කැලණිය විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 165 |
| ජෛවීය විද්‍යාව | 185 |
| භෞතීය විද්‍යාව | 300 |
| කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණය (MIT) | 100 |
| කළමනාකරණය | 520 |
| වාණිජ්‍යය | 250 |
| කලා | 1200 |
| සාමය හා ගැටුම් නිරාකරණය | 35 |
| පරිසර සංරක්‍ෂණය හා කළමනාකරණය | 60 |
| කථන හා ශ්‍රවණ විද්‍යා | 50 |
| පරිවර්තන අධ්‍යයන | 25 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 50 |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | 50 |
| ඉංජිනේරු තාක්‍ෂණවේදය (ET) | 86 |
| තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය | 75 |
| ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL) | 50 |
| භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 50 |
| පරිගණක විද්‍යාව | 50 |
| මූල්‍ය ඉංජිනේරුකරණය | 50 |
| එකතුව | **3351** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 160 |
| ඉංජිනේරු විද්‍යාව | 120 |
| ජෛවීය විද්‍යාව | 300 |
| හෙද | 50 |
| ඖෂධ විද්‍යාව | 50 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | 50 |
| ආහාර විද්‍යාව හා තාක්‍ෂණය | 60 |
| භෞතීය විද්‍යාව | 300 |
| කළමනාකරණය | 910 |
| කළමනාකරණය (රාජ්‍ය) විශේෂ | 85 |
| දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය | 60 |
| වාණිජ්‍යය | 125 |
| කලා | 700 |
| ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS) | 50 |
| ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 55 |
| ඉංජිනේරු තාක්‍ෂණවේදය (ET) | 161 |
| ජෛවපද්ධති තාක්‍ෂණවේදය (BST) | 100 |
| තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය | 125 |
| භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 70 |
| එකතුව | **3531** |

## මොරටුව විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 60 |
| ඉංජිනේරු විද්‍යාව | 723 |
| ඉංජිනේරු විද්‍යාව (EM) | 50 |
| ඉංජිනේරු විද්‍යාව (TM) | 70 |
| තොරතුරු තාක්‍ෂණය (IT) | 200 |
| වාස්තු විද්‍යාව | 75 |
| නිර්මාණවේදය | 60 |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | 50 |
| නගර හා ග්‍රාම නිර්මාණය | 55 |
| ප්‍රමාණ සමීක්ෂණය | 125 |
| පහසුකම් කළමනාකරණය | 50 |
| ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය | 60 |
| තොරතුරු තාක්‍ෂණය සහ කළමනාකරණය | 100 |
| භූමි නිර්මාණවේදය | 50 |
| ව්‍යාපාර විද්‍යාව | 100 |
| එකතුව | **1828** |

| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| වෛද්‍ය විද්‍යාව | 205 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 90 |
| පශු වෛද්‍ය විද්‍යාව | 100 |
| කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය | 200 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | 50 |
| සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | 50 |
| ජෛවීය විද්‍යාව | 180 |
| ඉංජිනේරු විද්‍යාව | 435 |
| භෞතීය විද්‍යාව | 250 |
| කළමනාකරණය | 175 |
| කලා | 750 |
| නීතිය | 50 |
| සංඛ්‍යානය හා සංකාර්යය පර්යේෂණ | 50 |
| පරිගණනය හා කළමනාකරණය | 50 |
| දෙහෙද | 50 |
| ඖෂධ විද්‍යාව | 30 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | 30 |
| විකිරණ ශිල්පය | 45 |
| භෞත චිකිත්ස | 40 |
| භූගෝලීය තොරතුරු විද්‍යාව | 50 |
| සමාජ වෘතවේදය | 50 |
| එකතුව | **2930** |

| යාපනය විශ්වවිද්‍යාලය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| වෛද්‍ය විද්‍යාව | 150 |
| ඉංජිනේරු විද්‍යාව | 175 |
| කෘෂිකර්මය | 175 |
| ජෛවීය විද්‍යාව | 125 |
| භෞතීය විද්‍යාව | 300 |
| කළමනාකරණය | 375 |
| වාණිජ්‍යය | 100 |
| කලා | 500 |
| නීතිය | 70 |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 75 |
| පරිගණක විද්‍යාව | 75 |
| හෙද | 60 |
| ඖෂධ විද්‍යාව | 60 |
| වෛද්‍ය රසායනාගර විද්‍යා | 60 |
| පරිවර්තන අධ්‍යයන | 35 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 125 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 125 |
| එකතුව | **2585** |

| රුහුණ විශ්වවිද්‍යාලය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| වෛද්‍ය විද්‍යාව | 240 |
| කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | 150 |
| ජෛවීය විද්‍යාව | 250 |
| ඉංජිනේරු විද්‍යාව | 510 |
| භෞතීය විද්‍යාව | 300 |
| කළමනාකරණය | 600 |
| කලා | 600 |
| ධීවර සහ සාගර විද්‍යා | 100 |
| හෙද | 150 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | 50 |
| ඖෂධ විද්‍යාව | 50 |
| පරිගණක විද්‍යාව | 100 |
| කෘෂි ව්‍යාපාර කළමනාකරණය | 55 |
| හරිත තාක්ෂණය | 50 |
| සාගර සහ මිරිදිය විද්‍යාව | 60 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 125 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 75 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 75 |
| මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය *(New)* | 50 |
| එකතුව | **3590** |

| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| ජෛවීය විද්‍යාව | 175 |
| ඉංජිනේරු විද්‍යාව | 120 |
| භෞතීය විද්‍යාව | 175 |
| කළමනාකරණය | 160 |
| වාණිජ්‍යය | 140 |
| කලා | 300 |
| ඉස්ලාම් අධ්‍යයනය | 275 |
| අරාබි භාෂාව | 225 |
| කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) | 120 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 90 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 100 |
| එකතුව | **1880** |

## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 75 |
| කෘෂිකර්මය | 120 |
| මැනුම් විද්‍යාව | 110 |
| කළමනාකරණය | 320 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | 60 |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | 60 |
| ව්‍යවහාරික විද්‍යා (භෞතිය විද්‍යා) | 60 |
| කලා (SAB) | 281 |
| ආගණනය සහ තොරතුරු පද්ධති | 100 |
| ශාරීරික අධ්‍යාපනය | 50 |
| ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 50 |
| සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | 80 |
| පරිවර්තන අධ්‍යයන | 30 |
| ආහාර ව්‍යාපාර කළමනාකරණය | 80 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 80 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 80 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 50 |
| එකතුව | **1686** |

## නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 80 |
| කෘෂිකර්මය | 120 |
| ජෛවීය විද්‍යාව | 100 |
| භෞතිය විද්‍යාව | 150 |
| කළමනාකරණය | 125 |
| වාණිජ්‍යය | 125 |
| කලා | 600 |
| සෞඛ්‍ය | 40 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 90 |
| පරිවර්තන අධ්‍යයන | 25 |
| එකතුව | **1455** |

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 85 |
| කෘෂිකර්මය | 180 |
| ආහාර විද්‍යාව හා පෝෂණය | 110 |
| කළමනාකරණය | 550 |
| ව්‍යවහාරික විද්‍යා (භෞතිය විද්‍යා) | 200 |
| ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | 85 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 200 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 90 |
| එකතුව | **1500** |

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 180 |
| කෘෂිකර්මය | 165 |
| කළමනාකරණය | 425 |
| කලා | 400 |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | 185 |
| ව්‍යවහාරික විද්‍යා (භෞතිය විද්‍යා) | 165 |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය | 75 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | 100 |
| සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය | 50 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 100 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 85 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 100 |
| එකතුව | **2030** |

## ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| විද්‍යාව සහ තාක්ෂණය | 65 |
| පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | 100 |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | 80 |
| සත්ත්ව පාලන විද්‍යාව | 75 |
| අපනයන කෘෂිකර්මය | 75 |
| තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 65 |
| කාර්මික තොරතුරු තාක්ෂණය | 100 |
| ඛනිජ සම්පත් සහ තාක්ෂණය | 65 |
| ජලජ සම්පත් තාක්ෂණය | 75 |
| තාල හා කිරි තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 65 |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 80 |
| ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | 100 |
| ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | 100 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 100 |
| මානව සම්පත් සංවර්ධනය *(New)* | 65 |
| එකතුව | **1210** |

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| සංගීතය | 275 |
| නර්තනය | 275 |
| නාට්‍ය සහ රංගකලා | 55 |
| දෘශ්‍ය කලා | 110 |
| එකතුව | **715** |

| ශ්‍රීපාලි මණ්ඩපය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| ප්‍රසංග කලා | 100 |
| ජනමාධ්‍ය | 100 |
| එකතුව | **200** |

| ත්‍රිකුණාමල මණ්ඩපය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| කළමනාකරණ අධ්‍යයන (TV) | 150 |
| සන්නිවේදන අධ්‍යයන | 200 |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 75 |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | 80 |
| පරිගණක විද්‍යාව | 100 |
| එකතුව | **605** |

| වව්නියා මණ්ඩපය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| කළමනාකරණ අධ්‍යයන (TV) | 175 |
| ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) | 75 |
| ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) | 75 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | 100 |
| ව්‍යාපෘති කළමනාකරණය | 75 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 150 |
| එකතුව | **650** |

| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 120 |
| එකතුව | **120** |

| ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| සංගීතය | 80 |
| නර්තනය | 70 |
| නාට්‍ය හා රංග කලා | 70 |
| දෘශ්‍ය හා තාක්ෂණික කලා | 70 |
| එකතුව | **290** |

| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 180 |
| යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 60 |
| එකතුව | **240** |

| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| පරිගණක විද්‍යාව | 200 |
| තොරතුරු පද්ධති | 100 |
| එකතුව | **300** |

| ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| සංගීතය | 100 |
| නර්තනය | 75 |
| චිත්‍ර සහ නිර්මාණ | 35 |
| එකතුව | **210** |

| අතිරේක ප්‍රවේශය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | සංඛ්‍යාව |
| කලා | 650 |
| එකතුව | **650** |

## විෂය ලැයිස්තුව

| විෂය | උපාධිය | උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| කෘෂි ව්‍යාපාර කළමනාකරණය | විද්‍යාවේදී | රු.වි |
| කෘෂි සම්පත් කළමනාකරණය සහ තාක්ෂණය | විද්‍යාවේදී | රු.වි |
| කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය | විද්‍යාවේදී | පේ.වි |
| කෘෂිකර්මය | විද්‍යාවේදී | නැ.වි/ස.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | ර.වි/ව.වි/යා.වි |
| සත්ත්ව පාලන විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) (සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය) | ඌ.වි |
| සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව | විද්‍යාවේදී | පේ.වි |
| ජලජ සම්පත් තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | ඌ.වි |
| අරාබි භාෂාව | ශාස්ත්‍රවේදී | අ.වි |
| වාස්තු විද්‍යාව | වාස්තු විද්‍යාවේදී | මො.වි |
| චිත්‍ර සහ නිර්මාණ | ලලිත කලාවේදී | රා.ඇ.(යා.වි) |
| කලා | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/ කැ.වි/ යා.වි/ රු.වි/නැ.වි/ අ.වි/ර.වි/ස.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | ස.වි |
| මානව විද්‍යාව | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි/ කැ.වි/යා.වි |
| අරාබි | ශාස්ත්‍රවේදී | පේ.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | නැ.වි |
| පුරා විද්‍යාව | ශාස්ත්‍රවේදී | පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| පුරා විද්‍යා හා උරුම කළමනාකරණය | ශාස්ත්‍රවේදී (විශේෂ) | ර.වි |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| බෞද්ධ සංස්කෘතිය | ශාස්ත්‍රවේදී | කැ.වි |
| බෞද්ධ දර්ශනය | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි/කැ.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| බෞද්ධ මනෝවිද්‍යාව | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| බෞද්ධ අධ්‍යයනය | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි |
| චීන | ශාස්ත්‍රවේදී | කැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| ක්‍රිස්තුධර්මය | ශාස්ත්‍රවේදී | නැ.වි |
| ක්‍රිස්තු සංස්කෘතිය | ශාස්ත්‍රවේදී | කැ.වි |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ශාස්ත්‍රවේදී | යා.වි |
| සංසන්දනාත්මක ආගම් | ශාස්ත්‍රවේදී | නැ.වි |
| අපරාධ විද්‍යාව | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| සංස්කෘතිය හා සෞන්දර්ය අධ්‍යයන (නර්තනය / සංගීතය) | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| ප්‍රජා විද්‍යාව | ශාස්ත්‍රවේදී | කො.වි |
| සංවර්ධන අධ්‍යයනය | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| නාට්‍ය හා රංගකලා | ශාස්ත්‍රවේදී | කැ.වි/යා.වි/නැ.වි |
| ආර්ථික විද්‍යාව | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ර.වි/ස.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| අධ්‍යාපනය | අධ්‍යාපනවේදී | නැ.වි |
| | අධ්‍යාපනවේදී (ගෞරව) | පේ.වි |
| ඉංග්‍රීසි | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| ඉංග්‍රීසි සාහිත්‍ය | ශාස්ත්‍රවේදී | යා.වි |
| ඉංග්‍රීසි විෂය ඉගැන්වීම | ශාස්ත්‍රවේදී | යා.වි |
| පරිසර කළමනාකරණය | ශාස්ත්‍රවේදී (විශේෂ) | ර.වි |
| සිනමා සහ රූපවාහිනී අධ්‍යයන | ශාස්ත්‍රවේදී (විශේෂ) | කැ.වි |
| ලලිත කලා | ශාස්ත්‍රවේදී | පේ.වි/යා.වි/නැ.වි |
| ප්‍රංශ | ශාස්ත්‍රවේදී | පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි |
| භූගෝල විද්‍යාව | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| ජර්මන් | ශාස්ත්‍රවේදී | කැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| හින්දු ශිෂ්ටාචාරය | ශාස්ත්‍රවේදී | පේ.වි/යා.වි/නැ.වි |
| හින්දු දර්ශණය | ශාස්ත්‍රවේදී | යා.වි |
| හින්දි | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි/කැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| ඉතිහාසය | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ර.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| ගෘහ ආර්ථික විද්‍යාව | ශාස්ත්‍රවේදී | යා.වි |
| ප්‍රතිබිම්බ කලා (ඡායාරූපකරණය, සිනමාව, වීඩියෝ සහ රූපවාහිනිය) | ශාස්ත්‍රවේදී | කැ.වි |
| ජාත්‍යන්තර සබඳතා | ශාස්ත්‍රවේදී | කො.වි |
| ජාත්‍යන්තර අධ්‍යයන | ශාස්ත්‍රවේදී | නැ.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ශාස්ත්‍රවේදී | කො.වි/ පේ.වි |
| ජපන් | ශාස්ත්‍රවේදී | කැ.වි |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| ජනමාධ්‍යවේදය | ශාස්ත්‍රවේදී | කො.වි |
| කොරියන් අධ්‍යයන | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| පුස්තකාල සහ විඥාපන විද්‍යාව | ශාස්ත්‍රවේදී (විශේෂ) | කැ.වි |
| වාග්විද්‍යාව | ශාස්ත්‍රවේදී | කැ.වි/යා.වි |
| සාහිත්‍ය විචාරය | ශාස්ත්‍රවේදී | කැ.වි |
| ජනසන්නිවේදනය | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| මාධ්‍ය අධ්‍යයනය | ශාස්ත්‍රවේදී | යා.වි |

| විෂය | උපාධිය | උසස් අධ්‍යාපන ආයතනය |
| --- | --- | --- |
| මහජන සම්බන්ධතා සහ මාධ්‍ය අධ්‍යයනය | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| සංගීතය | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| පාලි | ශාස්ත්‍රවේදී | පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි |
| ප්‍රසාංගික කලා (සංගීතය, නර්තනය) | ශාස්ත්‍රවේදී(ගෞරව) | කැ.වි |
| දර්ශනය | ශාස්ත්‍රවේදී | පේ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| දර්ශනය හා මනෝවිද්‍යාව | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| සැලසුම්කරණය | ශාස්ත්‍රවේදී | යා.වි |
| දේශපාලන විද්‍යාව | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| මනෝවිද්‍යාව | ශාස්ත්‍රවේදී | පේ.වි/යා.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| රුසියන් | ශාස්ත්‍රවේදී | කැ.වි |
| සංස්කෘත | ශාස්ත්‍රවේදී | පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි |
| සිංහල | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ර.වි/ස.වි |
| සමාජ සංඛ්‍යානය | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| සමාජ / ව්‍යාපාර සංඛ්‍යානය | ශාස්ත්‍රවේදී | ශ්‍රී.ජ.වි |
| සමාජ විද්‍යාව | ශාස්ත්‍රවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| සංඛ්‍යානය | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| දෙමළ | ශාස්ත්‍රවේදී | පේ.වි/කැ.වි/යා.වි/නැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ස.වි |
| ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| සමාජ ව්‍යුහවේදය | සමාජ ව්‍යුහවේදී (ගෞරව) | පේ.වි |
| සංරක්ෂණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| භාෂා පරිවර්තන ක්‍රම | ශාස්ත්‍රවේදී | කැ.වි |
| භාෂා පරිවර්තන අධ්‍යයනය | ශාස්ත්‍රවේදී | යා.වි |
| පරිවර්තන අධ්‍යයනය | ශාස්ත්‍රවේදී (විශේෂ) | යා.වි |
| | ශාස්ත්‍රවේදී (ගෞරව) | ස.වි/කැ.වි/නැ.වි |
| දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය (චිත්‍ර හා ග්‍රැෆික් කලාව) | ශාස්ත්‍රවේදී (ගෞරව) | කැ.වි |
| බටහිර සම්භාව්‍ය සංස්කෘතිය | ශාස්ත්‍රවේදී | පේ.වි/කැ.වි |
| ප්‍රසංග කලා | ශාස්ත්‍රවේදී (විශේෂ) | කො.වි(ශ්‍රී.ම) |
| ජනමාධ්‍ය | ශාස්ත්‍රවේදී (විශේෂ) | කො.වි(ශ්‍රී.ම) |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදී | කො.වි/කැ.වි |
| ජෛවීය විද්‍යාව | විද්‍යාවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි/රු.වි/නැ.වි/අ.වි |
| | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | ර.වි |
| භෞතික විද්‍යාව | විද්‍යාවේදී | කො.වි/පේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි/රු.වි/නැ.වි/අ.වි |
| | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | ර.වි/ස.වි |
| ව්‍යවහාරික ජීව විද්‍යාව | විද්‍යාවේදී | ර.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | අ.වි |
| ව්‍යවහාරික භෞතික විද්‍යාව | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | ස.වි/නැ.වි(ත්‍රි.ම) |
| | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා)(විශේෂ) | ස.වි/නැ.වි(ත්‍රි.ම) |
| ව්‍යවහාරික භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | නැ.වි(ත්‍රි.ම) |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | අ.වි/නැ.වි(ත්‍රි.ම) |
| | විද්‍යාවේදී | පේ.වි/අ.වි/ර.වි/ව.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/පේ.වි |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | ව.වි |
| ව්‍යවහාරික ගණිතය | විද්‍යාවේදී | නැ.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ව්‍යවහාරික ගණිතය සහ ආගණනය | විද්‍යාවේදී | යා.වි (ව.ම) |
| ව්‍යවහාරික සංඛ්‍යානය | විද්‍යාවේදී (විශේෂ) | අ.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ජලජ සම්පත් කළමනාකරණය | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| අණුක ජීවවිද්‍යාව හා ජීව රසායන විද්‍යාව | විද්‍යාවේදී | කො.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | කො.වි |
| අණුක ජීවවිද්‍යාව හා ජෛව තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි/පේ.වි |
| අණුක ජීවවිද්‍යාව හා ශාක ජෛව තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි |
| ජෛව රසායන හා අණුක ජීවවිද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ප්‍රතිශක්තිවේදය සහ සමෝධානික අණුක ජීවවිද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ජෛව තොරතුරු තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ජීව විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/පේ.වි |
| ජෛවපද්ධති තාක්ෂණවේදය | ජෛවපද්ධති තාක්ෂණවේදී(ගෞරව) | ශ්‍රී.ජ.වි/යා.වි/නැ.වි/අ.වි/ර.වි/ව.වි/ඌ.වි/කො.වි/ස.වි/රු.වි |
| උද්භිද විද්‍යාව | විද්‍යාවේදී | නැ.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | රු.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි/පේ.වි/යා.වි |
| රසායන ජීව විද්‍යාව | විද්‍යාවේදී (විශේෂ) | කො.වි |
| රසායන විද්‍යාව | විද්‍යාවේදී | නැ.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | රු.වි/අ.වි |
| | විද්‍යාවේදී (ගෞරව) | ර.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/කො.වි/පේ.වි/යා.වි |
| රසායනික විද්‍යා තාක්ෂණය | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා)(විශේෂ) | ස.වි |
| පරිගණන රසායන විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |

| | විෂය | උපාධිය | උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|---|
| ✪ | පරිගණන භෞතික විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ඉංජිනේරු භෞතික විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | පරිසර කළමනාකරණය හා වන විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ✪ | පරිසර විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | පාරිසරික විද්‍යාව | විද්‍යාවේදී | යා.වි (ව.ම) |
| | | විද්‍යාවේදී (ගෞරව) | ජේ.වි |
| ✪ | මූල්‍ය ව්‍යාපාර හා පරිගණක ගණිතය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | භූ විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ජේ.වි |
| ✪ | භූගෝලීය තොරතුරු විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ජේ.වි |
| ✪ | මානව ජීව විද්‍යාව | විද්‍යාවේදී | ශ්‍රී.ජ.වි |
| ✪ | කාර්මික ගණිතය | විද්‍යාවේදී | ර.වි |
| ✪ | කාර්මික රසායනය | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ✪ | බහුඅවයවික රසායනය | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ✪ | කර්මාන්ත සංඛ්‍යානය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | විද්‍යාවේදී | කො.වි |
| ✪ | මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය | විද්‍යාවේදී (ගෞරව) | රු.වි |
| ✪ | සාගර සහ මිරිදිය විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | රු.වි |
| ✪ | ගණිතමය මූල්‍ය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ගණිතමය භෞතික විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි |
| ✪ | ගණිතය හා සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ගණිතය | විද්‍යාවේදී (විශේෂ) | රු.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/අ.වි/කො.වි/ජේ.වි/යා.වි |
| ✪ | ගණිතය (ශුද්ධ ගණිතය හා ව්‍යවහාරික ගණිතය) | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි |
| ✪ | ගණිතය (ශුද්ධ ගණිතය හා සංඛ්‍යානය) | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි |
| ✪ | ක්ෂුද්‍ර ජීව විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි |
| ✪ | න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | න්‍යෂ්ටික තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | භෞතික විද්‍යාව | විද්‍යාවේදී | නැ.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | රු.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි/අ.වි/කො.වි/ජේ.වි/යා.වි |
| ✪ | ශාක ජීව විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ✪ | ශාක ජෛව තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි/ශ්‍රී.ජ.වි |
| ✪ | ශාක විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ශුද්ධ ගණිතය | විද්‍යාවේදී | නැ.වි |
| ✪ | සංඛ්‍යානය | විද්‍යාවේදී | නැ.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි/කො.වි/ජේ.වි/යා.වි |
| ✪ | සංඛ්‍යානය සමඟ පරිගණක විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | සත්ත්ව විද්‍යාව | විද්‍යාවේදී | නැ.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | රු.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි/කො.වි/ජේ.වි/යා.වි |
| ✪ | විද්‍යාව හා කළමනාකරණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | විද්‍යාව හා අධ්‍යාපනය | විද්‍යාවේදී (ගෞරව) | යා.වි |
| ✪ | සන්නිවේදන අධ්‍යයනය | ශාස්ත්‍රවේදී (සන්නිවේදන අධ්‍යයනය) | නැ.වි (ත්‍රි.ම) |
| | | ශාස්ත්‍රවේදී (භාෂා) | නැ.වි (ත්‍රි.ම) |
| | | ශාස්ත්‍රවේදී (විශේෂ) | නැ.වි (ත්‍රි.ම) |
| ✪ | පරිගණනය හා කළමනාකරණය | විද්‍යාවේදී (ගෞරව) | ජේ.වි |
| ✪ | පරිගණක විද්‍යාව | විද්‍යාවේදී | කො.වි.ප.අ./යා.වි/රු.වි/නැ.වි.(ත්‍රි.ම) |
| | | විද්‍යාවේදී (ගෞරව) | කො.වි.ප.අ./ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි/ජේ.වි |
| | | විද්‍යාවේදී මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) | කො.වි.ප.අ. |
| | | විද්‍යාවේදී (විශේෂ) | අ.වි |
| | | පරිගණක විද්‍යාවේදී | කො.වි/රු.වි/නැ.වි.(ත්‍රි.ම) |
| ✪ | පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | ඌ.වි |
| | | විද්‍යාවේදී (ව්‍යාවහාරික විද්‍යා)(විශේෂ) | ස.වි |
| ✪ | ආගණනය හා තොරතුරු පද්ධති | විද්‍යාවේදී (විශේෂ) | ස.වි. |
| ✪ | නර්තනය | ලලිත කලාවේදී | ස.වි.අ.ආ./රා.ඇ |
| ✪ | නර්තන හා නාට්‍ය | ප්‍රායෝගික කලාවේදී (විශේෂ) | සෞ.වි |
| ✪ | දන්ත ශල්‍ය විද්‍යාව | දන්ත ශල්‍ය විද්‍යාවේදී | පේ.වි |
| ✪ | මෝස්තර නිර්මාණ ශිල්පය (වාස්තු විද්‍යාව) | මෝස්තර නිර්මාණවේදී (ගෞරව) | මො.වි |
| ✪ | නාට්‍ය හා රංගකලා | ලලිත කලාවේදී | ස.වි.අ.ආ |
| | | | |
| ✪ | **ඉංජිනේරු** | | |
| | රසායන හා ක්‍රියාවලි විද්‍යා ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| | රසායන හා සැකසුම් ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි |
| | සිවිල් ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි/මො.වි/අ.වි/යා.වි /ශ්‍රී.ජ.වි |
| | සිවිල් හා පාරිසරික ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | රු.වි |
| | පරිගණක ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි/යා.වි/ශ්‍රී.ජ.වි |
| | පරිගණක විද්‍යාව හා ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි/යා.වි/ශ්‍රී.ජ.වි |
| | විද්‍යුත් හා තොරතුරු ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | රු.වි |
| | විදුලි ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි/අ.වි |
| | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| | යාන්ත්‍රික ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි/මො.වි/අ.වි/යා.වි/ශ්‍රී.ජ.වි |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | රු.වි |
| | නාවික ඉංජිනේරු සහ නාවික නිර්මාණ ශිල්පය | ඉංජිනේරු විද්‍යාවේදී | රු.වි |
| | නිෂ්පාදන ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | පේ.වි |
| | ද්‍රව්‍ය විද්‍යාව හා ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| | විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව | ඉංජිනේරු විද්‍යාවේදී | අ.වි |
| | ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| ✪ | ඉංජිනේරු විද්‍යාව (භූ සම්පත්) | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |
| ✪ | ඉංජිනේරු විද්‍යාව (පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය) | ඉංජිනේරු විද්‍යාවේදී | මො.වි |

| | විෂය | උපාධිය | උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|---|
| ✪ | ඉංජිනේරු තාක්ෂණවේදය | ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි/රු.වි/ර.වි/ව.වි/ඌ.වි<br>කො.වි/ස.වි |
| ✪ | ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | ඌ.වි |
| ✪ | පරිසර සංරක්ෂණ හා කළමනාකරණය | විද්‍යාවේදී | කැ.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | කැ.වි |
| ✪ | පාරිසරික විද්‍යා හා සම්පත් කළමනාකරණය | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා) | ස.වි |
| | | විද්‍යාවේදී (ව්‍යාව විද්‍යා)(විශේෂ) | ස.වි |
| ✪ | අපනයන කෘෂිකර්මය | විද්‍යාවේදී (ගෞරව) | ඌ.වි |
| ✪ | පශුසම්පත් කළමනාකරණය | විද්‍යාවේදී (ගෞරව) | මො.වි |
| ✪ | විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මෝස්තර නිර්මාණවේදී<br>(වි.නි.හා නි.ප්‍ර) | මො.වි |
| ✪ | ධීවර සහ සාගර විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | රු.වි |
| ✪ | ආහාර ව්‍යාපාර කළමනාකරණය | විද්‍යාවේදී | ස.වි |
| ✪ | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය | විද්‍යාවේදී (ගෞරව) | ව.වි |
| ✪ | ආහාර විද්‍යාව හා පෝෂණය | විද්‍යාවේදී (ගෞරව) | ව.වි. |
| ✪ | ආහාර විද්‍යාව හා තාක්ෂණය | විද්‍යාවේදී(විශේෂ) | ජ.වි/ස.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි |
| ✪ | හරිත තාක්ෂණය | විද්‍යාවේදී | රු.වි |
| ✪ | සෞඛ්‍ය ප්‍රවර්ධනය | විද්‍යාවේදී | ර.වි |
| ✪ | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | ඌ.වි |
| ✪ | කාර්මික තොරතුරු තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | ඌ.වි |
| ✪ | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | තොරතුරු සහ සන්නිවේදන<br>තාක්ෂණවේදී (ගෞරව) | ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි (ව.ම)/රු.වි/අ.වි/ර.වි/<br>කො.වි/ඌ.වි |
| ✪ | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | තොරතුරු සහ සන්නිවේදන<br>තාක්ෂණවේදී | ර.වි |
| | | විද්‍යාවේදී (තොරතුරු තාක්ෂණය) | යා.වි (ව.ම) |
| | | විද්‍යාවේදී | ර.වි |
| | | විද්‍යාවේදී (ගෞරව)(තොරතුරු තා.) | යා.වි (ව.ම) |
| ✪ | තොරතුරු පද්ධති | විද්‍යාවේදී තොරතුරු පද්ධති | කො.වි.ප.අ. |
| | | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති | කො.වි.ප.අ./ර.වි |
| ✪ | තොරතුරු තාක්ෂණය | විද්‍යාවේදී (තො.තා)(ගෞරව) | මො.වි |
| ✪ | තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | විද්‍යාවේදී (තො.තා.හා ක)(ගෞරව) | මො.වි |
| | | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ඉස්ලාම් අධ්‍යයනය | ශාස්ත්‍රවේදී | අ.වි |
| ✪ | භූමි නිර්මාණවේදය | භූමි නිර්මාණවේදී (ගෞරව) | මො.වි |
| ✪ | උද්‍යාන විද්‍යාව හා තිරසාර භූමි නිර්මාණය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | නීතිය | නීතිවේදී | කො.වි/ජ.වි/යා.වි |
| ✪ | ගිණුම්කරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි/යා.වි |
| | | ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) | රු.වි |
| | | ව්‍යාපාර කළමනාකරණවේදී(විශේෂ) | කැ.වි |
| ✪ | ගණකාධිකරණය | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| ✪ | ගණකාධිකරණය හා ව්‍යාපාර මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) | ව.වි |
| ✪ | ගණකාධිකරණය හා මූල්‍ය | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | යා.වි (ව.ම) |
| | | විද්‍යාවේදී (විශේෂ) | ර.වි |
| ✪ | විගණනය සහ වෝහාරික ගිණුම්කරණය | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | කැ.වි |
| ✪ | බැංකු සහ ව්‍යාපාර මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) | ව.වි |
| ✪ | බැංකු සහ රක්ෂණය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |
| ✪ | ව්‍යාපාර පරිපාලනය | ව්‍යාපාර පරිපාලනවේදී | නැ.වි |
| | | ව්‍යාපාර පරිපාලනවේදී(විශේෂ) | කො.වි/ජ.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| ✪ | ව්‍යාපාර ආර්ථික විද්‍යාව | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| | | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | යා.වි(ව.ම) |
| ✪ | ව්‍යාපාරය හා පරිසරය | විද්‍යාවේදී (ගෞරව) | කො.වි |
| ✪ | ව්‍යාපාර තොරතුරු පද්ධති | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි. |
| ✪ | ව්‍යාපාර කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) | රු.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ර.වි/ස.වි/ව.වි |
| ✪ | ව්‍යාපාර තාක්ෂණය | වාණිජ විද්‍යාවේදී (විශේෂ) | කැ.වි |
| ✪ | වාණිජ්‍යය | වාණිජවේදී | යා.වි/නැ.වි |
| | | වාණිජවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි./කැ.වි/අ.වි |
| ✪ | ව්‍යාපාර විද්‍යාව | ව්‍යාපාර විද්‍යාවේදී (ගෞරව) | මො.වි |
| ✪ | පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |
| ✪ | ව්‍යවසායකත්වය | ව්‍යාපාර පරිපාලනවේදී(ගෞරව) | රු.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි. |
| | | වාණිජ විද්‍යාවේදී (විශේෂ) | කැ.වි |
| ✪ | දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| ✪ | මූල්‍ය | ව්‍යාපාර පරිපාලනවේදී(විශේෂ) | කො.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| | | ව්‍යාපාර කළමනාකරණවේදී(විශේෂ) | කැ.වි |
| ✪ | මූල්‍ය කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | ජ.වි/යා.වි |
| | | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |
| | | වාණිජ විද්‍යාවේදී (විශේෂ) | කැ.වි |
| ✪ | මූල්‍ය ඉංජිනේරුකරණය | ව්‍යාපාර කළමනාකරණවේදී( ගෞරව) | කැ.වි |
| ✪ | බැංකුකරණය | ව්‍යාපාර කළමනාකරණවේදී( ගෞරව) | කැ.වි |
| ✪ | රක්ෂණය | ව්‍යාපාර කළමනාකරණවේදී( ගෞරව) | කැ.වි |
| ✪ | සත්කාරසේවා කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |

| විෂය | උපාධිය | උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| මානව සම්පත් කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි/ජේ.වි/යා.වි |
| | ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) | රු.වි |
| | ව්‍යාපාර කළමනාකරණවේදී(විශේෂ) | කැ.වි |
| | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | යා.වි(ව.ම) |
| | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| | විද්‍යාවේදී(ගෞරව) | ර.වි |
| මානව සම්පත් සංවර්ධනය | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | ඌ.වි |
| රක්ෂණය හා මූල්‍ය | විද්‍යාවේදී(ගෞරව) | ව.වි |
| මූල්‍ය හා රක්ෂණය | විද්‍යාවේදී(ගෞරව) | කො.වි |
| ජාත්‍යන්තර ව්‍යාපාර | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි |
| කළමනාකරණය | ශාස්ත්‍රවේදී | ජේ.වි |
| | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි/අ.වි |
| | ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) | යා.වි(ව.ම) |
| | වාණිජවේදී | ජේ.වි |
| | විද්‍යාවේදී | නැ.වි(ත්‍රි.ම) |
| | විද්‍යාවේදී (විශේෂ) | නැ.වි(ත්‍රි.ම) |
| ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි |
| අලෙවිකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | කො.වි/යා.වි |
| | ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) | රු.වි |
| | ව්‍යාපාර කළමනාකරණවේදී(විශේෂ) | කැ.වි |
| අලෙවි කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | ජේ.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි/ස.වි |
| | විද්‍යාවේදී(ගෞරව) | ර.වි |
| | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | යා.වි(ව.ම) |
| මෙහෙයුම් කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) | ජේ.වි |
| මෙහෙයුම් සහ තාක්ෂණික කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපාර කළමනාකරණවේදී | යා.වි(ව.ම) |
| | ව්‍යාපාර කළමනාකරණවේදී(ගෞරව) | යා.වි(ව.ම) |
| කළමනාකරණය (රාජ්‍ය) විශේෂ | විද්‍යාවේදී (විශේෂ) | ශ්‍රී.ජ.වි |
| සංචාරක කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි/ර.වි |
| කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය | විද්‍යාවේදී | කැ.වි |
| | විද්‍යාවේදී(ගෞරව) | කැ.වි |
| | විද්‍යාවේදී (ක.හා තො.තා) | අ.වි |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා | විද්‍යාවේදී | ජේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/රු.වි |
| වෛද්‍ය විද්‍යාව | වෛද්‍ය විද්‍යාවේදී සහ ශල්‍ය විද්‍යාවේදී | කො.වි/ජේ.වි/ශ්‍රී.ජ.වි/කැ.වි/යා.වි/රු.වි/නැ.වි/ ර.වි/ව.වි/ස.වි/මො.වි |
| ඛණිජ සම්පත් තාක්ෂණය | විද්‍යාවේදී(ගෞරව) | ඌ.වි |
| | විද්‍යාවේදී (ගෞරව)(ඛනිජ සැකසුම් තාක්ෂණය) | ඌ.වි |
| | විද්‍යාවේදී (ගෞරව)(ජල විද්‍යා හා තාක්ෂණය) | ඌ.වි |
| සංගීතය | ලලිතකලාවේදී | රා.ඇ./ස්.වි.අ.ආ. |
| | ප්‍රාසංගික කලා (විශේෂ) | සෞ.වි |
| හෙද | විද්‍යාවේදී | ජේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/රු.වි/නැ.වි/කො.වි |
| තාල හා ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම | විද්‍යාවේදී(ගෞරව) | ඌ.වි |
| සාමය හා ගැටුම් නිරාකරණය | ශාස්ත්‍රවේදී(ගෞරව) | කැ.වි. |
| ඖෂධ විද්‍යාව | ඖෂධවේදී | ජේ.වි/ශ්‍රී.ජ.වි/යා.වි/රු.වි |
| | විද්‍යාවේදී(ගෞරව) | කො.වි |
| ශාරීරික අධ්‍යාපනය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |
| භෞත චිකිත්සා | විද්‍යාවේදී | කො.වි/ජේ.වි |
| | විද්‍යාවේදී (විශේෂ) | කො.වි |
| භෞතික විද්‍යාව- තොරතුරු සහ සන්නි. තාක්ෂණය | විද්‍යාවේදී (භෞ.වි සහ තො.හා ස.තා) | ශ්‍රී.ජ.වි |
| | විද්‍යාවේදී (භෞ.වි සහ ඉලෙක්ට්‍රෝ.වි) | කැ.වි |
| ප්‍රමාණ සමීක්ෂණය | විද්‍යාවේදී(ගෞරව) | මො.වි |
| විකිරණ ශිල්පය | විද්‍යාවේදී | ජේ.වි |
| විද්‍යාව සහ තාක්ෂණය | විද්‍යාවේදී(ගෞරව) | ඌ.වි |
| | විද්‍යාවේදී(ගෞරව)(මෙකාට්‍රොනික්ස්) | ඌ.වි |
| | විද්‍යාවේදී (ගෞරව) (පදාර්ථ විද්‍යාව හා තාක්ෂණය) | ඌ.වි |
| | විද්‍යාවේදී (ගෞරව)(ආහාර ඉංජිනේරු විද්‍යාව සහ ජෛව සැකසුම් තාක්ෂණය) | ඌ.වි |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී | යා.වි/නැ.වි(ත්‍රි.ම) |
| කථන හා ශ්‍රවණ විද්‍යාව | විද්‍යාවේදී(ගෞරව) | කැ.වි |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | විද්‍යාවේදී(ගෞරව) | කැ.වි/ස.වි |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ස.වි |
| | විද්‍යාවේදී(ගෞරව) | ශ්‍රී.ජ.වි |
| සංඛ්‍යානය හා සංකාර්යය පර්යේෂණ | විද්‍යාවේදී(ගෞරව) | ජේ.වි. |
| මැනුම් විද්‍යාව | විද්‍යාවේදී | ස.වි |
| තේ තාක්ෂණය හා අගය වැඩි කිරීම | විද්‍යාවේදී(ගෞරව) | ඌ.වි |
| සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය | විද්‍යාවේදී (විශේෂ) | ර.වි |
| සංචාරක හා සත්කාර කළමනාකරණය | ව්‍යාපාර පරිපාලනවේදී(ගෞරව) | යා.වි |
| නගර හා ග්‍රාම නිර්මාණය | විද්‍යාවේදී | මො.වි |
| ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය | විද්‍යාවේදී (ප්‍ර.හා සැ.ක) | මො.වි |
| යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී | කො.වි |
| පශු වෛද්‍ය විද්‍යාව | පශු වෛද්‍යවේදී (ගෞරව) | ජේ.වි |
| දෘශ්‍ය කලා | දෘශ්‍ය කලා (විශේෂ) | සෞ.වි |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ලලිත කලාවේදී | ස්.වි.අ.ආ. |
| ධීවර විද්‍යාව | විද්‍යාවේදී (ගෞරව) | යා.වි |

# ප්‍රථම උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාල සහ ආයතන වල ලිපිනයන්

කොළඹ විශ්වවිද්‍යාලය,
"සනාතන මන්දිරය",
94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03
☎ : 011 - 2581835, 2584695, 2585509

ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය,
වෑවල, හොරණ
☎ : 034 - 2265553, 2263616, 2263617, 2263516

වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය,
කින්සි පාර, කොළඹ 08
☎ : 011 - 2695300, 2696243, 2688748, 2688749

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය,
35, රීඩ් ඇවනිව්, කොළඹ 07
☎ : 011-2581245, 2581246, 2581247

පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.
☎ : 081 - 2388301, 2388302, 2388303,
2388304, 2388305, 2392000

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
☎ : 011 - 2802695, 2802696, 2803191, 2803192,
2802022, 2801024, 2758000, 2801025

කැලණිය විශ්වවිද්‍යාලය,
දළුගම, කැලණිය.
☎ : 011 - 2913855, 2911397, 2913854, 2911407,
2913858, 2910164, 2911391, 2903903

වෛද්‍ය පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය,
තලගොල්ල පාර, රාගම.
☎ : 011 –2958219, 2958039, 2961000

මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද, මොරටුව
☎ : 011 - 2650301, 2650340, 2650441, 2650534

යාපනය විශ්වවිද්‍යාලය,
තිරුනෙල්වේලි, තැ.පෙ. 57, යාපනය
☎ : 021 - 2222294, 2218100

යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය,
පාර්ක් පාර, වව්නියාව.
☎ : 024 – 2222265, 2222264

ලලිත කලා පිළිබඳ රාමනාදන් ඇකඩමිය, යාපනය විශ්වවිද්‍යාලය,
මරතනාර්මඩම්, චුන්නාකම්.
☎ : 021-2242613

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම, මාතර
☎ : 041 -2222681, 2222682, 2227001 - 4

වෛද්‍ය පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය,
කරාපිටිය, ගාල්ල
☎ : 091 - 2234801, 2232321, 2234730,
2222731, 2234803, 2222801, 2232288

කෘෂිකර්ම පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය,
මාපලාන, කඹුරුපිටිය.
☎ : 041 - 2292200, 2292815

ඉංජිනේරු පීඨය,
රුහුණු විශ්වවිද්‍යාලය,
හපුගල, ගාල්ල.
☎ : 091 - 2245765, 2245766

නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා,
වන්තාරමූලේ, චෙන්කලඩි.
☎ : 065 – 2240490, 2240590, 2240585, 2240580

ශ්‍රී ලංකා, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය,
කෝනේසපුරි, නිලාවේලි, ත්‍රිකුණාමලය.
☎ : 026 - 2227317, 2222769

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය,නැගෙනහිර විශ්වවිද්‍යාලය, කල්ලඩි, මඩකලපුව
☎ : 065-2222663, 2227996, 2050695

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.
☎ : 025 - 2266645, 2266643, 2266650

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,
111, විද්‍යාල මාවත, කහදූල්ල, කුලියාපිටිය.
☎ : 037 - 2281414, 2281412, 2283614

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,
මාකඳුර, ගෝනවිල.
☎ : 031 - 2299704, 2299430

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
තැ.පෙ. 02, පඹහින්න, බෙලිහුල්ඔය.
☎ : 045 – 2280014, 2280087, 2280178

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,
ඔලුවිල්.
☎ : 067 – 2255062, 2255063, 2255064

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
3 කණුව, පස්සර පාර, බදුල්ල.
☎ : 055-2226370, 2226400, 2226633

සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය,
21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07.
☎ : 011 – 2696971, 2691483, 2679637, 2033710

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,
නාවල පාර, නුගේගොඩ.
☎ : 011 - 2853777, 2881000

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායකපුර, රාජගිරිය.
☎ : 011 - 2694308, 2692385

මානව සම්පත් අභිවර්ධන ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය, තැ. පෙ. 1557,
275, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
☎ : 011 – 2587245, 2503393

ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය,
යක්කල.
☎ : 033 - 2222748, 2222740

ප්‍රවේශ දෙපාර්තමේන්තුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 7.
www.ugc.ac.lk
දුරකථන : 011-2678731,011-2685758, 011-2695301,011-2695302
ෆැක්ස්: 011-2691678

ISBN 978-955-583-150-5

Rs. 500/=